# ෂර්ලොක් හෝම්ස්

# ආපසු එයි !

චන්දන මෙන්ඩිස්



SHERLOCK HOLMES IS BACK !

GAME IS AFOOT AGAIN !

- *New York Mirror*

http://sherlockholmesinvestigations.blogspot.com

# ෂර්ලොක් හෝම්ස් ආපසු එයි !



"කොක්ස් සහ සමාගමට අයත් බැංකුවේ සුරක්ෂිතාගාරයක, තැළී, පළුදු වී, දුර්වර්ණ වී ගිය ලෝහ ට්‍රන්ක පෙට්ටියක් තැන්පත්ව ඇත.

මේ පෙට්ටිය කඩදාසි හා ලිපිගොනුවලින් පිරී ඇත. මේ කඩදාසි සියල්ලක්ම පාහේ මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් විවිධ කාලවලදී කළ පරීක්ෂණ පිළිබඳ විස්තර සටහන්ය......"

"......මගේ මේ අපරාධ පරීක්ෂණ වෘත්තිය අද රෑට අවසන් වුණත්, ගෙවී ගිය කාලය දිහා මට උපේක්ෂාවෙන් බලන්න පුළුවනි. පරීක්ෂණ දහසකට අධික ගණනක මං [illegible] තියෙනවා....."

http://sherlockholmesinvestigations.blogspot.com

# ෂර්ලොක් හෝම්ස් ආපසු එයි !

අසංක්ෂිප්ත පරිවර්තනය

**චන්දන මෙන්ඩිස්**

ප්‍රකාශක

**චන්දන මෙන්ඩිස්**

141/2, දූව පාර,

බද්දගාන, කෝට්ටේ

Reading Purpose Only... Not For Print.

# පටුන


| | |
|---|---|
| ප්‍රස්තාවනාව | 07 |
| 1. සුවපහසු නවාතැන | 25 |
| 2. තේම්ස් නදීතෙර වික්‍රමය | 54 |
| 3. හදිසි අභාවය | 82 |
| 4. රැම්ස්ගේට් ප්‍රහේළිකාව | 102 |
| 5. මාරයාගේ දූතයෝ | 138 |
| 6. කර්නල් වෝබටන්ගේ උමතුව | 164 |
| 7. නාඳුනන්නා | 198 |




Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

පාසල් පුස්තකාල සඳහා යෝග්‍ය පොතක් වශයෙන්
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ
බලපත්‍රය

## ෂර්ලොක් හෝම්ස් ආපසු එයි

1952 පෙබරවාරි මස 29 දින නිකුත් කරන ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ උපකෘත, ස්වභාෂා, ද්විභාෂා හා ඉංග්‍රීසි පාඨශාලාවන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 19/ඒ ඡේදය යටතේ අධ්‍යාපන අධ්‍යක්ෂක ජනරාල්තුමන් විසින් පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කරන ලදී.

ඒ.එෆ්. ඩී. නානායක්කාර
ලේකම්,
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන
උපදේශක මණ්ඩලය.

2004. 11. 08. දින
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන
අමාත්‍යාංශය, 'ඉසුරුපාය',
බත්තරමුල්ල.

ගොනු අංකය : අග්‍රම /2/7113


1. THE ADVENTURE OF THE PHARMACEUTICALS SALESMAN
2. THE DEPTFORD HORROR
3. A CASE OF SUDDEN DEATH
4. THE RAMSGATE PUZZLE
5. THE MADNESS OF COLONEL WARBURTON
6. ANGELS OF DEATH
7. THE ADVENTURE OF THE BANK MANAGER


Reading Purpose Only, Not For Print
http://sher... igations.blogspot.com

# ප්‍රස්තාවනාව

මා මෙයට පැටළුණේ ඉතාම පුදුම සහගත අයුරෙනි. මා කියන මේ කථාව ඔබට විශ්වාස කිරීමටත් අපහසු වනු ඇත. මේ කියන්නේ මගේ පෞද්ගලික පුරාජේරුවක් යයි තවදුරටත් කියවද්දී ඔබ සිතනු ඇත. එහෙත් මේ එවැන්නක් නොවන බව මම අවධාරණය කරමි. මගේ ආගිය තොරතුරු නොකියා, මා මෙයට සම්බන්ධ වූ හැටි හෙළිකළ හැකි, වෙනත් ක්‍රමයක් මම නොදනිමි. කෙසේ වුවද මේ සිදුවීම ඇත්තක් බව ඔප්පු කිරීමට සාක්ෂි ඇත්තේ ද ස්වල්පයක් පමණි. දීර්ඝ කථාවක් හැකි තරම් කෙටියෙන් කීමට මම උත්සාහ දරන්නෙමි.

"බ්‍රිටිෂ් එයාවේස් ගුවන් සමාගම වෙනුවෙන්, කපිතාන් ඇතුළු කාර්ය මණ්ඩලය ඔබ සැම සාදරයෙන් පිළිගන්නවා" යයි ගුවන්යානයේ ඉදිරියට පැමිණි ගුවන්සේවිකාව අප අමතමින් පැවසුවාය. "අයහපත් කාලගුණය නිසා ඇතිවූ ප්‍රමාදය ගැන කණගාටුයි. ඔබට සංග්‍රහ කිරීමට අපේ කාර්යමණ්ඩලය දැන් සූදානම්."

දැඩි කුසගින්නේ පසුවූ අපට, එය සතුටුදායක ආරංචියක් විය. දිනය 1977 සැප්තැම්බර් 13 වැනිදාය. කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙන් රාත්‍රී 2ට ලන්ඩනයේ හීත්රෝ බලා යාමට නියමිතව තිබූ යානය, පිටත්වූයේ පාන්දර 4ටයි. එය සිංගප්පූරුවෙන් කොළඹ බලා ඒමේ ප්‍රමාදයක් ඇතිබැව්, කල්තබාම නිවේදනය වී තිබිණි. රාත්‍රී දෙකක්ම හරි හැටි නිදි නොලබා, මේ ගමනට සූදානම් වෙමින් සිටි මම, බොහෝ වෙහෙසට පත්ව සිටියෙමි.

ගුවන්යානයේදී අපට පිළිගැන්වුණු ප්‍රණීත ආහාර වේල, මම සතුටින් භුක්ති වින්දෙමි. කුසපුරා ආහාර ගත් වහාම, සෙසු මගීන් මෙන් අසුන මදක් ඇලකරගෙන, නිදාගැනීමට හැකිවේතැයි මම සිතාසිටියෙමි. එහෙත් එය එලෙස ඉටු නොවිය. විශාල මුදලක් වැයකර අප යන මේ ගමන, කොතරම් දුරට සාර්ථක වේද? නුපුරුදු රටකට ගොස්, සියලු බලාපොරොත්තු සුනුවිසුනු වී, හිස් අතින්

http://sherlockholmesinvestigations.blogspot.com

ආපසු ඒමට සිදුවේද? මා මේ කියන්නේ කුමක් ගැනදැයි ඔබ දැඩි විමතියකට පත්වී සිටිනු නොඅනුමානයි. ඒ සියල්ලක්ම දැන් මම පැහැදිලිව ඔබට කියා දෙන්නම්.

පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨයෙන්, හැත්තෑව දශකය මුලදී උපාධිය ලබද්දී සිසුන් හැම දෙනාගේම සිත්වල තිබුණේ එකම අරමුණකි. එනම්, එංගලන්තයට ගොස්, ලන්ඩනයේ ශල්‍ය වෛද්‍යවරුනගේ රාජකීය විද්‍යාලයේ, දන්ත ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගැනීමයි. එංගලන්තයේ නෑදෑ හිතමිතුරන් සිටි බොහෝ දෙනෙකුට මෙය දුෂ්කර කරුණක් නොවිණි. එංගලන්තයේ රෝහලක දන්ත වෛද්‍යවරයෙකු ලෙස තාවකාලික පත්වීමක් ලබා, අවශ්‍ය සායනික පුහුණුව ලබාගැනීමට ඒ මගින් පහසුවිය. එහෙත් මට මෙන්ම, මගේ හිතමිත්‍රයා වූ තිලක්ට ද පිහිටවීමට, එංගලන්තයේ එවැනි කිසිවෙකු නොවීය.

බ්‍රිතාන්‍ය දන්ත වෛද්‍ය සඟරාවේ සතිපතාම, ඔවුන්ගේ රෝහල් වල ඇබෑර්තු පිළිබඳ දැන්වීම් පළවිණි. අපි ලංකාවේ සිට ඒවාට නොකඩවා ඉල්ලුම්පත් යැව්වෙමු. එහෙත් ඒවාට පිළිතුරක් හෝ ලැබුණේ ඉතා කලාතුරකිනි. එක් දිනක් ලන්ඩනයේ ප්‍රධානතම රෝහලක මුඛ ශල්‍ය වෛද්‍ය විශේෂඥයෙකුගෙන් සතුටුදායක පිළිතුරක් අප වෙත ලැබිණි.

"....... එංගලන්තයට පැමිණ, සිද්ධාන්තික හා සායනික දැනුම පිළිබඳ පරීක්ෂණයකින් සමත්විය හැකි නම්, පත්වීමක් ලබාදිය හැකිය.

මහාචාර්ය ඩාලිං"

මෙය අපට ඉතාම සතුටුදායක පිළිතුරක් වූ බව අමුතුවෙන් කිවයුතු නොවේ.

"එංගලන්තයට ගිහිං පරීක්ෂණ වලින් අසමත් වුණොත්, අපට හිස් අතින් ගෙදර එන්නයි වෙන්නේ" තිලක් කීය.

"ඩාලිං අපිව අමාරුවේ දාන එකක් නෑ. මොනවා හරි රස්සාවක් හොයල දේවි. උඹත් එනවා නම් මං ලෑස්තියි යන්න" මම පිළිතුරු දුනිමි.


http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙනම් ඉතින් මියෙම්වා රැකෙම්වා කියල යමු" මගේ මිත්‍රයා එකඟ විය.

* * *

යුරෝපයට අප රැගෙන ගිය ගුවන්යානය පැය ගණනක දීර්ඝ ගමනකින් පසු ලන්ඩනයේ හීත්රෝ ගුවන් තොටුපොළට ළඟාවිය. එංගලන්තයේ රැකියාවක් කළ ශ්‍රී ලාංකික හිතවතෙක්, අප පිළිගැනීමට ගුවන් තොටුපොළට පැමිණ සිටියේය. ඔහුගේ නිවසේ ද දිනක් නවාතැන් ගෙන සිට, පසුදා උදයේ අපි මහාචාර්ය ඩාලිං හමුවීමට යාමට පිටත්වීමු. ඔහු සේවය කළේ ලන්ඩනයේ ඊස්ට්මන් දන්තාරෝග්‍ය ශාලාවේය.

අඩි හයයි අඟල් තුනක් පමණ උසබූ, ඊට සරිලන මහතක් තිබූ මහාචාර්ය ඩාලිංට තිබුණේ රතුපැහැති ප්‍රසන්න මුහුණකි. ඔහුගේ වයස අවුරුදු පනහක් පමණ විය යුතු යයි මට සිතිණි. දුඹුරු පැහැති හිසකෙස් බාගෙට හැළී, ඔහුගේ හිස මුදුනේ තට්ටය පෑදෙමින් තිබිණි. සුහද සිනාවක් පාමින් අප පිළිගත් ඔහු, ඉතාම කාරුණික අයෙකු බව අපි ඉක්මනින් වටහාගත්තෙමු.

"ඔබ දෙදෙනා ආවේ හොඳ වෙලාවට " ඔහු කීය. "ඔබේ දැනුම ගැන මං පරීක්ෂණයක් පවත්වන්නේ තවත් සති දෙකකින්. එතෙක් කැමැති නම් ඔබට යෙදෙන්නට, මෙහෙම කටයුත්තක් තියනවා. සසෙක්ස් සෞඛ්‍ය අධිකාරියේ, ජංගම දන්ත වෛද්‍ය ඒකකයේ ඇබෑර්තු දෙකක් ඇතිවෙලා. රෝහල්වල පත්වීම් ලැබෙන තුරු කැමැති නම්, ඔබට ඒ තනතුරු වල කටයුතු කරන්න පුළුවන්. නැවතීමට සුවපහසු කාමර සමඟ තරමක් සතුටුදායක වැටුපක් ලැබෙනවා. කැමැතිද?"

"මොනවද අපට කරන්න වෙන වැඩ?" මම ඇසීමි.

"පශ්චාත් උපාධිය සඳහා පිළිගැනෙන මුඛ ශල්‍යකර්ම වැඩ නම් මොකුත් නැහැ." මහාචාර්යතුමා කීය. "ඒ බව මම කල්තබා ඔබට කිවයුතුයි. ජංගම ඒකකයෙන් කරන්නේ ඒ පළාතේ වැඩිහිටි නිවාස වල සහ තමන්ගේම ගෙවල් වල, දුර්වලව ඉන්නා රෝගීන්ට දන්ත වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම- හොඳටම සෙලවෙන දත් ගැළවීම,

http://sherlockholmesinvestigations.blogspot.com

කෘතිම දත් ලබාදීම සහ ඔවුනගේ සුළු මුඛ රෝග වලට ප්‍රතිකාර කිරීම හා රෝග විනිශ්චය කිරීම, ඊට අයත්වෙනවා. මොකද කියන්නෙ? මට මේ දන්ම පිළිතුරක් ඕන" මහාචාර්ය ඩාලිං කීවේ තීරණාත්මක අයුරෙනි.

"මහාචාර්යතුමා. මං බොහොම කැමැතියි ඒ පත්වීම භාරගන්න" මම කීවෙමි.

"මමත් කැමැතියි" මගේ මිතුරා කීය.

"බොහොම හොඳයි මහත්වරුනි, බොහොම හොඳයි" මහාචාර්යතුමා සතුට පළ කළේ යළිත් වරක් අපට උණුසුම් අයුරින් අතට අත දෙමිනි. "ඔබට හෙට උදේම පුළුවනි වැඩ භාරගන්න. දැන් යන්න දෙදෙනාට හිමිවෙන නිල නිවාසයට. හෙට උදේ මෙහේට ඇවිත් මා හමුවෙන්න. එහෙකොට ඔබේ පත්වීමේ ලිපිය දෙන්නම්. අදාළ නිලධරයාට දැනුම්දීම, මං මේ මොහොතෙම කරනවා."

* * *

අප දෙදෙනා එකිනෙකට තරමක් ඈතින් පිහිටි ජංගම වෛද්‍ය ඒකක දෙකකට අනුයුක්ත කෙරිණි. මහාචාර්යතුමා පැවසූ අයුරින්ම, අපට භාරවූයේ, වැඩිහිටි නිවාස සහ වයස්ගත අය වෙසෙන නිවාස වලට ගොස්, ඔවුනට ප්‍රතිකාර කිරීමයි. අවුරුදු අසූව, අනූව, වයසේ සිටි ආච්චිලා සීයලාට උවමනා වූයේ, කලක් පාවිච්චි කොට අබලන්වූ කෘතිම දත්කුට්ටම වෙනුවට අලුත් දත්කුට්ටමය. මේ සඳහා කටයුතු සම්පාදනය කිරීම එතරම් අමාරු කටයුත්තක් වූයේ නැත. මාස තුනක් මම ඉතා සතුටින් මට භාරවූ රාජකාරියේ යෙදුණෙමි.

එක් දිනක් උදයේ අපේ ජංගම ප්‍රතිකාර රථය ළඟාවූයේ, අබලන් පෙනුමක් තිබූ මධ්‍යම ප්‍රමාණයේ නිවසක් වෙතයි. ගෙවත්ත කලකට පෙර අලංකාරව මල් වවා තිබුණත්, දැන් ඒ සඳහා උනන්දුව අඩුවෙමින් පැවැති බව මම දුටුවෙමි.

"මීට කාලෙකට ඉස්සර අපි මේ ගෙදර ජෝඩුවට දන්ත වෛද්‍ය ප්‍රතිකාර දෙන්න ආවා" ඩිමෙලෝ නම් ඉන්දියානු දන්ත වෛද්‍ය සහායකයා, රිය නවත්වද්දීම මට කීය. "මේ ජෝඩුව හරිම සැරයි. හදල දුන්නු දත්කුට්ටම හරි නැහැ කියල, දන්ත වෛද්‍යවරයාට හොඳටම දොස් කිව්වා! ඔහු මේ රටේ තරුණයෙක්. මෙහෙ නාකි


http://sherlockholmesinvestigations.blogspot.com

මිනිහගේ සැර පරුෂ කථාවට, දොස්තර මහත්තයාගේ හිත හරියට නරක්වුණා. ඊට පස්සේ දිගටම අපි මේ ගෙදර මගහැරියා" සහායකයා මට කීවේය.

රියදුරා වැන්රිය නිවස ඉදිරිපිට නවතා නළාව හැඬවූයේය. මිනිත්තු කිහිපයකින් දොර විවෘත කරගෙන එළියට පැමිණියේ වයස්ගත මහත්මයෙකි. වැන්රිය දෙස ඔහු මඳ වේලාවක් බලාසිටියේ, එය හඳුනාගැනීමට අපහසු වී තිබූ නිසාය. මොහොතකින් රිය හඳුනාගත් පසු, ඔහුගේ මුහුණට නැඟුණේ ප්‍රසන්න පෙනුමක් නොවේ.

"ඔහේලා ආවේ බොහොම කාලෙකින් නේ. මෙච්චර කාලයක් කොයි ලෝකෙ ගිහින් හිටියද?" ඔහු ඇසුවේ රළු හඬිනි.

අවුරුදු හැත්තෑපහක් අසූවක් වයස් වූ ඔහු, ඒ වේලාවේ සිගරට්ටුවක් දල්වාගෙන දුම් ගුළි හෙළමින් සිටියේය. උස, ඉතා කෙට්ටු සිරුරක් තිබූ ඔහුගේ මුහුණේ තිබුණේ, කේඩෑරි වූ පෙනුමකි. මඳ වේලාවක් ගතවෙද්දී ඔහුගේ බිරිඳ ද ආලින්දයට පිවිසියාය. සැමියා මෙන්ම ඉතා කෙට්ටු තැනැත්තියක් වූ ඇයගේ, ශරීරයේ ඉහළ කොටස මඳක් කුදු ගැසී තිබිණ. තරමක් කෙටිව කැපූ හිසකෙස් සම්පූර්ණයෙන්ම සුදු පැහැවී තිබිණ. රන්වන් රාමුව සහිත උපැස් යුගලක් පැළඳ සිටි ඇය, අප පිළිගත්තේ සිනාමුසු මුහුණෙනි. ඇය ද වයස අවුරුදු හැත්තෑව ඉක්මවා ගොස් ඇතැයි මම අනුමාන කළෙමි.

මගේ සහායකයා වූ ඩිමෙලෝ, ගෙහිමි යුවළට මා හඳුන්වා දුන්නේය. දන්ත වෛද්‍ය සේවය ගැන අප්‍රසාදයට පත්ව සිටි නිසාදෝ, ගෙහිමියාගේ මුහුණේ ඇතිවූයේ එතරම් සුහද පිළිගැනීමක් නොවේ.

"මම තෝමස් නෙල්සන්. මේ මගේ බිරිඳ ජෙනිෆර්. මට ටොම් කියල කථා කරන්න. ඔබ ඉන්දියානුවෙක්ද?" ඔහු ඇසුවේය.

"නැහැ. මම ශ්‍රීලංකාවෙන්" මම පිළිතුරු දුනිමි.

"කොහේ වුණත් කමක් නෑ. අපට තියෙනවා සෞඛ්‍ය ප්‍රශ්න. එහෙම නේද ජෙනී?"

නෙල්සන් මහතා පැවසුවේ සිගරට්ටුව දකුණු අතේ ඇඟිලි අතරට ගෙන මුවෙන් දුම්ගුළියක් පිටකරමිනි. "මගේ බිරිඳට එංගලන්තයේ දත් දොස්තර කෙනෙක්, කෘතිම දත්කුට්ටමක් හැදුවා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒක හොඳ කටේ පළඳින්න නෙමෙයි, පස් කපන බුල්ඩෝසරයකට සවි කරන්න. ඒක පැන්ඝයක් වටින්නේ නෑ. මං ඒක විසිකෙරුවා කුණු බාල්දියට."

ඉස්තෝප්පුවේ අඳුන්වල හිඳගන්නා මෙන් සංඥාකොට ඔහු යළිත් කථාව ඇරඹුවේය.

"ඔහේට පුළුවන්ද ඉලන්දාරියා, මගේ ජේනීට අලුත්ම දත්කුට්ටමක් හදන්න? හොඳට මතක තියාගන්නවා. ඒක පැළඳ ගත්තාම ඇගේ හිනාව ඉතාම අලංකාර එකක් විය යුතුයි."

"අපි උත්සාහ කරල බලමු" මා පිළිතුරු දුන්නේ එතරම් විශ්වාසයකින් නොවේ.

"ටොම්" කාන්තාව කථාකළාය. "මගේ දත් බඳින වැඩේට කලින්, ඔයාගේ කටේ අසනීපෙ මේ දොස්තර මහත්තයාට පෙන්නුවොත් හොඳයි නේද?"

නෙල්සන් මහතා මුලින් එයට අකමැති බවක් පෙන්නුවත්, පසුව බිරිඳගේ පෙරැත්තය නිසා ඊට එකඟ විය.

ඔහුගේ නම හා අනෙක් සෞඛ්‍ය තොරතුරු විමසා, මම ඒවා කාඩ්පතක සටහන් කළෙමි. අනතුරුව ඔහුගේ මුඛය පරීක්ෂා කර බැලීමි. ඔහුගේ වම් කම්මුල ඇතුළු පැත්තේ රුපියලේ කාසියක් තරම් විශාල පැල්ලමක් විය. තැනින් තැන වණවීම ද සහිත එය කුමක්දැයි බැලූ බැල්මට මට හඳුනාගත හැකිවිය. ඒ, අධික ලෙස දුම්පානය කරන්නන්ගේ සහ බුලත්විට සපන්නන්ගේ සෑදෙන මුඛ පිළිකාවේ, මූලික අවස්ථාවයි. නෙල්සන් මහතා අධික ලෙස දුම්පානය කරන්නෙක් බව ඝාසයක් ඇති ඕනෑම කෙනෙකුට පහසුවෙන්ම වටහා ගත හැකි කුරුණක් විය.

"නෙල්සන් මහත්මයා" මම කීවෙමි. "ඔබ වහාම ශල්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතුයි. මං ඔබට ලිපියක් දෙන්නම්. ඊස්ටමන් දන්තාරෝග්‍ය ශාලාවට ගිහිං, මහාචාර්ය ඩාලිං හමුවෙන්න."

"මොකක්ද මහත්මයා මේ අසනීපෙ?" බියෙන් තැතිගත් නෙල්සන් මහත්මිය විමසුවාය.

"මට ඒ ගැන හරියටම කියන්න බැහැ." මම කීවෙමි. "මහාචාර්යතුමා මේ කොටස කපා ඉවත්කරලා, එය අණ්වීක්ෂයෙන් පරීක්ෂා කරලා, රෝගය නිශ්චය කරාවි. මං ඔහුට දුරකතන යෙනුත් දන්වන්නම්."


http://sherlockholmesinvestigations.blogspot.com

අපගේ හමුවීම එදිනට එතැනින් නිමාවිය.

දින හතරකට පසු මම තෙල්කන් මහතා දැකීමට යළිත් වරක් ඔහුගේ නිවසට ගියෙමි. එදා මට ලැබුණේ ඉතා උණුසුම් පිළිගැනීමකි. ඔහු මහාචාර්යතුමා වෙත නොපමාව යැවීම ගැන, ඔවුහු මහත් සතුටට පත්ව සිටියහ.

"මහාචාර්ය ඩාලිං මාව එවෙලේම ඔහුගේ වාට්ටුවට ඇතුළුකර ගත්තා. ඔබ මේ රෝගය හඳුනාගැනීම ගැන, ඔහු හරියට ඔබට ප්‍රශංසා කළා......" තමාට ලබාදුන් ප්‍රතිකාර ගැන ඔහු දිගින් දිගටම විස්තර කළේ ඉමහත් සතුටෙනි. තෙල්කන් ජෝඩුව මුව නොසෑහෙන සේ මට ස්තූති කළහ.

මීළඟට මම සතියකට දෙවරක් ඔවුන්ගේ නිවසට ගොස් තෙල්කන් මහතා පරීක්ෂා කර බැලුවෙමි. ඔහු දුම්බීම සම්පූර්ණයෙන්ම අත්හැරිය දුම්මෙය. ඒ, මහාචාර්යතුමා තරයේම අවවාද කිරීම නිසයි. දුම්බීම අත්හළ නිසාම තෙල්කන් මහතාගේ කටේ තුවාලය ද ඉක්මනින් සුවවිය. ජෙනිෆර් තෙල්කන් මහත්මියට කෘතිම දත් සකස් කිරීම, මට මීළඟට පැවරිණි. එය සාර්ථක ලෙස නිමකිරීමට තරම් මම වාසනාවන්ත වීමි. මේ නිසා වයසක තෙල්කන් ජෝඩුව මා සමග කොතරම් කුළුපග වූවාද යත්, සතියකට තුන්හතර වතාවක් ඔවුන්ගේ නිවසට පැමිණෙන මෙන් මට ඇරයුම් කළහ.

මේ කාලය වන විට, මගේ මිත්‍ර තිලක්ට ලීඩ්ස් නගරයේ රෝහලක පත්වීමක් ලැබී තිබිණි. රාජකාරි අවසන් කොට හැන්දෑයාමයේ ආපසු නිලනිවසට පැමිණි පසු, මට දැනුණේ දැඩි පාළු බවකි. දීර්ඝ සන්ධ්‍යා යාමය ගෙවා දැමීමට ක්‍රමයක් සොයාගත යුතු බව මම තේරුම් ගත්තෙමි.

තෙල්කන් යුවළ හැන්දෑ යාමය ගතකළේ "බ්‍රිජ්" නමින් හැඳින්වෙන කාඩ් ක්‍රීඩාවේ යෙදෙමිනි. පේරාදෙණි සරසවියේදී මිතුරන් සමග "බ්‍රිජ්" ක්‍රීඩාවේ යෙදීම නිසා, මට ද ඒ පිළිබඳ යම් දැනුමක් තිබිණි. තෙල්කන් නිවසේ කාඩ් ක්‍රීඩා කිරීම සඳහා අසල්වැසියෝ කිහිපදෙනෙක් ද පැමිණියහ. එයින් එක් අයෙක් වූයේ විශ්‍රාමලත් පොලිස් නිලධරයෙකු වූ ඩොනල්ඩ් හක්ස්ලි මහතාය. අනෙක් දෙදෙනා ඉන්දීය සම්භවයක් තිබූ, සෑහෙන කලක් එංගලන්තයේ වාසයකොට සිටි බැනර්ජි යුවළයි.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔවුන්ගේ ක්‍රීඩාවට එකතුවීමට අලුත් සාමාජිකයෙකු ලෙස මා එකතුවීම ගැන ඔවුහු අතිශය සතුටට පත්වූහ. කාඩ් ක්‍රීඩාව අවසන් කොට, එක් දිනක් රාත්‍රියේ අපි කෝපි බොමින් පිළිසඳරේ යෙදී සිටියෙමු. අපේ මාතෘකාව වූයේ, ඉංග්‍රීසි ලේඛකයන්ගේ සාහිත්‍ය කෘති හා ඒවා ඇසුරින් නිර්මාණය වුණු චිත්‍රපටය.

"රාණි මොනවාද මේ දවස්වල කියවන පොත්?" නෙල්සන් මහත්මිය බැනර්ජි මහත්මියගෙන් විමසුවාය.

"රඩ්යාඩ් කිප්ලිංගේ නවත් කෙටිකතා එකතුවක් හම්බවුණා" බැනර්ජි මහත්මිය පිළිතුරු දුන්නාය.

"රාණි හැමදාමත් කියවන්න ආසා, ඉන්දියානු පසුබිමක් තියෙන පොත් වලට නේ. කිප්ලිං, ආර්.කේ. නාරායන්, තාගෝර්ගේ පොත් වලින් අපේ ගෙදර පිරිලා" බැනර්ජි මහතා කීය.

"මට ඩොක්ට ශිවාගෝ පොතේ හොඳ ඉංග්‍රීසි පරිවර්තනයක් ලැබුණා." හක්ස්ලි මහතා කීය. "හරිම අගේ ඇති කථාව. ජෙනිෆර්ට ගෙනැත් දෙන්නද කියවන්න?"

"අපේ මං ආස නෑ රුසියානු කථා වලට" නෙල්සන් මහත්මිය කීවාය. "ඒක නෙමෙයි. අපි අහමු අපේ තරුණ දොස්තර මහත්තයා කැමති කාගේ පොත් වලටද කියලා" නෙල්සන් මහත්මිය ඇසුවේ කෝපි පෝච්චිය මා වෙතට ළං කරමිනි.

"මං පුංචි කාලෙ ඉඳලම කැමතියි, ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ, ෂර්ලොක් හෝම්ස් කථාවලට" මම පිළිතුරු දුන්නෙමි.

"මොනවා? හඃ හඃ හා!" නෙල්සන් මහතා මහහඬින් සිනාසුණේය. "අපූරුයි! අපූරුයි! ඔන්න ජෙනී අපි දෙන්නට හොඳයි. රහස් පරීක්ෂක කථා වලට කැමැති යාළුවෙක් නැතුව, අපි හිටියේ හරිම හිතේ අමාරුවෙන්. ජෙනී වඩාත්ම කැමැති කොනන් ඩොයිල්ටනේ. ඔන්න දූන් හරි" තම කෝප්පය කෝපි වලින් පුරවා ගත් නෙල්සන් මහතා නොනවත්වාම සිනාසුණේය. බැනර්ජි හක්ස්ලි දෙදෙනාම ඔහුට හවුල්වූහ.

"මොනවා?" නෙල්සන් මහත්මිය ඇසුවේ මහත් පුදුමයෙනි. "ඔබ කැමැති ආතර් කොනන් ඩොයිල්ටද? අනේ කොච්චර එකක්ද? ආසියාවේ ඈත කෙළවරේ, අපි නම නොදන්නා රටවල මිනිස්සුත් කොනන් ඩොයිල්ගේ වටිනාකම දන්නවා. අපේ මෝඩ මිනිසුන්ට තමයි එයාගෙ අගයක් නැත්තේ" ඇය කීවේ චෝදනා මුඛයෙනි.

Reading Purpose Only - Not For Print



http://sherlockholmesinvestigations.blogspot.com

"මට නම් ෂර්ලොක් හෝම්ස් පෙන්වන්න බෑ". හක්ස්ලි මහතා කීය.

"ඒකෙ පුදුමයක් නෑ ඩොනල්ඩ්" නෙල්කන් මහත්මිය ගත් කටටම කීවාය. "ඔයා පොලිස්කාරයෙක් නේ. පොලීසියේ අය මොන තරම් මෝඩද කියලා අපට තේරෙන්නේ, ෂර්ලොක් හෝම්ස් කථා කියවන කොට."

මෙයට හක්ස්ලි මහතාගේ මුහුණ කෝපයෙන් රතුවුවත්, ඔහු එයට පිළිතුරක් දුන්නේ නැත.

"මමත් කැමැතියි ඉන්දියාව ගැන විස්තර කරල තියෙන "ද සයින් ඔෆ් ෆෝ- (සිව්රහස් සලකුණ) කථාවට" බැනර්ජි මහත්මිය කීවාය. "ඒකෙ ඉන්දියානු කැරැල්ල ගැන විස්තර කරලා තියෙනවා හරිම ලස්සනට. මං කිසිම දවසක, කිසිම පොතක ඉන්දියානු කැරැල්ල ගැන ඒ තරම් අලංකාර විස්තරයක් කියවල නෑ."

"ඒ කථාවත් හොඳයි" මම කීවෙමි. "ඒ වුණත් කථා හැම එකක්ම එකකට එකක් පරදින්නේ නෑ. මේ තරම් රසවත් කථාන්තර ගොතන්න, ෂර්ලොක් හෝම්ස් වගේ චරිතයක් නිර්මාණය කරන්න, කොනන් ඩොයිල් මොන තරම් දක්ෂයෙක් වෙන්න ඇද්ද....."

"....... ෂර්ලොක් හෝම්ස් චරිතය නිර්මාණය කරන්න?" ඇසූ නෙල්කන් මහතා මා දෙස තත්පර කිහිපයක් නිහඬව බලා සිටියේය. අනතුරුව ඔහු කථාව පටන් ගත්තේ සුපුරුදු ගැඹුරු කට හඬෙනි. "ෂර්ලොක් හෝම්ස් කියන්නේ ඇත්තටම ජීවත්වුණු කෙනෙක්. මං පුංචි කාලෙ. ඔහුගේ බේකර් වීථියේ 221B නිවසට ලියුම් පවා ලියල තියෙනවා. ඒවාට උත්තරත් ආවා."

"ඔබ දන්නවාද දොස්තර මහත්මයා" නෙල්කන් මහත්මිය කථාව පටන්ගත්තාය. "ඔය කථා වලින් වැඩි හරියක් ඇත්ත කථා. දොස්තර වොට්සන් කියන නාමයෙන් පෙනී හිටියේ දොස්තර කොනන් ඩොයිල්."

"රාණී මොකද කියන්නේ?" නෙල්කන් මහත්මිය ඇසුවාය.

"අනේ මං දන්නේ නෑ. කතා කියවන කොට නම් හිතෙන්නේ ෂර්ලොක් හෝම්ස් ඇත්තටම මේ ලන්ඩනයේ ජීවත්වුණා කියලයි."

රෑ බෝවී තිබූ බැවින් අපේ කතාබහ එදිනට එතෙකින් අවසන් විය.

* * *

http://sherlockholmesinvestigations.blogspot.com

ඉන්පසුව කිහිප වරක්ම සැන්දෑකාල වල මම නෙල්කන් නිවසට ගියෙමි. ෂර්ලොක් හෝම්ස් කථා ගැන නොයෙක් ප්‍රශ්න අසමින්, මා ඇත්තෙන්ම හෝම්ස් ලෝලියෙක්දැයි පරීක්ෂා කිරීමට ඔවුහු, මා වෙත ප්‍රශ්න ඉදිරිපත් කළහ.

"ඔබ හිතන්නේ හෝම්ස් කථා තියෙන්නේ හැටයි කියලද?" වරක් නෙල්කන් මහතා මගෙන් ඇසීය.

"ඔව්. කෙටි ඒවා 56යි. දිග ඒවා 4යි" මම පිළිතුරු දුනිමි.

"නෑ පුතා" ඔහු කීය. "කථා හැටට වඩා තියෙනවා. ඒවා කියවපු අයත් ඉන්නවා. එහෙම නේද ජෙනී?"

සැමියාගේ ප්‍රශ්නයට පිළිතුරක් නොදී, ඇය සිය සැමියා දෙසත් මා දෙසත් මාරුවෙන් මාරුවට බැලුවේ, සිතේ සඟවාගෙන සිටි රහසක් එළිකිරීමට සූදානම්වන තැනැත්තියක ලෙසිනි. මඳ වේලාවක් කල්පනා කරමින් සිටි ඇ, තීරණයකට පැමිණි බැව් ඇගේ මුහුණෙන් දිස්විය.

"පුතා." ඇය කීවාය. "ඔබ උපතින් ආසියාතිකයෙක් වුණත්, අපි ඉංග්‍රීසි ජාතිකයන් වුණත්, ඔබ දැන් අපට අපේම පුතෙක් වගෙයි. අපට දරුවන් හැටියට හිටියේ පුතුන් දෙන්නෙක් විතරයි. ලොකු පුතා වැඩිදුර ඉගෙන ගන්න ඇමරිකාවට ගිහිං, එහේදි විවාහ වෙලා එහේම නැවතුණා. ඔහු අපි ගැන බලන්න අවුරුදු තුන හතරකට වත් එංගලන්තයට එන්නෙ නෑ. අපි දෙන්න ගැන හැමදාමත් බැලුවේ පුංචි පුතා. ඔහු ගුවන් යානා නියමුවෙක් වෙන්න පුහුණු වෙමිනුයි හිටියේ. ඔහු හදිසි අනතුරකින් මියගියා."

නෙල්කන් මහත්මියගේ දෑස් වලින් කුඩුළු කැට නොනැවතී කඩා හැළෙන අයුරු මට බලාසිටීමට නොහැකිවිය. මඳ වේලාවක් නිහඬව සිට හැඬුම පාලනය කරගත් ඇය, යළිත් කථා කළාය.

"පුංචි පුතාගේ මරණයෙන් පස්සේ ඔහුගේ බිරිඳ, ඔවුන්ගේ පුංචි දරුවන් දෙදෙනාත් අරගෙන ඕස්ට්‍රේලියාවේ පදිංචියට ගියා. අපි දැන් වළ පයයි ගොඩ පයයි ඉන්න මිනිස්සු. අපි අපේ දේපොළ ඒ මිනිපිරියන් දෙදෙනාට ලියනවා. ඒත් පුතා ඔබ අපට කළ උපකාරය අපට අමතක කරන්න බෑ."

"මං කළ උපකාරය? මොකක්ද මං කළ උපකාරය?" මම පුදුමයෙන් ඇසීමි.


http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ අපට නොකිව්වාට මහාචාර්යතුමා ඇත්ත තත්ත්වය අපට කිව්වා. ටොම්ගේ කලවේ හැදෙන්න පටන් අරගෙන තිබුණේ පිළිකාවක්. එහෙම නේද? පිළිකා රෝගයෙන් ටොම්ගේ ජීවිතය බේරා ගත්තේ ඔබ බව, මහාචාර්ය ඩාලිං අපට කිව්වා."

"ඒක මගේ රැකියාවේ හැටියට කළ දෙයක්."

"කොහොම වුණත් ඔබ අපට කළ උපකාරය සලකලා, අපි බොහොම අගය කරන දෙයක් ඔබට තෑගි කරනවා. ඒක ඔබත් හුඟක් අගය කරන බවට සැකයක් නෑ."

"ඔව් ජෙනී" නෙල්සන් මහතා කීවේ ඇගේ අත්දෙකෙන්ම අල්ලාගනිමිනි. "තෑග්ගක් දිය යුත්තේ ඒකෙ අගයක් දන්න පුද්ගලයාට. මේ තීරණය ගත්තේ මගේ ජෙනිෆර්. ඇය ගන්නා තීරණයක් කවදාවත් වැරදිලා නෑ."

කිසිවක් තේරුම් ගැනීමට අපහසුව මම ඔවුන් දෙදෙනා දෙස බලා සිටියෙමි.

"ඔබ අහල ඇති දෙවැනි ලෝක යුද්ධය ගැන" නෙල්සන් මහත්මිය කථාව යළිත් ඇරඹුවාය. "බොහෝවෙලාවට ඔබ නම් ඒ කාලෙ ඉපදිලාත් නැතුව ඇති. නමුත් ලන්ඩන් නගරයේ හිටි අපි, ලෝක යුද්ධෙදි මුහුණදුන්නේ මහ බිහිසුණු කාල පරිච්ඡේදයකට.

ජර්මන් කාරයෝ ගුවන්යානා වලින් ඇවිත් ලන්ඩනයට බෝම්බ දමන්න පටන්ගත්තා. නගරය පුරාම සිදුවුණේ මහ විනාශයක්. මිනිසුන් පදිංචි ගෙවල්, ලොකු ගොඩනැගිලි, බැංකු, රජයේ කාර්යාල, රෝහල් විශාල ගණනක් විනාශවුණා. නගරය පුරා ඇතිවුණු ගිනිගැනීම් අප්‍රමාණයි. මගේ තාත්තා ඒ කාලෙ සේවය කළේ ලන්ඩන් ගිනිනිවන හමුදාවේ. බෝම්බ වලට මිනිසුන් මියයද්දි, අනෙක් පුළුවන් අය ලන්ඩනය අත්හැරලා ඈත පළාත්වලට පැනගියා. ගින්නෙන් විනාශවෙලා, කඩාවැටුණු ගොඩනැගිලි වල තිබුණු බඩුගන්න කිසිවෙක් හිටියෙ නෑ. සමහර තැන්වල තිබුණු බඩුමුට්ටු, ගිනිනිවන හමුදා භටයෝ තමන්ගේ ගෙවල්වලට අරගෙන ආවා. අපේ තාත්තා අරගෙන ආ බඩු අතර මට නම් වැඩකට ඇති දෙයක් කියලා තිබුණේ එක දෙයයි. ඒ මොන වගේ දෙයක් කියලද ඔබට හිතෙන්නේ?"

"මට නම් හිතාගන්න අමාරුයි."

"ඔව්. ඔබට අවුරුදු ගණනක් හිතුවත් ඒක නම් හිතන්න බැහැ" ඇය කීවාය. "ඒ තමයි මහ ලොකු, මලකඩ කෑ ට්‍රන්ක පෙට්ටියක්.

http://sherlockholmesinvestigations.blogspot.com

මේ යකඩ පෙට්ටිය තනි මිනිහෙකුට උස්සන්න පුළුවන් එකක් නෙමෙයි. තාත්තට ඒක හමුවෙලා තිබුණේ ගිනිගත්තු බැංකු ගොඩනැගිල්ලක බිම් මහලේ සුරක්ෂිතාගාරයේ තිබිලා.

බෝම්බ දමන්න පටන්ගනිද්දි සුරක්ෂිතාගාරයේ තිබුණු රත්තරන් වගේ සැහැල්ලු බඩු, බැංකු නිලධරයන් ඉවත්කරගෙන ගිහින් තියෙනවා. ඉතිරිවෙලා තිබිලා තියෙන්නේ මේ වගේ ඉබ්යතුරු දාමූ, ලොකු ට්‍රන්ක පෙට්ටි පමණයි. කවුරු හරි මේක සුරක්ෂිතාගාරයේ තියන්න ඇත්තේ බොහොම වටිනා දෙයක් නිසා වෙන්න ඇති කියල තාත්තා හිතල තියෙනවා. ඔහු ඒක ගෙදර අරගෙන ආව වෙලාවෙම අගුළ කඩලා ඇරල බැලුවා. ඒක පිරෙන්න තිබුණෙ මොනවද දන්නවද? මොනවද?

ෆුල්ස්කැප් පිටුවල තීන්තෙන් ලියූ හා ටයිප් කළ ලියවිලි මහා සම්භාරයක්. පිටු පනහ හැට, සිය ගණනින් එකට රෝල් කරලා ටේප් පටිවලින් ගැටගහලා. තවත් සමහරක් දුඹුරුපාට කඩදාසි කවරවල දමලා, ලාකඩ වලින් සීල් තියලා. තාත්තා ඒකෙ හැමතැනම අවුස්සලා බැලුවා. නමුත් වටිනා කියන කිසිම දෙයක් හම්බවුණේ නැහැ. ඔහුට හොඳටම තරහ ගියා. ඔහු සූදානම් වුණේ ඒ ලියවිලි ඔක්කොම ගිනිතියල විනාශකරල දමන්න. නමුත් මගේ අම්මා ඒකට ඉඩදුන්නේ නැහැ. මේ විධියට බැංකුවක ආරක්ෂාවට තියන්න ඇත්තේ, ඒ ලියවිලි වල මොකක් හරි වටිනාකමක් තිබෙන නිසා වෙන්න ඇති" කියල ඇය කීවා.

"ඒ දවස්වල මගේ ලොකු පුතාට අවුරුදු දෙකයි. පුංචි පුතා ඉපදිලා නැහැ. පුතාට නින්ද යනතුරු ඉඳලා, මං ඒ ලියවිලි අරගෙන එකින් එක කියවලා බැලුවා.

දෙවියනේ! මට මගේ ඇස් අදහාගන්න බැරිවුණා. මොනවද ඒ තිබුණේ? ඒවා තීන්තෙන් ලියා සහ යතුරු ලියනය කරලයි තිබුණේ. මං කුඩා කාලේ ඉඳන් ෂර්ලොක් හෝම්ස් කථා හැම එකක්ම කියවා තිබුණා. ඒත් මේවා කිසිදිනෙක මා නොකියවූ ෂර්ලොක් හෝම්ස් කථා බව දැකලා, මගේ හිතේ ඇතිවුණේ මහ පුදුමයකට පත් හැඟීමක්! ඒ වගේම දරාගන්න බැරි සතුටක්!

මං ට්‍රන්ක පෙට්ටියේ පියන් පිටපැත්ත පරීක්ෂා කරල බැලුවා. ඒකෙ තීන්තෙන් ලියා තිබුණු යමක්, මලකඩ තට්ටුව හා දූවිලි නිසා

http://sherlockholmesinvestigations.blogspot.com

වැසී ගිහින් තිබුණා. මං බෝතල් කටුවක් අරගෙන, පෙට්ටියේ පියන සූරලා බැලුවා. එහි සඳහන්ව තිබුණේ මොකක්ද දන්නවද?

JOHN. H. WATSON M.D.
LATE INDIAN ARMY

මං දන්නවා පුතා. ඔබට මේක විශ්වාස කරන්නත් අමාරු වේවි. නමුත් මගේ ඒ නිධානය මං ඔබට පෙන්වන්නම්."

නිවස ඇතුළත ගබඩා කාමරයක් වෙත ඔවුහු මා කැඳවාගෙන ගියහ. බිත්ති අල්මාරියක පහළම තට්ටුවේ ඉගාඩගසා තිබූ, පරණ ඇඳුම් හා ඇඳ ඇතිරිලි රාශියක්, නෙල්කන් මහත්මිය ඉවත් කළාය. එවිට ඇය මෙතරම් ආරක්ෂා කළ වස්තුව මට දැකගන්නට ලැබිණ. ඉබියතුරු දමා තිබූ යකඩ පෙට්ටිය, අල්මාරියෙන් එළියට ගැනීම ඉතා අපහසුවිය. එය බිම දිගේ විසිත්ත කාමරය වෙත ඇදගෙන ඒමට අපි සමත්වීමු.

"ජෙනීගේ ආශාව තිබුණේ කවදාහරි, මේක අපේ පුංචි පුතාට දෙන්නයි" නෙල්කන් මහතා කීවේය. "ඔහු අකාලයේ මියගිය නිසා, මේකට කුමක් කළ යුතුද කියල හිතාගන්න බැරුවයි අපි හිටියේ. මං බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට කථා කළා. ඔවුන් මං කීව දේවල් ඒ තරම් බැරෑරුම්ව ගත්තේ නෑ. ඔවුන් කිව්වා මට රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට කථාකරන්න කියල. මං දෙගමනක් ඔවුන්ටත් කිව්වා. ඒත් උන් ඒක කිසි ගණනකට ගත්තේ නෑ. උන් හිතුවේ මේ මොළේ හරක්වුණු හාකි මිනිහෙකුගේ බහුබූත කියලයි. අඩුම ගණනේ මේව පරීක්ෂා කරල බලන්න, මිනිහෙක් එවන්නවත් උන්ට උවමනාවක් තිබුණේ නැහැ."

රෙදි කැබැල්ලක් ගෙන පෙට්ටිය පිසදැමූ නෙල්කන් මහත්මිය, යතුරු කැරැල්ලකින් ඉබියතුරු විවෘත කළාය. පෙට්ටියේ පියන මලකඩ කා තිබීම නිසා, විවෘත කිරීම තරමක් අපහසු විණි.

ඇය කී අයුරින්ම එහි තිබුණේ, ඉතා ක්‍රමානුකූලව වෙන් වෙන්ව ගැට ගසා තිබූ ලියවිලි රාශියකි. බොහොමයක් ලිපිලේඛන දුර්වර්ණ වුවද, හොඳින් ආරක්ෂාවී තිබූ බව මම දුටුවෙමි. එහෙත් ඒ අතර කෘමීන් විසින් කා දමා තිබූ හා තෙතමනය නිසා දිරාගොස් පතුරුවලට කැඩුණු ලේඛන ගණනාවක්ම විය. එකට අමුණා

http://sherlockholmesinvestigations.blogspot.com

නොතිබුණු ෆුල්ස්කැප් පිටු රාශියක් පැරණි පුවත්පත්වලින් ඔතා ඒවයින් නූල්වලින් බැඳ තිබූ බව මම දුටුවෙමි.

"ඒ දවස් වලම මං මේකෙ තිබුණු කඩදාසි ඔක්කොම එළියට අරගෙන පරීක්ෂා කරල බැලුවා" නෙල්කන් මහත්මිය කීවාය. "සමහර ඒවා කාවුන් විසින් කෑලි කෑලිවලට කපලා. තවත් ඒවා පොත්ගුල්ලන් විදලා. ඒ ගමන මම හොඳට තිබුණු කොළ එකතු කරලා පත්තරවලින් ඔතලා තැබුවා. මං තමයි මේකට කපුරු බෝල දැම්මේ."

මම එක් කඩදාසි මිටියක් ලිහා බැලුවෙමි. "කර්නල් වෝබටන්ගේ උමතුව" යනුවෙන් එහි සඳහන් විය. තවත් එකක් "තෝමස් නාදිතෙර වික්‍රමය" නම් විය. මේවා අග JHW යනුවෙන් අත්සන් කොට තිබිණි.

"ඔබට හිතෙන්නේ මේක බොරුවක් වංචාවක් කියලද?" මා නිහඬව සිටිනු දුටු නෙල්කන් මහතා ඇසීය.

"කොහොමටවත් නෑ" මම පිළිතුරු දුනිමි. "මේක තමයි දොස්තර වොට්සන්, කොක්ස් සහ සමාගමේ සුරක්ෂිතාගාරයේ තැබූ ට්‍රන්ක පෙට්ටිය. ඔහුගේ ගල්පාළමේ අභිරහස කථාවේ මුලම ඒ බව සඳහන් වෙනවා, ඔබට මතක ඇති."

"පුතා." නෙල්කන් මහතා යළිත් කීය. "ඔබ එහෙම කිව්වට ඇයි රාජ්‍ය ලේඛනාගාරයේ මිනිස්සු මේක පරීක්ෂාවට නාවෙ? මේක බොරු වංචාවක් කියල උන් හිතන්න ඇති. සැකයක් නෑ."

"මෙතැන කිසිම වංචාවක් නෑ" මම පිළිතුරු දුන්නෙමි. "වංචා සහගත අදහසකින් මෙහෙම දෙයක් කරන්න කාටහරි හිතුණා කියමු. ඒත් සාර්ථකව මේ තරම් පරීක්ෂණ සටහන් සංඛ්‍යාවක් ලියන්න පුළුවන් කෙනෙක් මේ ලෝකෙ බිහිවුණා කියල මං හිතන්නේ නෑ.

ඒක නෙමෙයි නෙල්කන් නෝනා, ඔබ දෙදෙනා සතුව තියෙන්නේ මහා අනර්ඝ වස්තුවක්. පොත් ප්‍රකාශන සමාගමකට නැත්නම් පැරණි ලියවිලි එකතු කරන්නෙකුට මේකෙ ඇති වටිනාකම මිල කරන්න බෑ."

"ඒක එහෙම වෙච්චාවේ" ඇය කීවාය. "නමුත් දැන් අපි මේක ඔබට තෑගි කරනවා."

"මං කොහොමද මේ වගේ වටිනා දෙයක් තෑග්ගක් හැටියට ඔබෙන් ගන්නෙ? ඔබ මේක විකුණනවා නම්......"

http://sherlockholmesinvestigations.blogspot.com

"විකුණන්න? විකුණන්න? ඒක කරන්නේ නෑ කොහොමටවත්" නෙල්සන් මහතා කීවේ උස්හඬිනි. "ඔබ විදේශිකයෙක් වුණත් පවුලේ කෙනෙකුට වඩා අපට පිහිටවුණා. ආණ්ඩුවට එපා කිව්වාට ක්‍රිස්ටි හෝ සදර්බි වගේ පරණ බඩු විකුණන තැනක් බොහොම කැමති වේවි මේක මිලට ගන්න. නමුත් අපි විකුණන්නේ නෑ. ඔබටත් එපා නම්....."

"නෑ මං කීවේ" මම ඒ කථාවට බාධා කළෙමි. "මේක මට ඉතාම අනර්ඝ වටිනා දෙයක් බව මං හංගන්නේ නෑ. නමුත් කවුරු හරි කියන්න ඉඩ තියෙනවා....."

"එහෙම හිතන්න එපා පුතා. මේක අපි ඔබට සන්තෝෂයෙන් දෙන තෑග්ගක්. ඔබ මේක භාරගන්නවා නම්, මං කැමතියි අදම, මේ දූත් අරගෙන යනවා නම්" නෙල්සන් මහත්මිය තම අවංක හැඟීම් හෙළි කළාය. ඇය එසේ කීවේ මට තවත් කථා කිරීමට ඉඩ නොතබා තීරණාත්මක අයුරෙනි.

ඉතින් මා කුමක් කරන්නද? මා කිසිදිනෙක නොකියවූ ෂර්ලොක් හෝම්ස්ගේ වික්‍රම රැසක් ඔවුන් මට පරිත්‍යාග කරන්නේ නම් එය කෙසේ ප්‍රතික්ෂේප කල හැකිද? ඔවුන් දෙදෙනාට මගේ හෘදයාංගම ස්තූතිය පුදකොට මම එය භාරගතිමි.

එදින රාත්‍රියේම කුලීරියක් කැඳවාගෙන, රියදුරාගේ ද උදව් ඇතිව එය පටවාගෙන, මගේ නිල නිවස වෙත ගෙන ආවෙමි.

එදා රාත්‍රියේ මගේ සිතේ පැවැති සන්තෝෂය කොතරම් විද යත්, එක් කථාවක් හෝ දිගටම කියවාගෙන යෑම සඳහා, සිත තැන්පත් කරගැනීමට මට නොහැකිවීය. මගේ සිතට දැනුණේ බලාපොරොත්තු නොවූ තරම් සෙල්ලම් බඩු රාශියක් තෑගි ලැබුණු දරුවෙකුගේ සිතට ඇතිවන හැඟීමය. පැකට්ටු කිහිපයක්ම විවෘතකර, පිටු කිහිපයක් පෙරළා බලා ආපසු තැබීමි. දොස්තර වොට්සන් අපට පවසා ඇති, ෂර්ලොක් හෝම්ස්ගේ මුල්කාලයේ වික්‍රම කිහිපයක් ද අතරින් පතර මට හමුවිය. සමහර අත්පිටපත් අකුරින් ලියා හෝ යතුරු ලියනය කර, මුද්‍රණය සඳහා යැවීමට සූදානම්ව තිබිණි. තවත් ඒවා සකස් නොකළ, දළ අත්පිටපත් බව මම තේරුම් ගතිමි. මේවායේ කථාන්තරය සම්පූර්ණයෙන්ම

http://sherlockholmesinvestigations.blogspot.com

අඩංගුය. එහෙත් හොඳින් සංස්කරණය නොවූ නිසාදෝ වොට්සන්ගේ සුපුරුදු ශෛලියෙන් ඈත්වූ බවක් මම දුටුවෙමි. රාත්‍රී දෙක පමණ වෙද්දී සියල්ල පෙට්ටිය තුළට දමා නින්දට යෑමට මම තීරණය කළෙමි. මහා වටිනා නිධානයක් පහළවූ අයෙකුගේ මෙන් සිත චංචලව පැවැතීම නිසා, මට ඒ රාත්‍රියේ සුවසේ නිදාගැනීමට පවා නොහැකි විය.

දිගු කලක් අධික ලෙස දුම්පානය කර තිබීම නිසා තෙල්කන් මහතා යළිත් වරක් රෝගී තත්ත්වයට පත්විය. මුඛ පිළිකාවෙන් ගැළවුණත්, නියුමෝනියා රෝගයෙන් හා හෘදයාබාධයෙන් දිවි ගලවා ගැනීමට ඔහුට නොහැකිවිය. ඔහු රෝහලේදී මියයද්දී ඔහු අසල සිටියේ තෙල්කන් මහත්මිය, බැනර්ජි යුවළ හා මා පමණි. ඔහුගේ අභාවය ගැන දන්වා යැව්වත් වැඩිමහල් පුතාගෙන් හෝ ලේලියගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි.

සැමියාගේ වියෝවෙන් පසු තනිවූ තෙල්කන් මහත්මිය, වැඩිහිටි නිවාසයකට ඇතුළුවීමට තීරණය කළාය. ඇය අවුරුද්දකට වැඩි කාලයක් එහි සතුටින් කාලය ගත කළාය. ඇයට ප්‍රතිකාර කිරීමට සිදුවූයේ අධික රුධිර පීඩනයට පමණි. එක් උදෑසනක ටොරිංටන් ආර්යා වැඩිහිටි නිවාසයෙන් මා වෙත දුරකතන ඇමතුමක් ලැබිණි. ජෙනිෆර් තෙල්කන් මහත්මිය නින්දේදීම මෙලොව හැරගොස් ඇතිබව ආයතන භාර නිලධාරිනිය මා වෙත දැනුම් දුන්නාය. මගේ දෙමාපියන් තරමට මා වෙත සෙනෙහසක් දැක්වූ තෙල්කන් යුවළගේ වියෝවෙන් දැඩි ශෝකයට පත් මම, එංගලන්තයේ එම ප්‍රදේශය අතහැර දමා ඈත පිටිසර, කෝන්වෝල් ප්‍රාන්තයට යාමට තීරණය කළෙමි.

* * *

මා වෙත ලැබුණු ඒ කථාන්තර සියල්ල මා තවමත් කියවා අවසන් කර නැත. කියවා, මා රසවිඳි කථා ඔබ වෙත ඉදිරිපත් කිරීමට මම තීරණය කළෙමි.

මා කලින් ද සඳහන් කළ අයුරින් සමහර කථාවල, වොට්සන්ගේ සුපුරුදු භාෂා විලාසය නොමැති බව පෙනීයයි. තවත් ඒවායේ නොයෙකුත් අඩුලුහුඬුකම් ද ඉඳහිට දක්නට ඇත. ඒ ගැන මම ඔබෙන් සමාව අයැද සිටිමි. මේ කථා කියවා මා ලැබූ සතුට හා ආශ්වාදය ඔබට ද ඒ අයුරින්ම ලබාගත හැකිවේනම් එය මට සැනසීමකි.

http://sherlockholmesinvestigations.blogspot.com


ෂර්ලොක් හෝම්ස්

Reading Purpose Only... Not For Print.



ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්


http://sherlockholmesinvestigations.blogspot.com

# සුවපහසු නවාතැන

ෂර්ලොක් හෝම්ස් සමග බේකර් වීථියේ ජීවත්ව සිටි කාලයේ ඔහු යෙදුණු පරීක්ෂණ රැසකට මම ද සහභාගි වීමි. මේ හැම එකක්ම, විසඳීම සඳහා හෝම්ස් ඒ හාරවුණු පැටළුණු අවුල් සහිත, අභිරහස් ඒවා නොවේ. එවැනි ගැටලු නොවූ පරීක්ෂණ ගණනාවක් ද මගේ සටහන් පොත්වල වාර්තා වී ඇත. අද්භූත නේවාසිකයා පිළිබඳ කථාව, කොරමෝරන් පක්ෂියා පිළිබඳ සිද්ධිය හා සුවපහසු නවාතැන ආදී කථා මේ වර්ගයට අයත්වේ. දැන් මා ඔබ වෙත ගෙන ඒමට අදහස් කරන්නේ, අන්තිමට සඳහන් කළ සිද්ධියයි. එය ඉදිරිපත් කිරීමට මා විශේෂයෙන්ම සිතුවේ, බිලී වීවර් තරුණයාගේ අත්දැකීම, කවදා හෝ ඔබට ද මුහුණදීමට සිදුවිය හැකි, අත්දැකීමක් වීමට ඉඩ ඇති නිසයි.

ඒ 1900 වසරේ ජනවාරි මාසයේ දිනයකි. විසිවැනි සියවස උදාවීම පිළිබඳ විවිධ පුද්ගලයන් පළකළ මත වලින් පුවත්පත් පිරී පැවතිණ. ජනවාරි මාසයේ සිරිත් පරිදි බේකර් වීථිය වැසී පවත්නා ඝන මීදුම නිසා, අශ්වකරත්ත ගමනාගමනයේ අඩු බවක් දැකිය හැකිවිය. පුවත්පත් සියල්ල කියවා පසෙකට විසිකළ හෝම්ස්, තම හාන්සිපුටුවේ වැතිරී පයිප්පය උරමින් සිටියේය. එදා ඔහු පයිප්පයට දමා තිබුණේ, වර්ජීනියාවෙන් ගෙන්වූ, අවුන්සය පැන්ස අටක් වූ විශේෂ දුම්කොළ වර්ගයකි. එහි වූ සුවිශේෂ සුවඳින් මම ඒ බැව් තේරුම් ගතිමි. විසඳීමට තිබිම ගැටලුවක් නොමැති දිනවල, මනස නිදහසේ සැහැල්ලුවෙන් තබාගැනීමට අවශ්‍ය වූ විට, මේ සැර අඩු දුම්කොළ වර්ගය වඩා හොඳයයි මගේ මිත්‍රයා කීපවරක්ම සඳහන් කළේය. මගේ බිරිඳ සිය නැන්දණිය දැකීමට ගොස් සිටි බැවින්, මම දින කිහිපයක් බේකර් වීථියේ නිවහනේ ගතකළෙමි.

වෙලාව උදේ නවයට ළංවන්නට ඇත. වේගයෙන් ආ අශ්වකරත්තයක් අපේ නිවස ඉදිරිපිට නවත්වන ශබ්දය පැහැදිලිවම ඇසිණ. කල්පනාවේ අතැලී සිටි හෝම්ස්ට, එය ඇසුණ බවක් නොපෙනිණි. මීළඟට අසන්නට ලැබුණේ, බරට අඩි තබමින්

http://sherlockholmesinvestigations.blogspot.com

කවුරුන් හෝ අපේ තරප්පුව නැග එන ශබ්දයයි. එය එක්කෙනෙකුගේ නොව, දෙදෙනෙකුගේ පා ගැටෙන හඬ බව මම තේරුම් ගතිමි. දොර විවෘතකරගෙන පළමුවෙන්ම අපේ කාමරයට කඩාවැදුණේ, ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ පරීක්ෂක අපේ හිතවත් ලෙස්ට්‍රේඩ්ය. ඔහු සමග තවත් පුද්ගලයෙක් ද විය. ඒ තරුණයෙකි. ඔහු දෙස බැලූබැල්මටම මට සිතුණේ, තරුණයා සිහිමඳ ගතියකින් පෙළෙන්නෙකු අයුරෙනි. ලෙස්ට්‍රේඩ් අනෙකා කැඳවාගෙන ආවේ, තරුණයාගේ හිණ වටා අතයවා, ඔහු වත්නම් කරගෙනයි. අපට කිසිවක් කීමට මිනිත්තුවක් හෝ පමා නොවූ ලෙස්ට්‍රේඩ්, තරුණයා සෝපාවේ වාඩිකළේය. අනතුරුව තම සාක්කුවෙන් බ්‍රැන්ඩි බෝතලයක් එළියට ගත් ලෙස්ට්‍රේඩ් එයින් උගුරු කිහිපයක් තරුණයාට පොවා, ඔහු සෝපාවේ හාන්සි කරවීය. ඔහුට දඟලීමට නොහැකිවන සේ, ඔහුගේ දෑතෙන් ලෙස්ට්‍රේඩ් තදින් අල්ලාගෙන ද සිටියේය. ඡ්මාළයට විකාර වූ පුද්ගලයෙකු මෙන්, තරුණයා හිඳ දෙපසට හරවමින් සිටි අයුරු අප බලාසිටියේ, පුදුමයෙනි. අනතුරුව ක්ෂණයෙන් සන්සුන් වූ ඔහු නිදන්නට පටන් ගත් සැටි අපි දුටුවෙමු. ඒ දෙස බලා දිග සුසුමක් හෙළූ ලෙස්ට්‍රේඩ් අවසන අප ඇමතුවේය.

"මට සමාවෙන්න හෝම්ස් මහත්තයා" ඔහු කීය. "මට වෙන කරන්න දෙයක් තිබුණෙ නෑ. චාරිංක්‍රොස් දුම්රියපොළට උදේ පාන්දර ළඟාවුණු බඩු දුම්රියක, ගාඩ් කෙනෙක් තමයි මේ ඉලන්දාරියා මට භාරදුන්නේ. මොහු සිහිවිකල්වෙලා වගේ දුම්රියට ගොඩවුණාලු. ඒකත් පොලිස්භටයෙකුගේ ආධාරයෙන්. තමාව මරන්න කවුදෝ පිටිපස්සෙන් එන බව කියලා විලාප නගනවාලු. මට භාරදුන්නා විතරයි, මා ළඟ දණින් වැටිලා මට ආයාචනා කළා. ඔහුව මරන්න එන අයගෙන් බේරගන්න කියනවා මිසක්, වෙන කිසිම දෙයක් කියන්නෙ නෑ. මං මුලින් හිතුවේ ඔහු උන්මත්තකාගාරයකින් පැන එන රෝගියෙක් වෙන්න ඇති කියලයි. ඔහුව කෙළින්ම පොලිසියට අරගෙන යන්නයි මං හිතාගත්තේ. නමුත් ආයෙත් මට හිතුණා, සමහරවිට මොහු මොකක් හරි අභිරහසක පැටළුණු කෙනෙක් වෙන්න ඇති කියල. මතකද වයිට්හෝල් වලදි වරක් ඔබේ අයියා- මයික්‍රොෆ්ට් හෝම්ස් මහත්මයා අපට භාරදුන්නු මේජර් මැකෝම්ක්? ඔහුත් මේ වගේ උමතු ගතියෙන් හිටි පුද්ගලයෙක් නොවැ?"

http://sherlockholmesinvestigations.blogspot.com

ලෙස්ට්‍රේඩ් නොනවත්වාම කියාගෙන ගියේය.

"මේජර් මැකෝමික් සම්බන්ධ ගැටලුව ගැන මං ඔබට පසුව කියන්නම් වොට්සන්" හෝම්ස් කීවේ මා දෙසට හැරෙමිනි. "හොඳයි ලෙස්ට්‍රේඩ්. ඇයි ඔබට හිතුණේ ඔහු අභිරහසකට මැදිවුණු පුද්ගලයෙක් කියල? බාගවෙලාවට ඔහු ඔබ කිව්ව වගේ, උමතු ගතියකට නිතිපතා ඖෂධ පාවිච්චි කරන කෙනෙක් වෙන්න පුළුවනි. යම්කිසි හේතුවකින් ඖෂධ ගැනීම වේල් දෙක තුනක් අතපසු වෙලා, ඔහුගේ උමතු ගතිය උත්සන්න වුණා වෙන්නත් පිළිවන්. කවුරු හරි තමන් මරන්න සැරසෙනවා කියල, මරණ භයෙන් එහෙ මෙහෙ දුව ඇවිදීම උමතු රෝගවල ලක්ෂණයක්. එහෙම නේද දොස්තර මහත්මයා?"

"ඔව්. ඒක ඇත්ත." මම පිළිතුරු දුන්නෙමි.

"ඉතින් එවැනි රෝගියෙකුට අපි මේ අයුරින් බ්‍රැන්ඩි පානය කිරීමට සැලැස්වීම සුදුසුද වොට්සන්?"

"ඒකේ වරදක් නැහැ" මම කීවෙමි. "බරපතල මානසික රෝග නිසා ප්‍රචණ්ඩත්වයට පත්වෙන රෝගීනට දෙන්නේ, මධ්‍යම ස්නායු පද්ධතිය, සම්පීඩනයකට ලක්කරන ඖෂධ. බ්‍රැන්ඩි වල අඩංගු මද්‍යසාරයෙන් කෙරෙන්නෙත් එම ක්‍රියාවමයි."

"බාහිර පෙනුමෙන් නම් මොහුගේ වයස අවුරුදු 22ත් 24ත් අතර" හෝම්ස් කීවේ තම අසුනෙන් නැගිට තරුණයාගේ මුහුණ දෙස හොඳින් බලමිනි. "බලන්න ලෙස්ට්‍රේඩ් ඔහුගේ සාක්කුවල තියෙන්නේ මොනවද කියල."

"හ්ම්. ලන්ඩන් සිට ස්වින්ඩන් දක්වා ගොස්, ආපසු ඒමට මිලට ගත්, දුම්රිය ප්‍රවේශපත්‍රයක අඩක්. පවුම් දෙකයි සිලිං අටයි පැන්ස හතරක මුදල්. එතරම් ලොකු පොහොසතෙක් නෙමෙයි. මේ තියෙන්නේ ඔහුගේ ආගන්තුක පත්‍රය

**බිලී වීවර්**

ඖෂධ අලෙවි ප්‍රවර්ධක

මිඩ්ලන්ඩ් ඖෂධ නිෂ්පාදන සමාගම

ග්‍රේට් පෝට්ලන්ඩ් වීථිය

http://sherlockholmesinvestigations.blogspot.com

තවත් නම් සහ ලිපින ලියූ කඩදාසි කැබැල්ලක්- ඔහු යාමට නියමිත තැන් වෙන්න ඇති.

හරි. පැහැදිලිවම ඔහු, වෛද්‍යවරුන් ළඟට ගිහිං මිඩ්ලන්ඩ් සමාගමේ ඖෂධ ගැන ප්‍රචාරය කරන්නෙක්. එතකොට අපි මුලින් හිතූ විධියට මානසික රෝගයකට ගොදුරුවූවෙක් නෙමෙයි. එහෙනම් ඔහු කොහොමද මෙහෙම තත්ත්වයකට පත්වුණේ? මට හිතෙන්නේ ඔහු මොනව හරි දරුණු, බිහිසුණු, දෙයකින් අප්‍රමාණ භීතියට පත්වෙලා, මානසික කම්පනයකට ගොදුරුවෙලා. ඔබ මොකද කියන්නේ වොට්සන්? ඔහුට වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්න වේවිද?"

"අපි තව ටිකක් ඉබසලා බලමු" මම කීවෙමි. "මෙවැනි තත්ත්වයන්ට මුහුණදුන් පුද්ගලයන්, ඉක්මනින් හෝ තරමක් ප්‍රමාද වී යථා තත්ත්වයට පත්වෙනවා. බියන්ඩ නිසා ඇතිවූ මත්ගතියෙන් පසුව අවදිවුණාමත්, කලබල කරන්න ගත්තොත් බෙහෙතක් විදින්න වෙනවා."

පැය භාගයක් පමණ ගතවෙද්දී, අපේ රෝගියා ක්‍රමක්‍රමයෙන් අවදිවන ලකුණු පෙනිණ. තමා වැතිර සිටි තැන එසේම හිඳිමින් ඔහු දෙනෙත් විවර කර වටපිට බැලීය. ඊළඟට ඔහු එක්වරම සෝපාවේ හිඳගත්තේය. ඉන්පසු අප තිදෙනාගේ මුහුණු දෙස මාරුවෙන් මාරුවට බලා අසුනෙන් බිමට පැන්නේය.

"මං මේ කොහෙද ඉන්නේ? කවුද ඔබ?" ඔහු උස් හඬින් ඇසුවේ අප වෙත ඇඟිල්ල දිගුකරමිනි.

"බිලී වීවර් මහත්මයා" හෝම්ස් කීවේ තරුණයාගේ අතින් අල්ලාගෙන ඔහුගේ උරහිසට තට්ටුකරමිනි. "ඔබ ඉන්නේ මිතුරයින් කීපදෙනෙක් අතරේ, ලන්ඩන් නගරයේ. ඔබට භයවෙන්න කිසිම කාරණයක් නැහැ. ඔබට කැමැති නම් ඔබ රැකියාව කරන මිඩ්ලන්ඩ් ඖෂධ සමාගමට ඔබව වහාම ඇරලවන්නත් අපට පුළුවනි. ඒ ගැන කිසිම සැකයක් හිතන්න එපා- මෙන්න ඔබේ සාක්කුවේ තිබුණු මුදල්. එය හරිද බලන්න" හෝම්ස් තරුණයාගේ අත්ල මත මුදල් තැබීය.

තරුණයා පුදුමයෙන් මෙන් අප දෙසත්, අපේ විසිත්ත කාමරයේ හතර වටේටත් බැලුවේ කිසිවෙක් විශ්වාසයට ගැනීමට අපහසු වූ ආකාරයෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"වීවර් මහත්තයා" හෝම්ස් ඉලිත් කථාකළේය. "මට පෙනෙනවා ඔබ අද උදේට කිසිම කෑමක් අරගෙන නෑ. බාගවෙලාවට ඊයේ රෑටත් කන්න නැතෑ. අපි ඔබට කෑම සූදානම් කරන්නම්. එය ලැබෙන තුරු ඔබට කැමැති නම් නාන කාමරයට ගිහින්, මුහුණ සෝදාගෙන එන්න පුළුවනි."

හෝම්ස් එසේ කියා, සේවක ළමයා කැඳවීමට සීනුව නාද කළේය. හදිසියේ පැමිණි අමුත්තෙකුට උදේ ආහාරය සහ කෝපි සූදානම් කරගෙන එන ලෙස හෝම්ස් සේවකයාට පැවසීය.

තරුණයා සිටි තැනින් නැගිට මූණ සෝදා ගැනීම සඳහා නානකාමරය වෙත ගියේ සන්සුන් ගමනෙනි. මඳ වේලාවකින් විසිත්ත කාමරයට පැමිණි ඔහුගේ මුහුණේ සුදුමැලි බව, මදක් අඩුවී තිබූ බැව් අපි දුටුවෙමු. ඔහු උදේ ආහාරය ගන්නා අතරේ, අපි ඒ දෙස නොබලා, එදිනෙදා දේවල් කතාබහ කළෙමු. හෝම්ස්, ලෙස්ට්‍රේඩ්ට කෝපි කෝප්පයක් පිළිගැන්වූ පසු, අප අතර ඇතිවූයේ මඳ නිහඬතාවයකි. ඊළඟට අපේ ඇරයුමක් නොමැතිවම, තරුණයා අප සමීපයට පැමිණ සෝපාවේ අසුන්ගත්තේය.

"මහත්වරුනි" තරුණයා කීය. "මට කියන්න තියෙනවා දිග කථාවක්. මං මේ කියන දේවල්, ඔබ කොයි තරමක් විශ්වාස කරාවිද කියල මම දන්නේ නෑ. මගේ කථාව ඇත්තක් බව ඔප්පු කරන්න, මා ළඟ සාක්ෂි ඇත්තෙත් නෑ. ඒත් මං ඔබට සහතික වෙන්නම්. මං මේ කියන කථාව, ඇත්තෙනුත් ඇත්ත මිස ඕබාරුවක් නෙමෙයි."

"මහත්මයා" මගේ මිත්‍රයා තරුණයා ඇමතුවේ පයිප්පයට දුම්කොළ පුරවමිනි. "ඔබ කියන කථාව ඇත්තක් බවට අපේ සැකයක් නෑ. නමුත් ඔබ, කවුද, මේ අත්දැකීමට යොමුවුණේ කොහොමද කියල මුල ඉඳලම පටන් ගත්තොත්, අපට ලොකු පහසුවක්."

මඳ වේලාවක් තරුණයා නිහඬව අප දෙස බලා සිටියේ කථාව ඇරඹිය යුත්තේ කොතැනින් දැයි සිතාගැනීමට විය යුතුය.

"මගේ නම බිලී වීවර්" ඔහු කීය. "මගේ වයස අවුරුදු විසිතුනයි. පාසල් ගුරුවරයෙකු වූ මගේ තාත්තා හෘදයාබාධයකින් හදිසියේම මියගියා. ඒ මීට අවුරුදු තුනකට කලින්. තාත්තාගේ හදිසි මරණය නිසා, අම්මාත් නංගීත් මමත්, මේ ලෝකෙ අතරමං වුණා. අප පදිංචිව සිටියේ මීඩලිකෝට් ප්‍රදේශයේ කුලී නිවසක. තාත්තා

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

ඉතිරිකළ විශාල මුදලක් අප සතුව තිබුණේ නැහැ. ඔහුගේ අවමඟුල් කටයුතු පවා කරගන්න හැකිවුණේ දේවස්ථානයේ ආධාරයෙන්.

මං එතකොට විද්‍යාව හැදෑරීමට විශ්වවිද්‍යාලයට ඇතුළුවීමේ අරමුණෙන් පාසලේ ඉගෙනුම ලබමිනුයි හිටියේ. තාත්තා මියගියේ, මගේ විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයට මාස හයක් තිබියදී. ඒකෙන් මම ලොකු අමාරුවක වැටුණා. විද්‍යා අංශයෙන් ඉගෙනීම ලබමින් සිටි මට, තවදුරටත් පාසල්ගාස්තු, විද්‍යාගාර ගාස්තු ගෙවීමට හැකියාවක් තිබුණේ නැහැ. අම්මා මැහුම් ගෙතුම් කරලා සුළු මුදලක් හෙව්වත්, කෑමබීම ටික ගන්න පවා මුදල් අමාරු බව අපට පෙනුණා. පාසලෙන් අස්වෙලා රැකියාවකට යන්න මං අන්තිමේදී තීරණය කළා."

කථාව මඳකට නැවැත්වූ තරුණයා මේසය මතවූ වීදුරුවට වතුර වත්කොට වතුර උගුරු කිහිපයක් බිව්වේය.

"විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයට රසායන විද්‍යාව හදාරා තිබීම නිසා, මට බොහොම අහඹුවෙන් රැකියාවක් ලබාගන්න පුළුවන් වුණා. ඒ, ඖෂධ නිෂ්පාදනය කරන මිඩ්ලන්ඩ් ෆාමසියුටිකල්ස් නම් සමාගමේ. මාව බඳවාගත් අලුත මං මුලින් සේවය කළේ, ඖෂධ නිෂ්පාදන අංශයේ රසායනාගාරයක. එහි අවුරුදු එකහමාරක් කළ සේවය ගැන, අපේ ප්‍රධානීන් සතුටට පත්වුණා. ඉතින් මට ඖෂධ ප්‍රචාරණය පිළිබඳ තනතුරකට උසස්වීමක් ලැබුණා. ඉතාම ඉහළ වැටුපක් නොලැබුණත්, මගේත් අම්මාගේත් නංගීගේත් ජීවිතය ගෙන යන්න ඒ මුදල ප්‍රමාණවත් වුණා.

මේ අතරේ දැනට මාස හතරකට කලින් අපේ ආයතනයට ග්ලෝරියා නැවර් නම් තරුණියක් සේවයට බැඳුණා. ඇය සමග මගේ පෙම් සබඳතාවක් ඇතිවුණා. අපදෙදෙනාගේම පවුල් වලින් ලැබුණු ආශිර්වාදය මැද, අපි මේ වසරේ ජුනි මාසයේ විවාහ වෙන්න විවාහ ගිවිසගෙනයි ඉන්නේ.

විවාහ අපේක්ෂාවෙන් ඉන්න නිසා අමතර මුදලක අවශ්‍යතාවය මට හොඳටම දැනුණා. ඒ නිසා වියදම් කිරීමේදී බොහොම අරපිරිමැස්මෙන් කටයුතු කළා. අතිකාල දීමනා ලැබෙන, පිට පළාත්වල සංචාර සඳහා මං ඉදිරිපත් වුණේ, බොහොම කැමැත්තෙන්. මට භාරවී තිබුණේ, ඈත ප්‍රදේශ වලට ගිහින්, එහි සිටින වෛද්‍යවරුන් හමුවෙලා, අප ආයතනයේ නිෂ්පාදනය කරන

http://sherlockholmesinvestigations.blogspot.com

නව ඖෂධ හඳුන්වාදීමයි. ඖෂධ නිෂ්පාදනාගාරයේ කාලයක් සේවය කර තිබුණ නිසා, මගේ කටයුත්ත බොහොම පහසුවුණා. ඉතින් ගිය සතියේ මට ස්වින්ඩන් ප්‍රදේශයට යන්න නියමවුණාම, මං ඒක කැමැත්තෙන්ම භාරගත්තා.

මම ලන්ඩනයෙන් පිටත්වෙන්න බලාපොරොත්තු වුණේ, සවස 2.20ට ක්ලැප්හැම් මංසන්ධියෙන් යන ශීඝ්‍රගාමී දුම්රියෙන්. නමුත් මං දුම්රියපොළට එන්න මිනිත්තු 10ක් පමාවුණා. ඒ නිසා මට බලාපොරොත්තුවුණු දුම්රිය අල්ලා ගන්න හැකිවුණේ නැහැ. ඊළඟ දුම්රිය යන්න තිබුණේ 3.10ට. මට යන්න සිදුවුණේ ඒකෙ. ඒ මදිවට ඒක මන්දගාමී දුම්රියක්. අතරමගදී ප්‍රමාදවෙච්චි, ඒක ස්වින්ඩන් වලට යද්දී රෑ නවය විතර වුණා.

මං දුම්රියපොළෙන් එළියට එද්දී, එක වලාකුළක් වත් නැති අහසේ ලස්සනට පුරහඳ පායලා තිබුණු හැටි මට පෙනුණා. අවට්න් හමාගෙන ආවෙ ඉවසන්න බැරි සීතල සුළඟක්. හඳ පායලා තිබුණත්, කළු පැහැති වැහි වලාකුළුත් සුළං පාරත් සමග ඇදී එන බව මං දුටුවා. මං වෙනදාට මේ පැත්තට ආවාම නවාතැන් ගන්න පුරුදු තැන නමා එලිෆන්ට් ඇන්ඩ් කාසල් හෝටලය. ඒක සාධාරණ ගාස්තු අයකරන, මිත්‍රශීලී සේවකයන් සිටිනු ජනප්‍රිය හෝටලයක්. අද මං ප්‍රමාද වුණු නිසා, ඒකෙ නවාතැන් ගන්න කාමරයක් නොලැබෙන බව මට එක්වරම කල්පනා වුණා. හෝටලයක් ගැන මොනවා හරි කල්තියා දැනගෙන ගියොත් හොඳයි කියල මට හිතුණා. මං ඒ ගැන දුම්රියපොළේ හිටි පෝටර්වරයෙකුගෙන් ඇහුවා.

"මේ කිට්ටුව නැද්ද, මට රෑට නවාතැන් ගන්න පුළුවන් හෝටලයක්? හුඟක් ඉහළ ගාස්තු අයකරන එකක් නෙමෙයි. නිකම් සාමාන්‍ය තත්ත්වයේ එකක්?"

"බෙල් ඇන්ඩ් ඩ්‍රැගන් හෝටලයෙන් අහල බලන්න" පෝටර්වරයා කිව්වේ පාරේ එක් පැත්තකට අත දිගු කරමින්. "සමහරවිට එතැන ඉඩ තියේවි. මෙහේ ඉඳන් හැතැක්ම කාලකට වැඩිය නැහැ ."

මම ඔහුට ස්තුතිකර, මගේ ඇඳුම් බෑගයත් ඔසවාගෙන, පෝටර්වරයා කිව් හෝටලය වෙත යන්න පිටත්වුණා. මං හැඳසිටි තේව්බිලූ ලෝම කබාය තිබුණත්, හිස්වැස්ම තිබුණත්, සීතල සුළඟෙන් මට ලොකු හිරිහැරයක් දැනුණා. කොයි මොහොතේ හෝ වැස්සක් කඩා හැළෙන්න ඉඩ ඇති බව මට හැඟුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

ස්වින්ඩන් වල මේ පාර, මං කවදාවත් ඇවිත් තිබුණු පැත්තක් නෙමෙයි. මෙහි පාර දෙපැත්තේ කඩ සාප්පු කිසිවක් තිබුණේ නැහැ. ඔක්කොම තිබුණේ පරණ ගෙවල්. කිසි අලංකාරයක් නැති, බොහොම උසට හැදූ පරණ ගෙවල්. පාරෙ ඉඳල තරප්පු හතරක් පහක් උඩට නැග්ගාම, කෙළින්ම ගෙදර ඉස්සරහ දොරටුව. බොහොම කාලෙකට ඉස්සර නම්, මේවායේ ජීවත්වෙන්න ඇත්තේ වැදගත් උදවිය. දැන් නම් දොරජනේල් වල ගාපු තීන්ත, පොතු ගැළවෙන්න පටන්අරගෙන.

මං ඉදිරියට ඇවිදගෙන යද්දි, වීදි ලාම්පු වලින් ආලෝකය හොඳින් වැටුණු තැන්වල, ගෙවල් දිහා බලමිනුයි ඉදිරියට ගියේ. එක ගෙදරක පහළ තට්ටුවේ ජනෙල් වීදුරුවේ අලවා තිබූ දැන්වීමක් හදිසියේම මට දකින්න ලැබුණා.

රෑට නවාතැන්

සහ

උදේ කෑම

සපයනු ලැබේ

මං එක්වරම නැවතුණා. දැන්වීමට යටින් අලංකාර විලෝ මල් ඇඳි මල්බඳුනක් තිබුණා. මම තරප්පු පෙළේ ඉහළට නැගලා, ජනෙල් වීදුරුවට දෑස් ළංකරලා ගේ ඇතුළ බැලුවා.

මට දකින්න ලැබුණු පළමුවැනි දේ තමා, හොඳින් දීප්තිමත්ව දැල්වෙන ගිනි උඳුනක්. ඒ ඉදිරිපිටම එළා තිබූ කළාලය මත බල්ලෙක් වකුටුවෙලා නිදාගෙන හිටියා. ඒ විසිත්ත කාමරය තිබුණේ මඳ අඳුරේ වුණත්, ඒ ඇතුළේ තිබුණු ලී බඩු පවා, මට හොඳින් පෙනුණා. ඒ කැටයම් සහිත ලීබඩු අවුරුදු හැටක්, හැත්තෑවක් පැරණි ඇති. ඒත් ඒවා අලුත් ඒවා මෙන් දීප්තිමත්ව දිලිසුණා. කාමරයේ එක් තැනක පියානෝවක්, තවත් තැනක කෙනෙකුට නිදාගන්න හැකි තරම් ලොකු සුවපහසු සෝපාවක්. කාමරයේ මුල්ලක ගිරවෙක් සහිත කූඩුවක් එල්ලා තිබුණා. සුරතල් සතුන් සිටින එකෙන් තේරෙන්නේ, මෙතැන හොඳ නවාතැනක් කියන එකයි කියල මට හිතුණා. ඒ වගේම මෙතැන නවාතැන්

Reading Purpose Only.. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

ගැනීමට සුදුසු, වැදගත් නිශ්ශබ්ද තැනක් වගේ පෙනුණා. පැහැදිලිවම මේක, බෙල් ඇන්ඩ් ඩ්‍රැගන් හෝටලයට වඩා හොඳවේවි, මං මටම කියා ගත්තා.

අනෙක් අතට මට හිතුණේ, මේ වගේ නේවාසිකයන් ගන්නා ගෙදරක නවතිනවාට වැඩිය, හෝටලයක නවතින එක හොඳ බව. හෝටලයක රෑ කෑමට කලින්, බීර වීදුරුවක් දෙකක් බොන්න පුළුවනි. කතාබහ කරන්න මිනිස්සු ඉන්නවා. අනෙක හෝටල්වල, අයකිරීම හුඟක් අඩුයි. මෙහෙම තැනක විශාල ගණනක් අයකරන්න පුළුවනි. මං කවදාවත් මේ වගේ නේවාසිකාගාර වල නැවතිලත් නෑ. ඔබට ඇත්තම කියන්නම්. මට නුපුරුදු ආකාරයේ තැනක නවතින්න, මගේ හිතේ පොඩි භයකුත් ඇතිවුණා. එහෙත් මෙවැනි නේවාසිකාගාරයක, ගෘහණිය අතින්ම පිළියෙල වන, රසවත් මස් ව්‍යාංජන, හොඳි සහිත ඉස්ටූ ගැන මතක් වෙලා, මගේ කටට කෙළත් ඉනුවා.

මිනිත්තුවක් දෙකක් හීතලේ ගැහි ගැහී ඉඳගෙන මම කල්පනා කළා. ආයෙ මට හිතුණා "බෙල් ඇන්ඩ් ඩ්‍රැගන්" හෝටලයටත් ගිහිං බලන්න. එතකොට මට තීරණය කරන්න පුළුවනි, එතැන නවතිනවාද මෙහේට එනවද කියන එක. එහෙම හිතලා මං පඩිපෙළ බහින්න සූදානම් වුණා.

ඒත් මට තේරුම් ගන්න බැරි විධියේ පුදුමාකාර දෙයක් සිදුවුණා. අර ජනේලයේ අලවා තිබූ, රෑට නවාතැන් හා උදේට කෑම කියන දැන්වීම වෙත, මගේ හිත හරියට ආකර්ෂණය වුණා. මගේ දෑස එතැනින් ඉවතට ඇදගන්න බැරි විධියට එතැනටම ඇදී ගියා.

රෑට නවාතැන් උදේට කෑම
රෑට නවාතැන් උදේට කෑම
රෑට නවාතැන් උදේට කෑම

මේ හැම අකුරක්ම මට පෙනුණේ කෙනෙකුගේ ඇස් වගෙයි. ඒ ඇස් වලින් මට ගෙදරට එන්න කියලා ආරාධනා කරනවා වගෙයි. මට එතැනින් ඉවතට යන්න බැරි විධියට මං වශීවුණා. හිතන්නවත් බැරි අයුරින්, මං එතැනට ආකර්ෂණය වුණා වගේ දැනුණා. ඊළඟට මගේ දෙපාවලින් ඉබේටම මාව යැවුණේ ඒ ගෙදර ඉදිරි දොරටුව ළඟට. මං එහි සීනුව නාද කළා.

http://sherlockholmesinvestigations.blogspot.com

ගේ ඇතුළේ කාමරයක හෝ කුස්සියේ සීනුව නාදවෙන හඬ මට ඇහුණා. නමුත් ඒ මොහොතේම, එක් ක්ෂණයකින් ඉදිරි දොර විවෘතවුණා. ඒ මොහොතෙම කියල මං කියන්නේ ඇයි? සීනුව නාද කරල, මට මගේ අත පාත දාන්නවත් ලැබුණෙ නැහැ. ඒ තරම් ඉක්මනටයි දොර ඇරුණෙ. විවෘතවුණු දොර ඉදිරිපිට, කාන්තාවක් හිටගෙන හිටියා. මේ තරම් ඉක්මනට දොර ඇරුණු එක ගැන, මගේ හිතේ තිගැස්මක් ඇතිවුණා.

දොර විවෘත කළ ඇය, ආචාරශීලී සිනාවකින් මාව පිළිගත්තා. ඇගේ වයස අවුරුදු හතළිස්පහක් හෝ පනහක් වෙන්න ඇති.

"කරුණාකරල එන්න ඇතුළට" ඇය් කිව්වේ බොහොම සිත්ගන්නාසුලු හඬින්. ඇය දොර පියන ඇරගෙන හිටියේ, මා ගෙට ඇතුළුවනතුරු. මං ඒ ගේ ඇතුළට ඇදී ගියේ අර මුලින් තිබූ ආකර්ෂණය, මගේ මුළු ඇඟටම දැනිලා වගේ.

"මං අර ජනේලයේ අලවා තිබූ දැන්වීම දුටුවා" මං කිව්වා.

"ආ..... ඔව්. මං දැනගත්තා" ඇය පිළිතුරු දුන්නා.

"මං මේ නවාතැන් ගන්න කාමරයක් හොයමිනුයි ආවේ."

"කාමරයක් සූදානමින් තියෙනවා මහත්මයා" ඇය කිව්වා. ඇයට තිබුණේ රෝස පැහැති රවුම් මුහුණක් සහ නිල්පාට අහිංසක ඇස් දෙකක්.

"මහත්මයා" ඇය කීවා. "ඇයි ඔබ සීතලේ ඉන්නේ? අර ගිනි උදුන ළඟට ගියා නම් උණුසුම් වෙන්න පුළුවනි."

"මං බෙල් ඇන්ඩ් ඩ්‍රැගන් හෝටලයට යන්න හිතාගෙනයි ආවෙ" මං කිව්වා. "නමුත් ඔබේ ජනේලයේ තිබුණු දැන්වීමට මගේ හිත ඇදිලා ගියා. මෙහේ අයකිරීම කොහොමද?"

"නවාතැන් ගාස්තු හා උදේ කෑම ඔක්කොටම, සිලිං පහයි පැන්ස හයයි."

ඇය කිව්වා. ඒ ගණන ඇත්තෙන්ම ඉතාම අඩු අයකිරීමක්. මං හිතාගෙන හිටියේ මමහෙම නැතක ඒ වගේ දෙගුණයක් විතර ගෙවන්න වේවි කියලයි. ඉතින් මං තත්පර කිහිපයක් ඒ ගැන හිතද්දී, ඇය ආයෙමත් කථාකළා.

"ඒ ගාස්තුව වැඩියි කියලද ඔබට හිතෙන්නේ? එහෙනම් මං තවත් බොහොම ස්වල්පයක් අඩුකරන්නම්. උදේ කෑමට ඔබට බිත්තර උවමනාමද? බිත්තර උවමනා නැත්නම්, මට පුළුවන් තවත්

http://sherlockholmesinvestigations.blogspot.com

පැන්ස හයක් අඩුකරන්න. මේ දවස්වල බිත්තර හරි ගණං. බිත්තර එපා නම් සිලිං පහක් පමණක් ගෙව්වට කමක් නෑ."

"නෑ නෑ" මං පිළිතුරු දුන්නා. "සිලිං පහයි පැන්ස හය කමක් නෑ. මං කැමතියි මෙහේ නවතින්න."

"මං දැනගත්තා ඔබ කැමැති වෙන බව. අපි ඇතුළට යමු" ඇය කීවා.

ඇය හරිම කරුණාවන්ත කෙනෙක් බවයි මට පෙනුණේ. මං පාසල් යන දවස්වල, නත්තල් නිවාඩුවට නවතින්න මගේ යාළුවන්ගේ ගෙවල් වල යනවා, එහෙම ගිය වෙලාවට ඒ යාළුවන්ගේ අම්මල, මට බොහොම කරුණාවෙන් සලකල තියෙනවා. මේ කාන්තාවගෙනුත් මට පෙනුණේ එවැනි යහළුවෙකුගේ අම්ම කෙනෙක් වැනි පෙනුම ම යි. වරක් ඒ අම්මා කෙනෙක් මට නත්තලෙන් පස්සෙත් ගෙදර නවතින්න කියලා කථා කළ විධියටමයි, මේ නෝනාත් කරුණාවන්තව කථාකළේ.

මං මගේ හිස්වැස්ම අතට ගත්තා.

"ඔන්න ඔය රාක්කයේ එල්ලන්න" ඇය කීවා. "කෝ ඔබේ කබායත් මෙහාට දෙන්න. මං ඒක එල්ලන්නම්."

හිස්වැසුම්, වැහිකබා එල්ලන රාක්කයේ වෙන කිසිම හිස් වැසුමක්, වැහි කබායක් දකින්න තිබුණේ නෑ. කුඩයක් සැරයටියක් වැනි කිසිම දෙයක් තිබුණේ නෑ.

"අද අමුත්තො කවුරුත්ම නෑ" ඇය කිව්වේ, මට කාමරය පෙන්වන්න, තරප්පුවේ උඩට නගින්න සූදානම් වෙමින්. "ඔබට පෙනෙනවා නේද? මගේ මේ නේවාසිකාගාරය හුඟක්ම අමුත්තො එන තැනක් නෙමෙයි."

ඇය එහෙම කිව්වාම මට එක්වරම හිතුණේ, මේ ගෑනි ටිකක් මෝඩ පහේ කෙනෙක් වගේ කියලයි. අනුග්‍රාහකයො කවුරුත් ආවෙ නැතත්, ව්‍යාපාරිකයන්ගේ සිරිත, හුඟක් අය එනව කියල කියන එක නේ.

"ඒ වුණාට නවාතැන් ගාස්තුවයි, උදේ කෑමයි, සිලිං පහමාරකට හම්බවෙනවා නම් හරි ලාබයි" මං කිව්වා. "අමුත්තො එනව අඩුයි කියල ඔබ කිව්වට, මට නම් හිතෙන්නෙ සෙනග පොරකකා ඒවි කියලයි."

"අමුත්තො එන්නෙ නැතිව නෙමෙයි මහත්තයා. නමුත් ඔය එන හැම කෙනෙක්වම මං භාරගන්නෙ නෑ. මං බොහොම තෝරල

http://sherlockholmesinvestigations.blogspot.com

බේරල තමයි නේවාසිකයන් අරගන්නේ. වැදගත් කෙනෙක් මිස, ආවට ගියාට කෙනෙක් මෙහෙ නවත්වා ගන්න, මං කොහොමටවත් කැමති නෑ. ඔබට තේරෙනවා නේද?" ඇය කිව්වා.

"ආ...... ඔව්"

"ඒ වුණත් මං හැමතිස්සෙම ඉන්නෙ සූදානමින්. අමුත්තෙක් එව් කියල රෑ දවල් දෙකේම සූදානමින් ඉන්නෙ. කොයි වෙලේ හරි හොඳ වැදගත් මහත්මයෙක් ආවොත්, මං බොහොම කැමැත්තෙන් ඔහුට නවාතැන් දෙනවා. ඉඳල හිටල හරි, මං ඉස්සරහ දොර අරිනකොට, එහෙම කෙනෙක් දොර ළඟ නැවතිලා බලාගෙන ඉන්නවා දකින්නත් සන්තෝෂයි."

මෙහෙම කියන කොට ඇය තරප්පු පෙළේ භාගයක්ම උඩට නැගලා. එතැනින් තරප්පු පෙළේ හැරෙන්න වේදිකාවක් තිබුණා. ඒක තමයි පළමුවෙනි තට්ටුව.

"මේ තට්ටුවේ තමයි මම පදිංචිවෙලා ඉන්නේ" ඇය කිව්වා.

ඊළඟට ඇය යළිත් උඩට නගින්න පටන්ගත්තා.

"මේ දෙවැනි තට්ටුව. මේක අමුත්තන්ට. මේ තියෙන්නෙ ඔබේ කාමරය. මං හිතන්නේ මේ කාමරේට ඔබ කැමැති වේවි" ඇය සිනාසුණා. මෙහෙම හිනාවෙද්දි ඇඟේ ඇඳෙතොල් සහ විදුරුමස ඉතාම සුදුමැලි බව මට එක්වරම පෙනුණා. ඇය කාමරයේ පහන දල්වමින් මාව ඇතුළට කැඳවාගෙන ගියා. ඒක ඉතාම අලංකාර ලෙස සකස් කළ කාමරයක්.

"උදේට ඉර පායද්දි මේ ජනේලයෙන්, කාමරය ඇතුළටම ඉර එළිය වැටෙනවා. පර්කින්ස් මහත්මයා..... මහත්මයාගේ නම පර්කින්ස් කියල නේද කිව්වේ?"

"නෑ. මගේ නම වීවර්"

"අන්න හරි වීවර් මහත්මයා. බලන්න මේ පිරිසිදු ඇඳ ඇතිරිලි. ඇඳ උණුසුමට තියෙන්න, මං ඇඳේ ඇතිරිලි මත උණුවතුර බෝතල් තියල තියෙන්නේ. ඔබට සීතල නම්, මේ කාමරේ තිබෙන ගිනි උදුන දල්වා ගන්න."

"ඔබට බොහොම ස්තූතියි" මං කිව්වා.

"වීවර් මහත්තයා මෙහෙ ආව එක කොයිතරම් හොඳ ද?" ඇය කිව්වා. "හුගක් කාලෙකින් කිසිකෙනෙක් ආවෙ නෑ. බලාගෙන ඉඳල ඉඳල මට එපාවෙලයි තිබ්බේ."

Reading Purpose Only.. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"දැන් ඉතින් ප්‍රශ්නයක් නැහැනේ" මං කිව්වා. "මං නිසා ඔබ කරදර වෙන්න උවමනාවක් නෑ."

මං මගේ ඇඳුම් බෑගය කාමරේ පුටුව උඩ තියලා, විවෘත කළා.

"එතකොට මේ මහත්තයගෙ රෑ කෑම කොහොමද? මෙහේ එන්න කලින් ඔබට කොහෙහෝ හරි රෑ කෑම කාලා එන්න පුළුවන් වුණාද?" ඇය ඇහුවා.

"නෑ නෑ මට බඩගිනි නෑ" මං කිව්වා. "මට ඕනකරන්නේ පුළුවන් ඉක්මනට නින්දට යන්නයි. ඒ මොකද මං හෙට උදේන්ම නැගිටින්න ඕනෑ. මට හෙට දවසේ රාජකාරි හුඟක් තියෙනවා."

"ආ බොහොම හොඳයි" ඇය කිව්වා. "එහෙනම් මං පහළට යන්නම්. ඔබට කැමැති හැටියට බඩුමුට්ටු අස්කර ගන්න පුළුවනි. ඒ වුණත් ඔබ නින්දට යන්න කලින් පහළ තට්ටුවට ඇවිත්, කරුණාකරල අමුත්තන්ගේ පොත අත්සන් කරන්න. ඒ මොකද මහත්මයා, ඒක මේ රටේ නීතිය නේ. ආණ්ඩුවෙන් නීති පනවලා තියෙන කොට අපි ඒ නීති පිළිපදින්න ඕනෑ නේ."

මෙහෙම කිව් ඇය දොර වසාගෙන පහළට බැස්සා.

මේ කාන්තාව ටිකක් අමුතු තාලේ කෙනෙක් බවයි මට හිතුණේ. නමුත් ඒකෙන් ප්‍රශ්නයක් නෑ. ඇය බොහොම කරුණාවන්ත කෙනෙක් බව පැහැදිලියි. මං හිතන්නේ ඇයට ඉන්න ඇති මගේ වයසෙ පුතෙක්. ඒ අහිංසකයා බෝයර් යුද්ධෙට ගිහින් මියයන්න ඇති. එහෙම මොකක් හරි හිතේ අමාරුවක් නිසා වෙන්න ඇති, ඇගේ අමුතු ගතිය. මට එහෙම හිතුණා.

ඇය අමුත්තන්ගේ පොත අත්සන් කළ යුතු බව කිව්ව නේ. ඉතින් මං ඇඳුම් මාරු නොකරම, මුහුණ කට සෝදාගෙන පහළට බැස්සා. ගෙහිමි කාන්තාව පෙනෙන්න හිටියේ නැහැ. නමුත් උදුනේ ගින්දර හොඳින් දල්වෙමින් තිබුණා. ඇගේ සුරතල් බලු පැටියා, ඒ ඉදිරිපිට පලස මත තවමත් නිදමින් සිටියා. විසිත්ත කාමරය ඇතුළත හොඳ උණුසුමයි. මෙහෙම තැනක නවාතැන් ගන්න ලැබීම ගැන මගේ හිතේ ඇතිවුණේ ලොකු සතුටක්.

අමුත්තන්ගේ පොත, පියානෝව උඩ තබා තිබුණා. පොත විවෘත කරලයි තිබුණේ. ඉතින් මං පෑන අරගෙන නිසි පිළිවෙළට මගේ නමත් ලිපිනයත් එහි ලිව්වා. ඒ පිටුවේ මගේ නමට උඩින් තිබුණේ තවත් හතර දෙනෙකුගේ නම් පමණයි. කවුරුත් කරන විදියට මං ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

නම් කියවලා බැලුවා. එතැන තිබුණු එක නමක් ක්‍රිස්ටෝපර් මුල්හොලන්ඩ්. ඔහු කාඩිෆ් පැත්තේ. තවත් තිබුණා නමක්, ග්‍රෙගරි ටෙම්පල්, බ්‍රිස්ටල් වලින්. ඒ වෙලාවේ ගෙහිමි කාන්තාව පෙනෙන්න නොහිටි නිසා මගේ හිතට අමුතු අදහසක් ආවා. අතේ පෑන තිබුණු නිසා, මං සාක්කුවේ තිබුණු කඩදාසි කැබැල්ලක ඒ නම් සහ ලිපින ලියා ගත්තා. ඔහොම ඉන්න බලන්න තවමත් ඒක මා ළඟ තියනවාද කියලා" මෙසේ කිව් තරුණයා තමාගේ කලිසම් සාක්කුවට අත දැම්මේය.

"මෙන්න මහත්මයා, ඔබේ සාක්කුවේ තිබුණු ඒ කොළ කැබැල්ල. අප ඔබේ සාක්කු සෝදිසි කර බලද්දී මේක හමුවුණා" කී හෝම්ස් එය තරුණයා අතට දුන්නේය.

"හරි මේක තමයි" තරුණයා කීවේ ඒ දෙස බැල්මක් හෙලමිනි. "බලන්න කියවලා" ඔහු එය ආපසු හෝම්ස් අතටම දුන්නේය. හෝම්ස් එය දිගහරිද්දී, ලෙස්ට්‍රේඩ් සහ මම හෝම්ස්ගේ උරහිසට උඩින් එබී බැලුවෙමු. ඉතා පැහැදිලි කුඩා අකුරින් එහි මෙසේ සඳහන් විය.

| | |
|---|---|
| ක්‍රිස්ටෝපර් මුල්හොලන්ඩ්- | අංක 13 දෙව්මැඳුර පාර<br>කාඩිෆ් |
| ග්‍රෙගරි ටෙම්පල්- | 27 සයිකමෝ උයන<br>බ්‍රිස්ටල් |
| ජෝන් ඩික්සන්- | 145 අලුත් මාවත,<br>මහවීදිය<br>චීන්චෙස්ටර් |
| රිචඩ්. ඩබලිව්. කාටර්- | 150 ග්‍රේට් වෙස්ටන් මාවත<br>සාන්තා බාබරා<br>කැලිෆෝනියාව<br>ඇමරිකා එක්සත් ජනපදය |

"මේ නාම ලේඛනය කියවා ගෙන යද්දී" තරුණයා කීය. "මට හිතුණේ මේ සමහරක් අය මං හඳුනන අයද කියලා. ඒ මොකද මෙයින් නමක් හෝ දෙකක් මං හොඳට අහල පුරුදුයි වගේ. මුල්හොලන්ඩ් කියන්නේ සාමාන්‍යයෙන් අපට ඒතරම් අහල හුරුපුරුදු නමක් නොමෙයි. නමුත් මං කොහෙද්දි ඒක අහල

http://sherlockholmesinsinhala.com

තියෙන්නේ? මං කල්පනා කරල බැලුවා. මාත් එක්ක පාසලේ ඉගෙන ගත්තු ළමයෙක් ද? නෑ. මුගේ අසල්වාසියෙක්ව හිටපු කෙනෙක්ද? නෑ. තාත්තාගේ යාළුවෙක් ද? ඒත් නෑ. නංගිගේ යාළුවෙක්ගේ සහෝදරයෙක්ද? ඒත් නෑ. මට මතක් කරන්න අමාරුයි. ඊළඟට ග්‍රෙගරි ටෙම්පල් කියන නමත් කවදා හරි අහපු නමක් වගේ ...... කවුද මේ මිනිස්සු?...... මං කල්පනා කළා. කවුද මේ ග්‍රෙගරි ටෙම්පල්? මට ඒක ශබ්ද නගා කියවුණා.

"හරි අපූරු ඉලන්දාරියෙක්" මගේ පිටුපසින් කවුදෝ කියනවා ඇහුණා. මං ආපහු හැරිලා බලද්දි හිටියේ, ගෙහිමි කාන්තාව. ඇය ලොකු රිදී බන්දේසියක් මත යමක් තියාගෙන, විසිත්ත කාමරය වෙත ආවා. ඇය ඒ බන්දේසිය අල්ලාගෙන හිටියේ, බොහොම ඉස්සරහට දිගු කරගෙන, හරියට දඟකාර අශ්වයෙකුගේ රේන්ස්පටි දෙක අල්ලාගෙන ඉන්නවා වගේ.

"මේ ඉහළම තියෙන නම් දෙක, මට ටිකක් අහල පුරුදුයි වගේ" මං කිව්වා.

"හැබෑට? ඔබ ඔවුන් අඳුනනවාද? ඒක අහන්නත් සන්තෝෂයි."

"මට හොඳටම විශ්වාසයි" මං කිව්වා.

"මං මේ නම් දෙක කොහේදී හරි අහලා තියෙනවා. ඒක හරිම පුදුමයි. සමහරවිට මං ඔවුන්ගේ නම් කියෙව්වේ පත්තරේද? ඒ ගොල්ලෝ සුප්‍රසිද්ධ අය නම් නොවෙයි. මං කිව්වේ ඔය ජනප්‍රිය ක්‍රිකට් ක්‍රීඩකයො පාපන්දු ක්‍රීඩකයො, නළුවො වගේ අය නම් නොවෙයි. එහෙම නේද?" මං ඇහුවා.

"සුප්‍රසිද්ධ?" ඇය ඇහුවේ, තේ බන්දේසිය සෝපාව ඉදිරිපිට ටීපෝව මත තබමින්. "නමුත් ඒ දෙන්නම බොහොම කඩවසම් ඉලන්දාරි. ඒ දෙන්න විතරක් නෙමෙයි. හතරදෙනාම එහෙමයි. හරියට ඔබ වගේමයි."

මං ආයෙමත් සැරයක් ඒ නම් ලැයිස්තුව කියවාගෙන ගියා. එහි සඳහන්ව තිබූ දිනයන් ගැන, මගේ අවධානය යොමුවුණා. අන්තිම පුද්ගලයා මෙහේ ඇවිත් තියෙන්නේ මාස හයකටත් කලින්. ක්‍රිස්ටෝපර් මුල්හොලන්ඩ් ඇවිත් තිබුණේ අවුරුදු දෙකකට කලින්. ග්‍රෙගරි ටෙම්පල් ඊට මාස දෙකකට පසු. මං ඒ බව ඇයට කිව්වේ පුදුමයෙන්.

"අනේ දෙවියනේ" ඇය මහ හඬින් සිනාවෙමින් හිස දෙපසට සෙලෙව්වා. ඇගේ සුදුමැලි විදුරුමස් හා දෙතොල් වලට අමතරව

http://sherlockholmesinvestigations.blogspot.com

තවත් දෙයක් පෙනුණා. ඇගේ දත් අසාමාන්‍ය ලෙස සුදු වගේම උල් බවත් මම දුටුවා. "බොරු දත් වෙන්න ඇති" මට එහෙම හිතුණා.

"අනේ දෙවියනේ" ඇය යළිත් කිව්වා. "මට එහෙම දෙයක් මතක්වුණේ වත් නැති හැටි. කාලය කොයිතරම් ඉක්මනින් ගෙවී යනවද? එහෙම නේද විල්කින්ස් මහත්මයා?"

"මගේ නම වීවර්"

"ආ ඔව්. මට අමතක වුණා." ඇය කිව්වේ සෝපාව උඩ වාඩිවෙමින්. "මට වෙලාවකට පුදුමත් හිතෙනවා, මට කාරණා අමතක වෙන ඉක්මන ගැන. හරියට මේ දැන් මේ කනෙන් අහපු දේ, අනෙක් කනෙන් පිටවෙලා යනවා වගේ."

"තවත් කාරණයක් මං ඔබට පෙන්වලා දෙන්නද?" මං ඇහුවා. "මේ නම් දෙක ගැන තියෙනවා තවත් අසාමාන්‍ය ලක්ෂණයක්. ඔබට ඒක පෙනුණද?"

"නැහැ මහත්මයා. මට එහෙම මොකුත් පෙනුණේ නැහැ."

"මේ පුද්ගලයො දෙන්නා ගැන තමයි මට හොඳට මතක්වෙන්නෙ" මං කිව්වේ ඉහළින්ම ඇති නම් දෙක පෙන්වමින්. "මේ දෙන්නා මගේ මතකයේ ඉතාම හොඳින් සටහන් වෙලා පමණක් නොවෙයි. මොකක් හරි විශේෂ හේතුවක් නිසා, මේ දෙන්නගෙ නම් දෙක එකට බැඳුණු නම් දෙකක්. හරියට එකම කාරණාවක්, එකම අංශයක් ගැන ප්‍රසිද්ධියක් ලැබුවා වගේ. එතකොටම මට මතක් වෙනවා මේ අන්තිම නමත් මට අහල පුරුදුයි වගේ. කොහොම වුණත් මුල්හොලන්ඩ් සහ ටෙම්පල් යන නම් දෙක හරියට නැපෝලියන් සහ වෙලිංටන් සාමි වගේ එකට බැඳුණු නම් දෙකක්."

"ඒකත් හරි පුදුමයි නේද?" ඇය කිව්වා. "දරුවෝ. ඔය කථා කළා මදෑ. දැන් ඉතින් ඇවිත් මෙහෙන් වාඩිවෙන්න. මේ සෝපාවේ මගේ ළඟින් වාඩිවෙන්න. මං ඔබට සූදානම් කළා ඉඟුරු විස්කෝතුයි, රස තේ කෝප්පයකුයි. නින්දට යන්න කලින් තේ කෝප්පයක් බීලා හිටියොත් නේද හොඳ?"

"අපරාදේ මොකටද කරදර වෙන්නෙ?" මං ඇහුවා. "මේ වගේ තේපැන් සංග්‍රහයක් මං ඔබෙන් බලාපොරොත්තු වුණේ නෑ."

මං එහෙම කිව්වේ පියානෝව ළඟ නැගිටලා, ඇය කරන වැඩේ දෙස බලමින්.

http://sherlockholmesinvestigations.blogspot.com

තේ කෝප්පය වහල තිබුණු පීරිසිය ඉවත් කළ ඇය, හැන්දෙන් තේ එක හොඳින් කුරු ගෑවා. ඊළඟට ඉඟුරු විස්කෝතු දමා තිබුණු තසිම වහල තිබුණු පීරිසියත් ඉවත්කළා. ඇයට තිබුණේ ඉතාම කෙට්ටු, සුදුමැලි, ඒත් කඩිසර අත්දෙකක්. ඇඟිලි බොහොම සිහින්. නියපොතු රතුම රතු පාටයි.

"මට හොඳට විශ්වාසයි, මං ඔය නම් කියවන්න ඇත්තේ පුවත්පත්වල" මං කිව්වා. "ටික වෙලාවක් යද්දි මට ඔය ගැන මතක් වේවි" මං ඇයට කිව්වා.

මොකක් හරි දෙයක් ටික ටික මතක් වේගෙන එනකොට, ඒක අමතක කර දමන්න, මං කොහොමටවත් කැමැති නෑ. ඉතින් මං දිගටම උත්සාහ කළේ, මගේ මතකය අවදි කරන්න. හරි! යමක් මගේ මොළේට ආවා. හරියට අන්ධකාරයේ කිසිවක් නොපෙනී සැරිසරද්දී, විදුලි කෙටීමකින් වපෙටීම ආලෝකමත් වුණා වගේ.

"ඔහොම ටිකක් ඉන්න!!" මට කෑගැහුණා. "මුල්හොලන්ඩ්. ක්‍රිස්ටෝපර් මුල්හොලන්ඩ්. එයා නේද අර ඊටන් විද්‍යාලේ ශිෂ්‍යයා. හරියටම හරි! ඔහු තමයි ස්විත්ඩන් හරහා පා ගමනින් දීර්ඝ සංචාරයක යෙදුණු සිසුවා. එක්වරම........"

"....... තේ වලට කිරි ටිකක් දාන්නද?" ඇය ඇහුවා. "සීනි එක හැන්දක් ඇතිද?"

"කමක් නෑ. එක හැන්දක් ඇති. ඊළඟට මට මතකයි ඔහු එක්වරම......"

"ඊටන් පාසලේ සිසුවෙක්?" ඇය ඇහුවා. "අනේ වෙන්න බෑ. ඔහු මෙහේ එද්දි කේම්බ්‍රිජ් සරසවියේ උපාධි අපේක්ෂකයෙක්. ඉතින් විල්කින්ස් මහත්මයා මෙහේ ඇවිත් මේ සෝපාවෙන් වාඩිවෙන්න..... වීවර් මහත්මයා...... මේ උදුන පත්තු කළාම හරිම උණුසුම්. මේ සීතල කාලෙට හොඳ ගිනි උදුනක් දාැතුව ඉන්න බෑ. එන්න. එන්න. ඔන්න දැන් තේ එක සූදානම්" ඇය ඇගේ ළඟ සෝපාවේ හිස්ව තිබුණු තැනට තට්ටු කළා. ඇය හිටියේ හිනාවකින් මුව සරසාගෙන.

මං විසිත්ත කාමරය හරහා ගිහින්, සෝපාවේ කෙළවරක ඇයට ටිකක් ඈතින් වාඩිවුණා. ඉදිරිපස තිබුණු ටීපෝව මා සිටි තැනට ළං කළ ඇය, තේ කෝප්පය ඒ මතින් තැබුවා.

"ඔන්න දැන් හරි. ඉතින් තේ කෝප්පය බීල ඉන්නකෝ." ඇය, ඇගේ තේ කෝප්පය අතට ගත්තා. මමත් මගේ තේ කෝප්පය අතට අරගෙන කටට ළං කළා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඇය මා දිහා හොඳින් බලාගෙන ඉන්නවා වගෙයි මට පෙනුණෙ. ඒ සමගම ඇගේ පැත්තෙන් හමා ආ සුළඟේ මට දැනුණේ අමුතු සුවඳක්. ඒක විලවුන් සුවඳක්ද? නැහැ. මොකක් හරි අමුතු සුවඳක්. ඒක මොකක්ද කියල මට හිතාගන්න අමාරුයි වගේ. ....... අච්චාරු දැමූ වොල්නට් සුවඳ ද? ඒත් නැහැ....... අලුතෙන් පදම් කළ හම්වල සුවඳ ද? නැහැ. මට හිතෙන්නෙ ඉස්පිරිතාල වල වාට්ටු අතරින් යද්දි දැනෙන, බෙහෙත් ගඳ මිශ්‍ර ඉස්පිරිතාල සුවඳක්.

"මුල්හොලන්ඩ් මහත්තයා මගේ තේ වලට හරි කැමැති වුණා" ඇය කිව්වා. "ඒ වගේ ආසාවෙන් මං හැදූ තේ බිව් කිසි කෙනෙක් මං ජීවිතේට දැකල නෑ" ඇය කිව්වේ මා දිහා බලාගෙන සිනාවක් පාමින් .

ඇය මෙහෙම කිව්වත් මට එක්වරම තේ කෝප්පයේ අමුත්තක් දැනුණා. මං මුලින් හිතුවේ ඒක ඇගේ ඉඟුරු විස්කෝතු වලින් ආව සුවඳ කියලයි. නමුත් දැන් මට තේරුණා. මේක ආමන්ඩ්-රටකොට්ටන් සුවඳ. ඒ සුවඳ හමන්නේ මගේ තේ කෝප්පයේ තිබුණු තේ එකෙන්.

"ඔය තේ කෝප්පෙ අතේ තියෙද්දිම නිමෙව්. ඕක බොන්නකො ඉතින්" ඇය කිව්වා. "තේ එකක් බොනකොට හුගක් උණුවෙන් බොන්න පුරුදුවෙන්න. මේ ශීතල දේශගුණයට උණුවෙන් කෑම කන බොන එක තමා හොඳ."

"මං කැමැති තේ එක හොඳට නිවෙන්න අරලා බොන්න" මං එහෙම කිව්වත්, දැන් මේ තේ එක බොන්න මගේ හිතේ කිසිම කැමැත්තක් නෑ.

"ඔබට කියන්න මහත්වරුනි. ආමන්ඩ් සුවඳට මගේ හිතේ තියෙන්නෙ ලොකු පිළිකුලක්. මං සරසවි පිවිසුම විභාගයට රසායන විද්‍යාව හදාරද්දි, අපට තිබුණා කාබනික රසායන විද්‍යාව ප්‍රායෝගික පරීක්ෂණ කරන්න. බෙන්සයිල් මද්‍යසාරය වැනි රසායනික ද්‍රව්‍ය වලින්, ආමන්ඩ් ගන්ධය හමනකොට, මට ඔක්කාරය සෑදෙනවා. කාබනික රසායන විද්‍යාවෙ ඇරොමැටික රසායන ද්‍රව්‍ය පරීක්ෂා කරන්න මට හරි අමාරු වුණා. අනික් අය විද්‍යාගාරයෙදි ඒ පරීක්ෂණ කරද්දි, මං විද්‍යාගාරයෙන් එළියට දුවලා කාණුවට වමනෙ කළා. ආමන්ඩ් ගඳ මට ඒ තරමට පිළිකුල්. ඉතින් මේ තේ කෝප්පයෙන් ආමන්ඩ් ගඳ දැනුණු ගමන් මගේ බඩ

http://sherlockholmesinvestigations.blogspot.com

දඟලන්න පටන්ගත්තා. මං කල්පනා කළේ, ඇගේ සිත නොරිදවා, තේ කෝප්පය ඇයට නොපෙනෙන්න ඉවතට විසිකරන්න."

"මොකද වීවර් මහත්තයා තේ කෝප්පෙ අතේ තියාගෙන කල්පනා කරන්නේ?" ඇය ඇහුවා. "ඔබට සීනි මදි නම් තව සීනි ටිකක් දාන්නම්. නැත්නම් කිරි ඕනෙ නම්......" එහෙම කියලා ඇය විසිත්ත කාමරයේ මේසය දිහා බැලුවා. මේසය උඩ සීනි පෝච්චිය තිබුණත් කිරි බඳුනක් තිබුණේ නෑ.

"මට අමතක වෙලා. කිරිජෝගුව ඇත්තේ කුස්සියේ. මොකද තේ එක බොන්න අමාරුද?"

මට එක්වරම තැනට සුදුසු නුවණක් පහළ වුණා. මේක මට හොඳ අවස්ථාවක් බව මං හිතාගත්තා. මෙයින් ප්‍රයෝජන ගත යුතුයි.

"නෝනා" මං කිව්වා, "ඔබේ මේ තේ එක නම් අනර්ඝයි. නමුත් මෙකෙ කහට ටිකක් වැඩියි. මට පුරුදු කිරි හුගක් දමාගෙන තේ බොන්න. තව කිරි ටිකක් තිබුණා නම්...... ඔබට කරදරයක්ද අනේ මං දන්නේ නෑ."

මගේ කටින් පිටවෙනු කොටම ඇය ඉක්මනින් නැඟිට්ටා. "අයියෝ ඕක කලින් කියන්න එපායැ. මං ගේන්නම් කිරි ජෝගුව" ඇය බොහොම කඩිසර ගමනින් කුස්සියට ඇදුනා.

ඇයගේ පිටුපස හැරුණු ගමන්, මං තේ කෝප්පය ළඟ තිබුණු මල්පෝච්චියේ පස් මතට හැලුවා. ඉතිරිවුණේ අඩියේ බිඳක් විතරයි. ඇය ආපහු ආවා විනාඩියෙන්.

"කමක් නෑ නෝනා" මං කිව්වා. "ඔබට කරදර කරන්න මට කණගාටු හිතුණා. ඒ නිසා අමතර කිරි නැතුවම මං තේ කෝප්පෙ එක උගුරට බිව්වා" එහෙම කියලා මං තේ කෝප්පය මේසය උඩින් තැබුවා.

මගේ ඒ වචන විශ්වාස නොකරන විදියට, ඇය තත්පර කිහිපයක් නෙත් කොනින් මා දිහා බලා හිටියා. ඉතින් මං සාක්කුවෙන් ලේන්සුව අරගෙන මගේ කටත් පිහදැම්මා.

"ඉඟුරු විස්කෝතු කිහිපයක් කමු." ඇය කිව්වා. "මේවා කඩෙන් ගෙනෙන ඒවා නෙමෙයි. මං ගෙදර හැදුවා."

ඇය විස්කෝතු තැටිය මා දිහාට ළං කළා.

"මගේ බඩ පිරිලා තිබුණේ. තේ එක බිව්වාම හොඳටම පිරුණා. තවත් විස්කෝතු කන්න ඉඩක් නෑ" මගේ ඒ ප්‍රතික්ෂේප කිරීමට ඇය එච්චර කැමැති වුණේ නැහැ.

http://sherlockholmesinvestigations.blogspot.com

මහත්වරුනි. දූත් මං එන්නේ මගේ කථාවේ වැදගත්ම හරියට. මේ වෙනකොට, මේ ගෑනිගෙ පිළිවෙළ ගැන මගේ හිතේ විශාල භයක් ඇතිවෙලයි තිබුණෙ. මම දන්නෙ නෑ ඔබටත් ඒ හැඟීම ඇතිවෙලා තියෙනවද කියලා. නමුත් කවදාවත් නැතිව මගේ හිතේ ඇතිවුණේ විශාල නැතිගැන්මක්. මගේ හදවත වේගයෙන් ගැහෙන්න පටන් ගත්තා. මගේ මුහුණ සුදුමැලි වුණාද දන්නෙ නෑ. නළලට ඩහදිය දමලා සීතල වෙනබව මට තේරුණා.

"මොකද පර්කින්ස් මහත්මයා, ඔබට අසනීපයක්වත්ද?" ඇය ඇහුවා.

"මගේ නම වීවර් නේ" මං කිව්වා. "ඔබට අමතක වෙන්න ඇති. අසනීපයක්ම නෙමෙයි. ගමන් මහන්සිය වෙන්න ඇති. ක්ලාන්ත ගතියක් දැනුණා."

මං එහෙම කිව්වාම ඇය සැනසුම් සුසුමක් හෙළුවා. මුහුණේ හිනාවක් මතුවුණා. ඇය ආයෙමත් සෝෆාවේ වාඩිවුණා.

දිගින් දිගටම මගේ හිතේ වැඩකළේ, අර අවුරුදු දෙකකට කලින් ඇවිත් තිබුණු මුල්හොලන්ඩ් සහ ඉග්‍රගරි ටෙම්පල් දෙදෙනාගේ නම්. මේ නම් දෙක මං දුටුවේ පුවත්පත්වල බව දූත් හොඳටම මට විශ්වාසයි. මට හිතුණා, ඉතා වැදගත් ප්‍රවෘත්තියක් සමග, ලොකු සිරස්තලයක් යටතේ, මං ඒ නම් දකින්න ඇති කියලා. එතකොට මගේ හිතේ භය තවත් වැඩිවුණා. ඒ බවක් නොපෙන්වා, තොරතුරු ඇයගෙන්ම අහගන්න මං හිතුවා.

"මුල්හොලන්ඩ් මහත්තයයි ටෙම්පල් මහත්තයයි හුගක් කල් මෙහේ නැවතිලා ඉඳලද ගියේ?" මං ඇහුවා.

"ගියේ?" ඇය ඇසුවේ ඇගේ නළල රැළිකරමින්. "දරුවෝ. ඔවුන් හතරදෙනාම තවමත් මෙහේ ඉන්නවා. ඒ ඉන්නේ දෙවැනි තට්ටුවේ. මුල්හොලන්ඩ් හා ටෙම්පල් දෙන්නා එක කාමරයක ඉන්නවා ජෝන් ඩික්සන්, රිචඩ් කාටර් මහත්වරු ඉන්නේ වෙනිං කාමරයක."

මං ඇය දිහා බැලුවේ හරිම පුදුමයකට පත්වෙලා. ඇය බොහොම සතුටින් සිනාසුණා. මහ හඬින් හිනාවුණා කිව්වොත් නිවැරදියි. ඇගේ සුදුමැලි වීදුරුමස් හා උල් දත් පෙනුණාම යළිත් හිතට භයක් දැනුණා. ඒ වෙලාවේ ඇගේ ඇස්දෙකේ හැටි දුටුවාම, මගේ හිතේ ඇතිවුණු භය දෙගුණ තෙගුණ වුණා. ඇගේ හිනාහඬේ

http://sherlockholmesinvestigations.blogspot.com

ගැබ්වෙලා තිබුණෙ, සාමාන්‍ය කෙනෙක් සතුටින් හිනාවෙන හඬ නෙමෙයිදෝ කියලත් මට හිතුණා.

"කීයද ඉලන්දාරියා ඔයාගෙ වයස?" ඇය ඇහුවා.

"විසිතුනයි"

"හෑ හෑ හෑ හා! විසිතුනයි! නියම වයස" ඇය යළිත් හිනාවුණා. "මුල්හොලන්ඩ් මහත්තයා මෙහේට එනකොටත් විසිතුනයි. ඔහු ඔබට වඩා ටිකක් මිටියි. ටෙම්පල් මහත්මයා නම් ඔබට වඩා උසයි. ඒත් ඒ එක්කෙනෙකුට වත්, ඔබට වගේ සුදුම සුදු දත්දෙපෙළක් තිබුණෙ නෑ. ඔබ දන්නවද? ඔබේ දත් හරි ලස්සනයි."

ඇගෙ මේ කථාව මගෙ හිතට ඇල්ලුවේ නෑ.

"ඒව ඔය පෙනෙන තරම් හොඳ නෑ" මං කිව්වා. "හක්කේ දත් ඔක්කොම වගේ පුරවල තියෙන්නේ."

"ඩික්සන් මහත්මයාට නම් ඔබට වඩා ටිකක් වයසයි" ඇය කීවේ මා කියූ දෙය ගණනකටවත් ගන්නේ නැතිව.

"ඊළඟට අර ඉලන්දාරියා....... කවුද නම...... රිචඩ් කාටර්.... ඔහුට අවුරුදු විසි අටයි."

මේ ගෑනි මොනවද මේ කථාකරන බහුබූත. මගේ හිතට ආවේ ඒ හැඟීම. වෙන මොකක් හරි දෙයක් ගැන කථාකළ යුතුයි කියල මට හිතුණා.

"අර කූඩුවේ දාපු ගිරව ඉන්නවා නේද?" මං කිව්වා. "මං ඒකට සම්පූර්ණයෙන් රැවටුණා. මං ජනේලයෙන් බලද්දී මං හිතුවේ ඒ කූඩුවේ ඉන්නෙ පණපිටින් ගිරවෙක් කියලයි."

"අනේ" ඇය කිව්වා. "ඉස්සර පණ පිටින් හිටියා තමයි. නමුත් දැන් ඌ මැරිලා. ඒ සතා බෙහෙත් දමල පුරවලා, කල්තබා ගන්න පුළුවන් විධියට සංරක්ෂණය කරලයි තියෙන්නේ."

"ඒක බොහොම අලංකාරව කරල තියෙනවා" මං කිව්වා. "කවුරු වුණත් දක්ෂයෙකුගේ වැඩක්. කවුද එහෙම සකස් කළේ?"

"මමයි කළේ."

"ඔබ ඒක කළා?"

"ඔව්" ඇය කීවා. "ඇයි ඔබ දුටුවේ නැද්ද මගේ බැසිල්?" ඇය හිස හරවලා පෙන්නුවේ, ගිනි උඳුන ඉස්සරහ වකුටුවෙලා, වැතිර හිටි බල්ලාව. එක්වරම මගෙ දෑස් ඌ දිහාවට යොමුවුණා. මේ තරම් වෙලාවක් බල්ලා කිසිම හැලහොල්මනක් කළේ නැහැ නේද කියන හැඟීම, මගේ හිතට ආවෙ එතකොටයි.

http://sherlockholmesinvestigations.blogspot.com

මං ළඟට ගිහින් උගේ පිට අතගාලා බැලුවා. උගේ පිට ගලක් වගේ සවිමත්, ඒ වගේම සීතලයි. මං උගේ මවිල් ටිකක් ඇඟිලි තුඩෙන් පැත්තකට තල්ලු කරලා බැලුවා. දෙවියනේ! සම රෝසපැහැ නෙමෙයි, අළුපාටට හුරු කළු පාටයි. ඌ ඉතාම හොඳින් ඖෂධ ගල්වලා, සංරක්ෂණය කළ බලු මළකුණක්!

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ!" මට එක්වරම කියැවුණා. "මේ වගේ වැඩක් කරන්න ඔබට හරිම අමාරු වෙන්න ඇති?"

"අමාරු? කිසි අමාරුවක් වුණේ නෑ" ඇය කිව්වේ කලින් වගේ සිනාවෙමින්. "මං ආදරය කරන අය මියගියාම, මං එයාලව බෙහෙත් දාලා පුරවලා, හැමදාම මං ළඟ ආරක්ෂා කරල තබා ගන්නවා. එතකොට ඔවුන් කවදාවත් මාව අත්හැරල යන්නේ නෑ. ඔබ කැමැතිද විවර් මහත්තයා තවත් තේ කෝප්පයක් බොන්න?"

"නෑ එපා. බොහොම ස්තූතියි" මං කිව්වේ ආමන්ඩ ගඳ මතක්වෙලා. එය මතක්වෙද්දී මට ඔක්කාරෙට ආවා. මට වමනේ යාවිද කියලා භයකුත් ඇතිවුණා. මං තේ කෝප්පය තොලේවත් නොගෑවේ හොඳ වෙලාවට.

"ඔබ අර පොතේ නම ලියල අත්සන් කළා නේද?" ඇය ඇහුවා.

"ඔව්."

"ඒක හොඳයි. ඒ මොකද නැත්නම්, ඔබ කවුද කියන එක මට කලක් යද්දි අමතක වෙලා යනවා. පොතේ නම තියනවා නම් මට ඕනෙම වෙලාවක ඇවිත් බලන්න පුළුවන්. මං හැමදාමත් ඇවිත් ඔය නම් ටික කියවලා, මතක් කරගන්නවා. මුල්හොලන්ඩ් මහත්මයා, ටෙම්පල් මහත්මයා, එතකොට.........."

"..........ඩික්සන් මහත්මයා." මං කිව්වා. "මං මෙහෙම ඇහුවට තරහ වෙන්න එපා. එතකොට මේ පසුගිය අවුරුදු දෙකේම මේ ගෙදරට ආවෙ ඔය අමුත්තො හතරදෙනා විතරද? වෙන කවුරුත්ම ආවෙ නැද්ද?"

"නැහැ මහත්මයා. ඔබ විතරයි"

මගේ හිතේ තිබුණු භය කිහිප ගුණයකින් වැඩිවෙලා වගෙයි මට දැනුණේ. හේතුවක් ඇතිවද නැතිවද මම දන්නේ නෑ. මගේ ඇඟ කිළිපොළා ගියා. තව ටික වේලාවකින් භයානක ඉරණමකට මුහුණ දෙන්න සිදුවේවි කියන හැඟීම මගේ හිතේ ඇතිවුණා. මට උවමනා වුණේ කොහොම හරි මෙතැනින් පැනගන්න. වචනයෙන් විස්තර

http://sherlockholmesinvestigations.blogspot.com

කළ නොහැකි භයකින් මගේ සිත වෙළී ගියා. මං කොහොම හරි මෙතැනින් යා යුතුයි. නමුත් ඒක කළ යුත්තේ කොහොමද කියල මට හිතාගන්න බැරිවුණා. මං ඇයට නොපෙනෙන්න, හොරැහින් ඉදිරි දොර දිහා බැලුවා.

දොර යතුරු දමා වහලා, යතුරු ඉවත් කරලා, දොර පොල්ලක් දමා තිබුණා. යතුරු හොයාගන්න එක ලේසි වෙන එකක් නැහැ. මං ජනේලය දිහා බැලුවා. ඒක වීදුරු කැලි හතරේ ලොකු ජනේලයක්. ඇතුළෙන් අගුළ ඇරගත්තොත්, විංගලා පාරට පැනගත හැකිවේවි. කරන දෙයක් ඉක්මනින් කළ යුතුයි.

"මොකද පර්කින්ස් මහත්මයා.......... නෑ, ව්වර් මහත්මයා, වටපිට බල බල කල්පනා කරන්නේ? මොකද ඔබට නිදිමතද?" ඇය ඇසුවා.

"ඔව්. මට හොඳටම නිදිමතයි. ක්ලාන්ත ගතියක් තරමට නිදිමතයි" මං කිව්වේ බොරුවට. මං අඩවන් දෑසින් ඇයගේ මුහුණ දිහා බලාගෙන හිටියා. එහි තිබුණේ අමුතුම බැල්මක්. ඒක සන්තෝෂයද වියරුවක්ද පුදුමයද කියල මට තේරුණේ නෑ.

"ඔබට කැමති නම් ඔතන නිදාගන්න. කමක් නෑ. නැත්නම් මුල්හොලන්ඩ් මහත්තයල වගේ උඩතට්ටුවට යන්න. එහෙම ගියොත් වඩාත් හොඳයි" ඇය කිව්වා.

ඔන්න එතකොටම මං හොය හොයා හිටිදේ මගේ ඔලුවට ආවා. අන්ධකාරයේ ආලෝකයක් දැල්වුණාම, හැමදෙයක්ම පෙනෙනවා වගේ, ඒක මට පැහැදිව පෙනුණා.

මුල්හොලන්ඩ් හා ටෙම්පල් දෙන්නාම තරුණයෝ. මේ ස්වින්ඩන් පළාතට ඇවිත් එක්වරම අතුරුදන්වුණා. ඔවුන් මොකක් හරි බිහිසුණු ඉරණමකට මුහුණ දෑව කියලයි පොලීසිය සැකකළේ. ඒ බව පුවත්පත්වල පළවුණු බව මට මතක්වුණා. එහෙනම් ඔවුනට අත්වෙන්න ඇත්තේ මොන ඉරණමද? මට ඇය කී දෙය මතක්වුණා.

"මං ආදරය කරන අය මියගියාම, මං ඔවුන් බෙහෙත් පුරවලා, හැමදාමත් මා ළඟ ආරක්ෂා කරල තබාගන්නවා. එතකොට ඔවුන් මාව අත්හැරල යන්නේ නෑ."

මගේ ගැළවීම ඇත්තේ මගේ අතේම බව, මට ක්ෂණිකව වැටහුණා. හැකි වහාම මෙතැනින් පැනගත යුතුයි. නමුත් ඒක බොහොම උපක්‍රමශීලීව කළ යුතු දෙයක්. නැත්නම් මේ ගෑනි මට මොනවා කරාවිද දන්නේ නෑ. මගේ මුළු සිරුරම භීතියෙන් කිලිපොලා ගියා.

http://sherlockholmesinvestigations.blogspot.com

මීළඟට ගතයුතු පියවර හිතාගන්න බැරුව, මං දෑස් පියාගෙන මිනිත්තු කීපයක් කල්පනා කළා. ඇය හිතන්න ඇත්තේ මට නින්ද ගියා කියලයි. ඇය වාඩිවෙලා හිටි සෝපාවෙන් නැගිට, බත්දේසියත් අරගෙන කුස්සියට ගියා. ඇය යන හැටි මං හොඳින් බලාගෙන හිටියා. බොහොම කඩිසර ගමනින් ගිය ඇය, ලාච්චුවක් අරින හඬ මට ඇහුණා. ඒ හැඳි, පිහි හෝ එවැනි ලෝහමය දේවල් එළියට ගන්නා ශබ්දයක්. කරන දෙයක් මේ මොහොතෙම කළ යුතුයි.

මං ශබ්දයක් නොනැගෙන්න විසිත්ත කාමරයේ සිට කුස්සිය පැත්තට ගියා. ඇය මා සිටි පැත්තට පිටුපාලා, යමක් කරනවා. විසිත්ත කාමරය හා කුස්සිය සම්බන්ධ වෙන තැන දොරක් තිබුණා. ඒකේ, මා සිටි පැත්තෙත් යතුරු දාන්න හැකි විධියට යතුරු කැරැල්ලක්, යතුරු කටේ එල්ලී තිබුණා. මං එක් ක්ෂණයකින් දොර වහලා යතුරු දැම්මා. ඊළඟට ගෙදර ඉස්සරහා පැත්තේ ජනේලය වෙත පැනලා, අගුළ අරින්න තැත් කළා. ඒ අගුළ හෙල්ලුනේවත් නෑ. ඊළඟට දොර වෙත පැනලා ඒකෙ, දොර පොල්ල අස්කරලා අරින්න බැලුවා. ඒකත් ගලක් වගේ මහබර ගනකම් ලෑලිවලින් තැනූ දොරක්.

මේ අතරේ ඇය දොරට තඩිබාමින් කෑගසන හඬ මට ඇසුණා. මට ගැළැවී යාමට ඒ තරම් කාලයක් තියේවි කියල හිතන්න බෑ. ඇයගේ පිටුපස දොර ඇරගෙන එළියෙන් ගෙට ආවොත් මට ගැළවීමක් නෑ. මං පුටුවක් ඔසවලා හැකි වේගයෙන් වීදුරු ජනේලයට, පහර පිට පහර එල්ල කළා. මැද රාමුවත් එක්ක වීදුරු කුඩුවී ගියේ විශාල විවරයක් සාදමින්.

මං ජනේලයෙන් එළියට පැනගත්තා. ඊට පස්සේ පාරට බැහැලා, හිස හැරුණු පැත්තට පුළුවන් වේගයෙන් දිව්වා. රාත්‍රිමුර සංචාරයේ යෙදී සිටි පොලිස් භටයෙක් මගදී මට හමුවුණා. මං උමතුවෙන් වගේ ඔහුට මොනව හරි කියන්න ඇති. ඔහු මාව පොලිසියට කැඳවාගෙන යන්න හැදුවා. මං ඒකට කොහොමටවත් කැමැතිවුණේ නැහැ. අන්තිමට ඔහු මාව දුම්රිය පොළට අරගෙන ආවා. ඒ වෙලාවේ බඩු දුම්රියක් වේදිකාවේ තිබුණා. ඔහු මාව දුම්රියට නග්ගනවා මට යන්තමට වගේ මතකයි. ඊට පස්සේ මං ක්ලාන්ත වෙන්න ඇති.”

http://sherlockholmesinvestigations.blogspot.com

තරුණයා තම කථාව නිම කළේය. අපි ඒ කථාව සාවධානව සවන්දී සිටියදී සියල්ල අමතක වූ බවක් දැනිණ. හෝම්ස් කලින් දල්වා ගත් පයිප්පය නිවී ගොස් ඇති බව ද, ඔහුට එය යළි දල්වා ගැනීමට අමතක වී ඇති බව ද මට දකින්නට ලැබිණි.

"බිලි වීවර් මහත්මයා" හෝම්ස් කීවේ මඳවේලාවක් නළල රැලිකරගෙන කල්පනා කිරීමෙන් පසුවයි.

"ආමන්ඩ් ගඳට ඔබේ ඇති පිළිකුල් ගතිය නිසා, ඔබේ ජීවිතය ගැළවුණා." හෝම්ස් කීය. "ඒ ගැන අප දෙවියන්ට ස්තුති කළ යුතුයි. ඔබේ තේ කෝප්පයේ දමා ඇය ඔබට දුන්නේ සයනයිඩ් විෂ. ඒකෙන් තමා ආමන්ඩ් ගඳ දැනුණේ. වොට්සන්. අතුරුදන්වීම් ගැන සටහන් තිබෙන මගේ පොතත්, පුවත්පත් වලින් තොරතුරු කපා අලවාගත් ස්ක්‍රැප් පොතත් මට දෙන්න."

පුවත්පත් වල "පෞද්ගලික" යයි සඳහන් දැන්වීම් තීරුව කපා අලවා, හෝම්ස් සකස් කළ මෙම පොත්වල විශ්වකෝෂයක මෙන් තොරතුරු අඩංගු විය.

"අපි බලමු M අකුරෙන්" හෝම්ස් කීවේ අතුරුදන්වීම් ගැන ඔහු විස්තර ලියා තබාගත් සටහන් පොත පෙරළමිනි. "මුල්හොලන්ඩ්.... ආ මේ තියෙන්නේ 1898 මැයි 7 දා. ක්‍රිස්ටෝපර් මුල්හොලන්ඩ් අතුරුදන්වුණා. දැන් අපි බලමු ස්ක්‍රැප් පොතේ. මේ ඩේලි ටෙලිග්‍රාෆ් පුවත්පතෙන් කපාගත් විස්තරයක්.

## පවුම් විසිපහක ත්‍යාගයක්

විනෝද සංචාරයක යෙදීමට මැයි 7 වැනිදා ස්වින්ඩන් බලා ගිය ක්‍රිස්ටෝපර් මුල්හොලන්ඩ් ආ ගිය අතක් නොමැත. ඔහුගේ වයස අවුරුදු 23යි. උස අඩි 5යි අඟල් 2යි. කේම්බ්‍රිජ් සරසවියේ උපාධි අපේක්ෂකයෙකි......

තව තොරතුරු තියෙනවා..... ඊළඟට අපි බලමු ග්‍රෙගරි ටෙම්පල් ගැන. මේ තියෙන්නේ.

## තරුණ නීතිඥයා අතුරුදන්වෙයි.

බාත් නගරයේ සිට ස්වින්ඩන් හරහා ලන්ඩනයට පැමිණීමට නියමිතව සිටි, ග්‍රෙගරි ටෙම්පල් මහතා අතුරුදන්වී ඇති බැව් පොලිසිය පවසයි. ස්වින්ඩන් දුම්රිය පොළෙන් රාත්‍රී අටට පිටවී ගොස් ඇති ඔහු මිතුරෙකු හමුවීමට නියමිතව තිබිණි....

http://sherlockholmesinvestigations.blogspot.com

ඊළඟට අපි බලමු ඩික්සන් ගැන.

"ජෝන් ඩික්සන් නම් කුලීරථ රියැදුරා අතුරුදන් වී ඇතිබැව් පොලිසියට වාර්තාවේ. නිව් හැම්ෂයර් නගරයෙන් ගෘහභාණ්ඩ තොගයක් ස්වින්ඩන් වෙත ගෙන ගිය ඔහුගේ, අශ්වකරත්තය බෙල් ඇන්ඩ් ඩ්‍රැගන් හෝටලය අසල තිබී හමුවී ඇත. එහෙත් ඔහු හෝටලය වෙත පැමිණ නැති බැව් පෙනේ."

"රිචඩ් කාටර්........... ඇමරිකානු සංචාරකයා ජූනි 27 වැනිදා සිට ආගිය අතක් නොමැත. ස්වින්ඩන් හි මේ අයුරින් කිහිපදෙනෙකුම අතුරුදන් වී ඇති බවට වාර්තාවී ඇති නමුත් මේ ගැන සෙවීමට පොලීසිය කිසිඳු පියවරක් ගෙන නැත."

"ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියට මේ ගැන සෑහෙන කාලෙක ඉඳල පැමිණිලි ලැබුණා" ලෙස්ට්‍රේඩ් කීය. "ඒත් අපට මේ අතුරුදන් වූ පුද්ගලයන් ගැන කිසිම හෝඩුවාවක් ලැබුණේ නැහැ."

"මේ මහත්මයා තේ කෝප්පය මල් පෝච්චියට වත්කළ නිසා තමයි මේ ආරංචිය වත් ලැබුණේ" මම කීවෙමි.

"ඔව්. එහෙම නොවෙන්න, තවත් අභිරහස් අතුරුදන්වීමක් අපේ ලැයිස්තුවට එකතුවෙන්න තිබුණා." ලෙස්ට්‍රේඩ් මගේ අදහසට එකඟවිය. "හෝම්ස් මහත්මයා. අපි මේ ගැන කුමක් කළ යුතුයි කියලද ඔබ හිතන්නේ?"

"අපි විවෘත වරෙන්තුවක් සකස්කරගෙන ගොස්, ඇයව අත් අඩංගුවට ගැනීමට කටයුතු කළ යුතුයි" හෝම්ස් කීය. "අර පුද්ගලයන් හතරදෙනාගේම අතුරුදන්වීමට ඇය වගකිව යුතු බවට කිසිම සැකයක් නෑ. ඇය නිදහසේ සිටීම බොහොම භයානකයි."

"මං ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගිහිං, ඒය සකස්කරගෙන එනතුරු ඔබ මෙහේ ඉන්නවාද?"

"නැහැ ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීවේ තම පිටකබාය ඉවත් කිරීමට සූදානම් වෙමිනි.

"මං හිතන්නේ අපි වීවර් මහත්මයා කැඳවාගෙන, පොලිස් මූලස්ථානයේ, අපරාධකරුවන්ගේ ඡායාරූපාගාරය වෙත යා යුතුයි. මේ කාන්තාව කවුද කියන එක ගැන මගේ හිතේ යම් අදහසක් තියෙනවා. ඒ වුණත් ඇයගේ ඡායාරූපයක් පෙන්වලා ඇයව නිශ්චිතව හඳුනාගෙන සිටීම වඩා හොඳයි."

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print

රෝද හතරේ කුලීරියක නැඟී අපි වහා පිටත්වී ගියෙමු. බිලී වීවර් තරුණයා, පොලිස් මූලස්ථානයේ අපරාධකරුවන්ගේ ඡායාරූපාගාරයේ ඉදිරියට ගියේ නළල රැළි කරගෙනයි.

"මෙන්න ඉන්නවා. මෙයා තමයි" බිලී වීවර්ට කෑගැසිණ. "මාව පිළිගන්න ඇය පැවේ මේ හිනාවම තමයි. මං දිවුරන්නම්. මෙයා තමයි ගෑනි."

"විල්මා රැට්න්බරි කුක්" හෝම්ස් කීය. "ඔබේ හඳුනාගැනීම නිවැරදි බවට කිසි සැකයක් නෑ. විස්තර අපි යද්දි කථා කරමු. දූන් හැකි ඉක්මනින් වරෙන්තුව සකස්කරගෙන එන්න ලෙස්ට්‍රේඩ්."

එම කටයුතු සඳහා සැහෙන වේලාවක් ගතවිය. ඉක්මනින් පිටත්වීමට අවශ්‍ය බව පවසමින් හෝම්ස් සිටියේ දැඩි නොඉවසිල්ලෙනි. අවසානයේ එම කටයුතු සම්පූර්ණ කරගෙන යූස්ටන් දුම්රියපොළෙන් දුම්රියට නඟින විට දහවල් එකොළහට ළංවී තිබිණි.

"ඔබ සමහරවිට අහලත් ඇති මහාචාර්ය එම්.ඩී.ඒ. රැට්න්බරි ගැන" හෝම්ස් කීවේ අප රැගත් දුම්රිය යූස්ටන් දුම්රියපොළෙන් පිටත්ව යද්දීය. "ලන්ඩන් විශ්වවිද්‍යාලයේ පෙරදිග භාෂා අංශයේ ප්‍රධානියාව සිටියේ මහාචාර්ය රැට්න්බරි. ඔහු ඉන්දීය භාෂා පිළිබඳ අංක එකේ විද්වතෙක්. ඔහුගේ බිරිඳ විල්මා. ඇය මානසික රෝගියෙක් බව කියමින් ඔහු ඇයගෙන් දික්කසාද වෙන්න උත්සාහ දරමින්නුයි හිටියේ. නමුත් දික්කසාදයක් ගැනීමට අපේ බ්‍රිතාන්‍ය නීතියේ ඇති අඩුපාඩු නිසා, එය සාර්ථක වුණේ නැහැ. මේ අතරේ මහාචාර්ය රැට්න්බරි ඉතා පුදුමාකාර ලෙස නින්දේදී මියගියා. මරණයට හේතුව හරිහැටි සොයාගැනීමට හැකිවුණේ නැහැ. එය මිනීමැරුමක් බවට ඒ කාලෙම මගේ හිතේ සැක පහළ වුණා. නමුත් අපට ඒ වෙනුවෙන් කළ හැකි දෙයක් තිබුණේ නැහැ.

මහාචාර්යතුමාගේ මරණයෙන් පසු, ඇය සරසවියේ ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාරයේ පාලිකාවක් ලෙස රැකියාවක් ලබාගත්තා. සරසවියේ සුළු සේවකයෙකු වූ කුක් නම් පුද්ගලයා සමග විවාහවුණා. ඇය පදිංචි වුණේ රැම්ස්හෝඩන් නම් එම ශිෂ්‍ය නේවාසිකාගාරයේමයි.

ශිෂ්‍යාවන්ගේ ආහාර සඳහා වෙන් කළ මුදල්, ඇය විශාල වශයෙන් වංචා කරන බවට, ලොකු සැකයක් මතුවෙලා තිබුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

මේ ගැන වහාම පරීක්ෂණයක් කළ යුතු බවට නේවාසික සිසුවියන් උද්ඝෝෂණයක් ගෙනගියා. සති දෙකක් ගතවීමට පෙර, එම උද්ඝෝෂණය මෙහෙය වූ සිසුවියන් කණ්ඩායමේ තිදෙනෙක්, ආහාර විෂවීමෙන් මියගියා. මෙයට හේතුව පාවන රෝගයක් බවට පැවසූ සරසවි බලධරයන් සිද්ධිය යටගැසීමටයි උත්සාහ කළේ. නමුත් මේ මරණය සැකකටයුතු බව කියා, වැඩිදුර පරීක්ෂණ පැවැත්විය යුතු බව කියමින්, බොහෝ දෙනෙක් පෙත්සම් ඉදිරිපත් කළා. මාත් එයින් එක්කෙනෙක්. ඒ අනුව මිහිදන් කෙරුණු සිසුවියන් තිදෙනාගේම මළසිරුරු ගොඩ ගෙන පරීක්ෂා කළා. ඒ මළසිරුර වල පොටෑසියම් සයනයිඩ් සොයා හැනීමට හැකිවුණා. ඒ අනුව විල්මා කුක් හා මුළුතැන්ගෙයි සේවිකාවක් අත්අඩංගුවට ගැනුණා. ඒ නඩුව ඔබට මතක ඇති ලෙස්ට්‍රේඩ්?"

"ඔව් හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් පිළිතුරු දුන්නේය. "මිනීමැරුම් තුනටම ඇය වරදකරු බව ඔප්පු වුණා. ඇය මෙසේ මිනීමැරීමට හේතුව, පැරනොයිඩ් ස්කිට්සොෆ්‍රේනියා නම් බිහිසුණු උමතු තත්ත්වයක් වැළැඳීම නිසා බවට විත්තියේ නීතිඥයා වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කළා. එයින් ඇය එල්ලුම් ගස් නොගිහිං බේරුණා. බිහිසුණු මානසික රෝගී අපරාධකරුවන් සඳහා වෙන්වුණු බ්‍රෝඩ්මුවර් බන්ධනාගාරයේ ඇයට ජීවිතාන්තය දක්වා සිරදඬුවමක් නියමවුණා. නමුත් මීට අවුරුදු හතරකට කලින් ඇය එතැනින් පැනගියා. ඊට පස්සේ ඇය ආගිය අතක් හොයාගන්න බැරිවුණා."

"ඇය පෝරකයට නොයැවීම නිසා තවත් අහිංසකයන් හතරදෙනෙකුගේ ජීවිත විනාශවුණා" මම කීවෙමි.

මඳවේලාවක් යද්දී, අප පැමිණි ශීඝ්‍රගාමී දුම්රිය ස්වින්ඩන් දුම්රියපොළට ළඟාවිය. ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියෙන් කළ දැන්වීමක් අනුව ස්වින්ඩන් පොලිසියේ භටයෝ දෙදෙනෙක් ද, පරීක්ෂකයෙක්ද දුම්රියපොළට පැමිණ සිටියෝය. අපේ ඉල්ලීමක් නොමැතිවම පෙරමුණ ගත් තරුණයා, අප රැගෙන ගියේ කුක් මහත්මියගේ නවාතැන් පොළ වෙතයි.

"බාගවෙලාවට ඇය සූදානමින් ඇති අපි පිළිගන්න" ලෙස්ට්‍රේඩ් කීය.

"මං හිතන්නේ නෑ" හෝම්ස් කීය. "ඇය මානසික රෝගයකින් පෙළුණත් ඉතාම කෛරාටික අපරාධකාරියක්. දැන් ගෙදරින් පැන ගිහින් ඇති. ඒක කරන්න ඇත්තේ ඊයේ රෑම. නැත්නම් අද පාන්දර."

http://sherlockholmesinvestigations.blogspot.com

පොලිස් භටයන් ඉදිරි දොරටුව මුරකරද්දී අපි නිවසේ පිටුපසට ගියෙමු. එහි දොරටුව අගුළු දමා නොතිබිණි. නිවස තුළ කිසිවෙකු සිටින බවට සලකුණක් හෝ නොවීය.

අප ඇතුළු වූ කුස්සියේ පැය හතර පහකට පෙර ආහාර පිළියෙල කළ බවට සලකුණු තිබිණ. බිලී වීවර් විස්තර කළ අන්දමට විසිත්ත කාමරයේ සංරක්ෂණය කළ බල්ලා හා ගිරවා ද අපි දුටුවෙමු.

අපි ඉහළ මාලයට නැගුණෙමු ඇගේ නිදන කාමරයේ දොර විවෘතව තිබිණි. පදිංචිකරු කඩිමුඩියේ නිවසෙන් පිටවී ගිය බවට සලකුණු එහි දැකගැනීමට හැකිවිය.

"කිරිල්ලිය පැන ගිහින්" හෝම්ස් කීය.

අපි දෙවැනි තට්ටුවට නැගුණෙමු. එහි කුඩා කාමර තුනක් විය. අගුළු දමා නොතිබූ පළමු කාමරයේ බිලී තරුණයාගේ ඇඳුම් පෙට්ටිය විවෘත කළ අයුරින්ම තිබිණි. දෙවැනි හා තුන්වැනි කාමර අගුළු දමා ඇති බැව් අපි දුටුවෙමු. එම දොරවල් කඩා බිම හෙළීමට අපට පොලිස් භටයන් දෙදෙනාගේ ද සහාය අවශ්‍ය විය.

කාමරවලට පිවිසුණු අපට දක්නට ලැබුණේ ශෝකය මෙන්ම විස්මය ද උපදවන දසුනකි. අවසන් කටයුතු සඳහා සූදානම් කළ සිරුරු මෙන්, එහි ඇඳන් සතරක් මත මළ සිරුරු සතරක් විය. ඖෂධ ගල්වා හොඳින් සංරක්ෂණය කර තිබුණත්, ඒවායේ මුහුණු කළු පැහැයට හැරී තිබිණි. වයිපට්ටිය හා කබා ඇතුළු සම්පූර්ණ ඇඳුමෙන් සරසා සිටි ඔවුනගේ දෙපා අසල, මල් වඩමක් බැගින් විය. ඒ සමගම ඔවුන්ගේ නම් සඳහන් කාඩ්පත බැගින් මල්වඩමට අමුණා තිබිණ.

* * *

අතුරුදන්වූ විල්මා රුවන්බරි කුක් සෙවීමට ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසිය දැඩි උත්සාහයක් දැරුවේය. එට මගේ මිත්‍රයාගේ උදව්ද ලැබිණි. එහෙත් මේ වන තුරුත් මේ භයානක අපරාධකාරිය ගැන කිසිදු තොරතුරක් සොයා ගැනීමට හැකිවී නැත.

"වීවර් තරුණයාගේ හිතේ ආමන්ඩ් සුවඳට පිළිකුලක් තිබුණු නිසා ඔහුගේ ජීවිතය බේරුණා." හෝම්ස් එක් දිනක් කීවේ ඔහුගේ ස්ක්‍රැප් පොතට තවත් තොරතුරක් අලවමිනි. "එහෙම අය බොහොම දුර්ලභයි. ඒ නිසා විල්මා රුටන්බරි කුක් ගැන සොඳිසි කිරීම අත්හැරදමන්න පොලිසියට හැකියාවක් නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

# තේම්ස් නදීතෙර වික්‍රමය

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා අපරාධ පරීක්ෂණ කටයුතු වල නිරතවූයේ, ඒ කෙරෙහි ඔහුගේ සිතේ ඇතිවී තිබූ දැඩි ආශාව නිසා බැව්, මම මීට පෙර ද සඳහන් කර ඇත්තෙමි. අභිරහස් ළමා කොල්ලය පරීක්ෂණයේදී හෝල්ඩනස් සාමිවරයාගෙන්, හෝම්ස් විශාල මුදලක් අයකළ බව සැබෑය. එහෙත් ඔහු එලෙස මුදල් අයකළ වෙනත් අවස්ථාවක්, මට සිහිකිරීමත් අපහසුය. පැමිණි අනුග්‍රාහකයා කොයිතරම් සුප්‍රසිද්ධ, ධනවත් පුද්ගලයෙකු වුවත්, සමහර විට ඒ ගැටලුව විසඳීමට භාරගැනීම, හෝම්ස් ප්‍රතික්ෂේප කළේය. ඒ එක්කෝ විසඳා දීමට තරම් ගැඹුරු පටලැවිල්ලක් එතැන නොතිබුණු විටයි; නැතිනම් ඒ අදාල ක්ෂේත්‍රය හෝම්ස්ගේ සිත් ඇදගැනීමට අසමත් වූ විටයි.

1895 ජුනි මාසයේ මුල සතියේ ශුද්ධෝත්තම පාප්වහන්සේගේ ඇරයුමක් පරිදි, හෝම්ස්ට වතිකානුවට යාමට සිදුවිය. ඒ ටොස්කා නම් අග්‍රාජගුරු ප්‍රසාදිතුමන්ගේ හදිසි මරණය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සඳහායි. එම පරීක්ෂණය වෙනුවෙන් දිවාරෑ නොබලා වෙහෙසවීමට සිදුවීම නිසා, මගේ මිත්‍රයා දැඩි මහන්සියකට පත්ව සිටියේය. සෑහෙන විවේකයක් නොගෙන තවත් මෙවැනි පරීක්ෂණ වල යෙදුණොත්, ඔහු බරපතල ලෙස රෝගාතුර වීමට ඉඩ ඇති බැව් මම දැන සිටියෙමි. එය මගේ බලවත් කණස්සල්ලට හේතු විය. ජුනි මාසයේ අග භාගයේ මෙම පරීක්ෂණය අප වෙත ලැබුණේ එවැනි සමයකයි.

එදා රාත්‍රී භෝජනය සඳහා අපි ෆ්‍රැස්කාටි නම් ඉතාලි අවන්හලට යාමට තීරණය කළෙමු. ඊට පෙර කැෆේ රෝයල් අවන්හලට ගොස් වයින් වීදුරුවක් රසවිඳීමට හෝම්ස් යෝජනා කළේය. ඇඩෙල්බර්ට් ග්රූනර් සාමිවරයාගේ මැරවරයින් අතින්, හෝම්ස්ට බිහිසුණු ප්‍රහාරයක් එල්ල වූයේ මේ කැෆේ රෝයල් අවන්හල ඉදිරිපිටදීය. එය ඔහුට, මට මෙන්ම පාඨක ඔබට ද අමතක නොවන තැනක් වනු නොඅනුමානය.

http://sherlockholmesinvestigations.blogspot.com

ඉතා අලංකාර ලෙස සරසා තිබූ විශාල කාමරයේ පසුබිමෙන් මියුරු පියානෝ වාදනයක් අපට අසන්නට ලැබිණ. හෝම්ස් ඇසූ යමකට පිළිතුරු වශයෙන් මා යමක් කීමට සූදානම් වූවා පමණි. ඔහු තම හිස සොලවා, දෑස් ඉදිරි දොරටුව දෙසට යොමු කළේය.

"ලෙස්ට්‍රේඩ් නේද මේ එන්නේ?" හෝම්ස් ඇසුවේ මදක් පුදුමයට පත්වයි. "මේ මිනිහා මොනවද මෙහේ කරන්නේ?"

මම ආපසු හැරී දොරටුව දෙස බැලීමි. මීයෙකුගේ වැනි මුහුණක් තිබූ, ස්කොට්ලන්ඩ්යාඩ් පොලිස් නිලධාරියා අවන්හලේ දොරටුව අසල සිටගත්තේය. මීළඟට ඔහු තම දෑස් කරකවමින් හෝටල් ශාලාවේ රැස්වී සිටි අමුත්තන් වෙත පරීක්ෂාකාරී බැලුම් හෙලන්නට පටන් ගත්තේය.

"ලෙස්ට්‍රේඩ් ඔබව හොයාගෙන ඇවිල්ල වෙන්න ඇති" මම කීවෙමි. "බාග වෙලාවට ඔහුට මොනව හරි හදිසි වැඩක් ලැබුණද දන්නේ නෑ."

"එහෙම එකක් කියල හිතන්න අමාරුයි වොට්සන්" හෝම්ස් කීය. "ඔහුගේ පාවහන් වතුරෙන් පෙඟිල. ඒ කියන්නේ ඔහු ඇවිත් තියෙන්නේ පයින්. හදිසියක් නම් ඔහු කුලීරියක එනවා මිසක්, පයින් ඇවිදගෙන ඒවි කියල හිතන්න අමාරුයි. ඔන්න ඔහු අප ළඟට එනවා. අහමු ඔහුගෙන්ම."

සෙනග අතරින් අප වෙත පැමිණි ලෙස්ට්‍රේඩ් පුටුවක් ඇදගෙන අපේ මේසයේම අසුන් ගත්තේය.

"මේ සාමාන්‍ය හෝදිසියක් පමණයි හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීවේ, මගේ මිත්‍රයාගේ ප්‍රශ්නයට පිළිතුරු ලෙසිනි. "ඒ වුණාට රාජකාරිය රාජකාරියමයි. මේ වගේ බොහොම ඉහළ පෙළේ අවන්හල් වලින්, මං බොහොම ලොකු ප්‍රචණ්ඩ දාමිමෝරු, මගේ දැලට කොටුකරගෙන තියෙනවා. ඔබතුමන්ලාට තියෙන සැප අපට කොයින්ද? ඔබතුමා නම් බේකර් වීදියේ හාන්සිපුටුවකට වෙලා, සැපට ඉඳගෙන, උපකල්පන ගොඩනංවනවා. අපට කොයින්ද එහෙම වාසනාවක්? අපි පාරට බැහැලා හරක් වගේ වැඩ. පාප්වහන්සේලාගෙන්, රජතුමන්ලාගෙන් අපට කවදද ඉස්තුතියක් ලැබුණේ? ඒ වගේමයි නරක වෙලාවක් ආවොත් පොලිස් ලොක්කො අපේ බෙල්ලෙන්ම අල්ලා ගන්නවා."

"ෂා ෂා ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "පොලිස් ලොක්කෝ ඔබට හරියට ගරු කරන බවයි මට නම් අහන්න ලැබුණේ. මං අර

http://sherlockholmesinvestigations.blogspot.com

රොනල්ඩ් ඇඩෙයාර් මිනීමැරුම සහ බ්රූස් පාටිංටන් අභිරහස විසඳුවාම ඒකෙ ගෞරවේ ලැබුණේ ඔබට නෙමෙයිද?"

"ඒක හරි හෝම්ස් මහත්මයා. ඒක ඇත්ත!" ලෙස්ට්‍රේඩ් කීය. "ඔන්න දැන් නවත් ඒ වගේ ගැටලුවක් මතුවෙලා."

"ඒ මොකක්ද?"

"ඔබතුමා දන්නවානේ ලන්ඩනයේ නැගෙනහිර කෙළවරේ, වරාය පැත්තෙ තිබෙන අපිරිසිදුම හරිය. නරකම මුඩුක්කු තියෙන්නෙත් ඒ ඩෙප්ට්ෆර්ඩ් වල් තමා. ඔය හරියේ තවමත් විශාල ගෙවල් කීපයක් ඉතිරිවෙලා තියෙනවා. අවුරුදු සියයකට, එකසිය පනහකට කලින් නම් මේවල අයිතිකාරයො, ඒ කාලෙ ඉඳපු ධනවත් වෙළෙන්දො. දැන් ඒ සමහරක් අයිති ඔවුන්ගෙ දරු මුණුපුරන්ට. ගෙවල් නම් ඉහාඳටම අබලන්, පරණ තාලේ ඒවා.

මෙන්න මෙයින් එක ගෙයක් පනුම්ය අවුරුදු සියයකට වැඩි කාලයක් අයිතිව තිබුණේ විල්සන් පරම්පරාවේ අයට. ඔවුන් ඒ කාලෙ කරල තියෙන්නේ පිඟන් බඩු වෙළඳම. ඒක අසාර්ථක වෙන්න පටන්ගත්තාම, ඔවුන් ව්‍යාපාර අත්හැර දමල ඒ ගෙදර ජීවත්වුණා. මෑත කාලයේ ඒ ගෙදර පදිංචිව හිටියේ හොරේෂියෝ විල්සන්, ඔහුගෙ බිරිඳ, ඔවුන්ගේ පුතා ජිනියාස් සහ දියණිය ජෙනට් විල්සන්. මීට අමතරව කාලයක් තිස්සේ විදේශ ගතවෙලා, රුකියාවල යෙදීහිට, ආපහු එංගලන්තයට ආව විල්සන්ගේ බාල මල්ලී තියෝබෝල්ඩ් විල්සනුත්, මේ නිවසේ පදිංචිව හිටියා. ඔහු අවිවාහකයෙක්.

අවුරුදු තුනකට කලින් එක දවසක් උදේ, හොරේෂියෝ විල්සන්ගේ, ඒ කියන්නේ අයියාගේ, මිනිය තේම්ස් ගඟේ පාවෙමින් තිබිල හමුවුණා. ඔහු අධික ලෙස මත්පැන් පානය කළ බේබද්දෙක් බව ප්‍රසිද්ධ කරුණක්. කව්රුත් විශ්වාස කළේ රෑ කාලයේ බීමතින් ගෙදර එද්දී, පය වැරැදිලා ඔහු ගඟට වැටෙන්න ඇති කියලයි.

ඊට අවුරුද්දකට විතර පස්සේ ඔහුගේ බිරිඳ- විල්සන් මහත්මිය මියගියා. ඇය හදවතේ රෝගයක් නිසා අසනීපයෙන් හිටියේ. ඇගේ මරණයට හේතුව හෘදයාබාධයක් බව අපි හොඳාකාරවම දන්නවා. ඒ මොකද දෙදෙනෙකු දුන් සාක්ෂි නිසා, මළසිරුර කපා පරීක්ෂා කරල බැලුවා."

"කවුද ඒ දෙන්නා?"

http://sherlockholmesinvestigations.blogspot.com

"තේම්ස් ගඟේ නැංගුරම් දමා තිබුණු බත්තලක මුරකරුවෙක් සහ රාත්‍රී මුර සංචාරයේ යෙදුණු පොලිස් භටයෙක්. ඒ දෙන්නටම රාත්‍රියේ, විල්සන්ගේ ගෙදර පැත්තෙන් මහා විලාපයක් අහන්න ලැබුණලු. පොලිස් භටයා කිව්වලු ඒ විලාපය කොයිතරම් බිහිසුණු එකක්ද කිව්වොත් ඔහුගේ ඇඟේ ලේ වතුර වුණා කියල. ඒ යකා මගේ යටතේ වැඩ කළා නම් මං ඔහුට හොඳ පාඩමක් උගන්වනවා. පොලිස් භටයෙකුටත් පුළුවන්ද ඔය වගේ කථා කියන්න?"

"මෙය සිද්ධවෙලා තියෙන්නේ රෑ කීයටද?"

"රෑ දහයට. ඒක තමයි කාන්තාව මියගිය වෙලාව."

"හොඳයි ඔබේ කථාව දිගටම කියන්න."

සාක්කුවේ තිබූ තම සටහන් පොත අතට ගත් ලෙස්ට්‍රේඩ් මඳ වේලාවක් එය පරීක්ෂාකර බැලුවේය. යළිත් ඔහු කථාව ඇරඹුවේ ඒ දෙස බලාගෙනය.

"ඔව්. පසුගිය මැයි 17 වැනිදා රාත්‍රී විල්සන් පවුලෙ දියණිය-ජෙනට්, සේවිකාවක් සමග ගෙදරින් පිටත ගිහින් තියෙනවා. ඔවුන් ගිහින් තියෙන්නේ බයස්කෝප් දර්ශනයක් නරඹන්න. ආපසු පැමිණි ඇයට දකින්න ලැබුණේ කණගාටුදායක දසුනක්. ඇගේ එකම සොහොයුරා ෆීනියාස් විල්සන් හාන්සි පුටුවේම මියගොස් සිටියා. ෆීනියාසුත් ඔහුගේ මව මෙන්, නින්ද නොයාමේ රෝගයෙන් පෙළුණු, දුර්වල හදවතක් තිබූ කෙනෙක්. කවුරුත් හෝ භීතියෙන් විලාප නැගූ බවට, මෙවර නම් පැමිණිලි තිබුණේ නැහැ. නමුත් මළ සිරුරේ මුහුණ, භීතියෙන් මියගිය අයුරක් පෙන්වමින් විරූපී වී තිබුණා. මේ නිසා මළසිරුර පරීක්ෂා කිරීමට පැමිණි වෛද්‍යවරයා විශේෂ තීරණයක් ගත්තා. ඔහු වැඩිදුර උපදෙස් පතා, පොලිස් ශල්‍ය වෛද්‍යවරයාව කැඳෙව්වා. ඔහු මළසිරුර කපා පරීක්ෂා කිරීම සිදු කළා. එහිදී තීරණය වුණේ මරණයට හේතුව හෘදයාබාධයක් බවයි. පොලිස් වෛද්‍යවරයාගේ මතය වුණේ, හෘදයාබාධයක දී සමහර විට ඇතිවෙන අධික වේදනාව නිසාත්, භීතියෙන් මියගිය අයෙකුගේ ලක්ෂණ මුහුණෙන් ප්‍රකාශවිය හැකි බවයි."

"ඒක සම්පූර්ණ ඇත්ත" මම කීවෙමි.

"මෙයින් පසු, විල්සන් පවුලේ ඉතිරි වී ඉන්නා එකම සාමාජිකාව- ජෙනට් විල්සන් මෙනෙවිය, බලවත් කම්පාවකට පත්වෙලයි ඉන්නේ. ඇය තීරණය කළාලු සියල්ල විකුණා දමලා

http://sherlockholmesinvestigations.blogspot.com

විදේශ ගතවෙන්න. මේ බව මට කිව්වේ ඇගේ බාප්පා තියොබෝල්ඩ්" ලෙස්ට්‍රේඩ් කීය.

"ඔබට කියන්න ලෙස්ට්‍රේඩ්, විල්සන් තරුණියාගේ මරණය ගැන පළවූ පුවත මම "මෝනිං ක්‍රොනිකල්" පුවත්පතේ කියෙව්වා." හෝම්ස් කීය. "කලින් මරණ දෙක ගැනත් එහි සඳහන් වෙලා තිබුණා. එකම පවුලක අය, මේ විදියට එක ළඟ ළඟ ඛේදජනක ලෙස මියයාම ගැන ඒ වෙලාවේ මගේ හිතෙත් කුතුහලයක් ඇතිවුණා."

"එහෙනම් ඔබතුමා මේ සිද්ධිය හොඳින් දන්නවා? මේ ගැන වැඩිදුර හොයා බැලුවද?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

"නැහැ." හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔය දවස්වලම තමයි අර දොස්තර නිව්ටන් වේලර්ට එරෙහිව චෝදනාවක් එල්ල වුණේ ඔහුගේ චිකිත්සාගාරයේ සේවය කළ හෙදිය මරාදැමීම ගැන. බාගවෙලාවට ඔබට එය දැනගන්න ලැබෙන්න නැහැ. මට ඒ සඳහා ස්කොට්ලන්තයට යාමට සිදුවුණා.

විල්සන් මෙනෙවියගේ සිතේ මේ වගේ හැඟීම් ඇතිවීමේ පුදුමයක් නෑ. මේ විදියට තමන්ගේ පවුලේ එක පිට එක මරණ සිදුවුණාම, ඕනෑම කෙනෙක් භය වෙන එක ස්වාභාවිකයි. ඇගේ බාප්පා, මොකද ඒ ගැන කියන්නේ?"

"ආ.... ඔහු ඊව් හෙට උදේ ඔබව හමුවෙන්න, ඔබේ ගෙදරට. තියොබෝල්ඩ් විල්සන් ස්කොට්ලන්ඩ්යාඩ් එකට ඇවිත් මාව හමුවුණා. ඔහු කියනවා ඇත්ත තත්ත්වය ඔහුගේ ඥාති දියණියට පහදා දීම අපට කරන්නලු. හදිසි ස්වාභාවික මරණ ගැන හිත කලබල කරගන්නේ නැතුව, බුද්ධිමත් තීරණයක් ගන්න කියලා ඇයට කියන්නලු. හිත කම්පා කරගෙන ඉන්න ගැහැනුළමයි සනසනවාට වඩා, වැදගත් බැරෑරුම් කටයුතු අපට තියෙනවා. ඒ නිසා මං ඔහුට කිව්වා, ගිහින් ඔබව හමුවෙන්න කියලා."

"හැබැට? ඥාති දියණිය මේ වගේ අවාසනාවන්ත සිදුවීමක් නිසා රට හැර යන එක ගැන, ඔහුගේ සිත කැලඹීමේ පුදුමයක් නෑ." හෝම්ස් කීය.

"සිත කැලඹීමක්ම නෙමෙයි හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "විල්සන් ඔහුගේ ඥාති දියණියට හරි ආදරෙයි. මේ වගේ ක්ෂණික තීරණයක් අරගෙන රට හැර යාමෙන්, ඇගේ අනාගතය

http://sherlockholmesinvestigations.blogspot.com

සම්පූර්ණයෙන්ම අඳුරු විය හැකි බවයි ඔහු කියන්නේ" කථාව මඳකට නැවැත්වූ ලෙස්ට්‍රේඩ් සිනාවක් පෑවේය. "ඒ වුණාට මේ තියෝබෝල්ඩ් මහත්මයා, මේ ලෝකෙ සැප සම්පත් ගැන බල බලා ඉන්න කෙනෙකුත් නෙමෙයි. මගේ මේ රක්සාවෙ මට ඉතා පුදුමාකාර මිනිස්සු හමුවෙලා තියෙනවා. ඒත් මේ පුද්ගලයා, ඒ හැම කෙනෙකුටම වඩා වෙනස්. ඔහු කැනරි කුරුල්ලන් පුහුණු කරන්නෙක්."

"ඒක ඉතින් පිළිගත්ත වෘත්තියක් නේ."

"හැබෑට?" ලෙස්ට්‍රේඩ් කීවේ අකුතුටට පත් අයුරෙනි. පුටුවෙන් නැගී සිටි ඔහු තම හිස්වැස්ම අතට ගත්තේ පිටවී යෑමට සූදානමෙනි. "ඔබට නම් නින්ද නොයෑමේ රෝගයක් නැති බව අපට විශ්වාසයි හෝම්ස් මහත්මයා. එහෙම නොවුණා නම් ඔබට වැටහේවි, විල්සන් උන්නැහේ පුහුණු කරන කැනරි කුරුල්ලන් අනික් උන්ට වඩා වෙනස් බව. ශුභ රාත්‍රියක් මහත්වරුනි."

"මොකක්ද ඔහු එයින් අදහස් කළේ?" මා ඇසුවේ ඔහු ඉදිරි දොරෙන් පිටවී යනු බලාසිටිමිනි.

"අපට එයින් තේරුම් ගන්න හැකි වෙන්නේ, අපි නොදන්නා මොනවා හරි, ඔහු දන්නා බවයි." හෝම්ස් කීය. "නමුත් සතුටුදායක දත්ත ප්‍රමාණයක් නැතිව, නොයෙක් අනුමාන කිරීම් වලින් අපට ප්‍රයෝජනයක් නැහැ. ඒ නිසා අපි හෙට උදේ වනතෙක් ඉමු. කොහොම වුණත් දේවගැතිතුමෙකු විසින් කළයුතු කටයුත්තක් කරන්න භාරගන්න, මගේ නම් අදහසක් නෑ. ලෙස්ට්‍රේඩ්ලට පමණක් නෙමෙයි, ගෑනුළමයි සනසන්නවාට වඩා වැදගත් වැඩ අපටත් තියෙනවා."

මගේ මිතුරා උදෑසන සිට බලාසිටි නමුත්, ඔහු හමුවීමට කිසිදු පුද්ගලයෙක් පැමිණියේ නැත. දහවල් ආහාරය අවසන් වෙද්දී, රෝගියෙකුගෙන් කැඳවීමක් ලැබුණෙන් මම ඒ සඳහා පිටත්ව ගියෙමි. මා ආපසු පැමිණෙද්දී, අමුත්තෙක් අපේ විසිත්ත කාමරයේ අසුන්ගෙන සිටි බැව්, මට දක්නට ලැබිණි.

ඔහු ඉතා අසාමාන්‍ය ලෙස කෙට්ටු, මැදිවියේ පුද්ගලයෙක් විය. ඒ බව ඔහු මට ආචාර කිරීම සඳහා අසුනෙන් නැගිටිද්දී මම දුටුවෙමි. උපැස් යුගලක් පැළැඳ සිටි විල්සන් මහතාට තිබුණේ; උගත් බුද්ධිමත් එමෙන්ම චාම් දිවියක් ගෙවන පුද්ගලයෙකුගේ

http://sherlockholmesinvestigations.blogspot.com

පෙනුමකි. අවුරුදු ගණනාවක් උෂ්ණ කලාපික රටවල වාසය කිරීම නිසා, ඔහුගේ මුහුණ තඹ පැහැ ගැන්වී, රැළිවැටී තිබිණ.

"ආ...... වොට්සන්. ඔබ ආවෙ හොඳ වෙලාවට" හෝම්ස් කීය. "මේ තමයි තියෝබෝල්ඩ් විල්සන් මහත්මයා. ඊයේ ඊ ලෙස්ට්‍රේඩ් අපට කිව්වේ මේ මහත්මයා ගැන නොවැ."

අමුත්තා මගේ සුරතෙන් අල්ලාගත්තේ සුහද අයුරෙනි. "වොට්සන් දොස්තර මහත්මයා. ඔබේ නම නම්, මට හොඳට පුරුදුයි." ඔහු කීය. "ෂර්ලොක් හෝම්ස් මහත්මයා, මට සමාව දේවි මං මෙහෙම කියනවට. දොස්තර මහත්තයා ලිවීමේදී දක්වන දක්ෂකම නිසා නොවෙන්න, අපට හෝම්ස් මහත්මයාගේ දක්ෂකම් දැනගන්න ලැබෙන්නේ නෑ. ඒ ගැන අපි ඔබට ස්තුතිවන්ත විය යුතුයි. වෛද්‍යවරයෙක් හැටියට, ඔබ ස්නායු කම්පනයෙන් පීඩා විඳින්නන් සුවකරල ඇති. මං හිතන්නේ, කණගාටුවෙන් ඉන්න මගේ ඥාති දියණිය ගැන ඔබෙනුත් මොකක් හරි පිහිටක් ලැබේවි."

"වොට්සන්" හෝම්ස් මා ඇමතීය. "මං විල්සන් මහත්මයාට පොරොන්දු වුණා, ඔහුත් එක්ක ඩෙප්ට්ෆඩ් වල ඔවුන්ගේ නිවසට එනවා කියල. ජෙනට් මෙනෙවිය නම් හෙටම ගෙදරින් යන්න තීරණය කරලාලු ඉන්නේ. විල්සන් මහත්මයා. මං ඔබට ආයෙමත් මතක් කරන්න කැමැතියි. මං ගිහින් කරුණු කිව්වා කියල, ඇය ඇගේ තීරණය වෙනස් කරාවිද? මට නම් හිතන්න අමාරුයි."

"හෝම්ස් මහත්මයා. ඔබ සතු දක්ෂතාවය ගැන සඳහනක් වත් කරන්නේ නැති තරමට, ඔබ හරිම නිහතමානියි. මං මේ ගැන පොලිසියට කිව්වා. ඔවුන් තමයි ඔබට මේ කරුණ කියන්න කියල යෝජනා කළේ."

"වොට්සන්. හඩ්සන් මහත්මියට දැනුම් දෙන්න, අපට රෝද හතරේ අශ්ව කරත්තයක් කැඳවන්න කියල. අපි ඩෙප්ට්ෆඩ් බලායන අතරේ මං කැමැතියි විල්සන් මහත්මයා සමග තවදුරටත් සාකච්ඡා කරන්න. තවමත් නොපැහැදිලි තැන් කිහිපයක්ම තියෙනවා, ඔබෙත් අහල දැනගත යුතු."

ඒ ගිම්හාන සෘතුව වුවද, ලන්ඩන් නගරයේ පැවැතියේ අඳුරු ස්වභාවයකි. අපි බ්ලැක් ෆ්‍රයර්ස් පාළම උඩින්, තේම්ස් නදිය තරණය කළෙමු. මහවනයේ වගුරු බිමකින් නැගෙන විෂදුම් වලාවන් මෙන්, තේම්ස් ගඟෙන් මීදුම් වළලු ඉහළට නැගුණු හැටි අපි දුටුවෙමු.

http://sherlockholmesinvestigations.blogspot.com

අපේ කරත්තය ඇදී ගියේ, වරාය අසබඩ පටු මාර්ගය හරහාය. දුගඳ හැමූ අපිරිසිදු මං මාවත් වලින් යද්දී, හෝම්ස්ගේ මුහුණේ තිබුණේ දොම්නස් සොබාවකි. එහෙයින් මම විල්සන් මහතා සමග කතාබහක යෙදීමට උත්සාහ කළෙමි.

"මට අහන්න ලැබුණා, ඔබ කැනරි කුරුල්ලන් පුහුණු කිරීම ගැන විශේෂඥයෙකු බව?" මම ඇසීමි.

උපැස් යුගළේ ගනකම් වීදුරු පිටුපස වූ, විල්සන්ගේ දෙනෙත් සතුටින් දිලිසෙන්නට පටන්ගත් හැටි මම දුටුවෙමි. "මං තවමත් කුරුල්ලන් ගැන අධ්‍යයනය කරන්නෙක් පමණයි මහත්මයා" ඔහු කීය. "ඒ වුණත් පහුගිය අවුරුදු තිහක කාලයක්, මේ කුරුල්ලන්ගේ හැසිරීමේ රටාව ඇතුළු හැමදෙයක් ගැනම පර්යේෂණ වල යෙදුණා. ඔබටත් මේ ක්ෂෙත්‍රය හදාරන්න හිතුණාවත්ද? නැහැ? ඒක හරි කණගාටුවට කරුණක්.

ග්‍රින්ජිලා කැනරියා කුරුලු විශේෂය පිළිබඳ අධ්‍යයනයක යෙදීම, පර්යේෂණ කිරීම කළ හැකි නම්, ඒක මිනිසෙකුට ජීවිත කාලයටම කළ හැකි අගනා කර්තව්‍යයක්. ඔය අක්මීන් ගැන විශේෂඥ දැනුමක් තිබෙනවා කියන අය, මේ සතුන් ගැන දන්නා තරම ඇසුවාම, මට කණගාටු හිතෙනවා. පහුගිය කාලෙ මම, බ්‍රිතාන්‍ය පක්ෂි විද්‍යා සංගමයේ, විද්‍යාත්මක සැසිවාරයට මගේ පර්යෙෂණ ගැන දේශනයක් කළා. මගේ මාතෘකාව වුණේ "මැඩෙයිරා දූපත් හා කැනරි දූපත් වල ග්‍රැන්ජිලා දෙවර්ගය පුහුණු කිරීම" ඔවුන් ගෙන් ඉදිරිපත් වුණු ප්‍රශ්න වලට සවන් දුන්නාම මගේ හිතේ ඇතිවුණේ මහා කලකිරීමක්."

"ශී කියන කුරුල්ලන් පුහුණු කිරීමට ඔබේ ඇති දක්ෂතාවය ගැන, ලෙස්ට්‍රේඩ් සඳහන් කළා."

"ග්‍රින්ජිලා කියන්නේ මහත්මයා, සොබාදහම විසින් නිර්මාණය කළ, සෞන්දර්යාත්මක සවන් යුගළයා. ඔවුනට තියෙනවා ගීත අනුකරණය කිරීමට, අපූර්ව හැකියාවක්. මනුෂ්‍ය වර්ගයාගේ අධ්‍යාත්මික වර්ධනයට පවා, ග්‍රින්ජිලා කුරුල්ලාගේ ගායන කෞශල්‍යය යොදාගන්න පුළුවනි. ලෙස්ට්‍රේඩ් මහත්තයා කිව් දේ ඇත්ත. මං ඔවුන්ව කෘතිම ආලෝකය ඇති පරිසරයක, රෑ කාලයට ගීත ගයන්නත් පුහුණු කරලා තියෙනවා."

"ඒක, කෙනෙක් ඉත්‍රාම කුලාතුරකින් යෙදෙන ආකාරයේ කටයුත්තක්" මම කීවෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. ඒ වුණත් මං ඒක යොදාගෙන තිබෙන්නේ, නින්ද නොයෑමේ රෝගය තිබෙන අයගේ යහපත පිණිසයි. එංගලන්තය පුරාම මගේ අනුග්‍රාහකයින් ඉන්නවා. මගේ කුරුල්ලන්ගේ ගායනා, ඉතාම මියුරු, සවන් පිනන ස්වරයෙන්, රාත්‍රී කාලය පුරාම ගලායනවා. එයින් අර පුද්ගලයින්ගේ මනසට ලැබෙන්නේ අපරිමිත වින්දනයක්. ගායනා අවසන් වෙන්නේ පහන් නිවා දැම්මාට පස්සෙයි."

"ලෙස්ට්‍රේඩ් කිව්ව දේ හරි" මම කීවෙමි. "ඔබේ වෘත්තිය නම් අපූරුම වෘත්තියක්."

අප කතාබහේ යෙදෙන අතරේ අපේ අනුග්‍රාකයාගේ සැරයටිය අතට ගත් හෝම්ස් එය තම අවධානයට ලක් කළේය.

"මට දැනගන්න ලැබුණා, ඔබ එංගලන්තයට ආපහු ආවෙ, අවුරුදු තුනකට කලින් කියලා?" හෝම්ස් ඇසීය.

"ඔව් මහත්මයා."

"ඔබ ඇවිත් තියෙන්නේ කියුබාවෙ ඉඳල බව මට පෙනෙනවා."

තියොබෝල්ඩ් විල්සන් එක්වරම තිගැස්සුණු බව මම දුටුවෙමි. ඔහු හෝම්ස් දෙස බැලුවේ තරමක් සැකය මුසු බැල්මකිනි.

"ඔව්" ඔහු කීය. "ඔබ කොහොමද ඒක දැනගත්තේ?"

"ඔබේ සැරයටිය සාදා තිබෙන්නේ කියුබානු කළුවර ලීයෙන්" හෝම්ස් කීය. "ලීයේ ඇති කළු පැහැයට ලා කොළ පැහැය මිශ්‍ර වීමත්, එහි ඇති අසාමාන්‍ය ඔපයත් නිසා, මට ඒක වරදින්න බැහැ."

"මං මේක ලන්ඩනයේදී මිලදී ගත්තා වෙන්න පුළුවනි" විල්සන් කීය. "මං වෙනත් රටක, අප්‍රිකාවෙ ඉඳලා ආවා වෙන්නත් පුළුවනි?"

"නැහැ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මේක සෑහෙන කාලයක් තිස්සේ ඔබ ළඟ තිබිල තියෙනවා. ඔබට පෙනෙනවා ඇති, සැරයටියේ මිට කොටසේ, එක් තැනක් ක්‍රමානුකූලව, දීර්ඝ කාලයක් තිස්සේ ගෙවී ගොස් ඇති හැටි. මේක වම් අතින් සැරයටිය ගෙන යන කෙනෙකුගේ, මුදු ඇඟිල්ලේ පැළැඳි මුද්දක් නිසා සිදුවූ දෙයක්. කළුවර කියන්නේ ඉතාම සවිශක්තිය ඇති දැව වර්ගයක්. ඒක මේ ආකාරයට ගෙවී යන්න නම්, රත්රන් වලට වඩා දැඩි ලෝහයක්, සෑහෙන කාලයක් තිස්සේ එතැන ඇතිල්ලිය යුතුයි. ඔබ චමත්කාරයෙක් බව මට පෙනෙනවා. ඒ වගේම ඔබේ ඇඟිල්ලේ ඇති මුදුව, රිදී එකක්."

"අනේ දෙවියනේ!" විල්සන් කීය.

Reading Pursue Online. Hot Free Print.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ වගේ දේවල් නිගමනය කිරීම කොයිතරම් පහසු වැඩක්ද. එක සැරේම මට හිතුණේ, මෙවැනි දෙයක් සොයාගැනීමෙන් ඔබ කළේ හරි දක්ෂකමක් කියලයි. මං සෑහෙන කාලයක් තිස්සේ කියුබාවට වෙලා, සීනි කර්මාන්තයේ යෙදිලා හිටියා. මං එහෙදී පාවිච්චි කළ සැරයටිය තමා මේ ගෙන ආවේ. ඔන්න අපි ගෙදර ළඟටම ආවා. දැන් ඉතින් මගේ අතීතය සොයාගත්ත වගේ, මගේ මෝඩ ඥාති දියණියගේ හිතේ ඇතිවී තිබෙන භය නැතිකරන්න, ඔබට හැකිවේවි කියල, මං හිතනවා. එහෙ කළ හැකි නම්, මං ඔබට සදා කාලයටම ණයගැතියි හෝම්ස් මහත්මයා."

අපි අශ්වකරත්තයෙන් බිමට බැස්සෙමු. එක්වරම අපට දකින්නට ලැබුණේ, දුර්වර්ණ වූ නිවාස පේළියකින් මායිම් වූ පටු මාවතකි. පාරේ අනෙක් මායිම තේම්ස් ගංගාවය. එහි ඉවුර දෙසින්, කහ පැහැති මීදුම ඉහළට ඒමට පටන්ගෙන තිබිණි.

විල්සන් මහතා සංඥාකළ දෙසට අපි ඒා නැඟුවෙමු. නිවසේ තාප්පය බැඳ තිබුණේ පාරට මායිම් වන ලෙසයි. එය තැනින් තැන කැඩී බිඳී ගොස්, පාසි වලින් වැසුණු, පැරණි ගඩොල් තාප්පයකි. අපි යකඩ ගේට්ටුවක් වෙත ළඟාවූයෙමු. තරමක් විශාල ඉඩම් කැබැල්ල මැද, විශාල නිවස පිහිටා තිබිණි. වල් බිහිවුණු මිදුලෙනුත්, ගරාවැටෙමින් තිබූ නිවසෙනුත් දිස්වූයේ, බියකරු මෙන්ම මුස්පේන්තු බවකි.

"මේක බොහොම කාලයකට ඉස්සර, මාලිගාවක් වගේ තිබුණු ගෙයක්" ඔහු කීවේ ගේට්ටුවෙන් ඇතුළු වී අප වත්ත ඇතුළට කැඳවාගෙන යද්දිය. "මේක ගොඩනඟලා තියෙන්නේ, මහා පීටර් රජ්ජුරුවෝ, ස්කේල්ස්කෝට් පෙදෙසේ පදිංචියට ආව කාලෙ. මේ ගෙදර උඩ තට්ටුවේ ජනේල වලට, රජ උයනේ නටබුන් තවමත් පෙනෙනවා."

නිවසට සමීපවෙද්දීම, මගේ හිතේ ඇතිවුණේ අප්‍රසන්න සිත් කලකිරවන හැඟීමය. එය විශාල නිවසක් බව සැබෑය. එහෙත් සෑම තැනකම වාගේ, බිත්තිවල බදාම කඩාවැටී, යටින් තිබූ ගඩොල් මතුවී තිබිණ. බදාම ඉතිරිවී තිබූ තැන්වල ද, එය කොළ පැහැති පෙඳ පාසි වලින් වැසී ගොස් තිබූ අයුරු පැහැදිලිවම දැකිය හැකිවිය. තවත් තැනක එක් බිත්තියක් වැසී ගොස් තිබුණේ අයිවි මල් පඳුරු වලිනි. ඒවා බිත්තිය දිගේ ඉහළට ගමන්කොට, වහලේ දුම්කවුළු

http://sherlockholmesinvestigations.blogspot.com

පවා ආක්‍රමණය කොට තිබූ අයුරු දැක ගන්නට ලැබිණ. ගෙවත්ත සම්පූර්ණයෙන්ම වල් බිහිවී ගොස්ය. එහි මල් වැවීම ගෙහිමියන් විසින් කලකට පෙර අත්හැර දැමූ අයුරකි. නිවස හා මිදුල අවට පැතිරී තිබුණේ, ගංඉවුරේ එකතුවූ වතුර පල්වීමෙන් නැගුණු දුගඳයි.

තියෝබෝල්ඩ් විල්සන් පටු බරාඳයක් මැදින් අප කැඳවාගෙන ගියේය. එවිට අප පිවිසුණේ ලොකු විසිත්ත කාමරයකටයි. එය සෑහෙන තරම් ගෘහභාණ්ඩ තිබූ සුවපහසු තැනක් විය.

අපේ අඩි ශබ්දය ඇසී, පුටුවක් වාඩිවී සිටි තරුණ කාන්තාවක් එක්වරම එතැනින් නැගිට්ටාය. ඇය සිටියේ යම් කටයුත්තක නිරතවී බැව් අපි දුටුවෙමු. ඒ, මේසයක ලාච්චු එළියට ඇද, අවශ්‍ය ලියකියවිලි සෙවීමේ උත්සාහයකි. ඇය රතු මිශ්‍ර දුඹුරු පැහැති කේශ කලාපයක් තිබූ, සිහින් තරුණියක බව අපි දුටුවෙමු. ඇගේ සුදු පැහැති හමේ දුඹුරු පැහැති තිත් වැටී තිබුණේ, නිතර සූර්ය රශ්මියට නිරාවරණය වීම නිසා විය යුතුය.

"මෙන්න ෂර්ලොක් හෝම්ස් මහත්තයයි දොස්තර වොට්සනුයි ආවා" අපේ අනුග්‍රාහකයා උස් හඬින් කීවේය. "මේ මගේ ඥාති දියණිය- ජෙනට්. ඇගේ හිතේ ඇතිවී තිබෙන අහේතුක බිය, ඇගේම යහපත පිණිස නැතිකර ලීමයි ඔබේ කාර්යය, මහත්වරුනි."

තරුණිය අප වෙත යොමු කළේ එඩිතර මුහුණකි. එහෙත් ඇගේ සිතේ තිබූ භීතියත්, එයින් ස්නායුවලට ඇතිවී තිබූ කම්පනයත් මට හඳුනාගත හැකිවිය. මුහුණේත් දෙතොලේත් මස්පිඩු වරින්වර අසාමාන්‍ය ලෙස හැකිළුණේ ඒ බැව් හඟවමිනි.

"බාප්පේ. මං කලින් කිව්වා වගේ, හෙට මෙහෙන් යන එක යනවමයි." ඇය කීවේ උස්හඬිනි. "මේ මහත්වරු මොනවා කිව්වත් මගේ ඒ තීරණය වෙනස් කරන්නේ නෑ. දැන් මේ ගෙදර තියෙන්නේ ශෝකය හා භීතිය පමණයි!"

"ඔබ මොකටද භය වෙන්නෙ?" හෝම්ස් ඇසුවේය.

තරුණිය තම දකුණු අත්ලෙන් දෑස වසා ගත්තාය. "මට නම් තේරෙන්නේ නෑ කියන්න. ඒ වුණාට මේ ගෙදර ඇහෙන්නේ මහා පුදුමාකාර ශබ්ද. හැමතැනම දකින්න ලැබෙන්නේ අඳුරු සෙවණැලි."

"ජෙනට්. ඔබට පිය උරුමයෙන් සල්ලි ලැබිල තියෙනවා; දේපොළ ලැබිල තියෙනවා" විල්සන් මහතා කීවේ අවංක හඬෙනි. "ඔය හිතේ මවාගත්තු අඳුරු සෙවණැලි නිසා, තාත්තලා සියලා

http://sherlockholmesinvestigations.blogspot.com

අවුරුදු සියගණනක් ජීවත්වුණු, මේ ගේදොර අත්ඇරලා දාල යන්නද හදන්නේ?"

"තරුණ නෝනා. අපි මෙහේ ආවේ ඔබට උදව් කිරීමේ අරමුණෙන්." හෝම්ස් කීවේ ඇගේ සිත සනසන හඬකිනි. "අපට ඕන කරන්නේ ඔබ මේ භයවෙලා තියෙන්නේ මොකටද කියල දැනගෙන, ඒ භය නැතිකරන්න. වැඩිදුර හිතා නොබලා, දැඩි තීරණ ගන්න එපා. එහෙම කිරීමෙන් සමහර වෙලාවලදී, අපි අපේ ජීවිත අඳුරු මාර්ග වලට යොමුකරගන්නවා."

"මහත්මයා" ඇය කීවාය. "සමහර වෙලාවලට අනෙක් අයට නොපෙනෙන කාරණා, ගැහැනියකගේ හිතට ඉවෙන් වාගේ වැටහෙනවා. ඒවා ඇහුවාම ඔබ නම් හිනාවේවි."

"කොහොමටවත් නෑ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔබ කියන දේ ඇත්ත. ඒවා සමහරවිට අදෘශ්‍යමාන බලවේග වලින් අපට පෙන්වා දෙන කාරණා වගෙයි. ඔබ මෙහේ රැඳෙනවාද, නැත්නම් පිටවෙලා යනවද කියන එක තීරණය කිරීම, ඔබට භාරයි. නමුත් ඊට කලින්, ඔබේ හිත භයට පත්වුණේ මොකක් නිසාද කියල මට කියන්න. බාගවෙලාවට මට හැකිවේවි ඒකට විසඳුමක් හොයාගන්න. දැන් ඉතින් මේ විශාල මන්දිරය පුරා අපව එක්කගෙන ගිහින්, අපට ගේ පෙන්වලා දෙන්න. ඒකනුත් ඔබේ හිතට සහනයක් දැනේවි."

"ඉතාම අනර්ඝ අදහසක්" විල්සන් කීවේය. "යමු ජෙනට්. ඔබේ හිතේ තියෙන ඔය සෙවණැලි ගැන භය, ඔක්කොම නැතිකරන්න අපට හැකිවේවි."

අපි සිව්දෙනා මුලින්ම එම නිවසේ බිම් මහලේ කාමරයෙන් කාමරයට ගමන් කළෙමු.

"මං ඔබට නිදන කාමරේ පෙන්වුණ්නම්" විල්සන් මෙනෙවිය කීවේ අන්තිමේදී අප උඩුමහලට නගින පුරප්පුව අසල රැඳී සිටියදීය.

"මේ තරම් පරණ ගෙයක් වෙලාත්, මේකෙ පොළොව යටට හෑරූ ගබඩා කාමර එහෙම නැද්ද?" හෝම්ස් ඇසීය.

"එවැනි එක ගබඩා කාමරයක් තියෙනවා හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "ඒ වුණාට ඒක ඒ හැටි පාවිච්චියට ගන්නෙ නෑ. බාප්පගේ පරණ කුරුලුකූඩු දූමු පෙට්ටි සහ දර තමයි ඒකෙ ගබඩාකරල තියෙන්නේ. එන්න මේ පැත්තෙන්. මං ඒක ඔබට පෙන්වන්නම්:"

http://sherlockholmesinvestigations.blogspot.com

අපට දකින්නට ලැබුණේ, බිත්ති ගල් වලින් තැනූ අඳුරු කාමරයකි. එහි එක් කෙළවරක දර ගොඩගසා තිබිණ. තවත් බිත්තියක් සමීපයේ, දර දමා දල්වන, ඕලන්ද මෝස්තරයේ පැරැණි ගිනිඋදුනකි. එය සකසා තිබුණේ, විශාල යකඩ පයිප්ප මගින් උණුසුම් වාතය නිවස පුරා කාමරවලට රැගෙන යන අයුරෙනි. මේ පයිප්ප සිවිලිම දිගේ ගොස්, කාමරයේ එක් මුල්ලකින් ඉහළට නැගිණ. කාමරයේ ඒ කෙළවරින්ම දොරක් විය. මෙම වීදුරු දොර හැරගෙන, තරප්පු පෙළ නැගීමෙන් ගෙළයනට යා හැකිවිය. එතැන තරමක දුර්ගන්ධයක් පැවැතිණ. හෝම්ස් කිහිපවිටක් තදින් ආශ්වාස- ප්‍රශ්වාස කරමින් උත්සාහ කළේ, එම දුර්ගන්ධය කුමක්දැයි හඳුනාගැනීමට වියයුතුය. ගඟේ මඩ පල්වීමෙන් නැගුණු දුගඳ මට නම් පහසුවෙන්ම හඳුනාගත හැකි විය.

"තේම්ස් ගඟ අයිනේ බොහොමයක් ගෙවල්වලට වගේ, ඔබටත් මීයන්ගෙන් කරදර ඇති?" මගේ මිත්‍රයා ඇසුවේ විල්සන් මෙනෙවිය ගෙනි.

"ඉස්සර නම් හරියට මී කරදරේ තිබුණා" ඇය කීවාය. "ඒත් බාප්පා මෙහේ පදිංචියට ආවාට පස්සේ බාප්පා උන් ඔක්කොම වඳකරලා."

"ඒක හරි" හෝම්ස් කීවේ කාමරයේ පොළොව දෙස පරීක්ෂාවෙන් බලමිනි.

"අනේ හැබෑට! පුංචි සතුන්ට නම් වැඩ රාජකාරි හරියට."

ඔහු බලා සිටි දෙය වෙත, මගේ දෑස ද යොමු කළෙමි. ගිනිඋදුන අසල සිටි කුඹී වැලක් කාමරය හරහා තරප්පුව අසලටත්, එතැනින් ගෙළයන දෙසටත් ගමන් කළේය!

"මේ වගේ රාජකාරියක් අපට භාරන්නු සිදුවුණේ නැත්තෙ හොඳ වෙලාවට වොට්සන්" හෝම්ස් කීවේ අතේ තිබූ කෝටුව කුඹිවැල දෙසට දිගුකරමිනි. "තමන්ගේ ශරීරය වගේ තුන්ගුණයක් ලොකු කෑම කැලි ඔසවාගෙන යන්න වෙන එකත්, ලේසිපහසු වැඩක් නෙමෙයි. බොහොම ඉවසිල්ලෙන් කළ යුතු කටයුත්තක්. අපට හොඳ පාඩමක්."

එසේ කී හෝම්ස් නිශ්ශබ්ද වී මිනිත්තු කිහිපයක් පොළොව දෙස පරීක්ෂාවෙන් බලා සිටියේය.

"........ හොඳ පාඩමක්" යළිත් ඔහු මුමුණන හඬ මට ඇසිණ.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක මහ මෝඩ කතාවක්" මෙතෙක් වේලා නිහඬව සිටි තියෝබෝල්ඩ් විල්සන් කීයේ. "මේ කුඹී වැලක් හැදිලා තියෙන්නේ, සේවකයො කුණුබාල්දිය වෙත යන්නේ කම්මැලි කමට, ඉතිරිවෙන කෑම ගිනිඋදුනට විසිකරන නිසා."

"ඉතින් ඔබ උදුන් දොරට අගුළක් සවිකළාද?"

"ඔව්. අගුළු දාල වහන විධියට සකස් කළා. ඔබට ඕනෙ නම් මං යතුර ගෙනැල්ලා, ඇරලා පෙන්වන්නම්. ඕනෙ නෑ? ඉතින් මෙතැන වැඩ කටයුතු ඉවර නම් යමු. මං පෙන්වන්නම් උඩ තට්ටුවේ නිදන කාමර."

"මම කැමැතියි ඔබේ සොහොයුරා මියගිය කාමරය බලන්න" හෝම්ස් විල්සන් මෙණෙවියට කීවේ, අප ඉහළ මාලය වෙත ළඟාවෙද්දීය.

"මෙන්න ඒ කාමරේ" ඇය කාමරයක දොර හරිමින් පැවසුවේ අප උඩ තට්ටුවට ළඟාවූ පසුවය.

එය සෑහෙන තරම් විශාල කාමරයක් විය. එයට ආලෝකය සැපයුණේ විශාල ජනෙල් කවුළු දෙකකිනි. අවශ්‍ය තරම් ගෘහභාණ්ඩ තබා, තරමක් සුඛෝපභෝගී යයි කිවහැකි අයුරින්, එය සකස් කොට තිබිණි. මේ කාමරයේ කෙළවරක ද විශාල බඳක් සහිත ගිනිඋදුනක් විය. උදුනෙන් ඉවතට ගිය පයිප්පයේ කුරුළු කූඩු දෙකක් එල්ලා තිබිණි.

"අර පැත්තේ තිබෙන දොරෙන් යන්නේ කොහේටද?" මගේ මිත්‍රයා ඇසීය.

"ඒ දොරෙන් යැවෙන්නේ මගේ කාමරයට. ඉස්සරවෙලා මගේ අම්මගේ කාමරය වුණේ ඒක."

"මට වැටහෙන විධියට ඔබේ අයියා, හුඟක් ඊ වෙනතුරු පොත්පත් කියවීමට ඇබ්බැහි වී සිටි කෙනෙක්. එහෙම නේද?"

"ඔව් මහත්මයා" ඇය කීවාය. "ඔහුටත් නින්ද නොයෑමේ රෝගය තිබුණා. ඒ වුණත් ඔබ කොහොමද ඒක දැනගත්තේ?"

"ඇඳිපුටුවට දකුණු පැත්තෙන් බුමුතුරුණ මත, දැල්වුණු ඉටිපන්දම් වලින් වැගිරුණු ඉටි විශාල ප්‍රමාණයක් එකතුවෙලා තිබෙනවා. හො හෝ! මේ මොකක්ද?"

ජනේලය සමීපයේ නැවතුණු හෝම්ස්ගේ දෙනෙත් යොමුවී තිබුණේ, බිත්තියේ ඉහළ කොටස වෙතයි. මීළඟට ජනෙල් පඩියට

http://sherlockholmesinvestigations.blogspot.com

නැගී ඔහු, අත දිගුකොට බදාමය මත ඇඟිලි තුඩුවලින් අතගා බලා, පසුව ඇඟිලි තුඩු නාසයට ළංකොට බැලීය. ඔහුගේ නළල රැළි වැටිණි. මුහුණේ මතුවූයේ ප්‍රහේලිකාවකට මුහුණ දුන් ලක්ෂණය. ජනෙල් පඩියෙන් බිමට බට ඔහු, කාමරය වටාම ගමන් කළේ සිවිලිම දෙස දෙනෙත් යොමුකරගෙනයි.

"හරි පුදුමාකාරයි" හෝම්ස්ට කියැවිණ.

"ඇයි හෝම්ස් මහත්මයා? මොකක්ද සිදුවෙලා තියෙන වැරැද්ද?" ජෙනට් විල්සන් මෙනෙවිය ඇසුවාය.

"නැහැ." හෝම්ස් පිළිතුරු දුන්නේය. "මට මේ ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ, බිත්තියේ ඉහළ කොටසේ සහ බදාමයේ මතුපිට ඇඳී තිබෙන, ඉරි සහ රවුම් මොනවාද කියන එකයි."

"බාගවෙලාවට මේ කරදරකාරී කැරපොත්තන් බිත්තිය දිගේ ඇඳුණු පාරවල් වෙන්න ඇති." විල්සන් කීවේ සමාව අයදින ස්වරයකිනි. "ජෙනට් මං ඔබට කලිනුත් කීව්වා. මේ සේවකයන් වැඩකරන හැටි ගැන හොඳට හොයල බලන්න කියලා. හෝම්ස් මහත්මයා. මොකක්ද ඊළඟට ඇතිවෙලා තිබෙන ප්‍රශ්නේ?"

පැත්තෙන් තිබූ දොර දෙසට මගේ මිත්‍රයා ඇවිද ගියේය. එය විවෘතකොට ඉහළ බිත්තිය දෙස බැලූ ඔහු, යළිත් ජනේලය අසලටම ඇවිද ආවේය.

"මං මෙහේ ආව ගමනෙන් ලැබුණු ප්‍රයෝජනයක් නෑ" හෝම්ස් කීවේය. "පෙනෙනවා නේද? මීදුමත් එන්න එන්නම වැඩිවෙනවා. අපි දෙන්නා ඉක්මන් කරලා ආපසු යායුතුයි. මේ කූඩු වල ඉන්නේ ඔබේ සිංදු කියන කුරුල්ලන් වෙන්න ඇති?" හෝම්ස් ඇසුවේ ගිනිඋදුන අසල එල්ලා තිබූ කුරුලු කූඩු වලට අත දිගුකරමිනි.

"ඒ කිහිපදෙනෙකු පමණයි. මේ පැත්තට එන්න මං පෙන්වන්න" දිගු බරාඳයක් දිගේ අප කැඳවාගෙන ගිය විල්සන් කාමරයක දොර විවෘත කළේය.

"ඔන්න බලන්න!" ඔහු කීය.

එය විල්සන්ගේ නිදනකාමරය විය. එහෙත් එවැනි නිදනකාමරයක් මම මගේ ජීවිත කාලය තුළම දැක නැත්තෙමි. බිම සිට සිවිලිම දක්වාම මේ කාමරය පිරී තිබුණේ, කුරුල්ලන් දමා තිබූ කූඩු වලිනි. රන්වන් කහ පැහැති කුරුල්ලන් සිය ගණනක්, එතැන සිටින්නට ඇත. ඔවුහු ඔනායේක් හඬින්, නොයෙකුත් මිහිරි ගීත ගායනා කළහ.

http://sherlockholmesinvestigations.blogspot.com

"ආලෝකය ඉර එළියද, නැත්නම් ලාම්පු වලින් ලැබෙන කෘතිම ආලෝකයද කියලා උන්ට වෙනසක් නෑ" විල්සන් කීය. "ඔන්න බලන්න" කී ඔහු අමුතු තාලයකට සිවුරුහන් කළේය. එය මට හුරුපුරුදු කුරුලු නාදයක් බව, මම හඳුනාගතිමි. විල්සන්ගේ කුරුල්ලෝ වහාම ඒ සිවුරුහන් හඬින් පටන්ගෙන මිහිරි කුරුලු සංගීතයක් නැගීමට පටන්ගත්හ.

"ඊ කොහාගේ හඬ නේද?" මම ඇසීමි.

"හරියට හරි" විල්සන් පිළිතුරු දුන්නේය. "මං ඔබට කලිනුත් කිව්වා වගේ, හරියට පුහුණු කළොත් ආන්ජීලාට අනුකරණය කරන්න බැරි ශබ්දයක් නෑ."

එක්වරම එක කුරුල්ලෙක් ඉතාම තියුණු අමිහිරි හඬක් නැගීමට පටන්ගත්තේය.

"ඒ ශබ්දය නම් මොන කුරුල්ලාගේද කියල, මට හඳුනාගන්න අමාරුයි" මම කීවෙමි.

"ඒ මූකලන් බකමූණා- රාත්‍රී කුරුල්ලෙක්."

"මට පුදුම ඔබ මේ කාමරේ පමණක්, විචෘත ගිනිගොඩක් දල්වාගෙන ඉන්නෙ ඇයි කියලා" හෝම්ස් කීය."මෙතැනට සෑහෙන්න තද සුළංපාරකුත් එනවා ඇති?"

"මට නම් එහෙම අපහසුවක් දැනුණේ නැහැ" විල්සන් පිළිතුරු දුන්නේය. "හෝම්ස් මහත්මයා. මීදුම එන්න එන්නම ඝන වෙනවා. ඔබේ ආපහු ගමන නම් බොහොම අමාරු වේවි වගේ."

"එහෙම නම් අපි ඉක්මනින් පිටත්වෙමු වොට්සන්."

අපි තරප්පුව බැස, බිම්මහලේ බරාඳය වෙත පැමිණියෙමු. අපේ හිස්වැසුම් ගෙන ඒම සඳහා තියෝබෝල්ඩ් විල්සන් විසිත්ත කාමරය වෙත ගියේය. ඒ අතරේ ජේනට් විල්සන් මෙනෙවියගේ කනට ළංවුණු හෝම්ස්, ඇයට යමක් කිසතු මට ඇසිණ.

"විල්සන් මෙනෙවිය. කාන්තාවන්ට ඉවෙන් වගේ දැනෙන දේ ගැන මං ඔබට කලිනුත් කිව්වා. මං ඒක ආයෙ මතක් කරන්නම්. බොහොම වෙලාවලදී, සත්‍ය තත්ත්වය ඇහැට නොපෙනුණාට ඉවට දැනෙනවා. ඔබට ශුභ රාත්‍රියක්."

මොහොතකට පසු, අපි ගෙළයත මැදින් වැටී තිබුණු අඩිපාර දිගේ, අපේ අශ්වකරත්තය දෙසට ඇවිද ගියෙමු. එහි පහන්වල ආලෝකය, මීදුම මැදින් යන්තමින් දිස්විය. අපේ කුලීරිය අඳුරු

http://sherlockholmesinvestigations.blogspot.com

මාවතේ ආපසු ගමන්ගන්නා අතරේ, මගේ මිත්‍රයා හිස පහතට නමාගෙන, කල්පනාවේ ගිලී උන්නේය. මීදුම ක්‍රමයෙන් වඩාත් ඝනවෙමින් පැවැති අතර, ගෑස්ලාම්පු වලින් නික්මුණේ නොපැහැදිලි ආලෝකයකි.

"කොහොමටත් මහන්සි වෙලා හිටි ඔබ, නිස්කාරණේ මේ අනවශ්‍ය වැඩකට කරදර වුණා නේද?" මම මගේ මිත්‍රයාගෙන් ඇසීමි.

"නෑ නෑ වොට්සන්" ඔහු කීය. "මට හිතුණා විල්සන් පවුලෙ පෞද්ගලික දේවල් වලට ඇඟිලිගහන්න, අපට අයිතියක් නැහැ කියලයි. ඒ වුණත් ........" කී හෝම්ස් අසුනේ පිටුපසට හේත්තු වී යළිත් කල්පනා කරන්නට පටන් ගත්තේය.

"......... ඒ වුණත් මේකෙ කොතැනක හරි, වැරැද්දක් තියෙනවා වොට්සන්. .......... වැරැද්දි! වැරැද්දි! ඒක කොහොමටවත් වෙන්න බැහැ" ඔහු දිගින් දිගටම පහත් හඬින් කියනු මට ඇසිණ.

"නමුත් මොකුත් වැරැදි දෙයක් මට නම් පෙනුණෙ නෑ" මම කීවෙමි.

"මට පෙනුණෙත් නෑ" ඔහු කීය. "නමුත් මගේ මොළයට අනතුරු ඇඟවීමේ සීනුව නාදවෙන හඬක් ඇහෙනවා. අර විධියේ ගිනිඋදුනක් මොකටද? අර බිම්මහලේ ගබඩා කාමරයේ, ගිනිඋදුනේ පයිප්පය, අනෙක් කාමර වල උදුන් වලට සම්බන්ධයි. ඒ ඇයි?"

"ඒ එක නිදන කාමරයක."

"නැහැ. නිදන කාමර දෙකක." හෝම්ස් කීය. "විල්සන් මහත්මිය මියගිය කාමරයෙත් ඒ විධියට පයිප්පය සකස්වෙලා තියෙනවා."

"මට නම් ඒකෙන් මොකුත් හිතාගන්න බැහැ." මම කීවෙමි. "ගිනිඋදුන් බොහොම පරණ තාලේ ඒවා කියනවා ඇරෙන්න."

"සිවිලිමේ තිබුණු ලකුණු ගැන ඔබට මොනවද හිතෙන්නේ?" හෝම්ස් ඇසීය.

"අර දූවිලි තට්ටු රවුමට සීරී ගිය ලකුණුද?"

"ඔව්. දූවිලි තට්ටු සීරී යමින් දැලි වලින් ඇතිවූ ලකුණු."

"දැලි?" මම ඇසීමි. "හෝම්ස් ඔබට වුණු වැරැද්දක්ද?"

"මං ඒවා අල්ලා බැලුවා. නාසයට ළංකර සුවඳ බැලුවා. ඒ දැව පිළිස්සීමෙන් සෑදුණු දැලි කැටිති."

අපි මඳවේලාවක් කුලීරිය තුළ නිහඬව සිටියෙමු. එය දැන් ලන්ඩන් නගර සීමාවට බොහෝ දුරට ළංවී තිබිණ. කුලීරියේ මඳක්

http://sherlockholmesinvestigations.blogspot.com

පහළට කරතිබූ ජනෙල් වීදුරුව අසල මගේ අත තබාගෙන, මම ඇඟිලි වලින් වීදුරුවට තට්ටුකරමින් සිටියෙමි. මා එසේ කළේ නිශ්චිත සිතිවිල්ලකින් නොවේ.

"වීදුරුව!" මගේ මිත්‍රයාට උස්හඬින් කෑගැසිණ.

ජනෙල් වීදුරුවේ බැඳී තිබූ හුමාලය මත, මගේ ඇඟිලි තුඩු වලින් ඉරි කිහිපයක් ඇඳී තිබිණි. එය දුටු හෝම්ස්ගේ සිතේ අවසන් සැකය ද පහවී ගිය අයුරකි. රිය නවත්වන මෙන්, ඔහු එක්වරම කුලීරථ රියදුරාට කෑගැසීය. අනතුරුව රථය ආපසු හරවාගෙන, ඩෙප්ට්ෆර්ඩ්හි ගමන පටන්ගත් තැනටම ආපසු යායුතු බව ඔහු රියැදුරාට දැනුම් දුන්නේය.

"බලන්න වොට්සන්. කාරණා මේ තරම් පැහැදිලිව තිබිලත්, අන්ධයෙකුට වගේ මට කිසිවක් නොපෙනුණු හැටි." හෝම්ස් කීවේ අසුනේ පිටුපසට හේත්තුවෙමිනි. "හෝඩුවාවන් තරමක් නොපැහැදිලි වුණත්, හැමදෙයක්ම එතැන තිබුණා. ඒත් තර්කානුකූලව නිගමනයකට එන්න තිබුණු අපහසුතාවය ගැන මටම පුදුමයි."

"මොන හෝඩුවාවන් ගැනද ඔබ කියන්නේ?"

"හෝඩුවාවන් නවයක් එතැන තිබුණා, නිගමනයකට එන්න, එයින් හතරක් වුණත් හොඳටම සෑහෙනවා. කියුබාවේ වාසය කරලා මිනිහෙක්, ආපහු එංගලන්තයේ පදිංචියට එනවා. ඔහු කැනරි කුරුල්ලන් පුහුණුකිරීමේ විශේෂඥයෙක්. ඊට අමතරව ඔහු, උෂ්ණ කලාපික රටවල නිශාචර කුරුල්ලන්ගේ ශබ්ද හැම එකක්ම දන්නවා. ඔහුගේ නිදනකාමරයේ තිබෙන්නේ ආදිකල්පික ගිනිඋදුනක්. මෙතැන සිදුවෙන්නේ මහ විනාශකාරී දෙයක් වොට්සන්. රියැදුරු උන්නැහේ! ඩාහතායු ඔහොම නවත්වන්න!"

අප පසුකර යමින් සිටියේ, බොහෝ කලබලකාරී ලෙස වෙළඳ කටයුතු සිදුවුණු, වීථි දෙකක් එකිනෙක හමුවූ මංසන්ධියකි. උකස් බඩු සාප්පුවල රත්බුබුළු, පහත් කණුවල ආලෝකයෙන් දීප්තිමත්ව බැබැළිණි. කරත්තයෙන් බිමට බැස, ඉදිරියට ඇවිද ගිය මගේ මිත්‍රයා, මඳවේලාවකින් ආපසු පැමිණියේය. අපි යළිත් ගමන ඇරඹීමු.

"හොඳ වෙලාවට අපි තවමත් නගරයේ" හෝම්ස් කීවේ හඬ නොනගා සිනාසෙමිනි. "ඒ මොකද නැගෙනහිර ලන්ඩනයේ

http://sherlockholmesinvestigations.blogspot.com

උකස්බඩු සාප්පු වල, ගොල්ෆ් පිති විකුණන්න තියේවි කියල බලාපොරොත්තු වෙන්න අමාරුයි."

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" මට කියැවිණි. එහෙත් ඔහු මගේ අතට බර ගොල්ෆ් පිත්තක් දුන් විට, මට කීමට කිසිවක් නොවිය. යම් බිහිසුණු අපරාධයක් සිදුවන්නේය යන හැඟීම, මගේ සිතට ඇතුළුවූයේ එවිටයි.

"අපට නව වෙලා තියෙනවා" මගේ මිත්‍රයා කීවේ තම ඔරලෝසුව පරීක්ෂා කරමිනි. "ළඟම තියෙන අවන්හලෙන් සැන්ඩ්විච් එකක් කාලා, කෝපි කෝප්පයක් බීලා යමු."

දුර්ගන්ධය හමන ඩෙප්ට්ෆර්ඩ් පෙදෙසට අපි යළිත් ළඟාවීමු. විල්සන්වරුන්ගේ පෞරාණික නිවසේ ශාලයනට අප පිවිසෙද්දී, අසල වූ සාන්ත නිකොලස් දෙව් මැඳුරේ රාත්‍රී දහය නාදවිය. මුළු නිවසම මීදුම් පටලයකින් වැසී තිබිණ. එහෙත් ඉහළ මාලයේ කාමරයක පහනක් දැල්වෙන හැටි, ජනෙල් වීදුරුව තුළින් අපි දුටුවෙමු.

"ඒ එළියක් පෙනෙන්නේ, ජේනට් විල්සන් මෙනෙවියගේ කාමරයේ" හෝම්ස් කීය. "මට දූන් තියෙනවා ලොකු රාජකාරියක්. මුළු ගෙදරම අය අවදිකරන්නෙ නැතිව, අපි විල්සන් මෙනෙවියට කථා කරන්න ඕනෙ. අපි බලමු ඇගේ ජනේලයට බොරළු අහුරක් විසිකරල, ඒක හරියයිද කියලා."

හෝම්ස් එසේ කොට මොහොතකින් ජනේලය විවෘතවිය.

"කවුද ඔය?" ඇය ඇසුවාය.

"මම ෂර්ලොක් හෝම්ස්. ඔබ සමග මං වහාම කථාකළ යුතුයි. ඔබේ නිවසට ඇතුළු විය හැකි දොරටුවක්, පැත්තේ බිත්තියේ තියෙනවද?"

"ඔව්. ඔය වම් පැත්තේ ජනේලය ළඟ දොරක් තියෙනවා. ඇයි මොකක්ද ප්‍රශ්නෙ?" ඇය ඇසුවාය.

"කරුණාකරල වහාම පහළට බැහැල එන්න" හෝම්ස් කීය. "ඒත් ශබ්ද කරන්න එපා. ඔබේ බාප්පාට කතාකරන්නවත් එපා."

අපි අඳුරේ අතපත ගාමින් ගොස්, ඇය පැවසූ එම දොර වෙතට ළංවීමු. මඳවේලාවක් යද්දී විල්සන් මෙනෙවිය දොර විවෘත කළාය. ඉටිපන්දමක් ද රැගෙන සිටි ඇය අප දෙස බලාසිටියේ බියපත් වූ විලසිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි හෝම්ස් මහත්මයා. මොකක්ද ප්‍රශ්නෙ?"

"මොකුත්ම කරදරයක් නෑ" හෝම්ස් කීය. "භයවෙන්න දෙයකුත් නෑ. ඒ ඔබ මගේ අදහස් පිළිපදිනවා නම්. කෝ ඔබේ බාප්පා?"

"ඔහුගේ නිදන කාමරයේ."

"බොහොම හොඳයි. දැන් අපි එනවා ඔබේ කාමරයට" හෝම්ස් කීය. "ඔබ වහාම ඔබේ ඇඳුම් පැළඳුම් අරගෙන, ඔබේ අයියා පදිංචිව සිටි කාමරයට යායුතුයි. ඔබේ ජීවිතයට ආදරයක් ඇත්නම්, ඒ කාමරයෙන් පිටවෙන්න උත්සාහකරන්න එපා. මං කියන තුරු එහි රැඳී ඉන්න."

"ඔබ මාව භය කරනවා හෝම්ස් මහත්මයා."

"ඒක ඇත්ත. නමුත් ඔබ මගේ උපදෙස් පිළිපැදිය යුතුයි. එතකොට මට ඔබේ ආරක්ෂාව ගැන සහතික වෙන්න පුළුවනි. ඔබ යන්න කලින්, මට තියෙනවා අහන්න ප්‍රශ්න දෙකක්. අපි ගියාට පස්සෙ බාප්පා මේ කාමරේට ඇවිත් ඔබට කථාකළාද?"

"ඔව්." ඇය කීවාය. "ඔහු පෙපෙරීනෝ නම් කුරුල්ලා අරගෙන ඇවිත්, ඌ මගේ කාමරේ තිබේන කුරුළු කූඩුවක දැම්මා. ඔහු කිව්වා, මේ මං විල්සන් නිවසේ ගතකරන අන්තිම රාත්‍රිය නිසා, මාව විනෝදයෙන්, සතුටින් තැබියයුතු බව. බාප්පා කිව්වා ඒ සඳහා ඔහුගේ ශක්ති ප්‍රමාණයෙන් ඔහුට කළහැක්කේ එක් දෙයක් පමණලු. ඒ කුරුළුගීත හොඳින් අහන්න සැලැස්වීමලු."

"හා හා! ඇත්ත නමයි. විල්සන් මෙනෙවිය. මං දැනගන්න කැමැතියි, ඔබේ අයියාට හා අම්මාට තිබුණු රෝගයෙන් ඔබත් පීඩා විඳිනවාද?"

"ඒ කියන්නේ හදවතේ දුර්වලකමද?"

"ඔව්"

"හොඳයි කමක් නෑ." හෝම්ස් කීය. "දැන් අපි ඔබ සමග ඉහළ තට්ටුවට එනවා. ඔබ හැකි ඉක්මනින්ම අනෙක් කාමරයට ගිහිං දොර අගුළු දමාගන්න. යමු වොට්සන්."

ජෙනට් විල්සන්ගේ අතේ තිබූ ඉටිපන්දමේ ආලෝකයෙන්, අපි ඉහළ තට්ටුවට නැගීමට පටන්ගත්තෙමු. ඇය කාමරයේ තිබූ ඇගේ ඇඳුම් පැළඳුම් එකතුකරගන්නා තුරු, අපි එහි කෙළවරක එල්ලා තිබූ කුරුළු කූඩු පරීක්ෂා කර බැලුවෙමු. ඒවා රෙදිවලින් ආවරණය කර තිබිණි. රෙදි මඳක් ඉවත් කළ විට ඒ තුළ නිදාසිටි කුඩා කුරුල්ලන් අපට දැකගත හැකිවිය.

http://sherlockholmesinvestigations.blogspot.com

"අපරාධයක් ඉතා සියුම්ව කරන්න, මොහු අතිදක්ෂයෙක්. ඒ වගේම, ඔහුගේ හිතේ තිබෙන බිහිසුණුකම වචනවලින් කියා නිමකරන්න බැහැ" හෝම්ස් කීවේය.

විල්සන් මෙනෙවිය අනෙක් කාමරයට ගොස් දොර වසාගත්තාය. අපි ඇගේ කාමරයේ රැඳී සිටියෙමු. එය ප්‍රමාණයෙන් කුඩා එකක් වුවත්, එහි ගෘහභාණ්ඩ සුවපහසු ලෙස සකසා තිබිණි. කාමරයට ආලෝකය සැපයුණේ රිදියෙන් නිමකළ බර පහනකිනි. ඕලන්ද උදුනට උඩින් එල්ලා තිබූ කුරුලුකූඩුවේ කුරුල්ලෝ තිදෙනෙක් වූහ. අප පිවිසෙද්දී ගීත ගායනය මොහොතකට නැවැත්වූ ඔවුහු, කූඩුව තුළින් එළියට හිස දමා අප දෙස බැලූහ.

"මං හිතන්නේ වොට්සන් අපට තව කාල වේලා තියෙනවා." හෝම්ස් කීවේ කෙඳිරිලි හඬිනි. "ඒ හින්දා අපි පැය භාගයක් විවේක ගමු. දැන් ඔය පහන නිවල දමන්න."

"අන්ධකාරයේ ඉඳීම අනතුරුදායකයි නේද හෝම්ස්?"

"මිත්‍රයා. අඳුරේ සිටීම අන්තරාදායක නෑ."

"මොකක්ද මෙතැන සිද්ධ වෙන්නෙ කියන එක ඔබ මට පැහැදිලි කළේ නැහැ හෝම්ස්." මම කීවෙමි. "ඔබ කී කරුණු වලින් මට තේරුම් ගන්න පුළුවන් මේකයි. විල්සන් මේ කුරුල්ලන්ව මොනව හරි බිහිසුණු වැඩකට යොදවා ගන්නවා. පහනේ ආලෝකය තිබෙද්දී පමණක් සිදුවෙන මේ භයානක කටයුත්ත මොකක්ද?"

"ඒක මොකක්ද කියලා හරිහැටි කියන්න, මට තවමත් අමාරුයි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "නමුත් ඒ ගැන යම් අදහසක් මගෙ හිතේ පහළවෙලා තිබෙන බව ඇත්තයි. අපට දැන් කරන්න ඉතිරිවෙලා තියෙන්නේ, සෝදිසියෙන් බලාසිටීම පමණයි. ඔබට පෙනෙනවා නේද, අර ඕලන්ද උදුනට ඉහළින් තිබෙන පයිප්ප කට? ඒක වසා තිබෙන්නේ එක් කොනක් සරනේරුවකින් සවිකළ පියනකින්. මං කැමැතියි ඒකට ඔබේ අවධානය යොමුකරනවා නම්."

"ඒකෙ මොකුත් විශේෂත්වයක් මට නම් පෙනෙන්නෙ නෑ" මම කීවෙමි.

"ඔව්. ඔබ හරි. නමුත් යකඩ උදුනක ඉන්ධන දැමීමට ඇති විවරය ටින් පියනකින් වසා තිබීම හරි අසාමාන්‍ය දෙයක් නේද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ!" මට කියැවිණි. "හෝම්ස් ඔබ කියන්නේ මේක භයානක වැඩසටහනක් සඳහා, විල්සන් යෙදූ උපක්‍රමයක් කියලද? ඔහු බිම් මහලේ ගබඩා කාමරයේ සිට, මෙතැනට පයිප්පයක් දමා තිබෙන්නේ, මොකක් හරි විෂක් ඒ දිගේ එවලා, ඔහුගේ ඥාති පරපුර විනාශකරන්න කියලද? ඒකද ඔහුගේ කාමරේ අසාමාන්‍ය තාලේ ගිනිඋදුනක් තියෙන්නේ?"

"ඔබේ නිගමන හුඟක්ම වැරැදි නැහැ මිත්‍රයා" හෝම්ස් කීය. "නමුත් තියෝබෝල්ඩ් විල්සන් කියන්නේ, ඔබ හිතනවාට වඩා කෛරාටික, සූක්ෂම උපායන් යොදන්නෙක්. බිහිසුණු සාර්ථක මිනීමරුවෙකු සතු වියයුතු ගතිලක්ෂණ, හැම එකක්ම, ඔහුට තියෙනවා. එකක් අනුකම්පා විරහිත බව. තවත් එකක් උපක්‍රමශීලි බව. දැන් කරුණාකරලා පහනේ එළිය හොඳටම අඩුකරන්න. මේ ගැටලුව මං තේරුම් ගත්ත හැටි නිවැරදි නම්, හෙට එළිවෙන්න කලින් අපට මොනවා හරි දැකගන්න ලැබේවි."

අසුනේ පිටුපසට හේත්තු වී, මම අඳුරේම කල්පනා කරමින් සිටියෙමි. මගේ හිතට තිබූ එකම සැනසීම, සාක්කුවේ තිබූ රිවෝල්වරයයි. කර්නල් සෙබස්ටියන් මෝරාන්ට මුහුණදීමට සිදුවූ දා සිටම, පුරුද්දක් ලෙස මම රිවෝල්වරය සාක්කුවේ තබාගතිමි. මගේ මිත්‍රයා කළ අනතුරු ඇඟවීමට අදහස කුමක්දැයි තේරුම් ගැනීමට, මම උත්සාහ දරමින් සිටියෙමි. නමුත් මා සිටින්නට ඇත්තේ, මා සිතුවාටත් වඩා විඩාපත් වී වියයුතුය. මට එතැනම නින්ද යන්නට ඇත.

මගේ අත ස්පර්ශකරනු දැනී මම අවදිවූයෙමි. පහන යළිත් දල්වා තිබිණ. මගේ මිත්‍රයා මා වෙතට නැමී සිටියේය.

"ඔබව අවදිකරන්න සිදුවීම ගැන මට කණගාටුයි වොට්සන්" ඔහු කීය. "ඒ වුණත් අපේ රාජකාරියට දැන් වෙලාව හරි."

"මොනවද මං දැන් කරන්න උවමනා?"

"වාඩිවෙලා, ඔබේ දෙසවන් හොඳින් යොමුකරන්න. ඇහෙනවද පෙපෙරිනෝ සිංදු කියන්න පටන් අරගෙන?"

එදා රාත්‍රී අපි සෑහෙන අවධානයකින් බලා සිටි අයුරු, මට සෑහෙන කලකට අමතක නොවෙනු ඇත. ලාම්පුවේ ආවරණය හෝම්ස් පැත්තකට තල්ලු කොට තිබිණි. ඒ අනුව ජනේලය තිබුණු බිත්තියට, ඒ සමග වූ යකඩ උඳුනට හා කුරුලු කූඩුවලට, හොඳින්

http://sherlockholmesinvestigations.blogspot.com

ආලෝකය ලැබිණ. මීදුම බොහෝ සෙයින් ඝනවී, වලාකුළ මෙන් ජනේලය අසලටම ගලා ආ හැටි, අපි ජනෙල් වීදුරුවෙන් දුටුවෙමු. කැනරි කුරුලු කූඩුවෙන් නැඟුණේ එතරම් මිහිරි හඬක් නොවේ. යම් දරුණු ක්‍රියාවක් සිදුවන්නට ඉඩ ඇති බවට, හෝම්ස් කළ අනතුරු ඇඟවීම නිසා, මගේ සිතේ පැවතියේ තැතිගත් ස්වභාවයකි. අවට පැවැති මූසල පරිසරය, මගේ සිත තව තවත් භීතියට පත්කළේය. වීණාවක තත්සර හඬක් ලෙසින් නැගී ආ සියුම් ශබ්දයක්, ක්‍රමක්‍රමයෙන් තීව්‍ර වන්නට පටන් ගත්තේය. මඳවේලාවක් යද්දී, එය කන් බිහිරිකරවන තළා හඬක් තරමට, තියුණු විය. අප සිටියේ කුරුල්ලන්ගෙන් පිරි මහා වනාන්තරයක යයි සිතෙන තරමට මේ හඬ උච්ච ස්වරයකට හැරිණි. කාලය ගතවෙන අයුරු මගේ සිතෙන් ගිලිහී තිබිණ. මම කාමරය වටේටම මගේ දෑස් යොමුකළෙමි. දකින්නට ලැබුණු දෙයින්, මගේ හදවත වේගයෙන් ගැහෙන්නට පටන්ගත්තේය.

සරනේරු සහිත පියනකින් වසා තිබූ ගිනිඋදුනේ පයිප්ප කට, ක්‍රමක්‍රමයෙන් විවෘත වෙමින් තිබිණි!

මා පහසුවෙන් බියට පත්වෙන බියගුල්ලෙකු නොවේ. සුළු දෙයකින් මා කිසිසේත් කම්පනයට පත්නොවන බව මගේ මිතුරෝ දනිති. එහෙත් මේ දකින්නට ලැබුණු දෙයින්, මගේ සිතේ භීතියක් ඇතිවී, වාඩිවී සිටි පුටුවෙන් මා තදින් අල්ලාගෙන සිටි බැව් සඳහන් කළ යුතුය. මගේ අත්පා සියල්ල හිරිවැටී ගොස් ඇතිබැව්, එක් මොහොතකට මට දැනිණ.

පියන එළියට තල්ලු වීමත් සමඟ ඇතිවූ හිඩැසෙන් කහපැහැති දඟලනසුලු, ඇඹරෙනසුලු යමක් එළියට ඇදෙමින් තිබිණ. කුඩා නියපොතු සහිත සතෙකුගේ ගාත්‍රා වැනි අවයව එළියට තල්ලු විය. ඉන්පසු එයින් යමක් ග්‍රහණය කරන්නට උත්සාහ ගත් බවක් අපි දුටුවෙමු. ඊළඟ මොහොතේ සම්පූර්ණ සත්ත්වයා එළියට පැමිණ ගිනි උදුන මත නිශ්චල විය.

දක්නට ලැබුණු දර්ශනයෙන් මම භ්‍රාන්ත වීමි. කුරුල්ලන් ආහාරයට ගන්නා, දකුණු ඇමරිකාවේ යෝධ දිවිමකුළුවන් මම මීට පෙර දැක ඇත්තෙමි. උන්ගේ දර්ශනය මගේ සිතේ එතරම් බියක් ඇතිකිරීමට සමත්වී නැත. එහෙත් ගිනිඋදුන මත සිටියේ, අතිවිශාල, බිහිසුණු පෙනුමක් තිබූ සත්ත්වයෙකි. සිරුර පුරා කළු පැහැති

http://sherlockholmesinvestigations.blogspot.com

කෙඳිවලින් වැසුණු මේ සතා, මා මීට පෙර දුටු ඇති දිවිමකුළුවන් මෙන් කිහිප ගුණයකින් විශාලය. උගේ දර්ශනය පවා ඇඟ කිළිපොළනසුලුය. ප්‍රමාණයෙන් කෑම පිඟානක් තරම් වූ උගේ, සිරුරෙන් පිටතට, උල් සහිත ගාත්‍රා විහිදී තිබිණි. මුහුණේ ඉදිරිපස තිබූ විෂ සහිත උල් දෙකක් වැනි හනු යුගළ ය ද, රතුපැහැයෙන් දිලිසෙමින් තිබූ අක්ෂි යුගළය ද, උගේ භයානක පෙනුම දෙගුණ තෙගුණ කළේය. සිරුර සන්ධි පාද මත, ඉහළට පහළට දෝලනය වෙමින් තිබූ අයුරෙන් මට හැඟුණේ, කොයි මොහොතේ හෝ, ඌ උගේ ගොදුර වෙත කඩා පැනීමට සූදානම් වෙන බවයි. මේ සතා හා අප අතර තිබුණේ අඩි දෙකක හෝ තුනක පරතරයක් පමණි. එය ඌට එක් පිම්මෙන් පැනීමට අපහසු දුරක් නොවේ.

"යන්තමින්වත් හෙලවෙන්න එපා වොට්සන්" හෝම්ස්ගේ මුවෙන් කෙඳිරිල්ලක් නිකුත් විය. එහි ගැබ්ව තිබුණේ, මා ඔහුගෙන් මීට පෙර අසා නොතිබුණු අනතුරු ඇඟවීමකි.

කොතරම් සිහින් හඬින් කථා කළත් එම ශබ්දය දිවිමකුළුවාට ඇසුණා විය යුතුය. ඌ එක්වරම ගිනිඋදුනේ සිට කුරුලු කූඩුව මතට පැන්නේය. එතැනින් සිවිලිමට ඇදුණු ඌ, ඉතා වේගයෙන් අප සිටි දෙසට ඇදී එන්නට පටන්ගත්තේය.

ගොල්ෆ් පිත්ත අතට ගත් හෝම්ස් විදුලි වේගයෙන් ක්‍රියාත්මක වූයේ මේ මොහොතේදීය.

"ඌව මරන්න වොට්සන්! දෙවියන්ගේ නාමෙන් ඉක්මන් කරන්න!" කී ඔහු ගොල්ෆ් පිත්තෙන් සිවිලිමේ සිටි දිවිමකුළුවා වෙත පහර පිට පහර එල්ල කරන්නට පටන්ගත්තේය. එහෙත් ඒවා සාර්ථක ලෙස එල්ලවූයේ නැත.

ඔහු එල්ල කළ පහර වැදී බදාමය කැඩී, කූඩුවේ කාමරය පුරා දූවිලි විසිරෙන්නට විය. ඊළඟ මොහොතේ, දිවිමකුළුවා බිත්තියේ සිට අප සිටි දෙසට පැන්නේය. උගේ පිම්ම අවසන් වූයේ ඇඳේ ඉහ කෙළවරිනි.

"ඔහොමම ඉන්න වොට්සන්" කී මගේ මිත්‍රයා, ගොල්ෆ් පිත්තේ බර කෙළවරෙන් රුදුරු සත්ත්වයා වෙත පහර එල්ල කළේ ඇසිපිය හෙළනවාටත් වඩා වේගයෙනි. මෙවර හෝම්ස්ගේ පළමු පහරෙන්ම අඩපණවූ දිවිමකුළුවා, ඊළඟ පහර කිහිපය සමග බිඳිගිය බිත්තරයක් මෙන් කහපැහැති තරලයක් බවට පත්විය. ඊටපසු උගේ

http://sherlockholmesinvestigations.blogspot.com

ඉතිරි අඩුපඩු ඒ මේ අතට දික්වුවද ස්වල්ප වේලාවකදී, එය ද නැවතිණි.

"දෙවියන්ට ස්තූතිවේවා!" මම කීවෙමි. "ඌ මේ පැත්තට පැන්නට, ඔබේ ඇඟට පැනගන්න බැරිවුණා"

"ඔව්. ඒ නිසා මගේ පණ යන්තම් බේරුණා" ඔහු අමාරුවෙන් කිවත්, හෝම්ස්ගේ මුහුණ සුදුමැලි වී, භීතියට පත්වී සිටි අයුරු මම දුටුවෙමි.

"දෙයියෝ සාක්කි! ඔන්න! ඌට තවත් සහකාරයෙක් ඉන්නවා වොට්සන්. ඌ විනාශකිරීම ඔබට භාරයි." හෝම්ස් කීවේ තැතිගත් ස්වරයෙනි.

මම වහාම ආපසු හැරී බැලුවෙමි. මගේ මිත්‍රයාගේ හිසට අඩි දෙකක් ඉහළින්, උඳුන් පයිප්පය මතට වී තවත් එවැනිම යෝධ දිවිමකුළුවෙක් සිටියේය. හෝම්ස් යන්තමින් හෝ නොසෙල්වී සිටියේ, සෙලවුණොත් ඌ ක්ෂණයකින් හෝම්ස්ගේ හිස මතට පනින බව දැනසිටි නිසයි. කලින් සතා උගේ ශරීරය දෝලනය කරන්නට පටන් ගත් අයුරින් මේ සතා ද දෝලනය ඇරඹුවේය. තවත් තත්පරයකින් හෝ දෙකකින්, ඌ හෝම්ස්ගේ හිසමතට පනින බව නිසැකය. මගේ රිවෝල්වරය අතට ගෙන, හෙමින් ඌ දෙසට ළං කොට වෙඩිතැබුවෙමි. වෙඩිපහර කීපයක් එල්ල වෙද්දී, ඌ සුනුවිසුනු විය. උගේ සිරුරේ සුන්බුන්, පයිප්ප කටතුළට වැටී, ඇතුළට පෙරළී ගිය සැටි අපි දුටුවෙමු.

"ඔබට මොකුත් අමාරුවක් නැහැනේද හෝම්ස්?" මම මගේ මිතුරා වෙතට පැන්නෙමි.

"මුළු හදින්ම මං ඔබට ණයගැතියි මිත්‍රයා" හෝම්ස් කීවේ සැනසුම් සුසුම් හෙළමිනි. "එක දඟමයක් හෙළවුණා නම්, මං ඉවරයි ......... මොකක්ද ඒ ශබ්දෙ?"

පහළ තට්ටුවේ දොරක් ඔච්චියෙන් වැසෙන ශබ්දයත්, මොහොතකින් කිසිවෙකු බොරළු හරහා දිවයන හඬත් අපට ඇසිණ.

"තක්කඩියා පැනලා යනවා. එළවාගෙන ගිහිං අල්ලාගමු" හෝම්ස් කීවේ, කාමරයේ දොර හැරගෙන තරප්පුවෙන් බැසීමට සූදානම් වෙමිනි. "ඔබේ වෙඩි ශබ්දයෙන් ඔහු ඔක්කොම තේරුම් ගන්න ඇති. ඔහුට පැනල යන්න ඉඩදෙන්න බෑ."

එහෙත් ඉරණම යෙදී තිබුණේ වෙනත් ආකාරයකටයි. එම පෙදෙස අපට වඩා හොඳින් දැනසිටි තියෝබෝල්ඩ් විල්සන්, මීදුම

http://sherlockholmesinvestigations.blogspot.com

සහ ගහ අඳුර තිබුණත් ඉදිරියට දිවගියේය. ඔහුගේ අඩිශබ්දය අපට ක්‍රමයෙන් නොඇසී යද්දී, තවදුරටත් ලුහුබැඳීමකට උත්සාහ කිරීම නිෂ්ඵල බව අපි තේරුම් ගත්තෙමු.

"පලක් නෑ වොට්සන්. මිනිහ පැනල ගියා." හෝම්ස් කීවේ හතිදමමිනි. "මෙතැනින් ඉස්සරහ වැඩ කටයුතු අපි පොලීසියට භාරකරමු. පොඩියක් කන්දෙන්න........ කෑගහන හඬක් ඇහුණා නේද?"

"මටත් මොකක්ද ශබ්දයක් නම් ඇහුණා."

"මේ මීදුමේ මොකක්වත් හොයාගන්න බෑ. අපි ආපහු යමු" මගේ මිත්‍රයා කීය. "අර අහිංසක ගැහැනු ළමයාගේ දුක්කරදර මෙතැනින් අවසන් බව ඇයට දනුම්දෙමු."

අපි අඳුරේම යළිත් නිවස දෙසට ගමන් කළෙමු. "උන් මහා භයානක, විෂ ඝෝර සර්පයන් වැනි සතුන් වර්ගයක් හෝම්ස්" මම කීවෙමි. "මං හිතන්නෙ නෑ එංගලන්තයේ සත්ත්ව විද්‍යාඥයින් මෙවැනි සතුන් වර්ගයක් ගැන අහලවත් ඇති කියල."

"ඌ තමයි ගැලියෝඩෙස් දිවිමකුළුවා" මගේ මිත්‍රයා කීය. "කියුබානු වනාන්තරයේ බිහිසුණුම සත්ත්වයා. ලෝකයේ වෙනත් කිසිම රටක, කිසිම වනාන්තරයක මේ සතා නොමැති වීම, මනුෂ්‍ය වර්ගයාගේ වාසනාවක්. ඌ එළියට එන්නේ රාත්‍රි කාලයට. මගේ මතකය නිවැරදි නම්, උගේ හනු යුගලේ ශක්තියෙන් ඌට පුළුවන්, කුඩා ක්ෂීරපායි සතෙකුගේ කොඳු ඇටය කඩන්න. ඔබට මතකද ජෙනට් මෙනෙවිය සඳහන් කළා, ඇගේ බාප්පා ගෙදර පදිංචියට ආවට පස්සේ, මීයන් පුදුමාකාර විධියට වඳවුණා කියල. සැකයක් නෑ. විල්සන් කියුබාවෙ ඉඳල ආපහු එද්දී, මේ සතුන් අරගෙන එන්න ඇති.

ඔහු අර කැනරි කුරුල්ලන්ට පුහුණු කළා, කියුබානු නිශාචර පක්ෂියෙකුගේ හඬ අනුකරණය කරන්න. ගැලියෝඩෙස් එම පක්ෂියා මරා ආහාරයට ගැනීමට පුරුදුව සිටියා. පක්ෂියාගේ හඬ ඇසුණාම ගැලියෝඩෙස් උගේ අඳුරු ගුහාවෙන්, එළියට ඇදුණා. සිවිලිමේ තිබුණු රවුමට රවුමට ඇඳී ගිය රේඛා, උගේ දලි නැවරුණු කකුල්, සිවිලිමේ හුණු මත ඇතිල්ලෙද්දී වුණු ඒවා.

කොහොම වුණත්, මේ ගැටලුව විසඳීමට උවමනා කරුණු තේරුම් ගන්න, මං කාලය ගතකළා වැඩියි. හෝඩුවාවන් මුල ඉඳලම තිබුණා. ඉතින් ඒවායින් උපකල්පනයක් ගොඩ නංවන්න, මං ප්‍රමාදවුණේ ඇයි කියල මටම හිතාගන්න බැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ එහෙම කීවත්, මට නම් කිසිම දෙයක් තේරුම් ගන්න පුළුවන් කමක් තිබුණෙ නැහැ" මම කීවෙමි. "විල්සන් කියන්නෙ බොහොම සියුම් අයුරින් මිනීමරන්න හපනෙක් බව මෙයින් ඔප්පුවෙනවා."

"තියෝබෝල්ඩ් විල්සන් දක්ෂයෙක් බවට සැකයක් නෑ" හෝම්ස් කීය. "ඔහු බිහිසුණු දිවිමකුළුවන්ට, අක්‍රිය ගිනිඋඳුන තුළ වාසභවනයක් සැකසුවා. ඒකට සම්බන්ධ යකඩ බට නිදන කාමර දක්වා සවිකළා. ඒ පයිප්ප වල කුරුලු කූඩු එල්ලා තැබුවා. කූඩුවල සිටි කැනරි කුරුල්ලන්ට, නිශාචර පක්ෂීන් නගන හඬ අනුකරණය කරන්න ඉගැන්නුවා. එතකොට දිවිමකුළුවා එළියට ගෙන්වා ගැනීම, අපහසු වුණේ නැහැ. උන්ව ආපහු කූඩුව තුළට ගෙන්වා ගැනීමට ඔහු යොදාගත් උපක්‍රමය මොකක්ද කියල අපි තවමත් දන්නේ නෑ. කොහොමවුණත් උන්ගේ උදව්වෙන් ඔහු සමත්වුණා තමන්ගේ අරමුණ ඉටුකරගන්න. ඒ තමයි, දේපොළ ඔහුට අයිතිකර ගැනීමට, බාධාවක් වුණු එහි උරුමක්කාරයින්, වරකට එකා බැගින් මෙලොවින් තුරන් කිරීම."

"ගැලියෝඩෙස් මකුළුවා මාරාන්තික විෂ සහිත සතෙක්ද?" මම ඇසීමි.

"අයහපත් සෞඛ්‍ය තත්ත්වයක ඉන්න මිනිහෙකුට මාරාන්තික වෙන්න පුළුවනි. නමුත් විල්සන් මෙතැන දී යොදාගත්තේ, සියුම් උපක්‍රමයක්. තමන්ට විනාශකරන්න උවමනා පුද්ගලයා, දිවිමකුළුවා ගේ දර්ශනයෙන් මාරාන්තික භීතියකට පත්කරන්න විල්සන් සමත්වුණා. එම දසුනෙන්, දුර්වල හදවතක් ඇති කෙනෙකු භීතියට පත්වෙලා හෘදයාබාධයකින් මියයන්න පුළුවනි. ඔබට හිතාගන්න පුළුවන්ද නින්ද නොයන පුද්ගලයෙකු, කුරුල්ලන්ගේ මිහිරි ගීත අසමින් ඉන්න අතරේ, එක්වරම ගිනි උඳුන මතින් මේ සතා මතුවුණාම හිතේ ඇතිවෙන හැඟීම්. අපට ඒක අත්විඳින්න ලැබුණා. කොතරම් බිහිසුණු දර්ශනයක් වුණත්, අපේ හදවත් තවමත් නිරෝගී නිසා අපේ දිවි ගැළවුණා. නමුත් වයසක විල්සන් මහත්මියයි, ඇගේ පුතයි, එයින් මියගියේ පපුවට වෙඩි පහරක් එල්ලවුණු තරම් ඉක්මනින්."

"මට තේරුම් ගන්න බැරි තවත් දෙයක් මෙතැන තියෙනවා හෝම්ස්. ඇයි ඔහු මේ තරම් අපරාධයක් කරමින්, ස්කොට්ලන්ඩ්යාඩ් එකෙන් උදව් ඉල්ලුවේ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"විල්සන් අපරාධ කළේ ලොකු ආත්ම විශ්වාසයක් ඇතිවයි. කොතැනක හෝ වැරැද්දක් සිදුවෙන බව ඉවවැටිලා, ඥාති දියණිය මෙහෙන් ඉවත්වී යන්නයි සූදානම් වුණේ. ඔහු ඒකට කැමැතිවුණේ නෑ. ඔහුට උවමනා වුණේ ඇයගේ ජීවිතයත්, කලින් අයගේ ක්‍රමයටම අවසන් කර, සියලුම දේපොළ නිරවුල්ව තමාටම හිමිකරගන්න.

ඔහු ඒ කටයුත්ත දෙපාරක් සාර්ථකව කළා. ඉතින් තුන්වැනි සැරේ ඔහුට සැක සහිත ඇඟිල්ලක් දිගුකරන්නේ කවුද? ඔහු ස්කොට්ලන්ඩ්යාඩ් එකට ආයාචනා කළා. ෂර්ලොක් හෝම්ස්ගෙනුත් උදව් ඉල්ලාගෙන ආවා. ඒහෙම කරලත් ජෙනට් විල්සන් මෙනෙවිය හෘදයාබාධයකින් මියගියා නම් මොකද වෙන්නේ? කවුරුත් අර අසරණ බාප්පාට ශෝකය ප්‍රකාශ කරාවි.

ඔබට මතකද අර ගබඩා කාමරයේ යකඩ උඳුනේ පියන, ඔහු ඉබියතුරු දමා වසා තිබුණු හැටි. ඔහු සූදානම් වුණානේ යතුරු ගෙනැල්ලා ඉබ්බ ඇරලා අපට පෙන්වන්න. ඔහු ලොකු බොරුවක් කරන්නයි සූදානම් වුණේ. ඔහු කියන්න ඉඩ තිබුණා "ඉබ්බාගේ යතුර හොයාගන්න බෑ, නැතිවෙලා" කියල. අපි අගුළ කඩල ඇරල බැලුවා නම් .......... එහෙනම් දිවිමකුළුවෝ අපේ බෙල්ල වටේ එල්ලෙනවා! මං කැමැතියි ඒ ගැන මතක් කරන්නේ නැතිව ඉන්න."

තියෝබෝල්ඩ් විල්සන් අපට යළිත් පණපිටින් දකින්නට නොලැබිණි. දින දෙකකට පසු තේම්ස් ගඟේ පාවෙමින් තිබූ මළසිරුරක් ගොඩට ගන්නා ලදී. එහි මුහුණ හඳුනාගැනීමට අපහසු තරමට විනාශ වී තිබිණි. ඊට හේතුව මුහුණ, නැවක දතිරෝද-ටර්බයින වලට අසුවීමෙන් විය යුතුය. පුද්ගලයා හඳුනාගැනීමට ඔහුගේ සාක්කු සෝදිසි කරන ලදී. එවිට හමුවූයේ එක් කුඩා සටහන් පොතක් පමණි. ෆ්‍රන්ජිලා කැනරියා නම් කුරුලු විශේෂයේ එක් එක් ප්‍රභේද බිත්තර දමන හා රකින කාලය පිළිබඳ සටහනක් එහිවිය.

http://sherlockholmesinvestigations.blogspot.com

# හදිසි අභාවය

එය 1895 වසරේ සැප්තැම්බර් මාසයේ සිකුරාදා දිනයක් බව මට මතක ඇත. උදේ වරුවේ දහයට පමණ මම මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා හමුවීමට යාමට තීරණය කළෙමි. දිගින් දිගටම රෝගීනට ප්‍රතිකාර කරමින්, යන්ත්‍රයක් මෙන් වැඩකොට මම හෙම්බත්ව් සිටියෙමි. මේ ඒකාකාරී ජීවිතයෙන් යම් වෙනසක් ලබාගැනීමට නම් නිවාඩුවක් ගතකිරීමට විදේශයකට යායුතුය. එහෙත් ඒ සඳහා සෑහෙන මුදලක්, මගේ බැංකු ගිණුමේ ඉතිරිව නොතිබිණ. හෝම්ස්ගේ අපරාධ පරීක්ෂණයකට සහභාගීවීමට හැකිනම්, මා අපේක්ෂා කරන වෙනස අත්විඳීමට හැකිවේ යයි, මගේ යටිසිත කියන්නාට විය. එහෙයින් මගේ ශල්‍යාගාරය වසාදැමූ මම, බේකර් වීථිය බලා පිටත් වී ගියෙමි.

මගේ මිත්‍රයා මා නොහඳුනන අයෙකු සමග කතාබහක නිරතව් සිටියේය. මැදිවියේ කෙණෙහු වූ ඔහු, උස තරබාරු පුද්ගලයෙක් විය. සම්පූර්ණයෙන්ම තට්ටය පෑදුණු හිස හා එක් ඇසකට පැළඳ සිටි උපැස නිසා, ඔහු වෙතින් දිස්වූයේ, සරසවියක මහචාර්යවරයෙකුගේ පෙනුමකි. ඔවුන්ගේ කතාබහට බාධානොකොට, එතැනින් පිටවී යාමට මට සිත්විය. එහෙත් මගේ මිත්‍රයාගෙන් ඊට අවසර නොලැබිණි.

"බොහොම සිත්ඇදගන්නාසුලු කථාවක් වොට්සන්" හෝම්ස් කීය. "ගැඹුරු යමක් නම් මේකෙ පෙනෙන්න නැහැ. ඒ වුණත් මේකත් ඔබ ලියා තබන්න තෝරාගන්නා ආකාරයේ, ආකර්ෂණීය සිද්ධියක්. මේ ඇල්බට් ස්ටෝකර් මහත්මයා. ඔහු ග්‍රිෆින් ජීවිතරක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ වරයෙක්. ඔහු කථාව පටන්ගත්තා විතරයි. ඔබට කරදරයක් නැත්නම්, කරුණාකර ඔබේ කථාව යළිත් මුල ඉඳලම පටන්ගන්න ස්ටෝකර් මහත්මයා. මගේ හිතමිත්‍ර මේ දොස්තර වොට්සන් තමයි, මා කරන පරීක්ෂණ කටයුතු වලට උදව් වෙන්නේ."

කිසිදු අමනාපයක් හෝ අපහසුවක් නොපෙන්වූ අමුත්තා, සිනාමුසු මුහුණින් මට ආචාරකොට, යළිත් කථාව පටන් ගත්තේය.


http://sherlockholmesinvestigations.blogspot.com

"අවුරුදු එකහමාරකට කලින් ජොනතන් ඉංගල් නම් මහත්මයෙක්, ජීවිත රක්ෂණයක් ලබාගන්න අප වෙත ආවා. අපේ වාර්තා වල සඳහන් වෙලා තියෙන හැටියට, ඔහු පෙනුමෙන් හොඳ නිරෝගී පුද්ගලයෙක්. එවැන්නෙකුට ජීවිත රක්ෂණ ලබාගැනීමට අපහසු නැති බව, මං අමුතුවෙන් කියන්න උවමනා නැහැ. ඔහු පවුම් 1500කට ජීවිත රක්ෂණයක් ලබාගත්තා. මෑතකදී ඔහු හදිසියේ මියගිහින්. ඒ හෘදයාබාධයකින් කියලයි අපට දැනගන්න ලැබුණේ. අධික ලෙස මේදය තැන්පත් වීශමත්, හෘදය වස්තුව විශාල වීම නිසා, එය අක්‍රිය වූ බවයි වෛද්‍ය වාර්තාවේ සඳහන් වෙන්නෙ. ඉතින් ඔහුගේ බිරිඳ- සිබිල් ඉංගල් මහත්මිය, අපෙන් රක්ෂණ වන්දි ඉල්ලා හිටියා. ඔහුගේ යැපෙන්නන් හැටියට ඔහුට සිටින්නේ මේ සිබිල් ඉංගල් මහත්මිය පමණයි. ඉතින් අපි ඒ සඳහා ලියකියවිලි සූදානම් කොට, මුදල් ගෙවන්නටයි සූදානම් වුණේ.

නමුත් ඊයේ අප වෙත ලැබුණා පුදුමාකාර ලියුමක්. එය එවා තිබෙන්නේ මාග්‍රට් ඉංගල් නම් තැනැත්තියක්. ඇය ඇගේ නීතිඥයින් මාර්ගයෙන් එවා ඇති දිවුරුම් පෙත්සමකින් කියා හිටිනවා, මියගිය ඉංගල් මහතාගේ නීත්‍යානුකූල බිරිඳ තමා බව. ඔහුට සිටිය එකම ඥාතියා තමා නිසා, ගෙවීම කළයුත්තේ තමන්ට බව ඇය කියනවා. ඇය තවත් කරුණු එහි සඳහන් කර තිබුණා. සිබිල් ඉංගල් කියල පෙනී සිටින්නේ හැගාඩ් මහත්මිය නම් වැන්දඹුවක්ලු, තමන් ජීවත්ව සිටින බව දැන දැනත් ඉංගල් මහතා සමග කර ඇති හැගාඩ් මහත්මියගේ විවාහය නීතිවිරෝධී එකක්ලු."

"බොහොම විනෝදජනක සිද්ධියක්. එහෙම නේද වොට්සන්?" හෝම්ස් සිනාසෙමින් ඇසුළුවේ නිවීගිය පයිප්පය යළිත් දල්වාගනිමිනි. "කොහොම වුණත් ඇය මේ පිළිබඳව කිවයුත්තේ, උසාවියට නේද?"

"ඔව් හෝම්ස් මහත්මයා" ස්ටෝකර් කීය. "නමුත් මාග්‍රට් ඉංගල්ගේ චෝදනා එතැනින් ඉවර නැහැ. ඇය කියනවා මේ සිබිල් කියන ගැහැනිය ඉංගල් මහතා මරාදමා ඇති බවට කිසිම සැකයක් නැහැලු."

"හැබෑට? ඇය එහෙම චෝදනාවක් කරන්නේ මොන හේතුවක් උඩද?" හෝම්ස් ඇසීය.

"සිබිල්ගේ පළමු සැමියා ජේම්ස් හැගාඩ් නම් කෙනෙක්ලු. ඔහු මියගියේ බොහොම සැකකටයුතු ආකාරයට ලු. ඔහුගේ මරණයට

http://sherlockholmesinvestigations.blogspot.com

හේතුව, උග්‍ර විෂක් ශරීර ගතවීමෙන් කියල ඒ දවස්වල සැකයක් තිබුණලු. ඊළඟට හදිසියෙ මියගිය ඉංගල් මහත්මයා, බොහොම නිරෝගී ශක්තිමත් කෙනෙක්; ඔහු හිටිහැටියේ හෘදයාබාධයකින් මියගියා කියන එක, කිසිසේත් විශ්වාසකරන්න බැරි කතාවක් ලු."

"ඒකෙත් ඇත්තක් තියෙනවා" හෝම්ස් කීය. "අවුරුදු එකහමාරකට කලින් ඔහු ඉතා හොඳ ශරීර සෞඛ්‍යයෙන් සිටියා නම්, එක්වරම මෙහෙම දෙයක් සිදුවුණේ කොහොමද කියල සැකයක් මතුවෙනවා. ජොනතන් ඉංගල්ගේ මරණය ගැන කරන චෝදනාව සත්‍යයක්ද කියල හොයල බලන්න, අපට තොරතුරු ටිකක් උවමනා වෙනවා. ඔහුගේ මරණය ගැන පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වූණාද, මරණයට හේතුව කුමක්ද, ඔහුට වස දුන්නා යයි සැකකරන්නේ, මොන හේතුවක් උඩද, ආදිය හොයල බැලියයුතුයි. මේවායේත් සැක සහිත බවක් තිබෙනවා නම් අපට ඉල්ලීමක් කරන්න වෙනවා. ඒ, ඉංගල්ගේ මිනිය ගොඩට අරගෙන, මරණයට හේතුව ගැන යළිත් සෝදිසිකරන්න කියලා."

"ඒක කරන්න හැටියක් නෑ මහත්මයා" කිව් ස්ටෝකර්ගේ මුවගට නැඟුණේ සිනාවකි.

"ඒ ඇයි?"

"ඉංගල්ගේ මිනිය පුළුස්සලා- ආදාහනය කරලා."

"ආහ්!" හෝම්ස්ට කෑගැසිණ. "ඒකෙන් වසදීමක් කියන සැකය වඩාත් තහවුරුවෙනවා. අනෙක් අතට සැකය ඔප්පුකිරීමට ඇති මාර්ගයත් විනාශවෙනවා."

"මේකත් මා කිවයුතුයි" ස්ටෝකර් කීය. "මළසිරුර ආදාහනය කරලා තිබෙන්නේ ඉංගල් මහතා මරණයට පෙර ලියාතිබෙන අන්තිම කැමැති පත්‍රයේ සඳහන් ඉල්ලීමක් අනුව."

"එතකොට මේක වසදීමෙන් කළ මිනීමැරුමක් යන සැකය, අපේ හිත්වල තදින්ම ඇතිවෙනවා. තමන් මියගියාම සිරුර ආදාහනය කරන්න කියලා, අන්තිම කැමැත්තෙන් ඉල්ලා තිබෙනවා කියමු. එතකොට අනෙක් පාර්ශවයට ඒක ලොකු වාසියක්. විෂ ශරීරගත කරලාම, ඔහුගේ මරණය ඉක්මන් කරන්න, ඔවුන් පෙළඹෙනවා. හොඳයි මරණ සහතිකය නිකුත් කරලා තිබෙන්නේ කවුද?"

"මරණ සහතික දෙකක් තියෙනවා" ස්ටෝකර් කීවේය. "පළමු එක, මියගිය ඉංගල් පදිංචිව සිටි, හොලෝවේ ප්‍රදේශයේ ඖෂධ


http://sherlockholmesinvestigations.blogspot.com

ක්‍රෙසන්ට්හි ඔහුට සාමාන්‍යයෙන් ප්‍රතිකාර කළ වෛද්‍යවරයාගෙන්. ඔහු හවුලන්ඩ් වීථියේ පදිංචි මෛඩ්‍යා පොලොක්. ඔහු තමා මුල් සහතිකය නිකුත් කරලා තියෙන්නේ. මරණයට හේතුව ස්ථිරකරලා වෛද්‍ය විශේෂඥයෙකුත් සහතිකයක් නිකුත් කර තිබෙනවා. ඒ විම්පෝල් වීථියේ කායික වෛද්‍ය විශේෂඥ හැල්බරි."

"හැල්බරි ඉන්නේ හවුලන්ඩ් වීථියට බොහොම ඈතින් නේ" හෝම්ස් කීය. "ඔහු මරණ පරීක්ෂණයක් පැවැත්තුවාද කියන කරුණ ඔබට දැනගන්න ලැබුණාද?"

"නැහැ. ඔහු එහෙම මොකුත් කිරුල නැහැ."

"එහෙම නම් හැල්බරි දුන්නු මරණ සහතිකයෙන් අපට ඇති වැඩක් නෑ" හෝම්ස් කීය. "කෙනෙකුගේ මළසිරුර දිහා බැලූ පමණින්, ඔහු මියගියේ හෘදයාබාධයකින් කියල කියන්නේ කොහොමද? රෝගියාට ප්‍රතිකාර කළ වෛද්‍ය පොලොක් ගේ වචනය, හැල්බරි පිළිගන්න ඇති. ස්ටෝකර් මහත්මයා, ඔබ කියන්නේ, මේ ගැටලුව විසඳීම මට භාරගන්න කියලද?"

"ඇත්තෙන්ම හෝම්ස් මහත්මයා. මේ ගැන මම මුලින් පොලීසියට දැනුම් දුන්නා. ඔවුන් කිව්වා මෙහි ඇති අවුල් සහගත බව නිසා යා යුත්තේ හෝම්ස් මහත්මයා ළඟට බව. නමුත් ඔබට ඒක කළ හැක්කේ මොන ආකාරයටද කියල, මට නම් හිතාගන්නවත් අමාරුයි."

"ඒක ඇත්ත" හෝම්ස් කීය. "කොහොම වුණත් අපි මුලින්ම මේ වෛද්‍යවරු දෙදෙනා හමුවෙලා බලන්න ඕන. මේ අවුලේ නොපැහැදිලි තැන් ටිකක් පැහැදිලි කරන්න බාගවෙලාවට ඔවුනට හැකිවේවි."

"ඇයි අනෙක් පුද්ගලයා නැගාඩ්?" මම කීවෙමි. "ඔහුගේ මළසිරුරත් ගොඩට අරගෙන මරණයට හේතුව සෝදිසි කර බලන්න වේවි. ඒ ඉතින් ඔහුවත් ආදාහනය කරල නැත්නම් .........."

"වොට්සන් කිව් දේත් හරි" හෝම්ස් මගේ අදහසට එකඟ විය. "නමුත් රක්ෂණ සමාගම නම් ඒ ගැන උනන්දු වෙන එකක් නැහැ. ඔවුනට ප්‍රශ්නය වෙලා තියෙන්නේ ඉංගල් ගේ මරණය නේ. ස්ටෝකර් මහත්මයා. ඔහුගේ මරණය සිදුවූ වකවානුව, අසනීපය හා ඔහුගේ පෞද්ගලික අත්‍යාරතුරු අඩංගු කෙටි සටහනක් ඔබ ළඟ නැද්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මා ළඟ විස්තර ටිකක් තියෙනවා හෝම්ස් මහත්මයා." ස්ටෝනර් එකට ඇමිණූ පිටු කිහිපයක් මගේ මිත්‍රයා අතට දුන්නේය. "මං දන්නෙ නෑ ඔබට අවශ්‍ය විස්තර ඔක්කොම ඔතැන තියෙනවද කියලා. නමුත් ඔහුට ප්‍රතිකාර කළ වෛද්‍යවරුන්ගේ නම් සහ ලිපින, අසනීප ඇතිවූ දින වකවානු ආදිය ඕකෙ ඇති."

ස්ටෝනර් පිටත්ව ගියපසු, එම කඩදාසි කිහිපය ඉක්මනින් කියවා බැලූ මගේ මිත්‍රයා, ඔරලෝසුව දෙස නෙත් යොමු කළේය.

"අපි ඉක්මන් කරලා විම්පෝල් වීථියට ගියොත්, අපට හැල්බරී අල්ලා ගැනීමට හැකිවේවි" හෝම්ස් කීවේ කබාය හැඳගනිමිනි. "අපි මේ පරීක්ෂණය පටන්ගත යුත්තේ පැහැදිලිවම එතැනින්. ඔහු කියන දෙයින් අපට මූලික අදහසකට එන්න පුළුවනි, මෙතැන මොකක් හරි වැරැදි වැඩක් සිදුවෙලාද නැද්ද කියන එක ගැන" එසේ කියූ හෝම්ස්, ස්ටෝනර්ගෙන් ලැබුණු වාර්තාව කබා සාක්කුවේ දමාගත්තේය.

අපි වහා සූදානම්ව පිටත්ව ගියෙමු. මිඩ්ල් ටෙම්පල් පටුමග කෙළවරින්, අපි කුලීරියකට නැඟුණෙමු. එය වෛද්‍ය හැල්බරීගේ ගෙදර දොරටුව අසලටම අප ගෙනගියේය. අපට එළියේ රැඳී සිටීමට සිදුවූයේ මිනිත්තු කිහිපයක් පමණි. අනතුරුව මේ වෛද්‍ය විශේෂඥයා විසින් ඔහු රෝගීන් පරීක්ෂා කරන කාමරය වෙත අප කැඳවනු ලැබිණ. ඔහු, එකතුවී තිබූ අනවශ්‍ය ලියුම් රැසක් අපද්‍රව්‍ය බහාලන කූඩයට දමමින් සිටියේය.

"ආයුබෝවන්" ඔහු පැවසුවේ අතට අතදී අප පිළිගනිමිනි. "වැඩකටයුතු, ලියකියවිලි ගොඩක් එක් රැස්වෙලා. මං මේ දෙසතියක් ඔස්ට්‍රියාවේ වියනා නුවර වෛද්‍ය සම්මේලනයකට සහභාගී වෙලා ආව විතරයි. මගෙන් මොකක්ද කෙරෙන්න ඕන?"

"අපි ආවේ ඉංගල් නම් මහත්මයා සම්බන්ධයෙන් .........." හෝම්ස් කීය.

"ඉංගල්? ....... ඉංගල් ....... ආ ඉංගල්" වෛද්‍යවරයා කීය. "ඔහොම ඉන්න ටිකක් කල්පනා කරල බලන්න."

"හොලොවේ හි ඕෂඩ් ක්‍රෙසන්ට් හි පදිංචි ජොනතන් ඉංගල්" හෝම්ස් පැහැදිලි කිරීමට තැත් කළේය.

"ආ....... ඔව් ඔව් ඉංගල්.... ඉංගල්.... මට දැන් මතකයි. ඉතින් කොහොමද ඉංගල් මහත්මයාගේ සැපසනීප?"

වෛද්‍යවරයා ඇසීය.

 http://sherlockholmesinvestigations.blogspot.com

"ඔහු මියගියා!"

"මියගියා? මියගියා? මොනවා ඔය ඇත්තද?" වෛද්‍යවරයා පැවසුවේ පුදුමයට පත් අයුරෙනි. "ඔය බලන්න. ඔන්න ඕකෙන් පෙනෙනවා, අපි රෝගයක් විනිශ්චය කරද්දී මොන තරම් පරෙස්සම් වෙන්න ඕනෙද කියලා. මට නම් හිතුණෙම ඔය මිනිහා කළේ බොරුවක් කියලයි. මං හිතුවෙ මිනිහා නැති ලෙඩක් ගැන, හිතේ මවාගත් අසනීපයක් ගැන, පැමිණිලි කරනවා කියලයි. ඇයි එහෙම කරන අය අනන්තවත් ඉන්නවා නොවැ?

ඔහු මා වෙත ඒවල තිබුණේ හෘදය විශාලවීමකට ප්‍රතිකාර කරන්න කියලයි. නමුත් මට නම් එහෙම දෙයක් හොයාගන්න බැරිවුණා. හෘදය ස්පන්දනයේ නම් සුළු අක්‍රමවත් බවක් තිබුණු එක ඇත්තයි. නමුත් එච්චරයි. මට නිකමට හිතුණේ ඔහු හොරෙන් ට්‍රයිනයිට්‍රින් පෙති ගිල දමනවාද කියලයි. මං දකුණු අප්‍රිකාවේ වැඩකරන කාලෙ, ඔය විදියට අක්‍රමවත් හදගැස්ම ගැන පැමිණිලි ලැබිල තියෙනවා. මට මතක්වුණේ ඒවා. ඒ නම් කෝඩයිට් සැපීම නිසා, ඇතිවුණු තත්ත්වයක්. කොහොම වුණත් මිනිහා අන්තිමට මැරිලා එහෙනම්. මරණයට හේතුව මොකක්ද කියල ඔබට දැනගන්න ලැබුණද?"

"ඔව්. හෘදය ප්‍රමාණයට වඩා විශාල වීම නිසා ක්‍රියා විරහිත වූ බවයි සඳහන් වෙන්නේ" හෝම්ස් කීය. "මළසිරුර ආදාහනය කරලා අවසන්. හැල්බරි දොස්තර මහත්මයා, මරණ සහතිකයේ 'C' ෆෝර්මයේ අත්සන් කරලා තියෙන්නේ ඔබ විසින්."

"මරණ සහතිකයට අත්සන් කරලා තියෙන්නේ මම?" වෛද්‍යවරයා ඇසුවේ උස් හඬිනි. "මොන පිස්සු කතාවක් ද ඒ? ඒක ඔහේලට වෙච්ච ලොකු වැරැද්දක්. මං කවදාවත් ඉංගල්ගේ මරණ සහතිකයට අත්සන් කළේ නෑ. ස්වේච්ඡා ප්‍රථමාධාර සංගමයෙන් ප්‍රදානය කරන සහතික පත්‍ර වගයකට නම් මං අත්සන් කළා. ඒව මෙහාට අරගෙන ආවේ ඉංගල් මහත්මිය. හැබැයි ඇගේ සැමියා මියගිය බවක් මං දැනගෙන හිටියේ නැහැ. මං ඔය රෝගියා පරීක්ෂා කරලා දින කිහිපයකට පසු, වෛද්‍ය සම්මේලනයට වියානාවට ගියා. ආපහු ආවේ ඊයේ. ඉතින් ඔහුගේ මරණ සහතිකය මං අත්සන් කළා කියල ඔබ කොහොමද කියන්නේ?"

http://sherlockholmesinvestigations.blogspot.com

රක්ෂණ නිලධරයා ඔහුට දුන් මරණ සහතිකය අතට ගත් හෝම්ස් එය වෛද්‍යවරයාට පෙන්වීය. වෛද්‍ය හැල්බරි තමාගේ නම සහ ලිපිනය ශබ්ද නගා කියෙව්වේ පුදුමයට පත් අයුරෙනි. "මේක නම් මහ පුදුමාකාර වැඩක්. මේ ගැන වහාම සොයා බැලිය යුතුයි."

"ඇත්තෙන්ම ඔව්" හෝම්ස් කීය. "ඉංගල්ගේ මරණය වස යොදා කළ මිනීමැරුමක් බවට සැක මතුවෙලා තියෙනවා."

"හා හා! ඔය තියෙන්නේ" හැල්බරි කීවේ සිනාසෙමිනි. "කිසි සැකයක් නෑ. යොදා ගන්න ඇත්තෙ ට්‍රයි නයිට්‍රින්. අපරාදෙ මං ඔහුව සැක කළේ. මේක වෙනත් කෙනෙකුගේ වැඩක්. බාග වෙලාවට අර හික් මීයෙක් වගේ ඉන්න, ඔහුගේ බිරිඳගේ වැඩක් ද දන්නෙත් නෑ. ඔය මිනිහා ජීවිත රක්ෂණයක් අරගෙන තිබෙන බව ඔබ කිව්වා නේද? එහෙනම් විශාල වන්දියක් ගන්න, ගෑනි ම වැඩේ කළාද දන්නෙ නෑ. මරණය ගැන කා වෙතද සැකය එල්ල වෙලා තියෙන්නෙ?"

"ඔහුගේ බිරිඳවයි සැක."

"හරියට හරි! මං කිව්වෙ නැද්ද?" වෛද්‍යවරයාට කෑගැසිණ. "ඒකි මහ යක්ෂ ගෑහැනියක්. ඒ වුණත් මිනිය පිළිස්සුවා නම් ප්‍රශ්න මතුවෙනවා. අළු ගොඩකින් කොහොමද සාක්ෂි හොයාගන්නෙ? කොහොම වුණත් කවුරු හරි මගේ අත්සන නම් හොරට ගහලා. මට නම් හිතෙන්නේ, අර ගෑනි සහතික වගයක් මට කියලා අත්සන් කරගත්තේ ඕකට තමයි. ඒක බලාගෙන යොදන්න ඇති හොර අත්සන. මේ වෛද්‍ය සහතිකයේ 'B' කොටස අත්සන් කරලා තියෙන්නේ වෛද්‍ය මීකිං කියල කෙනෙක්. එයා කවුද? ලෙඩාව මට එවල තිබුණේ වෛද්‍ය පොලොක්."

"ඔහු කවුද කියලා අපි හොයල බලන්නම්. බාගවෙලාවට වෛද්‍ය පොලොක් දන්නවා ඇති" හෝම්ස් කීය.

එතැනින් පිටවී අපි හවුලන්ඩ් වීථියේ වෛද්‍ය පොලොක්ගේ චිකිත්සාගාරය වෙත ගියෙමු. අපි මුලින් හමුවූ වෛද්‍යවරයා ගැන හෝම්ස් පොලොක්ට සඳහන් කළේ නැත.

"ඉංගල්?" වෛද්‍ය පොලොක් ඇසුවේය. "ආ මට දැන් ඔහු මතකයි. ඔබ කියන්නේ ඔහු මියගියා කියලද? ඒක නම් මට අහන්නත් පුදුමයි. ඒ මොකද මම නම් හිතුවෙ නැහැ, ඔහුගේ තත්ත්වය ඒ තරමට බරපතලයි කියලා."

 http://sherlockholmesinvestigations.blogspot.com

"ඔහුගේ හෘදයේ විශාල වීමක් තිබුණද?" හෝම්ස් ඇසීය.

"කියන්න තරම් විශාල වීමක් තිබුණේ නෑ. ඔහුට හෘදය වස්තුවේ මොනම රෝගයක් වත් තිබුණු බවක් මට නම් පෙනුණේ නෑ. හෘදයේ කපාට හැම එකක්ම ඉතාම හොඳින් වැඩකළා. ඔහුට තිබුණේ අධිකව දුම්පානය කරන්නෙකුගේ හදවතක්. මං නිවාඩුවට යද්දී මේ ලෙඩාව වෛද්‍ය මීකිංට භාර කරලයි ගියේ. ඔහු තමා ඒ කාලයේ මගේ චිකිත්සාගාරයේ වැඩකළේ. ඉංගල් මියගිය බවක් මීකිං මට කිව්වේ නැහැනේ. ඒක හරි පුදුමයි. ඔබ කියන්නේ මරණ සහතිකය අත්සන් කර තියෙන්නේ වෛද්‍ය මීකිං කියලද?"

"ඔව්. එපමණක් නොවෙයි. මළසිරුර ආදාහනය කිරීමට ඉල්ලුම් කරන අයදුම් පත්‍රයේ, ඒ සඳහා "වෛද්‍ය නිර්දේශය" කියන කොටසත් මීකිං මහත්මයා ම අත්සන් කර තිබෙනවා."

"අහන්නත් පුදුමයි" පොලොක් කීය. "කමක් නෑ. අපි බලමු රෝගීන්ගේ විස්තර අඩංගු වාර්තා පොත." වෛද්‍යවරයා රාක්කයකින් ලොකු පොතක් අතට ගත්තේය. ඒ සමගම මරණ සහතික නිකුත්කරන, මුද්‍රිත ෆෝරම අඩංගු පොත ද ගෙන, එහි පිටු ආපසු පෙරළීමට පටන්ගත්තේය.

"ඔව් හරි" වෛද්‍යවරයා කීය. "මේ තියෙන්නේ- ඉංගල් මහතා, ඕෂඩ් ක්‍රෙසන්ට්. අන්තිමට බෙහෙත් ගන්න ඇවිත් තියෙන්නේ සැප්තැම්බර් 4 වැනිදා ....... සුවය ලබා ඇත....... රාජකාරි කටයුතු සඳහා සුදුසුයි........ මරාණාසන්න බවක් මේකෙන් කියවෙන්නේ නෑ. එහෙම නේද? කොයි එකටත් අපි බලමු මරණ සහතික නිකුත් කළ පොත."

ඔහු එහි පිටු පෙරළීමට පටන්ගත්තේය. "හෝ හෝ! මේ මොකද මේ? මරණ සහතික පිටු දෙකක් මේකෙන් කඩාගෙනා. ඒවා නිකුත් කළේ කාටද කියල නෑ. බලමුකෝ දිනය. සැප්තැම්බර් 2වැනිදා සහ 13වැනිදා අතර වියයුතුයි. හරිම පුදුමාකාරයි. මේක නම් කොහොමටවත් මීකිං ගෙ වැඩක් වෙන්න බෑ. ඔහු හැමදෙයක්ම ඉතාම ක්‍රමානුකූලව කරන, විශ්වාස කටයුතු කෙනෙක්." එසේ කියූ වෛද්‍යවරයා එම කාලය තුළ රෝගීන්ගේ විස්තර සටහන් කළ තවත් පොතක් පරීක්ෂා කළේය.

"මට නම් මේකෙන් මොකුත් හිතාගන්න බැහැ" වෛද්‍ය පොලොක් කීය. "ලෙඩා මියගියා නම් ඒ බව, මෙන්න මේ පොතේ

http://sherlockholmesinvestigations.blogspot.com

සඳහන් වෙන්න ඕනෙ. එහෙම කෙනෙක් මියගිය බවක් මේකෙ නෑ" වෛද්‍යවරයා කීවේ ඔලුව අවුල් වුණු පුද්ගලයෙකු විලසිනි.

"අපට වෛද්‍ය මීකිං හමුවෙන්න පුළුවන් කොහේදි ද?" මම ඇසීමි.

"ඒක එච්චර ලේසි වෙන එකක් නෑ" පොලොක් කීය. "දැන් නම් ඔහු ඇත්තේ අත්ලාන්තික් සාගරය මැද. ඔහු රාජකීය තැපැල් ප්‍රවාහණ නෞකා සේවයට බැඳුණා, නැව එංගලන්තයෙන් පිටවෙලා ගියේ සති තුනකට කලින්. ඒ නිසා මේ මරණ සහතිකය අත්සන් කිරීම, කොහොමටවත් ඔහු කළා වෙන්න බෑ."

අපට දැනුම්දීමට වෛද්‍ය පොලොක් සතුවූයේ එම තොරතුරු පමණකි. මිනිත්තු කිහිපයකින් අපි ඔහුගෙන් සමුගෙන පාරට බැස්සෙමු.

"මෙතැන මොකක් හෝ වංචා සහගත වැඩක් කෙරිල තියෙන බවයි මට නම් හිතෙන්නේ. ඔබ මොකද කියන්නේ හෝම්ස්?" මම ඇසීමි.

"ඔව්. ඔබ හරි" ඔහු කීය. "ඇහැඳිලිවම වංචාවක් කෙරිල තියෙනවා. නමුත් මෙතැන බොහොම සිත් ඇදගන්නා ලක්ෂණයකුත් තියෙනවා. ඒ තමයි, පුද්ගලයා කවුරු වුණත්, ඔහු එම වංචාකිරීමට පෙන්වා ඇති දක්ෂභාවය. මෙවැනි ප්‍රයෝගයක් කිරීමට ඇයට තිබුණු දැනුම. මේක කරල තියෙන්නේ, කොයි තරමක් හිතල මතල සැලසුම් සහගතවද? ඒ කරුණ ඔබට පෙනුණෙ නැද්ද වොට්සන්"

"ඇය බොහොම අවදානම් කටයුත්තකයි යෙදිල තියෙන්නේ" මම කීවෙමි.

"බොහොම අවදානම් කටයුත්තක්" හෝම්ස් කීය. "නමුත් ඒක සියයට අනූනවයක්ම සාර්ථකව සිදුකළා කිව්ව හැකි. බලන්න මළසිරුර ආදාහනය කර, සාක්ෂි ඔක්කොම විනාශ කළ හැටි. ඉංගල්ගෙ පළමුවැනි කිරිඳ ඉදිරිපත් නොවුණා නම්, ඇගේ හිතේ ඇතිවූ සැකයක් ගැන නොකිව්වා නම්, මෙතැන වුණු අපරාධය කොහොමට වත් හෙළිවෙන්නේ නෑ."

"හෝම්ස්. මෙතැන සිදුවුණේ මොන වගේ දෙයක් කියලද ඔබට හිතෙන්නෙ?"

ඔහු හිස සෙලෙව්වේ ඊට සාර්ථක පිළිතුරක් තමා සතුව නොමැති බව හඟවමිනි.


http://sherlockholmesinvestigations.blogspot.com

"මේක මොන අරමුණකින් කළාද යන්න තමා නිශ්චය කරන්න අමාරු" හෝම්ස් කීය. "ඉංගල් මෙපන්නුවේ බොරු රෝගී බවක් කියල අපට නිගමනය කරන්න පුළුවනි. බොහොම වෙලාවට ඔහු ට්‍රයිනයිට්‍රින් හෝ එවැනි ඖෂධයක් පාවිච්චි කළා, වෛද්‍යවරුන් නොමග යවන්න. වෛද්‍යවරුන් හමුවෙන්න ගියේ කාරණා දෙකකට. එකක් ඔවුන්ගේ අත්අකුරු මිල සාම්පල ලබාගන්න. අනෙක තමන් රෝගී බවක් ඔවුන්ගේ හිත්වල රඳවන්න. නමුත් ඇයි ඉංගල්ම ගිහින්, වෛද්‍යවරුන්ට තමන් අසනීපයෙන් පෙළෙන කෙනෙක් බව පෙන්නුවේ? ඒ ටික මට පැහැදිලි නෑ.

වෛද්‍යවරුන් දෙදෙනාම මේ නගරයෙන් පිටවී සිටින කාලයක්, මේ වැඩේට යොදාගෙන තිබෙන්නේ බොහොම සැලසුම් සහගතව. අපි දන්නවා මිනිය ආදාහනය කරන්න කලින්, අවමංගල කටයුතු කරන ආයතනයට, ඒ සඳහා වෛද්‍යවරයෙකුගේ ලිඛිත සහතිකය අවශ්‍යයි. ඒක ඉතාම හොඳට ලැබිල තියෙනවා. ඊළඟට අවමංගල අධ්‍යක්ෂකවරයා වෛද්‍යවරයාගෙන් කටවචනයෙන් යමක් අහන්න ඉඩ තියෙනවා. මෙතැන ඒක කරන්න බෑ. ඇයි? වෛද්‍යවරයා අත්ලන්තික් සාගරය මැද. වෛද්‍ය සහතික වල ආකෘති පත්‍ර දෙක නම් වෛද්‍ය පොම්ලොක්ගෙන් හොරකම් කරගත් බවට සැකයක් නෑ. ඊළඟට ආදාහනයට උවමනා අයදුම්පත් නම්, ආදාහනාගාරයෙන් ලබාගන්න පුළුවනි. වෛද්‍යවරයෙක් හැටියට ඔබට මේ ගැන මොනවද වොට්සන් හිතෙන්නෙ?"

"ඉංගල්ගේ මරණය සිදුවෙ නැති එකක් බව ඇත්තයි" මම කීවෙමි. "නමුත් මං හිතන්නේ නෑ පොලොක් හෝ මීකිං වෛද්‍ය සහතිකයක් නිකුත්කිරීම ප්‍රතික්ෂේප කරාවි කියල. ඊළඟට ඒක අනුමත කරන්න හැල්බරි මැලිවෙන එකක් නෑ. ඔවුනට හිතේවි තමන් කළ රෝග විනිශ්චය වැරදුණා කියල.

හෝම්ස්. මට මෙහෙම දේකුත් හිතෙනවා. මේක බාගවෙලාවට ට්‍රයිනයිට්‍රින් අධිකව ශරීරගත වීමෙන්, අත්වැරැද්දෙන් වුණු මරණයක් වෙන්න බැරිද? එහෙමත් නැත්නම් සියදිවි හානිකර ගැනීමක්?"

"එහෙම දෙයක් හිතන්න අමාරුයි මිත්‍රයා" හෝම්ස් කීය. "මෙතැන සියදිවි හානිකර ගැනීමක් වුණා කියල, කොහොමටවත් හිතන්න බෑ. එහෙම දේකට නම් මොකටද ඔය හැටි හොර අත්සන්, හොර මරණ සහතික සකස් කරන්නේ? මෙතැන තිබෙන සූක්ෂම

http://sherlockholmesinvestigations.blogspot.com

සැලසුම් කිරීමේ හැටියට, නොදැනුවත් කමින් සිදුවූ ඖෂධ විෂවීමක් කියල හිතන්න අමාරුයි."

"හොඳයි ඒව එහෙමයි කියමුකෝ" මම කීවෙමි. "ජොනතන් ඉංගල් ඇයි අන්තිම කැමැත්තක් සකස් කළේ, තමන්ගේ සිරුර වළනොදමා, ආදාහනය කරන්න කියල?"

"අපි කොහොමද දන්නෙ?" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔහු එහෙම අන්තිම කැමැත්තක් ලියුවද කියල? මෙතැන බොහොම දක්ෂ හොර අත්සන් කාරයෙක් ඉන්න බව පැහැදිලියි. හොර මරණ සහතික දෙකක් හදාගත්ත නම්, හොර අන්තිම කැමැත්තක් හදාගැනීම එච්චර අමාරු වෙන්නෙ නැහැ."

"මට ඒ බවක් කල්පනා වුණේ නෑ." මම කීවෙමි.

"ඔබේ අවධානය මෙන්න මේ කාරණයට යොමු කරන්න වොට්සන්. මිනිය පුළුස්සා දැමීමක් උවමනා වුණේ ඇයි? ඒක තමයි මෙතැන තිබෙන වැදගත්ම හෝඩුවාව. ඒ මොකද මළසිරුරේ යම් සැකකටයුතු දෙයක් ඉතිරිවී තිබුණා. ඒ යම්කිසි දෙය වෛද්‍යවරුන් දකින්න ඉඩ තිබුණා. කොයි වෙලාවේද? එක්කො මිනිය වළ දැමීමට පෙර. නැත්නම් කාගේ හෝ පෙත්සමකින් මිනිය ගොඩ ගත්තොත්. ඒ හැම ප්‍රශ්නයක්ම පහසුවෙන් විසඳා දමන්න මිනිය ආදාහනය කළා."

"ඔබ හිතන්නේ එහෙම හංගන්න උවමනා වුණේ, ශාරීරික තුවාලයක්ද? එහෙමත් නැත්නම් ශරීර ගතවූ විෂක්ද?" මම ඇසීමි.

"ඒ ඕනෑම දෙයක් වෙන්න පුළුවනි." හෝම්ස් කීය. "ඔබේ කබාය හැඳගෙන හිස්වැස්ම අතට ගන්න වොට්සන්."

"කොහේ යන්නද?"

"අපි වහාම යායුතුයි අවමඟුල් කටයුතු සිදුකළ ආයතනයට. ඔහු ඉන්නේ කෙන්ටිෂ් ටවුන් පාරේ."

කුලීරියක නැගී අපි වහාම අවමංගල්‍ය අධ්‍යක්ෂක වරුන් වූ බරල් සහෝදරයෝ ආයතනය වෙත පිටත්වී ගියෙමු. එම ආයතනයේ එකම හිමිකරු වූ බරල් මහතා සුළු ව්‍යාපාරිකයෙක් විය. ඔහුගේ සාමාන්‍ය ඍකියාව වී තිබුණේ වඩුවැඩ හා කැබිනට් සෑදීම බව අපට දක්නට ලැබිණ. මිනීපෙට්ටි සෑදීම ඔහු කළේ, අනෙක් කටයුතු වලින් ලැබුණු ආදායම මඳ වූ නිසා වියයුතුය. අප ඇසූ ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දීමට ඔහු එක්විටම කැමැත්ත පළකළේය.

 http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only Not For Print

"මහත්තයා. ඇත්තම කියනවා නම්, ඔය මැරුණා කියන මහත්තයා, මගේ ඇස්දෙකට දැක්කෙ නෑ" ඔහු කීවේ හෝම්ස් ඇසූ ප්‍රශ්න වලට පිළිතුරු ලෙසයි. "මිනීපෙට්ටිය හදන්න, මං මිනියේ දිග මනිද්දී, මිනිය රෙද්දකින් වහලයි තිබුණේ. ඒ වෙලාවෙ ඉංගල් මහත්මියත් කාමරේ හිටියා. ඒ නිසා මං මගේ කටයුතු ඉක්මනට ඉවරකළා."

"මිනීපෙට්ටිය අරගෙන ආවම, ඒකට මළසිරුර දැම්මේ ඔබ නොවෙයිද එහෙනම්?"

"නැහැ. ඉංගල් මහත්මිය කිව්වා, ඇයත්, මැරුණු මහත්මයාගේ සහෝදරයාත්, මිනිය පෙට්ටියට දමන්නම් කියලා. ඒ නිසා මිනීපෙට්ටිය සාලෙ තියෙද්දී මට යන්න කිව්වා."

"නමුත් ඔබ මිනීපෙට්ටියේ පියන වහලා එයට ඇණ සවිකරද්දී වත් මිනිය දැක්කෙ නැද්ද?"

"පියන වහලා ඇණවලින් සවිකිරීම කළේ මං නොවෙයි" බරල් මහතා කීය. "ඒ කටයුත්ත සඳහා මං ඒ ගෙදරට යනකොට එය සිද්ධකරල ඉවරයි. ඉංගල් මහත්මිය කිව්වා, පෙට්ටිය ඉක්මනට වැසීමට ඔවුනට සිද්ධවුණා කියලා. එදා ටිකක් උණුසුම් දවසක්. තරමක් සැර ෆෝමලින් ගඳක් වගේත් තිබුණා. මං හිතන්නේ ඔවුන් කළ දේ හරි."

අපි ආපසු එන්නට පිටත්වූයෙමු.

"පරීක්ෂණයේ තවත් ඉදිරියට යා හැකි යමක් ඔහුගෙන් අපට දැනගන්න ලැබුණෙ නැහැනේද හෝම්ස්?" මා ඇසුවේ අප ආපසු එන අතරයි.

"ඇයි නැත්තේ? මළසිරුරේ මොකක් හරි අස්වාභාවික ගතියක්, සැක කටයුතු දෙයක් තිබුණු බවට දැන් කවදුරටත් තහවුරු වෙනවා. අවමංගල අධ්‍යක්ෂකවරියා ඒ දේ දකිනවාට වත් ඉංගල් මහත්මිය කැමැති වුණේ නැහැ. දැන් අන්තිමට බැලුවාම, ජොනතන් ඉංගල් මියගියාට, ඔහු මැරුණෙ කොහොමද කියල කවුරුවත් දන්නෙ නෑ."

අප ආපසු බේකර් වීථියේ නිවහන වෙත ළංවෙද්දී, හෝම්ස් නමට විදුලි පුවතක් ලැබී තිබිණි.

"අලුත් තොරතුරු රැගෙන හවස හයට ඔබ හමුවීමට එන්නෙමි.

ස්ටෝකර්"

හරියටම හවස හය වෙද්දි ඔහු අප හමුවට පැමිණියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස් මහත්තයා, ඉංගල්ගේ බිරිඳ ලෙස අප හැඳින්වූ සිබිල් හැගාඩ් ගෙදරින් පැනල ගිහින්."

"මොනවා? ඔබ කොහොමද දන්නේ?"

"මේ සිද්ධිය ගැන කරුණු හොයන්න මං ඒ ගෙදරට ගියා. දැන් පොලිසිය එතැන. මේ කාන්තාව බහු විවාහ චෝදනාව උඩ හිරබාරයට ගන්නයි පොලිසිය ඇවිත් තියෙන්නේ. නමුත් ඇය ඊට කලින් ගෙදරින් පැන ගිහින්."

"ඔවුන් නිවස සෝදිසි කරල නැද්ද?" හෝම්ස් ඇසුවේය.

"සෝදිසි කළාලු" ස්ටෝකර් පිළිතුරු දුන්නේය. "නමුත් වැදගත් කිසිම දෙයක් ලැබිල නැහැ. පරණ රයිෆල් පතරොම් කිහිපයක් නම් හමුවුණාලු. මං එයින් එකක් ඉල්ලාගෙන ආවා" ඔහු සාක්කුවට අත දමා එක් පතරොමක් එළියට ගත්තේය.

පතරොම අතට ගත් හෝම්ස් එය පරීක්ෂා කර බැලුවේය. "මේවා අවුරුදු විස්සකට ඉහත කාලේ පාවිච්චි කළ මෝස්තරයේ ඒවා. මෙන්න බලන්න."

අඬුවකින් ඉතා පරෙස්සමෙන් පතරොමේ කෙළවර විවෘත කළ හෝම්ස්, ඒ තුළින් තංගුස් වැනි ලූමක් එළියට ගත්තේය.

"කෝඩයිට්!" මම කීවෙමි.

"වෛද්‍ය හැල්බරිගේ හිතේ ඇතිවූ සැකය නිවැරදි බව මේකෙන් ඔප්පු වෙනවා" හෝම්ස් කීය. "ගෑනි කෝඩයිට් ලබාගත්ත ක්‍රමය මේකයි එහෙනම්."

හෝම්ස් එම කරුණ පිළිබඳව ස්ටෝකර්ට පැහැදිලි කර දුන්නේය.

"හෝම්ස් මහත්තයා. මරණ සහතික වල වංචාවක් ගැන ඔබ මට කිව්වානේ. මං ඔබට කියන්නම් මට දැනගන්න ලැබුණු තවත් ඒ වගේ වංචාවක් ගැන." ස්ටෝකර් කීවේ පුටුවේ පිටුපසට හේත්තුවෙමිනි. "ඔබ දන්නවාද ජොනතන් ඉංගල් කළ රැකියාව මොකක්ද කියලා? ඔහු සේවය කළේ නිවාස සහ දේපොළ වෙළඳ සමාගමක. ඔවුන් කරන්නේ ඉඩම් මිලදී ගැනීම සහ විකිණීම. ඉංගල් එතැන සේවය කළේ, ලේකම් හැටියට. නමුත් මුදල් පිළිබඳ කටයුතු භාර භාණ්ඩාගාරික තනතුර දැරුවෙත් ඔහුයි. මං ගියා මේ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂකවරයා හමුවෙන්න. ඔහු මට සම්පූර්ණ විස්තරයක් කීවා.

සමාගමේ මුදල් පිළිබඳව හැම කටයුත්තක්ම කෙරිලා තියෙන්නේ ඉංගල් ගේ පාලනය යටතේලු. මුදල් භාරගැනීමත්,

Reading Purpose Only, Not For Print

ගෙවීමත් දෙකම ඔහු කරල තියෙනවා. ඒ ගිණුම් කටයුතු පිළිබඳ පොත්පත් තිබුණෙත් ඔහුගේ භාරයේ. සමාගමේ මුදල් කටයුතු නිසිපරිදි සිදුනොවෙන බවක්, අධ්‍යක්ෂක මණ්ඩලයේ කිහිපදෙනෙකුට තේරුණාලු. ගණකාධිකාර සමාගමක් ලවා තමන්ගේ මූල්‍ය කටයුතු ගණන් ගැනීමට ඔවුන් තීරණය කළාලු. මේ බව ඉංගල්ටත් දැනුම් දීල තියෙනවා. දවස් දෙකකට පස්සේ සමාගමට ලියුමක් ලැබුණාලු, ඉංගල්ගේ බිරිඳගෙන්; ජොනතන් ඉංගල් මහත්මයාට හෘදයාබාධයක් හැදිලා, බරපතල ලෙස අසනීපයි කියලා. ඇය ඉල්ලා හිටියලු, සැමියා ආපහු රැකියාවට පැමිණෙන තෙක් ගිණුම් සෝදිසි කිරීමේ කටයුතු කල්දමන්න කියලා."

"ඉතින් කල් දැම්මද?"

"නැහැ" ස්ටෝකර් කීය. "ගණකාධිකාරවරු ඒ කටයුත්ත දිගටම කරගෙන ගියාලු. ගණන් තැබීමේ පොත්වල, අක්‍රමිකතා රාශියක් ඔවුනට දැකගන්න ලැබිල තියෙනවා. ඒට අමතරව පවුම් තුන්දහසකට අධික මුදලකට වෙච්ච දෙයක් නෑ. එපමණක් නොවෙයි. සමාගමට ලැබියයුතු මුදල් වෙනුවෙන් ඉංගල් භාරගෙන තිබෙන චෙක්පත් රැසක් ව්‍යාජ ඒවා."

"ඔවුන් ඒ බව ඉංගල්ට දැන්නුවාද?"

"නැහැ. ඒ මොකද ඉංගල් මහත්මියගෙන් ඔවුනට තවත් ලියුමක් ලැබුණාලු, ඇගේ සැමියාගේ තත්ත්වය බොහොම බරපතලයි කියලා. ඒට පස්සේ සමාගම තීරණය කළාලු ඔහුගේ අසනීපය හොඳවෙනතුරු ඉන්න. ඔන්න ඒට පස්සෙ තමයි ඔහුගේ මරණය ගැන සමාගමට දැනගන්න ලැබිල තියෙන්නේ."

"ස්ටෝකර් මහත්මයා" හෝම්ස් කථා කළේය. "ඔබ කියන්නේ, මේ බොරු මරණ සහතික වලයි, සමාගමේ කර ඇති වංචනික ගිණුම් වලයි සම්බන්ධයක් තියෙනවා කියල නේ? මොකක්ද ඒ සම්බන්ධෙ?"

"මෙහෙමයි" ස්ටෝකර් කීය. "ඔහු සමාගමට කළ වංචනික ක්‍රියා අහුවෙන්න යන බව ඉංගල් දුටුවා. ඔහුට දීර්ඝ කාලීන සිර දඬුවමකට යටත්වෙන්න වෙන බව ඉංගල් තේරුම් ගත්තා. ඒ නිසා ඔහු, සියදිවි හානිකරගත්තා."

"හොඳයි එහෙම හිතමු. එහෙනම් ඇයි මේ බොරු මරණ සහතික?" හෝම්ස් ඇසීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේකයි හෝම්ස් මහත්තයා. සියදිවි හානිකරගත්තාම රක්ෂණ වන්දි ලැබෙන්නේ නෑ. ඒ නිසා ඇය බොරු මරණ සහතික සකස් කරන්න ඇති. සිබිල් ඉංගල්ට විරුද්ධව තිබෙන මිනීමැරීමේ චෝදනාව ඉවත්කරගන්න පුළුවනි. අපි ඇයට ඉඩදෙමු, සියදිවි හානි කරගැනීම ගැන, කැමැත්තෙන්ම සාක්කි දෙන්න" ස්ටෝකර් කීය.

"ඒක කරන්න බැහැ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "එතැන වුණේ සියදිවි හානිකරගැනීමක් නම්, ඇයත් ඒකට හවුල්. ඒකට ආධාර හා අනුබල දුන්නා කියන්නේ, මිනීමැරුමකට ආධාර හා අනුබල දීමට සමානයි. නමුත් දැනට නිලවශයෙන්, ඇයට විරුද්ධව එහෙම චෝදනාවක් ඉදිරිපත් කරල නෑ. වෛද්‍යවරු තිදෙනෙක් ඔහු පරීක්ෂා කරල බැලුවා. ඔහු මියගියේ හෘද්‍යාබාධයකින් නෙමෙයි කියල කාටවත් කියන්න බැහැ."

"නමුත් මං හිතන්නේ ඔහු මියගියේ, අධික ප්‍රමාණයක් කෝඩයිට් ශරීර ගතවෙලා, එය විෂවීමෙන්" මම කීවෙමි.

"අපි හිතන්නේ එහෙමයි" හෝම්ස් කීය. "නමුත් අපි කාටවත් ඒ ගැන සහතික වෙන්න බෑ."

"එහෙම නම්" ස්ටෝකර් කීවේ අසුනෙන් නැගිටිමිනි. "ඉංගල් මියගියේ ස්වාභාවික හේතූන් නිසාද, එහෙමත් නැත්නම් විෂක් ශරීරගතවීමෙන්ද කියල හොයාගන්න ක්‍රමයක් නැද්ද?"

"එකම ක්‍රමයක් තියෙනවා" හෝම්ස් කීය. "මේක සාර්ථක වෙන්න, බොහොම සුළු ඉඩක් තමයි තියෙන්නෙ. ඉංගල්ගේ මළසිරුර ආදාහනයෙන් පසු ලැබුණු අළු පරීක්ෂාකර බැලුවොත්, අපට යම් හෝඩුවාවක් ලැබෙන්න ඉඩ තියෙනවා."

"නමුත් විෂක් ශරීර ගතවෙලා මියගියා නම්, අළු පරීක්ෂාවෙන් ඒක හොයාගන්න අමාරුයි." මම කීවෙමි. "මං හිතන්නේ නෑ කාබනික විෂක් කොහොමටවත් හොයාගැනීමට හැකිවේවි කියල. ඒ වගේම රසදිය, ඇන්ටිමනි වගේ ලෝහමය විෂක් වත් අළුවල රැඳී තිබේවි කියල හිතන්න අමාරුයි."

"ඒක වෙන්න පුළුවනි" මගේ මිත්‍රයා කීය. "නමුත් අලුතෙන් යම් දෙයක් අපි හොයාගන්නවා නම්, ඒකට සුළු ඉඩක්වත් තිබෙන්නේ, අළු පරීක්ෂාකර බැලීමෙන් පමණයි. අපි ඒ සඳහා ඉල්ලීමක් කරමු."

හෝම්ස් කළ ඉල්ලීමට දින දෙකකට පසු පිළිතුරක් ලැබිණ. අධිකරණ වෛද්‍ය අංශයේ අධීක්ෂණය යටතේ අළු පරීක්ෂා කර

Reading Purpose Only Not For Print


http://sherlockholmesinvestigations.blogspot.com

බැලීමට අවසර දී තිබිණි. මේ සඳහා සුප්‍රකට ව්‍යාධිවේද විශේෂඥ වෛද්‍ය හෙම්ං පත්කර ඇති බැව්, ලිපියේ සඳහන් විය.

නියමිත දිනයේ අපි ඔහු සමග දුම්රියෙන් කෝෆීල්ඩ් බලා පිටත්ව ගියෙමු. ආදාහනාගාරය පිහිටා තිබුණේ කෝෆීල්ඩ් වලයි. රජයෙන් කර තිබූ දැන්වීම අනුව, ආදාහනාගාරයේ පාලක තැන අප හමුවීමට දුම්රියපොළට පැමිණ සිටියේය. ඔහුට අමතරව, ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් ද එහි සිටියේය.

"හෝම්ස් මහත්මයා. ඔබට කලින් දැනුම් දෙන්න මට වෙලාවක් තිබුණේ නෑ. මට නියෝගය ලැබුණේ අන්තිම මොහොතේ."

"කමක් නෑ බ්‍රැඩ්ස්ට්‍රීට්. ඔබේ පැමිණීම අපට සතුටක්" හෝම්ස් කීය.

ආදාහනාගාරයේ අළු එක්රැස් කර තබන අංශය වෙත අප කැඳවාගෙන යන ලදී. බිත්තියේ තැනූ කුඩා කුටිවල අළු තැන්පත් කර තිබුණේ මැටි බඳුන්වල බහාලූ පසුය.

තම ලේඛනය පෙරළූ ආදාහනාගාර පාලකයා, අංකයක් හා ජොනතන් ඉංගල් යන නම ශබ්ද නගා කියෙව්වේය. මීළඟට එම අංකය දරන කවුළුව වෙත අප කැඳවාගෙන ගිය ඔහු, කුටිය තුළින් හතරැස් හැඩයේ, දිගින් වැඩි බඳුනක් එළියට ගත්තේය. එම අළු අයත් තැනැත්තාගේ නම සහ මියගිය දිනය, බඳුන මත සටහන් කොට තිබිණ. එය නිවැරදි බව අප තහවුරු කළ පසු, අළු බඳුන මේසයක් මත තබන ලදී. එය විවෘත කරන ලද්දේ පාලකයා විසිනි.

අපි මඳවේලාවක් නිහඬව ඒ දෙස බලා සිටියෙමු. ඒ තුළ වූයේ, හිම මෙන් සුදු පැහැති, ඉතා පහසුවෙන් කැඩෙනසුලු පතුරු වැනි අළු ගොඩකි. සුදු රේන්ද කැබැලි ගොඩක් වැනි ඒ අතර, අඩ වශයෙන් දැවුණු හා නොදැවුණු අස්ථි කැබැලි ද දක්නට ලැබිණ. ඒවා කිසිවක් මට හඳුනාගත හැකිවේදැයි, මගේ ව්‍යුහ විද්‍යාත්මක දැනුම යොදා මනසින් අභ්‍යාසයක යෙදුණෙමි, එහෙත් එය සිතූ තරම් පහසු නොවීය.

අන්තිමේදී වෛද්‍ය හෙම්ං නිහඬතාවය බින්දේය. "හෝම්ස් මහත්මයා. ඔබට හිතෙනවාද මේ අළු වල, මොකක් හරි අසාමාන්‍ය බවක් තියෙනවා කියලා? මට නම් එහෙම පෙනෙන්නේ නෑ."

"බාගවෙලාවට ඔබට නොපෙනෙනවා වෙන්නත් පිළිවන්" හෝම්ස් කීය. "අපි මේ අළු ගොඩ මේසය උඩ හොඳට තුනී කරල පරීක්ෂා කරමු."

http://sherlockholmesinvestigations.blogspot.com

අළු මේසය මත විහිදුවා, අඩක් දැවුණු හා නොදැවුණු සන වස්තූන් මේසයේ කෙළවරකට එකතු කෙරිණි.

"හොඳයි" වෛද්‍ය හෙමිං කීවේ, යළිත් වරක් තම දෑස් අළු ගොඩ මතින් ගෙනගිය පසුය. "මොකද ඔබ කියන්නෙ හෝම්ස් මහත්තයා?"

"මං දකින්න බලාපොරොත්තුවුණු සමහර දේවල් මෙතැන ඇත්තේ නැහැ" හෝම්ස් කීය. "වෛද්‍ය වාර්තාවේ සඳහන් වෙලා තිබුණා, ඉංගල්ට නිරෝගී දත්දෙපෙළක් තිබුණා කියල. කෝ ඒ දත්? මට දතක කැබැල්ලක්වත් දකින්න ලැබුණෙ නැහැ. දත් ගින්නෙන් දවාලීම අස්ථි වලටත් වඩා අමාරු බව, අප දන්නා කරුණක්. විශේෂයෙන්ම දතේ එනැමලය සහිත කොටස."

"ඒ කරුණ මමත් පිළිගන්නවා" වෛද්‍ය හෙමිං කීය. "දත් පිළිබඳව නම් කිසිම සලකුණක් නෑ. ඒකත් හරි පුදුමයි. ඒකෙ මොකක් හරි වැදගත්කමක් ඇති කියල ඔබට හිතෙනවද?"

පිළිතුරක් දෙනු වෙනුවට ෂර්ලොක් හෝම්ස් කළේ වකුවුණු සිහින් දිගටි අස්ථි කැබැල්ලක් අළුගොඩ තුළින් එළියට ගැනීමයි. ඔහු එය නිහඬව අපේ මුහුණු වෙත ළං කළේය.

"ඉළ ඇටයක කැබැල්ලක්" හෙමිං කීය. "එත් ඒකට තියෙන්නේ හරිම අසාමාන්‍ය පෙනුමක්. කැඩී බිඳී ගිය හෝ දැවීමෙන් ඇතිවුණු රළු කෙළවරක් වෙනුවට, මේකෙ කෙළවර කියතකින් කපල වගේ."

එය පසෙකින් තැබූ හෝම්ස් තවත් විශාල අස්ථි කැබැල්ලක් අතට ගත්තේය.

"මේ තියෙන්නේ තවත් නිදසුනක්," ඔහු කීවේ එය හෙමිං අතට දෙමිනි.

"ඔව්. මේකෙ කියතකින් කැපූ ලකුණු පැහැදිලිවම පෙනනවා."

"ඔව් ඔබ හරි" හෝම්ස් කීය. "ඔබ හිතන්නේ මේක මොන අස්ථිය කියලද?"

"ඒක තමයි මාත් මේ කල්පනා කළේ" හෙමිං පිළිතුරු දුන්නේය. "පළපුරුදු වෛද්‍ය විශේෂඥයෙක් හැටියට, මේ තරම් ලොකු ඇට කැබැල්ලක් මට හඳුනාගන්න අපහසුයි කියන්නත් ලැජ්ජයි. නමුත් සත්‍යය නම් මේක මොකක්ද කියල මට හඳුනාගන්න අමාරුයි. හැඩයෙන් නම් මේක අනු ජංඝාස්ථිය වගෙයි. නමුත් එහෙනම් මීට වඩා දිග වියයුතුයි. මේක අන්වරාස්ථියේ පහළ කෙළවරද?"


http://sherlockholmesinvestigations.blogspot.com

"අන්වරාස්ථිය නම් නොවෙයි." කී හෝම්ස් තවත් අස්ථියක් වෛද්‍ය හෙම්ං අතට දුන්නේය. එය අතට ගෙන කල්පනාවට වැටුණු වෛද්‍යවරයා, මහත් කැලැඹීමට පත්වූ බවක් පෙනිණ.

"හෝම්ස් මහත්මයා" ඔහු කීය. "මේක නම් හරි පුදුමාකාර දෙයක්. මේ එකක් වත්, මොන අස්ථියේ කොටසද කියල, මට හරියාකාරව හඳුනාගන්න බැහැ. පැහැදිලිවම ගාත්‍රාවක දිගු අස්ථියක් විය යුතුයි. ඒත් කොයි එකේද?"

"හොඳයි හෙම්ං මහත්මයා, දැන් අපි බලමු" කී හෝම්ස් දිගුඅස්ථි සියල්ල එක ළඟ තැබුවේය.

"ඔබ කියන්නේ මේවා ගාත්‍රාවල අස්ථි කියලනේ. එකම විධියේ අස්ථි පහක් තියෙනවා. මිනිහෙකුට එකම විධියේ අස්ථි තිබිය හැක්කේ දෙකයි. එහෙනම් ඇයි මෙතැන එකම විධියේ අස්ථි පහක්?" හෝම්ස් ඇසූ ප්‍රශ්නයට මට මෙන්ම විශේෂඥ වෛද්‍ය හෙම්ංට ද පිළිතුරක් නොතිබිණ.

"බලන්න මේ අස්ථි හතරකම කියතකින් කැපූ බවට ලකුණු තියෙනවා. ඉංගල්ගේ පශ්චාත් මරණ පරීක්ෂණයක් කළේ නැහැ. ඒ නිසා අස්ථි කියතකින් කපා තිබෙන්න හැටියක් නැහැ. මරණ පරීක්ෂණයක් කළත්, ගාත්‍රා වල දිගු අස්ථි කපන්නේ මොකටද? ඔබට මේවා හඳුනාගන්නත් අපහසුයි. ඒ මොකද මේ මනුෂ්‍ය අස්ථි නොවෙයි මේ බැටළුවෙකුගේ අස්ථි!"

"බැටළුවෙකුගේ?" අප දෙදෙනාවම කෑගැසිණ.

"මේ අළු බඳුන තුළ එකම මනුෂ්‍ය අස්ථියක් වත් නැහැ" හෝම්ස් කීය. "නමුත් පැහැදිලිවම බැටළු ගාත් පහක් නම් තියෙනවා."

"එහෙනම් මිනීපෙට්ටිය තුළ මළසිරුරක් තිබුණෙ නැද්ද?" මෙතෙක් නිහඬව සිටි පොලිස් පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් ඇසීය.

"කොහොමටවත් නැහැ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මනුෂ්‍ය ශරීරයේ බරට හරියන්න, මස් කඩේකින් බැටළුවෙකුගේ ශරීරයේ කොටස් අරගෙන, මිනීපෙට්ටිය තුළ අසුරා තිබෙනවා. දැන් බලන්න කාරණා එකිනෙකට ගැළපෙන හැටි; සම්බන්ධ වෙන හැටි. බැටළු ගාත් පහයි. මිනිස් ඇට එක කැබැල්ලක් හෝ නැහැ. වංචනික ලෙස සකස් කළ මරණ සහතික. ඒ ගැන ටිකක් කල්පනා කළාම ගැටලුව විසඳෙනවා. සිදුවෙලා තියෙන්නේ මොකක්ද කියල පැහැදිලියි. මේ සම්බන්ධව ඉතිරි වැඩ කටයුතු කිරීම අපි බ්‍රැඩ්ස්ට්‍රීට්ට භාර කරමු."

http://sherlockholmesinvestigations.blogspot.com

"හෝම්ස්. ඔබ මෙහේට එද්දීම දැන හිටියාද, අළු බඳුනේ තිබෙන්නේ මොනවද කියල?" මා ඇසුවේ අප දුම්රියෙන් ආපසු එමින් සිටියදීය.

"ඔව් වොට්සන්" ඔහු පිළිතුරු දුන්නේය. "මළසිරුර ආදාහනය සඳහා ලබාගතයුතු අවසර පත්‍රය, වංචනික ලෙස සකස්කර ඇති බව අපට දැනගන්න ලැබුණා. එතකොට මගේ හිතේ සැකයක් ඇතිවුණා. ඇයි සාමාන්‍ය විධියට ලබාගත හැකි අවසර පතක් වංචනික ලෙස සැකසුවේ, කියල. ඊළඟට අවමඟුල් කටයුතු කළ බරල්ගේ සාක්ෂියෙන්, මගේ සැකය තහවුරු වුණා."

"ඒ වුණාට ඔහු මිනිය මැන බැලූ බව අපට කිව්ව නේද?"

"ඇත්ත. නමුත් රෙද්දකින් වසා තිබූ එය් මිනියක්ද? පණපිටින් සිටි මිනිසෙක්ද? බරල් "මිනිය" මනින තුරු එතැන සිටියේ ඉංගල්මයි."

"ඇයි ඔහු මේ වගේ දෙයක් සැලසුම් කළේ?"

"ඉංගල්, ඔහු සේවය කළ සමාගමේ මුදල්, මහා පරිමාණයෙන් වංචා කළා. කොහොමද ඔහු නීතියෙන් ගැළවෙන්නේ? ඔහුට හැමදාමත් හැංගිල ඉබ්රේන්ට බැහැ. ඉංගල් බොහොම කෛරාටිකයෙක්. ඉතින් ඔහු සාර්ථක ක්‍රමයක් සොයාගත්තා. ඒ තමයි තමාගේ 'මරණය' හා සිරුර ආදාහනය. එතකොට දේපොළ වෙළඳ සමාගමටත්, පොලීසියටත්, ඉංගල් ගැන අමතක කර දමනවා හැරෙන්න, වෙනත් විකල්පයක් ඉතිරිවෙන්නේ නෑ. ඔහුට විරුද්ධව ඇති බහු විවාහ චෝදනාව ගැනත් අපි මෙතැනදී මතක් කළ යුතුයි. "මැරුණාම" ඒකත් අත්ඇරෙනවා. එතකොට ඔහුට පුළුවන් අලුත් නමකින් සිබිල් හැගාඩ් විවාහ කරගන්න. එතකොට කලින් බිරිඳගෙන් කරදරයකුත් නෑ. ඒ මදිවාට ඔහුට රක්ෂණ සමාගමෙන් පවුම් 1500ක වන්දියකුත් ලැබෙනවා.

මේ විධියේ ව්‍යාජ මරණයක් වෙන්න නම් ව්‍යාජ ලෙඩකුත් ඕනෑ. මළසිරුරක් නැති නිසා, හොර මරණ සහතික ඕනෑ. ඒ නිසාම ආදාහනයකුත් ඕන වෙනවා. නැතිනම් මරණය ගැන සැක හිතිලා මිනීපෙට්ටිය ගොඩගත්තාම හැමදෙයක්ම අහුවෙන නිසා. ඊළඟට අවමංගල සේවා ආයතනයට කරුණු වසන් කරන්න උවමනායි. ඒකත් ඔහු සාර්ථකව කළා. අනෙක ආදාහනයෙන් පසු ඉතිරිවෙන අළු පරීක්ෂා කළොත්, ඒ ගැන සැකයක් ඇති නොවිය යුතුයි. ඒ


http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only. Not For Print.

කියන්නේ මස් හා ඇට පිළිස්සුණාම දකින්න ලැබෙන අළු තිබිය යුතුයි. ඒ සඳහා රාත්තල් එකසිය පනහක මස්වලින් මිනීපෙට්ටිය පිරවිය යුතුයි. එක දවසකට මස් කඩෙන් මේ තරම් විශාල මස්ගොඩක් ගන්නත් බෑ. ඉංගල් දවස් කීපයක් තිස්සේ, බැටළු ගාතය හෝ දෙක බැගින් මිලට ගෙනා; ඒවා නරක් වෙන නිසා ෆෝමලීන් යෙදුවා. ඒ ඇර ගඳ තමා බරල් මහත්මයාට දැනුණේ."

අප කෝෆීල්ඩ් ආදාහනාගාරයට ගිය ගමනින් සතියකට පසු, සැඟවී සිටි ජොනතන් ඉංගල්, පොලිස් අත්අඩංගුවට පත්විය. මුදල් වංචාකොට, තමාගේ අවමඟුල හා ආදාහනය සැලසුම් කළ ඔහු, බන්ධනාගාරයේ දීර්ඝ සිරදඬුවමකට නියම් වූ බව, පසුව අපට අසන්නට ලැබිණ.

Reading Purpose Only.. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# රැම්ස්ගේට් ප්‍රහේළිකාව

මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා දිගින් දිගටම අපරාධ පරීක්ෂණ කටයුතු වල යෙදුණේ, ඔහුගේ ශරීර සෞඛ්‍යය ගැන නොසලකා හරිමිනි. දිවා රෑ නොතකා වෙහෙස වීම නිසා 1907 වසරේදී ද, මගේ මිත්‍රයා අධික රුධිර පීඩනයෙන් පෙළෙන්නෙකුගේ ලක්ෂණ පෙන්නුම් කළේය. මේ එවැන්නක් මා දුටු පළමුවතාව නොවේ. ඔහුගේ ළබැඳි මිත්‍රයා ලෙසත්, පෞද්ගලික වෛද්‍යවරයා ලෙසත්, හෝම්ස්ගේ දුක සැප සොයා බැලීම මගේ වගකීම බැව් මම දැන සිටියෙමි. එහෙත් දීර්ඝ විවේකයක් ගැනීමට මා නිතර කළ ඉල්ලීම, ඔහු ප්‍රතික්ෂේප කළේ සිනාමුසු මුහුණෙනි.

"දීර්ඝ විවේකයක්? මට එහෙම දෙයක් ගැන හිතන්නවත් අමාරුයි වොට්සන්" හෝම්ස් කීවේ දඟකාර සිනාවක් පාමිනි. "මං භාර අරගෙන, තවම අවසන් කරන්න නොලැබුණු වැඩ, තව කොයිතරමක් තියෙනවද? අවසන් කරන්න බොහොම කිට්ටු ඒවා කීයක් තියෙනවද? ඉතිං ඔබ කියන්නේ මේ ඔක්කොම අත්හැර දමලා අද හෙටම නිවාඩුවක් ගතකරන්න යමු කියලද?"

"මේ බේකර් වීථියෙන් ඉවත් වෙලා නොගිහිං, ඔබට විවේකයක් ගන්න කිසිම පිළිවෙළක් නෑ." මම කීවෙමි. "ගැටලු හතරක් පහක් විසඳල ඉවර වෙනකොට, තව ගැටලු දහයක් දොළහක් අරගෙන අනුග්‍රාහකයො එනවා වැළ නොකැඩී. ඉතින් මෙහේ රැඳී හිටියොත්, ඔබට ඔවුන්ගෙන් කිසිම ගැළවීමක් නෑ."

"ඉතින් මං මොනවා කරන්නද මගේ හිතවත් වොට්සන්?" හෝම්ස් කීවේ මෙතෙක් වෙලා වාදනයට සූදානම් කරමින් සිටි වයලීනය පසෙක තබා, හාන්සි පුටුවේ වැතිරෙමිනි. "ගැටලුවකට මුහුණදීලා, ඒකෙන් අමාරුවේ වැටිලා ඉන්න මනුස්සයා තමයි, ඒකෙ බරපතලකම දන්නෙ. ඔවුන් එයින් ගොඩට ගැනීමට මං වහාම භාරගන්නා බව ඇත්තයි. ඒ ගැටලුවක් විසඳීමට ඇති ආශාව නිසාම නෙමෙයි; අමාරුවේ වැටුණු කෙනෙකුට පිහිටවීම, හොඳ මනුෂ්‍යයෙකුගේ යුතුකමක් නිසා."


http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබේ මේ අසරණ-සරණ පිළිවෙත නිසා, කවුරුත් තමන්ගේ කරදර හිරිහැර මෙහාට අරගෙන එනවා." මම කීවෙමි. "ඔබ දිවා රෑ නොබලා වෙහෙසෙනවා. අන්තිමට ඔබ බරපතල ලෙස අසනීප වෙලා ඇඳට වැටෙන තුරු ඔබම අන්තෙ නෑ."

මගේ දේශනාවට කිසිවක් නොකියා හෝම්ස් මා දෙස සිනාමුසු මුහුණින් බලාසිටියේය. "මම දන්නවා මිත්‍රයා" ඔහු කීය. "මා අධිකව වෙහෙසවීමෙන් වළක්වන්න ඔබ උත්සාහ කරන්නේ, මගේ යහපතට, මා ගැන මිත්‍ර ප්‍රේමයෙන්. නමුත් කල්පනා කරල බලන්න. උදව් ඉල්ලාගෙන මා ළඟට ඇවිත් හඬාවැටෙන අසරණයින්ට මං කොහොමද පිටුපාන්නෙ? ඒක හදවතක් ඇති මනුස්සයෙකුට කරන්න පුළුවන් වැඩක්ද? දැන් බලන්න. ඊයේ ඔබ මෙහේ නොහිටි වෙලාවෙ ආවා මේරි කොලින්ස් නම් වයසක කාන්තාවක්. ඇගේ විසිහැවිරිදි දියණිය- ඇමෙලා කොලින්ස් මිනීමැරුම් චෝදනාවකට හිරභාරයට අරන්. ඇය අවුරුදු අටක පිරිමිළමයෙක්, සාන්තමරියා දෙව්මැඳුරේ ළිඳට තල්ලුකරලා මරා දැම්මාලු. ඒකයි චෝදනාව."

"ඔබ හිතන්නේ ඇය අහිංසකයි කියලද?"

"දන්න කිසිවක් මා ළඟ නෑ" හෝම්ස් කීය. "ඒ නිසා මට තවමත් ඒ ගැන මොකුත් කියන්න බෑ. නමුත් තමන්ගේ දියණිය නිර්දෝෂයි කියල, මා ළඟට ඇවිත් හඬාවැටෙන අම්ම කෙනෙක්, මං කොහොමද චොට්සන් එළවගන්නෙ?"

"ඒව මං දන්නේ නෑ හෝම්ස්. මං අද උදේ එකොළහට හාර්ලි වීදියේ වෛද්‍ය විශේෂඥයෙකුට ඔබව පෙන්වන්න, වෙලාවක් වෙන්කරගෙනයි තියෙන්නෙ. ඒ ඔබ හොඳට අහල පුරුදු කෙනෙක්- ශ්‍රීමත් ජෝන් හැන්වෙල්. කාලයක් තිස්සේ අධික ලෙස පයිප්පය බීමත්, ඔබේ ඔය අසනීප තත්ත්වයට එක හේතුවක් වෙන්න ඇති. වරින්වර ඔබට දැනෙන ක්ලාන්ත ගතිය, හිස දෙපැත්තේ කැක්කුම, නින්ද අඩුකම- මේ රෝග ලක්ෂණ වලින් කියන්නේ මොකක්ද කියල මට හොඳට තේරුම් ගන්න පුළුවනි. නමුත් මං වැඩිය කැමැතියි, වෛද්‍ය විශේෂඥයෙකුම ඔබට ඒ කරුණු වටහාදෙනව දකින්න."

"හොඳයි හොඳයි" හෝම්ස් කීවේ පරාජය පිළිගන්නා හඬකිනි.

උදේ 10.30 වෙද්දී අපි කුලීරියකින් වෛද්‍ය විශේෂඥයා හමුවීම සඳහා පිටත්වී ගියෙමු. ලන්ඩන් වෛද්‍ය විද්‍යාලයේ හෘදරෝග

http://sherlockholmesinvestigations.blogspot.com

පිළිබඳ මහාචාර්යවරයෙකු වූ ශ්‍රීමත් ජෝන් හැන්වෙල්, එම ක්ෂෙත්‍රයේ අග්‍රගණ්‍ය විද්වතෙක් විය. හෘදය හා රුධිරවාහිනී පිළිබඳ ඔහුගේ දැනුම සැමවිටම, අනෙක් වෛද්‍යවරුනට වඩා අවුරුදු ගණනක් ඉදිරියෙන් බව යුරෝපය පුරා පිළිගැනිණි.

මගේ මිත්‍රයා දීර්ඝ ලෙස පරීක්ෂා කළ වෛද්‍යවරයා පැවසුවේ, ෂර්ලොක් හෝම්ස්, අධික රුධිරපීඩනයේ මූලික අවස්ථාවේ, රෝග ලක්ෂණ පෙන්වන බවයි. හෝම්ස් සති තුනක නිවාඩුවක් අනිවාර්යයෙන්ම ගතයුතු බවත්, ඉන්පසු ද රෝග ලක්ෂණ මෙලෙසම පැවතුනහොත් තම්බා ඖෂධ නියමකරන බවත් වෛද්‍යවරයා තවදුරටත් කීය. එහෙයින් කෙන්ට් ප්‍රදේශයේ මුහුදු වෙරළ අසබඩ ගම්මානයක, නිවාඩුවක් ගතකිරීමට හෝම්ස් කැඳවාගෙන යාමට මම තීරණය කළෙමි.

ඒ අනුව එක් සුන්දර උදෑසනක අපි ලන්ඩනයෙන් පිටත්වී ගියෙමු. අපේ ගමනාන්තය වූයේ රැම්ස්ගේට් සමීපයේ පිහිටි රෙකුල්වර් නම් ගම්මානයයි. මුහුදු වෙරළ ආසන්නයේ කඳු ගැටයක් මත පිහිටි තානායමේ අපි ලැගුම් ගත්තෙමු. උදේ පාන්දර මුහුදේ නෑමටත්, සවස් වරුව ගම්මානයේ ඇවිදීමටත් යෙදීමට අපි තීරණය කළෙමු. තානායම භාරකරු වූයේ බ්‍රයන් චෙස්ටර් නම් මැදිවියේ මහතෙකි. ඔහු ප්‍රදේශයේ ක්‍රීඩා සංගම් කිහිපයක නිලතල දැරුවෙක් විය. පළාතේ වැදගතුන් ඔහු හමුවීමට නිතර පැමිණි නිසා, ඔවුන් කිහිපදෙනෙකු හඳුනාගැනීමට ද අපට අවස්ථාවක් සැලසිණ. එක් දිනක් උදේ වරුවේ මුහුදේ නෑම සඳහා ගොස් ආපසු පැමිණෙන විට අප හමුවීම සඳහා අමුත්තෙක් පැමිණ සිටියේය.

"මේ කපිතාන් ඩෝසන්" ඔහු හඳුන්වා දෙමින් චෙස්ටර් පැවසීය. "මේ මහත්මයා තමයි රැම්ස්ගේට් ප්‍රදේශයේ වෙරළාරක්ෂක රෙජිමේන්තුවේ ප්‍රධාන නිල්ධරයා. ඔබතුමන් ලා මුහුදේ නාන්න ගිහින් මිනිත්තු දහයක් වුණේ නැහැ, ඔහු ආවා. නමුත් ඔබතුමන්ලාගේ විවේකයට බාධාකරමින් ආපසු කැඳවන්න මං කැමැතිවුණේ නැහැ."

අසුනෙන් නැගිට අපට අතට අත දුන් කපිතාන් ඩෝසන්, අඩි හයක් පමණ උස, අතිශයින්ම තරබාරු පුද්ගලයෙකු විය. කළුපැහැති ඝන උඩුරැවුලක් තිබුණු ඔහුගේ මුහුණ, අව්වට පිළිස්සීම නිසා දුඹුරු පැහැ ගැන්වී තිබිණ. බැලූ බැල්මට රළු පෙනුමක් තිබුණත්, කතාබහේදී ඔහු ප්‍රියමනාප පුද්ගලයෙකු බව අපි වටහා ගත්තෙමු.

 http://sherlockholmesinvestigations.blogspot.com

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා මෙහේ ඇවිත් ඉන්නේ, අපරාධ පරීක්ෂණ කටයුතු වලින් ඈත්වෙලා විවේකයක් ගන්නයි කියලා බ්‍රයන් මට කිව්වා" ඩෝසන් කථාව ඇරඹීය. "ඒ වුණත් මේ වෙලාවේ මගේ මේ ප්‍රශ්නයට මොකක් කළ යුතුද කියල මට හිතාගන්න බැරිවුණා. ඒ නිසා හැමදේකටම කලින් ඔබෙන් අදහසක් ගන්නයි මං ආවේ."

තමා වෙත ගැටලුවක් ගෙනැවිත් ඇති බව ඇසූ හෝම්ස්ගේ මුහුණේ ඇතිවූයේ සතුටු සිනාවකි. ඔහු තම පයිප්පය සාක්කුවෙන් ගෙන, එයට දුම්කොළ පිරවීමට පටන්ගත්තේය. කතන්දරයට සවන් දෙනු විනා වෙනත් විකල්පයක් නොමැති බැව් මම තේරුම්ගතිමි.

"හෝම්ස් මහත්මයල මේ පැත්තට ඇවිත් නවම ගතවුණේ දවස් දෙක තුනක් බව මම දන්නවා" ඩෝසන් කීවේ දීර්ඝ කථාවකට මුලපුරමිනි. "ඒ නිසා ඔබට මේක තේරුම් ගන්න පහසුවෙන්න, මේ පළාතේ වටපිටාව ගැනත් මම යමක් මතක් කරන්නම්.

ඔබ සමහර විට දන්නවත් ඇති, මේ රැම්ස්ගේට් ඉඳල හැතැක්ම දෙකක් උතුරෙන් තමයි, ලන්ඩන් වරාය වෙත යන මුහුදු මාර්ගය පිහිටලා තියෙන්නේ. ප්‍රංශයේ, ඕලන්දයේ සහ බෙල්ජියමේ සිට එංගලන්තයට බඩු ප්‍රවාහණය කරන, කුඩා නැව් රාශියක්ම යාත්‍රාකරන්නේ, අපේ මුහුදුතීරය අසලින්මයි. මේ නාවික ගමනාගමනය පහසුවීමටත්, මේ ප්‍රදේශයේ ධීවරයන්ගේ ප්‍රයෝජනයටත් රෙකුල්වර් ප්‍රදීපාගාරය පිහිටුවා තිබෙනවා. මේක තිබෙන්නේ, මුහුදු වෙරළේ සිට සැතපුම් අටක් පමණ, සාගරය මැදට වෙන්න. මෙහි පරිපාලනය කෙරෙන්නේ මගේ යටතේ තිබෙන වෙරළාරක්ෂක ස්කන්ධය මගින්. මෙම ප්‍රදීපාගාරයේ කටයුතු සඳහා සේවකයන් දෙදෙනෙක් හැමවිටම එහි සේවයේ යෙදී ඉන්නවා. ඇත්තෙන්ම එහි සේවක මණ්ඩලය හතරදෙනෙක්. අනෙක් දෙදෙනා මේ දිනවල නිවාඩු ලබා ගමට ගිහින්. පහුගිය සතියකට වැඩි කාලයක්, ප්‍රදීපාගාරයේ වැඩකළේ, හැරී බානට් සහ ටොම් ජෙෆ්රි නම් සේවකයන් දෙදෙනා.

ගිය ඉරිදා සවස, හැරී බානට් ඉණිමගෙන් ලිස්සා පහළට ඇදවැටී, ඔහුගේ කකුල කැඩී තිබෙනවා. ඔවුන් මේ බව මට දන්වා එව්වේ, බෙල්ජියමේ සිට ලන්ඩන් වෙත ඉරිදා රාත්‍රි යාත්‍රා කළ, "ලියෝපෝල්ඩ්" නම් යාත්‍රාවේ නාවිකයන් අත. ප්‍රදීපාගාරයේ සේවයට අය මදි නිසා, අපි අලුත් සේවකයකුත් බඳවාගෙනයි

http://sherlockholmesinvestigations.blogspot.com

හිටියේ. ඔහු තවත් සතියකින් එහි යවන්නයි මං බලාපොරොත්තු වුණේ. මොහු ජේම්ස් බ්‍රවුන් නම් අවුරුදු පනස්පහක් වයසැති කෙනෙක්. ඔහු කාලයක් තිස්සේ නෞකා වල සේවය කොට පළපුරුද්දක් ඇති, පරණ නාවිකයෙක්.

හැරී බානට්ගේ අනතුර ගැන දැනගත් විගස, ප්‍රදීපාගාරයට යාමට සූදානම් වන ලෙස මං බ්‍රවුන්ට දැනුම් දුන්නා. මං ඒ නියෝගය දුන්නේ ඊයේ රාත්‍රියේමයි. මං බලාපොරොත්තු වුණේ යාත්‍රාවකින් සඳුදා උදේම ජේම්ස් බ්‍රවුන් එහි යවන්නයි. ඔහු සඳුදා උදේ සූදානම් වෙලා තොටුපොළට ආවා. නමුත් මාගේට් අසල මුහුදේ නාන්න ගිය තරුණයෙක් අතුරුදන් වී ඇති බවට, සඳුදා එළිවෙන පාන්දර පණිවුඩයක් ආවා. ඒ නිසා මගේ වෙරළාරක්ෂක භටයෙකු සහ කිමිදුම්කරුවෙකු වහාම මාගේට් වෙත යවන්න මට සිදුවුණා. ප්‍රදීපාගාර සේවකයන් ප්‍රවාහණයට ඇති බෝට්ටුවයි අපි එහි යැව්වේ. ඒ බව තොටුපොළට ආව බ්‍රවුන්ට එතැන සිටි නිලධරයා දැනුම් දුන්නා."

"මාව ප්‍රදීපාගාරයට ගෙනියන්න වෙන බෝට්ටුවක් නැද්ද?" බ්‍රවුන් ඇහුවා.

"අපේ අනෙක් බෝට්ටු දෙකම මේ දවස්වල අලුත්වැඩියා කරනවා. අනෙක ඔබ සමග එවන්න මට කෙනෙකු ඇත්තේ නැහැ."

"එතකොට ප්‍රදීපාගාරයට, පිහිනා ගෙන යන්න කියලද ඔහේ මට කියන්නෙ?" බ්‍රවුන් ඇසුවා.

"නෑ නෑ. ඔය අලුත් ඇඳුම් පිටින් පිහිනන්න කියලා අපි කියන්නේ නෑ." නිලධරයා පිළිතුරු දුන්නා. "විලට් නම් වයසක ධීවරයෙකුට අයිති හොඳ රුවල් බෝට්ටුවක් තියෙනවා. ඔහු අද මුහුදු යන්නේ නැහැ. ඔහු තමන්ගේ දියණිය බලන්න මින්ස්ටර් නගරයට යනවා. ඔහුගේ බෝට්ටුව අපේ වැඩේට යොදාගන්න, මං ඔහුගෙන් අවසර ගත්තා. ඒ වුණත් ඔබ සමග යවන්න කෙනෙක් තමයි නැත්තේ."

"ඇයි ඔහේ හිතන්නේ, මට ඔය බෝට්ටුවක් පැදගෙන මුහුදු යන්න දැනුමක් නැහැ කියලද?" බ්‍රවුන් ඇසුවා. "මං මුහුදට බැස්සේ අවුරුදු දහයක කොල්ලෙක් කාලෙ."

"හොඳයි බ්‍රවුන්. ඔහේ මේක පැදගෙන ගියා කියමුකෝ. කවුද මේක ආපහු පැදගෙන එන්නේ? බෝට්ටුවේ ආරක්ෂාව ගැන මං විලට්ට වගකිවයුතුයි."


http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only - Not For Print

"ඇයි ඉතින් මං යන්නේ අර කකුල කැඩුණු මිනිහෙක් නිදහස් කරන්න නේද?" බ්‍රවුන් ඇසුවා. "මං වගේම එයත් කැමැති වෙන එකක් නැහැ මුහුදෙ පීනාගෙන එන්න. එයාගෙ කකුල මිසක් අත කැඩිලා නැහැනෙ."

"ඔව් ඒකත් හරි" නිලධරයා කිව්වා.

"කොහොම වුණත් ඔහේ ඒ මිනිහා අතේ බෝට්ටුව එවන්න බලාපොරොත්තු වෙනවා නම්, මේ දැන්ම පිටත්වෙලා ගියොත් හොඳයි. ඒ මොකද එතකොට, ආපහු එන මිනිහට වඩදියත් එක්ක ආපහු ගොඩට එන එක පහසුවේවි."

ඔවුන් රුවල් සකසලා. බ්‍රවුන් නැඟුණු බෝට්ටුව දියත් කරන්න උදව් කළා. විලට්ගේ "එමිලි" නම් මේ බෝට්ටුව, ඕක් ලීයෙන් තනා වාර්නිෂ් ආලේප කළ, ශක්තිමත් එකක්. ඒකෙ රුවල් ඉතාම හොඳින් ක්‍රියාත්මක කළ හැකි බවට නිලධරයා සහතික වෙනවා. මේ හරියේ රැල්ල හුරුපුරුදු බ්‍රවුන්ට, නිලධරයා අමතර උපදෙසුත් දුන්නාලු.

"ඔහේට කරන්න තියෙන්නෙ මෙච්චරයි බ්‍රවුන්. දැන් බාදිය ඉවරවේගෙනයි එන්නෙ. ඒකෙ ප්‍රයෝජනය ගන්නවා. ඔරුවේ ඉස්සරහ, ඊසාන පැත්තටම තියාගන්නවා. මහරුවල උඩටම ගත්තාම පහසුයි. නිරිතදිගින් එන බලෙ රැල්ලට අහුවුණාම, එක හුස්මට ප්‍රදීපාගාරය ළඟටම යන්න පුළුවනි. ඊත් හොඳින් මතක තියාගන්නවා. ප්‍රදීපාගාරයෙන් නැඟෙනහිර පැත්තට නම් යන්න එපා. රැල්ල සැරවුණොත් ඔහේ දියඹටයි ඇදෙන්නෙ. බේරිල ආපහු එම බොරු."

"මේ උපදෙස් වලට බ්‍රවුන් හොඳින් ඇහුම්කන් දීගෙන හිටියලු. නමුත් මුහුද හොඳින් හුරුපුරුදු කෙනෙක් හැටියට, ඔහු ඒවා ගණන්ගත්ත බවක් පෙන්නුවේ නැහැලු. බෝට්ටුව දියත් සරල, රුවල දියත් කරන්න උදව්වුණු අය, ටික වෙලාවක් දුරේක්ෂ වලින් බලාගෙන ඉඳලා තියෙනවා."

"ඉතින්?"

"මේ අතරේ ප්‍රදීපාගාරයේ භූවාල ලබා සිටි හැරී බානට් නම් සේවකයා, අපි මිනිහෙක් සමග යාත්‍රාවක් එවනතුරු බලාගෙන ඉඳල තියෙන්නේ නොඉවසිල්ලෙන්. ඔහුගෙ කකුලේ වේදනාව නිසා, තවත් බලාගෙන ඉන්න බැරුව, ගොඩබිම දෙසට එන නැවක හෝ එන්න ඔහු තීරණය කළාලු. වාසනාවකට වගේ ඕලන්දයේ සිට

http://sherlockholmesinvestigations.blogspot.com

ආ "ක්වීන් බ්‍රියටිස්" නෞකාව, ආපදා සංඥා මගින් නවත්වාගන්න ඔවුනට හැකිවෙලා තියෙනවා. අනතුරට පත්ව හිටි බානට්ව ගොඩබිමට ගෙන එන්න, නැවේ කපිතාන් කැමැතිවුණාලු. බානට් ආ වහාම අපි ඔහුව රෝහලට ඇතුළු කළා."

මෙතෙක් වේලා දිගටම කථාකළ කපිතාන් ඩෝසන්, මිනිත්තු කිහිපයකට නිහඬවිය. ඔහු යළිත් කථාව පටන්ගත්තේ, අප සැම වෙත තේ ගෙන ආ සේවකයා දුන් තේ කෝප්පය, අතට ගත් පසුයි.

"හෝම්ස් මහත්මයා. දැන් ප්‍රශ්නය වෙලා තියෙන්නේ මේකයි. ජේම්ස් බ්‍රවුන් ප්‍රදීපාගාරයට වාර්තාකරල නැහැ. වෙනත් වචන වලින් කියනවා නම් ඔහු අතුරුදන් වෙලා. ඔහු මහමුහුදට ගසාගෙන ගියාද, වතුරේ ගිලී මියගියාද, නැත්නම් රැකියාව අත්හැර බෝට්ටුවත් අරගෙන පැනගියාද, මේ ගැටලුව අපට හිතාගන්න අමාරුයි."

"බොහොම වෙලාවට වෙන්න ඇත්තෙ, බාදිය අඩුවේගෙන යද්දි ඔහු රැල්ලත් එක්ක මුහුද මැදට ගහගෙන යන්න ඇති" රුවල් බෝට්ටු හැසිරවීමේ මනා නිපුණත්වයක් තිබූ වෙස්ටර් කීය.

"එක අතකින් ඔහු පළපුරුදු නාවිකයෙක්" ඩෝසන් යළිත් කථාව පටන් ගත්තේය. "අවුරුදු හතළිහක් වත් මුහුදේ රැල්ල සමග සටන් කරපු කෙනෙක්. ඊළඟට ඔහු ගිය යාත්‍රාව අබලන් එකක් නෙමෙයි. මේ වෙලාවේ මුහුදේ රළු ප්‍රචණ්ඩ බවක් තිබිලත් නැහැ. ඒ නිසා ඔහුට තනියම බෝට්ටුව හසුරුවාගන්න අපහසුවුණා කියල අපට හිතන්න බැහැ.

බෝට්ටුව දියත්කරන්න උදව්වුණු අය, බොහොම වෙලාවක් බ්‍රවුන් ගිය දිහා බලාගෙන ඉඳල තියෙනවා. ඔහු රුවලේ උදව්වෙන් සෑහෙන දුරක් ගියාට පස්සෙ, හබල්ගාන්න පටන් අරගත් බවයි පෙනෙන්නෙ. මේ වෙනකොට සැහැල්ලු මීදුමක් පාවෙලා ඇවිත් තියෙනවා. ඒ නිසා අපේ අයට ඊටපස්සේ ඔහුව දකින්න ලැබිල නෑ."

"වෙන මොනවද ඔහු ගැන තියෙන තොරතුරු?" හෝම්ස් ඇසීය.

"වෙරළාරක්ෂක නිලධරයා බ්‍රවුන් පිටත්වී ගිය අවස්ථාව ගැන, මා වෙත ලිඛිතව දන්වා සිටියා. මේන්න ඔහු ලියූ වාර්තාව.........."

කපිතාන්වරයා තම සාක්කුවෙන් ලිපියක් ගෙන එය කියවීමට පටන්ගත්තේය.

 http://sherlockholmesinvestigations.blogspot.com

"........ අන්තිම වරට දකිනවිට ජේම්ස් බ්‍රවුන් බෝට්ටුවේ ඉදිරියට මුහුණ ලාගෙන සිටියේය. ඔහුගේ අතේ පයිප්පයක් සහ දුම්කොළ දමන පසුම්බියක් විය. ඔහු බෝට්ටුව හැසිරවීමට යොදාගත්තේ තම වැළමිටයි. පසුම්බියේ වූ දුම්කොළ එළියට අදිමින් ඔහු පයිප්පය පුරවන්නට පටන්ගත්තේය.........."

"ඔන්න බලන්න හෝම්ස් මහත්මයා." ඩෝසන් කීය. "ඔහු පයිප්පය අතින් අල්ලාගෙන හිටියලු; කකුලෙන් නෙමෙයි පයිප්පය අල්ලාගෙන ඉඳල තියෙන්නේ! පසුම්බියේ තිබුණු දුම්කොළ අරගෙන ඒක පිරෙව්වලු; කිරිබෝතලේකින් නෙමෙයි දුම්කොළ අරගෙන තියෙන්නෙ. ඔන්න අපේ මිනිස්සු ලියන වාර්තාවල හැටි" කෝපයට පත්ව සිටි කපිතාන් ඩෝසන් කඩදාසිය ගුළිකොට සාක්කුවට දමාගෙන සුරුට්ටුවේන් තවත් දුම්ගුළියක් පිටකළේය.

"එහෙම කියන්නත් එපා" හෝම්ස් කීය. "ඔබේ සේවකයා කළේ ඔහු දුටුදේ වාර්තා කිරීම පමණයි. සමහර විස්තර ප්‍රයෝජනවත් වේවි කියල හිතාගෙන, ඒවා තෝරා බේරා වාර්තා කිරීම නොවෙයි."

"මගේ හිතවත් මහත්මයා" ඩෝසන් කීය. "ඒ වුණාට බ්‍රවුන් කියන යක්ෂයා, ඔහුගේ පයිප්පය පිරෙව්වේ මොනවායින්ද කියන එකේ ඇති වැදගත්කම මොකක්ද?"

"කාටද කියන්න පුළුවන්" හෝම්ස් කීය. "බාගවෙලාවට ඒක පසුව බොහොම වැදගත් කාරණයක් වෙන්නත් පුළුවනි. ඉතාම සුළු නිරීක්ෂණ වුණත් පසුව ඉතාම වැදගත් වියහැකි බව, මං අත්දැකීමෙන් දන්න දෙයක්. හොඳයි. ඒක අපි දැනට අමතක කරමු. ඔහු ප්‍රදීපාගාරයට නොගිය බව ඔබ කොහොමද දන්නෙ?"

"මුහුදේ විනෝද චාරිකාවක සහ ප්‍රදීපාගාරය බලන්න තරුණයන් කණ්ඩායමක් බෝට්ටුවක ගිහින් තියෙනවා. ටොම් ජෙෆ්රි ඔවුන් අතේ මට ලියුමක් එවලා තිබුණා.

ඔහු කියා තිබුණා, එක පුද්ගලයෙක් සහිත රුවල් බෝට්ටුවක් ප්‍රදීපාගාරය දෙසට එන හැටි ඔහු දුරේක්ෂයෙන් දුටු බව. නමුත් මේ බෝට්ටුව ප්‍රදීපාගාරයට හැතැක්ම කාලක් විතර තිබියදී, විශාල මීදුම් වලාවක් ඇවිත්, බෝට්ටුව වැසී ගියාලු. මීදුම් වලාව ඈතට පාවෙලා යන්න, සෑහෙන වෙලාවක් ගතවුණාලු. ඊට පස්සෙ ජෙෆ්රිට ඒ පුද්ගලයා වත් ඔහු රැගත් බෝට්ටුව වත් දකින්න ලැබුණේ නැතිලු."

"හොඳයි" හෝම්ස් කීවේ කාරණා සියල්ල තමාට ඒත්තු ගියබව හඟවමිනි. "මීදුම සහිත මෙහෙම දවසක, ගැඹුරු මුහුදක් ඇති, නැව්

http://sherlockholmesinvestigations.blogspot.com

ගමනාගමනය කෙරෙන ප්‍රදේශයක, නාවික අනතුරක් ඇතිවීමේ පුදුමයක් නැහැ නේද? වෙරළාරක්ෂක සේවයේ පළපුරුදු කෙනෙක් හැටියට, මං හිතන්නේ ඔබ මීට කලින් මේ වගේ, මුහුදේ අතුරුදන් වීම් වලට මුහුණදීල ඇති. ඉතින් මෙතැන අභිරහසක් තියෙනවා කියල ඔබට හිතෙන්නෙ ඇයි? මේ වගේ දෙයකදී හොඳ විශේෂඥ අදහසක් දීමට මට වඩා ඔබට හැකිවේවි කපිතාන්."

"හෝම්ස් මහත්මයා" කපිතාන් කීය. "ඔබ කියන කාරණාව සම්පූර්ණ ඇත්ත. මං වෙරළාරක්ෂක සේවයේ අවුරුදු දහඅටක පළපුරුද්දක් තියෙන කෙනෙක්. මිනිස්සු යාත්‍රාවල ඕනෑ තරම් මුහුදේ අතුරුදන් වෙලා තියෙනවා. නමුත් මං ඔබට කලිනුත් කිව්ව වගේ, මේ මිනිහ හොඳ පළපුරුදු නාවිකයෙක්. සඳුදා දවසෙ මුහුදෙ කිසිම රළු බවක් තිබුණෙ නැහැ. ඔහු ගිය යාත්‍රාව ඉතා හොඳ එකක්. දැන් ඒකවෙලා දින තුනක් වෙනවා; .යාත්‍රාව ගැනවත් මිනිහ ගැනවත් කිසිම හෝඩුවාවක් නැහැ. ඔහු දියවැලකට අහුවෙලා උතුරුමුහුදට ගසාගෙන ගියා නම් මිස, මං හිතන්නේ නෑ........."

මේ අවස්ථාවේ අපේ සාකච්ඡාවට බාධාවක් ඇතිවිය. කපිතාන් හමුවීමට කිසිවෙක් පැමිණ ඇති බැව් තානායම් සේවකයා දැනුම් දුන්නේය. කැඳවීම අනුව එතැනට පැමිණි වෙරළාරක්ෂක හටයා සිරුවෙන් සිටගෙන ආචාර කොට මෙසේ කීය.

"ජේම්ස් බ්‍රවුන්ගේ මළසිරුර මිත්ගල්ස් වලට ගොඩගහල තිබිල මෙහේට ගෙනාවා. දැන් අපේ ජැටිය අසල වෙරළේ තිබෙනවා." යළිත් ආචාර කළ හටයා පිටව් ගියේය.

මඳවේලාවක් යනතුරු එතැන පැවතියේ දැඩි නිහඬතාවයකි. අපි කවුරුත් මුහුණට මුහුණ බැලුවෙමු. අනතුරුව නිහඬතාවය බිඳිමින් කපිතාන්ම කථාව ඇරඹීය. ,

"මට සමාවෙන්න හෝම්ස් මහත්මයා. මං හිතන්නේ මං ඔබට අනවශ්‍ය කරදරයක් කළා. මං ටිකක් කලබල වුණා වැඩියි. දැන් ඉතින් මේක, පොලිසිය හා හදිසිමරණ පරීක්ෂකවරයා කැඳවිය යුතු ප්‍රශ්නයක් වෙනවා." කපිතාන් අසුනෙන් නැගිට හෝම්ස්ට හිසනමා ආචාරකොට පිටවී යන්නට සූදානම් විය.

"ටිකක් ඔහොම ඉන්න කපිතාන් ඩෝසන්" හෝම්ස් කීවේ නිලධරයා නවතමිනි. "මේක කොහොමටවත් මං අනදැමිය යුතු ප්‍රශ්නයක් කියල මම හිතන්නේ නැහැ. බාගවෙලාවට මෙතැන


http://sherlockholmesinvestigations.blogspot.com

කිසිම අභිරහසකුත් නැතුව ඇති. ඒ වුණත් ඔබේ විරුද්ධත්වයක් නොමැති නම්, මං කැමැතියි වැඩිදුර ඉගෙනගැනීමේ අරමුණෙන් මළසිරුර පරීක්ෂාකර බලන්න."

"ඔබ පැමිණෙනවා නම් ඒක අපට විශාල ගෞරවයක් හෝම්ස් මහත්මයා."

මිනිත්තු පහක් ගතවෙද්දී, අපි වෙරළාරක්ෂක සේවයේ බෝට්ටු නවත්වා තබන, ජැටියට ළඟාවීමු. එහි ලෑලි කුටියක ලෑල්ලක් මත, මළසිරුර තබා තිබිණ. අප එහි යද්දී විට්ස්ටේබල් පොලීසියේ පොලිස් භටයෙක් ද එතැනට ළඟාවිය.

"කොටද මේ මිනිය හමුවෙලා තියෙන්නේ?" කපිතාන් ඇසීය.

"රැම්ස්ගේට් වලින් මසුන් මරන්න ගිය ට්‍රෝලර් යාත්‍රාවකට. මෙන්න ඉන්නවා එය රැගෙන ආ අය" කී භටයා ට්‍රෝලර් යාත්‍රාවේ නියමුවා කැඳවාගෙන ආවේය.

"අපි දුටුවා මේ මිනිය සවුත්ෂින්භල්ස් වල් වෙරළට ගොඩගහල තියෙනවා. ඉතින් අපි බෝට්ටුවක් යවල ඒක අරගෙන ආවා. ඔහු, අපි හඳුනන කෙනෙක් නෙමෙයි. ඒ නිසා, මං ඔහුගේ සාක්කුව පරීක්ෂා කරල බැලුවා. මෙන්න මේ ලියුම අහුට හමුවුණා." නියමුවා කපිතාන් අතට ලිපියක් දුන්නේය. එහි මෙසේ සඳහන්ව තිබිණි. "ජේම්ස් බ්‍රවුන්, වෙරළාරක්ෂක සේවය බාරේ, රෙකුල්වර්, කෙන්ට්."

"හෝම්ස් මහත්මයා" ඩෝසන් කීය. "ඔබේ අකමැත්තක් නොමැති නම් මිනිය පරීක්ෂාකරල බලල යමක් කිව්වොත්, අපට ලොකු උදව්වක්."

හෝම්ස් පොලිස් නිලධරයා දෙස බැලුවේ, ඒ සඳහා ඔහුගේ අනුමැතිය අවශ්‍ය බව හඟවමිනි. තමාගේ විරුද්ධත්වයක් නොමැති බැව් පොලිස් භටයා පැවසූ නිසා හෝම්ස් තම කටයුතු අරඹුවේය.

මියගිය පුද්ගලයා සිහින් සිරුරක් තිබූ, වයස පනස්පහක හැටක පමණ අයෙකු බැව් පෙනිණි. ඔහු හැඳසිටියේ නාවිකයන් අඳින තාලේ ඇඳුම්ය. ඔහු මියගොස් දින දෙකක් හෝ තුනක් ගතවී ඇති බැව් මට සිතාගත හැකිවිය. මුහුදේ දින දෙක තුනක් පාවෙමින් තිබෙන මළසිරුරු, මාළුන්ගේ හා කකුළුවන්ගේ ප්‍රහාරයට ලක්වී විරූපවීම, බොහෝවිට දක්නට ලැබෙන්නකි. එහෙත් මේ මළසිරුරට එවැනි හානි කිසිවක් වී නොතිබිණි. අස්ථි කිසිවක් කැඩීබිඳී නොතිබුණු අතර, උඩුබැලි අතට තිබියදී මළසිරුරේ එක් තුවාලයක් වත් දක්නට නොවීය.

http://sherlockholmesinvestigations.blogspot.com

මළසිරුර යටිඅතට හැරවූ පසු, හිසේ පිටුපස විශාල තුවාලයක් දැකිය හැකිවිය. හෝම්ස් ඒ තුවාලය සියුම් ලෙස පරීක්ෂා කර බැලීය. තම උත්තල කාචයේ උදව්වෙන් මඳ වේලාවක් ඒ දෙස බලාසිටි හෝම්ස්, සාක්කුවෙන් කුඩා දේ අල්ලන අඬුවක් (ට්වීසරයක්) අතට ගත්තේය. ඉන්පසු දිනපොතේ තිබූ ලියුම් කවරයකට මළසිරුරේ තුවාලයේ වූ සුදු පැහැති ද්‍රව්‍ය රැසක් එක්තු කරගත්තේය.

"හොඳයි දැන් අපි ඔහුගේ කලිසම් සාක්කු පරීක්ෂාකර බලමු.

ඔහුගේ සාක්කු ඔරලෝසුව තිබෙනවා. එය වටිනා රිදී ඔරලෝසුවක්. එහි වෙලාව 12.13ට නැවතිලා. දවල්ද රෑ ද? බොහොම වෙලාවට දවල් වෙන්න ඇති. ඒ මොකද අන්තිම වරට දුටු තැනැත්තාට ඔහු නොපෙනී ගියේ දවල් දොළහට කලින් නිසා. ඔහුගේ ජැකට්ටුවේ දකුණු සාක්කුවේ තිබෙනවා බ්‍රයර් ලීයෙන් කළ පයිප්පයක්, ඌරු මී සුඹින් සෑදූ දුම්කොළ දමන පසුම්බියක්; පෙට්ටියක හෝ කාඩ්පතක නොඇසිරූ ගිනිකූරු ගොඩක්."

"විශේෂ දෙයක් නැහැ. එහෙම නේද හෝම්ස් මහත්මයා?" මෙතෙක් වේලා නිහඬව සිටි කපිතාන් කීවේය. "ඕනෑම නාවිකයෙකුගේ සාක්කුවක් බැලුවොත් පයිප්පයක්, දුම්කොළ, ගිනිකූරු දකින්න ලැබේවි."

"ඔව්." හෝම්ස් එයට එකඟවිය.

මීළඟට නාවිකයාගේ පයිප්පය අතට ගත් හෝම්ස්, එය ඉතා සැලකිල්ලෙන් පරීක්ෂාකර බැලුවේය. එහි කඳ කාචයෙන් පරීක්ෂා කළ ඔහු, මළසිරුරේ මුඛය විවෘත කොට බැලීය. අනතුරුව පයිප්පයේ කෝවටද ඔහුගේ සැලකිල්ල යොමුවිය.

"දැන් අපි බලමු පයිප්පයේ තියෙන්නේ මොනවද කියලා. එළියෙ දුම්කොළ ටික නම් බාගෙට පිලිස්සිලා. බලමු ඇතුළෙ හරිය" හෝම්ස් තම පෑන පිහියෙන්, පයිප්පයේ කෝව හාරා එහි වූ සියල්ල කඩදාසියක් මතට හැලුවේය.

නොපිලිස්සුණු දුම්කොළ අතට ගෙන එහි ගඳ සුවඳ බැලූ මගේ මිත්‍රයා, මිනිත්තු කිහිපයක් කල්පනා කරමින් සිටියේය. එය කුමන දුම්කොළ වර්ගයක්දැයි සුවඳෙන් හඳුනාගැනීමට ඔහු උත්සාහ කළ බව මම තේරුම් ගතිමි. අනතුරුව කඩදාසිය මත වූ දුම්කොළ කැබැලි කාචයෙන් පරීක්ෂා කර බැලීය. දුම්කොළ වර්ග හා ඒවායේ අළු ගැන හෝම්ස් පොත් පිංචක් පවා ලියා ඇති බැව් මට මෙහිදී සිහිවිය.

 http://sherlockholmesinvestigations.blogspot.com

"අපි බලමු ඔහුගේ පයිප්පයට යොදන දුම්කොළ මොනවද කියල" ඔහු කීය.

මම වතුරෙන් පෙඟී තිබූ අසුම්බිය විවෘත කළෙමි. ඒ තුළ වූයේ කැබැලි වලට කැපූ දුම්කොළය.

"මං හිතන්නේ පදම් නොකළ ලාබ දුම්කොළ" මම කීවෙමි.

"හරියට හරි. පදම් නොකළ රළු දුම්කොළ" හෝම්ස් මා කී දේට එකඟ විය.

අනෙක් සාක්කුවල තිබී හමුවූ එකම වැදගත් දෙය නම්, තලය නැමිය හැකි කුඩා දුනු පිහියක් පමණි. එහි තලය එළියට ඇද හෝම්ස් එය ද පරීක්ෂා කර බැලුවේය. මුදල් ස්වල්පයක් ද සාක්කුවක තිබූ නමුත්, කිසිවෙක් මුදල් ගැනීමට උත්සාහ කළ බවකට සාක්ෂි නොතිබිණි.

හෝම්ස් මළසිරුරේ හීණ වටා වූ බඳපටිය ද සෝදිසියට ලක් කළේය.

"බැලූබැල්මට නම් පෙනෙන්නේ මුහුදේ ගිලීමෙන් සිදුවූ මරණයක් කියලයි" හෝම්ස් කීය. "නමුත් මේ තුවාලය සිදුවෙලා තියෙන්නේ කොහොමද? ඒක හරි වැදගත් කරුණක්. කොහොමවුණත් වෛද්‍යවරයා මළසිරුර කපාපරීක්ෂා කරලා කියනතුරු, මරණයට හේතුව අපට කියන්න බැහැ."

"හොඳයි හෝම්ස් මහත්මයා" කපිතාන් කීය. "පොලිස් ශල්‍ය වෛද්‍යවරයා ඇවිත් ඉන්නවා, මරණ පරීක්ෂණය පවත්වන්න. ඔබතුමාත් කැමැතිද මෙතැන ඉන්න."

"නැහැ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "අපි උදේට කෑම කාලත් නෙමෙයිනේ ආවෙ. මම දොස්තර වොට්සන් එක්ක ආපනු ශාලාවට යන්නම්. මරණ පරීක්ෂණය අවසන් වුණාට පස්සේ ඔබට හැකිනම් ඒ පැත්තේ ඇවිත් යන්න."

"සත්තකින්ම මං එනවා. ඔබ දෙදෙනාටම ස්තුතියි" පැවසූ කපිතාන් අපට ආචාර කළේය.

අපි ආපනු ශාලාව වෙත පැමිණියෙමු.

"අපි හුඟක් දවල්වුණා වොට්සන්. දැන් අපි උදේ කෑම ගන්නවා වෙනුවට, තරකද ටිකක් කල්තියා දවල් කෑම ම ගත්තොත්?" හෝම්ස් ඇසුවේ ඔහුගේ සාක්කු ඔරලෝසුව බලමිනි.

"ඒකෙත් වරදක් නෑ" මම ඊට එකඟවූයෙමි. "කොහොමටත් දැන් අපි මුහුණකට සෝදගෙන එනකොට එකොළහමාරවත් වේවි."

http://sherlockholmesinvestigations.blogspot.com

තානායමේ සේවකයා කැඳවූ මගේ මිත්‍රයා, අපට උදේ කෑම වෙනුවට, දහවල් කෑම කල්තබා ලබාදෙන මෙන් ඉල්ලා සිටියේය. එය පිළියෙළ වනතුරු, අපි තානායමේ විවෘත ආලින්දයට වී කතාබහක යෙදුණෙමු.

තානායම කඳුගැටයක මුදුනේ ගොඩනංවා තිබීම නිසා, එහි ආලින්දයට දිස්වූයේ අලංකාර දසුනකි. මේ අඩවියේ මුහුදු වෙරළ වක්‍රව පිහිටියේය. එහෙයින් වෙරළ තීරයේ සැතපුම් දෙකකට වැඩිදුරක්, ඉතා පැහැදිලිව දක්නට ලැබිණ. ඉංග්‍රීසි ඕඩය හරහා යාත්‍රාකොට, රැම්ස්ගේට් අසලින් ලන්ඩන් වරාය වෙත ඇදෙන නෞකා සහ ධීවරයන්ගේ රුවල් ඔරු, මහාසාගරයේ දිස්වූයේ, දක්ෂ චිත්‍රශිල්පියෙකුගේ සිතුවමක් විලසිනි. ඈත දියඹ දෙස මුහුණ යොමුකරගෙන, මගේ මිත්‍රයා කළේ සිතුවිලි සයුරක කිමිදීම බව මම තේරුම් ගතිමි. ඔහුගේ සිතුවිලි දාමය නොබිඳ, මම නිහඬව සිටියෙමි.

"ඔබ වැනි මිත්‍රයෙක්, උදව්කරුවෙක් මට ලැබීම මගේ වාසනාවක් වොට්සන්" ඔහු කීයේ මඳවේලාවකට පසු නිහැඬියාව බිඳ දමමිනි. "ඒ මොකද යම්කිසි තෝඩුවාවක් ඔස්සේ උපකල්පනයක් ගොඩනංවමින් මං ඉදිරියට යද්දි, ඒක නොබිඳා, නිහඬව සිටිමට ඔබ හොඳින් දන්නවා. මං මේ කල්පනා කළේ, අපට දකින්න ලැබුණු දේවල් ගැන. මෙතැන සැක කටයුතු දෙයක් මට මුලින්ම හිතට එන්නේ කොහෑනිත්ද අන්නබද? අර වෙරළාරක්ෂක නිලධරයා ලියූ වාර්තාවෙන්. කපිතාන් ඩෝසන් කියූ විදියට "මෝඩ" වාර්තාවෙන්."

"මොනවා ? ඒ කොහොමද?"

"ඔහු ලියල තිබුණු දේ ඔබට මතකද වොට්සන්? අන්තිම වරට දකින විට, මියගිය තැනැත්තා ඔහුගේ පයිප්පයට, තම පසුම්බියෙන් දුම්කොළ පුරවමින් සිටියේය..... අන්න එවැනි වගන්තියක් එහෙම නේද?"

"ඔව්?"

"අපි දුටුවා හොඳාකාරවම, ඔහුගේ පසුම්බියේ තිබුණේ රළු දුම්කොළ. නමුත් පයිප්පයේ තිබුණේ කුට්ටි දුම්කොළ නමින් හඳුන්වන වෙනත් දුම්කොළ වර්ගයක්. ඔහු ළඟ කුට්ටි දුම්කොළ තිබුණු බවට සලකුණක් නෑ."


http://sherlockholmesinvestigations.blogspot.com

මේ මොහොතේ අපේ සාකච්ඡාවට බාධාකරමින් කපිතන් ඩෝසන් අපේ තානායම වෙත පැමිණියේය.

"කරදර කරනවාට සමාවෙන්න හෝම්ස් මහත්මයා" ඔහු කීය. "පශ්චාත් මරණ පරීක්ෂණය අවසන්වුණේ දැන්. වෛද්‍යවරයා කියනවා මරණයට හේතුව, හිසට එල්ල වූ තදබල පහරක් නිසා, හිස්කබල කිඳීගොස්, මොළයට සිදුවුණු තුවාල හා, මොළය තුළට ලේ ගැලීම කියලා. මරණය සිදුවී ඇත්තේ දිය ගිලීමෙන් නොවෙයි කියලා ඔහුට සහතිකයි ලු."

"හැබෑට?" ෂර්ලොක් හෝම්ස් ඇසුවේ තම දෑත් සතුටෙන් එකිනෙක පිරිමදිමිනි. "මං මේ දොස්තර වොට්සන් එක්ක කථා කරකර හිටියෙත් ඒ ගැනයි. දැන් ඉතින් මොකක්ද ඔබේ තීරණය?" මගේ මිත්‍රයා ඇසුවේ කපිතන් ඩෝසන්ගෙනි.

"ඒ ප්‍රශ්නය මං ඔබෙන් අහන්නයි හිතුවේ හෝම්ස් මහත්මයා. මරණ පරීක්ෂණයෙන් ලැබුණු තීන්දුවෙන් හැමදෙයක්ම පැටලී සංකීර්ණ වෙනවා" කපිතන් පිළිතුරු දුන්නේය.

"කොහොමටවත් නෑ" හෝම්ස් කීවේය. "මං හිතන්නේ ඒකෙන් කාරණාව වඩාත් පැහැදිලි වෙනවා."

"හෝම්ස් මහත්මයා?" කපිතාන් කීවේ අසල වූ පුටුවේ හිඳගනිමිනි. "ඔබ කියන දේ නම් මට තේරුම්ගන්න අමාරුයි. කොහොමවුණත් මේ ගැන දැන් මං ගතයුතු පියවර මොකක්ද?"

"ඔබ හැමදෙනෙකුගෙන්ම සාක්ෂි විමසලා අවසන්ද?"

"ඔව් හෝම්ස් මහත්මයා."

"එතකොට බ්‍රවුන් බෝට්ටුව පැදගෙන එනවා දුටු, ප්‍රදීපාගාරයේ සේවකයා?" හෝම්ස් ඇසීය.

"ඒ මිනිහා අලුතෙන් මොනවා කියන්නද?" කපිතන් ඇසීය. "ඔහු දුටු දේවල් පිළිබඳ රපෝර්තුවක් එවා තිබුණා. මං හිතන්නේ නෑ ඔහුගෙන් ප්‍රශ්න කිරීමෙන් වැඩක් වේවි කියලා."

"මං හිතන්නේ අප නොදුටු, නොදන්න කරුණු ඔහු දන්නවා ඇති" හෝම්ස් කීය. "මුහුදේ ඒ වෙලාවේ පැවතුණු තත්ත්වය ගැන හොඳ විස්තරයක් කරන්න පුළුවන් ඔහුටයි. ඔහු තවමත් ප්‍රදීපාගාරයේද? නැත්නම් නිවාඩුවට ගොඩබිමට ඇවිත්ද?"

"ඔහු තවමත් එහේ" ඩෝසන් කීය. "උවමනා නම් මට පුළුවනි ඔහුව යාත්‍රාවක් යවලා මෙහාට ගෙන්වන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"නෑ නෑ. මං කැමැතියි එතැනටම ගිහිං ඔහු එක්ක කතාබහ කරන්න" හෝම්ස් කීවේ අසුමනාන් නැඟීසිටිමිනි. "දැන් වෙලාව එකොළහයි හතළිහයි. අවල් කෑම ඉක්මණින් අවසන් කරලා පිටත් වුණොත්, කීය වෙද්දි එතැනට යනකොට?"

"ප්‍රශ්නය තියෙන්නේ හෝම්ස් මහත්මයා" කපිතාන් කීවේ අහස දෙස බලමිනි. "අද සුළං හැමීම වේගවත්, මධ්‍යාහ්නයට ළංවුණත් සුළඟෙ තියෙන්නේ සිසිල් බවක්. මුහුද රළු නොවුණොත්, දවල් දෙකට පිටත්වෙමු."

බොහෝ කාලයකින් මුහුදු ගමනක යෙදෙන්නට මට අවස්ථාවක් ලැබී නොතිබිණි. ඊට සහභාගිවීමට මම ආශාවෙන් සිටියෙමි. එහෙත් බලාපොරොත්තු නොවූ අයුරින් අපේ ඒ මුහුදු ගමන අවලංගු කිරීමට සිදුවිය. පැයක් ගතවීමට පෙර අහස කළුවලාකුළු වලින් වැසිණි. අඳුරුවීමත් සමගම ඈත අහසේ ගොරවන හඬ ද අපට අසන්නට ලැබිණි. මුහුදු රළ වඩාත් වේගවත් වෙද්දී විදුලි කොටමින්, අකුණු ගසමින් වැසි කඩා හැලෙන්නට පටන්ගත්තේය.

"අපේ ගමන හෙටට කල්දමන්න වෙනවා හෝම්ස් මහත්මයා" කපිතාන් කීය. "මුහුද බොහොම ප්‍රචණ්ඩ වේගනයි එන්නෙ. මේක මුහුදු ගමනක යෙදෙන්න සුදුසු කාලගුණයක් නෙමෙයි. හොඳින් පායලා, මුහුද සන්සුන් වුණොත් අපි හෙට උදේන්ම පිටත්වෙමු."

පසුදා උදයේ ද අහසේ පැවැතියේ අඳුරු බවකි. එදින කාලගුණයත් පෙර දිනයේ මෙන්ම වියහැකි බවට හෝම්ස් අනාවැකි පළකළේය.

"මං හිතන්නෙ නෑ වොට්සන් අදත්, අර මිනිහෙක් ගෙන් කරුණු විමසන්න ප්‍රදීපාගාරය පැත්තෙ යන්න හැකිවේවි කියල. ඒකට බලාගෙන ඉඳීම කාලය නාස්ති කිරීමක්" හෝම්ස් කීය. "ඒක නෙමෙයි මිත්‍රයා. ඇයි අපි අපට ලැබුණු මේ දුර්ලභ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නෙ නැත්තෙ?"

"ඔබ කියන්නෙ මොකක් ගැනද? මොන අවස්ථාවෙන්ද?" හෝම්ස් කියූ දෙය තේරුම් ගැනීමට අපහසු වූ මම ඇසීමි.

"මේකයි වොට්සන්" ඔහු කීවේ ආලින්දයේ වූ හාන්සි පුටුවේ අසුන් ගනිමිනි. "අපි ඇවිත් ඉන්නේ මේ වෙරළබඩ නගරයේ සති 3ක නිවාඩුවක් ගතකරන්න. ලන්ඩන් නගරයේ පාතාල ලෝකයේ මැරවරයින් ගැන නොහිතා, සමුද්‍ර ජීවීන් ගැන හිතන්න මීට වඩා

 http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

හොඳ අවස්ථාවක් කොයින්ද? මං අපරාධ පරීක්ෂණයට අදාල නැති, විවිධ ක්ෂෙත්‍ර ගැන අධ්‍යයනය කරල තියෙනවා. නමුත් මත්ස්‍යයින් නොවන සමුද්‍ර ජීවීන් ගැන අධ්‍යයනයක් කරන්න මට අවස්ථාවක් ලැබිල නෑ; විශේෂයෙන්ම විවිධ බෙල්ලන් වර්ග, මුහුදු පණුවන් ගැන, සත්ත්ව විද්‍යාවට අපි ඉගෙනගත් මොලස්කාවන්, සිලන්ටරේටාවන් ගැන. තාපස කකුළුවා හා මුහුදු ඇනිමෝනියාගේ සහජීවනය ආදී දේවල්, මොන තරම් සිත් ඇදගන්නා කරුණුද? ඔබ මොකද කියන්නේ?"

"ඉතාම විශිෂ්ට අදහසක් හෝම්ස්" මම කීවෙමි. "මං බොහොම කැමතියි ඔබ එවැනි දෙයක් ගැන සිත යොමුකරනවා නම්. අපරාධ පරීක්ෂණයේ යෙදීමෙන් ඔබේ මනසට ඇතිවී තිබෙන ආතතිය, ස්නායු වලට ඇතිවූ කම්පනය, හැම එකක්ම, මෙහෙම වැඩක යෙදුණොත් මගහැරී යාවි. ඔබ කොතැනින්ද පටන් ගන්න හිතුවෙ?"

"මේ ජීවීන් ගැන මූලික දැනුමක් වත් නොමැතිව, ගැඹුරු අධ්‍යයනයක යෙදෙන්න හදන එක මුලාවක්" මගේ මිත්‍රයා කීය. "ඒ හින්දා මං හිතුවේ, ඒ සඳහා අවශ්‍ය පොත් කිහිපයක් සපයාගෙන කියවලා, මූලික දැනුමක් ලබාගන්නයි."

"අදහස හොඳයි. ඒ වුණත් මේ හදිසියෙ කොහෙන්ද අවශ්‍ය පොතපත සපයාගන්නෙ?"

"මං කුලීරියක් ගෙන්වාගෙන ඉක්මනට කෙන්ට් විශ්ව විද්‍යාලයේ පුස්තකාලයට ගිහින් එන්නම්" හෝම්ස් කීවේ අසුනෙන් නැගිටිමිනි. "වැස්ස ගැන හිතහිතා කාලය කාදැමීම අපරාධයක්. මගේ හිතවත් ආචාර්ය කෙනත් හිගින්ස් අල්ලා ගත්තොත් මගේ වැඩේ පහසුවේවි."

හෝම්ස් සමග පාසලේ එක පන්තියේ ඉගෙනුම ලබා තිබූ කෙනත් හිගින්ස්, කෙන්ට් විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් විය. මගේ මිත්‍රයා බේකර් වීථියේ අපේ නිවහනේ පැවැත්වූ, රසායන විද්‍යා පරීක්ෂණ වලින් ලැබූ ප්‍රතිඵල ගැන, විටෙක කෙනත් හිගින්ස් සමග ලිපි හුවමාරු කරගත්තේය.

කුලීරියක් ගෙන්වාගෙන වැස්සේම පිටත්ව ගිය හෝම්ස් ආපසු එද්දී සවස තුන පමණ වී තිබිණි. ඒ වන විටත් වර්ෂාවේ අඩුවක් දකින්නට නොලැබිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මගේ හොඳ වෙලාවට හිගින්ස් සරසවි බිමේදිම හමුවෙන්න හැකිවුණා" හෝම්ස් කීවේ විශාල පොත් තුනක් මේසය මත තබමිනි. "ඔහු මාව ජීව විද්‍යා අංශයට කැඳවාගෙන ගිහින්, සමුද්‍රජීව විද්‍යාව භාර කථිකාචාර්යවරියකට මාව අඳුන්වා දුන්නා. මෙන්න ප්‍රතිඵලේ."

එදා මුළු සවස්වරුවත්, රාත්‍රියත්, හෝම්ස් ගත කළේ, ඔහු රැගෙන ආ පොත්පත් වල කරුණු හැදෑරීමටයි. විටෙක පොත් වැසූ ඔහු හිස් බැල්මකින් ඈත අහස දෙස බලාගෙන කල්පනා කළේය.

පසුදා උදෑසන කෑම මේසයට පැමිණි මගේ මිත්‍රයාගේ දෙනෙතේ දීප්තිමත් බවක් මම දුටුවෙමි. මුහුදු බෙල්ලන් හා පණුවන් ගැන ඔහු බලාපොරොත්තු වූ ආකාරයේ දැනුමක් ලැබී ඇතැයි මට සිතිණි.

දහවල් දහය පමණ වෙද්දී කපිතාන් ඩෝසන් අප හමුවීමට පැමිණියේය.

"දවස් දෙකකට පස්සෙ අද කාලගුණය හොඳ පැත්තට හැරුණා" ඔහු කීය. "හෝම්ස් මහත්මයා, ප්‍රදීපාගාරයට මුහුදුචාරිකාවක යෙදෙන්න ඔබ තවමත් කැමැති නම් අද යන්න පුළුවන්."

"මගේ ඒ කැමැත්තේ කිසිම වෙනසක් නෑ කපිතන්" හෝම්ස් කීය. "අපට සූදානම් වෙන්න මිනිත්තු දහයක් හොඳටම ප්‍රමාණවත්."

අප ප්‍රදීපාගාරය වෙත ගෙනයාම සඳහා, වෙරළාරක්ෂක සේවය සතු හොඳම මුහුදු යාත්‍රාව සූදානම් කරන ලදී. බොහෝ කාලයකට පසු මුහුදේ මෙවැනි ගමනක යෙදීමට ලැබුණු නිසා, මගේ සිතේ ඇතිවූයේ සතුටකි. එහෙත් ගමනේ සුන්දරත්වය විස්තර කිරීමට මෙය අවස්ථාවක් නොවේ. විලියම් ක්ලාක් රසල්ගේ මුහුදු කථාවලට මම කුඩා කාලයේ සිටම අතිශයින් ප්‍රියකරමි. එවැනි කථාවල සඳහන් වෙන චමත්කාරය මේ ගමනේදී මට යළි යළිත් මැවී පෙනිණ.

පැය තුනක පමණ ගමනින් පසු, අපි අපේ ගමනාන්තයට ළංවෙමින් සිටියෙමු. රතුපැහැය ආලේප කොට තිබූ රෙකුල්වර් ප්‍රදීපාගාරය, නිල් පැහැති සාගරය මැදින් මතුවෙන්නට පටන් ගත්තේය. මිනිසුන් දෙදෙනෙකු එහි සඳළුතලයක් වැනි වටකුරු වේදිකාව මතට වී, අපේ යාත්‍රාව දෙස දුරේක්ෂයකින් බැලූ සැටි, අපේ දුරේක්ෂයට දිස්විය.

 http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only Not For Print

"මහත්මයා" අපආ යාත්‍රාවේ නියමුවා කීය. "ඔබ මෙතැන හුගක් වෙලා රැඳෙනවාද? ඊසාන දිග සීමාවේ පරණ බෝයාව ඉවත්කරලා අලුත් එකක් සවිකරන කටයුත්ත තිබෙනවා. අපි ඒකට ගිහින් ආවොත් ප්‍රමාද වැඩිවේවිද?"

"මෙතැන කොයිතරම් වේලා රැඳෙන්න වේවිද කියලා මට දැන්ම කියන්න බැහැ" කපිතන් කීවේ ගොඩබැසීමට සූදානම් වෙමිනි. "ඒ වුණත් බෝයාවේ වැඩේ ඉවර කරලා එන්න. ඒකත් අත්‍යවශ්‍ය කටයුත්තක් නේ. කොයි එකවුණත් ප්‍රමාද වෙන්න එපා."

බෝට්ටුවක නංවා අප ප්‍රදීපාගාරයේ පාමුල වෙත ගෙනයනු ලැබිණ. ප්‍රදීපාගාරය කොතරම් දැවැන්ත නිර්මාණයක්ද යන්න තේරුම් ගත හැකිවූයේ එය අසලටම ගියපසුය. මුහුදේ ගිල්වා තිබූ කොන්ක්‍රීට් ආධාරක කණුමත, ශෝධ කොන්ක්‍රීට් අත්තිවාරමක් විය. වඩදිය බැසගොස් වතුර මට්ටම පහළ යාම නිසා, එම ආධාරකයේ අඩි පහළොවක් පමණ එළියට විවෘත වී තිබිණ. දුර්වර්ණ වූ එම පෘෂ්ඨය, මුහුදු බෙල්ලන් හා මුහුදු පැළෑටි වලින් වැසී තිබිණි. ඉණිමඟ මත බැඳී තිබූ පාසි වර්ග නිසා, එහි ලිස්සනසුලු බවක් ද විය. තරමක් අපහසු වුවත්, අපි පරෙස්සමෙන් ඉණිමඟ දිගේ ඉහළට නැග, ප්‍රදීපාගාරය මුදුනේ වූ වේදිකාව මතට ගොඩවුණෙමු.

"මමත් මේ මහත්වරුත් ආවේ අතුරුදන්වුණු ජේම්ස් බ්‍රවුන් ගැන හොයල බලන්න. ටොම් ජෙෆ්‍රි කියන්නේ ඔහේලගෙන් කොයි එක්කෙනාද?" කපිතන් ඇසුවේ ප්‍රදීපාගාරයේ සිටි සේවකයන් දෙදෙනාගෙන්ය.

"මහත්මයා. මම තමයි ජෙෆ්‍රි" කියමින් උස ශක්තිමත් පෙනුම තිබූ තැනැත්තා ඉදිරිපත්විය. ඔහුගේ මූහුණ අව්වෙන් පිලිස්සී දුඹුරු පැහැ ගැන්වී තිබිණි.

"හැරී බානට් කකුල කඩාගත්තා. ඒ ගමන ඔහේගේ මේ අතට මොකක්ද කරගත්තේ?" කපිතාන් ඇසුවේ රෙදිපටියකින් වෙළා තිබූ ජෙෆ්‍රිගේ ඇඟිලි කිහිපය පෙන්වමිනි.

"අර්තාපල් ගෙඩියක් පොතු අරිද්දී, පිහියට කැපුණා මහත්මයා. ඒ තරම් ලොකු තුවාලයක් නෙමෙයි."

"හොඳයි ජෙෆ්‍රි" කපිතාන් කීය. "බ්‍රවුන්ගේ මිනිය අපට හමුවුණා. දැන් මරණ පරීක්ෂණය සඳහා සාක්ෂි උවමනා කරල තියෙනවා. ඒකට සාක්ෂිකාරයෙක් විදියට බාගවෙලාවට තමුසෙවත් කැඳවන්න පුළුවනි. ඒ හින්දා දන්න ඔක්කොම අපට කියන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"මහත්මයා. මට කියන්න තියෙන්නේ මං කලිනුත් ඔබතුමන්ට දන්වා එව්ව කාරණාම තමයි. ඒ වුණත් මං ආයෙමත් කියන්නම්."

කපිතාන් කටඋත්තරය ලියාගැනීමට සූදානම් වෙද්දී ඒ අසල සිටගත් ජෙෆ්‍රි කීය.

"මගේ උදව්වට කවුරු හරි එවාවි කියල, උදේ ඉඳන්ම මං ගොඩබිම පැත්ත බල බලයි හිටියේ. ඉරමුදුන් වෙලාව ළං වෙද්දි, එක මිනිහෙක් විතරක් ඉඳපු බෝට්ටුවක් මේ පැත්තට එනහැටි, මං දුටුවා. ඊට පස්සේ තමයි උතුරෙ ඉඳලා දකුණට මහා මීදුම් වලාකුළක් හමන්න පටන්ගත්තේ. ඒක ඉවරවෙලා බලනකොට, ඒ බෝට්ටුව පෙනෙන්න තිබුණෙ නෑ. ඔහුට ප්‍රදීපාගාරය තිබෙන දිශාව තේරුම් ගන්න, මං මීදුම් නළාව හඬවන්න පටන්ගත්තා. ඒ අතරෙම හතරවටේට දුරේක්ෂය අල්ලා පරික්ෂාවෙන් බැලුවා. ඒ වුණත් බෝට්ටුව මෙහේ ආවෙ නෑ. කිසිම දෙයක් දකින්න ලැබුණෙත් නෑ. මං දන්නෙ එච්චරයි. මට හිතෙන්නෙ වඩදිය බැහැල යද්දි, ආපහු ගලන වතුර පාරත් එක්ක, ඔහු වේගයෙන් දියඹට ඇදිල යන්න ඇති. මීදුම නිසා ඔහුට ප්‍රදීපාගාරය නොපෙනී යන්න ඇති."

"ඔබ ඒ බෝට්ටුව අන්තිමට දැක්කේ වෙලාව කීයට විතරද?" හෝම්ස් ඇසීය.

"එකොළහමාරට විතර."

"ඔබ දුටුවෙ ඔහු කොයි වගේ කෙනෙක් විධියටද?"

"මට හරියටම කියන්න බැහැ මහත්මයා. ඔහු අවල් අදිමින් හිටියේ, මට පිටුපස්ස හරවලා."

"ඔහු ළඟ ඇඳුම් බෑගයක් හෝ පෙට්ටියක් වැනි යමක් තිබුණාද?"

"ඔව් මහත්මයා. ඔහු ළඟ පෙට්ටියක් තිබුණා."

"මොන විධියේ පෙට්ටියක්ද?"

"කොළ පාට තීන්ත ගෑව කුඩා එකක්."

"ඒක ලනුවකින් බැඳලද තිබුණෙ?"

"ඔව් මහත්මයා."

"ලනුපොට කීයකින්ද?"

"පොට දෙකකින්."

"ඔබ මේවා දකිද්දී බෝට්ටුව තියෙන්න ඇත්තෙ මෙතැන ඉඳන් කොයිතරම් දුරකින්ද?"

"හැතැක්ම භාගයක් විතර දුර."

"ඒ වුණත් මේ විස්තර ඔබට පැහැදිලිවම පෙනුණා?"


http://sherlockholmesinvestigations.blogspot.com

මේ ප්‍රශ්නයට ටොම් ජෙප්‍රිගේ මුහුණ රතුවිය. ඔහු හෝම්ස් වෙත හෙළුවේ සැකය මුසු බැල්මකි. "මහත්මයා. මං ඒ බෝට්ටුව දිහා බලාගෙන හිටියේ දුරේක්ෂයෙන්."

සාක්ෂි විභාගය අවසන් විය. තම රපෝර්තු පොතේ සියල්ල ලියා අවසන් කළ කපිතාන්, එයට ජෙප්‍රිගේ අත්සන ලබාගත්තේය. එම කටයුතු අවසන් වූ බැවින් අපේ පුටු, විශාල කවුළුව සමීපයට ගෙන අපි මහා සාගරය දෙස බලාසිටියෙමු. ලන්ඩන් වරාය දෙසටත්, එතැනින් ඉවතටත් ඇදියන නෞකා හත අටක්ම ක්ෂිතිජයට තුදුරෙන් දකගන්නට ලැබිණ. එහෙත් මගේ මිත්‍රයාගේ අවධානය ඇද ගැනීමට සමත්වූයේ, ඒ කිසිවක් නොවන බව මම දුටුවෙමි. ජනේලය අසල බිත්තියේ සවිකර තිබූ පයිප්ප රාක්කයක් වෙත හෝම්ස් තම දෙනෙත යොමුකරගෙන සිටියේය. ඉවත දමන ලෑලි කැබලි වලින්, රළු ආකාරයට තනා තිබූ මේ පයිප්ප රාක්කයේ පයිප්ප පහක් විය.

"මෙහේ රාජකාරි කරන ඔබ හැමදෙනාම බොහොම තදින් පයිප්පයට ඇබ්බැහි වුණු අය වගෙයි. එහෙම නේද?" හෝම්ස් ඇසුවේ ස්මිත් නම් අනෙක් සේවකයාගෙනි.

"ඒක හැබෑව මහත්මයා" ඔහු කීය. "මෙහේ ඉතින් වෙන කරන්න දෙයක් නෑ. හරි පාළුයි. දුම්කොළත් අපට ලැබෙන්නෙ නොමිලෙම වගේ. පිටරටවල නැව් මෙතැනින් යද්දි අපට බොහොම ලාබෙට දුම්කොළ දෙනවා. සමහර වෙලාවට නොමිලෙම. ඕලන්ද කාරයො හරි කරුණාවන්තයි. හොඳ අනර්ඝ දුම්කොළ කුට්ටියක් දෙකක් දෙන්න අමතක කරන්නෙ නෑ."

"එහෙනම් ඔබ ගොඩබිමේදි ඉඩලෙන්දන් ගෙන් දුම්කොළ මිලට ගන්නෙ නැතුව ඇති?" හෝම්ස් ඇසීය. "පෑ ! නොකළ රළු දුම්කොළ ඔබ පාවිච්චි කරල බලල නැද්ද?"

"නැහැ මහත්මයා" ස්මිත් කීය. "ඒවා ගන්න ගියත් ලොකු මුදලක් ගෙවන්න වෙනවා. අනෙක මෙහේ තෙතමනය නිසා වැඩි කාලයක් තියාගන්න බෑ. පුස්කනවා."

"ඔබේ පයිප්ප රාක්කය බොහොම අලංකාරයි" හෝම්ස් කීවේ එයට ළංවී පයිප්ප එකින් එක අතට ගෙන බලමිනි. "කවුද මේක හැදුවෙ?"

"මං විවේක වෙලාවට කළ වැඩක් මහත්මයා" ස්මිත් පිළිතුරු දුන්නේ සතුටෙනි. "කවුරු කවුරුත් පයිප්ප බොනවා, වගේම එහේ

http://sherlockholmesinvestigations.blogspot.com

මෙහේ දමනවා. මේක කිසි පිළිවෙළක් නෑ. මං මේ රාක්කය හදලා බිත්තියේ සවිකළා. කාටත් නියමකළා බොන්නෙ නැත්නං, පයිප්පය රාක්කෙන් තියන්න. දැන් නිකං නැවක කැබින් කාමරයක් වගේ පිළිවෙළයි නේද?"

"කවුරු හරි පයිප්පය උරන එක අත්හැරදමල වගෙයි" හෝම්ස් කීවේ රාක්කයේ කෙළවරේ වූ, කොළ පැහැති පුස් බැඳෙන්නට පටන්ගෙන තිබූ පයිප්පය අතට ගනිමිනි.

"ඔව්" ස්මිත් කීවේය. "ඒක පාසන්ස්ගේ පයිප්පය. එයාට ඒක අමතක වෙලා ගිහින්. ඔහු මාසෙකට කලින් මෙහේ රැකියාවෙන් අස්වෙලා ගියා. මෙහේ තියෙන තෙතමනයට ඉක්මණට පුස් බැඳෙනවා."

"පයිප්පයක් පාවිච්චි නොකර තිබුණොත් මේ විදියට පුස් බැඳෙන්න කොයිතරම් කාලයක් ගන්නවද?" හෝම්ස් ඇසුවේ අතට ගත් පයිප්පය රාක්කයෙන් ආපසු තබමිනි.

"ඒක හරියටම කියන්න බැහැ මහත්මයා" ස්මිත් පිළිතුරු දුන්නේය. "රස්නෙ කාලෙට සතියෙන් පුස් බැඳෙනවා. මේ තියෙන්නේ බානට්ගේ පයිප්පෙ. ඔහු ඒක දාලා ගිහින්- අර කකුල කැඩිලා ගිය එක්කෙනා. මෙහෙන් යන්නත් දවසක දෙකක ඉඳල ඔහුට පයිප්පය අතට ගන්න ලැබුණෙ නෑ. බලන්න දැන්ම ම තැනින් තැන කොළපාටට තිත් වැටෙන්න පටන් අරගෙන."

"මේ අනෙක් පයිප්ප ඔක්කොම ඔබේ ඒවද?"

"නැහැ මහත්මයා. මෙන්න මේක මගේ. අර තියෙන එක ජෙෆ්රිගේ. මේ මැද තියෙන එකත් එයාගෙ වෙන්න ඇති මං හිතන්නේ. මං හරියටම දන්නෙ නෑ" ස්මිත් පිළිතුරු දුන්නේය.

"ෂර්ලොක් හෝම්ස් මහත්තයා" කපිතාන් ඩෝසන් කීවේ මෙතෙක් කළ සාකච්ඡාවට හොඳින් සවන්දීමෙන් අනතුරුවයි. "ඔබ නම් පයිප්ප හා දුම්කොළ ගැන විශේෂඥයෙක් වගෙයි. ඔබ ඒවා ගැන ගැඹුරු අධ්‍යයනයක යෙදෙනවා එත්ද?"

"මනුෂ්‍ය වර්ගයා ගැන ගැඹුරු අධ්‍යයනයක යෙදෙන්න නම්, පළමුවෙන්ම පටන්ගන්න ඕන, ඔහු එදිනෙදා භාවිතකරන උපකරණ ගැන අධ්‍යයනයක් කිරීමෙන්" හෝම්ස් පිළිතුරු දුන්නේ ස්මිත් එතැනින් ඉවත්ව ගිය පසුයි.

"කෙනෙකුගේ දුම් පයිප්පය කියන්නේ, ඔහුට බොහොම සමීප පෞද්ගලික උපකරණයක්. මේක දුම්බොන කෙනෙකුට එක


http://sherlockholmesinvestigations.blogspot.com

වෙලාවකට මිත්‍රයෙක් වගෙයි. ඒක භාවිත කරන පුද්ගලයාගේ හැටියට, එක් එක් පයිප්පය වෙනස් ස්වභාවයකට පත්වෙනවා. ඔහුගේ කායික ස්වභාවය පමණක් නොවෙයි, හැසිරීම් රටාවේ පෞද්ගලික ගතිලක්ෂණ පවා, එවැනි පයිප්පයකින් හඳුනාගන්න පුළුවනි.

මේ බලන්න. මේ තියෙන්නේ ජෙෆ්‍රිගේ පයිප්පය. ඒකෙ කටේ තබාගන්නා කොටස තදින්ම හපලා. ඒ බව ඔබට පැහැදිලිවම පෙනෙනවා ඇති. දත්පාරවල් කොයිතරම් යටට වැදිලාද කියන එක බැලුබැල්මටම පෙනෙනවා. කෝව, මුවහත් පිහිතලයකින් නිතර නිතර සෑරීම නිසා, ඒක ගැඹුරු වෙලා, බිත්ති තුනී වෙලා. දැන් කෝව බිත්තර කටුවක් වගෙයි. ඊළඟට කඳ කොටසේ තියෙන ලකුණු බලන්න. බිම වැටීම නිසා තැලිලා, පතුරු ගැළවිලා. මේ හැම දෙයකින්ම පෙන්වන්නේ ඔහුගේ සිරුරේ ඇති දැඩි ශක්තිය වගේම, රළු ගතිපැවතුම්. දුම්බොන අතරේ ඔහු පයිප්පය බොහොම තදින් හපනවා. පිරිසුදු කිරීමේදී අනුකම්පා විරහිතව කෝව හාරනවා. අළු ටික හලන්න උවමනා වුණාම ඕනෙවටත් වඩා හයියෙන් පයිප්පය මේසය මත ගහනවා."

"ඔව්. ඔහු බොහොම රළු ගතිපැවතුම් ඇති කෙනෙක් බව මට අහන්න ලැබුණා" කපිතාන් ඊට එකඟ විය.

"ඊළඟට මේක බලන්න" හෝම්ස් කීවේ තවත් පයිප්පයක් අතට ගනිමිනි. "මේක ස්මිත්ගේ පයිප්පෙ. කෝව වටේටම හුගක් දැවිලා ගිහින්. ඒක දකින්න ලැබෙන්නෙ පයිප්පය දල්වා ගත්තාම ඒක උරන්නෙ නැතිව හුගක් කථාකරකර ඉන්න අයගෙ. නිතර නිවෙනවා. ආයෙ දල්වනවා. නමුත් මගේ හිත වඩාත්ම ඇදී ගියේ මේ මැදින් තිබෙන පයිප්පයට."

"ස්මිත් කිව්වෙ ඒකත් ජෙෆ්රිගෙ කියල නේද?"

"ජෙෆ්‍රිගෙ වෙන්න ඇති කිව්වා." හෝම්ස් කීය. "නමුත් ඔහුට වැරැදිලා, කියලයි මට නම් හිතෙන්නේ. මේක ජෙෆ්‍රිගේ එකට වඩා හාත්පසින්ම වෙනස් පයිප්පයක්. මේක සෑහෙන්න පරණ එකක්. නමුත් කටේ තබාගන්න කොටසේ දත් වලින් වුණු කිසිම සලකුණක් නෑ. මේ රාක්කයේ තිබෙන පයිප්ප වලින්, හැපූ බවක් නොපෙන්වන එකම පයිප්පය මේකයි. බොහොම පරෙස්සමෙන් පාවිච්චි කරලා තියෙන්නේ. නමුත් කඳ වටා ඇති රිදී පටිය කළුම

http://sherlockholmesinvestigations.blogspot.com

කළුපාට බව ඔබට පෙනෙනවා ඇති. ජෙෆ්රිගේ පයිප්පයේ රිදී පටිය දීප්තිමත්ව බැබලෙනවා."

"මේකෙ රිදී පටියක් තිබුණු බව මට නම් පෙනුණෙ වත් නැහැ" මම කීවෙමි. "මේක මේ හැටි කළුපාට වුණේ කොහොමද?"

පයිප්පය අතට ගත් හෝම්ස් එහි රිදී පටියේ මතුපිට සූරා පෙන්විය. "මේක කළුපාට වුණේ සිල්වර් සල්ෆයිඩ් නම් රසායනික සංයෝගය සෑදීම නිසා. ඔහු සාක්කුවේ තබාගත් යමක තිබූ ගෙන්දගම් වලින්, රිදී පටිය මත සිල්වර් සල්ෆයිඩ් පටලයක් සෑදෙන්න ඇති."

"වෙන මොනවද ඔබට මේක ගැන කියන්න පුළුවන්?" කපිතාන් ඇසීය.

තම පෑන පිහිය අතට ගත් හෝම්ස්, පයිප්පයේ කෝව හාරා එහි තිබූ දුම්කොළ ඉවතට හැලුවේය.

"රළු දුම්කොළ නේද? හරි පුදුමයි" මම කීවෙමි.

"පුදුම වෙන්න දෙයක් නෑ. මං ඒ බව දැනහිටියා."

"ඔබ දැනහිටියා?"

"ඔව්" හෝම්ස් කීය. "මේ තමයි මියගිය ජේම්ස් බ්‍රවුන්ගේ පයිප්පය."

"මොනවා? ඔබ කොහොමද එහෙම තීරණයකට ආවෙ?" කපිතාන් ඇසුවේ මවිතයෙනි.

"ඔන්න මං කාරණා එකින් එක ඉදිරිපත් කරන්නම්" මගේ මිත්‍රයා කීවේය. "බලන්න නිවැරදිද කියලා. මේ පයිප්පයේ පුස් බැඳිලා නැහැ. ඒ නිසා මේක මෙතැන තිබ්බ ඇත්තේ බොහොම ටික කාලයයි. ඒ නිසා මේක ජෙෆ්රිගේ, ස්මිත්ගේ, බානට්ගේ හෝ තව කාගෙහරි. බානට්, ජෙෆ්රි හා ස්මිත් තුන්දෙනාගේම පයිප්පවල තදින් වැදුණු දත් පාරවල් ඇති බැව් පැහැදිලියි. ඔබට මතක ඇති මම බ්‍රවුන්ගේ මළසිරුරේ කට ඇරලා පරීක්ෂා කර බැලූ හැටි. බ්‍රවුන්ගේ කටේ දත් තිබුණෙ නෑ. ඒකෙන් අපට සැහෙන්න ඉදිරියට එන්න පුළුවන්.

ඊළඟට කෝවෙ තිබුණු දුම්කොළ ගැන බලන්න. මේ ප්‍රදීපාගාරයේ සේවය කරල පළපුරුදු අර තුන්දෙනාම, මේ ප්‍රදේශයේ ගොඩබිමේදී ලාබෙට විකුණන්න තිබෙන රළු දුම්කොළ පාවිච්චි කරන්නෙ නෑ. ඔවුනට නොමිලේ ලැබෙනවා, ඉතා හොඳ

 http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only.. Not For Print.

වර්ගයේ පදම් කළ කුට්ටි දුම්කොළ. නමුත් බ්‍රවුන්ගේ පසුම්බියේ තිබුණා රළු දුම්කොළ.

ඔබට මතක ඇති බ්‍රවුන්ගේ සාක්කුවක තිබී අපට හමුවුණා පයිප්පයක්. එහි කටින් අල්ලන කොටස පරීක්ෂා කරල බැලුව නම්, මං කියන කරුණ පැහැදිලිවම තේරුම් ගන්න පුළුවන්. ඒකෙ තියෙනවා කිසිවෙකු දත්වලින් පයිප්පය හැපූ ලකුණු. ඒක දෙකට කැඩෙන තරමට දත්වලින් හපලා. සෑහෙන්න ශක්තිමත් දත් දෙපෙළක් ඇති කෙනෙකුට මිසක්, ඒ හපන්කම කරන්න බැහැ. නමුත් බ්‍රවුන්ගේ කටේ එක දතක්වත් නැහැ. එම පයිප්පයේ තිබුණෙත් හොඳ වර්ගයේ දුම්කොළ. ඒවා බ්‍රවුන් ළඟ තිබුණු බවට කිසිම සාක්ෂියක් නැහැ. ඒකට අදාළ තවත් කාරණාවක් මං කියන්නම්."

"නමුත් මෙහෙම එකක් වෙන්න බැරිද?" මම ඇසීමි. "ඔහු ළඟ කුට්ටි දුම්කොළ ටිකක් තිබිලා, ඒක සම්පූර්ණයෙන් කපලා පයිප්පයට දමා බිව්වද අන්නෙ නෑ?"

"ඔව්" හෝම්ස් කීය. "ඔබේ තර්කයත් හරි. නමුත් එහෙම කුට්ටි දුම්කොළ තිබුණා නම්, ඒක කැපූ ලකුණු ඔහුගේ පිහියේ තිබිය යුතුයි. එවැනි කිසිම සලකුණක් නෑ. කුට්ටි දුම්කොළ කැපුවා නම්, පිහිතලයේ කහට පැල්ලමක් හිටිනවා. ඒක නිකං වතුර ටිකක් ගෑවට යන්නෙ නෑ. මීළඟට මතුවෙනවා ප්‍රශ්නයක්. ඔහු කුට්ටි දුම්කොළ ටිකක් තිබිලා, ඒක කපන්න බඳපටියේ තිබෙන නාවික පිහිය යොදාගත්තද? මං ඔහුගේ බඳපටිය පරීක්ෂා කළා. ඔහුගේ බඳපටියේ නාවික පිහිය නැහැ. කුඩා දුනුපිහියෙන් වඩාත් පහසුවෙන් ඒ කටයුත්ත කරගත හැකිව තිබියදී ඔහු ඒකට නාවික පිහිය යොදා ගනීවිද? දෙවන ප්‍රශ්නයක් මතුවෙනවා.. ඔහුගේ නාවික පිහියට මොකද වුණේ?"

"ඔහු මුහුදට වැටෙද්දී පිහියත් කවරයෙන් ගැලවී වැටෙන්න ඇති" මම කීවෙමි.

"ඒක හිතන්න අමාරුයි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "නාවිකයන්ගේ බඳපටියේ තිබෙන පිහිය, ඒ තරම් ලේසියට කවරයෙන් එළියට එන්නේ නෑ. ඒක එළියට ඇදගැනීම ටිකක් අපහසුයි කියන්න පුළුවනි. ඒක සාමාන්‍යයෙන් තියෙන්නේ කුඹ ගහට නැගලා, රුවල බැඳීමේදී ප්‍රයෝජනයට ගන්න. ඒ කියන්නේ

http://sherlockholmesinvestigations.blogspot.com

එක් අතකින් මොකක හරි එල්ලී ඉන්න ගමන්, අනෙක් අතෙන් පිහිය අරගෙන කඹයක් කපන්න වගේ වැඩකට. ඒ නිසා පිහිය වැටුණා කියලා හිතන්න අමාරුයි. අනෙක මේ කවරයට පිහියේ තලය විතරක් නෙමෙයි, මිටේ කොටසකුත් ආවරණය වෙනවා. නමුත් දැන් මට පෙනෙන්නේ මොහු ළඟ, නිතර ප්‍රයෝජනයට ගතහැකි සාක්කු දුනුපිහියකුත් තිබිල තියෙනවා. ලොකු පිහියකින් කළ හැකි හැම වැඩකටම වගේ, ඒකත් යොදා ගතහැකියි. ඔහු බඳපටියේ නාවික පිහිය තබාගන්න ඇත්තේ, ආත්මාරක්ෂාවට ආයුධයක් ලෙස වෙන්නත් ඇති.

මං ඔබට කිව් තවත් කාරණයක් පැහැදිලි කරන්නම්. මං ඔබට කිව්වා, මේ පයිප්පයේ ඇති රිදීපටිය කළුපාට වෙලා තියෙන්නේ, සිල්වර් සල්ෆයිඩ් පටලයක් සෑදීම නිසා කියල.

ඔබට මතක ඇති ජේම්ස් බ්‍රවුන්ගේ සාක්කුවේ තිබී, පැකට්ටුවක අසුරා නොතිබුණු, ගිනිකූරු ගොඩක් අපට හමුවුණු බව. එම ගිනිකූරු වේගයෙන් මොනවා හරි පෘෂ්ඨයක වැද්දුව ගමන් දැල්වෙනවා. ඒ නිසා තමයි විශේෂයෙන්ම නාවිකයන් අතර මේ ගිනිකූරු වර්ගය බොහොම ජනප්‍රිය. ඒ මොකද තද සුළං වෙලාවලදීත්, තෙත් සහිත කාලගුණයකදීත් මේවා දැල්වෙනවා. නමුත් සාමාන්‍ය ආරක්ෂිත ගිනිකූරු තෙත් කාලගුණයක හෝ සුළං වෙලාවට දල්වා ගන්න අමාරුයි. මේ අනාරක්ෂිත ගිනිකූරු සාදා තිබෙන්නේ, කූර අගට ගෙන්දගම්- සල්ෆර් තට්ටුවක් ආලේපකොට ඒ මත ෆොස්ෆරස් මිශ්‍රණය තැවරීමෙන්. එතකොට ජේම්ස් බ්‍රවුන්ගේ සාක්කුවේ තබාගත්- පයිප්පයේ රිදීපටිය මත, සිල්ව සල්ෆයිඩ් පටලයක් බැඳුණු හැටි පැහැදිලියි."

"වෙන මොනවද ඔබට නිගමනය කරන්න පුළුවන්?" මම ඇසීමි.

"ඊළඟට මට කීමට ඇති දේවල් උපකල්පනයක් ගොඩ නැගීමට නම් ප්‍රයෝජනවත්........"

"මොනවද ඒ දේවල්."

"බ්‍රවුන්ගේ ඉණේ තිබූ නාවික පිහිය නැහැ. ජෙෆ්රිගේ අතේ තිබෙනවා පිහියකින් වුණු තුවාලයක්."

හෝම්ස්ගේ කථාවට සවන්දීගෙන සිටි කපිතාන්වරයා, මීළඟට ජනේලයෙන් මහසයුර දෙස බලාගෙන සිටියේය. අනතුරුව දුරේක්ෂය දෙනෙතට තබාගත් ඔහුට කෑගැසිණ.


http://sherlockholmesinvestigations.blogspot.com

"දෙයියෝ සාක්කි! අපේ බෝට්ටුවෙන් තවත් එකක් ඇදගෙන එනවා. බාගවෙලාවට මේකද දන්නෙ නෑ බ්‍රවුන් ආව බෝට්ටුව?"

අපි සියලුදෙනාම නිරීක්ෂණ වේදිකාවට පිවිසුණෙමු. බෝට්ටුව ප්‍රදීපාගාරයට ළංවූ පසු, එහි නියමුවා ගොඩට පැන එහි ඉණිමග දිගේ ඉහළට පැමිණියේය.

"මහත්මයා" ඩේවිස් නම් වූ නියමුවා කීය. "මේ අර බ්‍රවුන් නංවල එව්ව 'එමිලි' නම් ධීවර බෝට්ටුව. නැගෙනහිර පැත්තේ ෂිංගල්ස් වැල්ලට මේක ගොඩගහල තිබුණු හැටි අපි දූරේක්ෂයෙන් දුටුවා. ඒ ගමන ගිහිං අපි මේක ඇදගෙන ආවේ. ඇවිත් බලන්න මහත්මයා."

අපි සියලුදෙනාම බෝට්ටුව පරීක්ෂා කිරීමට පහළට බැස්සෙමු.

"මොනවද ඩේවිස් ඔබට මේකෙ තිබිල හමුවුණේ?"

"නාවික පිහියක් හමුවුණා. මෙන්න........"

ඩේවිස් දුන් පිහිය අතට ගත්තේ ෂර්ලොක් හෝම්ස්ය. "මේක තිබුණෙ කොතැනද කියලා මට පෙන්වන්න ඩේවිස්."

බෝට්ටුවේ එක් කෙළවරක ලෑල්ලක් මත එය ඇමිණී තිබූ අයුරුත්, තමාට එය එක්වරම ගළවාගැනීමට අපහසුවූ හේතුවත් නියමුවා පෙන්වා දුන්නේය. බෝට්ටුව පිරිසුදු කිරීමේදී ඉවත්කළ හැකි මූඩිය ගැළැවී, මුල්ලක තිබුණු බවත්, එය යළි සවිකළේ තමා බවත් ඔහු වැඩිදුරටත් කීය.

"මූඩිය අහම්බෙන් ගැළැවී ගියා කියල ඔබ හිතන්නේ නැද්ද?" හෝම්ස් ඇසීය.

"නැහැ මහත්මයා. කවුරු හරි ඒක ඕනෑ කමින්ම ගළවා දමලා. අර රාක්කයක් උඩයි තිබුණේ. අනෙක බෝට්ටුව සමබර කරන්න යොදන වැලිගෝනි, ඔක්කොම එකමුල්ලකට ගොඩගහල තිබුණේ."

"ඔබ කියන්නේ කවුරු හරි හිතාමතාම මේ දේ කළා කියලද?" හෝම්ස් ඇසුවේය.

"මට හිතෙන්නේ එහෙමයි මහත්මයා."

"හෝම්ස් මහත්මයා" කපිතාන් කීවේ දෙඋර හකුළවමිනි. "මට නම් මේ කිසි දෙයක් තේරුම් ගන්න බැහැ. මේක දැන් මහ අවුල් ජාලයක් වෙලා. මේකට හරිහැටි විසඳීමක් ලැබුණෙ නැත්තම්......"

"කපිතාන්. ඔබට උවමනා මේක විසඳාගන්න නේ. මං කැමැතියි ඔබ සමග පෞද්ගලිකව මේ ගැන වචන කිහිපයක් කථා කරන්න" හෝම්ස් පිළිතුරු දුන්නේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"බොහොම හොඳයි. මං සූදානම්" කී කපිතාන් වටපිට බැලුවේ ඒ සඳහා සුදුසු තැනක් ළඟපාත ඇතිදැයි විමසීමට මෙනි. "කමක් නෑ. අපි යමු මේක උඩට."

ඔවුන් දෙදෙනා ප්‍රදීපාගාරය උඩට නගිද්දී, මම සෙසු අය සමග පහළ රැඳී සිටියෙමි. මිනිත්තු අහක් යාමට පෙර සියල්ලන්ටම උඩට පැමිණෙන ලෙස කැඳවීමක් ලැබිණ. ඒ අනුව ප්‍රදීපාගාරයේ සේවකයන් දෙදෙනා- ජෙෆ්රි සහ ස්මිත්, බෝට්ටුවේ නියමුවා සහ සේවකයන් දෙදෙනා සමග මම ද ඉහළට නැගුණෙමි.

"හෝම්ස් මහත්මයා" කපිතාන්වරයා කීවේ සියලුදෙනාම අසුන්ගත් පසුයි. "ඔබ මේ ගැටලුවට විසඳුම කිව්වා මිසක්, මට කිසිදෙයක් පැහැදිලි කරල දුන්නේ නෑ. මං ඔබට ආයාචනය කරනවා මට මේක තේරුම් කර දෙන්න කියල."

"හොඳයි" මගේ මිත්‍රයා කථාව පටන්ගත්තේය.

"ජේම්ස් බ්‍රවුන් ඔහුගේ බෝට්ටුව හැදගෙන මේ ප්‍රදීපාගාරය ළඟටම ආවා. ඊළඟට ඔහු තමන්ගේ පෞද්ගලික බඩු තිබුණු පෙට්ටියත් ඔසවාගෙන, ඉණිමඟ නැගලා, මේ විසිත්ත කාමරයටත් ආවා. ඔහු තමන්ගේ පයිප්පය පුරවාගෙන එය දල්වාගන්න උත්සාහ කළා. නමුත් සාර්ථක වුණේ නෑ. එවිට ජෙෆ්රි තමන්ගේ පයිප්පයක් තමන්ගේ දුම්කොළ වලින් පුරවලා බ්‍රවුන්ට දුන්නා."

"මොකක්ද ඒ කථාවෙ තේරුම" ජෙෆ්රි කථාවට බාධා කළේ කෝපයෙනි. "මං ඔබට කිව්වා නේද ඔහුගේ බෝට්ටුව මෙහේ ආවෙ නැහැ කියල."

"ඔබ එහෙම කිව්වා තමයි" හෝම්ස් කීය. "එහෙම නම් මැරුණු මිනිහාගේ සාක්කුවේ තිබිල ඔබේ පයිප්පය අපට හමුවුණේ කොහොමද? ඔහුගේ පයිප්පය ඔහේලගෙ රාක්කෙට ආවෙ කොහොමද? අන්න ඒක තේරුම් කරන්න."

එයට ජෙෆ්රි නිහඬ වූ බැවින් හෝම්ස් යළිත් කථාව පටන්ගත්තේය.

"බ්‍රවුන් හා ජෙෆ්රි අතර, කුමන හෝ හේතුවක් නිසා, මේකෙ දොරටුව ළඟදි සණ්ඩුවක් ඇතිවුණා. බ්‍රවුන් ඔහුගේ බඳ පටියෙන් පිහිය ඇදලා අරගෙන ජෙෆ්රිට අනින්න තැත්කළා. ඒකෙන් තමා ජෙෆ්රිගේ වම් අත තුවාල වුණේ. එවිට ජෙෆ්රි පහරක් එල්ල කළා බ්‍රවුන්ට. ඒ පහරින් බ්‍රවුන්ගේ අතින් පිහිය ගිලිහී ගිහින් පහළ තිබුණු


http://sherlockholmesinvestigations.blogspot.com

බෝට්ටුවට වැටුණා. ඩේවිස් මහත්මයා අපට කිව්වා පිහිතලය ලෑල්ලකට ඇමිණී තිබුණු හැටි. මම හරියට කියන්න බැහැ ජෙෆ්රි, බ්‍රවුන්ව මෙතැනින් පහළට තල්ලු කළාද කියන එක........"

"මහත්තයො. ඔහේට පිස්සු හැදිලද? මොනවද මේ කියන විකාර?" ජෙෆ්‍රි කෑගැසීය.

"නමුත් අරගලයේ ප්‍රතිඵලයක් ලෙස බ්‍රවුන්" හෝම්ස් කීය. "මේ ප්‍රදීපාගාරය මුදුනේ ඉඳලා පහළට ඇදවැටුණා. ඔහුගේ හිස එවිට වැදුණේ කොන්ක්‍රීට් ආධාරකයේ, තියුණු දාරය මත. හිසට ඇතිවූ තුවාලයෙන් ඔහු මියගියා."

"මොනවද මේ බහුබූත කතා?" ජෙෆ්‍රි හෝම්ස්ට බාධා කළේය.

"....... ඊට පසු ජෙෆ්රි, බ්‍රවුන්ගේ පෙට්ටිය මුහුදට විසිකර දැම්මා" හෝම්ස් තම කථාව නැවැත්වූයේ නැත. "ඔහුගේ බෝට්ටුවටම බ්‍රවුන්ව දමලා, එහි අඩියේ මූඩිය ගලවලා, බෝට්ටුව බාදිය සමග ගහගෙන යන්න සැලැස්සුවා. මේක වුණේ දවල් දොළහ පහුවෙලා, මිනිත්තු දහයට විතර. මං කිව්වදේ හරිද ජෙෆ්රි මහත්මයා?"

ඔහු මෙතෙක් වේලා හෝම්ස්ගේ කථාවට කන්දෙමින් සිටියේ සුදුමැලි වූ මුහුණෙනි. ඊළඟට මිනිත්තු කිහිපයක් යනතුරු නිහඬව මගේ මිත්‍රයා දෙස ඇසිපිය නොහෙළා බලාසිටියේය. අවසානයේ ඔහු කථාකිරීමට තීරණය කළේය.

"මහත්මයා" ජෙෆ්රි කීය. "මට කිසිම ගැළවීමක් නැතිබව දැන් තේරෙනවා. ඔබ මේ දේවල් කියන්නෙ හරියට මෙහෙ කොහේ හරි හැංගිලා බලාගෙන හිටියා වගේ. කොහොම වුණත් මං ඔබට හැම දෙයක්ම හෙළිකරන්නම්. මුල ඉඳලාම කියන්නම්. එතකොට ඔබට තේරුම් ගැනීම පහසුවේවි.

මගේ ඇත්ත නම ජෙෆ්රි රෝක්. ඔහුගේ නම බ්‍රවුන් නෙමෙයි; ඇමොස් ටොඩ්. අවුරුදු 16කට කලින් අපි දෙන්නා හොඳ මිත්‍රයෝ. අපි වැඩකළේ කියුනාඩ් නැව් සමාගමට අයත් "යුනිකෝන්" නම් නෞකාවේ. මේක සවුත්හැම්ටන් හා දකුණු අප්‍රිකාවේ කේප්ටවුන් අතර යාත්‍රා කළ, බඩු ප්‍රවාහණය කරන නැවක්.

නැවේ කපිතාන් සහ නිලධරයන් එක් පැත්තකටත්, සේවකයන් අනෙක් පැත්තටත්, දෙපාර්ශවය අතර නිතර නිතර ගැටුම් ඇතිවුණා. අපි කේප්ටවුන් වලින් බඩු පටවාගෙන අත්ලාන්තික් සාගරය හරහා එංගලන්තය දෙසට යාත්‍රාකරමිනුයි හිටියේ. මා කලින් සඳහන් කළ ආරවුල් නිසා, එක් රාත්‍රියක දී කපිතාන්ගේ

http://sherlockholmesinvestigations.blogspot.com

දෙවැනියා සහ තවත් නිලධරයෙක්, සේවක පිහිපාරකින් මියගියා. ඒකෙන් ගැටුම තවත් උත්සන්න වුණා. නැවේ කැරැල්ලක් ඇති වුණා. එහි ප්‍රතිඵලය ලෙස නැවේ නිලධරයන් හැමදෙනාම සහ සේවකයන් අටදෙනෙක් ජීවිතක්ෂයට පත්වුණා. ඉතිරිවුණේ අපි හයදෙනෙක් පමණයි.

නැව ආපසු එංගලන්තය වෙත ගෙන ඒමට අපට හැකියාව තිබුණා. නමුත් එයින් අපට ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න වෙන බව අපි දැනහිටියා. සමහරවිට නඩු විභාගයක් පැවතුණහොත්, අප එල්ලුම්ගසට නියම වෙන්නත් පුළුවනි. අපේ හයදෙනාගෙන් හතරදෙනෙක් අයිරිෂ් ජාතිකයෝ. ඉංග්‍රීසි ජාතිකයන් හිටියේ ඇමොස් ටොඩ් හා මා පමණයි. ජීවිත බේරාගැනීමට අපට ගැනීමට තිබුණේ එක් පියවරක් පමණයි, ඒ තමයි නැව මුහුදුබත් වෙන්න ඇරලා, ජීවිතාරක්ෂක බෝට්ටු වලින් කොහේ හරි රටකට ගොඩබැසීම.

නැවේ කපිතාන් සතුව තිබූ මුදල් සියල්ල අපි ගත්තා. අයිරිෂ් ජාතිකයන් හතරදෙනා එක් බෝට්ටුවක පිටත්වෙලා ගියා. ටොඩ් සහ මම සති කිහිපයකට සෑහෙන කෑම රැගෙන, තවත් බෝට්ටුවකට නැඟුණා. සතියක් යන්න කලින් ඇමරිකන් නැවකින් අපව බේරාගත්තා. අපි ඔවුනට කිව්වේ එන්ජින් කාමරේ පිපිරීමකින් නැව මුහුදුබත්වුණා කියලයි. ඔවුන් අපට හොඳට සලකලා අපව එංගලන්තයට යැව්වා.

අප කළ අපරාධය ඒ වෙනකොටත් එංගලන්තයට හෙළිවී ඇතිබව දැනගත්තේ, අපි එංගලන්තයට පා තැබුවාට පස්සෙයි. ඒ ගැන කොහොම හරි නැව් සමාගම දැනගෙන තිබුණා. ටොඩ් සහ මාව අත්අඩංගුවට ගෙන අධිකරණයක් ඉදිරියට ගෙනාවා.

එතකොට ඇමොස් ටොඩ් මොකද කළේ? ඔහු කොන්දේසි සහිත සමාවක් ලබාගෙන, රජයේ සාක්ෂිකරුවෙක් වුණා. තමන් කිසිම අපරාධයක් නොකළ බව කියමින් මුළු සිද්ධියම හෙළිකළා. අන්තිමේදී මාව එල්ලුම්ගහට නියමවුණා. මා එක්ක එකට මිනීමරපු එකාට සමාව ලැබුණා. පසුව මගේ අභියාචනාව සලකලා මාව විසි අවුරුද්දකට හිරේට නියමවුණා. දොළොස් අවුරුද්දක් හිරබත් කෑවට පස්සේ මං හිරෙන් පැන්නා.

මහත්වරුනි. මං හිරේ ගිය දවසේ ඉඳල මගේ හිතේ තිබුණේ එකම අරමුණයි. ඒ ඇමොස් ටොඩ් හොයාගෙන, කොහොම හරි

 http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගෙන් පළිගැනීම. හිරෙන් පැනලා ආවදා ඉඳල මං හැංගිලා හිටියේ නෑ. මං වෙස්වලාගෙන එංගලන්තය පුරා ටොඩ් සොයමින් ඇව්දදා. ඒත් ඔහුව මට හමුවුණේ නෑ. අන්තිමේදී ජීවත්වෙන්න විධියක් නැති නිසා, ටොම් ජෙෆ්රි නමින් නම වෙනස් කරගෙන, ප්‍රදීපාගාරයේ රක්ෂාවට බැඳුණා.

මනුස්ස පරාණයක් දකින්න නොලැබෙන මුහුද මැද, මේ ප්‍රදීපාගාරයට වෙලා, මං ගෙව්වේ බොහොම දුක්ඛිත ජීවිතයක්. ඒ වුණත් ජීවත්වීම සඳහා මට වෙන් කරන්න දෙයක් තිබුණේ නැහැ. මගේ වයසට ආව කෙනෙක් නැවක රක්ෂාවකට ගන්නේ නෑ. පහුගිය අවුරුදු තුනක කාලය මං මෙහේ රැකියාව කළා.

ගිය සෙනසුරාදා රෑ මගේ සහකාර හැරී බානට්, ඉණිමගෙන් ලිස්සා වැටිල කකුල කඩාගත්තා. බානට් වෙනුවට, අලුතෙන් බඳවාගත් ජේම්ස් බ්‍රවුන් නම් සේවකයා එවන බව, වෙරළාරක්ෂක නිලධරයන් මට දන්වා තිබුණා. බානට් පිටවෙලා ගියාට පස්සේ අලුත් මිතුරා පිළිගන්න, මං බලාගෙන හිටියේ නොඉවසිල්ලෙන්.

ඔහු රුවල දමාගෙන බෝට්ටුවේ ඇවිත්, පසුව අවල් ඇදගෙන එනහැටි මං දුරේක්ෂයෙන් බලාහිටියා. ඔහු ඇවිත් මේක පාමුල බෝට්ටුව නවත්වලා, ඉණිමගේ උඩට නගින්න සූදානම් වෙද්දි, ඔහුගේ පහසුවට මං කඹයකුත් පහළට දැම්මා. බඩුපෙට්ටියත් කරේ එල්ලාගෙන, ඔහු ඉණිමග දිගේ උඩට නගින්න පටන්ගත්තා.

ඔහු උඩට නගිද්දිවත්, මට ඔහුගේ මුහුණ හරිහැටි පෙනුණේ නෑ. වේදිකාව උඩට ඔහුව ගන්න, මං ඔහුට අත්දුන්නා. මගේ වාරුවෙන් ඔහු වේදිකාව උඩට නැගුණා. ඔහුගේ මුහුණ මං පළමුවරට දැක්කේ එතකොටයි.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ!" මගේ ළපුවේ ගැස්ම එකපාරටම නැවතුණා. ඒ ඇවිත් හිටියේ කවුද? ඇමොස් ටොඩ්! මං අවුරුදු ගණනාවක් එංගලන්තය පුරා හෙව්ව, මගේ පරම හතුරා ඇමොස් ටොඩ්. මං ඔහුව හඳුනාගත්තට, ඔහුට බැරිවුණා මාව හඳුනාගන්න. වචනයක් වත් කථා නොකර මං කෙළින්ම ගියේ, අපේ නිදන කුටි තියෙන පැත්තට. ඔහු මගේ පිටුපසින් ආවා.

"ඔහේ වැඩිය කතාබහ කරන කෙනෙක් නෙමෙයි. එහෙම නේද යාළුවා?" ඔහු ඇසුවේ පුදුමයෙන් වටපිට බලමින්. "මට ශුභ උදෑසනක් කියල කියන්නෙ වත් නැද්ද? අද ඉඳන් අපි දෙන්නට

http://sherlockholmesinvestigations.blogspot.com

හොඳ යාළුවො වෙන්න සිද්ධවෙනවා. මගේ නම ජිම් බ්‍රවුන්. තමුසෙගෙ නම මොකක්ද?" ඔහු ඇසුවා.

මං ඔහුව ජනේලය ළඟට කැඳවාගෙන ආවා. මගේ මුහුණට හොඳින් හිරු එළිය වැටෙන විධියට මුහුණ ජනේලය පැත්තට හරවලා මෙහෙම කිව්වා.

"මගේ මුහුණ දිහා හොඳ පරීක්ෂාවෙන් බලන්න ඇමොස් ටොඩ්. ඊටපස්සේ තමුසෙගෙ හිතින්ම අහල බලනවා මගේ නම මොකක්ද කියලා."

මගේ කටහඬ ඇසුණ ගමන් ඔහු තිගැස්සුණා. මගේ මුහුණ හරිහැටි දුටු ගමන්, ඔහුගේ මුහුණ සුදුමැලි වුණා. හරියට මළමිනියක් දුටුවා වගේ භීතියෙන්, ඔහු වෙවුලන්න පටන් ගත්තා.

"මේ..... මේක නම් වෙන්න බෑ. මේ ජෙෆ් රෝක්ද?"

මං මහහඬින් හිනාවුණා. මට මගේ හිනාව නවත්වාගන්න බැරිවුණා.

"උඹ ආවද මිත්‍රයා? ඇමොස් ටොඩ්! උඹ මගේ කකුල් දෙක ළඟට ආවද? මගේ පරම හතුරා!" මට එක සැරේ කෑගැසුණා.

මහත්වරුනි. දෙවියන් වහන්සේ බොහොම සාධාරණ කෙනෙක්. දෙවියන් වහන්සේ යුක්තිය ඉටුකරන කෙනෙක්. උන්වහන්සේ ටොඩ්ව මගේ දෙපා ළඟට එව්වා.

"මගේ පරම හතුරා!" මං ආයෙත් කිව්වා.

"එහෙම කියන්න එපා මිත්‍රයා" ඔහු කිව්වා. "මං ඔබේ හතුරා කියල තවදුරටත් හිතන්න එපා. දෙවියෝ දන්නවා, ඔබ දකින්න ලැබීම ගැන මං කොයිතරම් සන්තෝෂවෙනවද කියලා. ඔබේ ඔය සුදුවුණු කොණ්ඩෙයි, මුහුණ පුරා වැවුණු රැවුලයි නිසා, මං කොහොමද ඔබව හඳුනාගන්නෙ? මං කළේ ලොකු වැරැද්දක් ජෙෆ්. මං ඒක පිළිගන්නවා.

උඹ හිරෙන් පැනගිය බව මට දැනගන්න ලැබුණා. ඒකෙන් මගේ හිතට දැනුණේ ලොකු සැනසීමක්. දොළොස් අවුරුද්දක් උඹව හිරේ තැබූ එකේ ශාපය මට වැදුණා. මං ආයෙත් දුප්පතෙක්. දැන් ඔය පරණ කථා කුරු ගාල වැඩක් නෑ. ගියදේ ගියාවෙ. අපි ඒව අමතක කරල දාමු. අපි අර ඉස්සර කාලෙ හිටියා වගේ මිත්‍රයෝ වෙමු."

ඔහු ලේන්සුවෙන් මුහුණේ ඩහදිය පිසදමාගෙන මා දිහා බලාගෙන හිටියා. ඒ ඔහුට ඊළඟට අත්වෙන ඉරණම මොකක්ද කියලා හිතාගන්න බැරුව.

 http://sherlockholmesinvestigations.blogspot.com

නමුත් ඌව මරාදමන්න දෙවියන් වහන්සේ මට ඉඩදුන්නේ නෑ.

"වාඩිවෙයන්" මං ඔහුට කීවේ අපේ ඇඳි පුටුව පෙන්වමින්. "වාඩිවෙලා මට කියපන් මාව උසාවියට පාවාදීලා, උඹ තනියම අරගත්තු අර සල්ලි කන්දරාවට මොකද කළේ කියල. උඹ ඒක සූදු කෙලලා ඉවර කරන්න ඇති. නැත්නං මෙහේ එන එකක් නෑ."

"ඒ මුදල්, හොරු මංකොල්ල කෑවා ජෙජ්" ටොඩ් කීවා. "මං උඹට කිව්වේ දූත් මං අන්තිම දුප්පතෙක් කියල. දූත් ඉතින් ඒව අමතක කරල දාමු."

"ඔව්" මං කිව්වේ වෙන කියන්න දෙයක් හිතාගන්න බැරුව. මං ඔහුගේ පුටුව ළඟට එද්දි ඔහු තිගැස්සිලා මං දිහා බැලුවේ අප්‍රමාණ භයකින්.

"මා දිහා ඔය විධිසට බලන්න එපා මිනිහෝ" මං කිව්වා. "මොකක් හරි කරපං. අඩුම ගණනේ බීපං උඹේ පයිප්පෙ වත්."

ඔහු ඉක්මනට සාක්කුවෙන් ගත්තා පයිප්පයක්. ඔහුගේ සාක්කුවෙන් පසුම්බියක් ඇදලා දුම්කොළ වලින් පුරවාගත්තා. ඊළඟට ඒක කටේ ගහගෙන, සාක්කුවෙන් ගිනිකූරුත් අරගෙන, පයිප්පය පත්තුකරන්න උත්සාහ කළා. නමුත් හරිගියේ නැහැ.

"චිඃ! මෙකෙ ඇතුළ ආයෙමත් හිරවෙලා" ඔහු කිව්වේ තරහෙන්. "උඹ ළඟ කම්බි කෑල්ලක් නැද්ද? මේ පසුම්බියේ ඌරුම් ලෝම වලින් මෙකෙ බටේ හිරවෙලාද කොහෙද"

"කම්බි කෑලි නම් මා ළඟ නෑ" මං කිව්වා. "උඹට ඕනෑ නම් මගේ මේ පයිප්පෙ ගනිං. මා ළඟ අමතර එකක් තියෙනවා අර රාක්කෙ. මෙන්න ඕලන්දයෙන් ගෙනෙන හොඳ කුට්ටි දුම්කොළ තියෙනවා. ඔහොම ඉඳින් උඹට එයින් ටිකක් කපලා දෙන්න" මං ඔහුට මගේ පයිප්පය පුරවලාම දුන්නා.

මාත් එක්ක හවුලෙ අපරාධ කරලා, අන්තිමට මාව පාවා දීලා, මාව එල්ලුම් ගස් යවන්න හැදූ, මගේ තරුණ ජීවිතේම විනාශ කළ හතුරාට මං සැලකුවේ එහෙමයි. ඔහුව මරාදමන්න උවමනාව තිබුණා නම්, මට ඒ වෙලාවේම ඌ බල්ලෙක් වගේ මරා දමන්න තිබුණා. නමුත් මහත්වරුනි මං එහෙම කළේ නෑ.

මං දුන්නු පයිප්පය ටොඩ් අතට ගත්තෙ "බොහොම ස්තුතියි" කියමින්. ඒත් මං දුම්කොළ කැපූ මගේ පිහිය දිහා ඇස් යොමුකරගෙන.

"ඒක තෙමෙයි ජෙජ්" ඔහු ඇසුවා. "අපට බැරිද ඉස්සර කාලෙ වගේ හොඳ යාළුවෝ වෙන්න?"

http://sherlockholmesinvestigations.blogspot.com

මේ වෙනකොට හතරවටේටම බොහොම තදින් මීදුම ගලන්න පටන් අරගෙන තිබුණේ. මං මීදුම් නළාව ක්‍රියාත්මක කළත්, ඒකේ ශබ්දය අඩුවේගෙන ගියා. එහෙම ඔයින්ඩ් එන්ජිමේ මොනව හරි දෝසයක් වුණාමයි. මං ඒ ගැන බලන්න යන්ත්‍රාගාරයට යන්න සූදානම් වුණා. ඒ යද්දි නිකමට හැරිල බැලුවා.

මෙන්න ටොඩ් බොහොම හෙමින් අඩිය තිය තියා හොරෙන්ම ඉණිමඟ දිහාවට යනවා.

"ඒයි ටොඩ්! උඹ කොහේද ඔය යන්නේ?" මට කෑගැසුණා.

"මං යනවා බෝට්ටුව හොඳට ගැටගහලද ආවෙ කියල බලන්න" එහෙම කිව් ඔහු, මං එනකොටත් යකඩ තරප්පුව දිගේ පහළට බහින්න අඩි දෙක තුනක් තියලා ඉවරයි. ඔහු සූදානම් වුණේ ඉණිමඟෙන් හෙමින්ම පහළට බහින්නයි. ඊටපස්සේ මෙතැනින් පැන ගිහින්, මා ගැන පොලීසියට දැනුම්දෙන්න. නමුත් මං පැනල එක්වරම ඔහුගේ කමිස කොළරයෙන් අල්ලාගත්තා.

"හා! උඹ හැදුවේ මෙතැනින් පැනලා ගිහින් මං ගැන පොලීසියට ඔත්තුව දෙන්නයි නේද? වරෙන් උඩට. අපට යාළුවො වගේ ඉන්න පුළුවන්" මං එහෙම කියලා මගේ ග්‍රහණය ලිහිල් කළා.

ඌ මොකද කළේ? මගේ ග්‍රහණය බුරුල් කළ වහාම ඉණේ තිබුණු පිහිය ඇදලා අරගෙන මට ඇන්නා. ඒ පිහිපාරටයි මගේ වම් අත කැපුණේ.

"මිනීමරු යක්ෂයා!" වේදනාවෙන් කෑගහමින් මං උගේ පිහිය තිබුණු අතට පහරක් එල්ල කළා. ඒ පාරට පිහිය උගේ අතින් ගිලිහිලා බෝට්ටුවට වැටුණා. ඒ වෙලාවේ ඌ ඉණිමගේ එල්ලී ඉඳගෙනම මගේ මුහුණට පාරක් එල්ල කළා. මම ඒ පාර වළක්වාගන්න පස්සට පැන්නා. ඒ අවසරයෙන් ඌ නැත්කළේ මට අහුනොවී වේගයෙන් ඉණි මගේ පහළට බහින්නයි. නමුත් ඌට පඩි තුනක්වත් බහින්න ලැබුණේ නෑ. කලබලය නිසා කකුල වැරදුණා; අත අතහැරුණා. ඇමොස් ටොඩ් ප්‍රදීපාගාරය මුදුනේ ඉඳලා පහළට වැටුණේ මරු විලාපයක් නගමින්. උගේ හිස ප්‍රදීපාගාරයේ අත්තිවාරම වූ කොන්ක්‍රීට් ආධාරකයේ වැදුණු හැටි මං දුටුවා. ඒ වැදුණු පාරට ඔළු කට්ට තියා, යකඩ තොප්පියක් වත් ඉතිරි වෙන්නේ නෑ. ඌ මට කළ අපරාධයට දෙවියෝ ඌට දඬුවම් දුන්නා.

මිනිත්තු කිහිපයක් යනතුරු, කළයුතු දෙයක් මට හිතාගන්න බැරිවුණා. ඊළඟට ඔහුගේ මළසිරුරත් බෝට්ටුවත් වහාම මෙතැනින්

 http://sherlockholmesinvestigations.blogspot.com

ඉවත් කළ යුතු බව මට වැටහුණා. ඒ වෙලාවෙ මීදුම තුනීවෙගන යමින් තිබුණේ. ඉතින් මං ඔහුගෙ මළසිරුර බෝට්ටුවට දමලා, එහි අඩියේ මුඩිය ගළවලා එය පා කරල යැව්වා. ඉතින් මහත්වරුනි ඉතිරි හරිය ඔබ දන්නවා. ඔබ කැමැති දඬුවමක් මට දෙන්න. නමුත් මට කියන්න තියෙන්නේ, මා විසින් කළ යුතුව තිබූ දෙය, මට දෙවියන් වහන්සේ කරල දුන්නු බවයි."

* * *

හය මසකට පසු කපිතාන් ඩෝසන් ලන්ඩනයට පැමිණි විටෙක අප හමුවීමට බේකර් වීදියට පැමිණියේය. එදා සැන්දෑවේ අපි වයින් බිඳක් තොලගාමින් පිළිසඳරේ යෙදී සිටියෙමු.

"ඔබ දන්නවද හෝම්ස් මහත්මයා ටොම් ජෙෆ්රිට අත්වුණු ඉරණම."

"නැහැ. මොකද වුණේ?"

"ඔහු ආයෙමත් හිරේ ගියා. කලින් ඉතිරිව තිබුණු ටිකයි, බ්‍රවුන්ගෙ සිද්ධියට දහඅටමාසයකුයි ඔහුට නියමවුණා." කපිතාන් කිය. "ඔබ ඒ අපරාධය විසඳූ හැටි ඉතාම විශිෂ්ටයි හෝම්ස් මහත්මයා. ඔබ කොහොමද සිද්ධිය බලාගෙන හිටියා වගේ හැමදෙයක්ම තේරුම් ගත්තේ?"

"ඒක ඒ තරම්ම සංකීර්ණ, තේරුම් ගන්න අමාරු එකක් කියල මට නම් හිතෙන්නේ නෑ කපිතාන්" හෝම්ස් කීය. "අපට නිරීක්ෂණය කරන්න හැකිවුණු දේවල් සමග, ලැබී තිබෙන දත්ත ගැළපුවාම සරල නිගමන වලට එන්න හුළුවන්කම තිබුණා.

මේ ජේම්ස් බ්‍රවුන් කියන පුද්ගලයා බෝට්ටුවේ නංවලා මුහුදට දැම්මෙ ප්‍රදීපාගාරය වෙත යන්න. ඔහු එහි ළඟාවුණේ නැහැ. එසේනම් ප්‍රශ්නය තියෙන්නේ ඔහු ගියේ කොහේටද?

ඔහු ගියේ කොහේටද කියලා අපි දන්නේ නෑ. නමුත් ඔහුගෙ මළසිරුරේ ගියතැන ගැන විස්තර සටහන් තිබුණා."

"ඒ මොනවද?"

"ඔබට මතක ඇති බ්‍රවුන්ගේ හිසේ පිටුපස තිබුණු තුවාලය. මෙය සිදුවී තිබෙන්නේ මරණයට පෙර බව මට තේරුම් ගත හැකිවුණා. ඊළඟට ඒ තුවාලයේ මට දකින්න ලැබුණා, කැඩී බිඳී ගිය බෙලිකටු සහ මුහුදු පණුවන්ගේ නාළාකාර කටු කැබැලි. මෙම සමුද්‍ර ජීවීන්

http://sherlockholmesinvestigations.blogspot.com

වාසය කරන පරිසරය ගැන වැටහීමක් ලබාගත්තොත්, ඔහුගේ තුවාලය ඇතිවූ ආකාරය ගැන හෝඩුවාවක් ලබාගත හැකිවේවි කියල මට හිතුණා. මෙන්න මේ වෙලාවෙ තමා කෙන්ට් විශ්වවිද්‍යාලයේ, ජීව විද්‍යා අංශයේ පුස්තකාලය මගේ පිහිටට ආවේ.

ඔබ දකින්න ඇති, ඔහුගේ හිසේ වූ තුවාලයේ බෙලිකටු කැබලි ලියුම් කවරයකට මා එකතු කරගත් හැටි. ඒවා පිළිබඳ සුළු දැනුමක් මට තිබුණත්, සාගර ජීව විද්‍යාව පිළිබඳ විද්වතුන්ගේ ග්‍රන්ථවල මං ඒ ගැන විමසා බැලුවා. මේවා පැහැදිලිවම ඇකෝන් බෙල්ලාගේ කටු සහ සර්පියුලා පණුවාගේ නාලාකාර කටු කැබලි. ඒකෙන් අපට ඉතා වැදගත් නිගමනයකට පැමිණෙන්න පුළුවන්. ඒ මොකක්ද? ඔහුගේ හිසේ වූ තුවාලය ඇතිවී තිබෙන්නේ, එම ජීවීන් වාසය කරන දැඩි වස්තුවකින් හිසට එල්ලවූ පහරකින්. ඒ වස්තුව කුමක් වුවත් එය වඩදිය වෙලාවට යටවෙන, බාදිය වෙලාවේදී එළියට විවෘත වෙන මතුපිටක් ඇති එකක්. ඒ මොකද ඇකෝන් බෙල්ලන් සහ සර්පියුලා පණුවන් ජීවත්වෙන්නේ, වරින්වර වාතයට විවෘත වෙන, යළිත් මුහුදු ජලයෙන් වැසී යන ප්‍රෘෂ්ඨ වල පමණයි. ඔහු පණපිටින් සිටියදී හිසට පහරක් එල්ල වුණු වස්තුව, මොකක් කියල අපි හිතාගන්නද? මේ කියන ආකාරයේ දේයක් මේ මුහුදු ප්‍රදේශයේ තිබෙන්නේ ප්‍රදීපාගාරයේ කොන්ක්‍රීට් ආධාරකය පමණයි.

අපි එතැනට ළඟාවුණු වෙලේ ඒ බව පැහැදිලිවම පෙනුණා. මේකෙන් මට තේරුම් ගතහැකිවුණා, ඔවුන් නිසැකවම ප්‍රදීපාගාරයට ආව බව. ප්‍රදීපාගාරය ගොඩ නංවා ඇති කොන්ක්‍රීට් කුළුණු ආධාරකය දෙස ඔබ හොඳින් බැලුවා නම් පෙනේවි, වරින්වර වඩදියෙන් හා බාදියෙන් ජල මට්ටම ඉහළ පහළ යෑම නිසා එහි සෑදුණු ඇකෝන් බෙල්ලන්. මේකෙන් කාරණාව ඉතාම පැහැදිලි වුණා. කපිතාන් ඩෝසන්, ඔබ අහල තියෙනවද සිංදු කිව්ව ඇටකටුව කියල ජර්මන් උපමා කථාවක්?"

"නැහැ."

"පොළොව හෑරූ ගොවියෙකුට හමුවුණාලු මිනිස් අස්ථියක්. ඒක මිනීමැරුමකින් පසු රහසේ වළදමා තිබූ මළසිරුරක අස්ථියක්. ගොවියා ඒක කපලා, මට්ටම් කරලා, පිඹින්න පුළුවන් බට නළාවක් විදියට සකස් කරගත්තලු. ඊළඟට ඒක පිඹින්න ගත්තාම නිකුත්වුණේ ඔහු බලාපොරොත්තුවුණු තාලය හෝ ශබ්දය

 http://sherlockholmesinvestigations.blogspot.com

නෙමෙයිලු. ඒකෙ කියවුණේ සින්දුවක්ලු. ඒ කියවුණේ මෙවැනි අදහසක්.

මගෙ අයියා, මා මරලා, මේ පොළොවේ වළ දැම්මා. මගෙ කුඹුරට ලොබ බැඳලා, ඔහු කළ අපරාධයට දඬුවම් දෙනු මැන සොයලා."

"හොඳ ආදර්ශමත් උපමා කථාවක් හෝම්ස් මහත්මයා."

"ඇත්තෙන්ම ඔව්" හෝම්ස් කීය. "ඒකෙන් අපට ඉගෙන ගන්න තියෙන්නේ, අපි ඒවට කන්දෙන්න සූදානම් නම් බොහොමයක් දේවල් සිංදු කියන්නත් සූදානම්."

Reading Purpose Only... Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# මාරයාගේ දූතයෝ

ඒ 1901 වසරේ මැයි මාසයේ දීප්තිමත් උදෑසනකි. බොහෝ දිනකින් ඇවිදින්නට යාමට නොලැබුණු නිසා, ලන්ඩන් නගරයේ වීථි කිහිපයකම ඇවිද ගොස්, අපි ආපසු නිවහන කරා එමින් සිටියෙමු. දින කිහිපයකට පසුව එළැඹි යහපත් කාලගුණ තත්ත්වය නිසා මහජනයා වීථියට බැස, එදිනෙදා කටයුතු වල නිරතවෙමින් සිටියේය. වික්ටෝරියා මහරැජිණියගේ අභාවය නිසා නවමන් ශෝකවෙමින් සිටි ලන්ඩන් කාන්තාවෝ, කළු පැහැති ඇඳුමෙන් සැරසී එදිනෙදා කටයුතු වල යෙදුණහ. කළු පැහැයට ඉඳුරාම වෙනස්, කාකි පැහැගත් ඇඳුමකින් සැරසුණු පිරිසක් ද මහමග ගැවසුණේය. ඒ දකුණු අප්‍රිකාවේ බෝයර් යුද්ධයට සහභාගි වන බ්‍රිතාන්‍ය යුද්ධභටයන්ය. නිවාඩුවට ගමරට බලා පැමිණ සිටි ඔවුහු, නිලඇඳුමෙන්ම නගරයේ ඔබමොබ සංචාරය කළහ. උදෑසන ව්‍යායාමය නිසා, මගේ මිත්‍රයා ඉමහත් සතුටට පත්ව සිටියේය.

"ඔබට හිතෙන්නේ නැද්ද වොට්සන්" ඔහු කීය. "දැන් කාලේ එංගලන්තයේ අපරාධකාරයන් ඒ සඳහා යොදාගන්නා උපක්‍රමවල, ඒ තරම් ගැඹුරු සංකීර්ණ බවක් නැහැ කියල?"

"ඔබ කියන දේ මට ඒ තරම්ටම පැහැදිලි නැහැ." මම පිළිතුරු දුන්නෙමි.

"හොඳයි. ඒක සරල කරල, මම මෙලහම කියන්නම්" හෝම්ස් කීය. "දොස්තර ග්‍රයිම්ස්බි රොයිලොට්ස්, ශුද්ධවන්ත පීටර්ස්, ස්ටේපල්ටන් වගේ කීපදෙනෙක් ඇරුණාම, අපේ මනසේ පටලැවීමක් ඇති කළ හැකි අය හිටියෙ, ඉතාම කලාතුරකින්. එහෙම නේද?"

"ඔබේ කතාවෙත් ඇත්තක් තියෙනවා" මම පිළිතුරු දුන්නෙමි. "නමුත් දැනට අපි සරලයි කියන ඒව විසඳන්න, ඒ කාලෙ ටිකක් අමාරුවුණා." මා එසේ කියද්දී අපි ඔක්ස්ෆඩ් වීථියෙන් හැරී බේකර් වීථියේ අපේ නිවහනට ළඟාවෙමින් සිටියෙමු.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔන්න අපි ගෙදරටත් ආවා" හෝම්ස් කීය. "හෝ හෝ! අපි නැති අතරේ අප හමුවෙන්න අමුත්තෙක් ඇවිත්. සෑහෙන වෙලාවක් තිස්සේ ඔහු හෝ ඇය බලාගෙන ඉඳල තියෙනවා."

අපේ නිවස ඉදිරිපිට පාරේ අශ්වකරත්තයක් දකින්නට නොලැබිණි. එහෙයින් මගේ මිත්‍රයාගේ ප්‍රකාශයෙන් මම පුදුමයට පත්වීමි.

"හැබෑටම හෝම්ස්. ඔබ කොහොමද ඔය තරම් දුරට කාරණා කියන්නේ?"

"ඔබට පෙනෙනවාද අපේ නිවස ඉදිරිපිට පදික වේදිකාවේ දාරයේ දිගේ, කොළ පැහැති තීන්ත ලකුණක්? අශ්වකරත්ත බොහොමයක් තීන්ත ආලේපකරන්න යොදාගන්නා කාලය මේකයි. මේ එවැනි අලුතෙන් ආලේප කළ තීන්ත වලින් ඇඳුණු ඉරක්. අප යද්දි ඔය ඉර තිබුණෙ නැහැ. අප ගියාට පස්සෙ පැමිණි අශ්වකරත්තයක්, හුඟක් වෙලා මෙතැන නවත්වාගෙන ඉඳල තියෙනවා. මං එහෙම කියන්නෙ, රියැදුරා ඔහුගේ පයිප්පයේ දාවී ඉතුරුවුණු දුම්කොළ රොඩු, දෙබරක්ම පදික වේදිකාව මතට හලල තියෙනවා. නමුත් අපි ප්‍රමාද නිසා වෙන්න ඇති. කුලීරිය පිටත්වී ගිහින්. මං විශ්වාස කරනවා රිය පැමිණවිට අපේ අනුග්‍රාහකයා, අප එනතුරු නිවසේ රැඳී ඇති කියලා."

අපි නිවසට ඇතුළුවී උඩුමහලට නැඟීමට සූදානම් වූයෙමු. හඩ්සන් මහත්මිය නිවස තුළ සිට දිව ආවාය.

"හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "ඔබ හමුවෙන්න අමුත්තෙක් ඇවිත් දැන් පැයකටත් වැඩියි. ඇය ඔබේ විසිත්ත කාමරයේ රැඳී ඉන්නවා. මට පෙනුණේ ඇය බොහොම විඩාපත්වෙලා වගෙයි. අසරණ මනුස්සයා. මං ඇයට හොඳ උණුසුම් තේ කෝප්පයක් පිළිගැන්නුවා."

"ඔබට බොහොම ස්තුතියි හඩ්සන් මහත්මිය" හෝම්ස් කීය. "ඔබ කටයුතු කර ඇති පිළිවෙළ කදිමයි. ඔන්න ආයෙත් සෙල්ලම පටන් අරගෙන වගෙයි වොට්සන්."

අප උඩුමහලට නැග අපේ විසිත්ත කාමරයට පිවිසෙද්දී, අපේ අමුත්තා සිය අසුනෙන් නැගිට්ටාය. ඒ අවුරුදු විසිදෙකක් පමණ වයසැති, සිහින් රූමත් තරුණියකි. ඇයගේ එතරම් දික්නොවූ කෙස්වැටිය, රන්වන් පැහැවිය. විශාල දෙනෙත් නිල් පැහැති වූ

http://sherlockholmesinvestigations.blogspot.com

අතර, නළලේ තිබුණේ බුද්ධිමත්කම පෙන්වන පුළුල් බවකි. ගවොමට උඩින් දුඹුරු පැහැති කබායක් ඇඳ සිටි ඇගේ, මෙම සියලු ලක්ෂණ මා දුටුවේ මඳවෙලාවකට පසුවය. වෛද්‍යවරයෙකු ලෙස මුලින්ම මගේ අවධානය යොමුවූයේ, ඇයගේ ඇස්වලට පහළින් පිහිටි අඳුරු සෙවණැලි හා වෙවුලන බවක් පෙන්නුම් කළ දෙතොල් දෙසයි. කුමන කරුණක් හෝ නිසා ඇය භීතියෙන් පසුවූ බව, මට සිතාගත හැකිවිය.

ඇය පැමිණෙන වෙලාවේ තමා නිවසේ නොසිටීම ගැන, මගේ මිත්‍රයා මේ තරුණියගෙන් සමාව අයැද සිටියේය. මීළඟට ඔහු ගිනි උදුන අසල වූ සුවපහසු අසුනක වාඩිවෙන මෙන්, තරුණියගෙන් ඉල්ලා සිටියේය.

"මට පෙනෙනවා ඔබ බොහොම ලොකු කරදරයකට මුහුණපාලා ඉන්න බව" හෝම්ස් කීය. "මේ මගේ මිත්‍ර දොස්තර වොට්සන්. ඔබේ ප්‍රශ්නය විසඳීම සඳහා අපි දෙන්නාගෙ උපරිම උත්සාහය යොදන්න අපි සූදානම්."

කරුණු සිතේ ගොනු කරගැනීමට මෙන් ඇය මොහොතක් නිහඬව බලාසිටියාය. "හෝම්ස් මහත්මයා, මගේ නම ඩැෆ්නි ෆෙරර්ස්" ඇය කීවේ මගේ මිත්‍රයා දෙසට හැරී ඔහු දෙස සුපරීක්ෂාකාරී බැල්මක් හෙළමිනි. "ඔබට හිතෙනවාද මරණයේ පණිවුඩය අරගෙන එන, මාරයාගේ දූතයින් කියල කොටසක් ඉන්නවා කියලද?"

හෝම්ස් එක්වරම මා වෙත හෙළුවේ මවිතයට පත් බැල්මකි. මට කිසිවක් සිතාගත නොහැකිවිය. මම ඔහු දෙස බලාසිටියෙමි.

"ෆෙරර්ස් මෙනෙවිය" ඔහු කීය. "මං හිතනවා මගේ පයිප්පය දල්වා ගැනීම ගැන ඔබේ විරුද්ධත්වයක් නැහැ කියලා. අපි කොයිතරම් සැපෙන්, සතුටෙන් ජීවත්වුණත්, කවදාහරි මරණයේ පණිවුඩය ගෙනඑන මාරදූතයින් හමුවෙන්න සිදුවෙනවා. ඒක අප කාටත් පොදුයි. එදාට අපි කැමැති වුණත් අකමැති වුණත් අපට මාරයා සමග යන්න වෙනවාමයි. මං හිතන්නේ නෑ ඔබ මේ මැදිවයසේ මහත්වරු දෙන්නෙක් හමුවෙන්න බේකර් වීදියට ඇවිත්, පැයකට වඩා රස්තියාදු වුණේ, මාරදූතයින් ගැන දැනගන්න කියල. එහෙම නෙමෙයි. ඔබේ ගැටලුව මොකක්ද කියලා මට මුල ඉඳලම කියන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබට හිතෙනවා ඇති, මං හරි මෝඩ ගැහැනියක් කියල" ඇය පවසද්දී, ඇගේ මුහුණ ලැජ්ජාවෙන් රතුවිය. "ඒ වුණත්...... ඒ වුණත්....... මා භීතියෙන් උමතු කළ මගේ කතන්දරය ඔබ ඇහුවොත්..... ඔබට හිතේවි මට දූනටමත් පිස්සු හැදිල කියල."

"මං සහතික වෙන්නම්, අපි ඔබව සිනාවට ලක් නොකරන බවට."

කාමරයේ සිවිලිම දෙස බලාගත් තරුණිය, මිනිත්තු දෙක තුනක් නිසලව සිටියාය. සිත තුළ අවුල්වී තිබූ කරුණු එක් පිළිවෙළකට සකසා ගැනීමට, ඇය උත්සාහ කරන්නට ඇත. අනතුරුව ඇය පහත සඳහන් විස්තරය අපට පැවසුවේ ඉතා පැහැදිලි හඬිනි.

"හැම්ෂයර් ප්‍රාන්තයේ ඇබට්ස්ටෑන්ඩ්හි ජොෂුවා ෆෙරර්ස් ගේ එකම දරුවා මා බව, ඔබට මුලින්ම කියන්නම්. මීට අවුරුදු කිහිපයකට පෙර ඔබට හමුවූ ෂොස්කෝම්බ් පරණ වළව්වේ සර් රොබට් නෝබටන් ඔබට මතක ඇති. ඔහු මගේ පියාගේ ඥාති සොහොයුරෙක්. මගේ මේ කරදර උත්සන්න වෙලා, තවත් දරාගන්න බැරි තත්ත්වයකට ආවා. එතකොට රොබට් මහප්පා තමා කිව්වේ මට ඇවිත් ඔබව හමුවෙන්න කියලා."

මෙතෙක් වේලා දෙනෙත් පියාගෙන කථාවට සවන්දෙමින් සිටි හෝම්ස්, දෙනෙත් විවෘත කළේය. ඔහුගේ කටේ තිබූ දුම් පයිප්පය ඉවතට ගත්තේය.

"ඔබ ලන්ඩන් නගරයට ආවෙ ඊයෙ රාත්‍රි නේද? ඉතින් ඊයේ රෑම මා හමුවෙන්න එන්නෙ නැතිව, අද උදේ වෙනතුරු හිටියෙ ඇයි?" හෝම්ස් ඇසීය.

ෆෙරර්ස් මෙනෙවිය ඒ ප්‍රශ්නයෙන් තිගැස්සුණු බව මම දුටුවෙමි.

"ඊයේ රෑ ලන්ඩනයට ආවත් මහප්පා සමග රාත්‍රි ආහාරය ගනිද්දී තමා, ඔහු ඔබ හමුවෙන්න යෝජනා කළේ. නමුත් ඔබතුමා ඒ බව දූනගත්තේ කොහොමද කියල, මට තේරුම්ගන්න අමාරුයි......."

"ඔබේ හැට්ටයේ දකුණු අත, කළු පැහැති කුඩු සහිත සියුම් දූවිල්ලකින් වැසී තිබෙනවා. ඒක හැම්ෂයර් සිට ලන්ඩනයට එද්දී, දුම්රියේ කවුළුවක් අසල අසුනක වාඩිවී සිටීමෙන්, තැන්පත් වූ දූවිලි බව පැහැදිලියි. නමුත් ඔබේ පාවහන්, ඉතාම පිරිසිදුව, දීප්තිමත්ව බැබලෙමින් තිබෙනවා. ඒකෙන් පෙනෙන්නේ ඔබ ඊයේ රාත්‍රි හෝටලයක නවාතැන් ගෙන තිබෙනවා. පාවහන් ඔපදැමීම එහිදී අද

http://sherlockholmesinvestigations.blogspot.com

උදේ කළ එකක් බවට සැක නෑ. හොඳයි. ඔබේ කථාව දිගටම කියන්න."

සුසුමක් හෙළා ළය සැහැල්ලු කරගත් තරුණිය යළිත් කථාව පටන් ගත්තාය.

"මගේ තාත්තා, මගේ අම්මා සමග ඔවුන්ගේ ජීවිත කාලයෙන් සැහෙන කොටසක් ගතකළේ ඉතාලියට තුදුරු සිසිලි දූපතේ. මගේ අම්මාට ඇගේ පියාගෙන් උරුම්වුණු මිදි හා ඔලිව් වතු ගණනාවක්ම මගේ දෙමව්පියන් සතුව තිබුණා. අම්මාගේ මරණයෙන් පස්සේ, තාත්තාට එහේ ජීවිතය එපාවුණා. ඔහු අප සතුව තිබූ ඉඩම් සියල්ල විකුණා දමලා, විශාල මුදල් සම්භාරයක් අරගෙන, අපි එංගලන්තයට පැමිණියා. මෙහේදී අපි අවුරුද්දකට වැඩිකාලයක් තිස්සේ රටේ තැනින් තැනට ගියා. ඒ තාත්තාගේ කැමැත්තට ගැළපෙන ගෙයක් හොයාගන්න බැරිව. ඔහුට තිබුණේ අමුතුම තාලේ රුචි අරුචිකම්. අන්තිමේදී ඔහුගේ සිත් ඇදගත් නිවසක් අපට ලැබුණා. ඒ නිව්ෆොරස්ට් පෙදෙසේ, ඇබට්ස්ටෑන්ඩිංහි."

"මොහොතක් ඉන්න මෙනෙවිය. මොනවද ඔහුගේ මේ රුචි අරුචිකම්?"

"මගේ තාත්තා බොහොම නිශ්ශබ්ද, තමන්ගේ පාඩුවේ ඉන්න කැමැති කෙනෙක්" ඈය කීවාය. "හැම දෙයකටම වඩා ඔහු හොයා බැලුවේ, ලොකු ජනගහනයක් නැති පාළු පළාතක්. අපේ ගෙදර තිබිය යුත්තේ, දුම්රියපොළකට සැහෙන දුරින් විය යුතුයි කියලයි ඔහු කිව්වේ. ඔහොම හොයද්දී අපට හමුවුණා බෝලියු නම් ගම්මානයෙන් විශාල නිවසක්. ඒක ඈබට්ස් පරම්පරාවට අයිති, බොහොම පැරණි වළව්වක්, ඒක අවුරුදු ගණනාවක් තිස්සේ පාවිච්චියට නොගත් නිසා, ගරාවැටී අබලන් වුණු එකක්. ඒක හොඳින් අලුත්වැඩියා කරල අපි එහේ පදිංචිවුණා. ඒ අවුරුදු පහකට කලින්. එදා ඉඳල අද දක්වාත් අපි ජීවත්වෙන්නේ, ස්වභාවයක් නොදන්නා, නමක් නොදන්නා, මහා බිහිසුණු හෙවණැල්ලකට භයෙන්."

"ස්වභාවයක් දන්නෙත් නැත්නම්, නමක් දන්නෙත් නැත්නම් මොකකටද ඔබ ඔය තරම් භයවුණේ? එහෙම දෙයක් තිබෙන බව දැනගත්තේ කොහොමද?"

"මට ඒක තේරුණේ අපි ජීවිතේ ගෙනගිය පිළිවෙළින්. අසල්වැසියන් කිසිම කෙනෙක් එක්ක ආශ්‍රයක් කරන්න තාත්තා

http://sherlockholmesinvestigations.blogspot.com

අපට ඉඩදුන්නේ නෑ. ගෙදරට උවමනා කරන කිසිම බඩුවක් ගමේ වෙළඳ පොළෙන් මිලට ගත්තෙත් නෑ. ඒ හැමදෙයක්ම ලින්ඩ්හර්ස්ට් නගරයෙන් බඩු ප්‍රවාහණය කරන අශ්වකරත්ත මගින් ගෙන්වාගත්තා. මුළු ගෙදරටම ඉන්නේ සේවක සේවිකාවන් තුන්දෙනයි. ප්‍රධාන ගෘහසේවකයා මැකිනි නම් මැදිවියේ කෙනෙක්. ඔහු කිසිවෙකු නුරුස්සන, කොයිවෙලෙත් තරහෙන් වගේ ඉන්න අප්‍රසන්න පුද්ගලයෙක්. ඊළඟට ඔහුගේ බිරිඳ සහ ඇගේ සොහොයුරිය ඉන්නවා, ගෘහ සේවිකාවන් හැටියට. තාත්තා මොවුන්ව අපේ ගෙදර සේවයට බඳවා ගත්තේ, ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ නුවරින්."

"එතකොට ගෙයින් පිටත වැඩ කටයුතු සඳහා මෙහෙකරුවන්?"

"එහෙම කිසිවෙක් නෑ. ගෙවත්ත සම්පූර්ණයෙන්ම කැලෑවෙන් වැහිලා යන්න තාත්තා ඉඩහැරියා. දැනටමත් ඒක නොයෙක් ආකාරයේ සතුන් සර්පයන්ගෙන් පිරිලා."

"මේකෙ මොකුත් අසාමාන්‍ය බවක් මට නම් පෙනෙන්නෙ නෑ, ෆෙරර්ස් මෙනෙවිය" හෝම්ස් කීය. "මට පිටිසර ගමක ජීවත්වෙන්න අවස්ථාවක් ලැබුණා නම්, ඇත්තෙන්ම මමත් ජීවත්වෙන්නේ ඔය විදියටයි. කරදරකාරී අසල්වාසීන්ගේ ආශ්‍රයෙන් මිදිලා, සොබාදහමේ සතුන් සහ ගහකොළ එක්ක ඉන්න තියෙනවා නම් මොන තරම් සතුටක්ද? එතකොට ගෙදර ඉන්නේ ඔබේ තාත්තා, සහ සේවක සේවිකාවන් තුන්දෙනා විතරයි?"

"ගෙදර ඉන්නේ එපමණයි" ඇය කීවාය. "නමුත් මේ වත්තේම කුඩා ගෙයක් තියෙනවා. ඒකෙ පදිංචිව ඉන්නේ ජේම්ස් ටොංස්ටන් මහත්මයා. අපි සිසිලියේ ජීවත්වෙද්දී, කාලයක් තිස්සේම තාත්තාගේ මිදිවතු බලාගැනීමේ කටයුතු කරලා තියෙන්නේ මේ මහත්මයා. තාත්තා ආපහු එංගලන්තයට එද්දී ටොංස්ටන් මහත්මයත් ආවා. වතුපාලකයා හෙවත් කලමනාකරුවා හැටියට තමයි තාත්තා ඔහුව පත්කරගෙන ඉන්නෙ."

"හැබෑට?" හෝම්ස් ඇහිබැම ඉහළට නැංවීය. "වත්ත කැලේට වැවෙන්න ඇරලා. වෙන පදිංචිකරුවන් කවුරුවත් ඇත්තෙත් නෑ. නමුත් කලමනාකාරයෙක් ඉන්නවා. ඒ මොකටද? ඒක ටිකක් අසාමාන්‍යයයි."

"ඒ පත්වීම නමට විතරයි හෝම්ස් මහත්මයා." ඇය කීවාය. "ටොංස්ටන් මහත්මයා තමයි තාත්තාගේ විශ්වාසවන්ත හිතවතා.

http://sherlockholmesinvestigations.blogspot.com

මේක රැකියාවක් කිව්වට, සිසිලියේ ඉන්න කාලේ, සෑහෙන කාලයක් කළ උදව් වෙනුවෙන් කෘතඥතා සැලකීමක්."

"ආ ඔව්. ඒක හරි."

"තාත්තා ගෙදරින් එළියට බහින්නේ බොහොම කලාතුරකින්. ඒ බැස්සත් ඔහු අපේ වත්තේ තාප්පයේ සීමාවෙන් පිටතට යන්නේ නෑ. බොහොම ආදරයෙන් බැඳුණු පවුලක, කවුරුත් සහයෝගයෙන් ඉන්නවා නම්, එහෙම ගේ ඇතුළටම වෙලා ජීවත්වීමේ අපහසුකමක් නැහැ. නමුත් අවාසනාවකට වගේ අපේ ගෙදර තත්ත්වය ඊට වඩා වෙනස්. අපේ තාත්තා ළඳවියන් කෙරෙහි භය පුද්ගලයෙක් වුණත්, මට ආදරයක් පෙන්වන කරුණාවන්ත කෙනෙක් නෙමෙයි. ඔහු කාරණා තමන්ගේම හිතේ තියාගෙන, නපුරු විධියට තනියම ක්‍රියව කියවා ඉන්න කෙනෙක්. සමහර වෙලාවට ඔහු දවස් ගණන්, තමන්ගේ කාමරයට වෙලා දොර යතුරු දමාගෙන ඉන්නවා. හෝම්ස් මහත්මයා. ඔබට දැන් හිතාගන්න පුළුවන් නේද මං ජීවත් වී ඉන්නා තත්ත්වය? තරුණියක් ඇගේ ජීවිතයේ හොඳම කාලය මේ විධියට ගතකරන්නේ කොහොමද? තමන්ගේ වයසේ කිසිකෙනෙක් හමුවෙන්න අවස්ථාවක් නොලැබී, මහ කැලෑවක් මැද්දෙ, ගරා වැටුණු මාළිගයක තරුණියක් කොහොමද සතුටින් ජීවත්වෙන්නේ? අපේ ජීවිතය හරිම ඒකාකාරී එකක්. නමුත් මාස පහකට පෙර අපි ඉතාම සුළු සිදුවීමකට මුහුණදුන්නා. එයින් පසු ඇතිවුණු සිදුවීම් දාමය නිසා තමයි, මට ඔබ හමුවෙන්න එන්න සිද්ධවුණේ.

එදා උදෑසන මං ගෙවත්තේ ටිකක් ඇවිදලා, ආපහු ගෙට එද්දියි මෙය දුටුවේ. අපේ ගෙවත්තේ තිබෙන, මගට හොඳටම සමීප ඕක් ගහක කඳට, ඇණයකින් යමක් සවිකර ඇතිබව, මම ඈතට දුටුවා. වඩාත් ළංවී බැලුවාම මට දකින්න ලැබුණේ, එය වර්ණ යෙදූ චිත්‍රයක් බවයි. බැලූ බැල්මට මට පෙනුණේ එය නත්තල් කැරොල් අලංකාර කරන්න හෝ බාල පොත් කවරවලට යොදාගන්නා සිතුවමක් වගෙයි. නමුත් එහි තේමාව වඩාත් වෙනස් එකක්. ඒ විතරක් නෙමෙයි. ඒක ටිකක් හිත කලබල කරන තාලේ එකක්.

පින්තූරයෙන් දක්වුණේ ගස් කොළන් කිසිවක් නැති කඳු ගැටයක්. ඒකෙ පසුබිම රාත්‍රී ආකාසය. කඳු ගැටය දෙපැත්තේ, සුරදූතයන් නවදෙනෙක් කණ්ඩායම් දෙකකට සිටියා. මං ඔවුනට

http://sherlockholmesinvestigations.blogspot.com

සුරදූතයන් කිව්වේ ඔවුන්ගේ සිරුරු වල, අර ආගමික චිත්‍රවල ආකාරයට පියාපත් තිබුණු නිසා. මං මේ චිත්‍රය දිහා බලාගෙන හිටියේ හරිම පුදුමයෙන්. ඒ මොකද මේකෙ මොකක්දෝ නොගැළපෙන, නුහුරු බවක් මට තේරුණා. නමුත් ඒ මොකක්ද කියල වටහා ගන්න, මට මොහොතක් ගතවුණා. ඒ තමයි සාමාන්‍යයෙන් චිත්‍රවල සුරදූතයන්ගේ ඇඳුම් ලෙසින් තියෙන්නේ ඉතාම වර්ණවත් අලංකාර රෙදි. නමුත් මොවුන් ඇඳගෙන සිටියේ, මළගමකට යනකොට අඳින විධියේ කළුම කළු රෙදි. ඔවුන් සිටියේ එක් පැත්තක හයදෙනෙක් හා අනෙක් පැත්තේ තුන්දෙනෙක්. චිත්‍රයේ පහළින් ලියා තිබුණා "හයයි තුනයි" යනුවෙන්."

ෆෙරර්ස් මෙනෙවිය තම දීර්ඝ කථාව ස්වල්ප වේලාවකට නැවැත්වූවාය. මම හෝම්ස් දෙස බැලීමි. ඔහු සිටියේ දෙනෙත් පියාගෙන, කථාවට දැඩි අවධානයක් යොමුකරගෙනය. ඔහුගේ පයිප්පයෙන් දුම්වළලු ඉහළට නැගෙමින් තිබිණි. එයින් මා තේරුම් ගත්තේ, මේ ගැටලුව හෝම්ස්ගේ සිත් ඇදගැනීමට සමත් වී ඇතිබවයි.

"මට එක්වරම හිතුණේ" ඇය කථාව යළි ඇරඹුවාය. "මේක අපට කෑම ද්‍රව්‍ය සපයන මනුස්සයා, ලින්ඩ්හර්ස්ට් සිට අරගෙන ආ අලුත් මෝස්තරයක දින දර්ශනයක් වෙන්න ඇති කියලයි. ඉතින් මං එය ගළවා අතට අරගෙන, ආපහු ගෙට ගියා. මගේ කාමරය තියෙන්නේ තිවසේ ඉහළ මාලයේ. මං උඩට නගිද්දී තරප්පුවේදී මට තාත්තා හමුවුණා."

"අපේ ගෙදරට එන පාරේ ගහක, මෙන්න මේ පින්තූරය සවිකරලා තිබුණා" මං කීවා. "ලින්ඩ්හර්ස්ට් වලින් බඩු ගෙනෙන මිනිහාගේ වැඩක් වෙන්න ඇති. මැකිනි ලවා ඒ මිනිහට දැනුම් දුන්නොත් හොඳයි, මේ වගේ දේවල් තැන් තැන්වල අලවන්නේ නැතුව, බඩුත් එක්ක භාරදෙන්න කියලා. මට නම් හිතෙන්නේ මේ සුර දූතයන්ගේ ඇඳුම්, කළු පාටින් නැතුව සුදු හෝ වෙනත් පාටකින් දුම්මා නම් ලස්සනයි. එහෙම නේද තාත්තෙ?"

මගේ කටින් ඒ වචන පිටවුණා විතරයි, ඔහු මගේ අතින් ඒ චිත්‍රය උදුරාගත්තා. තත්පර කිහිපයක් ඔහු ඒ දිහා බලාගෙන හිටියේ වචනයක් වත් කථාකරගන්න බැරිව. ඊළඟට ඔහුගේ මුහුණ සම්පූර්ණයෙන්ම සුදුමැලිවුණා. දෑත් වෙව්ලන්න පටන්ගත්තා. නළලෙන් ඩහදිය ගලන්න පටන්ගත්තා.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි තාත්තේ?" මං ඇහුවේ ඔහුගේ අත්දෙකෙන්ම අල්ලා ගනිමින්.

"මාර දූතයෝ!" ඔහුගේ කටින් පිටවුණා. ඔහු අතිශයින්ම භීතියට පත්වුණු බව මට පෙනුණා. මගේ අත ගසල දමල, ඔහු තමන්ගේ කාමරයට දුවල ගිහින් දොර වසාගත්තා. එහි ඇතුළතින් යතුරු දමාගත් හඬ මට ඇසුණා.

එදා ඉඳල මගේ තාත්තා ගෙදරින් එළියට බැස්සේ නෑ. ඔහු කාලය ගත කළේ කාමරය ඇතුළට වෙලා, කියවමින් හෝ ලියමින්. එහෙමත් නැත්නම් ජේම්ස් ටොංස්ටන් සමග දීර්ඝ සාකච්ඡාවල යෙදෙමින්. ටොංස්ටන් මහත්මයගේ හැමවිටම තිබුණු ශෝකාකුල මුහුණ, ඉන්පසු තාත්තාගෙනුත් දිස්වුණා. මට තාත්තව දකින්න ලැබුණේ කෑම ගන්නා වෙලාවලදී විතරයි. මෙම සිදුවීම නිසා මගේ හිතේ ඇතිවුණේ, ඉවසා දරාගන්න බැරි ශෝකයක් හා කම්පාවක්. එක් හිතවත් කාන්තාවක් නිසා නොවෙන්න, මගේ මොළේ නරක් වී මා උමතුවෙන්න ඉඩ තිබුණා. මේ උතුම් හදවතක් ඇති කාන්තාව තමයි නෝඩ්හැම් මහත්මිය. ඇය තමා අපේ පළාතේ දොස්තර මහත්මයාගේ බිරිඳ. වාසනාවකට වගේ ඇය සතියකට දෙතුන් වතාවක් මාව දකින්න අපේ ගෙදරට ආවා. අසල්වාසී කෙනෙක් මේ විදියට අපේ ගෙදරට පැමිණීම ගැන, තාත්තාගේ නම් කිසිම කැමැත්තක් තිබුණේ නැහැ. ඔහු ඒක හැඳින්වූයේ, අපේ පෞද්ගලික ජීවිතයට, බාහිර ඇඟිලි ගැසීමක් ලෙසයි.

සති කිහිපයකට පස්සේ තවත් සිදුවීමක් වුණා. හරියටම කියනවා නම් ඒ පෙබරවාරි 11 වැනිදා. උදේ කෑම වේල අවසන් කළාට පස්සේ, මැකිනි නම් අපේ සේවකයා මා හමුවෙන්න ආවා. ඔහුගේ මුහුණේ තිබුණේ මහ අමුතුම භාලේ පෙනුමක්.

"මේ සැරේ නම් ලින්ඩ්හර්ස්ට් වලින් බඩු ගෙනෙන එක්කෙනාගේ වැඩක් නෙමෙයි." ඔහු කීවේ හිතේ කණගාටුවෙන්. "කාගේ වැඩක් වුණත් මගේ හිතට හරි නෑ."

"ඇයි මොකක්ද මැකිනි වෙලා තියෙන්නේ?"

"ගිහින් බලන්න ඉස්සරහ දොර දිහා" ඔහු කීවේ ඔහුගේ රැවුළ කසමින්.

මං වහාම ඉදිරි දොර වෙත ගිහින් බැලුවා. එදා අර ඕක් ගහේ කඳට සවිකර තිබූ විදියෙම පින්තූරයක්, අපේ ගෙදර ඉස්සරහ

http://sherlockholmesinvestigations.blogspot.com

දොරට ඇණගසා සවිකර තිබුණා. මේ චිත්‍රයේ පොඩි වෙනසක් තිබුණා. මේකෙ හිටියේ පිහාටු ඇති මාරදූතයින් හයදෙනයි. චිත්‍රය පහළ 6 ඉලක්කම ලියා තිබුණා.

මං ඒක ගළවලා අතට අරගෙන ඒ දිහා බලාගෙන හිටියා. මගේ හදවත හිරිවැටී ගියාක් මෙන් වේදනාවක් මට දැනුණා. එක්වරම මා පිටුපසින් අතක් ඉදිරියට ඇවිත්, චිත්‍රය මගේ අතෙන් උදුරාගත්තා. ආපසු හැරී බැලූ මට දකින්න ලැබුණේ මා පිටිපස සිටි වොංස්ටන් මහත්මයා?

"මේක ඔබ වෙත යොමුකෙරුණු එකක් නෙමෙයි ෆෙරර්ස් මෙනෙවිය" ඔහු කිව්වා. "ඒ ගැන ඔබ දෙවියන් වහන්සේට ස්තුති කළ යුතුයි."

"මොකක්ද මේකෙ තේරුම?" මං ඇහුවා. "මේක ඇවිත් තියෙන්නෙ මගේ තාත්තාටද? මේක මොකක් හරි බිහිසුණු දෙයක් නම්, ඇයි අපි පොලිසිය කැඳවන්නෙ නැත්තෙ?"

"ඒ අපට පොලිසිය උවමනා නැති නිසා" ඔහු කිව්වා. "මං කියන දේ විශ්වාස කරන්න ෆෙරර්ස් මෙනෙවිය. පොලිසිය නැතිවුණාට අපට පුළුවනි ඔය ප්‍රශ්නය විසඳගන්න."

එහෙම කියලා වහාම ආපසු හැරුණු ඔහු ගේ ඇතුළට ගියා. ඒ චිත්‍රය ගෙනයන්න ඇත්තෙත් තාත්තට පෙන්වන්න වෙන්න ඇති. ඒ මොකද ඊළඟට සතියක් යනතුරු, මට මගේ තාත්තාව ඇහින් දකින්නවත් ලැබුණෙ නැහැ."

"මොහොතකට නවතින්න" හෝම්ස් කථාවට බාධාකළේය. "අර ඕක් ගහේ චිත්‍රය සවිකර තිබුණු දිනය, හරියටම කවදාද කියා ඔබට මතකද?"

"ඔව්. ඒ දෙසැම්බර් 29 වැනිදා."

"හරි. ඔබ කිව්වා දෙවැනි චිත්‍රය දකින්න ලැබුණේ පෙබරවාරි 11 වැනිදා බව. ස්තුතියි. දැන් ඔය සිත්ගන්නාසුලු කථාව දිගටම කියන්න."

"ඊට සති දෙකකට පස්සේ එක දවසක් හැන්දෑවේ ඇඳිරි වැටෙද්දී, මම තාත්තත් එක්ක ඊ කෑමට වාඩිවුණා. මං වාඩිවෙලා හිටියෙ ඔහු හිටිය පැත්තට මුහුණදාලා. එදා මහ දරුණු විදියට කුණාටු සුළං හැමූ දවසක්. විදුලි කොටමින්, මුළු පළාතම දෙදරන්න හෙණ පුපුරමින්, ධාරානිපාත වර්ෂාවක් කඩා හැළෙන්න

http://sherlockholmesinvestigations.blogspot.com

පටන්ගත්තා. ගේ ඇතුළට හමා ආ වේගවත් සුළඟ, දුම්කවුළු තුළින් එළියට හමාගියේ, මහ අඳෝනා හඬක් නගමින්. ඒක හරියට මේ වළව්වේ මියගොස් ඇති මිනිසුන්ගේ අවතාර නගන විලාපයක් වගේ. කෑමමේසය ආලෝකමත් වෙන විධියට ඉටිපන්දම් කිහිපයක්ම දල්වා තිබුණා. කෑමවේල අවසන් කළාට පස්සේ තාත්තා හිටියේ ටිකක් අප්‍රසන්න ගතියෙන්. ඔහු වයින් බෝතලයකින් ස්වල්පයක් බොමිනුයි හිටියේ. මා ඉදිරියෙන්, ඒ කියන්නේ ඔහුගේ පිටුපසින් ජනේලයක් තිබුණා. එය තිරරෙදි වලින් ආවරණය වෙලා තිබුණේ නැහැ. සුළඟ සමග ආ වැස්ස ජනෙල් වීදුරුවට වැදෙමිනුයි තිබුණේ. නමුත් එක්වරම ඒ දියපහර ආවරණය කරමින් ජනෙල් වීදුරුවෙන් මට යමක් දකින්න ලැබුණා. ඉටිපන්දම් එළියෙන් මා දුටු ඒ දර්ශනයෙන්, මගේ මුළු ඇඟම හිරිවැටී ගියා. භීතියට පත් මගේ මුහුණ තාත්තා දකින්න ඇති. ඔහු ඇසිපිය නොහෙළා මගේ දෑස්දෙස බලාහිටියා.

ජනෙල් වීදුරුවෙන් මට දකින්න ලැබුණේ මිනිහෙකුගේ මුහුණක්. මුහුණේ පහළ කොටස තම දෑතින් වසාගෙන කුරිරු දෑස් පමණක් මා වෙත යොමු කරගෙනයි සිටියේ.

මගේ මුහුණේ පළවුණු හැඟීම් වලින් තාත්තාට සියල්ල තේරුම් යන්න ඇති. ඉටිපන්දම් සවිකර තිබූ බර ලෝහ ආධාරකය අතට ගත් ඔහු, එය එක්වරම පිටිපස ජනේලය වෙත දමා ගැහුවා.

මහ හඬක් නංවමින් වීදුරු කුඩුවී ගියා. ඒ සමග ගෙට හමා ආ සුළඟත් සමග, ජනෙල් රෙදි වවුලන්මෙන් සුළඟේ පොර බැදූ හැටි දිස්වුණා. ඉතිරිවී තිබූ ඉටිපන්දම් වල එළියත් නිවී යද්දී මට ක්ලාන්ත වෙන්න ඇති. මට සිහිය ඇවිත් බලද්දී, මං හිටියේ මගේ ඇඳේ.

රාත්‍රියේ වුණු සිද්ධිවීම ගැන තාත්තා පසුවදා මොකුත් කීවේ නැහැ. ගමෙන් මිනිහෙක් ගෙන්වලා ජනේලය අලුත්වැඩියා කළා. හෝම්ස් මහත්මයා. දැන් මම මගේ කථාවේ අවසන් කොටසටයි ළඟාවෙන්නේ.

පසුගිය මාර්තු 25 වැනිදා මම තාත්තත් සමග උදේ කෑමට සූදානම් වුණා. කෑම මේසය උඩ අපට දකින්න ලැබුණේ මොකක්ද? අර මාරදූතයන් හයදෙනෙක් හා කුන්දෙනෙක් ඉන්න චිත්‍රය. නමුත් මෙවර චිත්‍රයේ යට මොකුත් ලියල තිබුණේ නැහැ.

මේක දුටු තාත්තා කලබල වුණේ නැහැ. තමාට කිසිම ආකාරයකින් ගැළවීමක් නැති ඉරණමකට මුහුණපාන කෙනෙක්,

http://sherlockholmesinvestigations.blogspot.com

පරාජය පිළිගන්නා අයුරු, ඔහුගේ මුහුණෙන් පිළිබිඹු වුණා. අවුරුදු ගණනාවකට පස්සේ ඔහු මට ආදරයෙන් කරුණාවෙන් කථාකළා.

"අන්තිමේදී ඒක මා වෙතට ඇවිත්" ඔහු කිව්වා. "ඒක එහෙම වුණු එක හොඳයි."

මම තාත්තා ළඟ දණින් වැටිලා ආයාචනා කළා. මං ඔහුට කිව්වා "තාත්තේ පොලිසිය කැඳවලා මේ අභිරහසේ අවසානයක් කරන්න. අපව භීතියට පත්කරන මේ බිහිසුණු අවතාරයෙන් බේරෙන්න අපි නීතියේ ආරක්ෂාව ඉල්ලමු."

"ඒ බිහිසුණු අවතාරයේ සෙවණැල්ල, බොහෝම දුරට අවසන් දරුවා" ඔහු කිව්වා. මීළඟට මොහොතක් නිශ්ශබ්දව සිටි ඔහු තම අත මගේ හිස මත තැබුවා.

"දුව. ඔයා සමඟ කවුරු හරි නාඳුනන කෙනෙකු කථා කළොත්, නැත්නම් ලියුමක් එව්ලා යම් විමසීමක් කළොත්, ඔහුට මේ දෙය කියන්න. කියන්න මගේ පෞද්ගලික දේවල් කිසිවක් ඔබට හෙළිකළේ නැතිබව, මැවුම්කරුවාගේ නාමය තුවක්කුවේ කඳේ ඇති බවත් කියන්න. ඒ වචන ටික මතක තියාගන්න. අනෙක් හැමදෙයක්ම අමතක කරදමන්න. ඔබ ඒ විදිහට කටයුතු කළොත්, වඩාත් සතුටුදායක වාසනාවන්ත ජීවිතයක් ඔබට උදාවේවි." එහෙම කිව් තාත්තා පුටුවෙන් නැගිටලා කෑම කාමරයෙන් පිටවී ගියා.

එදා සිට මගේ තාත්තාව මට ඇහින් දකින්නවත් ලැබුණේ නැති තරමයි. අන්තිමේදී මං හිතට ධෛර්යය ගත්තා. මං මගේ මහප්පට සර් රොබට් නෝබටන්ට ලියුමක් ලිව්වා. මං කිව්වා මට ඔහු හමුවෙන්න උවමනා බව. ඊට පස්සේ වෙනත් කෙනෙකු හමුවෙන්න යන බව හඟවමින්, ඊයේ මං ගෙදරින් පිටවී ලන්ඩනයට ආවා. මගේ කථාවේ මුලහරිය අහද්දීම මහප්පා කිව්වා, සම්පූර්ණ කථාන්තරයම ඔබට හෙළිකරන්න කියලා."

හෝම්ස්ගේ මුහුණේ දකින්නට ලැබුණේ දැඩි කම්පාවකට පත් බවකි. නළල රැළි කරගෙන මොහොතක් කල්පනා කළ ඔහු හිස දෙපසට සෙලවූයේ සියලු බලාපොරොත්තු කඩවී ගිය අයුරෙනි.

"මෙරිස් මෙනෙවිය" ඔහු කීය. "කිසිවක් සඟවන්නේ නැතිව ඔබට ඇත්ත තත්ත්වය හෙළිකරන එක හොඳයි කියලයි මට හිතෙන්නෙ. දැන් ඉතින් ඔබ අලුත් ජීවිතයක් ගැන සිතා බැලිය

http://sherlockholmesinvestigations.blogspot.com

යුතුයි. ඔබට ලන්ඩනයේ පදිංචි විය හැකිනම් වඩාත් හොඳයි. ඔබේ වයසේ අලුත් මිතුරුමිතුරියන් ඇතිකර ගැනීම, ලන්ඩනයේදී වඩාත් පහසුවේවි."

"එතකොට මගේ තාත්තා?"

එම ප්‍රශ්නයට පිළිතුරු නොදී හෝම්ස් තම අසුනෙන් නැගිට්ටේය.

"දොස්තර වොට්සනුයි මමයි දැන් එනවා ඔබ සමග හැම්ෂයර් වෙත යෑමට. සිද්ධවීමට ඉඩ ඇතිදේ අපට වළක්වන්න බැරිවුණොත්, ඒකට පළියගන්නවත් අපට හැකිවේවි."

"හෝම්ස්!" මට කෑගැසුණේ ඔහු අදහස් කළ දෙය තේරුම් ගත්විටය.

"අපි ප්‍රමාද වැඩියි වොට්සන්" මගේ මිත්‍රයා කීවේ ෆෙරර්ස් මෙනෙවියගේ උරහිස මත් අත තබමිනි. "ඇගේ පියාගේ ජීවිතය ගළවාගන්න මට හැකියාවක් නැහැ. ඉතින් ඇයට හිස් බලාපොරොත්තු ඇතිකරගන්න ඉඩදීම ලොකු වංචාවක්. ඊට වඩා හොඳයි, සත්‍යය වටහාගෙන එයට මුහුණදීම."

"මොකක්ද සත්‍යය?" මම ඇසීමි. "මනුස්සයෙක් එක පයක් මිනීවළෙත් තවත් එකක් ගොඩ තියාගෙනත්, ජීවත් වෙන්න සටන් කරනවා."

හෝම්ස් මා වෙත හෙළුවේ විමතියට පත් බැල්මකි.

"ඒක හැබෑවයි වොට්සන්" ඔහු කීය. "ඒත් අපි යථාර්ථයට මුහුණදිය යුතුයි. එහෙනම් අපි තවත් කාලය නාස්ති නොකර හැම්ෂයර් බලා යමු. අවශ්‍යම දේවල් ටිකක් ගමන් මල්ලකට දමාගන්න."

මම මගේ කාමරයට ගොස් අත්‍යවශ්‍ය ඇඳුම් ඇතුළු දේවල් කිහිපයක්, ගමන් මල්ලක අසුරාගත්තෙමි. මේ අතරේ හෝම්ස් මගේ කාමරයට පැමිණියේය.

"වොට්සන්. ඔබේ රිවෝල්වරයත් ගත්තොත් නුවණට හුරුයි."

"අන්තරායකට මුහුණදෙන්න වේවි කියල ඔබ හිතනවද?"

"මාරාන්තික අනතුරකට වොට්සන්" ඔහු කීවේ තම නළලට තට්ටු කරමිනි. "දෙවියනේ! ඇය තව එක දවසක් කලින් ආවා නම්......."

විසිත්ත කාමරයට අප පිවිසෙද්දී හෝම්ස් තම පොත් රාක්කයෙන් කුඩා පොතක් සාක්කුවට දමාගත්තේය. මීළඟට ඔහු

http://sherlockholmesinvestigations.blogspot.com

තම ගමන්කබාය හැඳගෙන, විදුලිපණිවුඩ පෝරමයක් ගෙන, එහි යමක් ලියුවේය. අප පහළට බසිද්දී ඔහු එය හඩ්සන් මහත්මිය අතට දුන්නේ "හඩ්සන් මහත්මිය කරුණාකර මේක ඉක්මනින් යවන්න" කියමිනි.

අශ්වකරත්තයක නැඟී, අපි වෝටලූ දුම්රියපොළට ළඟාවූයෙමු. මඳවේලාවක් යද්දී, බෝන්මත් බලායන දුම්රියක් අල්ලාගැනීමට අපට හැකිවිණි.

මෙම දුම්රිය ගමන, සිත ශෝකාකුල හැඟීම් වලින් බරකළ එකක් ලෙස මගේ මතකයේ රැඳී ඇත. ඉහෙල් කවුළුවකට සමීපයෙන් හිඳගත් හෝම්ස්, තම දෑස ද වැසෙන සේ හිස්වැස්මේ ඉදිරිකොටස පහළට ඇදගත්තේය. මිළඟට ඇඟිලි තුඩුවලින් වරින් වර කවුළුවට තට්ටු කරමින් ඔහු දිගින් දිගටම කල්පනා කළේය.

ඩැෆ්නි ෆෙරර්ස් මෙනෙවියට කණගාටුදායක ඉරණමකට මුහුණපාන්නට සිදුවී ඇතැයි, හෝම්ස්ගේ කථාවෙන් හෙළිවිණි. ඇගේ සිත් සනසනු යමක් කීමේ අටියෙන්, මම ඇය සමග කතාබහක් ඇරඹීමට උත්සාහ කළෙමි. මගේ ප්‍රශ්නවලට ඇය ඉතා කාරුණිකව පිළිතුරු දුන්නාය. එහෙත් ඇගේ කැලැඹුණු මනස පිරී ඇත්තේ, වෙනත් සිතිවිලි වලින් බැව් මට පෙනී ගියේය.

පැය දෙකක ගමනකින් පසු දුම්රිය ලින්ඩ්හර්ස්ට් දුම්රියපොළට ළඟාවීම සතුටට කරුණක් විණි. අප දුම්රියෙන් බැස දුම්රිය පොළෙන් එළියට ඒමට සූදානම් වූවා අමණි. ප්‍රසන්න පෙනුමක් ඇති කාන්තාවක් ඉක්මන් ගමනින් අප ඉදිරියට ආවාය.

"මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයද?" ඇය ඇසුවාය. "දෙවියන්ට ස්තුතිවේවා! ඔබේ විදුලි පුවත් ප්‍රමාදයක් නැතිව මා වෙත ලැබුණා.... අනේ ඩැෆ්නි!"

"නෝඩ්හැම් මහත්මිය! ඇයි? ...... .... මට මේ මොකුත් තේරුම් ගන්න බැහැ?"

"ෆෙරර්ස් මෙනෙවිය" හෝම්ස් කීය. "ඔබේ හිතවත් මිතුරිය නෝඩ්හැම් මහත්මියගේ රැකවරණය මේ වෙලාවෙ ඔබට අවශ්‍යයි. ඔබව ඇයට භාරදෙන්න ලැබීම අපට ලොකු පහසුවක්. මහත්මිය. මං දන්නවා. ඔබ ඇයව හොඳින් බලාගනීවි. අපි යමු වොට්සන්."

කුඩා අශ්වකරත්තයක් කුලියට ගෙන අපි දුම්රියපොළෙන් පිටත්වී ගියෙමු. ගැමි නිවාස වලින් වටවුණු, යම් තරමකට නාගරික

http://sherlockholmesinvestigations.blogspot.com

කරණයට ලක්වෙමින් තිබූ, ලින්ඩ්හර්ස්ට් ගම්මානයෙන් අපි ඉක්මනින් ඉවත්වී ගියෙමු. මීළඟට කඳු නගිමින්, කඳු බසිමින් අපට ගමන් කිරීමට සිදුවී තිබුණේ, මග දෙපස ගහකොළෙන් වැසුණු කැලෑබද පෙදෙසකය. මේ බෝලියු ගම්මානය බව රියැදුරා කීය. එහි නිවසක් දක්නට ලැබුණේ ඉඳහිටය. තවත් සැතපුම් කිහිපයක් ඉදිරියට යද්දී අපට පෙනී ගියේ, මෙය බොහෝදුරට මිනිස් වාසයෙන් තොර පෙදෙසක් බවයි. එක් කඳු මුදුනකට ළඟාවෙද්දී, අපි ඇතින් පිහිටි ජලාශයක් සහ බෝලියු දේවමැඳුරේ නටබුන් ද දුටුවෙමු. මෙතැන් සිට අපට වඩාත් දුෂ්කර මගක ගමන්කිරීමට සිදුවිය. එහි අශ්වකරත්තය පවා ගමන් කළ හැකිවූයේ අපහසුවෙනි. පාර දෙපස වැඩී තිබුණු යෝධ ඕක් ගස්වල අතු, පාරට ඉහළින් එකිනෙක පැටලී, නියම වනාන්තරයක පෙනුමක් ගෙන ආවේය. පොළොවට ඉර එළියක් නොවැටෙන තරමට වැවී තිබුණු තුරුලතා නිසා, අප ගමන් කළේ මිනිස් වාසයකින් තොර ඝන වනාන්තරයක් තුළට දැයි මට විටෙක සිතිණි.

"මං හිතුව වගේ තමයි" හෝම්ස් කීය. ඔහු එලෙස පැවසුවේ අප ගමන් කළ දිශාවටම, අපට බොහෝ ඉදිරියෙන් පාපැදියක ගමන් කරමින් සිටි පොලිස් භටයෙකු පෙන්වමිනි. පාර අවසන් වූ තැන ගේට්ටුවක් විය. එය විවෘතව තිබිණි. එතැනින් අප පිවිසියේ මිනිස් පහසක් නොලැබූ බවක් පෙන්නුම් කළ ගෙවත්තකටය. ඊට මඳක් ඔබ්බෙන් ගරා වැටුණු පුරාණ විලව්වක ඉස්තෝප්පුව දැකගත හැකිවිය. ඒ අසල වූ කණාටු සෙඩාර් ගහක් යට, කිහිපදෙනෙක් කතාබස් කරමින් සිටියහ. අශ්වකරත්තයෙන් බැස අපි ඒ දෙසට ගමන් කළෙමු.

එතැන සිටි කිහිපදෙනා වූයේ කළු පැහැති බෑගයක් අත තිබූ මහත්මයෙකු, මුහුණ පුරා රැවුලක් වවාගත්, දුඹුරු පැහැති ඇඳුම් කට්ටලයකින් සැරසුණු වයස්ගත පුද්ගලයෙකු සහ පාපැදියෙන් පැමිණි පොලිස්භටයා ය. සෙඩාර් ගස මුල දක්නට ලැබුණු දර්ශනයෙන් මම භීතියට පත්වීමි.

ගස මුල වයස්ගත අයෙකුගේ මළසිරුරක් විය. ඔහු දෑත් දෙපසට විහිදාගෙන සිටි අතර, ඇඟිලි වලින් පොළොවේ පඳුරු තදින් ග්‍රහණය කරගෙන සිටියේය. ඔහුගේ මුහුණ ඉතා අසාමාන්‍ය ලෙස ඉහළට නැමී තිබුණේ දිගු රැවුලෙන් මුහුණේ පෙනුම ආවරණය වන

http://sherlockholmesinvestigations.blogspot.com

ලෙසය. ඇතුළත තිබූ අස්ථි ද දිස්වන සේ, ඔහුගේ උගුර හරහා තිබුණේ බිහිසුණු කැපුම් තුවාලයකි. ඒ අවට ගලාගිය ලේ වලින් භයානක චිත්‍රයක් මැවී තිබිණ. අප එතැනට ළං වෙද්දී කළු පැහැති බෑගයක් අතින් ගත් පුද්ගලයා ඉදිරියට ආවේය. ඔහු මෙම ප්‍රදේශයේ වෛද්‍යවරයා බව අපි තේරුම් ගතිමු.

"මේක මහා බිහිසුණු අපරාධයක් ෂර්ලොක් හෝම්ස් මහත්මයා" ඔහු කීය.

"ඔබේ විදුලි පුවත ලැබුණු ගමන්ම, මගේ බිරිඳ ඉක්මනටම දුම්රියපොළට ගියා. ෆෙරර්ස් මෙනෙවිය හමුවෙන්න වෙලා ඇතිව ඇය එහේට ළඟාවෙන්න ඇති කියල මං විශ්වාස කරනවා."

"ඔබට ස්තුතියි දොස්තර මහත්මයා. අප එද්දී නෝඩ්හැම් මහත්මිය දුම්රිය පොළට ඇවිත් හිටියා. කල්වේලා ඇතිව මට මෙහේට එන්න බැරිවුණු එක ගැන කණගාටුයි." හෝම්ස් කීය.

"මහත්මයා. මට පේනෙන්නේ ඔබ මේ අපරාධය සිදුවෙන බව කලින් දැනහිටියා වගෙයි?" පොලිස් භටයා කීවේ අප වෙත සැක සහිත බැලුම් හෙළමිනි.

"ඔව්. මං දැන හිටියා. ඒ නිසයි ආවෙ."

"මං කැමතියි දැනගන්න මේ අපරාධය......" පොලිස් භටයා හෝම්ස්ගෙන් ප්‍රශ්නකිරීමට උත්සාහ කළේය.

මගේ මිත්‍රයා පොලිස් භටයා පසෙකට කැඳවා ඔහුගේ කනට කර යමක් කීය. ඔහු ඊට එකඟව හිස සලන හැටි මම දුටුවෙමි.

"ඔබ කැමැති හැටියකට එය සිදුවේවි මහත්මයා. ඊළඟට ටොංස්ටන් මහතාගේ කට උත්තරය යළිත් වරක් ඔබට කියාවි."

දුඹුරු පැහැති ඇඳුම් කට්ටලයෙන් සැරසී සිටි වයස්ගත තැනැත්තා. ඔහුගේ අළු පැහැති දෙනෙත් අප [illegible]ත යොමු කළේය.

"ඒ මොකටද මං කට උත්තරය තව් තවත් අයට කියන්නේ? කීබල් මහත්මයා. මෙතැන පොලිස් රාජකාරි කරන්නේ ඔබ නේද? මං මගේ කට උත්තරය ඔබට දීල අවසන්. ඕකට තවත් එකතු කරන්න අමතර දෙයක් මා ළඟ නෑ. ෆෙරර්ස් මහත්මයාගේ දිවිනසාගැනීම ගැන ඔබේ වාර්තාව ඉහළ නිලධරයනට යවන්න."

"සිය දිවි නසාගැනීම?" හෝම්ස්ගේ කටින් පිටවූයේ එක් නිමේෂයකිනි.

"ඇයි වෙන මොකක්ද?" "දැන් සති ගණනක් තිස්සේ ඔහු, ගේ ඇතුළටම වෙලා කණගාටුවෙන් කල්පනා කර කර හිටියා. මේ

http://sherlockholmesinvestigations.blogspot.com

ගෙදර ඉන්න හැමෝම ඒ බවට සාක්ෂි කියාවි. දැන් සියතින්ම දිවි නසාගෙන."

"හ්ම්" කී හෝම්ස් මළසිරුර අසල දණගසා ගත්තේය. "මේ තියෙන්නේ ඔහු යොදාගත් ආයුධය වෙන්න ඇති. සත්ත්ව අඟකින් තැනූ සුදු මිටක් සහිත, අකුලන්න පුළුවන් තලයක් ඇති පිහියක්. මේක ඉතාලියේ සෑදූ පිහියක්. ඒ බව මට ඇක නැතුව කිය හැකියි."

"ඔබ කොහොමද ඒක දන්නෙ?"

"මිලාන් නගරයේ පිහි නිෂ්පාදකයෙකුගේ මුද්‍රාව තිබෙනවා, මේ තලයේ. නමුත්..... මේ මොකක්ද? ඔහෝ! ඒකත් අපූරු දෙයක්!"

දණගසා සිටි තැනින් නැගීසිටි හෝම්ස්, බිම තිබී ඔහු අතට ගත් උපකරණය දෙස පරීක්ෂාවෙන් බැලීය. එය කෙටි ගිනිබටයක් සහිත රයිෆලයකි. කොකා ගස්සන තැනට මඳක් පිටපසින් දෙකට කපා, එය සකස්කර තිබුණේ දෙකට නැමීමට හැකි අයුරෙනි.

"මේක තිබුණේ ඔහුගේ හිස ළඟ" පොලිස් භටයා කීය. "ඔහුගේ ජීවිතයට තිබුණු අවදානම දැනගෙන, ඔහු මේක කොයි වෙලෙත් ළඟ තබාගන්න ඇති."

හෝම්ස් හිස සෙලවූයේ එම අදහසට එකඟ නොවන බව හඟවමිනි. "මේකෙ උණ්ඩ පුරවා නැහැ" ඔහු කීය. "ඔබට පෙනෙනවා ඇති, මේකෙ ආලේප කළ ග්‍රීස් පවා එහෙමම තිබෙන හැටි. ආ මේ මොනවද? වොට්සන් කරුණාකරල ඔබේ ලේන්සුව හා පැන්සල මා අතට දෙන්න."

"ඒක ආයුධයේ කාණුව පිරිසිදු කිරීමට කුරක් දැමීමට ඇති සිදුර" වොංස්ටන් කීය.

"ඒක මම දන්නවා. ෂඃ මේක හරි අපූරු දෙයක්" කී හෝම්ස්, පැන්සල වටේ ලේන්සුව ඔතා, එය සිදුර තුළට දමා යළි ඉවතට ගත්තේය. "ලේන්සුවේ මොකුත්ම නැහැ" හෝම්ස් කීය.

"ඇයි මොකක් තියේවි කියලද ඔහේ බලාපොරොත්තු වුණේ?" වොංස්ටන් ඇසීය.

"දූවිලි."

"දූවිලි?"

"ඔව් මේ සිදුරේ මොකක් හරි සඟවල තිබිල තියෙනවා. ඒකයි මේකෙ ඇතුළත දූවිලි නැතුව පිරිසිදුවට තියෙන්නෙ. මං කැමැතියි වොංස්ටන් මහත්මයා ඔබ සමග වචන කිහිපයක් කථාකරන්න.

http://sherlockholmesinvestigations.blogspot.com

මට දැනගන්න ලැබුණා, මුලින්ම මිනිය දුටුවේ ඔබ බව. ඊළඟට ඒ බව දන්වලා ඔබ අනෙක් අයව කැඳෙව්වා. එහෙම නේද? ඔබේ කටින්ම විස්තර සියල්ල අසාගත්තොත්, ඔබ පොලීසියට දුන් කට උත්තරය කියවනවාට වඩා මට පහසුයි."

"කියන්න ඒ තරම් මහලොකු විස්තරයක් නෑ මහත්මයා." ටොංස්ටන් කීය. "පැයකට විතර කලින් පිරිසිදු වාතය ටිකක් ආශ්වාස කරන්න, මං ගෙයින් එළියට ආවා. එතකොට මං දැක්කා ෆෙරර්ස් මහත්මයා මේ ගහ යට නැගිට හිටි හැටි.

මං ඔහුට හඬනගා කතාකළා. ඔහු මා සිටි දෙසට හැරිල බලල යළිත් ආපසු හැරුණා. ඊළඟට මම දුටුවේ ඔහු තම අත උගුර දිහාට ගෙනියන හැටි. ඊට පසු ඔහු එක්වරම අප්‍රාණික වෙලා බිම ඇදගෙන වැටුණා. මං වහාම මෙතැනට දුවගෙන ආවා. මට දකින්න ලැබුණේ ඔහු මේ ආකාරයටම බිම වැටී හිටි හැටි. ඊළඟට කටක් ඇරුණ වගේ වෙන්න, ඔහුගේ උගුර කැපී තිබුණු හැටි. පිහිය මේ ළඟම තිබුණා. මට ඔහු වෙනුවෙන් කළහැකි කිසිදෙයක් තිබුණේ නැහැ. ඉතින් මම සේවකයාව යැව්වා, දොස්තර නෝඩ්හැම් සහ පොලිසිය කැඳවාගෙන එන්ට. එච්චරයි."

"ඉතාම පැහැදිලි විස්තරයක්" හෝම්ස් කීය. "ඔබ ෆෙරර්ස් මහත්මයා එක්ක සිසිලියේ ජීවත්වුණා නේද?"

"ඔව්."

"ඉතින් මහත්වරුනි" හෝම්ස් කීවේ, අනෙක් අය දෙස බලමිනි. "ඔබට ආපසු නිවෙස් වෙත යෑමට අවශ්‍ය නම් යන්න. මගේ විරුද්ධත්වයක් නැහැ. වොට්සන් මිත්‍රයා ඔබ මා සමග සිටිය යුතුයි. පොලිස් නිලධර මහත්මයා ගෙනුත් මං ඉල්ලා හිටිනවා, ටිකක් වෙලා රැඳී ඉන්න ලෙස."

දොස්තර නෝඩ්හැම් සහ ටොංස්ටන් එතැනින් ඉවත්වී ගිය වහාම හෝම්ස් ක්‍රියාත්මක විය. ෆෙරර්ස්ගේ මළසිරුර වැටී තිබූ තැන වටේම, අඩි කිහිපයක් දුරට පොළොව පරීක්ෂා කිරීමට හෝම්ස් පටන්ගත්තේය. ඔහු එසේ කළේ දණගසා ගෙන, මුහුණ පොළොවට ළං කරගෙනය. විටෙක ඔහු ඉව අල්ලන සිව්පා සතෙකු මෙන්, මුහුණ හරවමින් දණගෑවේය; සාක්කුවේ තිබූ කාචය අතට ගෙන, සාමාන්‍ය ඇසට නොපෙනුණු දේ නිරීක්ෂණය කළේය. අනතුරුව එතැනින් නැගිට සෙඩාර් ගසේ කඳ ද සියුම් ලෙස පරීක්ෂාවට ලක් කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

එක්වරම පොලිස් භටයා ඇමතූ හෝම්ස්, "මෙ කඳේ අත්තක් කැඩීගොස් සෑදී තිබෙන ගැටය පරීක්ෂා කරල බලන්න. මොනවද ඔබට පෙනෙන්නෙ?"

"මට නම් පෙනෙන්නේ හිසකෙස් වගෙයි. නැහැ නැහැ. දුඹුරු පාට නූලක්"

හෝම්ස්ගේ කාචය අතට ගෙන පරීක්ෂා කළ පොලිස්භටයා පැවසුවේය.

"බොහොම හරි" හෝම්ස් කීය. "කරුණාකරල ඒක ඉවත් කරගෙන, මෙන්න මේ ලියුම් කවරයේ දමාගන්න. වොට්සන්. දැන් ඔබ මට ටිකක් උදව් කළ යුතුයි."

මෙසේ කී හෝම්ස් මගේ ආධාරය ද ඇතිව, ගසේ අඩි හයක් පමණ ඉහළින් පිහිටා තිබූ කරුවකට නැගගත්තේය. එතැන සිට යළිත් කඳේ පහත කොටස හා ගසේ අතු වෙත දෙනෙත් යොමු කළේය.

"බලන්න මෙතැන තියෙන දේවල්" ඔහු කීය. "ගසේ කඳට වුණු අලුත් සීරීමක්. ගසේ දෙබලේ තැනින් තැන මඩ පැල්ලම්. අත්තකින් කොටසක් කැඩීගිය තැනක තවත් දුඹුරුපාට නූලක්. ඒක පොත්තට ඇලිලා තියෙන්නේ, හරියට කෙනෙක් එතැනට පිට හේත්තු කරගෙන හිටියා වගේ. මෙතැන හෝඩුවාවන් රැසක් තිබෙනවා. හරියට නිධානයක් වගේ.

කීබල් මහත්මයා. මම දැන් ඔන්න ගහෙන් බිමට පනින්නයි හදන්නේ. මං කැමැතියි ඔබ දෙදෙනාම මං බිමට පනින තැන හොඳින් බලාගන්නවා නම්. ඔන්න!"

එසේ කී මගේ මිත්‍රයා ගස උඩ සිට බිමට පැන්නේය. අනතුරුව එතැන පොලිස් භටයාට පරීක්ෂා කිරීමට ඉඩ සලසා, එතැනින් ඉවත්විය.

"මොනවද ඔබට පෙනෙන්නේ?"

හෝම්ස් ඇසීය.

"පොළොව ඇතුළට එබුණු සලකුණු දෙකක්."

"හරියට හරි. ඒ මගේ දණහිස් දෙක වැදුණු තැන."

"දෙයියෝ සාක්කි!" පොලිස් භටයාට කෑගැසිණ. "මෙතැන ලකුණු දෙකක් නෙමෙයි හතරක් තියෙනවා. නමුත් මේ ලකුණු දෙක, ඔබේ දණහිස් වලින් ඇතිවූ ලකුණු තරම් ඇතුළට කාවැදිලා නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ කියන්නේ අනික් පුද්ගලයා හෝම්ස් මහත්මයා තරම් බර නැති සැහැල්ලු කෙනෙක් විය යුතුයි" මම කීවෙමි.

"විශිෂ්ටයි වොට්සන්" හෝම්ස් කීය. "මං හිතන්නේ අපට සොයාගන්න උවමනා හැමදෙයක්ම අපට හම්බවුණා."

පොලිස් භටයා හෝම්ස් දෙස බලාසිටියේ තමාට මේ කිසිවක් තේරුම් ගත නොහැකි බව හඟවන දෑසකිනි.

"මහත්මයා. මට මේ මොකුත් වටහා ගන්න බැහැ. මොකක්ද මේකෙ තේරුම?"

"බාගවෙලාවට ඔබට සාජන්ට් තනතුරට උසස්වීමක්, කීබල් මහත්මයා." හෝම්ස් කීවේ පොලිස් භටයාගේ පිටට තට්ටු කරමිනි.

"දැන් අපි යමු අනික් අය ඉන්න තැනට"

අප නිවසට ඇතුළුවෙද්දී පොලිස් නිලධරයා, ගෘහභාණ්ඩ තබා තිබූ දිග කාමරයකට අප කැඳවාගෙන ගියේය. එහි ජනේලයක් සමීපයේ ලොකු මේසයක් තබා තිබිණි. එමම මේසයට වාඩිවී දොස්තර නෝඩ්හැම් යමක් ලියමින් සිටියේය. "ඔබේ වැඩකටයුතු ඉවරද හෝම්ස් මහත්මයා?"

"ඔබ නම් මරණය ගැන වාර්තාවක් ලියනවා වගෙයි" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේය. "දොස්තර මහත්මයා. මං ඔබෙන් ඉල්ලා හිටිනවා, වැරදි විදියේ අදහසක් ප්‍රකාශ නොවෙන අයුරින් ඔය වාර්තාව ලියන්න. ඒ ගැන ඔබ විශේෂයෙන් සැලකිලිමත් විය යුතුයි."

තම කටයුතු වහා නැවැත්වූ නෝඩ්හැම්, හෝම්ස් දෙස බලාසිටියේ ගල් පිළිමයක් ලෙස නිශ්චල වෙමිනි.

"මට නම් තේරෙන්නෙ නෑ, ඔබ මේ කියන්නෙ මොනවද කියලා?"

"හොඳයි" හෝම්ස් කීය. "ජෝෂුවා ෆෙරර්ස් මහතාගේ මරණය සිද්ධවූ ආකාරය ගැන ඔබේ අදහස මොකක්ද?"

"ෂඃ ෂඃ හෝම්ස් මහත්මයා" නෝඩ්හැම් කීය. "මෙතැනදී අපට එක එක්කෙනාගේ අදහස් විමසීමක් අවශ්‍ය වෙන්නෙ නැහැනේ. අපි හැමෝටම බැලූ බැල්මටත් පෙනෙනවා. වෛද්‍යවරයෙකු ලෙස මට වෛද්‍ය විද්‍යාත්මකවත් පෙනෙනවා. ෆෙරර්ස් තමාගේ බෙල්ල කපාගෙන සියදිවි හානිකරගෙන."

"ෆෙරර්ස් මහත්මයා හරි පුදුමාකාර පුද්ගලයෙක්" හෝම්ස් කීය. "ඔහුට තමන්ගේ කණ්ඨ ශිරාව කපාගැනීමෙන් පමණක් දිවි

http://sherlockholmesinvestigations.blogspot.com

හානිකරගන්න තිබුණා. ඇයි ඔහු මේ කන ළඟ ඉඳලා අනෙක් කන ළඟටම කපාගත්තේ? ඒකෙත් එක් කාරණාවක් මගේ හිතට ඇතිවෙනවා. මට කවදාහරි මිනීමැරුමක් කරන්න වුණොත්, මේ වගේ වැරැදි නොකරන්න මං පරෙස්සම් වෙනවා."

මගේ මිත්‍රයා කළ ප්‍රකාශය නිසා, එතැන මඳ නිහැඬියාවක් ඇතිවිය. දොස්තර නෝර්ඩ්හැම් වාර්තාව ලිවීම නවත්වා තම අසුනෙන් නැගිට්ටේය. මෙතෙක් වේලා බිත්තියට හේත්තු වී තම දෑත් එකට පටලවාගෙන සිටි ටොංස්ටන්, හෝම්ස් වෙතට තම මුහුණ යොමු කළේය.

"මිනීමරනවා කියන වචනෙ පවා මහ අශික්ෂිත එකක් ෂර්ලොක් හෝම්ස් මහත්මයා!" ටොංස්ටන් කීවේ ගොරෝසු අප්‍රසන්න හඬෙනි.

"ඔව්. ඔබ හරි. ඒ වුණාට මිනීමැරීම ඊටත් වඩා අශික්ෂිත ක්‍රියාවක්. බාගවෙලාවට මැලාවිටා වට නම් එහෙම නොවෙන්නත් පුළුවනි" හෝම්ස් කීය.

"මොන බහුබූත කථාවක්ද ඒ?"

ටොංස්ටන් කෑගැසුවේය.

"ෂෑ ෂෑ" හෝම්ස් කීය. "මං මේ කථාන්තරයේ අඩුතැන් පුරවන්න බලාපොරොත්තු වුණේ ඔබේ දැනුමෙන් - ඔබ සිසිලි දූපත ගැන ලබා තිබෙන දැනුමෙන්. නමුත් "මැලා විටා" කියන රහස් සංගමය බහුබූතයක් බවයි ඔබ නම් කියන්නේ. ඒ නිසා ඒ සංගමය ගැන මං කාරණා ටිකක් හෙළිකළොත් ඔබට ප්‍රයෝජනවත් වේවි."

"හෝම්ස් මහත්මයා. ඔබ ප්‍රවේශම් වුණොත් හොඳයි" ටොංස්ටන් කීවේ අනතුරු අඟවන විලාසයෙනි.

"දොස්තර නෝර්ඩ්හැම් මහත්මයා. කීබල් මහත්මයා. මං කියන මේ කථාවේ සමහර තැන් ඔබ දෙදෙනාට එතරම් පැහැදිලි නැතිවෙන්න පිළිවන්." මගේ මිත්‍රයා කීවේ සැපපහසු අසුනකට බරවෙමිනි. "නමුත් ඒ තැන්, මං ඔබට පසුව පැහැදිලි කර දෙන්නම්. වොට්සන්. ඔබ ඩෑෆ්නි ෆෙරර්ස් මෙනෙවියගේ කථාවට මුල සිටම සවන්දුන් නිසා, ඔබට මේ හැම දෙයක්ම තේරුම් ගත හැකිවිය යුතුයි.

ෆෙරර්ස් මෙනෙවිය ඇගේ කථාව කියද්දී, එක කරුණක් මට මුල සිටම පැහැදිලි වුණා. එනම් ඇගේ පියා, මොකක් හරි බිහිසුණු, අවදානම් දෙයකින් සැඟවී සිටිනා බව. තමාට එල්ල වියහැකි කුමක්

http://sherlockholmesinvestigations.blogspot.com

හෝ අන්තරායදායක තත්ත්වයකින් හැංගෙන්නයි, ඔහු මේ කැලෑවෙන් වැසුණු පළාතක, අබලන් නිවසක පදිංචියට ආවේ. ඔහු එංගලන්තයට සංක්‍රමණය වුණේ, සිසිලි දූපතේ දීර්ඝ කාලයක් ගතකරලා. සිසිලිය කියන්නේ, රහසිගත බිහිසුණු සංවිධාන ගැනත්, ඒවායේ බලසම්පන්න ක්‍රම ගැනත් ප්‍රසිද්ධ රටක්. ෆෙරර්ස් එක්කෝ එම සංවිධානයට විරුද්ධවෙලා, ඔවුන්ගේ සතුරෙකුව වෙලා ඉඳලා තියෙනවා. එහෙමත් නැත්නම් එවැනි සංවිධානයකට සම්බන්ධ වෙලා, එහි වැදගත් තනතුරක් දරලා තියෙනවා. ඔහු මාරදූතයින් ගැන ලැබුණු මුල් ලිපියෙන්ම කැලඹීමට පත්වුණා. නමුත් පොලීසියට දැනුම්දීමටවත්, පොලීසිය කැඳවීමටවත්, ඔහු උත්සාහ ගත්තේ නැහැ. එයින් මා තේරුම් ගත්තේ මොකක්ද? ෆෙරර්ස් සිසිලියේදී එම මිනීමරු සංවිධානය හා සම්බන්ධවයි ඉඳල තියෙන්නේ.

වොට්සන් ඔබට මතක ඇති; ඒ පළමුවැනි දැනුම්දීමේ මාරදූතයින් නව දෙනෙක් හිටියා. වචනයෙන් ලියා තිබුණා හයයි තුනයි කියලා. එය ගසට තබා ඇණ ගසා තිබුණේ දෙසැම්බර් 29 වැනිදා. එතැන් සිට හරියටම සති 6යි දින 3 කින්, ඔවුන්ගේ ඊළඟ දැනුම් දීම සිදුවුණා. එදා පෙබරවාරි 11 දා. හරියටම සති හයයි දින තුනකින්.

නමුත් මේ දෙවැනි චිත්‍රයේ මාරදූතයින් හයදෙනයි. එතකොට පෙබරවාරි 11 වැනිදා ඉඳල සති හයකින් ඔහුට යමක් ලැබීමට නියමිතයි. ඒ කියන්නේ මාර්තු 25 වැනිදා. හරියටම මාර්තු 25 වැනිදා ඔහුට චිත්‍රයක් ලැබුණා. ඒකෙත් මාර දූතයින් නව දෙනයි. හයයි තුනයි බැගින්. මාර්තු 25 ඉඳලා සති හයයි දින 3 ක් ගියාම එන්නේ මැයි 9. ඒ කියන්නේ අද. නමුත් ඔබට මතකද වොට්සන් එම චිත්‍රයේ පහළ කිසිවක් ලියා නොතිබුණු බව ඇය කිව්වා?

එතකොට මම තේරුම් ගත්තා, චිත්‍රයෙන් අනතුරු අඟවන පුද්ගලයන් කවුරුන් වුණත්, අනතුරු ඇඟවීම අවසන් බව. ෆෙරර්ස් මහත්මයා මරණයෙන් ගළවාගන්න මං ප්‍රමාද වැඩිබව මට තේරුණා. නමුත් ඔහු වෙනුවෙන් මා විසින් ඉටු කළ යුතු යුතුකමක් තිබුණා. මං මේ ගැටලුව විසඳන්න ක්‍රියාත්මක වුණේ වෙනත් කෝණයකින්.

එදා ෆෙරර්ස් මෙහෙවිය ජනේලයෙන් බිහිසුණු මුහුණක් දුටුවා. එය මෙවැනි රහස් මිනීමරු සංවිධාන පළිගැනීමේදී යොදාගන්නා ක්‍රමයක්. ඔවුන් අදාළ පුද්ගලයා පමණක් නෙමෙයි, ඔහුගේ පවුලේ

http://sherlockholmesinvestigations.blogspot.com

අයත් භීතියට පත්කරනවා. එදා ෆෙරර්ස් මෙනෙවිය භය කරන්න ආව තැනැත්තා, ඔහුගේ මුහුණේ පහළ කොටස අතින් ආවරණය කරගන්න පරෙස්සම් වුණා. ඇයි? මේ තරුණිය විසින් තමා හඳුනාගැනීම වැළැක්වීමට.

ඊළඟට මරණයේ පණිවුඩය රැගත් චිත්‍රය ජොෂුවා ෆෙරර්ස් වෙත ආවේ මොන පිළිවෙළටද කියල හිතල බලමු. මුලින්ම ඕක ගහේ කඳේ. ඊළඟට ඉස්සරහ දොරේ. ඊළඟට උළුඳ කෑම ගන්නා මේසයට ආවා. මේකෙන් බොහොම පහසුවෙන් කුඩා ළමයෙකුට වුණත් තේරුම් ගන්න පුළුවන් සරල කරුණක් පෙනෙනවා. මාරාන්තික පණිවුඩය එවූ පුද්ගලයා කවුරු වුණත්, ඔහු යම් දෙයක් හොඳින් දැනහිටියා. ඒ මොකක්ද? ෆෙරර්ස් මහත්තයා ගෙදරදී ගතකරන දිනචර්යාව හා ඉරියව් එපමණක්ද? අවසන් පණිවුඩය කෑම මේසය මත තබන්න ඔහුට ජනෙල් හෝ දොරවල් බලෙන් අරින්න උවමනාවක් තිබුණේ නැහැ.

ඩැල්නි ෆෙරර්ස් මෙනෙවියගේ අසාමාන්‍ය කථාවෙන්, යම්කිසි කරුණක් මගේ සිතේ නැවත නැවතත් රැව් පිළිරැව් දෙන්න පටන්ගත්තා. නමුත් ඒක මොකක්ද කියලා හිතාගන්න වත්, හරිහැටි ග්‍රහණය කරගන්නවත් මට හැකියාවක් තිබුණේ නැහැ. නමුත් වොට්සන් කිව්ව, වලේ පයයි ගොඩ පයයි කථාවෙන්, විදුලියක් කෙටුවා වගේ හැමදෙයක්ම මගේ හිතට ආවා."

ෂර්ලොක් හෝම්ස් තමන්ගේ ගමන්කබා සාක්කුවෙන්, යමක් ඉවතට ගැනීමට සූදානම් වෙද්දී මම අනෙක් අය දෙස බැලුවෙමි. කාමරය තුළට ගලා ආවේ බැස යන හිරුගේ රතු පැහැති අවසන් ආලෝක කිරණ සමූහයයි. පොලිස් නිලධරයා මෙන්ම වෛද්‍යවරයා ද මේ කථාවට සවන්දීගෙන සිටියේ දැඩි උනන්දුවකිනි. තවමත් ඔහුගේ දෑත් පටලවාගෙන සිටි ටොංස්ටන් පමණක්, සෙවණැලි අතරට වී මගේ මිත්‍රයා දෙස ඇසිපිය නොහෙළා බලාසිටියේය.

"මේ තියෙන්නේ හෙක්තෝන් විසින් ලියන ලද ජාත්‍යන්තර රහසිගත සංවිධාන නම් පොත" හෝම්ස් කීය. "දොස්තර වොට්සන් කියූ දෙයින් මගේ අවධානය යොමුවුණේ, මං කලකට පෙර මේ පොතේ කියවූ ඡේදයකට. දැනට ශතවර්ෂ තුනකට පෙර, සිසිලියේ බිහිවුණු රහසිගත සංවිධාන ගැන මේ කතුවරයා කියන දේ අහන්න.

http://sherlockholmesinvestigations.blogspot.com

මැලාවිටා නමින් හඳුන්වන අතිශයින්ම බිහිසුණු රහසිගත සංගමය, ඔවුන්ගේ සාමාජිකයන් හා ලිපි ගනුදෙනු කිරිමේදී චිත්‍ර හා සංකේත යොදා ගනී. ඔවුන් බහුලව යොදාගන්නා චිත්‍ර අතර, පිහාටු සහිත සුරදූතයන්, පිහාටු සහිත සිංහයන් සහ යක්ෂයා වේ. මෙම සංවිධානයට බැඳීමට අපේක්ෂා කරන පුද්ගලයා, ඊට තමාගේ සුදුසුකම පෙන්වා දියයුත්තේ මිනීමැරුමක යෙදීම ඔගිනි. ඊට අමතරව මෙම සංගමයට පක්ෂපාතිත්වය සුරැකීමට, දිව්රුම් දීමක් සිදුකළ යුතුය. එම තැනැත්තා එක් කකුලක් විවෘත මිනීවළක තබාගෙන, අනෙක් කකුල ගොඩ තබාගෙන දිව්රුම් දීම කළයුතුය. සංගමයේ නීතිරීති වලට පටහැනිව ක්‍රියා කළොත් හිමිවන දඬුවම බිහිසුණු මරණයකි. මේ පිළිබඳව, අදාළ පුද්ගලයාට දැනුම්දීමේ විශේෂ ක්‍රමයක් ද ඇත. පළමු දැන්වීම කර සති 6 දින 3 කින් දෙවැනි දැන්වීම ද එයින් සති 6 කින් තුන්වැනි දැන්වීම ද ලැබේ. තවත් සති 6 යි දින 3 කින් මරණ දඬුවම ක්‍රියාත්මක වේ.

ජෝෂුවා ගෙරර්ස් මේ භයානක සංගමයේ සාමාජිකයෙක්ව සිටි බවට අපට කිසි සැකයක් නෑ" හෝම්ස් කීවේ ඔහුගේ අතේ තිබූ පොත වසා දමමිනි. "මේ දඬුවම දෙන්න ඔහු කළ වැරැද්ද මොකක්ද කියලා අපට කවදාවත් දැනගන්න ලැබෙන එකක් නෑ. ඒ වුණත් කෙනෙකුට ඒක අනුමාන කරන්න පුළුවනි.

ඔවුන්ගේ නීති සංග්‍රහයේ සඳහන් වෙනවලු, සංගමයේ නායකතුමාගේ අනන්‍යතාවය හඳුනාගන්නා තැනැත්තාට දඬුවම මරණය කියලා. මං ඔබට මතක් කර දෙන්නම් වොට්සන්; ගෙරර්ස් ඔහුගේ දුවට කිව්වා, අසන හැම ප්‍රශ්නයකටම ඇය දිය යුතු පිළිතුර වන්නේ, පියාගේ කටයුතු ගැන තමා කිසිවක් නොදන්නා බව. අනෙක මැවුම්කරුවාගේ නම තුවක්කුවේ කඳේ ඇති බව. මතක තියාගන්න ඔහු යොදාගත් වචනය "තුවක්කුවේ", තුවක්කුවක නෙමෙයි. ඒකෙන් එකක් පැහැදිලියි. පණිවුඩය ලබන පුද්ගලයා එම වචන වලින් විශේෂ ආයුධය හඳුනාගත යුතු බව. මේකෙන් අපට ගතහැකි තීරණය මෙයයි. ගෙරර්ස්ගේ මළසිරුර අසල තිබූ තුවක්කුව, සිසිලියේ රහස් සංවිධාන වලටම සුවිශේෂ එකක් බව.

ඔහුට නියමවුණු කටයුත්තට යද්දි, ගෙරර්ස් ඔහුගේ ගිනිඅවිය අරගෙන ගියා. ආයුධයක් හැටියට නෙමෙයි; සාමය උදාකරගන්න. ඒ මොකද එහි කඳේ තිබුණා, කඩදාසි කැබැල්ලක ලියලා රෝල් කර

http://sherlockholmesinvestigations.blogspot.com

තිබූ යම් ලියමනක්. මොකක්ද මේ ලියවිල්ල? ෆෙරර්ස් සිසිලියේ ගතකළ කාලයේදී, යම් අවාසනාවන්ත අයුරකින් ඔහු අතට පත්වුණු නායකතුමාගේ අනන්‍යතාවය. ඒක විනාශකර දැමීමෙන් ප්‍රයෝජනයක් නැහැ. ඒ මොකද ඒ නම ඔහු දැනටමත් දැනගෙන අවසන් නිසා. ඒ හේතුවෙන් තමාව නොවරදවාම මරණ දඬුවම ලැබෙන බව ජොෂුවා ෆෙරර්ස් දැන හිටියා. ඔහු සෑම උත්සාහයක්ම ගත්තේ තම දියණියගේ ජීවිතය ආරක්ෂා කිරීමට.

තමාව මරා දැමීමට මැලාවීටා කල්ලියෙන් පත්කළ ඝාතකයා කවුද කියල ෆෙරර්ස් දැන හිටියේ නැහැ. සෙඩාර් ගහේ අතු බෙදුණු තැන දෙබලට වෙලා, මේ ඝාතකයා ෆෙරර්ස් එනතුරු බලාගෙන හිටියේ, බැටළුවෙකු එනතුරු රැකසිටින ව්‍යාඝ්‍රයෙක් වගේ. ෆෙරර්ස් ගහ යටට ආවම, ඝාතකයා පිහිය අතට අරගෙන බිමට පැන්නා. ඊළඟට ඔහු අසරණයාගෙ ජීවිතය විනාශ කළේ කිසිදු අනුකම්පාවකින් තොරව. ඊට පස්සෙ ඔහු ෆෙරර්ස්ගෙ සිරුරේ හැමතැනක්ම සෝදිසි කරල බැලුවා, අර තම ලියූ කඩදාසි කැබැල්ල තිබේද කියලා. තුවක්කු කඳෙන් ඒක හොයාගත්තට පස්සේ ඔහුගේ රාජකාරිය අවසන්වුණා. නමුත් ඔහු දැනහිටියේ නැහැ, ඔහු ගහෙන් බිමට පනිද්දී තණකොළ සහිත මෘදු පොළොවේ ඇතිවුණු සලකුණු ගැන. ඒ වගේම තමන්ගේ ඇඳුමෙන් නූල් කැබැලි දෙකක් සෙඩාර් ගහේ පැටලී තිබුණු බව."

ෂර්ලොක් හෝම්ස් කථාව අවසන් කරද්දී අඳුරුවෙමින් තිබූ විසිත්ත කාමරය පුරා පැතිර ගියේ, මරණය හඟවන බිහිසුණු නිශ්ශබ්දතාවයකි. මීළඟට හෝම්ස් තම අකුණු අත දිගුකළේ ජේම්ස් වොංස්ටන් වෙතය.

"අන්න ඉන්නවා ජොෂුවා ෆෙරර්ස් මරා දැමූ මිනීමරුවා" හෝම්ස් කීය.

"ඔහේට වැරදුණා" වොංස්ටන් පැවසුවේ තම සුදුමැලි මුහුණට නගාගත් සිනාවක් ඇතිවය. "ජොෂුවා ෆෙරර්ස්ට මරණ දඬුවම දුන් පුද්ගලයා."

වොංස්ටන් අප දෙස බලාසිටියේ කණගාටුවන හෝ පසුතැවිලි වන මුහුණකින් නොවේ. තමාට භාරවූ යුතුකම් කොටස, මැනැවින් ඉටුකළ පුද්ගලයකු සතු ශාන්ත බවක් ඔහුගේ මුහුණෙන් පිළිබිඹු විය. මේ අතර යකඩ දම්වැල් එකට ගැටෙන හඬක් ඇසිණි. පොලිස් භටයා විලංගු යුගළ වොංස්ටන්ගේ දෑතට හිරකළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

නීතියේ ග්‍රහණයෙන් ගැළවීමට ඔහු කිසිදු උත්සාහයක් නොදැරීය. පොලිස් භටයා, සිරකරුවා එළියට කැඳවා යද්දී හෝම්ස්ගෙන් ප්‍රශ්නයක් එල්ල විය.

"ඔබ ඒ ලියවිල්ලට මොකද කළේ?"

ටොංස්ටන් අප දෙස බලා සිට ඊට පිළිතුරු දුන්නේය.

"ඒ කඩදාසිය විනාශකර අවසන්" ඔහු කීය. "මැලාවිටාවේ රහස තවදුරටත් ආරක්ෂා වෙනවා. ඊළඟට මං කියන මෙන්න මේ කාරණය හොඳින් හිතට ගන්න ෂර්ලොක් හෝම්ස් මහත්තයා. මං හිතන්නෙ නෑ ඔබේ ආයුෂ ඒ තරම් දිගු එකක් වේවි කියල. ඒ මොකද ඔබ මැලාවිටා ගැන දන්නා ප්‍රමාණය හොඳටම වැඩියි!" මෙසේ කියා හෝම්ස් දෙස අනුකම්පා විරහිත බැල්මක් හෙළූ ටොංස්ටන්, පොලිස් භටයා සමඟ නිවසෙන් එළියට බැස්සේය.

එතැන වැඩ කටයුතු නිමකිරීමට පැයකට ආසන්න කාලයක් ගතවිණි. මේ වන විට මුළු ප්‍රදේශයම අන්ධකාරයෙන් වැසී ගොස්ය. තවමත් එහි රැඳී සිටි දොස්තර නෝඩිහැම්ගෙන් සමුගෙන අපි ආපසු ඒමට පිටත්වුණෙමු. අපේ අරමුණ වූයේ මේ සම්පූර්ණ දුරම පයින් ගොස්, බෝලියු ගම්මානයේ තානායමට ළඟාවීමයි. එහි රාත්‍රිය ගතකොට උදෑසන දුම්රියකින් ලන්ඩනයට ඒමට අපි බලාපොරොත්තු වූයෙමු.

එදා පුරහඳ පායා තිබූ දිනයකි. එහෙත් රැස්ස ගස් වලින් ආවරණය වූ අපේ ගමන් මඟට සඳඑළිය වැටුණේ යන්තම්නි. සැතපුම් පහක දුර ඇවිද එද්දී, දිගින් දිගටම කල්පනාවට වැටී සිටි මගේ මිත්‍රයා, කතාබහ කිරීමට පටන්ගත්තේ බෝලියු තානායම වෙත පිවිසෙද්දීය.

"වොට්සන්. ඔබ මං ගැන හොඳින් දන්නවා ඇතිනේ. මැලාවිටා සාමාජිකයෙකුගේ අනතුරු ඇඟවීම් වලට තියා, ලන්ඩන් පාතාල ලෝකයේ භයානක මැරවරයින්ගේ පොලුමුගුරු, ගිනිඅවි වලට වත් මං භය නෑ. බෝලියු සුසාන භූමිය ළඟින් එද්දී මට හුඟක් දේ කල්පනා වුණා. ඒ සොහොන් බිමේ වැළලී ඉන්නා අපේ මුතුන් මිත්තන් සාමයෙන් ජීවත්වෙලා සාමයෙන් මියගියා. නමුත් අද අපේ ජීවිත කාලයේ සාරධර්ම පිරිහිලා, මොන තරමක් බිහිසුණු අපරාධ සිදුවෙනවද. වර්තමානයේ සීඝ්‍රයෙන් වැඩිවෙන මාරදූතයින් වැනි මේ අපරාධකාරයන් මර්දනය කිරීමට, දෙවියන් වත් පියවර නොගත්තොත්, සාමකාමී මිනිසාට නම් ඒ කටයුත්ත කිරීමට කිසිම හැකියාවක් නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

# කර්නල් වෝබර්ටන්ගේ උමතුව

"ඔබේ අවසන් නිගමනය හරියටම හරි වොට්සන්" හෝම්ස් කියනු මට ඇසිණ. "බිහිසුණු අපරාධ ඇතිවීමට මූලික පදනම වී තියෙන්නේ, දුප්පත්කම බීමත්කම සහ නූගත්කම."

"මටත් හිතුණේ ඒකමයි." මම එකඟවීමි. "ඇත්තෙන්ම මම මේ කල්පනා කර කර හිටියේ....." මම කථාව නවත්වා මහත් පුදුමයෙන් මගේ මිත්‍රයා දෙස බැලීමි. "දෙයියන්ට ඔප්පු වෙච්චාවේ හෝම්ස්!" මට කෑගැසුණේ ඉමහත් පුදුමයෙනි. "මේක හරි පුදුමාකාර දෙයක්නේ. මගේ හිතේ ගැඹුරේම තිබුණු, මං කල්පනා කර කර හිටි දේ ගැන ඔබ කොහොමද තේරුම් ගත්තෙ?"

මගේ මිත්‍රයා හාන්සිපුටුවේ, පිටුපසට හේත්තුවූයේ, සෑහෙන තෘප්තියකට පත්වී බව මම දුටුවෙමි. ඔහු අතේ තිබූ පයිප්පය අසල වූ මේසය මත තබා, දෑත් ඇඟිලි තුඩු ඒකට තබාගත්තේය.

"ඒක ඒ තරම් විශිෂ්ට හොයාගැනීමක් කියල, මං හිතන්නෙ නෑ මිත්‍රයා" හෝම්ස් කීය. "මං අහුගිය මිනිත්තු කිහිපයක්ම ඔබ දිහා බලාගෙන, ඔබේ මුහුණේ මතුවෙන හැඟීම් හා ඔබේ දෑසේ ඉරියව් නිරීක්ෂණය කරමිනුයි හිටියේ. මුලින්ම ඔබේ මුහුණේ තිබුණේ හැඟීම් කිසිවක් නැති බැල්මක්. ඔබ හිස කරකවමින් කාමරය සිසාරා බැලුවා. ඔබේ දෙනෙත් නැවතුණේ පොත් රාක්කය ළඟ. ඊළඟට ඔබේ දෙනෙත් යොමුවුණේ, එක් විශේෂ පොතක් කෙරෙහි බව මං නිරීක්ෂණය කළා. ඒ, දුප්පතාගේ දුක, හොඳින් විස්තර වන වික්ටර් හියුගෝගේ "ලේ මිසරාබ්ලේ" නම් ග්‍රන්ථය වෙත. මට මතකයි ගිය අවුරුද්දෙ ඔය පොත කියවන දවස්වල ඔබ හරිම කම්පාවට පත්වුණා. දුප්පත්කම නිසා ඇතිවෙන ඛේදජනක ප්‍රතිඵල ගැන ඔබ කථාකළේ, හදවතටම දැනුණු ශෝකයෙන්. අද මේ මොහොතෙ මොකද වුණේ? ඔබේ දෑස්වල බැල්ම එක්වරම වෙනස්වුණා. ඇහිබැම රැළිවැටුණා. මනුෂ්‍යයා විඳින කෙළවරක් නැති දුක් කම්කටොලු, වධ වේදනා ගැන ඔබට සිහිවුණා. ඔබේ සිත ඒ පැත්තට දිව යද්දී, දෑසේ තිබුණා කම්පිත බැල්මක්. එයින් පසු ඔබේ

http://sherlockholmesinvestigations.blogspot.com

ඇස් යොමුවුණේ ජනේලය දෙසට. හිම වැටෙන අයුරු, ඇත ගොඩනැගිලි වල පියසි හිමෙන් වැසී ඇති ආකාරය, ඔබට දකින්න ලැබෙන්න ඇති. ඊළඟට ගිනිඋදුන් පඩිය අසල, මට මෙතෙක් පිළිතුරු ලියන්න බැරිවුණු ලිපි දෙසට ඔබේ දෙනෙත් යොමුවුණා. ඒ මොකද ඒ ලිපි ලැල්ලකට අමුණා තියෙන්නේ තියුණු තුඩක් සහිත කිණිස්සකින්. වික්ටර් හියුගෝ ඔහුගේ පොතේ කියූ හැම දෙයක්ම, ඔබේ සිතේ මැවී පෙනුණා. ත්‍රාසජනක හිම වැටෙද්දී ඇතිවන, ඉවසිය නොහැකි අධික ශීතල. මුඩුක්කු වල ජීවත්වෙන මිනිස්සුන්ට උණුසුම ලබාගන්න නියා, කුසගින්න නිවාගන්නවත් හැකියාවක් නැතිකම. ඊළඟට මුවහත් තලයක් ඇති අවි ආයුධ. මේ දුක්ඛිත මිනිසුන් දුකෙන් මුදවා ගත්තෙ නැත්නම්, කවදා හරි මේ හැමදෙයක්ම අවසන් වෙන්නේ දරුණු ඛේදවාචකයකින්. අන්න ඒ කරුණ ගැනයි, මං ඔබ සමග එකඟවුණේ."

"ඇත්තමයි" මම කීවෙමි. "ඔබ ඉතාම නිවැරදි ලෙස, මගේ හිතේ ඇතිවූ හැඟීම් හැම එකක්ම, හොඳින් තේරුම්ගන්න සමර්ථ වුණා. මේක නම් විශිෂ්ට දක්ෂතාවයක්."

"මගේ හිතවත් වොට්සන්. එතැන තෙරුමණ්, නිරීක්ෂණය සහ තර්කන ඥානය, ඉතාම සරල ලෙස උපයෝගී කර ගැනීමක්."

ඒ වසර අවසන් වෙමින් පැවැති කාලයයි. හිම කුණාටු, ලන්ඩන් නගරය හරහා හමාගියේ, මුළු නගරයම අක්‍රිය කරමිනි.

මගේ මිත්‍රයාගේ පරීක්ෂණ කටයුතු අඳහා මේ වසර සාර්ථක එකක් විය. මගේ බිරිඳගේ අකල් මරණයෙන් පසු, මම බේකර් වීථියේ අපේ පරණ නිවහනේ යළිත් පදිංචියට ආවෙමි. ඇගේ වියෝව නිසා මට දැනුණු සාංකාව හා පාළුව මගහැර ගතහැකි වූයේ ෂර්ලොක් හෝම්ස්ගේ අපරාධ පරීක්ෂණ වලට සහභාගී වීමෙනි.

"තවමත් ඔබ පිළිතුරු නොයැවූ ලිපි කිහිපයක්ම තිබෙන බව, මම දුටුවා" මම කීවෙමි. "ඒවල වත් හැද්ද සිත් ඇදගන්නාසුලු පරීක්ෂණ කිසිවක්?"

"වැදගත් කිසිම දෙයක් නෑ වොට්සන්" ඔහු පිළිතුරු දුන්නේය. "බර්ට් ස්ටීවන්ස්ල. මොරියාටිලා දර්ශන තලයෙන් ඉවත්වෙලා ගියාට පස්සේ, තවම කාටවත් බැරිවුණා ඒ අඩුව පුරවන්න. අපරාධ නිර්මාණයට ඇති කෞශල්‍යය: අපරාධකාරයා අතින් මොටවෙලා, ගිළිහිලා ගිහින් වගෙයි........ හෝ හෝ මොකක්ද ඒ ශබ්දෙ?" හෝම්ස්

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ අවධානය යොමු කළේ පියගැට පෙළ වෙතින් නැඟුණු අඩි ශබ්දයක් වෙතයි. බරට අඩි තබමින් කිසිවෙකු උඩුමහලට නැග එන හඬ අපට අසන්නට ලැබිණි.

"සැකයක් නෑ. මේ එන්නෙ ග්‍රෙග්සන්. මොකක් හරි අලුත් දෙයක් ලැබිලා ඇති" ඔහු කීය.

"ග්‍රෙග්සන් ?"

"ඔව් මට කිසිම සැකයක් නෑ. අඩි ශබ්ද දෙකක් අතර කාල පරාසය ඔහුටම සුවිශේෂයි. ඔහුගේ සාක්කුවේ කොයි වෙලෙත් විලංගු යුගළක් තිබෙනවා. එය එකට ගැටෙන හඬ මගේ දෙසවණට යන්තමින් වැටුණා."

හෝම්ස්ගේ වචන නිමවෙන්නටත් පෙර, දොර විවෘත කරගෙන, අපේ විසිත්ත කාමරයට පිවිසියේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ අපරාධ පරීක්ෂක ටෝබියස් ග්‍රෙග්සන්ය. වැහිකබායක් ද හිස හා කන් වැසෙන සේ වූ හිස්වැස්මක් ද පැළඳ සිටි ඔහු, හතිදමමින් ඒවා ඉවත්කොට, හිස්වැසුම් රඳවනය මත දැම්මේය.

"ශුභ උදෑසනක් ග්‍රෙග්සන්. ඔබ මේ හිමකුණාටුවක් පවතින වෙලේ මෙහේ ආවෙ, මොනවා හරි බරපතල අපරාධයක් ගැන, මා හමුවෙන්න බවට සැකයක් නෑ. මේ දවස් වල මං ඉන්නෙ සෑහෙන තරම් නිදහසකින්. මේ ගිනිළඳුන ළඟම තියෙන පුටුවට එන්න. ඔබේ දුම්කොළ අර පුරුදු තැන. නැත්නම් සුරුට්ටුවක් බොනවා නම්, මෙන්න අපට තෑගි ලැබුණු හවානා සුරුට්ටු තිබෙනවා."

ග්‍රෙග්සන් උදුන සමීපයේ අසුන වෙත පැමිණ, හරිබරි ගැසී හිඳගෙන මහ හඬින් සිනාසෙන්නට පටන්ගත්තේය.

"හඃ හඃ හඃ හා! කවදාවත් වරද්දින්නෙ නැති ෂර්ලොක් හෝම්ස් මහත්තයට අද නම් වැරදුණා." ඔහු කීවේ දෑත්වලින් තම කලවා වලට ගසාගනිමිනි.

"මට වැරදුණා?" මගේ මිත්‍රයා ඇසුවේ පුදුමයෙනි. "එහෙනම් ඔබ ආවේ ගැටලුසහගත අපරාධයක් විසඳා ගන්න නෙමෙයිද?"

"මං අද රාජකාරි කටයුත්තකට ගිය බව ඇත්තයි. මේ ඒක ඉවරවෙලා එන ගමන්. මං ආ කුලීරිය, ඔක්ස්ෆඩ් වීථිය හා බේකර් වීථිය මංසන්ධියේදී තවත් කුලීරියක ගැටුණා. කාටවත් බරපතල තුවාලයක් සිද්ධවුණේ නෑ. නමුත් මං ආ කුලීරියේ ඇක්සලයක් කැඩුණා. ආයෙ ස්කොට්ලන්ඩ්යාඩ් ගියත්, මං තවත් රාජකාරියකට

Reading Purpose Only. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

යැවෙන්නේ නෑ. ඉතින් මට හිතුණා මේ ටිකදුර පයින් ඇවිත් ඔබේ ගිනිඋදුන සමීපයට වෙලා, ඔබ සමඟ කතාබහක යෙදිලා ඉන්න."

"ඔබේ ඒ පැමිණීම ගැන ස්තූතියි ග්‍රෙග්සන්" හෝම්ස් කිය. "අපි දෙන්නා මේ කතාකරමින් හිටියෙත්, යෙදෙන්න කිසිම අපරාධ පරීක්ෂණයක් නැති එක ගැන. ඉතින් කොහොමද කාලය ගෙවාගන්නෙ? ඔබට අද උදේ පාන්දරම යෙදුණු කටයුත්ත මොකක්ද කියලා, මං ඇහුවට කමක් නැද්ද?"

"මේක නම් පැහැදිලිවම දිවිනාසා ගැනීමක් හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීය. "ඔබේ ඔය සිද්ධාන්ත, උපකල්පන, නිරීක්ෂණ කිසිම දෙයක්, මෙතනදී අපට ඕන වෙන්නෙ නැහැ. ඒ වුණත් මං කියන්නම් ඔබට සිද්ධිය.

ඔබ සමහරවිට අහලත් ඇති කර්නල් ලුවී වෝබටන් ගැන?....... අහල නෑ? හොඳයි මම කියන්නම්. කර්නල් වෝබටන් ක්‍රිමියානු යුද්ධයට සහභාගිවුණු රණශූරයෙක්. ඔහු යුදපිටියේ සටන් කරමින් සිටියදී බරපතල තුවාල ලැබුවා. ඔහුගේ ජීවිතය බේරාගැනීමට හැකිවුණේ, ක්‍රිමියන් යුදපෙරමුණේ පිහිටා තිබූ ස්කුටාරි නම් බ්‍රිතාන්‍ය රෝහල නිසා. හරියටම කියනවා නම් එහි සිටි ෆ්ලොරන්ස් නයිටිංගේල් මෙහෙවියගේ සාත්තුසේවයට පින්සිදුවෙන්න. යුද්ධය අවසානයේ සම්මාන පිදීමේදී ඔහු වික්ටෝරියා කුරුසියෙන් සම්මාන ලැබුවා. ඔහුගේ බිරිඳ මීට අවුරුදු අටකට පෙර මියගිය බවයි අපට අහන්න ලැබුණේ. ඔවුනට දරුවන් නැහැ.

කර්නල් වෝබටන් දීර්ඝ කාලයක් තිස්සේ පදිංචි වෙලා හිටියේ නැගෙනහිර ලන්ඩනයේ, එල්ම්වුඩ් මාවතේ අංක 37 දරන නිවසේ. මේක අනෙක් නිවාස වලින් වෙන්ව, ලොකු ගෙවත්තක් මැද පිහිටි කුඩා නිවසක්. ගිය මාසයේ වයස අවුරුදු 68 සම්පූර්ණ කළ කර්නල් වරයාට, පහසුවෙන් ජීවත්වෙන්න ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක් ලැබුණා. නමුත් ඔහු පසුගිය අවුරුදු හතඅටක කාලයක් තිස්සේ ස්වයං රැකියාවකුත් කරගෙන ගියා බවයි මට අහන්න ලැබුණේ.

කර්නල්ගේ පියා ජීවත්ව සිටියදී ඔහු, කලාත්මක කාන්තා හිස්වැසුම් නිර්මාණය පිළිබඳ සුප්‍රසිද්ධ ශිල්පියෙක්ලු. ලුවී වෝබටන් තරුණ කාලයේ, ඒ කියන්නේ යුද්ධ හමුදාවට බැඳෙන්න පෙර මේ අංශයේ කටයුතු කරලා තියෙනවා. ඔහු පියාගේ හිස්වැසුම් නිෂ්පාදනාගාරයේ වැඩකරලා, හොඳ පුහුණුවක් ලබල තියෙනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

යුද්ධය නිසා ඔහු සෑහෙන තරම් ආබාධිත තත්ත්වයටයි පත්වුණේ. කර්නල් වෝබටන්ගේ දකුණු කකුලේ අස්ථි බිඳී ගොස්, සුවවෙද්දී යම් අඩුපාඩුවක් ඇතිවුණා. ඒ නිසා ඔහු සැරයටියක ආධාරයෙන්, කොරගසමින් ගමන්කළේ. ඔබට තේරෙනවා ඇති, මෙවැනි කෙනෙකුට, හිස්වැසුම් නිර්මාණය වැනි, එක තැන හිඳගෙන කරන වෘත්තියක් වඩාත් සුදුසු බව. දවස පුරාම ගෙදරට කොටු වෙලා තනියම සිටින්නට වුණු නිසා, කාලය ගෙවාගැනීම සඳහා ඔහු මේ කටයුත්තේ යෙදුණා වෙන්නත් පුළුවනි. කොහොමවුණත් ඔහුගේ අතින් නිමවුණු හිස්වැසුම් වලට විශාල ඉල්ලුමක් තිබුණා. ලන්ඩන් නගරයේ ඉහළම පෙළේ වෙළඳ ආයතන, සතිපතා ඔහුගේ නිමැවුම් මිලදී ගත් බවත් මට දැනගන්න ලැබුණා. ආබාධිත තත්ත්වයට අමතරව කර්නල්වරයා රූමටොයිඩ් සන්ධි ප්‍රදාහය නම් රෝගයට ගොදුරුවීම නිසා, ජීවිතය ගෙවලා තියෙන්නේ දැඩි වේදනාවකින්.

ඔහුගේ ගෙදරම පදිංචි සේවක සේවිකාවන් කිසිකෙනෙක් නැහැ. දිනපතාම ඇවිත්, කෑම උයා දී ගේ පිරිසිදු කර දී යන කාටර් මහත්මිය නම් කාන්තාවක් ඉන්නවා. ඇය අද උදේ ඇවිත් පුරුදු විධියට, අමතර යතුරෙන් ඉදිරි දොර ඇරගෙන ගෙට ඇතුළ්වෙලා තියෙනවා. එහෙම එද්දි ඇය සිරිත් පරිදි කරන විධියට ගෙදර සිනුව නාද කළාලු. නමුත් එයට වෙනදා මෙන් ඔහුගෙන් ප්‍රතිචාරයක් ලැබිල නැහැ. ඒ වුණත් ඇය ඒ තරම් පුදුමයකට පත්වෙලා නැහැ. කුමක් නිසාද කියනවා නම්, මෑතක සිට හන්දිවල වේදනාවට ඔහු පාවිච්චි කරන ඖෂධ නිසා, කර්නල් වෝබටන්ට උදේට තදින්ම නින්ද යනවලු.

කෙසේ වෙතත් කන්තෝරු කාමරයට පා තැබූ කාටර් මහත්මිය, ඇයට දකින්නට ලැබුණු දර්ශනයෙන් දැඩි භීතියටත් කම්පනයටත් පත්වුණාලු. ඇය දුටුවේ ඛේදජනක දසුනක්. කර්නල් වෝබටන් තමන්ගේ රිවෝල්වරයෙන්ම, තමන්ගේ කට ඇතුළට වෙඩි තබාගෙන මියගිහින්!"

ග්‍රෙග්සන්ගේ මේ වචන වලින්, ඒ බිහිසුණු දර්ශනය මැවී පෙනුණාක් මෙන්, අප අතර එක් මොහොතකට පැතිර ගියේ දැඩි නිශ්ශබ්දතාවයකි. දකුණු අත තම නළල වෙත යැවූ හෝම්ස් මිනිත්තු දෙකක් පමණ නිහඬව කල්පනා කරමින් සිටියේය. ඔහු ග්‍රෙග්සන් වෙත නෙත් යොමුකළේ ඉන්පසුවය.

http://sherlockholmesinvestigations.blogspot.com

"සැක කටයුතු කිසිම දෙයක් ඔබට දකින්න ලැබුණෙ නැද්ද?" හෝම්ස් ඇසීය.

"කිසිවක් නෑ" ග්‍රෙග්සන් කීය. "හොරෙක් ආව බවට කිසිම සලකුණක් නෑ. මම කාටර් මහත්මියගෙන්, ඒ කියන්නේ සේවිකාවගෙන් මේ ගැන ප්‍රශ්න කළා. ඇය කිව්වේ මෙහෙම දෙයක්. කර්නල් වෝබර්ටන්ට ඥාතීන් හෝ මිත්‍රයන් කිසිකෙනෙක් හිටියේ නෑ. ඒ මදිවට අසනීප නිසා ඔහුට විඳින්න වුණු වේදනාව. ඉතින් ඔහුගේ සිහිවිකල් වීමේ පුදුමයක් නැති බවයි, ඇගේ අදහස. ඔහු මෑතක ඉඳල තනියම දොඩවන්නත්, වේදනාවෙන් වගේ කෑගසන්නත් පුරුදුව හිටි බව ඇය තවදුරටත් කිව්වා."

"මේ මරණයට ඇගේ සම්බන්ධයක් නැහැ කියල ඔබට හොඳටම විශ්වාසද?" මගේ මිත්‍රයා ඇසීය.

"එක්වරම මට එහෙම දෙයක් හිතුණෙ නැහැ හෝම්ස් මහත්මයා." ග්‍රෙග්සන් කීවේ හිස කසමින් මඳක් කල්පනාකරමිනි. "මේක සියදිවිනසා ගැනීමක් බව මට සියයට අනූනවයක්ම විශ්වාසයි..........."

"...... ඇයි ඔබට ඉතිරි සියයට එක අවිශ්වාස?"

"ඔබතුමා අර වගේ ප්‍රශ්නයක් මගෙනුත් ඇසුව නිසා" ග්‍රෙග්සන් කීය. "මං ඒක තවදුරටත් පැහැදිලි කරන්නම් හෝම්ස් මහත්තයා. දින තුනකට කලින් ගෙදර ජලනළයක කරාමයක් කැඩී ගිහින් තියෙනවා. ඒක අලුත්වැඩියා කිරීමට කාර්මිකයෙකු ඇවිත් වැඩ කළාලු. නාන කාමරය හා කුස්සිය අතර ජලනළයේ තමයි, කරාමය කැඩීගිහින් තියෙන්නේ."

"ඒ කාර්මිකයා කවුද? ඔහු ඒ අලුත්වැඩියාව සඳහා කොපමණ කාලයක් ගත්තද? ආදී කරුණු, ඔබ සේවිකාවගෙං අහල සටහන් කරගත්තද?" හෝම්ස් ඇසීය. "බොහොවෙලාවට ඒ කටයුත්තට මුදල් ලබාගන්න, ඔහු කර්නල් වෝබර්ටන් සිටි කාමරයටත් යන්න ඇති?"

"මං ඇයගෙන් විස්තර ඇහුවා." ග්‍රෙග්සන් පැවසුවේ ලේන්සුව අතට ගෙන මුහුණ පිසදා ගනිමිනි. "ජලනළ අලුත්වැඩියාව කරල තියෙන්නේ, කාටර් මහත්මියගේ සැමියා - විලියම් කාටර් විසින්. ඔහු බොහෝම කලකට පෙර කාර්මිකයෙක්ලු. දැන් රැකියාවක් නොකරන බවයි කියන්නේ."

"මේ සියලු කරුණු ඇය ඔබට කැමැත්තෙන්ම හෙළිකළාද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීය. "ඇය ඒ ගැන කථාකරන්නවත් කැමැති වුණේ නැහැ."

"ග්‍රෙග්සන්. මෙතැන මොකක් හරි අපරාධයක් නිසැකවම සිද්ධවෙලා කියල මං කියන්නේ නැහැ" හෝම්ස් කීය. "නමුත් ඔබ විමසිය යුතු අත්‍යවශ්‍ය කරුණු කිහිපයක්ම ඔබට මඟහැරිලා. ඒ බව කණගාටුවෙන් වුවත් මා කිවයුතුයි. සියදිවි නසාගැනීමක් කියලා ඔබ කිව්වත්, මට නම් පෙනෙන්නේ මේක සංකීර්ණ ලෙස පැටළුණු නූල් බෝලයක් ලෙස. මං ඔබට යෝජනාවක් කරන්න කැමැතියි ග්‍රෙග්සන්. යළිත් වරක් එල්මවුඩ් මාවතට ගිහිං, තවදුරටත් මේක ඇතුළට හාරා අවුස්සා බලන්න."

මගේ මිත්‍රයාගේ කටින් එම වචන පිටවීමත් සමගම, ග්‍රෙග්සන්ගේ මෙතෙක් වේලා දක්නට තිබූ සාඩම්බර බව අතුරුදන් විය. හිස මදක් පහතට කරගෙන, ඔහු දකුණු අතේ ඇඟිලි වලින් නළල් තලයට තට්ටු කරන්නට පටන් ගත්තේය. ඒ, ඔහු අතින් යම් යම් අඩුපාඩු සිදුවී ඇති බැව් ඔහුටම වැටහී ඇති අයුරෙනි.

අපේ විසිත්ත කාමරය තුළ මිනිත්තු කිහිපයක නිහඬතාවයක් පැවතිණ. අනතුරුව, පොලිස් නිලධරයා පුටුවෙන් නැගී සිටියේ නිශ්චිත තීරණයකට එළඹුණු බවක් හඟවමිනි.

"හෝම්ස් මහත්මයා" ඔහු කීය. "ඔබතුමා කිව් කාරණාවෙත් ලොකු ඇත්තක් තියෙනවා. මං හොයා බැලූ ප්‍රමාණය මදි. මගෙන් මොකක් හරි අතපසු වීමක් සිද්ධවුණොත්, ඒක මහ ඉහළින් ප්‍රචාරය කරන්න සූදානම් පුද්ගලයො, අපේ ස්කොට්ලන්ඩ්යාඩ් එකේ ඕනෑතරම් ඉන්නවා. ඔබතුමා කිව් විදියට, මං එල්මවුඩ් මාවතට ආපහු යනවා මේ මොහොතෙම්. ඔබට කරදරයක් නැත්නම් මා සමග එන්න කියලා මං ඔබතුමාට ආයාචනය කරනවා."

කිසිදු පරීක්ෂණ කටයුත්තක් නොලැබී කාමරයටම කොටුවී සිටි හෝම්ස්ට, මෙම ඇරයුම සන්තෝෂදායක එකක් වූ බැව් මම වටහාගතිමි. හිම වැටෙන මෙවැනි දවසක නිවසෙන් එළියට බැසීමට, මගේ නම් කැමැත්තක් නොවීය. එහෙත් මගේ මිත්‍රයා ගමනට සූදානම් වෙද්දී, මට පමණක් නිවසේ රැඳී සිටිය හැකි ආකාරයක් නොපෙනිණ.

"වොට්සන්" හෝම්ස් කීවේ මගේ සිතැඟි වටහාගෙන වියයුතුය. "වැස්සයි සීතලයි අමතක කරල දාල, අපි ග්‍රෙග්සන් එක්ක එල්මවුඩ්

http://sherlockholmesinvestigations.blogspot.com

මාවතට ගිහිං එමු. මෙතැන මොකක් හරි අභිරහසක් නැතිවුණත්, අලුතෙන් යමක් ඉගෙන ගන්න මේකු හොඳ අවස්ථාවක්."

ගමන්කබා, වැහිකබා ආදී සියලු ආම්පන්න වලින් සැරසී, අපි රෝද හතරේ ලොකු අශ්වකරත්තයකින් බේකර් වීථියෙන් පිටත්වී ගියෙමු.

පාර හිමෙන් වැසී තිබීම නිසා අපට එල්ම්වුඩ් මාවතට ළඟාවීමට පැයකට කිට්ටු කාලයක් ගතවිණි. අංක 37 දරන නිවස පිහිටියේ, ප්‍රධාන පාරට මායිම්ව නොවේ. එල්ම්වුඩ් මාවත, තරමක් අප්‍රකට එල්ම්වුඩ් උද්‍යානයට සම්බන්ධ අතුරුපාරකි. විශාල එල්ම් හා ඕක් ගස් වලින් වැසුණු මේ ප්‍රදේශයේ, එතරම් සිත් අදනා බවක් නොවීය. 19 වැනි සියවස මුල් භාගයේ ඉදිකළ විශාල මන්දිර අතර, ඉතිරිවී තිබූ ඉඩම් කෑබැලිවල, කුඩා නිවාස ඉදිකර තිබිණි. ඒවා ද අවුරුදු තිහක් හතළිහක් ඒරැණි, දුර්වර්ණ බිත්ති සහිත ඒවා බැව් පෙනිණ. කර්නල් වෝබටන්ගේ අංක 37 දරන නිවස ද මෙවැනි එකකි. ගෙවත්තට ඇතුළුවන ගේට්ටුව ළඟ පොලිස් භටයෙක් මුරට සිටියේය.

"දොස්තර මහත්මයා ආවද කනිංහැම්?" ග්‍රෙග්සන් අසද්දී, සීරුවෙන් සිටගත් පොලිස් භටයා "ඔව් මහත්මයා" යයි පිළිතුරු දුන්නේය.

"ආයුබෝවන් දොස්තර මහත්මයා" ග්‍රෙග්සන් කීවේ විසිත්ත කාමරයේ පුටුවක වාඩිවී යමක් ලියමින් සිටි මහතෙකුටයි.

"මං පරීක්ෂාව අවසන් කරල, වෛද්‍ය වාර්තාව ලියන්න පටන්ගත්තා" තරුණයෙකු වූ පොලිස් ශල්‍ය වෛද්‍යවරයා කීය.

"මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මං ඔහුටත් මිනිය පෙන්වන්නම්" කී ග්‍රෙග්සන් දොර හොඳින් විවෘතකොට අත දිගුකොට අපට පෙන්වීය.

එය කන්තෝරු කාමරය යයි සිතිය හැකි, ඉඩකඩ සහිත කාමරයකි. එක් බිත්තියක් පිරෙන්නට තිබුණේ පොත් අසුරා තිබූ රාක්කයකි. ඊට විරුද්ධ පැත්තේ ඕක් ලීයෙන් තැනූ ශක්තිමත් ලාච්චු අල්මාරියක් විය. සම් කවර වලින් නිම වූ ඇඳි පුටු දෙකක්, සහ තවත් වේවැල් පුටුවක් එම කාමරයේ විය. කාමරයේ මැදට වන්නට බිම, මළසිරුර වැටී තිබිණි.

"සියදිවි නසාගැනීමක් බවට සැක නෑ කියල, මං මුලින් කිව්වේ මේ නිසා" ග්‍රෙග්සන් කීවේ මළසිරුරේ විවෘතව තිබූ මුඛය

http://sherlockholmesinvestigations.blogspot.com

පෙන්වමිනි. හමුදා ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කොට තිබුණත්, මෙම මළසිරුරේ දසුන මට ද අප්‍රසන්න එකක් විය. එහි උඩුතල්ල බිඳී විනාශ වී ගොස් හිස් කබල දෙසට ගැඹුරු තුවාලයක් සෑදී තිබිණ. සුනුවිසුනු වී ගිය අස්ථි කැබැලි හා ලේ කැටි, අවට විසිරී තිබුණේ ඛේදජනක දසුනක් සිතුවම් කරමිනි.

මළසිරුරු අසල දණගසාගත් මගේ මිත්‍රයා, එය පරීක්ෂා කිරීමට පටන්ගත්තේය. කට හා නිකට අවට දුර්වර්ණ වූ ලේ වලින් කළු පැහැ ගැන්වී තිබිණි. කම්මුල් වලට පහළින් ද, ගලාගොස්, කැටිගැසී, වියළුණු විශාල ලේ කැට් අපි දුටුවෙමු. මීට අමතරව ඔහුගේ හිස අසල බුමුතුරුණ මත ද විශාල ලේ පැල්ලමක් විය. දකුණු අතේ ඇඟිලි කකුළුවෙකුගේ අඬු මෙන් විහිදී, පහතට නැමී තිබිණි. හිසට අඩි කිහිපයක් දුරින් ස්වයංක්‍රීය රිවෝල්වරයක් විය.

තමාගේ රාජකාරි කටයුතු නිමකළ පොලිස් ශල්‍ය වෛද්‍ය එල්වර්ති, වාර්තාව ද අතැතිව අප සිටි තැනට පැමිණියේය.

"ඔහුගේ කටේ වෙඩි බෙහෙත් ලකුණු තියෙනවා නේද දොස්තර මහත්තයා?" ග්‍රෙග්සන් ඇසීය.

"ඔව්" එල්වර්ති පිළිතුරු දුන්නේය. "මං මුලින් දකිද්දී, ඔහු මියගිහින් පැය එකොළහක් හෝ දොළහක් ගතවී තියෙන්න ඇති."

"සේවිකාව දකිද්දිත් මේ පහන දල්වා තිබුණලු" ග්‍රෙග්සන් කීවේ මළසිරුර කෙළින්ම ඉහළින් තිබූ විදුලිපහන පෙන්වමිනි.

"තමන්ට වෙඩි තියාගන්න, ඔහු මේතැන තෝරාගත්තු එක පුදුමයි" හෝම්ස් කීය. "වෙඩි තියාගන්න කලින් ඔහු විදුලිපහන දල්වාගත්තෙ ඇයි කියන එකත් ප්‍රශ්නයක්."

"ඔහුගේ හිතේ අඳුරට භයක් තියෙන්න ඇති." වෛද්‍යවරයා කීය. "උමතු භාවය වැඩිවුණාම එහෙම දෙයක් වීම ස්වාභාවිකයි."

"ඔව්. එහෙම දෙයක් වෙන්න ඇති." කිව් හෝම්ස් මළසිරුර නවදුරටත් පරීක්ෂා කළේය. මම ඒ අසලටම වී බලාසිටියෙමි. යම්කිසි නිගමනයකට පැමිණිය හැකි, ප්‍රයෝජනවත් හෝඩුවාවක් වේදැයි මම සුපරීක්ෂාකාරී වීමි.

මළසිරුරේ ස්වභාවය දැකීමට ප්‍රිය උපදවන එකක් නොවූ බව, මම මුලින් ද සඳහන් කළෙමි. බොහෝ දුරට තට්ටය පෑදුණු කර්නල් වරයාගේ ඉතිරිව තිබූ අළුපැහැ වුණු කෙස් ස්වල්පය කැටිගැසුණු ලෙයින් එකට ඇලී තිබිණ. ශරීරය කුදු ගැසී තිබුණේ, ඉමහත්

http://sherlockholmesinvestigations.blogspot.com

භීතියකට ඔහු මුහුණදුන් අයුරෙනි. යම්කිසි පුදුමාකාර දෙයකින් ඔහු මවිතයට පත්වූ බව හඟවමින් මෙන් දෑස් හොඳින් විවෘතව තිබිණි. ඔහුගේ සෘජු නාසයේ මෙන්ම නළලේ මතුපිට ද තෙත් ගතියක් දකිය හැකිවිය. ඇඳුම් පැළඳුම් සියල්ලක්ම පාහේ, කාලයක් තිස්සේ ඇඳීමෙන් ගෙවීගිය අබලන් වූ ඒවා බැව් පෙනිණ. ගෙදරට පාවිච්චි කළ සෙරෙප්පු දෙකේ විළුම් පෙදෙස් සම්පූර්ණයෙන්ම ගෙවී ගොස් තිබුණු අතර, තද නිල් පැහැති කලිසමේ තැන් කිහිපයක්ම ඉරී හිල් සෑදී ඇති බැව් මම දුටුවෙමි.

"මළසිරුර මුලින්ම දුටුවෙ ඔහුගේ සේවිකාවය කිව්ව නේද? කෝ ඇය?" හෝම්ස් ඇසුවේය.

"ඇය ඉන්නවා අල්ලපු කාමරේ."

කාටර් මහත්මිය අඩි පහකට වඩා උස් නොවූ, කෙට්ටු සිරුරක් තිබූ, වයස හැටක පමණ කාන්තාවක් වූවාය. ඇගේ කොටට කපා තිබූ හිසකෙස් මෙන්ම විශාල දෑස් ද, එක්වරම මගේ අවධානයට ලක්විය. දිගින් දිගටම විවෘතව තබාගෙන සිටි එම දෑසින් කියැවුණේ අතිශය පුදුමයට පත් බවකි. ඇය හැඳ සිටියේ ගෙවීගිය දුඹුරු පැහැති කබායක් සහ මිල අඩු වර්ගයේ ලෝම ගවොමකි. කළු පැහැති පරණ හිස්වැස්මක් ද ඇයේ අතේ විය.

"කාටර් නෝනා" ග්‍රෙග්සන් කීය. "මේ තමයි අපරාධ පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඔහුට ඔබෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න තියෙනවාලු."

"වාඩිවෙන්න කාටර් නෝනා" හෝම්ස් කරුණාවන්ත ස්වරයෙන් කීවේ, කලබල වී අසුනේන් නැගී සිටි වයස්ගත කාන්තාවටයි. "මේ ගෙදර වැඩ කටයුතු ඔක්කොම බලාකියාගත්තෙ ඔබ. එහෙම නේද?"

"ඔව් මහත්මයා" ඇය කීවාය. "මං හැමදාම උදේ අටට මෙහාට එනවා. ඉරිදාට මගේ නිවාඩු දවස. ඒදාට එන්නෙ නෑ. ගෙදර ඔක්කොම පිරිසිදු කරලා, රෙදි හෝදලා, දවල් කෑමට මොනවා හරි උයලා තියලා මම ආපහු යනවා."

"කීයටද ඔබ සාමාන්‍යයෙන් පිටවෙලා යන්නෙ?"

"පිගන් සෝදන වැඩත් ඉවර කරලා දවල් දෙකට දෙකහමාරට විතර. නමුත් සෙනසුරාදා දවස්වලට ආපහු යද්දී තුන විතර වෙනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ මොකද?"

"ඉරිදාට මං නොඑන නිසා වෝබටන් මහත්මයාට කෑම පිළියෙල කරගන්න අපහසුවෙන්න, බඩු සූදානම් කරනබන්න වෙනවා."

"කර්නල් වෝබටන් උදේ වරුවේ කොහේවත් ගියේ නැද්ද?"

"ඔහු?" ඇය ඇසුවේ එම ප්‍රශ්නයෙන් පුදුමයට පත්වූ අයුරෙනි. "ඇයි දෙවියනේ ඔහු කවදාවත්, කොහේවත් ගියේ නෑ. ලෝභ මසුරෝ කොහොමටවත් එහෙම යන්නෙ නෑනෙ. එහෙම යනවද මහත්මයා?"

එම ප්‍රශ්නයට හෝම්ස්ට සිනා පහළවිය. "කාටර් මහත්මිය ඔබ කියන්නේ ඔහු ලෝභයෙක් කියලද?"

"ඇයි මහත්මයා. ඒක හැමෝම දන්න කාරණයක් නේ. ඔහු හදන හිස්වැසුම් ගෙනියන්න එන මිනිස්සුත් ඒක දන්නවා. ඔහුට උවමනා කරන බඩු විකුණන්න එන මිනිස්සුත් දන්නවා. ඔහුගේ ලෝභකම....."

"......ඒ මිනිස්සු අන්තිමට ආවෙ කවදද?"

"බඩු ගෙනියන අයයි, ගේන අයයි ඔක්කොම එන්නෙ සෙනසුරාදාට" ඇය කීවාය. "අනෙක් දවස්වලට ඔහු කාටවත් දොර අරින්නේ නෑ."

"අද බ්‍රහස්පතින්දා. ඔබ කියන්නේ ගිය සෙනසුරාදා, ඒ කියන්නේ දවස් පහකට කලින් ඔවුන් ආවා කියලද?"

"ඔව්." ඇය කීවාය. "උදේ නවය වෙද්දී ඔවුන් එනවා. දවල් එකට කලින් ගනුදෙනු ඔක්කොම අවසන් කරලා පිටවෙලා යනවා."

"ජලනළ වල අලුත්වැඩියාවක් කළ බව මට අහන්න ලැබුණා. ඒක කළේ කවදද?" හෝම්ස් ඇසීය.

"මං සඳුදා වැඩට ඇවිත් බලන කොට, කුස්සියේ ඉඳන් පහළ තට්ටුවේ නානකාමරයට වතුර යන ජලනළයේ කරාමයක් කැඩිලා. ඒක අලුත්වැඩියා කරන්න මගේ මහත්තයා එක්ක එන්න කියලා කර්නල් කිව්වා."

"ඔබේ සැමියා ජලනළ කාර්මිකයෙක්ද?"

"ඔහු ජලනළ වල වැඩත් ටිකක් දන්නවා මහත්මයා" ඇය කීවාය. "ඔහු ඉස්සර නොයෙක් කාර්මික වැඩ කළ කෙනෙක්. දැන් වයස්ගත නිසා වැඩට යන්නේ නැහැ. ළමයි කසාද බැඳලා ගියාට පස්සේ, අපි

http://sherlockholmesinvestigations.blogspot.com

මොකටද වැඩිපුර මහන්සිවෙලා සල්ලි හොයන්නේ කියල ඔහු අහනවා. වෝබටන් මහත්මයා ජලනල කාර්මිකයෙක් ගෙන්වා ගන්නෙ නැත්තෙත්, එවැනි කෙනෙකුට වැඩි මුදලක් ගෙවන්න වෙන නිසා. මගේ මනුස්සයාටත් ඔහු කීයක් හරි දෙන්නේ බොහොම අකමැත්තෙන්."

"ඔබ කියන්නේ වෝබටන් මහත්මයා කොහේවත් නොගියි බවයි." හෝම්ස් කීය. "බිල් ගෙවීම් හෝ බැංකු කටයුතු සඳහාවත් ගෙයින් පිටවී ගියේ නැද්ද?"

"මාසෙකට දවසක්වත් එහෙම ගිය බවක් මං දන්නෙ නැහැ මහත්මයා. කොයි වෙලෙත්, බඩුවල මිල වැඩිවීම, ජීවන වියදම ඉහළ යෑම ගැන ආණ්ඩුවට බැණ බැණ හිටියා. අන්න අර කාමරේට...." ඇය කීවේ වසා තිබූ කාමරයක් පෙන්වමිනි. "මට වත් ඒකට යන්න දුන්නේ නැහැ"

මෙම කරුණු අසන්නට ලැබුණු පසු, හෝම්ස්ගේ දෙනෙත් දීප්තිමත් වූ හැටි මම දුටුවෙමි.

"ඇයි ඒ කාමරේ මොනවද තියෙන්නෙ?"

"මුදල් දමන යකඩ පෙට්ටියක් මහත්මයා," ඇය කීවාය. "කොයි වෙලෙත් ඒ කාමරයේ දොර වහල යතුරු දමලා, යතුර කොහේ හරි හංගාගෙනයි හිටියේ."

"ඔබ දැන් මෙහේ රැකියාව කරන්න පටන් අරගෙන කොපමණ කාලයක් වෙනවද?"

"අවුරුදු දෙකක් විතර වෙනවා. පත්තරේ තිබුණු දැන්වීමක් දැකලයි මං ඉල්ලුම් කළේ. ඒ වුණත් මෑතක සිට නම් මම කල්පනා කර කර හිටියේ මෙහේ රැකියාවෙන් අස්වෙනවද කියලයි."

"ඒ ඇයි?"

"දැන් මාස තුනක විතර ඉඳලා කර්නල් වෝබටන් පිස්සුවෙන් වගේ තනියම දොඩවනවා. සමහර වේලාවට කාමරය ඇතුළේ මහ හඬින් කෑගසනවා."

"එහෙම අසනීප ගතියක් තිබුණා නම්, ඔහු ඒකට බෙහෙතක් ගත්තේ නැද්ද?"

"මොකද නැත්තේ?" ඇය කීවාය.

"දොස්තර බෙල් තමයි ඔහුට බෙහෙත් කරන්නේ. දොස්තර මහත්තයා කිව්වේ හන්දිපත් අමාරුව හා අත් වෙව්ලීම අඩුකරන්න ගන්න බෙහෙත් වල්ට, සිහිකල්පනාව අඩුවෙනවලු."

http://sherlockholmesinvestigations.blogspot.com

"හො හෝ. එහෙනම් ඔහු දිගටම ප්‍රතිකාර ගත් කෙනෙක්?" මෙවර ප්‍රශ්නය ඇසුවේ ග්‍රෙග්සන්ය. "මං ඒ බවක් දැනගෙන හිටියේ නැහැ."

"දොස්තර බෙල් ඇවිත් අන්තිමටම වෝබටන් මහතා පරීක්ෂා කළේ කවදාද?" හෝම්ස් ඇසීය.

"දවස් තුනකට කලින් ආවා."

"වෝබටන් මහත්මයා හුඟක් ලියුම් ගනුදෙනු කළාද? මං අදහස් කළේ ඔහු නිතර කාටහරි ලියුම් යැව්වද?"

"මම දන්නෙ නෑ මහත්මයා" ඇය පිළිතුරු දුන්නාය. "මං මෙහේ වැඩට එනකොට, උදේ පළමුවෙනි තැපෑලෙ ලියුම් බෙදීම කරලා ඉවරයි. දෙවැනි තැපෑලෙන් නම් ඔහුට ඒ හැටි ලියුම් ආවෙ නෑ. ආවා නම් ඔය බිල්පත් වගේ ඒවා- පැන්ස බාගේ මුද්දර අලවා එන ලියුම් එකක් හෝ දෙකක් පමණයි."

"හොඳට, ඔබට ස්තුතියි කාටර් මහත්මිය." කී හෝම්ස් ඔහුගේ සටහන් පොත දිගහැරියේය. "ඔබේ ලිපිනයත් අපට කියන්න."

"නොම්මර 85 ෂේඩ් ග්‍රෝව් පටුමග."

"මං ඔබෙන් ඉල්ලා හිටිනවා තවත් ටික වෙලාවක් මේ නිවසේ රැඳී ඉන්න කියලා. ඊට පස්සේ ඔබට ගෙදර යන්න අපි අවසර දෙන්නම්" කී හෝම්ස් මෙවර නිවසේ ඉස්තෝප්පුව වෙත පැමිණියේය.

"කර්නල් වෝබටන් මසුරු පුද්ගලයෙකු කියන ආරංචිය හැමතැනම පැතිරී තිබුණු බවයි පෙනෙන්නෙ" හෝම්ස් කීය. "නමුත් මේ වගේ කෙනෙක් තමන්ගේ දිවි හානිකරගන්නා කියල හිතන්න අමාරුයි, යම්කිසි දේකට භයෙන් එහෙම කරගන්නා නම් මිස. තනියම ජීවත්වෙන නිසා, ඔහුගේ හිතේ නොයෙක් බහුබූත මැවුණා වෙන්නත් පිළිවන්. කොහොම වුණත් වෝබටන්ගේ නියම ස්වභාවය, අපට දොස්තර බෙල්ගෙන් අසා දැනගන්න පුළුවන් වේවි."

කන්තෝරු කාමරයේ දොර විවෘත විය. වෛද්‍ය එල්වර්ති අප ඉදිරියට ආවේ තම දෑත් පිසදමමිනි. "මං මළසිරුර ටිකක් පිරිසිදු කරලා හාන්සි පුටුවක් මත තැබුවා." ඔහු කීය.

අපි යළිත් වරක් ඒ කාමරයට ඇතුළුවුණෙමු. ලේ සෝදා ඉවත්කළ පසු, කර්නල් වරයාගේ මුහුණේ තිබුණේ කිරිමැටි

http://sherlockholmesinvestigations.blogspot.com

පැහැයකි. කටේ වම් කෙළවරට ළං වන්නට විශාල ඉන්නෙකු විය. යටිහක්ක පහතට නොවැටීමට දමූ වෙළුම් පටිය නිසා, දෙතොල් එකට තෙරපී තිබුණේ, ඔහුට චිම්පන්සි පෙනුමක් ගෙනදෙමිනි. මේසය මතවූ පීරිසියක ඔහුගේ කෘතිම දත් කුට්ටම විය. එය ද හෝම්ස්ගේ පරීක්ෂාවට ලක්විය. උඩු ඇන්දේ කෘතිම දත් වල තල්ල කොටස, කැබලි වලට කැඩී වෙඩි පහරින් උණුවී ගොස් තිබිණි. එහි වෙඩිබෙහෙත් දැවුණු සලකුණු ද විය. ඒ අසලම මේසය මත රත්රන් රාමුව සහිත උපැස් යුගළක් ද විය.

"මේක තිබුණේ කොහේද?" ග්‍රෙග්සන් ඇසුවේ උපැස්යුගළ පෙන්වමිනි.

"බිම වැටිල ඇඟට යටවෙලා තිබුණා." වෛද්‍යවරයා පිළිතුරු දුන්නේය.

මීළඟට හෝම්ස් මියගිය පුද්ගලයාගේ ඇඳුම් වල සාක්කු පරීක්ෂා කර බැලීය. එක් සාක්කුවක යතුරු කැරැල්ලක් හා මුදල් පසුම්බියක් විය. පසුම්බියේ වූයේ මාරුකාසි කිහිපයකි. ඊට අමතරව මුදල් පසුම්බිය තුළ තිබී දොස්තර බෙල් විසින් එවන ලද ලිපියක් හමුවිය.

මයිකල් බෙල්
එම්.ඩී.

කර්නල් වෝබටන් වෙත,

ඔබට ප්‍රතිකාර කිරීම සඳහා කලින් පොරොන්දු වූ පරිදි හෙට (බදාදා) උදයේ මට පැමිණීමට අපහසු බව කණගාටුවෙන් දන්වමි. අනිද්දා (බ්‍රහස්පතින්දා) එම වේලාවටම නොවදරවාම පැමිණෙමි.

හිතවත්
එම්. බෙල්.

"එහෙනම් වෛද්‍යවරියා හොයාගෙන යන්න, කරදරවෙන්න උවමනාවක් නැහැ. ඔහු අද මෙහාට ආවම ම හුඟක් ප්‍රශ්නවලට පිළිතුරු ලැබේවි." ග්‍රෙග්සන් කීය.

මීළඟට හෝම්ස්ගේ අවධානය යොමුවූයේ, වසා තිබූ කාමරය වෙතයි. මළසිරුරේ සාක්කුවේ වූ යතුරකින් අපි කාමරය විවෘත කළෙමු. බිත්තියටම සවිකොට තිබූ යකඩ සේප්පුව දුඹුරු පැහැති ඝන තිර රෙද්දකින් ආවරණය කොට තිබිණි. එය විවෘත කර ගැනීම එතරම් පහසුනොවීය. වෝබටන්ගේ සාක්කුවේ තිබූ යතුරු

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print.

කැරැල්ලෙන් යතුරු කිහිපයක් දමා උත්සාහ කොට, අවසානයේ සේප්පුව විවෘතකර ගැනීමට මගේ මිත්‍රයා සමත් විය.

"මේක ඇතුළෙ මුදල් මොකුත් නැහැනේ?" හෝම්ස්ට කියවුණේ පුදුමයෙනි.

"ඔහු දිවිනසා ගැනීමට හේතුවත් ඒකම වෙන්න පුළුවනි." ග්‍රෙග්සන් කීය.

"ඔව් ඒකත් වෙන්න බැරි නෑ" කී හෝම්ස් බිත්තිය අසල වූ ලාච්චු අල්මාරිය පරීක්ෂා කළේය.

"මේක ඇතුළෙ තියෙනවා, පරණ චෙක්පොතක් සහ ඉතිරිකිරීමේ ගිණුමක පාස් පොතක්. ඒ ගිණුමේ තියෙන්නෙත් සුළු මුදලයි. පවුම් පනහකට වඩා නෑ" හෝම්ස් කීය.

"අසනීපය නිසා ඔහුට හුඟක් මුදල් වියදම් වෙන්න ඇති." මම කීවෙමි.

"ඔහුගේ බැංකුව නැෂනල් ඇන්ඩ් කවුන්ටීස් බැංකුව බවයි පෙනෙන්නේ" හෝම්ස් කීවේ පාස්පොත හා චෙක්පොත පෙරලා බලමිනි. "මේකෙ අන්තිමට ගිණුම් කිහිපයක අංක තියෙනවා. ග්‍රෙග්සන් දුරකතනයෙන් බැංකුව අමතලා බලන්න, කර්නල් වෝබටන්ගේ බැංකු ගිණුම් ගැන."

පාස්පොත අතට ගත් ග්‍රෙග්සන් එම කටයුතු සඳහා බරාඳයේ පිහිටි දුරකතනය වෙත ගියේය. මේ අතර මගේ මිත්‍රයා බිම වැටී තිබූ රිවෝල්වරය මේසය මතට ගෙන, සිය ප්‍රබල උත්තල කාචය ද අතට ගෙන, ආයුධය පරීක්ෂා කර බැලීමට පටන්ගත්තේය.

"හ්ම්. ස්මිත් සහ වෙසන් වර්ගයේ රිවෝල්වරයක්. .38 එකක්. ආරක්ෂක අගුළ බුරුල් කරලා...! ඒක හරි...." මීළඟට ඔහු ආයුධය විදුලිපහනේ ආලෝකයට ළං කොට තුවක්-සියුම්ව පරීක්ෂා කළේය. ඔහුගේ අවධානය යොමුවුණේ රිවෝල්වරයේ උණ්ඩ අසුරන මැගසීනයටයි.

"එක් පතරමක් අඩුයි. ඔහු පාවිච්චි කළේ එක් පතොරමයි නේ. ඒ හින්දා ඒක හරි." තමාටම කියාගත් හෝම්ස් පතරොම් සියල්ල ගිනි අවියෙන් ඉවතට ගත්තේය. මීළඟට ඔහු මේසය මත තිබූ අතපිස්නාවක් ගෙන, එය රිවෝල්වරයේ කට තුළට දමා, ඇතුළත පිසදා, ඉවතට ගත් රෙදිකඩ කාචයෙන් සියුම් ලෙස පරීක්ෂා කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"වොට්සන් ඔබ දන්නවාද........"

හෝම්ස් මා අමතා යමක් කීමට තැත් කළත්, පොලිස් පරීක්ෂක ග්‍රෙග්සන් අපේ කථාවට බාධාකළේය. ඒ අලුත් තොරතුරක් අප වෙත හෙළිකිරීමටයි.

"හෝම්ස් මහත්තයා" ග්‍රෙග්සන් කීය. "බැංකුවේ මේ වෙලාවේ සිටි සෙනග නිසා, මට තොරතුරු හොයල දෙන්න හුඟක් වෙලා ගතවුණා. ඒ වුණත් එහි කළමනාකරු කීදේ ඔබ දන්නවද?"

"ඇයි මොකක්ද?"

"කළමනාකරු කිව්වා" ග්‍රෙග්සන් කීවේ හතිදමමිනි. "පහුගිය අවුරුදු පහක කාලයක් තිස්සේ, කර්නල් වෝබටන්ගේ ගිණුම් වල, සැලකියයුතු මුදලක් කවදාවත් තිබුණෙ නැතිලු. මුලින් පවුම් හත් අට දාහක් තිබිල තියෙනවා. බැංකු සුරක්ෂිතාගාරයේ සේප්පුවක් පවා ඔහු ඒ දිනවල කුලියට අරගෙන තියෙනවා. අවුරුදු පහකට පෙර, ඔහු ගිණුම් වලින් මුදල් ආපහු අරගෙන සේප්පුවත් ආපහු භාර දුන්නලු."

"හැබෑට?" හෝම්ස් මඳවේලාවක් කල්පනා කළේ නළල රැලිකරමිනි. "ඒකට හේතුව මොකක් කියලද ඔබ අනුමාන කරන්නෙ? කර්නල් වෝබටන් ලණ්ඩනයෙන් නිවාසයක් මිලට ගත්තද? එහෙමත් නැත්නම් කොටස් වෙළඳ පොළේ කොටස් මිලදී ගත්තද? මොකක්ද?"

"මමත් ඔය ප්‍රශ්නය බැංකුවෙන් ඇහුවා හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් පිළිතුරු දුන්නේය. "ගනුදෙනුකරුවන් මුදල් ආපහු ඉල්ලුවාම ඒකට හේතුව බැංකුව ආපහු අහන්නෙ නැහැලු නේ. නමුත් ඊට මාස දෙක තුනකට කලින් සිට ලන්ඩනය පුරා බැංකු පහක් හයක් මංකොල්ලකෑවා. ඔබට මතක ඇති ඔය කාලෙ ග්‍රීන්ඩිලේස් බැංකුව, වෙස්මිනිස්ටර් බැංකුව, මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුව ආදී ඒවල, ලන්ඩනය පුරා ශාඛා කොල්ලකෑම් වලට ලක්වුණා. ඊට අමතරව නැෂනල් ඇන්ඩ් කවුන්ටීස් බැංකුවේ මේ ශාඛාවත් කොල්ලකෑමට උත්සාහයක් දැරුවලු. නමුත් ඒක අසාර්ථක වුණාලු. ඒ දවස්වල සමහර ගනුදෙනුකරුවන් ඔවුන්ගේ තැන්පත් මුදල් බැංකුවෙන් ඉවත්කරගෙන තියෙනවා."

"කර්නල් වෝබටන් ඒයින් එකෙනෙක් වෙන්න ඇති?"

"ඔව්."

http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙනම් ඔහු, ඔහුගේ ඒ මුදල් මේ යකඩ සේප්පුවේ තමා තැන්පත් කරල තියාගන්න ඇත්තෙ. ඒවාට සිදුවුණු දෙයක් අපට හිතාගන්න අමාරුයි."

හෝම්ස් කීවේ, ග්‍රෙග්සන්ට මේසය අසල පුටුවේ වාඩිවීමට සංඥා කරමිනි.

"තවත් කාරණයක් තියෙනවා ග්‍රෙග්සන්."

"ඔව්."

"පොලීසියේ අවි ආයුධ බලපත්‍ර අංශයට කතාකරල බලන්න, කර්නල් වෝබටන් රිවෝල්වරයක් අරගෙන තියෙනවද කියල. එහෙනම් ඒකෙ අංකය කියද කියලත් අහන්න" හෝම්ස් උපදෙස් දුන්නේය.

ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය හරහා එම තොරතුරු සොයාගැනීමට, ග්‍රෙග්සන්ට ගතවූයේ මිනිත්තු දහයකි.

"හරියට හරි හෝම්ස් මහත්මයා. කර්නල් අවුරුදු පහකට කලින් රිවෝල්වරයක් අරගෙන තිබෙනවා. එහි අංකය M 8962 ස්මිත් ඇන්ඩ් වෙසන් වර්ගයේ .38 එකක්" ග්‍රෙග්සන් කීවේ එය සටහන් කරගත් කඩදාසි කැබැල්ලකට නෙත් යොමුකරමිනි.

"එහෙනම් මේක කර්නල්ගේ රිවෝල්වරයමයි." හෝම්ස් කීය. "නමුත් මට තේරුම්ගන්න අමාරු...... කමක් නෑ කොයි එකටත් දැන් අපි මුළු ගෙයම පරීක්ෂා කර බැලිය යුතුයි."

"හෝම්ස් මහත්තයා. මම උඩුමහලේ නිදන කාමර සෝදිසි කරල බලන්නම්." පොලිස් නිලධරයා කීවේ උඩුමහලට නැගීමට සූදානම් වෙමිනි. "මං හිතන්නේ නෑ ඔබට, විසිත්ත කාමරයේ සොයාගත හැකි යමක් ඇති කියල."

ග්‍රෙග්සන් උඩුමහලට ගිය පසු, හෝම්ස් විසිත්ත කාමරය ක්‍රමානුකූලව පරීක්ෂා කිරීමට පටන් ගත්තේය. ඔක් ලාච්චු අල්මාරියෙන් පටන්ගෙන, ඔහු සෑම තැනක්ම ඉතා සියුම්ව පරීක්ෂාවට ලක් කළේය. පැය භාගයක් තිස්සේ නිහඬව තම කටයුත්තේ යෙදුණත්, සාර්ථක ප්‍රතිඵල ලැබුණු බවක්, මගේ මිත්‍රයාගේ මුහුණෙන් නම් ප්‍රකාශයට පත්නොවීය.

මීළඟට ඔහු ගිනිඋදුන අසල දණගසාගත්තේය. මම ද එතැනට ළංවීමි. ගිනිඋදුන් අඩියේ එතරම් විශාල අළුගොඩක් නොතිබිණි. එයින් අපට පැහැදිලි වූයේ, උදුන නිතර නිතර දල්වා නොමැති

http://sherlockholmesinvestigations.blogspot.com

බවයි. මෙතරම් සීතල දේශගුණයක් තිබුණත් උදුන එතරම් නොදැල්වූයේ ඇයි? එය පැහැදිලි කිරීමට කාටර් මහත්මියට හැකිවනු ඇත. කෙසේ වෙතත් උදුනේ යකඩකූරු වල දූලි බැඳී තිබිණි.

ඉන්පසු මගේ මිත්‍රයා ඉතා විමසිල්ලෙන් බලාසිටියේ ගිනිඋදුනේ ආරක්ෂක වැට සහිත ඇතුළත කොටස හා යකඩකූරු දෙසයි. අනතුරුව ඔහු තම කබාය ඉවත්කොට, එය පුටුවක් මතට දැම්මේය. ඊළඟට තම කමිසයේ මැණික් කටුව අසල බොත්තම ගලවා, කමීස අත උරහිස දක්වාම ඉහළට රෝල් කළේය. අනතුරුව ආරක්ෂක වැටෙන් ඇතුළට රිංගුවේය. ඔහු කරන්නට තැත්කරන්නේ කුමක්දැයි මම එතැනට ළංවී බලා සිටියෙමි.

හෝම්ස් ඔහුගේ දකුණු අත චිමිනිකවුළුවේ බිත්තිය දිගේ ඉහළට යැව්වේය. මීළඟට එම අතින් ගිනිඋදුන් පඩිය අල්ලාගෙන, කඳ ඉහළට එසවූ ඔහු, චිමිනි කවුළුව දිගේ බිත්තිය සෝදිසි කළ බැව් මම දුටුවෙමි. එතැනින් සෑහීමට පත් නොවුණු ඔහු, කකුලේ ඇඟිලි තුඩින් එසැවුණේය. අවසානයේ උදුනේ වූ යකඩ කූරු මතට ද නැඟුණේය. ඔහු එම ඉරියව්වෙන් මිනිත්තු දෙකක් පමණ සිට, උදුනෙන් බිමට බැස්සේය. මගේ මිත්‍රයාගේ කමිසය පුරා දූලි කුඩු තැන්පත් වී තිබිණි.

"මේක හුඟක් කාලෙකින් පිරිසිදු කරල නෑ වොට්සන්. දූලි පිරිල" කුස්සියේ ජලනළය වෙත ගිය ඔහු, දෑත් සබන් යොදා සෝදා ගත්තේය. අනතුරුව කබාය ද හැඳගෙන, නාන කාමරය වෙත ගිය අයුරු මම දුටුවෙමි.

"සෝදිසි කරන්න පුළුවන් හැම තැනක්ම සෝදිසි කළා" මෙසේ කියමින් පියගැට පෙළ බැස කාමරයට පිවිසියේ ග්‍රෙග්සන්ය. ඔහු බෙහෙවින් විඩාවට පත්වී සිටි බැව් ඉන් අකින්නට ලැබිණ.

"මේක නම් දිවි නසාගැනීමක් වෙන්න ඇති හෝම්ස් මහත්තයා. අපරාධයක් කියල සැක හිතන්න සැලකියයුතු කිසිම හෝඩුවාවක් මට නම් හමුවුණේ නෑ. ඔබට මොනවද දකින්න ලැබුණෙ?"

මේ අවස්ථාවේ අපේ කථාවට බාධාකරමින් කාටර් මහත්මිය එහි පැමිණියාය.

"මහත්මයා" ඇය කීවාය. "මං දැන් ගෙදර ගියාට කමක් නැද්ද? මගේ මනුස්සයාට දවල් කෑම වේල හදල දෙන්න ඕන. ඔහු මඟ බලාගෙන ඇති."

http://sherlockholmesinvestigations.blogspot.com

"කාටර් නෝනා" හෝම්ස් ඇය ඇමතුවේය. "ඔබෙන් දැනගතයුතු තවත් කරුණු කිහිපයක් තියෙනවා. නමුත් ඔබේ සැමියා ඔබ එනතුරු බලාගෙන ඉන්නවා නම්, ගියාට කමක් නැහැ. දැනගන්න යමක් තිබුණොත් අපි ඔබේ නිවසට එන්නම්. ඒක නෙමෙයි ඉස්සර මගේ ගෙදරත් සුළු සුළු කාර්මික වැඩ කළා, කාටර් කියල හොඳ මහත්මයෙක්. උසින් මගේ උසමයි. කෙට්ටුයි. බොහොම කඩිසර දක්ෂ පුද්ගලයෙක්. බාගවෙලාවට එයාද දන්නෙ නැ ඔබේ සැමියා?"

"ඉස්සර නම් ඔහුත් දක්ෂ කාර්මිකයෙක් තමයි මහත්මයා" කාටර් මහත්මිය කීවේ දිගු සුසුමක් හෙළමිනි. "දෙවියො තමා දන්නේ. අවුරුදු ගණනාවක් තිස්සේ තිබෙන අසනීපයක් නිසා ඔහු දැන් හරි අබලන්. ඒ වුණත් ඔහු ඔබ කියන මහත්මයා නම් වෙන්න බෑ. ඒ මොකද මගේ සැමියා එච්චර උස නෑ. මගේ උසම වගේ. නමුත් මට වඩා තරබාරුයි. ඔහුගේ අසනීපෙට හේතුවත් ඒක කියලයි දොස්තර මහත්තුරු කියන්නේ."

"ඒක හරි කණගාටුවට කරුණක්" හෝම්ස් කීය. "හොඳයි එහෙනම් කාටර් මහත්මිය. ඔබට යන්න පුළුවනි. කර්නල් වෝබටන්ට ප්‍රතිකාර කරන දොස්තර බෙල් අද එනවා කියල ලියුමක් එවල තියෙනවා. ඔහු සාමාන්‍යයෙන් එන්නෙ කීයටද?"

"ඔහු එන්නෙ හරියටම හවස දෙකට" කාටර් මහත්මිය කීවාය. "ඔහුගේ පෞද්ගලික චිකිත්සාගාරයේ වැඩ පටන්ගන්නේ හවස තුනට. එහේ යන්න බලාගෙන තමා මෙහේ එන්නේ."

"ඒකත් එහෙමද?" මෙතෙක් වෙලා නිහඬව සිටි ග්‍රෙග්සන් ඇසීය. "එහෙනම් අපි තවත් මෙතැන බලාගෙන ඉඳල වැඩක් නෑ. දැන් එකොළහමාරයි. මෙහේ තවත් කාලය නාස්ති නොකර මට ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගිහිං එන්න පුළුවනි."

"ඒකත් ඇත්ත ග්‍රෙග්සන්" හෝම්ස් කීවේ අසුනෙන් නැගිටිමිනි. "මායි වොට්සනුයි මේ කිට්ටුවෙන් දවාලට සැන්ඩ්විච් එකක් කාලා, දවල් දෙකට කාලක් තිබියදී මෙතැනට එනවා. ඔබත් ඒ වෙලාවට ආවොත් හොඳයි ග්‍රෙග්සන්."

"සත්තකින්ම මං එනවා හෝම්ස් මහත්තයා."

කාටර් මහත්මිය අපෙන් සමුගෙන පිටවී ගියාය.

"මගේ සෝදිසිය තවමත් ඉවර නැහැ. තවත් පරීක්ෂා කළයුතු තැන් කිහිපයක්ම තියෙනවා" හෝම්ස් කීවේ පොලිස් නිලධරයාටයි.

http://sherlockholmesinvestigations.blogspot.com

"දැන් මගේ හිතේ සැකයක් ඇතිවෙලා තියෙනවා මේක මිනීමැරුමක්ද කියලා. ඔබ දැන් යන්නේ රහස් පොලිස් මූලස්ථානයට නිසා, මං ඔබට පොඩි කාරණයක් කියන්නම්. කාලෙකට පෙර වර්තිංඩන් බැංකුව කොල්ල කෑව හොර කල්ලියක, සට්න් නම් පුද්ගලයෙක් ඔහුගේ සගයන් අතින් අද්භූත අයුරින් මැරුම් කෑවා. මේ ගැන විස්තර ඔබට මතක නැත්නම්, දොස්තර වොට්සන්ගේ වාර්තා පෙරලා බැලුවොත් දැනගන්න පුළුවනි. මං කියන්න හදන්නේ මේකයි.

මට තේරුම් ගන්න අමාරු අබිරහස් නැත් කිහිපයක්ම මෙතැන තියෙනවා. මෙතැන සියදිවි නසා ගැනීමක් වෙලා බවයි ඔබ කියන්නෙ. නමුත් කර්නල් වෝබටන් බැංකුවේ තිබුණු මුදල් සියල්ල ආපහු අරගෙන තමාගේ ගෙදර යකඩ සේප්පුවේ දමාගෙන ආරක්ෂා කළා. එහෙම හිතන්න අපට සාක්ෂි තියෙනවා. ඔහු හිස්වැසුම නිෂ්පාදනයෙනුත් විශාල මුදලක් හෙව්වා. ඒ කිසිදෙයකට සිද්ධවුණු දෙයක් නැහැ. සේප්පුව හිස්.

මේ ක්ෂේත්‍රයේ ඔබ සමහරවිට නොදන්නා කරුණු කිහිපයක් මං ඔබට දැන් කියන්නම්. ක්‍රිමියා යුද්ධය අවසන් වෙද්දී, බ්‍රිතාන්‍ය හමුදාවේ සේවය කළ ඉහළ නිලධරයන් කිහිපදෙනෙකු බැංකු වලට බඳවා ගත්තා. ඒ මොකටද? බැංකුවල ආරක්ෂක කටයුතු මෙහෙය වියයුතු ආකාරය ගැන උපදෙස් දීමට සහ ආරක්ෂක නිලධරයන්ට ගිනිඅවි පුහුණුව ලබාදීමට. කර්නල් වෝබටන්ට වික්ටෝරියා කුරුසියෙන් සම්මාන පිදුණු බව ඇත්ත, නමුත් ඊට පස්සේ ඔහු කොහේද හිටියේ? මොකද කළේ? ආබාධිත විශ්‍රාමිකයෙක් හැටියට ගෙදරම හිටියද? නැත්නම් කවුරුන් හෝ සමග ආශ්‍රයක් තිබුණද? මේ හිස්වැසුම් නිෂ්පාදනය සඳහා මිනිසුන් බඩුගෙන ආවා. ඒවා මිලදී අරගෙන යන්න කිසල හැම සිනිඳුරාදාකම මිනිසුන් මෙහේට ඇවිත් තියෙනවා. ඔවුන් ඇත්තටම ආවේ ඒ කටයුත්තටද, නැත්නම් වෙන මොකකට හරිද? වෝබටන් වෙනත් නමකින් පෙනී හිටියද?

ඔහුගේ මේ ඡායාරූපයත් අරගෙන ගිහිං, ස්කොට්ලන්ඩ්යාඩ් හි අපරාධකරුවන්ගේ ඡායාරූපාගාරයේ සෝදිසි කරල බලන්න."

තමාට පැවරුණු කාර්යය සතුටින් භාරගත් ග්‍රෙග්සන් පිටවී ගියේය. කර්නල්වරයාගේ ලියනමේසයට වාඩිවූ හෝම්ස්, ප්‍රථමයෙන් එහි තිබූ පෑන් පැන්සල්, තීන්ත බෝතල් ආදිය පරීක්ෂා

http://sherlockholmesinvestigations.blogspot.com

කළේය. අනතුරුව තම සාක්කුවෙන් කුඩා දේ ලොකු කර බලන උත්තල කාචය අතට ගෙන, මේසය මත වූ තීන්ත පොවන කඩදාසිය වෙත තම අවධානය යොමු කළේය.

"වොට්සන්. මේ තීන්ත පොවන කඩදාසියේ පොගවා තිබෙන ලිවීම්, මොන පාට තීන්තෙන් කියලද ඔබ හිතන්නෙ?"

මම කාචය අතට ගෙන පරීක්ෂා කර බැලිමි. තරමක් පරණ පොවන කඩදාසිය පුරා, තීන්තෙන් කළ ලිවීම් වියළා ඇති සැටි දුටුවෙමි.

"හැම එකක්ම වාගේ නිල්පාට තීන්තෙන් කළ ලිවීම්. එකම තැනක් හෝ දෙකක් කළු තීන්තෙන්. රතු, දම්, හෝ කොළ තීන්ත වියළීම් මොකවත් නැහැ" මම කීවෙමි.

"දැන් අපි බලමු මේ මේසය උඩ සහ කන්තෝරු කාමරයේ තිබෙන තීන්ත මොනවද කියල."

හෝම්ස් මේසය උඩවූ තීන්ත බෝතල් දෙකක් ඉවතට ගත්තේය. ඒ දෙකම "ක්වින්ක්" වර්ගයේ නිල්පැහැති තීන්ත විය. එක් බෝතලයක් බොහෝ දුරට අවසන් වී තිබූ අතර, අනෙක පාවිච්චියට ගෙන නොතිබිණ. ඔහුගේ නිවස පුරා හොයා බැලුවත් වෙනත් තීන්ත බෝතල් හමුනොවිණි.

"එහෙම නම් කොහොමද කළු තීන්තෙන් මොනව හරි ලියවිලා තියෙන්නෙ?"

මම ඇසීමි.

"සැකයක් නෑ. ගෙදරට ආව කෙනෙක්, කර්නල් සමග වෙළඳ ගනුදෙනුවකට ආ කෙනෙක් වෙන්න ඇති; චෙක්පතක් හෝ රිසිට්පතක් ලියුවා වෙන්න පුළුවනි. එහෙමත් නැත්නම් කර්නල්ට ප්‍රතිකාර කිරීමට ආ වෛද්‍යවරයා ඖෂධයක් ලියාදුන්නා වෙන්නත් පුළුවනි. එහෙම නම් ඒක ෆවුන්ටන් පෑනකින් (උල්පත් පෑනකින්) කළ ලිවීමක් විය යුතුයි. ඒ මොකද මෙහේට ආව කෙනෙක් තමන්ගේ තීන්ත බෝතලයත් සමග කූරුපෑනක් අරගෙන ආවා කියල හිතන්න අමාරුයි."

"කර්නල් ළඟ කළුපාට තීන්ත, ෆවුන්ටන් පෑනක් තිබුණා වෙන්න බැරිද?"

"විශිෂ්ටයි වොට්සන්!" හෝම්ස් කීය. "ඒකත් අපි අමතක නොකළ යුතු කරුණක්. නමුත් අපි සෝදිසි කළ කොහේවත් තිබී

http://sherlockholmesinvestigations.blogspot.com

එවැන්නක් හමුවුණේ නැහැ. ඔහුගේ අත් අකුරෙන් කළ ලිවීම් රාශියක් දකින්න ලැබුණා. ඒ හැම එකක්ම නිල් තීන්තෙන් කළ ඒවා."

"හොඳයි. මොනවද ඔබට මේකෙන් ගතහැකි නිගමන?" මම ඇසීමි.

"මෙන්න මේකයි" කී හෝම්ස්, විශාල තීන්තපොවන කඩදාසිය අමුණා තිබූ රාමුවෙන් ඉවත්කරගෙන, එය නානකාමරයේ කැටපත ඉදිරියට ගෙන ගියේය.

"මොනවද වොට්සන් ඔබට කියවන්න පුළුවන්?"




"මොකුත් පැහැදිලි නැහැ" මම කීඅවමි. "නමුත් ලිපිනයක් ලියා ඇති බව කිව හැකියි. යටින්ම තියෙන වචනය ලන්ඩන්."

"ඔව්. පැහැදිලි නැහැ. නමුත් අපට තැන් තැන් වල අකුරු හඳුනාගත හැකියි" මගේ මිතුරා කීය. "මුල්ම වචනය G අකුරෙන් පටන්ගත් නමක්. දෙවැනි වචනය Kit සහ තවත් මොනවා හරි තිබෙන නමක්. ඊළඟට නම් තියෙන්නෙත් & Co- සහ සමාගම කියලා. ඔබට ඒක පැහැදිලිද?"

"ඔබ කිව්වට පස්සේ, මට ඒ ටික හිතාගන්න පුළුවනි."

"හොඳයි. දැනට අපි දෙවැනි පේළිය අමතක කරමු. අංකයක් තියෙනවා ඒක 64, හෝ 67 හෝ 61 විය යුතුයි. ටිකක් පැහැදිලි මදි. ඊළඟට වීථියේ නම. ඒක Vin සහ තවත් යමක්. ඊටත් පහළින් පේළියේ මුල් වචනය St දෙවැනි වචනය පැහැදිලි නෑ. නමුත් අන්තිම වචනය Square විය යුතුයි. එතකොට අපට තියෙනවා.

G...... Kit...... & Co
64\61\67 Vin....... ........
St...... Square

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only.. Not For Print.

හොඳයි වොට්සන්. ලන්ඩන් නගරයේ පාර තොට ගැන ඔබේ දැනුම ප්‍රයෝජනවත් වෙනවා මෙන්න මේ වෙලාවේ. ඒ මොකද ලන්ඩන් නගරය පිළිබඳ සවිස්තර අත්පොත, මේ වෙලාවේ අප ළඟ නැති නිසා. මුලින්ම මතක් කරන්න සාන්තුවරයන්ගේ නම් යොදා තිබෙන චතුරශ්‍ර මොනවාද?"

"සාන්ත ක්ලෙයා චතුරශ්‍රය, සාන්ත නිකලස් චතුරශ්‍රය, සාන්ත සෙබස්තියන් චතුරශ්‍රය?" මම කීවෙමි.

"ඒ එකක් වත් කියල හිතන්න අමාරුයි. ඒ මොකද මේ දෙවැනි වචනය පටන්ගන්නේ T නැත්නම් J අකුරෙන් කියලයි මට හිතෙන්නේ...."

"සාන්ත තෝමස්,...... සාන්ත ජූඩ්,......... සාන්ත ජේම්ස්......"

"විශිෂ්ටයි වොට්සන්. ඒක කදිමට ගැළපෙනවා. සාන්ත ජේම්ස් චතුරශ්‍රය හරියටම හරි. මෙතැනින් ඉදිරියට ගමන පහසුයි."

"ඒ කොහොමද?"

"ඔය දුරකතන නාමාවලිය ගන්න. ඒකෙ නිල්පාට පිටුවලින් ඇති වෙළඳසැල් නාමාවලිය බලමු. සාන්ත ජේම්ස් චතුරශ්‍රයේ තිබෙන වෙළඳ ආයතන වලින් G සහ Kit නම් බලීත් ඇති සමාගම......." හෝම්ස් නාමාවලියේ පිටු පෙරලමින් පරීක්ෂා කළේය.

"මෙන්න තියෙනවා" හෝම්ස් කෑගැසුවේ අපමණ සන්තෝෂයෙනි.

Gordon Kitchner & Co<br>
Money Lender<br>
64 Vine Street<br>
St. James Square

ගෝඩින් කිච්නර් සහ සමාගම<br>
මුදල් ණයට දෙන්නෝ<br>
64 වයින් වීථිය<br>
සාන්ත ජේම්ස් චතුරශ්‍රය.

"දැන් කාරණය ටික ටික පැහැදිලි වෙමින් එනවා. කාමරයට ආව පුද්ගලයා කවුරු හරි........" කී මගේ මිත්‍රයා කතාබහ නවත්වා කල්පනා කිරීමට පටන්ගත්තේය. ඔහු නළල රැලිකරමින් දිගින්

http://sherlockholmesinvestigations.blogspot.com

දිගටම කල්පනා කළා මිස, කිසිවක් පැවසුවේ නැත. බිත්ති ඔරලෝසුවේ දහවල් 12.30 නාද විණි. හෝම්ස් තම දූහැනෙන් අවදිවූයේ එවිටයි.

"දෙයියෝ සාක්කි!" ඔහු කීය. "අපි තවම දවල් කෑමට ගියෙත් නෑ. දොස්තර බෙල් එනවා කිව්වේ දවල් දෙකට නේද. ඒක මට සම්පූර්ණයෙන්ම අමතකවුණා. අපි ඉක්මනට ගිහින් එමු වොට්සන්."

අප නිවසෙන් එළියට පිවිසෙද්දීම මෘතශරීරය ඉවතට ගෙන යාම සඳහා සේවකයෝ පැමිණියහ. ඒ සමගම පොලිස් භටයෝ දෙදෙනෙක් ද වූහ.

"කර්නල් වෝබටන්ට උමතුවක් තිබුණා හරි, නැතුව හරි" හෝම්ස් කීවේ "ෂෙල් රෝයල්" නම් ප්‍රංශ අවන්හලට ඇතුළු වී පුටුවක් ඇද වාඩිවෙමිනි. "ගෝඩ්න් කිච්නර් නම් සමාගමකින් ඔහුට ණයක් ගන්න උවමනා වුණේ ඇයි?, බැංකුවේ තිබ්බගත් මුදල් සියල්ල කිසියම් හේතුවක් නිසා වියදම් වෙලා ගියා කියල හිතමු. නමුත් ඔහුගේ විශ්‍රාම වැටුප සහ ස්වසං ක්‍රියාවෙන් ලැබුණු ආදායම? ඒවට මොකද වුණේ?"

"ඔහු සූදුවට ඇබ්බැහි වී සිටි, අශ්වරේස් සඳහා මුදල් විනාශ කළ කෙනෙකු වෙන්න බැරිද?"

මම ඇසීමි.

"මතක තියාගන්න. ඔහු බොහොම අරපරෙස්සමින් ජීවත්වූ කෙනෙක්. ඒ නිසා ඔහු සූදුවට මුදල් නාස්ති කළා කියල හිතන්න අමාරුයි" මෙසේ කී හෝම්ස් අවන්හලේ කෑමවට්ටෝරු පත අතට ගත්තේය. "අපි මේ ඔක්කොම අමතක කරල බඩ පිරෙන්න හොඳ කෑම වේලක් කාලා ඉඳිමු වොට්සන්. ඔබ දුටුවාද අර එක." ඔහු කීවේ අවන්හලේ ඇතුළත පුවරුවේ වූ දැන්වීම පෙන්වමිනි.

අද විශේෂ : කැවියාර් සමග බේකන් සහ චීස් ඔම්ලට්.

ඔහු අතිශයින් ප්‍රිය කළ බේකන් සහ චීස් ඔම්ලට් රස විඳිද්දී කර්නල් වෝබටන් හෝම්ස්ට සම්පූර්ණයෙන්ම අමතක වුණු බැව් දුටුවෙමි.

දහවල් ආහාරය අවසන් කොට අප කර්නල්ගේ නිවසට ළඟාවෙද්දී, සවස දෙකට මිනිත්තු දහයක් තිබිණි. ග්‍රෙග්සන් ද පැමිණි බව ගේට්ටුවේ මුරට සිටි පොලිස්භටයා අපට දැනුම් දුන්නේය.

http://sherlockholmesinvestigations.blogspot.com

මළසිරුර ඉවත්කරගෙන යාම නිසා කාමරයේ පෙනුම වඩාත් ප්‍රසන්න විය. අප එහි පිවිසෙද්දී ග්‍රෙග්සන් සෝපාවේ වාඩිවී යමක් කියවමින් සිටියේය.

"හෝම්ස් මහත්මයා" ඔහු කීය. "ඔබ කිව් කාරණය - ඒ කියන්නේ කර්නල් වෝබටන් ට අපරාධ සම්බන්ධ ඉතිහාසයක් තියෙනවද කියල මං පරීක්ෂා කරල බැලුවා. නමුත් එහෙම කිසිවක් මට නම් හොයාගන්න බැරිවුණා."

"හොඳයි ඒකට කමක් නෑ." හෝම්ස් කීවේ අසුනක වාඩිවෙමිනි. "බාගවෙලාවට- ඔහු අහිංසකයෙක් වෙන්න පුළුවනි. ඔහු සියදිවි නසා ගත්තද? නැත්නම් කවුරු හරි ඔහුව මරා දැමුවද? එහෙම කළා නම් ඒ මොන අරමුණකින්ද? ඔහු ළඟ තිබුණා කියන ඇතැයි අපි හිතන මුදල් වලට මොකද වුණේ? ඔහු මරා දැමුවා නම් ඒ සඳහා මෙහේට ආව අමුත්තා කවුද? මේ ප්‍රශ්නවලට පිළිතුරු හොයාගන්න අපට සෑහෙන මහන්සියක් වෙන්න වෙයි වගේ.")

"මට ඔබට කලින් කියන්න බැරිවුණා" ග්‍රෙග්සන් කීවේ වාඩිවී සිටි තැනින් නැගිටිමිනි. "ඉහළ තට්ටුවේ ඔහුගේ නිදන කාමරයේ බුමුතුරුණ මත, ඇඳ අසළම, දුඹුරු පැහැති විශාල පැල්ලම් දෙකක් මට දකින්න ලැබුණා. ඒවා පරණ ලේ පැල්ලම්ද නැත්නම් මොනවාද කියා බැලූ බැල්මට තේරුම් ගන්න අමාරුයි. ඔබම ගිහින් එය සෝදිසි කර බැලුවොත් වඩාත් ප්‍රයෝජනවත් වේවි."

"මම ඒ වැඩේට දොස්තර වොට්සන් යවන්නම්" හෝම්ස් කීය. "ශල්‍ය වෛද්‍යවරයෙක් හැටියට ඔහු මටත් වඩා හොඳට ලේ පැල්ලම් හඳුනාගනීවි. වොට්සන්, කරුණාකරල මේ කියන පැල්ලම් මොනවද කියල බලන්න. ඒ අතරේ මා විසින් කළයුතු තවත් එක් දෙයක් තියෙනවා."

තරප්පු පෙළ දිගේ ඉහළ තට්ටුවට යාමට මම අසුනෙන් නැගිට්ටෙමි. මා සමග එහි යාමට ග්‍රෙග්සන් ද සූදානම් විය. කලින් අපි එක්වරක් වෝබටන්ගේ නිදන කාමරයට ගියෙමු. එවෙලේ මෙම පැල්ලම් දුටු බවක් මට මතක නැත. මා නොදුටුවත් හෝම්ස්ට එය මගහැරුණේ කෙසේද? අනෙක් අතට ලේ පැල්ලමක් වැනි හෝඩුවාවක් ගැන අසන්නට ලැබුණහොත්, ඒ ගැන පරීක්ෂා කිරීමට මගේ මිත්‍රයා කිසිසේත් ප්‍රමාද නොවේ. නමුත් අද ඔහු ඒ ගැන උනන්දුවක් නොදැක්වූයේ ඇයිද යන්න, මට සිතාගැනීමට අපහසුවිය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ග්‍රෙග්සන්" හෝම්ස් පොලිස් නිලධරයා ඇමතුවේ, ඔහු පියගැට පෙළේ තරප්පු තුන හතරක් ඉහළට දුව නැගී පසුයි. "මොහොතක් ඉන්න. ඔබ කියන පැල්ලම දොස්තර වොට්සන් පරීක්ෂා කරල ආපුවාවෙ. මට ඔබෙන් වහාම දැනගත යුතු විස්තර ටිකක් තියෙනවා..... දැන් වෙලාව දෙකයි. දොස්තර බෙල් කොයි මොහොතේ හෝ ඒවි. වොට්සන් ඔබ ගිහින් ඉක්මනට එන්න. ඒ අතරේ ග්‍රෙග්සන්....."

පොලිස් නිලධරයා තරප්පුව බැස, ආපසු මගේ මිත්‍රයා වෙත ගියේ එතරම් සතුටකින් නොවේ. මම ඉක්මනින් කර්නල් වෝබටන්ගේ නිදන කාමරයට ගොස් බුමුතුරුණ පරීක්ෂාකර බැලීමි. එය තේ හෝ කෝපි කෝප්පයක් හැළීම නිසා ඇතිවූ පැල්ලමක් බව පැහැදිලිවම පෙනිණ, මම ඉක්මනින් පහළ තට්ටුවට බැස්සෙමි.

"......ඒ කටයුත්ත ඔබ කිව් ආකාරයටම කරන්න, මං පොරොන්දු වෙනවා හෝම්ස් මහත්මයා."

හෝම්ස් හා ග්‍රෙග්සන් අතර ඇවැති සංවාදයක අවසන් කොටස මට ඇසුණේ පියගැට පහළට බසිද්දීය. මෙම පරීක්ෂණය ඉදිරියට ගෙන යායුතු ආකාරය ගැන, ඔවුන් ආකච්ඡා කරන්නට ඇත. මට දකින්නට ලැබුණු දේ ගැන මගේ මිත්‍රයාට පැවසීමට පෙර ඉදිරි දොර විවෘත විය.

නියමිත වෙලාවට මිනිත්තු තුනක් පමාවී පැමිණි මේ අමුත්තා වෛද්‍යවරයා බව මම තේරුම් ගතිමි. අවුරුදු තිස්පහක් පමණ වයසැති කඩවසම් පුද්ගලයෙකු වූ ඔහුගේ අතේ, වෛද්‍යවරුන් ගෙනයන වර්ගයේ කළු පැහැති බෑගයක් විය. අඩි හයකටත් වඩා උස, ඊට සරිලන මහතක් තිබූ ඔහු, ඉතා අලංකාර ඇඳුම් කට්ටලයකින් සැරසී සිටියේය. නිවසේ විසිත්ත කාමරයට පිවිසි ඔහු, කිසිවක් තේරුම් ගැනීමට අපහසු වූවාක් මෙන් වටපිට බැලීය.

"සමාවෙන්න මහත්වරුනි" ඔහු කීය. "මං මේ ආවේ මගෙන් ප්‍රතිකාර ලබන, කර්නල් වෝබටන් පරීක්ෂා කරන්න. අද මං මේ වෙලාවට එන බව ඔහුට දන්වලයි තියෙන්නෙ."

"කර්නල් වෝබටන් මියගියා" පොලිස් නිලධරයා පැවසුවේ එතරම් ගරුසරු බවකින් නොවේ. "මං හිතන්නේ ඔබ වෙන්න ඇති දොස්තර බෙල්?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවා කර්නල් වෝබටන් මියගියා?" වෛද්‍යවරයාගේ මුහුණේ පළවූයේ අතිශයින්ම මවිතයට පත් ලකුණුය. අනතුරුව ඔහු කථාකිරිමට පටන්ගත්තේ සුසුමක් හෙළීමෙන් පසුයි.

"මම දොස්තර මයිකල් බෙල්. මගේ රෝගියාට මොකද වුණේ? හදිසියේ මියයන්න තරම් බරපතල රෝගී තත්ත්වයක් ඔහුට තිබුණේ නැහැ. සිහිකල්පනාව අඩුවෙලා, ඔහු මද උමතු තත්ත්වයකින් හිටී බව නම් ඇත්තයි. නමුත් කායිකව දරුණු රෝගයකින් පෙළුණේ නැහැ."

"දොස්තර මහත්මයා" හෝම්ස් කථා කළේ නිවුණු ස්වරයෙනි. එහි අරමුණ වූයේ කැලැඹීමට පත් වෛද්‍යවරයා සන්සුන් කිරීම බව මම තේරුම් ගතිමි.

"කර්නල් වෝබටන් මියගියේ සිය දිවි හානිකරගෙන. ඔහු කට ඇතුළට වෙඩි තබාගෙන."

වෛද්‍යවරයාට සිහුරුහත් කෙරුණේ, තම රෝගියා මෙවැනි ඉරණමකට මුහුණ දෙන බවක් දැන සිටියාක් මෙනි. වෛද්‍ය බෙල් තම හිස, සෙමින් ඉදිරියට හා පිටුපසට සෙලවීය.

"හෝ හෝ! ඒ විධියටයි ඔහු මරණයට පත්වුණේ එහෙනම්." බෙල් කීය. අනතුරුව ඔහු දිග සුසුමක් හෙළා දෙවුර හැකිළුවේය. "අසරණ මනුස්සයා! වයස්ගත වීම නිසා ඔහු මස්තිෂ්ක ව්‍යසනයට ගොදුරු වී හිටියා. මං නියම කළ ඖෂධ ඔහු හරිහැටි පාවිච්චි කළේ නෑ. රෝගය උත්සන්න වෙන්න හේතුව ඒකයි. ඒ වුණත් මං හීනෙකින්වත් හිතුවෙ නෑ දෙවියනේ මෙහෙම දෙයක්........."

"දොස්තර මහත්මයා" හෝම්ස් බෙල්ගේ කථාවට බාධා කළේය. "ඔහුට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා හැටියට, කර්නල් මෙවැනි දෙයක් සිද්ධකරගැනීම ගැන ඔබට පුදුම නැතුව ඇති. නමුත් අපට වෛද්‍ය සහතිකයක් උවමනා වෙනවා. මුද්‍රිත පෝර්ම නොමැති වුණත්, කරුණාකරල ඔහුගේ රෝගී මානසික තත්ත්වයත්, මරණයට හේතුවූ පසුබිම ගැනත් විස්තරයක් ලියල දෙන්න. කර්නල් ගේ අවසන් කටයුතු කරන්න ඒක ලොකු පහසුවක් වේවි."

හෝම්ස් කියද්දීම තම බෑගය විවෘත කොට කඩදාසියක් හා පෑන ගත් වෛද්‍යවරයා, මේසයට වාඩිවී දීර්ඝ විස්තරයක් ලියුවේය. එය අවසන් කළ පසු ලියවිල්ල හෝම්ස් අතට ලැබිණ.

"දොස්තර මහත්මයා" ටෝබියස් ග්‍රෙග්සන් වෛද්‍යවරයා ඇමතීය. "කර්නල් වෝබටන්ගේ නිදනකාමරයේ බුමුතුරුණ මත

Reading Purpose Only Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

දුඹුරු පැහැති පැල්ලම් වගයක් තියෙනවා. මට නම් හිතෙන්නේ ඒවා ලේ පැල්ලම් කියලයි. ඒ වුණත් මං කැමැතියි ඒ ගැන වෛද්‍යවරයෙකුගේ අදහස් දැනගන්න......" ග්‍රෙග්සන්ට කීමට ඉඩ ලැබුණේ එපමණකි. ගිනි උඳුන් පඩිය මත තිබූ වීදුරු මල් බඳුනක් හෝම්ස්ගේ අතවැදී බිම වැටී කැබැලි වලට කැඩී ගියේය.

"දෙයියෝ සාක්කි!" හෝම්ස්ට කියැවිණි. "මට සමාවෙන්න මහත්වරුනි. මගේ අත්වැරැද්දක්" හෝම්ස් පැවසුවේ තම දකුණු අතින් නළලට තට්ටුකර ගනිමිනි. "වොට්සන්. අපි මේ වීදුරු කැබලි ඉවත්කරලා, මෙතන ඉක්මනින් පිළිවෙළක් කරල දාමු. ග්‍රෙග්සන් ඒ අතරේ ගිහිං, ඔබ දොස්තර මහත්මයාට පෙන්වන්න බලාපොරොත්තු වුණු දේ පෙන්වන්න."

වෛද්‍යවරයා සමග පොලිස්නිලධරයා ඉහළ මාලයට ගිය විගස හෝම්ස් දුරකථනය මතට ගොස් කිසිවෙකු අමතා කථා කළේය. බිඳුණු වීදුරු කැබැලි එකතුකිරීමට මට භාරවුණු නිසා ඔහු කවුරුන් සමග කුමක් කථා කළේ ද යන්න, මට අසාගන්නට නොලැබිණි.

මිනිත්තු දහයක් ගතවෙද්දී ග්‍රෙග්සන් වෛද්‍යවරයා සමග පහළට බැස ආයේය.

"මොනවා හරි කහට පැල්ලමක්, ලේ නම් නොවෙයි." කී වෛද්‍ය බෙල් සැපපහසු අසුනක වාඩිවිය.

"සියදිවි හානිකර ගැනීමට හේතුව කියලා ඔබ දුන් වෛද්‍ය සහතිකය, අපට ප්‍රයෝජනවත් වෙනවා දොස්තර මහත්මයා" හෝම්ස් කීය. "ඒ වුණත් පුවත්පත් වාර්තාකාරයින්ගෙන් තමා ගැළවෙන්නම බැරි. ඔවුන් අහයි අපි අතන මෙතැන හැම තැනක්ම හරි හැටි සෝදිසි කළාද කියලා. ග්‍රෙග්සන් දැන් නම් මට හරි මහන්සියි. ගේම සෝදිසි කරන කටයුත්ත, මං හෙට උදේට දොස්තර වොට්සනුත් එක්කි ඇවිත් කරන්නම්. නමුත් අද හැන්දෑවට මට එක උදව්වක් කරල දෙන්න ඕන."

"ඒ මොකක්ද හෝම්ස් මහත්මයා?"

"අර ගිනිඋඳුනේ දුම්කවුළුව නම් හරිම අපිරිසිදුයි. සෑහෙන කාලෙකින් පිරිසිදු කරලා නැතුව ඇති. මං හිතන්නේ දූලි තට්ටුව අඟලක් දෙකක් ගනකමට ඇති. ගිනිඋඳුනේ ආරක්ෂක වැටෙන් ඇතුළුවුණාම, දුම්කවුළුව හොඳින් පිරිසිදු කරන්න පුළුවනි. ඔබට හැකිද අද හැන්දෑවෙම ඒ වැඩේ කරවන්න. කාටර් මහත්මියට කිව්වොත්, ඇගේ සැමියා ලවා කරවාවි."

http://sherlockholmesinvestigations.blogspot.com

"අද හැන්දෑවට මං ඒක නොවරදවාම කරවන්නම්" පොලිස් නිලධරයා පිළිතුරු දුන්නේය.

"හොඳයි. මං ඔබට පොරොන්දු වුණානේ කර්නල්ගේ නිදන කාමරය සෝදිසි කරන බවට. දැන් ඒකට යමු" හෝම්ස් කීවේ ග්‍රෙග්සන්ටයි. "බුමුතුරුණු, කොට්ට, මෙට්ට හැම දෙයක්ම ඉවත්කරලා, එක කොනක ඉඳන් පරීක්ෂා කරමු. වොට්සන් ඔබේ උදව්වත් අපට අත්‍යවශ්‍යයි."

මම ග්‍රෙග්සන් සමග පියගැට පෙළේ ඉහළට නගින්නට පටන්ගත්තෙමි. හෝම්ස් අප පිටුපසින් ආවේය. අපි උඩුමහලට නැගී වහාම, බුමුතුරුණු ඉවත් කළ යුතු බැව් හෝම්ස් උස්හඬින් කීවේ ග්‍රෙග්සන්ටයි.

උඩුමහළට නැගුණු වහාම, මගේ මිත්‍රයා තම පාවහන් ගළවා පැත්තකින් තැබීය. අපට ද වහා එසේ කරන මෙන් ඔහු සංඥා කළේය. මීළඟට ඔහු නිශ්ශබ්දව තරප්පු පෙළේ පහළට බැස්සේ අප ද කැඳවමිනි. කිසිදු ශබ්දයක් නොනගා අපි විසිත්ත කාමරයට පිවිසුණෙමු.

වෛද්‍ය බෙල්, ඔහු කලින් අසුන්ගෙන සිටි තැන දක්නට නොවීය. ඔහු සිටියේ හෝම්ස් කලින් පිවිසුණු, ගිනිඋදුනේ ගසඩකුරු මත ය. ඒ දැක මම අතිශය පුදුමයට පත්විමි.

අපට ශබ්දයක් නොනගා දෙපසට වන ලෙස හෝම්ස් සංඥා කළේය. මිනිත්තුවක් ගතවන්නට පෙර වෛද්‍යවරයා ගිනි උදුනෙන් එළියට ආවේ, ඇඳුම පුරා තැවරුණු දූලි ඉවත් කරමිනි. ඒ අතරම ඔහු යමක් තම කබා සාක්කුවට දමාගත්තේය.

හෝම්ස් සහ ග්‍රෙග්සන් එක්වරම ඔහු වෙත කඩාපැන, වෛද්‍යවරයා බදා තදින් අල්ලාගත්හ.

"දොස්තර මහත්තයා! මොකටද එිමිනි කවුළුවේ දූලි සුද්ධ කරන්න ගියේ?" හෝම්ස් ඇසුවේ සිනාමුසු මුහුණෙනි. "මං ඒ වැඩේ ග්‍රෙග්සන්ට භාරදුන්නා නේ?"

"මං....... මං......." යයි ගොතගැසූ වෛද්‍ය බෙල්ගේ මුහුණ භීතියෙන් සුදුමැලි වී තිබිණි. තම අතක් නිදහස් කර ගැනීමට ඔහු තදින් පොර බැදුවේය.

"වොට්සන්!" හෝම්ස් කෑගැසුවේය. "ගන්න ඔහු කබා සාක්කුවට දමාගත් රිවෝල්වරය!"

http://sherlockholmesinvestigations.blogspot.com

මම වහාම වෛද්‍යවරයාගේ කබා සාක්කුවෙන් ගිනිඅවිය එළියට ගතිමි.

"කර්නල් වෝබටන් සියදිවි හානි කරගත් රිවෝල්වරය මේක නේද මහත්මයා?" හෝම්ස් ඇසුවේ ඔවුන් දෙදෙනාගේ ග්‍රහණයෙන් ගැළැවීමට දඟළු වෛද්‍යවරයාගෙනි.

ග්‍රෙග්සන්ගේ පොලිස් තළා හඬ සමග ගෙට ඇතුළු වූ පොලිස් භටයෝ වෛද්‍ය මයිකල් බෙල්ගේ දෑතට විලංගු දමූහ. පැය භාගයක් ගතවෙද්දී ඔහු ග්‍රෙග්සන් හා තවත් පොලිස්භටයෙකු සමග කුලීරියකින් ස්කොට්ලන්ඩ්යාඩ් බලා යනු අපි බලා සිටියෙමු. ඔහුගේ සුඛෝපභෝගී අශ්වකරත්තය පාර අයිනේ නවත්වා තිබිණි.

* * *

"මට නම් මේ කිසිම දෙයක් තාවමත් තේරුම් ගන්න බැහැ, හෝම්ස්" මම කීවෙමි. "දකින්න ලැබුණු දේවල හැටියට නම් ඔහු අපරාධයක් කරල වගෙයි. ඔහු එහෙම දෙයක් කළ බවක් ඔබ දැනගත්තෙ කොහොමද?"

මා මගේ මිත්‍රයාගෙන් ඇසුවේ එදා රාත්‍රියේ බේකර් වීථියේ, අපේ නිවහමේ අප කතාබහේ යෙදී සිටියදීය.

තම පයිප්පයේ වූ අඩක් දැවී ගිය දුම්කොළ රොඩු හා අළු සියල්ල ඉවතට හැළූ හෝම්ස්, එය අලුත් දුම්කොළ වලින් පුරවා ගත්තේය. එය දල්වාගෙන දුම්වළලු කිහිපයක් පිටකළ පසු ඔහු කථාව පටන්ගත්තේය.

"මගේ හිතේ මුලින්ම සැකයක් ඇතිවුණේ ඔහු ඒවා තිබූ අර ලියුමෙන්" හෝම්ස් කීය. "ලියුම එවූ කවරයක් අපට දකින්න ලැබුණේ නෑ. ඒක කමක් නෑ කියමු. ඒ වුණත් කර්නල් වෝබටන් මොකටද වෛද්‍යවරයා එන බව දැන්වූ ලියුම මුදල් පසුම්බියේ දමාගත්තෙ? කොහේවත් ඇවිදින්න නොයා ගෙදර ඉන්න මිනිහෙක්, මෙවැනි නොවැදගත් ලියුමක් ඉමිසෙ උඩින් හෝ ගිනි උදුන් පඩිය උඩින් තියාවි. නැත්නම් අනෙක් ලියුම් සමග තියාවි. ඒ අසාමාන්‍ය බව නිසා මගේ හිතේ සැකයක් ඇතිවුණා.

ඊළඟට මළසිරුර අසල වැටී තිබූ රිවෝල්වරය. ඒකෙ අයිතිකාරයා වෝබටන් බව ඇත්තයි. ඒකෙ මැගසිනයේ තිබූ එක් පතරොමක් අඩුයි. නමුත් මේ රිවෝල්වරයෙන් මෑත කාලෙක

http://sherlockholmesinvestigations.blogspot.com

වෙඩිල්ලක් පත්තු කරල නෑ. ඔබ දකින්න ඇති මං සුදුරෙදි කැබැල්ලක් දමලා, එහි කට ඇතුළ පිසදා බැලූ හැටි. එහි වෙඩිබෙහෙත් දැවුණු දූලි තිබුණේ ඉතාම ස්වල්පයයි. ඊට වඩා දූලි තිබුණා මියගියා පුද්ගලයාගේ කටේ; කැබලි වලට කැඩී ගිය කෘතිම දත් එකට බද්ධ කළ වල්කනයිට් වලින් සෑදූ තල්ලේ. එතකොට මට පැහැදිලි වුණා, වෙඩි තැබීමට පාවිච්චි කළේ මේ රිවෝල්වරය නොවන බව. ඒ කියන්නේ මෙක් සියදිවි නසාගැනීමක් නොවන බව.

ඊළඟට කර්නල් වෝබටන් උමතු වී ඇති බව කාටර් මහත්මියට කියමින්, මේ ජවනිකාව රඟදැක්වීමට පසුතලය සකස් කළේ කවුද? වෛද්‍ය බෙල්. අපි හරියටම දන්නේ නෑ කර්නල්ගේ උමතු බවක් තිබුණාද කියලා. නමුත් එවැනි තත්ත්වයක් ගැන කල්තබා ප්‍රසිද්ධියක් දීල තිබුණාම, දිවිනසාගැනීම ගැන සැකයක් ඇතිවෙන්නේ නෑ.

කර්නල් වෝබටන්ගේ මුදල් මංකොල්ලකන්න හොරු ආවා කියල හිතමු. ඇයි ඔවුන් මේ මහලු මනුස්සයාගේ කට ඇරලා වෙඩි තියන්නේ? ඊළඟට කොහේද ඔහු මියගිහින් හිටියේ? හොඳට දීප්තිමත් එළියක් ඇති විදුලිපහන යට. වෝබටන් ඇයි විදුලිපහන යටට ඇවිත් කට අරින්නේ? ඔබ රෝගියකු පරීක්ෂා කරන කොට, වෛද්‍යවරයෙකු හැටියට ඔබ මුලින්ම මොකක්ද කියන්නේ වොට්සන්? ඔබ කියන්නේ කට හොඳට ඇරලා, දිව එළියට දාලා පෙන්වන්න කියල නේද? එහෙම නේද වොට්සන්? නමුත් මේ වෛද්‍යවරයා තිරිසන් විධියට මොකද කළේ? තමන් විසින් ජීවත් කළ යුතු තැනැත්තාව ඝාතනය කළා. විදුලිපහන යටට ඇවිත් වෛද්‍යවරයාගේ පිළිසරණ පතා කට ඇරිය රෝගියා, මුදල් වලට තණ්හාවෙන් නින්දිත ලෙස මරාදැම්මා!"

"ගිනි උදුනට නැගලා ඔබ කළ කටයුත්තෙත්, පසුව වෛද්‍ය බෙල් එතැනට රිංගූ එකෙත් සම්බන්ධය, මට හරිහැටි තේරුණේ නැහැ හෝම්ස්."

"වෝබටන්ට වෙඩිතැබීමට යොදාගත් රිවෝල්වරය අපරාධකාරයා ගෙන ගියේ නැතිනම්, ඒ ළඟම තිබිය යුතුයි." හෝම්ස් කීය. "මං ගිනිඋදුනට ඇතුළුවෙලා එතැන හොඳින් සෝදිසි කළ හැටි ඔබ දකින්න ඇති. එහි අළු මත එක් තැනක මං දුටුවා,

http://sherlockholmesinvestigations.blogspot.com

"ජෝන් වයිට්" වර්ගයේ සපත්තු අඩියක ලකුණක්. එතැනට නගින්න බොහොම දුරට ඉඩතියෙන පුද්ගලයා කර්නල් වෝබටන්. නැත්නම් කාටර් මහත්මියගේ සැමියා. කකුලේ ආබාධයක් තිබුණු වෝබටන්ට ඔතැනට නගින්න හදිසි අවශ්‍යතාවයක් නැහැ. ඇරත් ඔහුගේ පාවහන් හොඳටම ගෙවී ගිය ඒවා. කාටර් දුප්පතෙක්. මිල අධික වර්ගයේ "ජෝන් වයිට්" සපත්තු පැළැඳි පුද්ගලයෙක් මොකටද ගිනි උදුනට නගින්නේ? එතකොට මං තීරණය කළා, ගිනිඋදුනේ ආරක්ෂක වැටෙන් ඇතුළුවෙලා බලන්න. උඩට අතගාගෙන යද්දි මට අතට අහුවුණා. බිත්තියේ කුඩා ගැටිටක්. නමුත් එතැනට සතුටුදායක ලෙස අත අඹන්න මට හැකිවුණේ උදුනේ යකඩකූරු මතටම නැග්ගට පස්සෙයි. ඒ හිඩැසේ රඳවා තිබුණේ රිවෝල්වරයක් බව මට අනුව දැනුණා. මං ඒක එහෙමම තිබියදී බිමට බැස්සා.

මේ වගේ තැනක ආයුධය තබන්න නම් ඔහු අඩි හයක් වත් උස කෙනෙකු විය යුතුයි. කාටර් මහත්මියගේ සැමියා ගැන තවත් විමසිලිමත් වීමට, මා ඇයට ඉදිරිපත් කළ ප්‍රශ්න ගැන ඔබට මතක ඇති."

"වෛද්‍ය බෙල් ගෙදරට ආවට පස්සෙද, ඔබට ඔහු ගැන සැකය තහවුරු වුණේ?" මම ඇසීමි.

"තීන්ත පොවන කඩදාසියේ කළු තීන්තෙන් ලියැවී තිබුණු දෙය ඔබට මතකද වොට්සන්? ගෝඩ්න් සහ කිච්නර් සමාගමට ලිපියක්" හෝම්ස් කීය. "තීන්ත පොවන කඩදාසියෙන් වියළා තිබුණේ, උල්පත් පෑනකින් කළ ලිවීමක්. කාචයකින් බැලුවාම ඒක කුඩා ළමයෙකුට වුණත් කියන්න පුළුවනි. ඊළඟට කර්නල්ගේ මරණය ගැන වෛද්‍ය සහතිකයක් ඉල්ලුවාම, වෛද්‍ය බෙල් තමන්ගේ උල්පත් පෑන අරගෙන, කළු තීන්තෙන් එය නොපැකිළිව ලියා දුන් හැටි ඔබට මතක ඇති. ඔහුගේ අත්අකුරු වල තීන්ත පොවන කඩදාසියේ තිබූ අකුරු වලට සමානකම ගැන මං ඔබට කියන්න යන්නෙ නෑ වොට්සන්."

"ඔබ අර මල්බඳුන ඒ වෙලාවෙ බිත්දේ උවමනාවෙන්ම කියලයි මට හිතුණේ."

"ඔව් වොට්සන්. ඔහුව මිහිත්තු දහයකට ෆ්‍රෙග්සන් සමග උඩුමහලට යවන්න මට උවමනා වුණා. බුමුතුරුණේ ඔබ දුටුදේ

http://sherlockholmesinvestigations.blogspot.com

ගැන, ඔබ කියාවි කියල මට භය හිතුණා. ඔහු නැති අතරේ මම ගෝඩ්න් සහ කිච්නර් සමාගමට දුරකතනයෙන් කතාකරල විස්තර දැනගත්තා. දොස්තර මයිකල් බෙල් ඒ සමාගමෙන්, විශාල වශයෙන් ණය අරගෙන තියෙනවාලු. ණය සහ පොළියෙන් පවුම් හාරදහසක්වත් අද උදේ වෙනකොට නොලැබුණොත්, ඔහුට විරුද්ධව නඩු ක්‍රියාකරන බව දන්වලාලු තිබුණේ. ඒ නිසා බෙල් මොකද කළේ? අර අහිංසක මිනුස්සයාට වෙඩි තියල ඔහුගේ සාක්කුවේ තිබුණු යතුරු කැරැල්ල අරගත්තා. එයින් ඔහුගේ යකඩ සේප්පුව ඇරලා මුදල් අරගෙන, එතැනදීම මුදල් ලියුම් කවරයක දාලා තැපැලට දාන්න සූදානම් කළා. ඔහු ලියුම් කවරයේ ගෝඩ්න් හා කිච්නර් සමාගමේ ලිපිනය තමන්ගේ පෑනෙන් ලියුවා. වැඩි තීන්ත, පොවන කඩදාසියෙන් වියළා, එය තැපැල් කළා. ඊයේ තැපැල් කළ ඒ ලියුම අද ඒ සමාගමට ලැබුණලු.

ඔහු ඊයේ නොවෙයි අද එන බව කියලා වෝබටන්ට ලියුමක් ලියුවා. ඒක ඔහු කර්නල්ගේ මුදල් පසුම්බියට දැම්මා. ඒකත් ලියාතිබුණේ කළු තීන්ත උල්පත් පෑනකින් බව ඔබ දකින්න ඇති.

ඔබ නිකමටවත් හිතුවද වොට්සන්, වෛද්‍ය වෘත්තිය වැනි උතුම් වෘත්තියක යෙදුණු බෙල්, පාතාල ලෝකයේ මිනීමරුවෙක් වැනි දූෂිත අපරාධකාරයෙකුගේ තත්ත්වයට ඇදවැටුණේ ඇයි කියලා?"

"ඒක තමයි හෝම්ස් මටත් එක්වරම කල්පනා වුණේ. මගේ වෘත්තිය සගයෙක් මෙහෙම කෙනෙක් වුණේ කොහොමද කියල මට හිතාගන්නවත් බැහැ" මම කීවෙමි.

"මං මේ ටික පසුව දැනගත්තේ, ගෝඩ්න් කිච්නර් සමාගමේ කලමනාකරුවෙකුගෙන්" හෝම්ස් කීය. "මයිකල් බෙල් වෛද්‍ය විද්‍යාලෙ ඉගෙන ගන්න කාලෙ ඉඳලම මත්පැනටත් සූදුවටත් ඇබ්බැහි වුණු කෙනෙක්ලු. ඔහු ඉපයූ හැම පැන්සයක්ම සමාජශාලා හා රේස් ඔට්ටු සඳහා විනාශ කළාලු. ඒ වුණාට ඔහු සමාජයට පෙන්වාගෙන ඉඳල තියෙන්නේ බොහොම අවංක කාරුණික, ත්‍යාගශීලී වෛද්‍යවරයෙක් හැටියට."

"බෙල් අර උදූනට නැගලා, රිවෝල්වරයත් අරන් බිමට පනිද්දී දූලි පිටින්ම අල්ලා ගත්ත එක තමා අපූරුම වැඩේ" මම කීවෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"අපි තව මොහොතක් පමාවුණා නම්" හෝම්ස් කීවේ වැතිර සිටි හාන්සිපුටුවෙන් නැගීසිටිමිනි. "එහෙනම් ඒක අපූරු වැඩක් වෙන්නෙ නෑ, මගේ හිතවත් වොට්සන්. දොස්තර මයිකල් බෙල් අපටත් ගිලින්න දෙන්නේ කර්නල් වෝබටන්ට දුන්නු බෙහෙතමයි!"

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# නාඳුනන්නා

ෂර්ලොක් හෝම්ස් මහතා වෙතටයි.

අත්‍යාවශ්‍ය කරුණක් ගැන ඔබ හමුවීමට, අද සවස 4.30 ට බේකර් වීථියේ ඔබේ නිවහනට පැමිණීමට මම බලාපොරොත්තුවෙමි. ගැටලු විසඳීමේදී අනුග්‍රාහකයන්ගේ පෞද්ගලික කරුණු වල රහසිගත බව සුරැකීම ගැන, ඔබතුමාට ලැබී ඇත්තේ සුවිශේෂ කීර්තිනාමයක් බව, අමුතුවෙන් කිවයුතු නොවේ. මට ඇත්තේ ද එවැනි ගැටලුවකි. එම වේලාවට ඔබට නිවසේ රැඳී සිටීමට නොහැකි නම් පමණක් ෴420 දුරකතන අංකයේ මා අමතන්න.

මීට හිතවත්
රිචඩ් කාටරයිට්.

37 ග්ලෙන් ආබර් පෙදෙස
බටහිර කෙන්සිංටනය

"මේ ලියුම අද උදේම පණිවිඩකරුවෙකු අතේ මා වෙත එවා තිබුණා වොට්සන්" මගේ මිත්‍රයා කීවේ ඔහුගේ හාන්සිපුටුවේ සුපුරුදු ලෙස වැතිරෙමිනි. "මං ඔබට අද හවසට එන්න කියලා කිව්වේ නම් බ්‍රිතාන්‍ය කෞතුකාගාරය නරඹන්න යන්නයි. ඒ වුණත් බොහොම කාලයකින් සිත්ගන්නාසුලු පරීක්ෂණයක් අපට නොලැබුණු නිසා ටිකක් රැඳිලා බලමු."

"ඇයි හෝම්ස් මේ ලියුම ඔබේ හිතේ කුතුහලයක් ඇතිකරන්න සමත්වුණේ නැද්ද?" මම ඇසීමි. "මොහු මේ ලියුමේ සඳහන් කරලා තියෙනවා, පෞද්ගලික රහසිගත වැඩක් කියලා. කිසි සැකයක් නෑ. මේක ඔබේ සිත් ඇදගන්නාසුලු එකක් වේවි. අපි කෞතුකාගාරයට වෙන දවසක යමු" එසේ කී මම පිටවී යාමට සූදානමෙන්; මගේ හිස්වැස්ම අතට ගතිමි.

"ඇයි වොට්සන් ඔබ ආ සැණින් යන්න හදන්නේ? 4.30ට තව පැය භාගයක් වත් නෑ. ඩ්ගේ අනුග්‍රාහකයාගේ කථාව අහන්න ඔබ ඉන්නෙ නැද්ද?" ඔහු ඇසීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේක රහසිගත එකක් නම්, මං ඒකට සවන් දෙනවාට ඔබේ අනුග්‍රාහකයා කැමැති වේවි එකක් නෑ. ඒ නිසා........"

"මොන පරීක්ෂණයද වොට්සන් මං ඔබට රහසක් කළේ?" කී හෝම්ස් හිස්වැස්ම මගේ අතෙන් උදුරාගෙන එය රාක්කයේ එල්ලුවේය. "මට ඔහු කියන කරුණු ඔබ දැනගන්නවාට කාට්රයිට් මහත්මයා කැමැති නැත්නම්, මේ පරීක්ෂණය භාරගැනීම මට ප්‍රතික්ෂේප කරන්න වෙනවා."

අනුග්‍රාහකයා පැමිණීමට පෙර, කථාන්තරයට සවන්දීමට හොඳින් සූදානම්වීම මගේ මිත්‍රයාගේ සිරිතක් විය. වැසි සහිත කාලයක් වූ බැවින් අපේ ආසන ගිනිඋදුනට ළංකරගත්තෙමු. තම පයිප්පයේ කෝවට අලුත් දුම්කොළ පිරවූ හෝම්ස්, ඔහුට ලැබී තිබූ ලිපිය යළිත් වරක් අතටගෙන කියවා බැලීය.

"වොට්සන්. මේ රිචඩ් කාට්රයිට් ගැන මොනවද ඔබ දන්න තොරතුරු? ඔහු මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ සොහොයුරා බව මම දන්නවා. ඒ ඇරෙන්න වෙන කිසිම දෙයක් දන්නෙ නෑ."

"මම දන්නෙත් ඒ හරිය විතරයි" මම කීවෙමි. "ඔහුගේ පියා කෙටි කාලයක්, යටත්විජිත භාර මහාලේකම් හැටියට කටයුතු කළ බව නම් ඔබටත් මතක ඇති. චරිතකථා විශ්වකෝෂය පෙරළා බැලුවොත්, අපට පුළුවන් වේවි තවත් තොරතුරු ටිකක් හොයාගන්න" මා පැවසුවේ හෝම්ස්ගේ පොත් එකතුව තබා තිබූ කුඩා අල්මාරිය වෙත යෑමට සූදානම් වෙමිනි.

එකෙණෙහිම අපේ නිවහන ඉදිරිපස පාරේ අශ්වකරත්තයක් නවත්වන හඬක් ඇසිණ. ඒ විගසින් කිසිවෙකු අපේ තරප්පුව නැග එන ශබ්දයට අපි සවන් යොමුකළෙමු.

"මට වැරැදීමක් නොවෙයි නම්, මේ එන්නේ අපේ අනුග්‍රාහකයා. ඔහු යොදාගත්තු වෙලාවටත් පැය කාලක් කලින්" හෝම්ස් කීවේ ගිනිඋදුන් පඩිය මත වූ ඔරලෝසුව දෙස බලමිනි.

ආචාරශීලීව දොරට තට්ටුකොට, අපේ අමුත්තා කාමරයට ඇතුළුවිය. උසින් අඩි හයකට වැඩිවූ ඔහුට තිබුණේ සිහින් සිරුරකි. කරදරයට පත් අනුග්‍රාහකයන්ගෙන් නිතර දක්නට නොලැබෙන ප්‍රසන්න, සිනහමුසු මුහුණක් ද ඔහු සතුවිය. වයසින් අවුරුදු හතළිහකට නොවැඩියයි කිව හැකි මේ නැනැත්තා, අපට හිසනමා ආචාර කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"නියමිත වෙලාවටත් පැය කාලකට කලින් මෙහි කඩාවැදීම ගැන මට සමාවෙන්න හෝම්ස් මහත්මයා. මේ ඔබේ හිතමිත්‍රයා දොස්තර වොට්සන් බවට සැකයක් නෑ" ඔහු කීවේ හෝම්ස්ගේ සංඥාව අනුව ළඟම තිබූ පුටුවේ වාඩිවෙමිනි.

"ඔබ කල්තබා පැමිණීමෙන් අපට කරදරයක් වුණේ නැහැ මහත්මයා" කී හෝම්ස්, යළිත් හාන්සිපුටුවේ ඇලවී පයිප්පය දල්වාගත්තේය. "ඔබට ඇතිවී තිබෙන ගැටලුව කුමක්ද, ඒ සම්බන්ධයෙන් මා ගතයුතු පියවර කුමක්ද යන්න විස්තර සහිතව කියන්න. මා දැනගතයුතු හැමදෙයක්ම, මේ දොස්තර වොට්සන් ඉදිරියේ ද කීම අත්‍යාවශ්‍යයි. ඒ මොකද පරීක්ෂණ පැවැත්වීමේ දී අපි දෙන්නම ක්‍රියාකරන්නේ එකට."

එයට හොඳින් සවන්දුන් අමුත්තා මඳවේලාවක් අප දෙස බලමින්, නිහඬව සිටියේය. අනතුරුව ඔහු කථාව පටන්ගත්තේ මෘදු කටහඬකිනි.

"මහත්වරුනි. මේ ගැටලුවට මුහුණදීලා ඉන්න පුද්ගලයා මම නෙමෙයි. නමුත් ඔහු අතිශයින්ම මට හිතවත්, මගේ ළබැඳි මිත්‍රයෙක් බව කිවයුතුයි." කාට්රයිට් මහතා කීය. "මෙම කරුණ හෙළිවුවහොත් ඔහුට ඇතිවිය හැකි අපකීර්තිය නිසා, මේ ගැටලුව ඔබට ඉදිරිපත් කරනවාට වත්, ඔහු කැමැතිවුණේ නැහැ. නමුත් හෝම්ස් මහතා මෙහි රහස්‍ය බව ආරක්ෂා කරන බවට මං දිගින් දිගටම සහතික වුණා. එතකොටයි මේ ගැන ඔබ හමුවෙන්න ඔහු මට අවසර දුන්නේ. ඒකුත් ඔහුගේ නම, රැකියාව, ගැන හෙළිනොකොට ප්‍රශ්නය පමණක් හෙළිකරන පොරොන්දුව උඩ. දැන් මං ඔබට ඒ ගැටලුව විස්තර කරන්නම්.

මගේ මිත්‍රයා සේවය කරන්නේ ලන්ඩන් නගරයේ පිහිටි එක්තරා බැංකුවක. ඔහු දරන තනතුර කුමක්ද කියන එකත්, මං හිතන්නේ ඔබට අවශ්‍ය නැහැ. ඔහු සම්බන්ධ එක්තරා සමාජ කටයුත්තක් දියත් කිරීමට........"

"කාට්රයිට් මහත්මයා" හෝම්ස් කථාවට බාධා කළේය. "ඔබ කියන මේ ගැටලුවට මැදිවී ඉන්නේ එක්තරා පුද්ගලයෙක්. ඔහු එක්තරා බැංකුවක සේවය කරන්නෙක්. ඔහු යම්කිසි සමාජ කටයුත්තකට සූදානම් වෙනවලු- මේ විධියට ගැටලු විසඳීම මට කොහොමටවත් කරන්න පුළුවන් දෙයක් නෙමෙයි මහත්මයා.

http://sherlockholmesinvestigations.blogspot.com

මෙතැන යම්කිසි අපරාධයක් සිදුවෙලා ඇති කියල, මං අනුමාන කරනවා. ඒ වුණත් ප්‍රමාණවත් දත්ත නොමැතිව අභිරහසක් හෙළිකරගන්නෙ කොහොමද? අඳුරේ අතපත ගාමින් ගැටලු ලිහන්න මට හැකියාවක් නැහැ මහත්මයා."

"ඔබ ඉල්ලන මුදලක් ගෙවීමට මම සූදානම්?" අමුත්තා කීය.

"මුදල වැදගත් නෑ කාට්රයිට් මහත්මයා" හෝම්ස් කීය. "ප්‍රශ්නයේ අගක් මුලක් හරිහැටි පැහැදිලි නැතිව, මං කොහොමද ගැටලු විසඳීමක් භාරගන්නේ? ඒක අපි දෙදෙනාගේම කාලය නාස්තිකිරීමක්. තවදුරටත් මේ ගැන කතා කිරීමෙන් පලක් වේවි කියල මං හිතන්නේ නෑ."

කාට්රයිට් මහතා අසුනෙන් නැගිටියේය. ඔහුගේ මුහුණ ලැජ්ජාවෙන් රතු වී තිබූ බැව් මම දුටුවෙමි.

"මට සමාවෙන්න හෝම්ස් මහත්මයා" ඔහු කීය. "මං හිතන්නේ මට වෙන කරන්න දෙයක් නෑ. ඔබට මුහුණදෙන්න වෙන ගැටලු සහගත බව මට තේරුම්ගන්න පුළුවනි. මං හැම දෙයක්ම, මුල ඉඳලා කියන්නම්. මට වෙන විකල්පයක් නෑ."

ගිනිඋදුන දෙස බලාගෙන මඳ වේලාවක් කල්පනා කළ ඔහු යළිත් තම අසුන වෙත ගොස් හිඳගත්තේය.

"මේ කාරණයට සම්බන්ධ මගේ මිත්‍රයාගේ නම සර් ආතර් හිල්වුඩ්. ඔබ සමහරවිට ඔහු ගැන අහලත් ඇති?"

"මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවේ අධ්‍යක්ෂක වරයෙක්?" හෝම්ස් ඇසීය.

"හරියටම හරි මහත්මයා" සුසුමක් හෙළා ළය සැහැල්ලු කරගත් කාට්රයිට් මහතා ඉතා උනන්දුවෙන් කතාව යළි පටන්ගත්තේය.

"ආතර් සහ මම කුඩා කාලයේ සිටම ඉගෙනගත්තේ එකට. ඊටන් හි මූලික අධ්‍යාපනය ලබලා, අපි එකටම කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ඇතුළුවුණා. ඔහු ආර්ථික විද්‍යාව හදාරද්දී, මං දේශපාලන විද්‍යාව හැදෑරුවා. අපි දෙන්නා එකට ක්‍රිකට්, රග්බි, ඔරුපැදීමේ කණ්ඩායම් වලට ක්‍රීඩා කළා. මේ නිසා අප දෙදෙනා අතර ඇතිවුණේ, යාළුවන් දෙදෙනෙකුට වඩා, නිවුන් සොහොයුරන් දෙදෙනෙකු අතර තියෙන ආකාරයේ බැඳීමක්. අප දෙදෙනාම දැන් හතළිස් අවුරුදු වයසේ.

තමන්ගේ දක්ෂකම නිසාම, ආතර් බොහොම ඉක්මනින් බැංකු ක්ෂෙත්‍රයේ ඉහළටම ගියා. ඒ නිසාම ඔහු, ඔබ සී පරිදි මර්චන්ට්ස්

http://sherlockholmesinvestigations.blogspot.com

ට්‍රස්ට් බැංකුවේ අධ්‍යක්ෂක වරයෙක්. මං විවාහ වෙලා දරු දෙදෙනෙකු ගේ පියෙක් වුණත් ආතර් තවමත් අවිවාහකයි. දැන් ඔහු විවාහ වෙන්න සූදානම් වෙනවා. ඔබ ඒ ගැන සමහරවිට පුවත්පත් වලින් දකින්නත් ඇති. චිලිංටන් සාමිවරයාගේ බාලම දියණිය සමග ආතර් විවාහ ගිවිසගත්තා. තව මාස දෙකකින් විවාහ කටයුතු සිදුකරන්න, දැන් සියල්ල සූදානම්.

අප දෙදෙනා අතර ඇති හිතවත් කම නිසා, අවුරුදු ගණනාවක් තිස්සේ සතියකට දෙතුන් වතාවක් ආතර් හා මා එකට හමුවෙනවා. එක්කෝ අප දෙදෙනාගෙන් කෙනෙකුගේ නිවසක. නැත්නම් වින්චෙස්ටර් ක්‍රීඩා සමාජශාලාවේ. නැත්නම් ගොල්ෆ් පිටියේ. ඔහු කිසි දවසක අධික ලෙස මත්පැන් පානය කරන්නෙක් නොවෙයි. එහෙම හුඟක් මත්පැන් පානය කර ඉන්නවා මම කවදාවත් දැකල නැහැ. ඕනෑම උත්සව වෙලාවකදී ආතර් බිව්වේ ෂෙරි වීදුරු දෙක තුනක්, හෝ බීර. රාත්‍රී කෑම සමග ක්ලැරට් වයින් පානය කළත්, ඒකෙන් කවදාවත් ඔහුගේ ස්වභාවයේ වෙනසක් වුණේ නැහැ.

නමුත් පසුගිය සතියක හෝ දෙකක ඉඳලා, ආතර්ගේ ස්වභාවයේ ලොකු වෙනසක් මට දකින්න ලැබුණා. ඔහු කාලය ගත කළේ හරි කණස්සල්ලෙන් වගේ. ෂෙරි, බීර, ආදිය බීම අත්ඇරලා, ඔහු විස්කි පානය කොට වෙරිවුණු අවස්ථා මට දකින්න ලැබුණා. මේ හදිසි වෙනසට හේතුව තේරුම් ගන්න මට හැකියාවක් තිබුණේ නැහැ. කෙළින්ම මේ ගැන ඔහුගෙන් විමසන්න තරම් ළඟ හිතවත්කමක් තිබුණත්, මට එක්වර එහෙම කරන්න හිතුණේ නැහැ.

ඊයේ රාත්‍රී අටට අපි දෙන්නා හමුවෙන්න නියමව තිබුණේ වින්චෙස්ටර් සමාජශාලාවේ. නමුත් මගේ බිරිඳගේ ඥාතියෙකුගේ හදිසි අසනීපයක් නිසා, සමාජශාලාවට යෑම මා අතින් පැය දෙකකින් විතර ප්‍රමාදවුණා. මං එහි යද්දි මගේ මිත්‍ර ආතර් අධික ලෙස බීමත්වෙලා හිටියා. ඔහුට තනියම ගෙදර යාගන්න හැකිවේද කියල මගේ හිතේ සැකයක් ඇතිවුණා. ආතර් ඔහුගේම අශ්වකරත්තයේ නැංවලා, රියැදුරා සමග ගෙදර යවන්න පුළුවන් කම තිබුණා. නමුත් එහෙම කරන්න මගේ හිත ඉඩදුන්නේ නැහැ. ආතර්ගේ හිතේ මොකක් හරි ලොකු ප්‍රශ්නයක් ඇති; මේ ගැන විමසා බැලීම මිත්‍රයෙකු හැටියට මගේ යුතුකමක් කියල මට හිතුණා. ඔහු පදිංචි ඇල්බනි හි. මගේ රිය එහි ගෙන එනමෙන් රියැදුරාට

Reading Purpose Only. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

කියලා, මං ආතර් සමග ඔහුගේ කරත්තයෙන් ඔහුගේ නිවසට ගියා. ඔහුගේ මේ වෙනසට හේතුව තවදුරටත් නොඅසා ඉන්න මට හැකියාවක් තිබුණේ නැහැ.

"ආතර් මේ අහන්න" මං කිව්වා. "ඔබට ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා බව මං දන්නවා. ඒක විසඳාගන්න මං උදව් වෙන්නම්. මොකක්ද ඒ ප්‍රශ්නය? මට ඒක කියන්න."

මඳ වේලාවක් ඔහු නිශ්ශබ්දව මා දිහා බලාගෙන හිටියා.

"මට සමාවෙන්න රිචඩ්" ඔහු කිව්වා. "මේ කාරණාව ඔබට නොකිව්වේ මොකද දන්නවද? සිදුවෙන්න තිබුණු දේ සිදුවෙලා හමාරයි. ඒක ඔබට හෝ වෙනත් කෙනෙකුට කීමෙන් පලක් නෑ. ඒ නිසා මගේ අවාසනාවන්ත ඉරණමට මට මුහුණ දෙන්න ඇරලා මගෙන් ඈත්වෙන්න."

මෙහෙම කියල ඔහු ප්‍රශ්නය මඟහරින්නයි හැදුවේ. ඔහු කී දෙයින් මගේ හිතේ ඇතිවුණේ විශාල කුතුහලයක්. අන්තිමේදී සියල්ල හෙළිකරන්න ඔහු එකඟවුණා. දැන් මං ඔබට කියන්නේ, ආතර් ඔහුගේ කථාව, කිව් වචන වලින්ම ඒ හැටියටම. එහි රහස්‍ය බව රැකගන්න කියලා මං යළිත් මතක් කරනවා.

"සති දෙකකට කලින් සඳුදා දවසක උදේක මං රැකියාව සඳහා බැංකුවට යෑමට සූදානම් වෙමින් ඉන්න අතරේ, මා හමුවෙන්න කවුදෝ පැමිණ ඇති බව මගේ සේවකයා කිව්වා. මේ වෙලාවෙ කෙනෙකු හමුවෙන්න මං අකමැති වෙලාවක්. ඔහුට පස්සෙ වෙලාවක එන්න කියන්න කියා මං සේවකයාට කිව්වා."

"ඔහුගේ නම එරික්ලු. ඔහුට ඔබතුමා හමුවෙන්න උවමනා, මහන මැෂින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන්ලු" සේවකයා කිව්වා.

දැන් මහන මැෂින් ව්‍යාපෘතිය ගැන මං ඔබට . මක් කියන්නම්. ලන්ඩන් නගරයේ බොහෝම දුප්පත්, අසරණ, තරුණ ගැහැනු ළමයින් හා අසරණ මව්වරුන් වෙනුවෙන්, අපේ මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවෙන් තමා මේ ව්‍යාපෘතිය පටන්ගත්තේ. මේක සමාජසේවා කටයුත්තක්. එයින් කරන්නේ ඇත්තෙන්ම අසරණ අය තෝරාගෙන, ඔවුනට නොමිලේ ඇඳුම් මැසීමේ පුහුණුවක් ලබාදීලා, ඊළඟට මහන මැෂින් ලබාදීම. ඔවුන් ඒවාට ඉතා කුඩා කොටස් වශයෙන්, පොලියක් නොමැතිව, මුදල් ගෙවීම අරඹන්නේ, අවුරුදු දෙකකට පසු. සමාජ සුභසිද්ධිය තකා පටන්ගත් මේ ව්‍යාපෘතියෙන්, අපේ බැංකුවට ලොකු ප්‍රසිද්ධියකුත් ලැබුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ හිතේ ඇතිවුණු සිතිවිල්ලක් උඩ, මං අපේ බැංකුවේ ලිවර්පූල් ශාඛාවේ කළමනාකරු හැටියට වැඩකරද්දියි මෙය ඇරඹුවේ. ඒක ඉතාම සාර්ථක වුණු නිසා, දැන් අපේ බලාපොරොත්තුව මේක මුළු එංගලන්තය පුරාම දියත් කරන්න. ඉතින් කවුරු හරි මේ ගැන සාකච්ඡා කරන්න ආවා කිව්වාම, මගේ උනන්දුව වැඩිවුණා. ඔහුව විසිත්ත කාමරයට කැඳවාගෙන එන්න කියලා මං සේවකයාට කිව්වා.

"ආතර් සහ මා අතරේ මේ කතාබහ ඇතිවුණේ ඔහුගේ විසිත්ත කාමරයේ. එය සේවකයෙකුට නොඇසෙන්න පෞද්ගලිකව කරන්න අපට හැකියාව තිබුණා. ඔහුගේ ශෙරි ගතිය හුඟක් දුරට හිඳිලා තිබුණු නිසා, ඔහු තවදුරටත් කථාව පටන්ගත්තේ ෂෙරි වීදුරුවක් පානය කළාට පස්සේ." රිචඩ් කාට්රයිට් මහතා කීය.

රිචඩ්. මං මේ පුටුවේ වාඩිවෙලා ඉඳිද්දි, අමුත්තා ඇවිත් ඔය පුටුවේ වාඩිවුණා. ඔහු මං කවදාවත් දැකපු කෙනෙක් නෙමෙයි. සම්පූර්ණයෙන්ම නාඳුනන කෙනෙක්. වැඩිය උසත් නැති මහතත් නැති ඔහු, ගනකම් රාමුව සහිත උපැස්යුගලක් පැළැඳ හිටියා. මුහුණේ තිබුණේ සුදුමැලි පෙනුමක්.

"සර් ආතර් හිල්වුඩ්. මං ඉක්මනට ආපහු යන්න ඕන" ඔහු කිව්වා.

"මගේ නම එරික්. මං ආවේ වැදගත් වැඩකට. ඔබ විලිංටන් සාමිවරයාගේ බාලම දියණිය සමග විවාහවෙන්න යන බව පුවත්පත් වල පළවුණා. ඔබ විශාල ධනවතෙක්. ඒක රහසක් නෙමෙයි. ඔබේ අනාගත මාමණ්ඩිය කෝටිපතියෙක්. ඒකත් මුළු රටම දන්නවා. මහත්මයා. ඔබේ රහසිගත පෞද්ගලික කරුණක් මං දන්නවා. ඒක හෙළිනොකර ඉන්න, මට පවුම් දාහක් මේ දැන් ගෙවන්න" ඔහු කිව්වා.

එක්වරම මගේ හිතේ ඇතිවුණේ දැඩි කෝපයක්. "තමුසෙ කියන විදියට සල්ලි දෙන්නෙ මං මොන වරදක් කළාටද? තමුසෙට පිස්සුද? මං ළඟ මේ වෙලාවේ පවුම් දාහක් තියා පවුම් පනහක්වත් නෑ. තමුසෙ කවුද? මට තමුසෙත් එක්ක කථාකරන්නවත් උවමනා නැහැ. පොලිසිය කැඳවන්න කලින්........"

එහෙම කියලා මං පුටුවෙන් නැගිටින්න සූදානම් වුණා. එතකොට මේ පුද්ගලයා මට පුටුවෙම ඉන්න කියලා සංඥා කළා.

"හිල්වුඩ් මහත්මයා. පොලිසියට කියන්න කලින් මං කියනදේත්

http://sherlockholmesinvestigations.blogspot.com

අහන්න." ඔහු කිව්වා. "ඔබතුමා මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවේ ප්ලිමත් ශාඛාවේ කලමනාකරු හැටියට, රාජකාරි කළ කාලය ඔබට මතක ඇති. ඒ කාලයේ ඔබ ප්‍රසිද්ධවුණේ, බොහොම කරුණාවන්ත ඒ වගේම කාර්යශූර කෙනෙක් හැටියට, ඒ කාලයේ ඔබේ බැංකුවේ සේවය කළ, ග්ලැඩිස් රෝවන් නම් තරුණියක් සමග ඔබගේ ප්‍රේම සම්බන්ධයක් ඇතිවුණා. ඒකෙ ප්‍රතිඵලයක් ලෙස ඔබ ඇය සමග විවාහ ගිවිසගත්තා. ඒ නිසා ඇය බැංකුවේ රැකියාවෙනුත් අස්වුණා. නමුත්....... හිල්වුඩ් මහත්මයා, ඔබ ඒ තරුණිය විවාහ කරගත්තේ නැහැ. ඒක ප්ලිමත් නගරයම දැනගත්තා. ඊළඟට සිදුවුණේ මොකක්ද? ඇය සියදිවි හානි කරගන්න කියලා විෂක් පානය කළා. ඔබ මොකද කළේ? ඔබ වහාම ලන්ඩන් නගරයට මාරුවක් අරගෙන පැන ගියා. සියදිවි හානි කරගත් ග්ලැඩිස් රෝවන්, සාන්ත මේරි සුසාන භූමියේ භූමදාන කෙරුණා.

අවුරුදු ගණනක් ගතවෙලා නිසා මේ සිද්ධිය දැන් කාටත් අමතකයි. නමුත් ඔබ විවාහ කරගන්න හදන සේරා විලිංටන් මෙනෙවිය වත්, විලිංටන් සාමිවරයා වත්, මේ භූටපටය පුවත්පත් වල පළවනවා දකින්න කැමැති වෙන එකක් නැහැ. ඊට අමතරව තවත් දෙයක් තිබෙනවා. ඔබේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වෙන මහන මැෂින් ව්‍යාපෘතියෙන්, අසරණ තරුණියන්ට ලැබෙන පිහිට ගැන මුළු රටම දන්නවා. කෝන්වෝල්හි අසරණ තරුණියකට ඔබ නිසා අත්වුණු ඉරණම ගැන, පුවත්පත් වල පළවුණාම, මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවේ මහනමැෂින් ව්‍යාපෘතියට මොකද වෙන්නේ? මෙවැනි කෙනෙක් තමන්ගේ අධ්‍යක්ෂක වරයෙක් ලෙස ඉඳීම බැංකුවට ලැජ්ජාවක්. එහෙම නේද? ඒ නිසා වැඩිදුර හිතන්න දෙයක් නෑ. ඔබට වෙනත් විකල්පයක් ඉතිරිවෙලා නෑ. මට පවුමේ නෝට්ටු වලින් පවුම් දාහක් දෙන්න. මං ඒ කථාව කාටවත් කියන්නේ නෑ."

මේ කථාව ඇසුවාම මගේ ඉහමොළ රත්වුණා. මේ මිනිහා මේ කරන්නේ නීති විරෝධී වැඩක්. රහස් හෙළිකරන බවට තර්ජනය කරලා කප්පම් ඉල්ලීම බරපතල අපරාධයක්. ඔහුව පොලීසියට අල්ලා දීමයි මා විසින් කළ යුත්තේ. නමුත් ඔහු ඒකට මට ඉඩක් තැබුවේ නැහැ.

"හිල්වුඩ් මහත්මයා. ඔබ තව පැය භාගයකින් බැංකුවට යන්න පිටත්වෙනවා. ඔබේ-අග්‍රකරත්තයෙන්ම මමත් ඔබ සමගම එනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔබ චෙක්පතක් ලියලා, පවුමේ නෝට්ටු වලින් දාහක්, ඔබම අයකැමිගෙන් ලබාගෙන, මා ඉවත ගෙනැත් දෙන්න. කිසිම කෙනෙකුට කථාකිරීම ඔබට තහනම්. මොනවා හරි ප්‍රයෝගයක් කරලා මාව පොලිසියට අල්ලා දුන්නොත්, අර විස්තරය සම්පූර්ණයෙන්ම, හෙට උදේ "ඩේලි මේල්," "මෝනිං ක්‍රොනිකල්" පුවත්පත්වල පළවේවි. මං ඒකට කටයුතු සූදානම් කරලයි ආවේ."

කළයුතු කිසිදෙයක් හිතාගන්න බැරිව මං මේ තක්කඩියා දිහා බලාගෙන හිටියා. මා මුහුණදී ඇති තත්ත්වයේ බැරෑරුම් බව කල්පනා වෙද්දී, මගේ සිරුරෙන් ඩහදිය ගලන්න පටන්ගත්තා.

රිචඩ්. ඔබ මගේ ප්‍රාණ මිත්‍රයා වුණත්, ප්ලිමත් හි මේ සිද්ධිය මං ඔබටවත් හෙළිකළේ නැහැ. ග්ලැඩිස් රෝවන් නම් තරුණියක සමග මිත්‍රවෙලා, මං කලබලේට විවාහ ගිවිසගත් බව ඇත්තයි. මේක අවුරුදු දොළහකට පමණ කලින් වුණු දෙයක්. නමුත් මෙහෙම කරන්න මට හේතුවක් තිබුණා. ඈ පිළිබඳ සම්පූර්ණ තොරතුරු බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයන් පසුව මට හෙළිකළා. ඇය අයහපත් චරිතයක් තිබුණු, මත්පැන් පානයට ඇබ්බැහිවුණු කාන්තාවක්. ඇයට ලොකු වන්දිමුදලක් ගෙවලා, මෙය සාමදානයෙන් කෙළවර කරගන්න මං නොගත් උත්සාහයක් නැහැ. නමුත් ඒක අසාර්ථක වුණා. මේ කරුණු හැම එකක්ම වැල නොකැඩී මගේ හිතට ගලා ආවා. මේ අතරේ මගේ අමුත්තා එරික්, මගේ විසිත්ත කාමරයේ තිබූ භාණ්ඩ දෙස හිස කරකවමින් බලමින් සිටියා. ඔහු වාඩිවී සිටි තැනින් නැගිටලා මගේ ගිනිඋදුන අසල තිබෙන අර ප්‍රතිමාව වෙතට ගමන් කළා. ඒක මාස තුන හතරකට පෙර ක්‍රිස්ටීස් ආයතනයේ පෞරාණික භාණ්ඩ වෙන්දේසියකින් මා මිලට ගත් එකක්.

"ෂා හරි අපූරු ප්‍රතිමාවක් නොවැ" මගේ අමුත්තා කීවේ එය අතගා බලමින්. ඒක රෝමයේ නටබුන් අතරින් සොයාගත්, සැබෑ පෞරාණික භාණ්ඩයක්. රෝම වංශවතෙකුගේ කිරිගරුඬින් තෙළූ උඩුකය පිළිමයක්.

"ඔබ මේකට විශාල මුදලක් වියදම් කරන්න ඇති?" ඔහු කිව්වේ පිළිමයේ හිස අතගා බලා, එයට මැද ඇඟිල්ලේ පුරුකෙන් තට්ටු කරමින්.

"හ්ම්" කිව්වා මිසක් මම එයට වෙන පිළිතුරක් දුන්නේ නැහැ.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේක රෝමයේ නිර්මාණයක්. ක්‍රිස්තු පූර්ව නැත්නම් ක්‍රිස්තු වර්ෂයට පසු පළමුවැනි සියවසේ එකක් වියයුතුයි." ඔහු විශාරදයෙකු වගේ ඒ ගැන තම මතය පළකළේ ආඩම්බර සිනාවක් පාමින්. මීළඟට ඔහු යළිත් පුටුවට ඇවිත් වාඩිවුණා.

"සර් ආතර් හිල්වුඩ්" ඔහු කිව්වා. "මට පරක්කු වෙන්න බැහැ. තව පැය කාලක් යද්දී ඔබේ බැංකුවේ වැඩකටයුතු ඇරඹේවි. පවුමේ නෝට්ටු මිසක් මං වෙන කිසි දෙයක් භාරගන්නෙ නෑ. ඒ නිසා ඉක්මන් කරන්න."

"නමුසෙ මේ විදියට හැමදාමත්, මාව භයකරලා කප්පම් ගන්නද බලාපොරොත්තු වෙන්නෙ?" මං ඇහුවා.

ඔහු මහ හඬින් හිනාවුණා. "හිල්වුඩ් මහත්මයා. ඔබ හිතනවද මං ඒ තරම් මෝඩයෙක් කියලා? කප්පම්කාරයින් අමාරුවේ වැටෙන්නේ, දෙතුන්පාරක් කප්පම් ඉල්ලන්න ඒම නිසා. මං ඒ මෝඩකම කරන්නෙ නෑ. ඔබට ඒ ගැන බයක් වෙන්න දෙයක් නෑ. අද මුදල් ගෙව්වාම එතැනින් ඔක්කොම ඉවරයි." එහෙම කියලා ඔහු යළිත් වරක් හිනාවුණා.

කොහොමහරි ඔහු කිව්වා වගේ, මට වෙන විකල්පයක් තිබුණේ නෑ. මං ඔහු සමග බැංකුවට ගිහින් ඒ මුදල් ගෙවලා, ඔහුගෙන් නිදහස්වුණා. එච්චරයි. මට දැන් උවමනා කරන්නේ ඒ සිත් වේදනා ගෙන දෙන සිද්ධිය අමතක කරන්නයි.

"එහෙම කිව් මගේ මිත්‍රයා ආතර්, තවත් ෂෙරි වීදුරුවක් එක හුස්මට ගිල දැම්මා."

සිය කථාව නිම කළ රිචඩ් කාට්රයිට් මහතා කැලැඹුණු මුහුණෙන් අප දෙදෙනා දෙස බලාගෙන සිටියේය. අප විසිත්ත කාමරයේ මිනිත්තු කිහිපයක නිශ්ශබ්දතාවයක් පැවතිණ. නළල රැළි කරගෙන පයිප්පයෙන් දුම්වළලු කිහිපයක් පිටකළ හෝම්ස් පයිප්පය අතට ගත්තේය.

"මේ ප්‍රශ්නය මා වෙතට ගෙන ඒම ගැන මං ඔබට කෘතඥ වෙනවා කාට්රයිට් මහත්මයා" හෝම්ස් කීය. "ගිය අවුරුද්දෙත් කප්පම්කරුවෙක්, අවස්ථා දෙකකදීම, මේ රටේ වැදගත්ම කෙනෙකුට තර්ජනය කර විශාල කප්පම් මුදල් ලබාගෙන තිබුණා. මං ඒ ගැන පරීක්ෂණයක් පටන්ගන්න සූදානම් වෙමිනුයි හිටියේ. නමුත් ඒ දවස්වලම සර් හෙන්රි බැස්කවිල් හා දොස්තර මෝටිමර් මා හමුවෙන්න ආවා. ඒ බැස්කවිල් පරම්පරාවේ අයට මුහුණ

http://sherlockholmesinvestigations.blogspot.com

දෙන්න සිදුවුණු ඛේදවාචකයක් ගැන කියන්න. ඒ ගැන පරීක්ෂණ පවත්වන්න ඩෙවොන් ප්‍රදේශයට යාමට සිදුවීම නිසා, කප්පම්කාරයා පිළිබඳ කටයුත්ත මගෙන් මගහැරී ගියා. ඊළඟට ඔහු ගැන මට අහන්න ලැබුණෙත් නෑ."

"හෝම්ස් ඔබට විශ්වාසද මේ ඒ පුද්ගලයාමයි කියලා?" මම ඇසීමි.

"මට හරියටම කියන්න බැහැ" හෝම්ස් කීය. "කොහොම වුණත් මුලින්ම අපි සර් ආතර් හිල්වුඩ් හමුවෙන්න ඕන. මේ පුද්ගලයාගේ බාහිර පෙනුම හා ඔහු ගැන තොරතුරු එක්රැස් කරගත යුතුයි. කාට්රයිට් මහත්මයා. මං විශ්වාස කරනවා, ඔබේ මිත්‍රයා අප හමුවෙන්න කැමැතිවේවී කියලා?"

"ඒක තමා ලොකුම ප්‍රශ්නය වෙන්නෙ" රිචඩ් කාට්රයිට් කීය. "ආතර් කියන්නෙ ඔහුට පවුම් දහසක් පාඩු වුණත්, ඒ පුද්ගලයා ආයෙමත් නොඑන බව හොඳටම විශ්වාසලු. මේක ආයෙත් හාර අවුස්සලා, තමන්ගේ පෞද්ගලික තොරතුරු එළියට ආවොත්, එක් පැත්තකින් ඔහුගේ විවාහය සිදුනොවෙන්න ඉඩ තියෙනවාලු. අනෙක් අතට ඔහු සමාජයේ ලබා තියෙන කීර්තියට කැළලක්ලු."

"ඔහුගේ කථාවෙත් ඇත්තක් තියෙනවා" මම කීවෙමි.

"නමුත් මේ වගේ අපරාධකාරයෙකුට නිදහසේ කටයුතු කරන්න ඉඩ හැරීම භයානක දෙයක්" හෝම්ස් කීය. "ඔබට මතක නේ වොට්සන්, චාල්ස් ඔගස්ටස් මිල්වර්ටන් අවුරුදු ගණනක් නිස්සේ කටයුතු කළහැටි. ඔහු ජීවිත කීයක් අඳුරු අගාධයට ඇද දැම්මාද? ඔහුට දඬුවම් ලැබුණු බව ඇත්තයි. නමුත් ඒ මොන තරම් අපරාධ සංඛ්‍යාවක් කළාට පස්සෙද? අසරණ මිනිස්සුන්ගේ ජීවිත ප්‍රාණ ඇපයට තියාගෙන, මේ විධියට කප්පම් ගන්න තක්කඩින්ට නීතියෙනුත් අනුකම්පාවක් නෑ. අපෙනුත් අනුකම්පාවක් නෑ. කාට්රයිට් මහත්මයා ඔබ කටයුතු කර තිබෙන ආකාරය, ඉතාම නිවැරදියි."

"හෝම්ස් මහත්මයා. දැන් අපි මේකට මොකක්ද කළ යුත්තේ?" අල්ප් අමුත්තා ඇසුවේ සතුටෙන් නම දැත් පිරිමදිමිනි.

"මුලින්ම අපි ඔබෙ මිත්‍රයා හමුවෙන්න උවමනායි" හෝම්ස් කීය. "මේ එරික් කියන තැනැත්තා ගැන විස්තර දැනගත යුතුයි. බොහොම වෙලාවට ඒ නම බොරු නමක් වෙන්න ඇති. ඔහුගේ පෙනුම

http://sherlockholmesinvestigations.blogspot.com

වුණත් ඔහු වෙනස් කරගෙන ඇති. නමුත් මූලික ලක්ෂණ මොනවාද කියා අපි දැනගත යුතුයි. ඊට පස්සේ........"

"මගේ මිත්‍රයා ඒකට කොයිතරම් අකමැති වුණත්, මං ඒකට ඔබට අවස්ථාවක් ලබා දෙන්නම්." අපේ අනුග්‍රාහකයා කීය.

"ඉතාම හොඳයි. හැකියි අපට ඉක්මනින් හමුවීමක් යොදාගන්න උත්සාහ කරන්න" හෝම්ස් කීය. "ඒ මොකද මේ වගේ සූක්ෂම අපරාධකාරයො හරිම ක්‍රියාශීලීයි. හැකි ඉක්මනින් ඔහු නව නවත් අපරාධ වලට යොමුවෙනවා. අපි පමාවුණොත් තව කී දෙනෙක් අමාරුවේ වැටේවිද කියන්න බෑ."

රිචඩ් කාට්රයිට් මහතා අපේ නිවසෙන් පිටවී ගියේ, හැකි ඉක්මනින් හමුවීමට වේලාවක් යොදාගෙන අපට දැනුම්දෙන බව පවසමිනි. ඒ අනුව එදින සවස ඔහු අප වෙත දුරකතන ඇමතුමක් දුන්නේය.

"අද රෑ දහයට ඔබට මගේ මිත්‍රයා හමුවෙන්න පිළිවන්, ඔහුගේ නිවසේදී. මමත් එහේට එනවා. ඔබත් එන්න."

නියමිත වේලාවට කුලීරියක නැගී අපි දෙදෙනා, ඇල්බනියේ පිහිටි සර් ආතර් හිල්වුඩ්ගේ නිවස වෙත ගියෙමු.

එය අලංකාර ලෙස නවීකරණය කළ, පැරණි මන්දිරයක් විය. රිචඩ් කාට්රයිට් හා සර් ආතර් දෙදෙනා පැමිණ අප පිළිගත්හ. ඉතාම සුන්දර විසිත්ත කාමරයක් වෙත අප කැඳවාගෙන යන ලදී. රෝම හා ග්‍රීක පෞරාණික භාණ්ඩ සහ පෙරදිග සිතුවම් වලින් අලංකාර කොට තිබූ එය, විදුලි බුබුළු වලින් ආලෝකමත් කොට තිබිණි.

හෝම්ස්ගේ ඉල්ලීම පරිදි සර් ආතර් හිල්වුඩ් කථාන්තරය යළිත් වරක් මුල සිටම පැවසුවේය. වරින්වර ඔහුට බාධා කරමින් හෝම්ස්ගෙන් ප්‍රශ්න කිහිපයක්ම ඉදිරිපත්විණි.

"මේ එරික් කියන පුද්ගලයාගේ පෙනුම මට තවත් විස්තර සහිතව කියන්න."

"ඔහු ඒ තරම් උස කෙනෙක් නොමෙයි. උස අඩි පහමාරක් විතර ඇති. කෙට්ටුයි. හිස්වැස්ම ඉවත්කළාම මං දුටුවා, ඔහු හිසකෙස් මැදින් බෙදා, දෙපැත්තට පීරා ඇති බව. මේ කාලෙ එය කලාතුරකින් දකින්න ලැබෙන මෝස්තරයක් නිසා, ඒක මට හොඳට සනිටුහන් වුණා. තවත් දෙයක්. ඔහුගේ දෑත් බොහොම කෙට්ටුයි, ඒ වගේම පිරිසිදුයි. නියපොතු කොටට කපලා. බරවැඩ

http://sherlockholmesinvestigations.blogspot.com

කරන කම්කරුවෙකුගේ දෑතක් නම් නෙමෙයි. ගැහැනියකගේ වගේ සියුමැලි අත් දෙකක්."

"දුර්වර්ණ වීම් මොනවත් ඔබ දුටුවේ නැද්ද?" හෝම්ස් ඇසීය. "දුම්බීම නිසා දුම්කොළ කහට පැල්ලම්, කැපීම් සීරීම් හා කැළැල් මොනවත් ඔබ දුටුවේ නැද්ද?"

"එවැනි කිසිවක් තිබුණේ නෑ."

"හිසකෙස් වල පාට මොකක්ද?"

"කළු පාටයි. තදකළු පාටයි."

"වයස කීයක් කියලද ඔබට හිතෙන්නේ?"

"තිස් පහක් හතළිහක් විතර."

"කටහඬේ හෝ කථාකළ විලාසයේ අමුතු පිළිවෙළක් ඔබට වැටහුණේ නැද්ද?"

"කටහඬ හරි ගොරෝසුයි....... කථාකළ විලාසයේ ........ ආ ඔබ කිව්ව නිසා දැන් මට මතක්වුණා. ඔහු සමහර ඉංග්‍රීසි වචන උච්චාරණය කරද්දී, ඒකෙ විදේශීය උච්චාරණ විලාසයක් යන්තමින් තිබුණා කිව්ව හැකි. බොහොම හොඳින් නෙමෙයි. යන්තමට" ආතර් හිල්වුඩ් පිළිතුරු දුන්නේය.

"ඒ කියන්නේ මේ උච්චාරණ ස්වභාවය ඉන්දියානු වැනි ආසියානු ජාතිකයන්ගේ දක්නට ලැබෙන වෙනසක්ද? නැතිනම් අමරිකානු හෝ ඉතාලි, පෝලන්ත ආදී යුරෝපීය උච්චාරණ වෙනසක් ද?"

"ඒක මට කියන්න අමාරුයි මහත්මයා."

"විදේශිකයන් ඉංග්‍රීසි භාෂාව කොතරම් ව්‍යක්තව කථාකළත්, උච්චාරණයේ වෙනස්කම් දකින්න පුළුවනි" හෝම්ස් කීය. "අපි හොඳින් සවන් දුන්නොත්, ඒ පුද්ගලයා සම්බන්ධ ලෝකයේ කුමන රටකටද යන්න අපට තේරුම් ගන්න පුළුවන්. විශාල රටක් නම් ඔහු අයත් වෙන්නේ, ඒ රටේ කුමන ප්‍රදේශයටද යන්න කීමට හැකි තරම්, උච්චාරණයේ සියුම් වෙනස්කම් තිබෙනවා. පෙනුමෙන් ඔහු විදේශයකින් ආව කෙනෙක්, නැත්නම් එවැනි සම්භවයක් ඇති කෙනෙක් වගේද?"

"නැහැ මහත්මයා. ඔහු සාමාන්‍ය ඉංග්‍රීසි ජාතිකයෙක් වගෙයි. ටිකක් සුදුමැලියි. අපි පාර තොටේ, දුම්රියේ නැත්නම් වෙළඳපොළේ දකින්න පුළුවන්, කිසිම විශේෂයක් නැති කෙනෙක්.

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ උඩුරැවුල නම් මුහුණේ ප්‍රමාණයට ටිකක් නොගැළපෙන රළු එකක්."

"ඔබ කවදාවත් ඔහුව දැකලා නැහැ කියලද ඔබ හිතන්නේ?"

"මට නම් හිතෙන්නේ කවදාවත්ම දැකලා නැහැ කියලයි. සම්පූර්ණයෙන්ම නාඳුනන කෙනෙක්."

"ආයෙත් දුටුවොත් ඔබට ඔහුව හඳුනාගන්න මොකුත්ම ලක්ෂණයක් නැද්ද?" හෝම්ස් ඇසුවේ එම කරුණ අවධාරණය කරමිනි. "මුහුණේ, කන්වල, නාසයේ විශේෂ පෙනුමක්? නැත්නම් කටේ, දත්වල අමුත්තක්?"

"කටේ ...... කටේ අමුත්තක්.....?" සර් ආතර් හිස කසමින් කල්පනා කළේය.

"ඔව්...... කටේ අමුත්තක් තිබුණ නේත්නම්. හරි හරි. දැන් මට මතකයි ඔව්. ඔහු සිනහවෙද්දී ඔහුගේ උඩු ඇන්දේ දත් කොහොමටවත් පෙනුණේ නැහැ. යට ඇන්දේ ඉදිරිපස තිබූ අක්‍රමවත් දත්දෙපෙළ තමා හොඳට පෙනුණේ. දැන් මට හොඳට මතකයි. කථා කරලා කට වහද්දී යට ඇන්දේ දත් පියවුණේ උඩු ඇන්දේ දත් වලට ඉදිරියෙන්, හරියට මේ වගේ!"

සර් ආතර් ආයාසයක් අරා යටිහනුව ඉදිරියට ගෙන කට වසා පෙන්වීය.

"විශිෂ්ටයි මහත්මයා" හෝම්ස් කීවේ සතුටෙනි. "ඒක ඉතාම වැදගත් නිරීක්ෂණයක්. ඔය වගේ යටිහනුව ඉදිරියට පිහිටි පුද්ගලයින්, සමාජයේ දකින්නට ලැබෙන්නේ ඉඳහිට. හැප්ස්බර්ග් රජපවුලේ යටිහනුව තමා ඔබ ඔය කියන්නේ. වෙන මොනවද ඔබට කියන්න පුළුවන්? ඇස් වල වර්ණය? ඇඳුම?"

"ඔහු සතරැමුව සහිත උපැස් යුගළක් පැළැඳ හිටියා. ඒ නිසා ඔහුගේ ඇස් මට පෙනුණේ නැහැ."

"උපැස් යුගළ බොහෝවිට උපක්‍රමශීලීව පැළඳගත් එකක් වෙන්න පුළුවනි." හෝම්ස් කීය.

"ඇඳුම - පරණ දුඹුරු පැහැති ෆ්ලැනල් කලිසමක් ඇඳලා හිටියා. ඔහු වැහි කබායක් ඇඳ හිටියා. ඒකෙන් උඩුකය සම්පූර්ණයෙන් ආවරණය වුණා."

"මොන වගේ වැහි කබායක්ද? මොන වර්ණයේද?"

"වර්ණය කොළපාට - අර ජංගල් කාකි කියල හඳුන්වන අපිරිසිදු කොළ පැහැය. ඒකෙ විශේෂ මෝස්තරයක් ගැන කියන්න බැහැ. නමුත් තවත් එක කරුණක් දැන් මට මතක් වෙනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only, Not For Print.

"ඔව් ඒ මොකක්ද?" හෝම්ස් ඇසුවේ නොඉවසිල්ලෙනි.

තම දෙනෙත් සිවිලිම දෙසට යොමුකළ සර් ආතර් මඳක් කල්පනා කළේය. අනතුරුව ඔහු කරාකළේ මුව'ගට නැඟුණු සිනාවක් ද ඇතිවය.

"ඔහුගේ වැහිකබායේ, පපුව මැදහරියට පහළින් තිබුණු බොත්තමක්, හැම තිස්සෙම බොත්තම් කාසයෙන් ගැළැවී කබාය ඇරුණා. ඔහු ඒක පුරුද්දකින් වාගේ නැවත නැවතත් දමාගත්තා. නමුත් ඒක ඒ ඉක්මනින් ගැළවුණා."

"ඒ මොකක් නිසාද?" හෝම්ස් මා දෙස බැලුවේ එම කරුණ එක්වරම වටහා ගැනීමට අපහසුවය.

"මට හොඳටම විශ්වාසයි ඒ ගැන" සර් ආතර් කීය. "ඒ බොත්තම වැහිකබායට, කලින් මසා තිබුණු නූල් ගැළැවී යන්න ඇති. ඒක ආයෙමත් මහගන්න ඇත්තේ ඔහු විසින්මයි. බොත්තම උවමනාවට වඩා වැහිකබා රෙද්දට තද වෙන්න, ලංවෙන්න මැහුවාම, ඒක බොත්තම් කාසයෙන් අහසුවෙන්ම ගැළවිලා කබාය ඇරෙනවා. ඒක ගැහැනියක් කළ මැහුමක් වෙන්න බෑ."

"සර් ආතර්ට කොහොමද ඒ ගැන ඔය තරමට විශ්වාස?"

"මං සරසවි නේවාසිකාගාරයේ ඉඳිද්දි කබායෙන් ගැලවුණු බොත්තම් තනියෙන් මහගන, මටත් ඔය මේ වුණා."

සර් ආතර් පවසද්දී අප කාටත් සිනා පහළවිණි.

"ඔබට .. අමතක වෙන්න ගියත්, ඒකත් ඉතාම වැදගත් නිරීක්ෂණයක් සර් ආතර්" හෝම්ස් කීය. "මේකෙන් අපේ ක්ෂෙත්‍රය තවත් පටුකරගන්න පිළිවන්. මේකෙන් අපට හිතාගන්න පුළුවන් එක් කරුණක්. බාගවෙලාවට ඔහු අවිවාහකයෙක් වෙන්න පුළුවනි. එහෙම නේද?"

අපරාධකරුවාගේ පෙනුම පිළිබඳව අපට දැනගත හැකිවූයේ එපමණකි.

"ඊළඟට ඔහු ඔබේ අර පිළිමය ගැනද විශේෂඥ අදහස් පළකළේ?"

මගේ මිත්‍රයා ඇසුවේ කැබිනෙට්ටුවක් මත තිබූ පිළිරුවක් වෙත යමිනි.

"ඔව්. මේක කිරිගරුඬෙන් නෙළූ ප්‍රතිමාවක්. ක්‍රිස්තු වර්ෂ පළමුවැනි සියවසේ එකක්. මා සමග කතාකිරීම නවත්වා ඔහු මේක දිහා බලාගෙන හිටියේ ලොකු ආශාවකින්."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔහු ඒ ගැන යම් දැනුමක් ඇත්තෙක් වග ඔබට තේරුණා?"

"ඔව්. ඔහු ඒ දෙසටම ඇස් යොමුකරගෙන හිටි හැටියට, ඒකත් ඉල්ලාවිද කියල මගේ හිතේ සැකයක් ඇතිවුණා. කරන්න ආව කාරිය ගැන ඔහුට මොහොතකට අමතක වුණා වගෙයි මට පෙනුණේ."

"මේ කාරණය අපට බොහොම ප්‍රයෝජනවත් වෙන්න ඉඩ තියෙනවා" හෝම්ස් කීය. "මං හිතන්නේ අපට වැදගත් කරුණු රාශියක් දැනගන්න ලැබුණා මං තවදුරටත් ඔබේ කාලය ගන්න බලාපොරොත්තු වෙන්නෙ නෑ. යමක් දැනගන්න ලැබුණු වහාම මං ඔබ දෙදෙනාට දන්වන්නම්."

"හෝම්ස් මහත්මයා" ගෙහිමියා කීය. "ඔහු අල්ලාගෙන නඩු පැවරීමක් වුණොත්, මාව මීකට ගාවන්න එපා කියල මං ඔබෙන් ඉල්ලා හිටිනවා."

"ඇත්තෙන්ම ඔව් මහත්මයා. අපි ඔබව උසාවියට කැඳවන්නෙවත් ඔබේ නම සඳහන් කරන්නෙවත් නැහැ. ඔබට ශුභ රාත්‍රියක්."

ඔවුන්ගෙන් සමුගෙන, කුලීරියක් අල්ලා ගැනීමට අපි මඳ දුරක් ඉදිරියට ආවෙමු.

"ඔහු කිසිම විශේෂ පෙනුමක් නැති, සම්පූර්ණයෙන්ම නාඳුනන්නෙක් නේද?" මම ඇසීමි.

"නාඳුනන්නෙක් තමයි." හෝම්ස් කීය. "නමුත් මට හොඳටම විශ්වාසයි වොට්සන්. බැස්කවිල් සිද්ධිය දවස්වල මේ පුද්ගලයා ගැන තමයි, මම සෝදිසියෙන් හිටියේ. 1887 අවුරුද්දේ එංගලන්තයේ ඉතාම උතුම් ප්‍රභූවරයෙකුටත් මොහුගෙන් තර්ජන එල්ලවුණා. එම ප්‍රභූවරයාගේ විෂමාචාර ගැන රහස් හෙළිකරන බවට තර්ජනය කරලා කප්පම් ගත්තා. අපි යන ගමන් ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගොඩවැදිලා බලමු. ලෙස්ට්‍රේඩ් අල්ල ගන්න පුළුවන්ද කියල."

එදා රෑ බෝවී තිබුණු බැවින් අපගේ උත්සාහය සාර්ථක නොවීය. පසුදා උදෑසන මා අවදිවන විටත්, මගේ මිත්‍රයා නිවහනෙන් බැහැර ගොස් සිටියේය. ඔහු ආපසු පැමිණෙන විට දහවල් එකොළහටත් ළංවී තිබිණ.

"ඊයේ රාත්‍රී නින්දට යන්න අපි ප්‍රමාදවුණු නිසා, ඔබව කලින් අවදිකරන්න මට හිතුණෙ නෑ වොට්සන්. මං කෙළින්ම

http://sherlockholmesinvestigations.blogspot.com

ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගියා." මගේ මිත්‍රයා කීවේ හඩ්සන් මහත්මිය විසින් ගෙන එනු ලැබූ කෝපි පානය කරමිනි. "උදේ පාන්දරින්ම ගිහින් ලෙස්ට්‍රේඩ් අල්ලා ගත්තා. මට පුළුවන් වුණා අවශ්‍ය තොරතුරු ටිකක් ඔහුගෙන් දැනගන්න."

"මොනවද ඒ තොරතුරු?" මම ඇසීමි.

හිස් කෝප්පය ඉවත තබා, හාන්සිපුටුවේ වැතිරුණු මගේ මිතුරා, සිරිත් පරිදි පයිප්පය දල්වා ගත්තේය. මිනිත්තු කිහිපයක් යනතුරුම ඔහු සිවිලිම දෙස බලාගෙන කල්පනා කරමින් සිටියේය. මගේ ප්‍රශ්නයට පිළිතුරක් ඉක්මනින් ලැබෙන බවක් නොපෙනුණු නිසා, මම යළිත් පුවත්පතට දෑනෙත් යොමු කළෙමි.

"ඔබ ඇහුවෙ මං දැනගත්තු තොරතුරු මොනවද කියල නේද?" හෝම්ස් ඇසීය. "මං මුලින්ම කිවයුතුයි, අපට ලැබී තිබෙන දත්ත ප්‍රමාණය හොඳටම මදි වොට්සන්. ඔබ ඊයේ රෑ කිව්වා වගේ මේ මිනිහා සම්පූර්ණයෙන්ම නාඳුනන්නෙක්.

අඩි පහමාරක් පමණ උස, වයස තිස්පහේ හතළිහේ මිනිස්සු රටේ ඕනතරම් ඉන්නවා. මං ස්කොට්ලන්ඩ්යාඩ් එකේ අපරාධකරුවන්ගේ ඡායාරූපාගාරයට ගියා. මට උවමනා වුණේ යටි හක්ක දිග අය ගැන හොයා බලන්න. එහෙම අය දෙදෙනෙක් හමුවුණා. එක් කෙනෙක් අපරාධ කරලා තියෙන්නේ මීට අවුරුදු තිහකට පමණ කලින්. අපට ඔහු ගැන අමතක කරන්න පුළුවනි. අනිකා එල්ලුම්ගස් යාමට සූදානමින් එක්සිටර් සිරගෙදර"

"ඉතින්?"

"ඊළඟට මං බැලුවා විෂමාචාර ගැන තර්ජනය කරලා කප්පම් ගැනීමේ අපරාධ ගැන වාර්තා. ඔබට තේරෙනවා ඇති වොට්සන්. මේ ආකාරයේ අපරාධ ගැන පොලීසියට පැමිණිලි කරන්නේ බොහොම කලාතුරකින් කෙනෙක් තමයි. බාගවෙලාවට ඔහුම අර අපරාධකාරයාට වෙනත් ක්‍රමයකින් දඬුවම් කරනවා. නැත්නම් සර් ආතර් වගේ නිහඬවෙනවා. කොහොම වුණත් මෙවැනි අපරාධයක් විය හැකියි කියලා, පොලීසියේ සැකය එල්ලවුණු එක් සිද්ධියක් ගැන මට දැනගන්න ලැබුණා.

මේක මාස අටකට කලින්වුණු සිදුවීමක්. නොෆෝක් ප්‍රාන්තයේ නොරිච් ප්‍රදේශයෙන් පාර්ලිමේන්තු මැතිවරණයට තරඟකරන්න සූදානම් මහත්මයෙක් හිටියා. ඔහු ලිබරල් පක්ෂයෙන් ඉදිරිපත්වීමට

http://sherlockholmesinvestigations.blogspot.com

බලාපොරොත්තුවෙන් හිටී ඇලන් පාමර්. මැතිවරණයට මාස දෙකක් තිබියදී ඔහු මෙලොවින් සමුගත්තා. මුලින් හිතුණේ මේක මිනීමැරීමක් කියල. ඔහු මියගියේ මුහුදේ ගිලීමෙන්. කොන්සවටිව් පක්ෂයේ අපේක්ෂකයා වෙතත් සැකය එල්ලවුණා. නමුත් මරණ පරීක්ෂණයෙන් තීරණය වෙලා තියෙන්නේ, මේක සිය දිවිනසා ගැනීමක් කියලා.

නමුත් ඔහුට සිය දිවි හානිකරගන්න කිසිම හේතුවක් තිබුණෙ නෑ. ඔහු පිගන් භාණ්ඩ නිෂ්පාදන කම්හලක, අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙක්. කුඩා ඇහැනු දරුවන් සිව්දෙනෙකුගේ පියෙක්. ඉතා විනීත, කරුණාවන්ත බිරිඳක් සිටිනවා. ඔහු කාටවත් ණය වෙලා නැහැ. භක්තිමත් කතෝලිකයෙක්. පළාතේ කවුරු අතරත් බොහොම ජනප්‍රියයි. මැතිවරණයේදී විශිෂ්ට ජයක් වාර්තා කරාවි කියලයි කාගේත් විශ්වාසය තිබුණේ."

"එහෙම කෙනෙක් සිය දිවි හානි කරගන්නා කියලා හිතන්නත් අමාරුයි" මම කීවෙමි.

"ඔව්. ඒ වුණත් ඔහු හරි සංවේදී පුද්ගලයෙක්ලු. මරණයට දින පහකට කලින් සිට අධික ලෙස මත්පැන් පානය කරලා තිබුණා. ගෙදරදීත් දැඩි සිත්වේදනාවකින් මෙන් කල්පනා කරමින් සිටි බැව් බිරිඳ කියා තිබුණා. මේ බව ඔහුගේ ළඟම මිතුරන් පවා කිව්වාලු."

"ඔහුගේ මරණය සිදුවුණු ආකාරය ගැන, ඔබට විස්තර දැනගන්න ලැබුණාද?"

"ඔව්. එක දවසක් රෑ ඔහු තනියම සමාජශාලාවෙන් පිටවෙලා ගිහින්, බලේක්නි තුඩුවෙන් මුහුදට පැන දිවි හානිකරගෙන තියෙනවා. මළසිරුර හමුවුණේ දිනදෙකකට පස්සේ."

"ඉතින් දිවිනසාගැනීමක් බව තීරණය වුණේ කොහොමද?"

"ඔහුගේ කාර්යාලයේ, ඔහුගේම අත් අකුරින් තිබූ ලිපියක් හමුවුණා. ඔහු තමන්ගේ පවුලේ අය සමඟත්, ගමේ මිනිසුන් සමගත් ඉතාම සුහද, ප්‍රීතිමත් ජීවිතයක් ගතකළ කෙනෙක්. ස්කොට්ලන්ඩ්යාඩ්හි පරීක්ෂක බර්ඩ්ස්ට්‍රීට් ඔබ දන්නවානේ. මිනිහා සෑහෙන දක්ෂයෙක්. පරීක්ෂණය එහෙමම අත්හැර දමන්නේ නැතුව, මාසයක් විතර මහන්සිවෙලා, ඔහු තොරතුරු රාශියක් රැස්කරගෙන තිබුණා. මට කියවන්න ලැබුණා ඒ ලිපිගොනුව.

මරණයට දින පහකට කලින්, ඇලන් පාමර් හමුවෙන්න නාඳුනන කෙනෙක් පාමර්ගේ කාර්යාලයට ඇවිත් තියෙනවා. මේ

http://sherlockholmesinvestigations.blogspot.com

තැනැත්තාගේ පෙනුම, අපි හොයන එරික්ගේ පෙනුමට බොහෝ දුරට සමානයි. ඝනරාමුව සහිත උපැස් යුගළ, මැදින් බෙදූ කළුකෙස් සහ කොළපාට වැහිකබාය. මේ කාරණා හෙළිකරල තියෙන්නේ පාමර්ගේ පෞද්ගලික ලේකම්වරිය. එදා උදේ පාමර් හමුවෙන්න ආ මේ තැනැත්තා, පැයක් පමණ පාමර් සමඟ රහසේ සාකච්ඡා කළාලු. ඉන්පසු දෙදෙනාම අශ්වකරත්යේ නැගී පිටවී ගියාලු.

බ්‍රැඩ්ස්ට්‍රීට්, පාමර්ගේ බිරිඳගෙන්, ඔහුගේ බැංකු ගිණුම් වල තොරතුරු ලබාගෙන තියෙනවා. හරියටම ඔය කියන දවසේ, පාමර් පවුම් දාහක මුදලක් ඔහුගේ ගිණුමකින් අරගෙන තියෙනවා. කොහෙන්ද? මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවෙන්! සර් ආතර් හිල්වුඩ් අධ්‍යක්ෂක වරයෙක් හැටියට ඉන්නා බැංකුවෙන්ම. මේක අහඹු සිදුවීමක් වෙන්න පුළුවන්ද? ඊළඟට පාමර් මහත්මිය කියල තියෙනවා, ඔහුට එතරම් මුදලක් ආපසු ගන්න කිසිම හේතුවක් තිබුණෙ නැහැලු. ඊළඟට පොලිස් පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට් මොකද කළේ. ඔහුට හිතුණලු ඇලන් පාමර්ගේ අතීතය හාරා අවුස්සා බලන්න. ටිකක් කරදර වුණත් ඔහුට හැකිවුණාලු ඒක සාර්ථකව කරන්න."

මේ අතරේ අපේ සාකච්ඡාවට බාධාවක් ඇතිවිය. දොරට තට්ටුකළ හඩ්සන් මහත්මිය හෝම්ස් නමට ලැබුණු විදුලිපුවතක් ඔහුට භාරදී පිටවී ගියාය. එය ඉක්මනින් කියවා බැලූ මගේ මිත්‍රයා එය පසෙක තබා යළිත් කථාව පටන්ගත්තේය.

"ඇලන් පාමර්ගේ ඇත්ත නම ඒක නෙමෙයිලු. ඔහුගේ සත්‍ය නම පෝල් ඇන්තනි මැක්ලුස්කි. අවුරුදු දහඅටකට කලින් ඔහු ස්කොට්ලන්තයේ ඇබර්ඩීන් කිට්ටුව පදිංචි වී ඉඳල තියෙනවා. රෝමානු කතෝලික ආගමේ පූජකවරයෙක් වීමේ අරමුණෙන් ඔහු සෙමනේරියක පුහුණුව ලබමින් ඉඳල තියෙන්නේ. එතැන ප්‍රධානියා වෙලා ඉඳල තියෙන්නේ ක්‍රිහාට් නම් ඉතාලි ජාතික පියතුමෙක්. එක් රාත්‍රියක සාහසිකයෙකුගේ පිහි ඇනුමකින්, ක්‍රිහාට් පියතුමා මියගොස් තිබෙනවා. මේකෙදි සැකය එල්ලවුණේ මැක්ලුස්කිට. ඒ මොකද දින කිහිපයකට කලින්, පියතුමා හා මැක්ලුස්කි අතරේ ආරවුලක් ඇතිවුණාලු. මරණයට පෙර දිනයේත්, දෙදෙනා අතර උණුසුම් වචන හුවමාරුවක් ඇතිවුණාලු. කොහොමවුණත් ඔහුට විරුද්ධව සාක්ෂි නොමැතිවීම නිසා, මැක්ලුස්කි සම්පූර්ණයෙන් නිදහස ලැබුවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක කොහොමද අපේ ප්‍රශ්නයට අදාල වෙන්නේ?" මම ඇසීමි.

"ඇයි වොට්සන් ඒක බොහොම පැහැදිලියි නේ" හෝම්ස් කීය. "මිනීමැරුම චෝදනා ලබල රක්ෂිත බන්ධනාගාරයේ සිටි මැක්ලුස්කි නිදහස් වුණා. එයින් අවුරුදු දහඅටකට පස්සේ ඔහු ඇබර්ඩීන් වලින් දකුණට සංක්‍රමණය වෙලා, ජන්දේ ඉල්ලන්න සූදානම් වෙනවා. දැන් ඔහු අවංක, කරුණාවන්ත ඇලන් පාමර් නම් මහත්මයෙක්. ඔහුගේ සත්‍ය තොරතුරු හෙළිකරන්න හදන මිනිහෙකුට පුළුවනි......."

"හරි. මට තේරෙනවා."

"ඔව්. මේ කප්පම් කාරයා, ඒ කියන්නේ එරික් මීට ඉහතත් සාර්ථකව ක්‍රියාත්මක වී ඇති බවයි, මේකෙන් අපට පෙනෙන්නේ. මීළඟට ඔහු කුමකින් කුමක් කරාවිද කියල හිතාගන්න අමාරුයි."

"මොකක්ද ඔබ ඊළඟට ගන්න පියවර?" මම ඇසීමි.

ඊට පිළිතුරු ලෙස හෝම්ස් විදුලි පුවත අතට ගත්තේය.

"මේක මට එව්වේ මයිකල් විල්කොක්ස්"

"පැරැණි භාණ්ඩ වෙළෙන්දා?"

"ඔව්. මේ දක්වා එරික් නම් නාඳුනන්නා හඳුනාගන්න, ඔහුගේ බාහිර පෙනුම, ඇඳුම් පැළඳුම් හැර වෙන කිසිම දත්තයක් නැහැ. බාහිර පෙනුම, ඇඳුම් ඇළඳුම් කියන හැම දෙයක්ම ව්‍යාජ ලෙස සකස්කරගත හැකියි. නමුත් මිනිසෙකුගේ අභ්‍යන්තර ස්වභාවය, ගතිගුණ, රුචිඅරුචි නම් එහෙම වෙනස්කරන්න බෑ. එරික්, හිල්වුඩ්ගේ රෝම පිළිමයට දක්වූ රුචිය, ඔහුගේ සිත ඇතුළෙන්ම හටගැනුණු එකක් බවට සැක නෑ. ඒකෙන් මං නිගමනයකට ආවා. එරික් කියන්නේ එක්කො කෞතුක භාණ්ඩ එකතු කරන්නෙක්, අලෙවිකරන්නෙක්; නැත්නම් ඒවා ගැන හ... දැනුමක් ඇති පුරාවිද්‍යාඥයෙක්. නමුත් සියලුම අනුවුක්ම් ඉඩ ඇත්තේ, මම මුලින් සඳහන් කළ ආකාරයේ කෙනෙක් වීමටයි. මෙන්න මේ කාරණය උදව්වට අරගෙන, ඔහුට ඇමක් දෙන්න පුළුවන්ද කියල උත්සාහ කරලා බලමු. මං හදන්නේ බොහොම ඈතින් තියෙන ඉලක්කයකට ඊතලයක් යවන්න. ඒක කොයිතරම් දුරට සාර්ථක වේවිද කියල කියන්න බැහැ. ඒ කටයුත්තට අපි හවසට යමු විල්කොක්ස් හමුවෙන්න."

දහවල් ආහාරයෙන් පසු අපි හැරෝවේ සඩ්බරිහිල් මාවතට ගියෙමු. සිය පියාගෙන් උරුම වූ පෞරාණික භාණ්ඩ අලෙවි සලක්

http://sherlockholmesinvestigations.blogspot.com

පවත්වාගෙන ගිය මයිකල් විල්කොක්ස්, ඉතා ප්‍රියමනාප පුද්ගලයෙක් විය.

"මොකද හෝම්ස් මහත්මයා ඔබ ඇවිත් ගියා කිව්වෙ? ඔබටත් හිතුණද ඔය රස්සාව අත් ඇරදාලා පැරණි බඩු එකතුකරන්න?" ඔහු ඇසුවේ අපට හිඳගැනීමට අසුන් දෙකක් පෙන්වමිනි.

"ඒකත් මට බොහොම ආශාවෙන් කරන්න පුළුවන් විනෝදාංශයක් විල්කොක්ස් මහත්මයා. නමුත් දැනට මට ඒකට කාල වේලාවක් නැහැ. දැන් මට උවමනා වෙලා තියෙනවා, පැරණි බඩු ගැන විස්තර ටිකක් දැනගන්න. ඔබ ළඟ තියෙනවද රෝම කිරිගරුඬ ප්‍රතිමා?"

"කලින් නම් මා ළඟ තිබුණා. දැනට නැහැ."

"ඒවල චිත්‍ර සහ විස්තර අඩංගු කැටලොග් පොත් ඔබ ළඟ නැද්ද?"

තම කාර්යාල කාමරයට ගිය විල්කොක්ස්, විශාල පොත් හතරක් රැගෙන ආවේය.

"හෝම්ස් මහත්මයා. ඔබට උවමනා කරන්නේ මොන වගේ දෙයක්ද?"

"ක්‍රිස්තු වර්ෂ පළමුවැනි සියවසේ රෝම ප්‍රභුවරයෙකුගේ උඩුකය ප්‍රතිමාවක්."

"පොත පෙරළූ ඔහු චිත්‍ර කිහිපයක්ම අපට පෙන්නුවේය."

"හරියට හරි. මෙන්න මේ වගේ එකක් තමා අපට ඕන" මගේ මිත්‍රයා කීවේ අතිශය සතුටිනි.

"මෙයින් එකක් නම් විශාල ගණනක් වෙනවා හෝම්ස් මහත්මයා. මං හිතන්නේ නෑ මෙයින් එකක් ඔබට අද හෙටම මිලට ගන්න හැකිවේවි කියල. එකතුකරන කෙනෙක් මුදල් හදිසිවෙලා විකුණුවොත් මිස."

"ඒ යුගයේ මොනවා හරි ප්‍රතිමා නැද්ද" හෝම්ස් ඇසීය.

"රෝම සොල්දාදුවන්ගෙන් උඩුකය කිරිගරුඬ ප්‍රතිමාවක් මහන්සිවුණොත් හොයා ගන්න පුළුවනි. එහෙමත් නැත්නම්, ලෝකඩ වලින් තැනූ, දෙවඟනකගේ ප්‍රතිමාවක් මං හොයල දෙන්නම්?"

"බොහොම හොඳයි" හෝම්ස් කීය. "ඉක්මනටම හොයල කියන්න. අවශ්‍ය මුදල් මම වහාම ලබාදෙන්නම්. ඊළඟට ඔබට තවත් කටයුත්තක් තියෙනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ මොකක්ද?"

"අපි මිලට ගන්න ප්‍රතිමා වලට සති දෙකක් තිස්සේ ලොකු ප්‍රසිද්ධියක් ලබාදීලා, ඒවා ක්‍රිස්ටීස් ආයතනය මගින් වෙන්දේසියේ විකුණමු."

"ඒ මොකටද?"

"අපරාධකාරයෙක් ආකර්ෂණය කරගන්න."

"බඩුවල නියම වටිනාකමට, වෙන්දේසියෙදි ඉල්ලුමක් ආවෙ නැත්නම්, බාගවෙලාවට ඔබට පාඩු සිදුවෙන්නත් පුළුවන්" විල්කොක්ස් කීය.

"කමක් නෑ. ඒ පාඩුව මං දරාගන්නම්" හෝම්ස් කීය. "මට මුදලින් ආධාර කරන්න සූදානම් අය ඉන්නවා. මේක සූදුවක් වගේ වැඩක්. එක වාරයකදී අපේ අරමුණ හරි නොගියොත්, තවත් සැරයක් වත් උත්සාහ කරල බලන්න වෙනවා."

රෝම පුරාවස්තු වෙන්දේසියක් පැවැත්වෙන බවට පුවත්පත් මගින් ප්‍රසිද්ධ කරන ලදී. මේ සඳහා විල්කොක්ස් මහත් පරිශ්‍රමයක් දරා කිරිගරුඬ පිළිම තුනක් ද, ලෝකඩ වලින් නිම කළ දෙවඟනකගේ පිළිමයක් ද, ලෝකඩෙන් තැනූ රෝම සොල්දාදුවකුගේ පිළිම දෙකක් ද ලබාගත්තේය. ඊට අමතරව පැරණි කාසි හා ආයුධ ද ඊට එකතු කෙරිණි.

"ක්‍රිස්ටී" නම් සුප්‍රසිද්ධ පෞරාණික භාණ්ඩ අලෙවිකරුවන්ගේ වෙන්දේසිය සඳහා යොදා ගත්තේ ස්පෙන්සර් ශාලාවය. එය ඇරඹීමට නියමිතව තිබුණේ, සතියේ දිනක දහවල් තුනටය.

අපි කල්වේලා ඇතිව එහි ගියෙමු. කුලීරියකට මුදල් ගෙවා, අවශ්‍ය වූ වහාම පිටවී යෑමට සූදානමෙන් රිය ගාල්කරන ලදී. වෙන්දේසිකරුවා කටයුතු කළේ ශාලාවේ වේදිකාව මත සිටය. හෝම්ස් කල්තබා විල්කොක්ස්ට දැනුම් දී තිබූ අයුරෙන්, වේදිකාව උඩ අසුන් තුනක්, අප සඳහා වෙන්කර තිබිණි. එහෙත් ඒවා තබා තිබුණේ, පහළ ප්‍රේක්ෂකාගාරයේ සිටි ගැනුම්කරුවන්ට, අප හරිහැටි නොපෙනෙන ලෙසයි. ඒ සඳහා තිරරෙදි දමා තිබිණි. එහෙත් අපට ගැනුම්කරුවන් පැහැදිලිව දැකගත හැකිවිය.

නියමිත වේලාවට දොරවල් විවෘත කළ වහාම, ගැනුම්කරුවෝ ශාලාව තුළට පැමිණියහ. මගේ මිත්‍රයා විසින් කලින් දී තිබූ උපදෙස් පරිදි, වෙන්දේසිය පටන්ගැනීම හිතාමතාම ප්‍රමාද කරන ලදී. ඒ හෝම්ස්ගේ නිරීක්ෂණ කටයුතු සඳහාය.

http://sherlockholmesinvestigations.blogspot.com

"සතකම් රාමුව සහිත උපැස්යුගළ, කෙස්වල පෙනුම ආදිය ගැන මොහොතකට අමතක කරන්න වොට්සන්" හෝම්ස් කීය. "උස, ඇගේ කෙට්ටු බව හා වයස ගැන ඔබේ සැලකිල්ල යොමු කරන්න. ඊට අමතරව උපැස් පැළඳි අය, උඩු රැවුලක් ඇති අය ගැනත් හිතාබලන්න."

මම ඉතා උනන්දුවෙන් මෙවැනි ලක්ෂණ ඇති පුද්ගලයන් සිටිදැයි බැලීමි.

"මට සැක හිතෙන හත්දෙනෙක් මෙතැන ඉන්නවා." හෝම්ස් කීය. "ආසනවල අංක සැලැස්ම මං මේ කොළේ අඳිනවා. ඔන්න බලන්න ඔහු කඩදාසිය මත එය ලකුණු කළේය."

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| A | | | | | | | | x | | | x | |
| B | | | x | | | | | | | | | |
| C | | | | | | | | | | | | |
| D | | | | x | | | | | x | | | |
| E | | | | | | | | | | | | |
| F | | | | | | | | | | | | |
| G | | | | | | | | | | x | | |
| H | | | | | | | | | | | | |
| I | | | | | x | | | | | | | |

"A පේළියේ 8 හා 11. B පේළියේ 3. C පේළියේ කවුරුත් නැහැ. D පේළියේ 4 හා 9 E හා F පේළිවල කවුරුත් නැහැ. G පේළියේ 10. H හි කවුරුත් නැහැ. I පේළියේ 5.

විල්කොක්ස් දූත් මට කියන්න, ඔබ මේ පුද්ගලයන් හඳුනනවාද කියන එක. ඔවුන්ගේ තොරතුරු මොනවාද ඔබ දන්නේ ආදිය."

"A පේළියේ 8 හා B පේළියේ 3 නම් මම හොඳට දන්නවා. ඔවුන් පරණ බඩු අලෙවිකරන්නන්ගේ නියෝජිතයෝ. D පේළියේ 4 වැන්නා රැන්ඩෝල් සාමිවරයා. ඔහු අවංක කෙනෙක්. පෞද්ගලික කෞතුකාගාරයක හිමිකරුවෙක්. I පේළියේ 5වැනි ආසනයේ ඉන්නේ මහාචාර්ය රදගර්ඩ්. ඔහු පුරාවිද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක්."

Reading Purpose Only.. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙනම් ඔවුන් ගැන අපට අමතක කරන්න පුළුවනි." හෝම්ස් කීය. "එතකොට ඉතිරිවෙනවා තව තුන්දෙනෙක් A පේළියේ 11, D පේළියේ 9 සහ G හි 10. ඔවුන් ඔබ දැකලා පුරුදු අයද?"

"මට ඒ ගැන සහතික වෙන්න බෑ" විල්කොක්ස් කීය. "බාගවෙලාවට දැකලත් ඇති. නැතුවත් ඇති."

වෙන්දේසිකරුවා එක් එක් භාණ්ඩය පෙන්වමින් විස්තරයක් කරද්දී ගැනුම්කරුවන් ඊට දක්වන ප්‍රතිචාරයට අපි අවධානය යොමුකළෙමු. භාණ්ඩ කිහිපයක්ම විකිණීගියේය. මඳවේලාවක් ගතවී යද්දී G පේළියේ 10 වැන්නා ආසනයෙන් නැගිට්ටේය. ඔහු අප සිතුවාට වඩා උස, මඳක් කුදු ගැසුණු අයෙකි. ඔහු අසුනෙන් ඉවතට ගියේ කොර ගසමිනි.

"එයත් අපට අමතක කරන්න පුළුවනි. එරික් උසත් නෑ. කොර ගහන්නෙත් නෑ" හෝම්ස් කීය. "එතකොට ඉතිරි වෙන්නේ දෙන්නයි. A පේළියේ 11 සහ D පේළියේ 9. දෙන්නගේම මුහුණු සුදුමැලියි. ඒ වුණාට දෙන්නාටම උඩුරැවුල් නැහැ. බාගවෙලාවට එරික් මේ දෙන්නාගෙන් කෙනෙක් වෙන්නත් පුළුවනි. එහෙමත් නැත්නම් ඔහු මේ වෙන්දේසියට ආවෙ නැතුවාවත්ද?"

මීළඟට වෙන්දේසි කෙරුණේ මිලෙන් අඩුවූ භාණ්ඩ දෙකකි. ලෝකඩෙන් තැනූ දේවගනාකගේ කුඩා පිළිමයක් සහ රෝම සොල්දාදුවෙකුගේ කුඩා කිරිගරුඬ පිළිමය ඒ භාණ්ඩ දෙකය. A පේළියේ 11 වැන්නා මෙය ඉල්ලා, මිල සිවම එයට ලන්සු තබන්නට පටන් ගත්තේය.

"මිනිහ නම් අවුරුදු හතළිස්පහක පනහක කෙනෙක්. ඔබ මීට කලින් ඔහුව දැකල තියෙනවද?" හෝම්ස් ඇසුවේ විල්කොක්ස්ගෙනි.

"නැහැ."

මෙම භාණ්ඩ වලට ශාලාවේ බොහෝ දෙනෙක් ඉල්ලුම් කළහ. A 11 අසුනේ තැනැත්තා මෙය කෙසේ හෝ මිලට ගැනීමේ අදිටනෙන් මෙන් නොකඩවා ඉල්ලුම් කළේය. මඳක් පැසුණු හිසක් තිබූ ඔහු රන්වන් රාමුව සහිත උපැස් යුගලක් පැළැඳ සිටියේය. මඳ වේලාවකට පසු වෙන්දේසිකරුවා A 11 යයි මා හැඳින්වූ තැනැත්තාගේ ඉහළ ලන්සුවට පිළිම දෙක ඇවර කළේය.

"දැන් අපට බලන්න තියෙන්නේ දෙදෙනෙක් ගැන විතරයි" හෝම්ස් කීය. "ඔවුන් කොයි මොහොතක හරි ශාලාවෙන් පිටවෙලා

http://sherlockholmesinvestigations.blogspot.com

යන්න පිළිවන්. අපි ඉක්මනට මෙතැනින් ගිහිං, ශාලාවේ පසුපස දොරෙන් ඇතුළුවෙලා ඔවුනට ළංවෙමු."

අපි වේදිකාව පිටිපස දොරෙන් පිටවූයේ තිරරෙදි වලට ආවරණය වී කිසිවෙකුට නොපෙනෙන අයුරෙනි. ප්‍රේක්ෂකයනට ඇතුළුවීමට තිබූ දොරටුවෙන් නිශ්ශබ්දව ඇතුළුවී, D පේළියේ හිස්ව තිබූ අසුනකට ගිය හෝම්ස් D 9 පුද්ගලයා දෙස විමසුම් බැල්මක් හෙළුවේය. මට සහ විල්කොක්ස්ට ලැබුණේ E හා F පේළිවල අසුන්ය.

අවසන් භාණ්ඩ වෙන්දේසියට ඉදිරිපත් වෙද්දී නදකළ හිසකෙස් තිබූ D 9 නැනැත්තා දෑතින්ම හිස කසන්නට පටන්ගත්තේය. ඒ අත් දුම්කොළ කහට වැදී, කහ පැහැ ගැහුණු මඳක් තරබාරු අත් බව අපට දැකගතහැකි විය. හිල්වුඩ් පැවසුවේ අපරාධකරුවාගේ දෑත් කාන්තාවකගේ මෙන් සිහින්, පිරිසිදු දෑත් බවයි. ඒ අනුව D 9 නැනැත්තා අපේ ලැයිස්තුවෙන් කපාහැරීමට සිදුවෙයි. එවිට ඉතිරිවන්නේ A 11 නැනැත්තා පමණි.

හෝම්ස් ආපසු අප අසලට පැමිණ කෙඳිරිලි හඬින් කථා කළේ විල්කොක්ස් ද ළඟට කැඳවූ පසුය. "දැන් අපට ඉතිරි A 11 විතරයි. මේ මිනිහ නම් අවුරුදු පනහක විතර කෙනෙක් වගෙයි. මං ළඟට දැක්කෙ උස අඩි පහමාරක විතර කෙට්ටු මිනිහෙක්. ඔහු එරික් වෙන්නත් පුළුවන්. කොහොම වුණත් අපට වෙන විකල්පයක් ඉතිරිවෙලා නැහැ. එයා ගැන අවධානය යොමුකරමු."

"මොකක්ද අපි කරන්න ඕන?" මම ඇසීමි.

"දැන් කොයි මොහොතේ හෝ ඔහු ශාලාවෙන් පිටවේවි." හෝම්ස් කීය. "මම වොට්සන් එක්ක ඉක්මනට ගිහිං කුලීරියට වෙලා ඉන්නම්. A 11 පිටවෙද්දී විල්කොක්ස් එයා පිටුපසින් එන්න. ඔහු මේ ප්‍රතිමාවලට මුදල් ගෙවන්නේ මොන නෝට්ටු වලින්ද කියන එකත් හොඳින් බලාගන්න. අනෙක ඔහුගේ කතාබහට හොඳින් කන්දෙන්න."

හෝම්ස් මගේ අතින් ඇදගෙන එළියට බැස්සේය. එළියට් නම් අපේ හිතවත් රියැදුරා, කුලීරිය මහපාර අසලම නවත්වාගෙන සිටියේය. අපි රිය තුළට නැග ස්පෙන්සර් ශාලාවේ දොරටු වෙත නෙත් යොමුකරගෙන සිටියෙමු.

පැය භාගයක් පමණ ගතවූ පසු, කිහිපදෙනෙකු එළියට බැස එනු පෙනිණ. අපගේ සැක කටයුතු පුද්ගලයා, දුඹුරු කඩදාසියකින් එතූ

http://sherlockholmesinvestigations.blogspot.com

පාර්සලයක් ද රැගෙන එන අයුරු දුටුවෙමු. විල්කොක්ස් ඔහු ළඟින්ම පිටිපසින් ආවේය. සැකකටයුතු තැනැත්තා වටපිට බලා කිංග්ස්බරි මාවතේ ඉදිරියට ඉක්මනින් ඇවිදගියේය.

"මිනිහා පිළිමවලට සල්ලි ගෙව්වේ පවුමේ නෝට්ටු වලින්" කරත්තයට ළංවූ විල්කොක්ස් කෙඳිරිලි හඬින් කීය. "බඩු ටික අඳුම අරගෙන යන්න ඔහුට උවමනා වුණා."

"ඔහුගේ කටහඬ ඔබට ළඟට ඇහුණද?"

"ඔව්. හරි ගොරෝසු කටහඬක්"

"කතාබහ සාමාන්‍යද?"

"ඒ කිව්වේ ගොතගැසීමක් එහෙමද? එහෙම මොකුත් නෑ. ඒත් මට හිතෙන්නේ සමහර වචනවල, විදේශීය උච්චාරණයක් යන්තමින් තිබුණා කියලයි."

"ඉතාම වටිනා නිරීක්ෂණයක් විල්කොක්ස්" හෝම්ස් කීවේ අපමණ සතුටෙනි. "මං හිතන්නේ මෙයා තමයි අපට ඕන කරන මිනිහා. ඔබට ස්තූතියි. අපි හෙට හමුවෙමු."

කුලිරිය ඉතා සෙමෙන් අප පසුපසින් පදවාගෙන එන ලෙස රියැදුරාට දන්වූ හෝම්ස්, මගේ අතින් ඇදගෙන පාරෙන් එහා පැත්තට පැන්නේය. මීළඟට අපි පාර්සලය රැගෙන ගිය පුද්ගලයා පසුපස හැකි වේගයෙන් ගමන් කළෙමු.

"සාන්ත ජේම්ස් පාරට හැරෙන හන්දියේදී, මිනිහා කුලීරියකට නගින්න ඉඩතියෙනවා. ඉක්මන් කරමු. මට නං සෑහෙන්න විශ්වාසයි මිනිහා තමයි එරික්" හෝම්ස් කීවේ ආපසු හැරී බලමිනි.

ඔහු කී අයුරින්ම කිංස්බරි මංසන්ධියේදී එරික් කුලීරියකට නගිනු අපි දුටුවෙමු. අපේ රිය පැමිණියේ අප පිටුපසින්මය. අපි එයට නැගුණෙමු.

"ඉක්මන් කරන්න විලියට්" හෝම්ස් කීය. "අන්න අර රතුපාට වහලක් තියන කුලීරිය පිටිපස්සෙනුයි අපට යන්න උවමනා. මග ඇරෙන්න ඉඩතියන්න එපා. හැබැයි හුඟක්ම ළංවෙන්නත් එපා."

කිංස්බරි හන්දියෙන් ආලිංටන් වීථියට හැරුණු රිය, වේගයෙන් ඉදිරියට ගමන්කළේය. අපි ඒ පසුපස ගමන්කළෙමු. රිට්ස් නාට්‍යශාලාව ළඟදී වමට හැරුණු රිය ගමන් කළේ පිකැඩලිය දෙසටයි. පාරේ වාහන එතරම් සංඛ්‍යාවක් නොවූ නිසා ඔහුට තරමක් පිටිපසින් ඉදිරියට යාමට අපට හැකිවිය. පිකැඩලියෙන්

http://sherlockholmesinvestigations.blogspot.com

හයිඩ්පාක් කෝනර් වෙත ගිය රථය, කෙන්සිංටන් මහාවීදිය දෙසට හැරෙව්වේය.

"මේ මිනිහා යන්නේ දිගටම බටහිර පැත්තට. එක්කො හැමර්ස්මිත් වලට. නැත්නම් චිස්වික්" හෝම්ස් කීවේ තළල රැළිකරමිනි.

"නැත්නං දිගටම බ්‍රෙන්ට්ෆර්ඩ් වලට යනවාද දන්නෙත් නෑ" මම කීවෙමි.

කැම්ඩන් මංසන්ධිය අසල තරමක අවහිරයක් පැවතිණ. ඒ නිසා රියේ වේගය අඩුවිය. හෝම්ස් සිතූ අයුරින්ම එය හැරවූයේ හැමර්ස්මිත් පාරටය. ඔහුනට ඉතා වේගයෙන් යාමට අවශ්‍යතාවයක් නොතිබුණු අයුරකි.

හැමර්ස්මිත් ප්‍රධාන පාර දිගේ ගමන්ගත් කුලීරිය, වෙලිංටන් වීථියට හරවනු අපි ඈතදීම දුටුවෙමු. මෙය එතරම් පුළුල් මාවතක් නොවිය. පාර දෙපස එක දිගටම පැවැති තට්ටු දෙකේ නිවාස පිහිටා තිබූ මෙහි, දක්නට ලැබුණේ පාළු බවකි.

"ඔහු පදිංචි ඇත්තෙ මේ පාරේ තමයි වොට්සන්. ඔහු කරත්තයෙන් බැහැලා ඇතුළුවෙන ගේ මොකක්ද කියල බලාගමු. ගෙදර අංකය හොඳට බලාගන්න."

ඉදිරියෙන් ගිය රිය නවත්වනු දුටු හෝම්ස්, අපේ රියේ වේගය බොහෝදුරට අඩුකරන මෙන්, අපේ රියැදුරාට දනුම් දුන්නේය. පාර්සලය රැගත් තැනැත්තා රියෙන් බැස්ස පසු, එම රථය ඉදිරියටම ගමන් කළේය. අපි කුලීරියේ කවුළුව තුළින් ඔහු සිටි දෙසට නෙත් යොමු කළෙමු. දුඹුරු කඩදාසියේ එතූ පාර්සලය එක් අතකින් පපුවට තදකරගෙන, ඔහු දකුණු අත කලිසම් සාක්කුවට දමා ගෙදර යතුර ඉවතට ගැනීමට තැත්කරමින් සිටියේය. නිවසේ අංකය 71 බැව් අපි දුටුවෙමු.

"එරික්ගේ ලිපිනය ඔන්න අපි හොයාගත්තා. අංක 71 වෙලිංටන් වීථිය" හෝම්ස් කීවේ තෘප්තිමත් හඬෙනි.

* * *

අප බේකර් වීථියේ නිවහනට ළඟාවෙද්දී රෑබෝවී තිබිණ. රාත්‍රී ආහාරය ඉක්මනින් ගිල් දැමූ මගේ මිත්‍රයා, විසිත්ත කාමරයේ සෝපාව මත වැතිරී කල්පනා කරන්නට පටන්ගත්තේය. ඔහු තම

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print

පයිප්පයට යොදාගෙන තිබුණේ තද දුර්ගන්ධයක් නැඟුණු සැර දුම්කොළ වර්ගයකි. ඒ සමඟම ඔහුගේ මුහුණේ වූ ඉරියව් වලින්, එක් කරුණක් මට පැහැදිලිව වටහාගැනීමට හැකිවිය. එනම් මගේ මිත්‍රයාට මේ වෙලාවේ උවමනා වී ඇත්තේ මා සමඟ සංවාදයක යෙදීම නොව, සොයාගත් කරුණු එකින් එක ගළපා, එරික්ට එරෙහි සටන සඳහා සැලසුමක් සකස්කිරීම බවයි.

පසුවදා උදෑසන මම මගේ වෛද්‍ය චිකිත්සාගාරය බලා පිටත්වී ගියෙමි. රෝගීන්ගේ කටයුතු කර්මින් දින දෙකක්ම මම මගේ නිවසේ රැඳුණෙමි. ඥාතීන් දකිමට ගිය මගේ බිරිඳ ආපසු පැමිණීමට නියමිත තවත් සිව්දිනකිනි. තුන්වැනි දිනයේ මම බේකර් වීථියේ අපේ නිවහන වෙත ගියෙමි. ෂර්ලොක් හෝම්ස් කාමරයේ නොවීය. එහෙත්, මා එහි පැමිණියහොත්, ඔහු එනතුරු රඳවාගන්නා මෙන්, ඔහු හඩ්සන් මහත්මියට උපදෙස් දී තිබිණි.

ඔහු ආපසු කාමරයට පැමිණෙන විට රාත්‍රී හත පමණ විය. ගෙවීගිය දුර්වර්ණ වූ ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි මගේ මිත්‍රයාගේ හිසේ, බොරු කොණ්ඩයක් ද විය.

"වොට්සන්. ඔබ ඇවිත් හුඟක් වෙලාද? මං ඉක්මනට එන්නම්."

තම කාමරයට වැදුණු ඔහු ආපහු පැමිණියේ මිනිත්තු දහයක් පමණ ගතවූ පසුය.

"පසුගිය දවස් දෙක මං බොහොම ප්‍රයෝජනවත් අයුරින් ගතකළා." ඔහු පැවසුවේ සුපුරුදු ලෙස හාන්සිපුටුවේ වාඩිවී පයිප්පය දල්වාගනිමිනි. "මං ඔබට මුල ඉඳලම කථාව කියන්නම්.

එදා අපි අර සැකකටයුතු පුද්ගලයා පසුපස වෙලිංටන් වීථියට ගිහින්, ඔහුගේ නිවස බලාගෙන ආව හැටි ඔබට මතකයි නේ. ඔහු අප හොයන අපරාධකාරයා යයි හැඟීමකට පත්වෙන්න තරම්, සාධාරණ සාක්ෂි නොමැති බව, මට කිහිපවරක් කල්පනාවුණා. අප ගියේ ඉතාම සුළු, හෝඩුවාවක් පසුපස. අපි මේ එළවන්නේ වැරදි මිනිහෙක් පස්සෙද? මට කීපවාරයක් එහෙම හිතුණා. නමුත් එරික් කියන නාඳුනන්නා හොයන්න අපට වෙන මොකුත්ම හෝඩුවාවක් තිබුණේ නෑ. ඉතින් පහුවදා උදේම මං, ඔබ දන් දුටු විධියට වෙස්මාරුකරගෙන බේකර් වීථියෙන් පිටත්වෙලා ගියා. මගේ අරමුණ වුණේ, එරික්ගේ නිවස කිට්ටුව නිවසක නවාතැන් අරගෙන, ඔහුගේ ගමන්බිමන් හැසිරීම ආදිය නිරීක්ෂණය කරන්න.

http://sherlockholmesinvestigations.blogspot.com

ලේඛකයෙකුට අවශ්‍ය වෙන දේවල් සහ ඇඳුම කිහිපයක් පරණ සූට්කේසයක දමාගෙන, මං කුලීඩියකින් ගිහිං වෙලිංටන් වීථියේ අනෙක් කෙළවරේ බැස්සා. ඊළඟට පාර දෙපැත්තෙම ගෙවල් "කුලියට දීමට තිබේ" හෝ "කාමර ඇත" වගේ දැන්වීම් තියෙනවද කියල හොය හොය, මං ඉදිරියට ඇවිදගෙන ආවා. නමුත් එවැන්නක් මට දකින්න ලැබුණෙ නැහැ. ඒ පාරෙ තිබුණු වෙළඳසල් දෙකකිනුත් විමසා බැලුවා. නමුත් සතුටුදායක ආරංචියක් ලැබුණෙ නෑ.

පාර දෙපැත්තෙම තිබෙන්නෙත් එක්දහස් අටසිය පනස් ගණන්වල තැනූ තට්ටු දෙකේ පරණ නිවාසු බව ඔබට මතක ඇති. මෙවල ජීවත්වෙන්නේ, රජයේ රැකියා වලින් විශ්‍රාම ලැබූ වයස්ගත අය සහ පහළ මධ්‍යම පංතියේ පවුල්. ඔබට මතක ඇති එරික්ගේ ගෙදර අංකය 71 බව. ඒ ඉදිරිපිසම පාරේ අනෙක් පැත්තේ ගෙදරකින් වයස්ගත කාන්තාවක් එළියට බැස්සා. ඇය අත තිබුණේ බඩුගැනීමට වෙළඳපොළට ගෙනියන කූඩයක්. මං ඇයව නවත්වලා කථාකළා.

"නෝනා. මේ හරියේ මට නවාතැන් ගන්න පුළුවන් කාමරයක් හෝ නේවාසිකාගාරයක් ගැන ඔබට කියන්න පුළුවන්ද? මම ලේඛකයෙක්. මේ දිනවල මම මධ්‍යම වික්ටෝරියානු යුගයේ නිර්මාණය වුණු නිවාස ගැන පොතක් ලියමිනුයි ඉන්නේ. එවැනි නිවාස තිබෙන වෙලිංටන් වීථිය ඒකට ඉතාම සුදුසු තැනක්. ඔබගේ නිවසේ නැද්ද නේවාසිකයෙකුට අමතර කාමරයක් හෙම?"

මගේ කතාව අහගෙන ඉඳලා, ඇය මුලින් මා දිහා බලාගෙන හිටියේ තරමක් අවිශ්වාසයෙන් වගේ. මගේ මුහුණේ හොර තක්කඩි පෙනුමක් නැති නිසාදෝ කොහෙද, ඇගේ සිතේ සැකය ඉවත්වුණු බැව් පෙනුණා.

"මගේ නිවසේ නම් අමතර කාමර නැහැ" ඇය කිව්වා. "ඒ වුණත් ගේබ්‍රියල් නෝනලගෙ ගෙදර නම් ඔබට නවාතැන් ගන්න කාමරයක් හොයාගන්න හැකිවේවි. ඒ ගොල්ලන්ගෙ ගෙදර නොම්මරේ 74. ඇගේ පුතා හමුදාවට බැඳිලා පිටරට ගිහින්. ඔහුගේ කාමරය පහුගිය කාලෙ කුලියට දීල තිබුණා. දැන් නම් කොහොමද දන්නෙ නෑ."

මං ඇයට ස්තුතිකරලා අංක 74 නිවස හොයාගෙන ගියා. ඒක තිබුණේ හරියටම 71 ඉදිරියෙන් නෙමෙයි. ඊට යාර 20ක් 25ක්

http://sherlockholmesinvestigations.blogspot.com

ඇතින්. අවුරුදු හැත්තෑපහක් පමණ වයසැති ගේබ්‍රියල් මහත්මිය බොහොම කරුණාවන්ත නැනැත්තියක්. ඒ වගේමයි ඇගේ සැමියාත්. ඔවුන්ගේ පුතාගේ කාමරය මේ දිනවල හිස්වෙලා. මං ලේඛකයෙකු බව කිව්වාම, මට නවාතැන් දෙන්න ඔවුන් බොහොම කැමැතිවුණා. මහත්මයාගෙ විශ්‍රාම වැටුපෙන් ජීවත්වුණු ඔවුනූට, ඒක හොඳ ආදායම් මාර්ගයක් බව මට වැටහුණා.

මට ලැබුණේ ගෙදර උඩතට්ටුවේ මහපාරට යාබද ඉදිරිපසම කාමරය. ඒකෙ වීදුරු ජනේල අල්ලියක්මු තිබෙනවා. ඒකට වෙනම ඇතුළුවිය හැකි දොරක් සහ තරප්පු පේළියක් තිබෙනවා. එරික් යයි අපි හිතාගෙන ඉන්න නැනැත්තා ගැන සොඳිසියෙන් ඉන්න, එතැන අනර්ඝ තැනක්. මගේ පරණ සූට්කේසයේ තිබුණු බඩුමුට්ටු එළියෙන් තබලා, මං මගේ කටයුත්තට සූදානම්වුණා. ලේඛකයෙකුට අවශ්‍ය ක්ඩ්දාසි හා තීන්ත වලට අමතරව ඔබට අයත් "දෙනෙතිය" ත් මම අරගෙන ගියා. ගේබ්‍රියල් මහතාගේ උවමනාව තිබුණේ මාව කථාවට අල්ලාගන්නයි. බොහොම අමාරුවෙන් ඔහුව මගහැර, මං අසල්වැසියා ගැන සොඳිසියෙන් හිටියා.

තවමත් ස්ථිර නැතිවුණත් අපි ඔහුට එරික් කියල කියමු. ඔහු එදා එළියට ආවෙ හැන්දෑවේ හයට. ඔහු සැරසිලා හිටියෙ වෙන්දේසිය සඳහා පැමිණි ඇඳුමෙන්මයි. ඔහු පිටුපස යන්න හිතලත්, මං ආයෙමත් තීරණය කළා, එහෙම නොගිහිං ඔහු ආපහු එන වෙලාව ගැන කල්පනාවෙන් ඉන්න. මේ පුද්ගලයා බොහෝවිට යන්න ඇත්තේ අවන්හලට. හැන්දෑවට එතැනට ගිහිං පොඩි 'අඩියක් ගහලා, ඔහු ආපහු එනවා වෙන්න පුළුවන්.

ඔබේ 'දෙනෙතියේ' ආධාරයෙන් අපට වැදගත් තවත් එක් කරුණක් මං නිරීක්ෂණය කළා. ඔහුගේ යටිහනුවේ ප්‍රමාණය ඉතා විශාලයි. සර් ආතර් කියූ එක් වැදගත් කරුණක් ඒක. උඩු රැවුළක් නොමැති නිසා වෙන්න ඇති යටිහනුව කැපී පෙනුණා. ඔහු ආපසු එනතුරු මං බලාගෙන හිටියා. හරියටම මිනිත්තු හතළිහකින් ඔහු ආපසු ආවා. මේ වෙනකොට ඇඳිරි වැටී තිබුණත්, ගෙදර පහන් දැල්වී තිබුණේ නැහැ. බාගවෙලාවට මොහු තනිකඩයෙක් වීමට ඉඩ ඇතිබව එයින් මට සිතුණා.

ඔහු යළිත් ගෙයින් එළියට බැස්සේ පසුවදා උදේ හරියටම නවයහමාරට. නමුත් ඒ රැකියාවකට යාමට නෙමෙයි. කළු වලාකුළු

http://sherlockholmesinvestigations.blogspot.com

තිබුණු නිසා, අහස දෙස බලමින් දොර ළඟ මිනිත්තුවක් දෙකක් ගතකළ ඔහු, පාරට බැස්සා. ඊළඟට මුල්ලකුත් අතින් ගෙන පාරදිගේ ගියා. මෙවරත් ඔහු අසුපස යන්න ආශාවක් ආවත්, එහෙම නොගිහිං මං බලාගෙන සිටියා. එකොළහට කාලක් තිබියදී ඔහු ආපහු ආවා. ලොකු මල්ලක් පුරවා ඔහු බඩුමිලට ගෙන තිබුණා. ඊට අමතරව අනෙක් අතේ තවත් කඩදාසි මල්ලක් තිබුණා. ඔහුගෙන ආ ඒ අමතර මල්ලේ තිබූ කිරිබෝතලය, පාන්ගෙඩියක්, පුවත්පත් කිහිපයක් සහ එලවළු මට යන්තමින් දකින්න ලැබුණා. ඉන්පසු හවස්වෙනතුරු ඔහු ගෙදරින් එළියට ආවේ නැහැ.

නමුත් කලින්දා හැන්දෑවේ වගේ හරියටම හවස හයට ඔහු ගෙයින් එළියට බැස්සා. මං ඔහුට යන්න ඇරලා, මිනිත්තු දෙකකට පස්සේ පිටත්වුණා. ඔහු හැන්දෑවරුවේ ගොඩවදින්නේ මොන අවන්හලටද කියන එක සොයාගන්නයි මට උවමනාවුණේ.

ඒ වෙලාවේ පාරේ ගමන් කළ විශාල වාහන සංඛ්‍යාව නිසා මට ඔහු නොපෙනී ගියා. මංසන්ධියට ගිය ගමන්ම හමුවෙන අවන්හල "රොබින්ස් නෙස්ට්." එයට ගොඩවැදී එහි සෙනග අතරේ ඉක්මනින් ඇවිද ගිය මට, එහි එරික් නොමැති බව දැකගත හැකිවුණා. ඊළඟට තවත් ඉදිරියට යද්දී තිබුණා, "රෝයල් කාසල්" අවන්හල. ඔහු ඒකෙ හිටියෙත් නැහැ. පයින් යන දුරින් තව තියෙන්නෙ එකම අවන්හලයි. ඒ "රීගල්" අවන්හල. මං හිතූ විධියටම ඔහු ඒකෙ සිටියා. කුඩා අවන්හලක් වුණු මෙහි එතරම් විශාල සෙනගක් හිටියෙ නෑ. අඳුරු මුල්ලක තිබුණු කුඩා මේසයකට වාඩිවෙලා, ඔහු තනියම බීර ජෝගුවක් බොමින් සිටියා. මං වහාම දොරටුව අසල මේසයකට වාඩිවෙලා, ඇහැ කොණින් ඔහු දෙස බලාගෙන සිටියා. බීර ජෝගුව අවසන් කළ එරික්, සාක්කුවෙන් සිල්ක් ලේන්සුවක් එළියට ඇදල අරගෙන කට පිසදමා ගත්තා. ඊළඟට වහාම පුටුවෙන් නැගිටල අවන්හලෙන් පිටවී ගියා. ඔහු ගැන තොරතුරු ටිකක් තැබෑරුමේ සේවකයාගෙන් දැනගන්න හැකිවේවි කියල මට හිතුණා.

මං කවුන්ටරයට ගිහින් බීර ජෝගුවක් ඇණවුම් කළා. මගේ ඉතිරි සල්ලි අතට නොගෙන මං එය සේවකයා දෙසටම තල්ලු කළා.

"අර දැන් මෙතැනින් පිටවෙලා ගිය මහත්මයා ඔබ අඳුනනවද?" මං ඇහුවේ මගේ බීර එක අතට ගනිමින්.

http://sherlockholmesinvestigations.blogspot.com

"මොන මහත්තයද?"

"අන්න අර මුල්ලෙ තිබෙන මේසෙ වාඩිවෙලා, තනියෙන්ම බීර බිව්වේ? මං එද්දිම වගේ තමයි ඔහු නැගිටලා ගියේ."

"ආ එයාද? එයා අපේ බොහොම පරණ ගනුදෙනුකාරයෙක්. වෙන කිසි තැබෑරුමකට යන්නෙ නෑ. හැමදාම හැන්දෑවට එන්නෙ මෙතැනටමයි. හරි හොඳ මහත්තයා. බොහොම නිශ්ශබ්දයි. කවදාවත් කලබලයක් කරන්නෙ නෑ. පාකර් මහත්මයා හැමදාමත් බොන්නෙ ලාගර් බීර විතරයි. ඒකත් එක පයින්ට් එකයි. ඒක බිව්ව වහාම පිටවෙලා යනවා. කිසි දවසක ලොකු නෝට්ටු අරගෙන ඇවිත් අපට කරදර කරන්නේ නෑ. ඕනෑම දවසක දෙන්නේ මාරු සල්ලි."

"ඔහුගේ නම පාකර් කියලද කිව්වේ? ඒ මහත්තයගෙ මුල නම මොකක්ද?" මං ඇහුවා.

"මුල නමද ....... මුල නම ....... මට ඉස්සර නම් මතක තිබුණා. ඇයි අහන්නේ?"

"නැහැ. මං නිකං දැන අඳුනගන්න ඇහුවේ. කලබලයක් නැති කෙනෙක් වග මටත් පෙනුණා. ආශ්‍රයට හොඳ එහෙම කෙනෙක්." මං කිව්වා.

"පාකර් මහත්තයා, අපේ ලොක්කගෙ ඉල්ලීමට නත්තල් සීට්ටුවටත් දායක වුණා. ඔව් ඔව් දැන් මට මතකයි. සීට්ටු පොතේ නම ඇති." මෙහෙම කිව් තරුණ සේවකයා, කවුන්ටරය පහතින් වූ ලාච්චුවකින් පොතක් එළියට ගත්තා.

"ආ මේ තියෙන්නේ නම. නොයෙල් පාකර් මහතා. අංක 71 වෙලිංටන් වීථිය. සිලිං හයක් එක්වරම ගෙව්වා."

"බොහොම ස්තුතියි. මං මේ පළාතට අලුත් කෙනෙක්. මධ්‍යම වික්ටෝරියානු යුගයේ නිවාස ගැන මං පොතක් ලියනවා. ඒකට කරුණු එකතු කරන්නයි මේ පළාතේ පදිංචියට ආවේ" මම කිව්වා.

"ඒක නම් අපූරු අදහසක් මහත්මයා. ඔබ මේ අවන්හලට නිතර ආවොත්, ඔය ගෙවල් ගැන විස්තර දැනගන්න, ඕනෑ තරම් අය හමුවෙන්න පුළුවනි."

"ඇත්තෙන්ම මං එනවා."

බීර වීදුරුව අවසන් කරලා, මං හෙමින් හෙමින් ආපහු ආවෙ කල්පනා කරමින්. එතකොට එරික් කියල බොරු නමක් දුන්

http://sherlockholmesinvestigations.blogspot.com

පුද්ගලයගෙ නියම නම නොයෙල් පාකර්. ඔහු ජීවත්වෙන්නෙ තනියම. දරුමල්ලන් ඉන්න කෙනෙක් නෙමෙයි වගේ. වයස අවුරුදු හතළිස් අටක් පනහක් පමණ. රැකියාවක් කරන්නෙත් නැහැ. නමුත් මුදල් හදල් තියෙනවා. ගමන් බිමන් නියම වෙලාවට. කවුරුවත් සමග ආශ්‍රයක් නැහැ. මං ආපහු ඇවිත් මගේ නේවාසිකාගාරයට ගියේ, පාකර්ගේ නිවස දෙසවත් නොබලා.

ඔහුගේ ගෙදර ගෑස්ලාම්පු දල්වා ඇති හැටි මගේ කාමරයට පෙනුණා. මේ මිනිහා මේ අඳුරට වෙලා තනියම මොකද කරන්නේ? බාගවෙලාවට ඔහුට බිරිඳක් ඉන්නවද කියන්නත් බැහැ. එහෙම ඉන්නවා නම් ඇය, ආබාධිත රෝගාතුරවුණු කෙනෙක් වෙන්න ඇති. ඒ මොකද කොයි වෙලාවකවත් ඔහු හැර වෙන කිසිම කෙනෙක් අංක 71 නිවසෙන් එළියට නොආව නිසා.

ටිකක් ඕපාදූප කතාකරන්න කැමැති ගේබ්‍රියල් මහත්මිය එක්ක, මං අසල්වාසීන්ගැන කතාකළා. නමුත් පාකර් කියල නමක් ඇය කිව්වෙත් නෑ. ඔහුගේ හැඩහුරුකම තියන කෙනෙක් ගැන තොරතුරක් දන හිටියෙත් නැහැ. මේ නොයෙල් පාකර් හෙවත් එරික්, අපරාධකාරී විධියට සැල්ලි හොයන්නේ මොකටද? ඔහු තනියම කෞතුක භාණ්ඩ එකතුකරලා, පෞද්ගලික කෞතුකාගාරයක් හදන්නද? නැත්නම් ඔහු සූදුකාරයෙක්ද? එහෙමත් නැත්නම් විශාල තඩත්තු මුදලක් ගෙවිය යුතු පවුලක් වෙන කොහේ හරි ඉන්නවද? මට මොකුත් හිතාගන්න බැරිවුණා.

ඒ ඊයේ රෑ. අද උදේ නොයෙල් පාකර්ගේ දිනචරියාවේ පැහැදිලි වෙනසක් මට දකින්න ලැබුණා. උදේ නවයහමාරට කඩේ ගිහින් පාන්, කිරි, පුවත්පත් අරගෙන ආව ඔහු, ආයෙමත් උදේ එකොළහමාරට නිවසෙන් එළියට ආවා. මෙපමණ දවසක් එළියට ඇඳගෙන ගිය දුඹුරු පාට බෑගි ඇඳුම් කට්ටලය වෙනුවට, ඔහු හැඳසිටියේ වෙනත් ඇඳුමක්. දිග අතට පුළුල් ඉරි සහිත කලිසමක් ඇඳලා, කළුපාට අලුත් කබායක් ඇඳ සිටියා. හිසේ අලුත් තොප්පියක් සහ අතේ රෝල් කළ කුඩයක්. ඔහු සිරුවෙන් ඇවිදගෙන යද්දී පෙනුණේ, තමන්ගේ කාර්යාලයට යන ලිපිකරුවෙකු වගේ. මමත් හැකි ඉක්මනින් හැඳපැළඳ ගෙන ඔහු පිටුපස ගියා.

පාකර් ගියේ රේවන්ස් කෝට් උමං දුම්රියපොළට. ඔහු නැගුණේ නැගෙනහිර ලන්ඩනය දෙසට ගමන්කරන දුම්රියකට. මාත් ඒකට

http://sherlockholmesinvestigations.blogspot.com

නැඟුණා. ඔහුට නොපෙනෙන තැනක, සෙනගට මුවාවී සූදානමෙන් මං බලාගෙන හිටියා. දකුණු කෙන්සිංටන් දුම්රියපොළෙන් බැහැලා, පාකර් කෙළින්ම ඇවිදගෙන ගියේ කවාකාර වේදිකාවට. එතැනදී ඔහු තවත් නැගෙනහිර දෙසට යන දුම්රියකට නැඟුණා. ගිහින් බැස්සේ මැන්ෂන් හවුස් වලින්. මමුත් ඔහු පසුපසින්ම ගියා.

පාකර් එක්වරක් වත් ආපහු හැරිලා බැලුවේ නැහැ. දුම්රියපොළෙන් එළියට ඇවිත්, ඔහු ගමන් කළේ ත්‍රෙඩ්නීඩ්ල් වීදියට. එංගලන්ත මහ බැංකුව පසුකරගෙන ඉදිරියට ඇවිදගෙන ගිය ඔහු, නැෂනල් ප්‍රොවින්ෂල් බැංකුව ඉදිරිපිට නැවතුණා. ඊළඟට පාකර් ඔහුගේ සාක්කු ඔරලෝසුව එළියට ගෙන වෙලාව බලමින් මඳක් කල්පනා කරමින් හිටියා. මේ වෙනකොට මං හිටියේ ඔහුට යාර දහයක් තරම් ඈතින්. අඩි කිහිපයක් ඉදිරියට ගිය ඔහු එක්වරම වමට හැරිලා දොරටුවකින් ඇතුළුවුණා.

මගේ හිතේ පොඩි සැකයක් ඇතිවුණා. ඔහු මාව මගහැරලා පැනලා යන්නද හදන්නේ? මං අඩි කිහිපයක් ඉදිරියට ගියේ, පාකර් ඇතුළුවුණු දොරටුව මොකක්ද කියල බලමින්. ඒක "කැප්ටන්ස් කැබින්" නම් නාම පුවරුවක් දමා තිබුණු විවිධ කෑම සංග්‍රහකරන අවන්හලක්. මාත් හෙමින්ම එතැනට ඇතුළුවුණා.

ඒක සෑහෙන්න ලොකු තැනක්. හතළිහකට පනහකට ආසන තිබුණා. නමුත් ඒ වෙලාවෙ සෙනග හිටියේ ආසන වලින් බාගෙක පමණයි. තොයෙල් පාකර්, ඉදිරිදොරට පිටිපස්ස හරවලා මේසෙකට වාඩිවෙලා හිටියා. ඔහු සිටියේ කෑමදමා තිබුණු අල්මාරි හා අයකැමියාගේ මේසය පැත්තට මූහුණ දාලා. ඒ මේසය කෙළින්ම ඉහළ බිරවෙළෙන්දෙකුගේ, බීර ප්‍රචාරක පුළුල් කැටපතක් එල්ලා තිබුණා. පාකර්ට මා නොපෙනෙන ලෙස, එහෙත් ඔහු සිටි තැන කැටපතෙන් දැකිය හැකි අයුරෙන්, මම මේසයකට වාඩිවුණා.

එක්වරම දකින්නට ලැබුණු දසුනෙන් මම තිගැස්සුණා. පාකර් අද හිටියේ තනියම නෙමෙයි. ඔහු ඉදිරිපිට අසුනේ අමුත්තෙක් සිටියා. මේක බොහොම වැදගත් කරුණක්. ඒ අමුත්තා රන්වන් පැහැයේ හිසකෙස් තිබූ උස තරුණයෙක්. මෙ තරුණයා ඇඳ හිටියෙත්, පාකර්ගේ විධියටම කළු කබායක් සහ ඉරි සහිත

http://sherlockholmesinvestigations.blogspot.com

කලිසමක්. දෙදෙනාම ඔවුන් ඉදිරියේ වූ කෑම කමින් ලොකු සාකච්ඡාවක් පටන්ගත් බව මට තේරුණා. ක්‍රමයෙන් අවන්හලට සෙනග ඇදී එන්නට පටන්ගත්තා. සිගරට් හා පයිප්ප දුමෙන් එතැන පිරෙද්දී, මාව ඔවුනට නොපෙනී යන බව මං තේරුම් ගත්තා. මං හැම් සැන්ඩ්විච් එකක් හා කෝපි පෝච්චියක් ගෙන්වාගෙන ඔවුන් ගැන හොඳ සෝදිසියෙන් හිටියා.

තරුණයාගේ තිබුණේ බොහොම අහිංසක, ප්‍රියමනාප පෙනුමක්. මේ වගේ මිනිහෙක් කොහොමද පාකර් වගේ තක්කඩියෙක් එක්ක යාළුවුණේ? මේ තරුණයාට මොකක්ද පාකර් එක්ක තියෙන ගනුදෙනුව? මේ පාකර්ගේ උදව්කාරයෙක් විත්ද? ඔහු කොහොමද අපරාධකාරයෙකුගේ හවුල් කාරයෙක් වුණේ?

ඔවුන් සැහෙන වෙලාවක්, ඒ කියන්නේ මිනිත්තු 20 ක් විතර කමින් බොමින් සාකච්ඡාවේ යෙදුණා. අන්තිමට පාකර් දෙතුන්වරක් වටපිට බලලා, කලිසම් සාක්කුවෙන් යමක් එළියට ගත්තා. ඒක දුඹුරු කඩදාසියක එතූ යමක් බව මං යන්තමින් දුටුවා. පාකර්ගේ අත එළියට ආවා පමණයි; එක් නිමේෂයකදී තරුණයා ඒ පාර්සලය අරගෙන තමන්ගේ කලිසම් සාක්කුවට දමාගත්තා. කුරුල්ලෙක් අහසෙන් පියාඹා ඇවිත්, වතුරේ ඉන්න මාළුවෙකු ක්ෂණිකව ඩැහැගෙන යනවා වගේ, ඒ කටයුත්ත සඳහා ගතවෙන්න ඇත්තේ තත්පරයකටත් අඩු කාලයක්.

මීළඟට තරුණයා තමන්ගේ කබා සාක්කුවෙන්, සාක්කු දිනපොතක් වැනි එකක් එළියට ගෙන පාකර් ඉදිරියේ තැබුවා. ඔහුත් තමන්ගේ සාක්කුවෙන් එවැනිම පොතක් අරගෙන, බොහොම වේගයෙන් යමක් පිටපත් කරගත්තා. මෙතැනදී සිදුවුණේ යම්කිසි ගාස්තුවක් ලබාගෙන, තරුණයා විසින් පාකර්ට අවශ්‍ය තොරතුරු ලබාදීමක් බව මට හැඟුණා. මීළඟට ඔවුන් බොහොම ඉක්මනට, අවන්හලෙන් පිටවී යාමට නැගිට්ටා. ඔවුනට යාමට ඉඩ ඇරලා, මමත් පරෙස්සමෙන් එළියට ආවා.

මං එළියට බහිද්දී දෙදෙනාම සතුටෙන් කථාකරමින් ත්‍රෙඩ්නීඩ්ල් වීථියේ ඉදිරියටම ඇවිදගෙන ගියා. එංගලන්ත මහ බැංකුව ඉදිරිපිට දී අතට අතදී, දෙදෙනා එකිනෙකාගෙන් සමුගත්තා.

තොයෙල් පාකර් එතැනින් ගමන්කළේ උමං දුම්රියපොළ දෙසට. මං ඔහු පසුපස යන්න හිතුවෙ නැහැ. තරුණයා ත්‍රෙඩ්නීඩ්ල්

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

වීථියේ ම ඉදිරියට ගියා. සැතපුම් කාලක් පමණ ඉදිරියට ගිය ඔහු විශාල ගොඩනැගිල්ලකට ඇතුළුවුණා. මං එහෙමම ඉදිරියට යමින් එතැන නාම පුවරුව දෙස දෙනෙත් යොමුකළා. මං දුටුවේ මොකක්ද කියා ඔබට අනුමාන කරන්න පුළුවන්ද වොට්සන්?"

"බැහැ."

"මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුව."

"දෙයියෝ සාක්කි! සර් ආතර් හිල්වුඩ් අධ්‍යක්ෂකවරයෙක් හැටියට ඉන්නේ මේ බැංකුවේ නේද?"

"හරියට හරි. මේක කොහොමටවත් අහම්බෙන් වුණු සිද්ධියක් වෙන්න බෑ. අර දිවිනසාගත් ඇලන් පාමර් මුදල් ලබාගෙන තිබුණෙත් මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවේ ගිණුමෙන්.

තරුණයාට ඔහුගේ ඉස්වාස්ප්‍රාහයට යන්න මිනිත්තු හතක කාලයක් දීලා, මං බැංකුවට ඇතුළුවුණා. මං කෙළින්ම ගියේ විදේශීය මුදල් ලබාදෙන කවුන්ටරය වෙත. මට ඇමරිකානු ඩොලර් ලබාගැනීමට අවශ්‍ය බව කියමින් මිනිත්තු කිහිපයක් එතැන ගතකරලා, මං වටපිට බැලුවා. මෙන්න ඉන්නවා අර තරුණයා. ඉතුරුකිරීමේ ගිණුම් වලින් මුදල් ආපසු ගන්නා කවුන්ටරයේ අයකැමි ඔහු. මං ඒ පෝලිමට එකතුවුණා. මට ඉදිරියෙන් සිටි වයසක කාන්තාවට පෝරමයක් පුරවන්න ඔහු උදව්වුණා. ඒ අතරේ මට හැකිවුණා, ඔහුගේ කබායේ ඉදිරිපස සවිකර තිබූ කුඩා රිදී තහඩුවේ සටහන්ව තිබූ නම බලාගන්න. "බෙන් තොම්සන්" එහි සඳහන්ව තිබුණා.

බලන්න වොට්සන්. සර් ආතර් හිල්වුඩ් ගේ බැංකුවේම ඉන්නවා, අපරාධකාරයාගේ මිත්‍රයෙක්.

ඊට පස්සේ එතැනින් පිටවෙලා මං කෙළින්ම ගියේ ස්කොට්ලන්ඩ්යාඩ් එකට. පාකර් හා තොම්සන් දෙදෙනාගේ නම් යටතේ, මොනවා හරි අපරාධයකට ඔවුන් සම්බන්ධ වෙලා තියෙනවද කියල මං හොයල බැලුවා. එවැනි කිසිවක් නැහැ. ඉතින් මගේ මිතුරෙක් හමුවෙන්නත් ගිහිං දැන් තමයි ගෙදර එන්නේ."

හෝම්ස්ගේ දීර්ඝ කථාන්තරය ඇසීමෙන් මම ඉමහත් පුදුමයට පත්වීමි. එරික් හෙවත් තොයෙල් පාකර් මේ අපරාධයේ යෙදෙන්නේ තනිව නොවේ. ඔහුට හොඳ සහයෝගයක් දෙන උදව්කරුවෙකු මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුව තුළම ඇත. පාකර්ට

http://sherlockholmesinvestigations.blogspot.com

රහසේ තොරතුරු ලබාදෙන පුද්ගලයා මේ තරුණයා බව දැන් හොඳින්ම පැහැදිලිය.

"කවුද හෝම්ස් ඔබ හමුවෙන්න ගිය මිතුරා?" මම ඇසීමි.

"සර් ආතර් හමුවෙන්න. දැන් පැයකට කලින්, බැංකුවේ ඔහුගේ කාර්යාලයට මං ගියා."

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඇයි ඔබ මෙහේ ආවෙ?" සර් ආතර් ඇහුවේ ටිකක් හරහෙන් "මං ඔබට කිව්ව නේ......." ඔහු ඉතිරි හරිය කිව්වේ කාර්යාලයේ සිටි ඔහුගේ පෞද්ගලික ලේකම්වරිය ඉවතට යවලා.

"...... මෙකට තවත් මැදිහත් වෙන්න මං කැමැති නැහැ කියලා. ඇරත් ඇයි ඔබ බැංකුවට ආවේ? ඔබට තිබුණ නේ අද හැන්දෑවට මාව ගෙදරදී හමුවෙන්න.

"මෙක හුඟක්ම වැදගත් කාරණයක් සර් ආතර්. දැන් මෙකට පටලැවී ඉන්නෙ ඔබ පමණක් නොවෙයි."

"ඒ කියන්නෙ?"

"මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවත් මේකට පටලැවිලා!"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! ඒ කොහොමද?"

"ඔබට කලින් අර අපරාධකාරයා එරික්ට අහුවුණු තවත් මහත්මයෙකුත්, පවුම් දාහේ කප්පම ගෙවල තියෙන්නේ මේ බැංකුවේ ගිණුමකින්."

"ඒක අහම්බෙන් වුණු දෙයක් වෙන්න ඇති. අපේ ගනුදෙනු කාරයන් විශාල ගණනක් මේ රටපුරාම ඉන්නවා."

"ඔව් එහෙම හිතමු." මං කීවා. "නමුත් ඒ මහත්මයා කප්පම ගෙවලා දිවි නසාගත්තා!"

"ආහ්!"

"එපමණක් නොවෙයි. ඔබේ බැංකුව තවත් විධියකින් මේකට පටලැවිලා."

"ඒ කොහොමද?"

"ඔබේ බැංකුවේ සේවකයෙක් තමා එරික්ට ඔත්තු දෙන්නේ."

"මොනවා? ඒක කිසි දවසක වෙන්න බෑ. ඔබට ලොකු වැරැදීමක් වෙලා හෝම්ස් මහත්මයා. හොඳයි මොකක්ද ඔහුගේ නම?" සර් ආතර් ඇසුවේ සිතාමුසු මුහුණෙන්.

"ඔහුගේ නම බෙන් තොම්සන්."

http://sherlockholmesinvestigations.blogspot.com

"මං එහෙම කිව්වා විතරයි, සර් ආතර් හිල්වුඩ් පුටුවෙන් ඉහළට විසිවුණේ, ඔහුගේ කකුලට සර්පයෙක් දෂ්ඨ කළා වගේ. ඔහුගේ මුහුණ සුදුමැලි වුණා. තොල කට වේළුණා."

"මොනවා බෙන් තොම්සන්? ඔහු මේකට සම්බන්ධයි? ඒක ඔප්පුකරන්න ඔබ ළඟ සාක්ෂි තියෙනවද?"

"ඔව්. මගේ ඇහින්ම මං දුටුවා. විස්තර පසුව කියන්නම්. කවුද මේ තරුණයා?"

"අපේ බැංකුවේ ඉන්න දක්ෂම තරුණ අයකැමිවරයෙක්." සර් ආතර් කිව්වා. "බොහොම දක්ෂයෙක්. ඔහු බැංකු විභාග ඉහළින්ම සමත්වුණා. විශේෂ පුහුණුවක් සඳහා අපි ඔහුව තෝරාගෙනයි ඉන්නේ. හෝම්ස් මහත්මයා. අර මහනමැෂින් ව්‍යාපෘතිය සම්බන්ධයෙනුත් ඔහු වැදගත් කාර්ය භාරයක් ඉටුකරනවා. ඔබට හොඳටම විශ්වාසද ඔහු මේකට සම්බන්ධයි කියලා?"

"ඒ විස්තර සියල්ලක්ම ඔබට මං දෙන්නම්. දැන් මට කියන්න නොයෙල් පාකර් කියල කෙනෙක් ඔබ හඳුනනවද කියල?"

"නොයෙල් පාකර්? මං කවදාවත් අහල නෑ" සර් ආතර් කිව්වා.

"ඔහු තමා එරික් කියන නමින් ඔබව කොල්ලකෑ තැනැත්තා." මං කිව්වා. "සර් ආතර්. මට ඔබෙන් උපකාරයක් අවශ්‍යයි. මං බැංකුවටම ඔබ හමුවෙන්න ආවේ ඒනිසා. මේ නොයෙල් පාකර් කියන පුද්ගලයා ඔබේ බැංකුවේ සේවය කරල තියෙනවද හොයල බලන්න? මේක බොහොම රහසිගතව කළ යුතු වැඩක්."

"රහසිගතව බව අවශ්‍ය නම්, එය මා විසින්ම කළ යුතුයි" සර් ආතර් කිව්වා. "ඔක්කොම වැඩ නවත්විල මං එය කරන්නම්. අද හවසට එය රැගෙන මට එන්න අපහසු වුණොත්, විශ්වාසවන්ත පණිවුඩකරුවෙක් අතේ ඔබේ නිවහනට එවන්නම්."

කථාව අවසන් කළ හෝම්ස් තම පොත් රාක්කය වෙත ගියේය. අපරාධකරුවන්ගේ විස්තර කෙටියෙන් සඳහන් කර, අකාරාදි පිළිවෙළට සටහන් කර තිබූ කෝෂ ග්‍රන්ථය ඔහු පෙරලා බැලුවේය. මම නිහඬව බලාසිටියෙමි.

"මේ නම් ඇති අපරාධකාරයින් ගැන කිසිම සටහනක් නෑ වොට්සන්" ඔහු කීවේ බලාපොරොත්තු කඩවූ විලාසයෙනි. එහෙත් පැය භාගයක් ගතවෙද්දී සර් ආතර් හිල්වුඩ්ගේ රියැදුරා ලිපියක් රැගෙන පැමිණියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"හිතවත් හෝම්ස් මහතාණනි,

ඔබ විමසූ තොරතුරු මේ සමග ඇත. එහෙත් අප සතුව ඇත්තේ විස්තර ස්වල්පයක් පමණි.

මේ හිතවත්,
ආතර් හිල්වුඩ්."

පාකර් සියර්පින්ස්කි, නොයෙල්:

1864 දී ආධුනික ලිපිකරුවෙකු ලෙස මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවට බැඳුණේ ඔහුට වයස අවුරුදු 17 දීය. 1867 දී සේවය ස්ථිර කරනු ලැබ, අයකැමි/ලිපිකරු ලෙස, විවිධ ශාඛාවල සේවය කොට ඇත. අවුරුදු තිහක සේවයෙන් පසු 1894 දී සේවයෙන් විශ්‍රාම ගෙන ඇත. විශේෂ දක්ෂතා හෝ බැංකු විභාග සමත්වීම් කිසිවක් නොමැත. විශ්‍රාම ගන්නා විට ද ඔහු අවිවාහකය. ලිපිනය "හෙක්සගන්" 196 රිච්මන්ඩ් හිල් පාර, ඊස්ට්වික්.

"හ්ම්" හෝම්ස් කීවේ ඔහුට ලැබී තිබූ ලිපිය ශබ්ද නගා කියවා අවසන් කරමිනි.

"ඔහුගේ සම්පූර්ණ නමට සියර්පින්ස්කි කියල තවත් කෑල්ලක් තිබුණට, පසුව ඒක අත්හැර දමල වගෙයි පෙනෙන්නෙ" මම කීවෙමි.

"මං හිතන්නේ ඔහුගේ පියා, පෝලන්තයෙන් එංගලන්තයට සංක්‍රමණය වුණු කෙනෙක්." හෝම්ස් කීය. "1860 පමණ කාලයේ බ්‍රිතාන්‍ය හමුදාවට යුරෝපයෙන් කුලී හේවායන් බඳවා ගත්තා. වැඩිමහල් පාකර් සියර්පින්ස්කි එහෙම කෙනෙක් වෙන්න ඇති. පාකර්ගේ ඉංග්‍රීසි උච්චාරණයේ අර සුළු වෙනසට හේතුවත්, පෝලන්ත මිශ්‍රණය වෙන්න පුළුවනි."

"හෝම්ස්. දැන් ඔබ මීළඟට ගන්නා පියවර කුමක්ද?" මම ඇසීමි.

"ඒක තමයි ප්‍රශ්නෙ. මොහුව අත්අඩංගුවට ගැනීම අපට බොහොම පහසුවෙන් කරන්න පුළුවනි. නමුත් ඔහුට විරුද්ධ සාක්ෂි දෙන්න කිසිකෙනෙක් ඉදිරිපත් වෙන එකක් නැහැ. ඔහු බොහොම ලෙහෙසියෙන් නඩුවෙන් නිදහස් වේවි."

"ඔහු තව කොයිතරම් කාලයක්, අසරණයෙකුගෙන් කප්පමක් ඉල්ලන්නෙ නැතුව ඉඳීවිද?"

"ඒක අපට කොහොමටවත් අනුමාන කරන්න බැහැ වොට්සන්. අද උදේ ඔහුට, තමන්ගේ මිත්‍රයා තොමසන්ගෙන් ලැබෙන්න

http://sherlockholmesinvestigations.blogspot.com

ඇත්තේ, ලොකු ගිණුමක් තියෙන ගනුදෙනුකාරයෙකුගේ තොරතුරු. පාකර් වහාම ක්‍රියාත්මක වෙන්න, බොහොම දුරට ඉඩතියෙනවා."

"බැංකුවේ රහස් තොරතුරු එළියට දීම ගැන, තොම්සන් අත්අඩංගුවට ගත්තොත්?"

"කෝ අපට සාක්ෂි? අනෙක එහෙම දෙයක් කළ ගමන් පාකර් හැංගෙනවා, ඒකෙ සැකයක් නෑ. වොට්සන් යළිත් වරක් මට ඔබේ උදව් ඕනෑ වෙනවා. මං බලාපොරොත්තුවෙනවා හෙට අනිද්දම තවත් කටයුත්තක යෙදෙන්න."

"ඒ මොකක්ද?"

"පාකර්ගේ ගෙදරට හොරෙන් ඇතුළුවෙන්න!"

"ඒ මොකටද? කොහොම වුණත් ඒක ඒ තරම් පහසුවෙන එකක් නෑ."

"ඔහු අපරාධයට සම්බන්ධ බව ඔප්පු කළ හැකි සාක්ෂි මොනවා හරි, ඔහුගේ නිවසේ තියෙනවා ද කියල, මුලින්ම අපි සොයා බැලිය යුතුයි. ඔහු කප්පම් ලබාගත් සහ ලබාගැනීමට බලාපොරොත්තුවන පුද්ගලයින් ගැන යම් සටහනක්, ලබාගත් මුදල් ප්‍රමාණ ගැන සඳහනක්, ඔහු ළඟ තිබෙන්න බොහොම දුරට ඉඩ තියෙනවා."

"ඔබ කොහොමද හෝම්ස් එහෙම කියන්නෙ? තමාව අපරාධයකට පටලැවිය හැකි සාක්ෂි, ඔහු ගෙදර තියාගනීවිද?" මම ඇසීමි.

"ඔහු අවුරුදු තිහක් බැංකු ලිපිකරුවෙක් ලෙස සේවය කළ කෙනෙක්. මෙහෙම පුද්ගලයෙක් තමන්ට ලැබුණු මුදල්, ආදායම/වියදම ගැන, ක්‍රමානුකූලව සටහන් කර තබා ගැනීමට ලොකු ඉඩක් තියෙනවා. අන්න ඒක මං කොහොම හරි හොයාගන්න ඕන."

"කොහොමද ඔබ ඔහුගේ ගෙට ඇතුළුවෙන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"ඔහු නගරයට යන්න පිටත්වෙන්න අඳින ඇඳුම මොකක්ද කියල මම දැන් දන්නවා" හෝම්ස් කීය. "ඊළඟට ඔහු කෙටිකාලයක් සඳහා ගෙදරින් පිටවෙන වෙලාවල් මම දන්නවා. ඔහුගේ ගෙදරට හොර යතුරක් හදාගත්තා, මට මිත්වෙල් ජොන්සන්ගේ උපකාරය ලැබෙනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

මිල්වෙල් ජොන්සන් යනු, කලකට පෙර ලන්ඩන් පාතාල ලෝකයේ, නමගිය අපරාධකරුවෙකි. බැංකු මංකොල්ලකෑම් ගෙවල් බිඳීම් යන අපරාධ ගැන, ඔහු දෙවරක්ම පාක්හර්ස්ට් බන්ධනාගාරයේ සිර දඬුවම් ලැබිය. පසුව් තම වැරැදි ක්‍රියා කලාපය ගැන වැටහී, එම ක්ෂේත්‍රයෙන් ඉවත්වූ ඔහු, පොලිස් ඔත්තු කරුවෙකු බවට පත්විය. පාතාල ලෝකයේ අපරාධකරුවන් ගැන හෝම්ස්ට තොරතුරු ලබාගැනීමට උවමනාවූ විට ඔහුට, මිල්වෙල් ජොන්සන්ගේ සහයෝගය ලැබිණ.

"ඒ වුණත් හෝම්ස්" මම කීවෙමි. "ජොන්සන් වගේ අපරාධකාරයෙකු සමග, කාගෙ හරි ගෙදරකට හොර යතුරකින් දොර ඇරගෙන ඇතුළුවීම අපරාධයක් නේද? අහුවුණොත් ලෙහෙසියෙන් ගැළවෙන්න බැරිවෙයි."

"පිස්සුද වොට්සන්?" හෝම්ස් කීය. "මං පාකර්ගේ ගෙට ඇතුළුවෙද්දී ජොන්සන්ව එක්ක යන්නෙ නෑ. නමගිය අපරාධකාරයෙක් අරගෙන යන්න තරම් මං මෝඩ නෑ. මං එක්ක යන්නේ සමාජය පිළිගත් වැදගත් මහත්මයෙක්."

"ඒක හරි" මම කීවෙමි.

"මං ඒ ගෙට හොරෙන් පනින්නේ රටේ වැදගත් කීර්තිමත් කෙනෙක් සමග."

"මොනවා ඒ කවුද?"

"ඔහුගේ නම දොස්තර ජෝන් එච්. වොට්සන්" මගේ මිත්‍රයා කීවේ සිනාසෙමිනි.

"දෙයියෝ සාක්කි හෝම්ස්! ඔබ මාවත් මේකට පටලවාගන්නද හදන්නේ?"

"මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීය. "අපි කරන්න හදන්නේ නීති විරෝධී වැඩක් බව ඇත්තයි. ඒ වුණත් ඒ මොන අරමුණකින්ද? එක් අපරාධයකින් දෙකකින් සෑහීමට පත්නොවී, දිගින් දිගටම කප්පම් ඉල්ලන අපරාධකාරයෙක් අල්ලාගැනීම. අපි කොහොමද දන්නෙ ඔහු මේ දේ කරලා නවතීවි කියලා? මේක සාර්ථකව කරන්න පුළුවන් බව දැනගත්තාම, ඊළඟට ඔහු කාව හරි පැහැරගෙන ගිහින් කප්පම් ඉල්ලාවි. නියපොත්තෙන් කඩන්න තියන දේ........"

"හරි හරි. මගේ සම්පූර්ණ සහයෝගය ඔබට ලැබෙනවා. කවදටද මං එන්න ඕන?"

http://sherlockholmesinvestigations.blogspot.com

"දිනය හා වෙලාව මං පසුව කියන්නම්. ඔබේ හමුදා රිවෝල්වරයත් පතරොම් පුරවලා අරගෙන එන්න."

එදා හැන්දෑවේ මම ඔහුගෙන් සමුගෙන යන්නට සූදානම් වීමි. ෂින්වෙල් ජොන්සන් හමුවීමේ අරමුණෙන් හෝම්ස් ද මා සමගම නිවසෙන් පිටත්විය.

පසුවදා උදේ පාන්දර සිටම ලන්ඩන් නගරයට මහවැහි කඩා හැළිණි. වැස්ස අඩුවන තුරු බලාසිට, සවස තුනට පමණ මම බේකර් වීථියේ අපේ නිවහන වෙත ගියෙමි. මා එහි යද්දී අපේ අනුග්‍රාහකයා වූ රිචඩ් කාට්රයිට් මහතා ද එහි පැමිණ සිටියේය.

"ආයුබෝවන් දොස්තර මහත්මයා" කාට්රයිට් මහතා කීය. "ඔබේ මිත්‍රයා ඔබ එනතුරු නොඉවසිල්ලෙන් බලාගෙන හිටියේ. ඔහු මේ කියමින් සිටියේ අර සිද්ධිය විසඳීමට ඔහු ලැබූ ප්‍රගතිය ගැන."

"ඔබ ආවේ හොඳ වෙලාවට වොට්සන්. ඔය පුටුව ගිනිඋදුන ළඟටම ගන්න. මේ මහ වැහි නිසා අපේ වැඩකටයුතු වලටත් කරදරයි" මගේ මිත්‍රයා කීය.

"ඊයේ හවස ෂින්වෙල් ජොන්සන්වත් කතාකරගෙන, මං වෙලිංටන් වීථියේ මගේ නේවාසිකාගාරයට ගියා. හවස හයට පාකර් ඔහුගේ බීර පයින්ටුව සඳහා ඊගල් අවන්හල වෙත පිටත්වෙලා ගියා. ඒ අවසරයෙන් අපට හැකිවුණා බලාපොරොත්තු වුණු කටයුත්ත ඉටුකරගන්න. අද හවස 4 වෙද්දී අවශ්‍ය යතුර මා වෙත ගෙනැත් දෙන්න ෂින්වෙල් ජොන්සන් පොරොන්දු වුණා. එතකොට ඒ වැඩේ හරි.

මං මේ කාට්රයිට් මහත්මයාට කියන්න සූදානම් වෙමින් හිටියේ අද උදේ මට මුහුණු දෙන්න වුණු වෙනස් විධියේ අත්දැකීමක්. ඒකත් වෙලිංටන් වීථියෙන්මයි. අපේ මිත්‍ර නොයෙල් පාකර් සම්බන්ධවමයි.

අද උදේ නවයහමාරට පාකර් සිරිත් පරිදි මල්ලත් අරගෙන එළියට බැස්සා. ඔහු බඩුගේන්න වෙළඳපොළට පිටත්ව යන හැටි මං බලාගෙන හිටියා. දහයයි හතළිහ වෙද්දී සුපුරුදු විධියට අත්දෙකෙන්ම පුවත්පත්, පාන් කිරිබෝතල් එල්ලාගෙන ඔහු ආපහු ආවා. මං බලාපොරොත්තු වුණේ ඔහු අද හැන්දෑවන තුරු, යළිත් කොහේවත් යන එකක් නැහැ කියලයි. නමුත් පැය භාගයකින් යළිත් ගෙදර ඉස්සරහ දොර විවෘතවුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

දොර ඇරගෙන එළියට ආවේ නොයෙල් පාකර් නෙමෙයි. එහෙනම් කවුද? ඔබට හිතාගන්න පුළුවන්ද? විවෘත වුණු දොරෙන් එළියට ආවේ එරික්! වෙනත් විධියකින් කියනවා නම්, ඔහු ගොදුරක් දඩයම් කරගැනීම සඳහා, දඩයමේ යෑමට සූදානමින්. සර් ආතර් හිල්වුඩ් විස්තර කළ අර චිත්‍රය අකුරටම නිවැරදියි. ගනරාමුව සහිත උපැස්යුගළ, කිළිටි දුඹුරු පැහැති කලිසම, කළුපාට රළු උඩුරැවුලක් අලවාගෙන. හිසේ කොණ්ඩය සම්පූර්ණයෙන්ම කළු පාට කරලා, මැදින් බෙදා පීරලා. ඔහු උඩුකයට ඇඳගෙන හිටියේ, අර ජංගල් කාකි කොළ පැහැයේ වැහි කබායමයි. අපරාධකාරයා මොහු බව දැන් සියයට සීයක් ස්ථිරයි. ඒ ඇඳුමෙන් ඔහු එක්වරම දකින්න ලැබුණාම, මගේ හිතත් කැලඹුණා. වහාම ඔහු පසුපස යායුතු බව මට වැටහුණා. නමුත් ගමනකට සූදානමෙන් මං හැඳගෙන හිටියේ නැහැ. කොහොම වුණත් මිනිත්තු දෙකෙන් ඇඳුම් මාරුකරගෙන, කබාය අතේ අරගෙන ඉක්මනටම මම ගෙදරින් පිටවුණා.

මට ඉස්සරහට හමුවුණේ ගෙදර හිමි ගේබ්‍රියල් ජෝඩුව.

"ටේලර් මහත්මයා. ඔබ ලොකු හදිසියකින් වගේ කොහේද මේ යන්නෙ?" ගේබ්‍රියල් මහතා ඇසුවා.

"මගේ යාළුවෙක් දුම්රියෙන් එනවා කිව්වා. දැනුයි මට මතක්වුණේ. ඔහු හමුවෙන්න දුම්රියපොළට දුවනවා" මං දිවගියේ ඔහු දුන් පිළිතුරට සවන් දීමටවත් නොරැඳී.

මේ වෙනකොට පාකර් හෙවත් එරික්, යාර සියයක් පමණ ඉදිරියට ගිහිං. උදේ වෙලාව නිසා පාරේ ගිය අශ්වකරත්ත වලට මුවාවෙමින්, මං හැකිතරම් වේගයෙන් ඉදිරියට ගියා. ඔහු උමං දුම්රිය පොළට ළං වෙද්දී, එතැනට යාගන්න මට හැකිවුණා. දුම්රිය ආ වහාම ඔහු එයට නැග්ගේ, එක්වරක් වත් ආපසු හැරී නොබලමින්. වැඩි පරෙස්සමට මං ඒ මැදිරියට නොනැග, ඊළඟ මැදිරියට නැග්ගා. ඒත් දිගටම ඔහු ගැන සෝදිසියෙන් හිටියා. ඔහු නයිට්ස්බ්‍රිජ් දුම්රියපොළේදී දුම්රියෙන් බැස්සා. මාත් දුම්රියෙන් බැහැල සෝදිසියෙන් හිටියා. නමුත් ඔහුට හුගක්ම ළං වුණේ නැහැ. දුම්රියපොළෙන් එළියට ආ පාකර් ගමන් කළේ වික්ටෝරියා - ඇල්බට් කෞතුකාගාරයට.

මේ ඔහුගේ විනෝදාංශය වූ පුරාවස්තු ගැන හැදෑරීමට යන ගමනක්ද? මට එහෙම හිතුණා. එහෙම වුණොත් මම මේ කරන්නෙ

http://sherlockholmesinvestigations.blogspot.com

කාලය නාස්තිකිරීමක්. ඒත් ඇයි එහෙම වැඩකට ඔහු වෙස්මාරු කරගෙන එන්නෙ? සමහර විට ඔහු ආ කටයුත්තට නියම වෙලාව එනතුරු නිකම් කාලය ගතකරන්න ආව වෙන්න පුළුවන්.

පැය භාගයක් යද්දි එරික් කෞතුකාගාරයෙන් එළියට ආවා. ඔහු බ්‍රොම්ටන් පාර දිගේ කෙළින්ම ඇවිදගෙන ගියේ, බෙල්ග්‍රේව් චතුරශ්‍රයට. ඔහුගේ ඉලක්කය වුණේ මෙහි දකුණු පැත්තේ තිබූ සුඛෝපභෝගී නිවසක් බව මට පෙනුණා. නමුත් ඒ මොන නිවසද? එතැන තිබුණු අවන්හලක මේස හා පුටු ආලින්දයේ තබා තිබුණා. ඔහු එයින් පුටුවක වාඩිවී, චිත්‍ර අඳින පොතක් දිග හැරගෙන චිත්‍රයක් අඳින්න පටන් ගත්තා. ඔහු ඇත්තේ, එහෙම නැත්නම් අඳින බව ඇඟෙව්වේ, බෙල්ග්‍රේව් චතුරශ්‍රයේ දකුණු පැත්තේ නිවාස. ඔහු සෑහෙන වෙලාවක් එතැන ගතකළා. නමුත් එරික්ගේ අරමුණ සාර්ථක වුණු බවක් පෙනුණේ නැහැ. ඊළඟට ඔහු ආපසු යන්න පිටත්වුණා.

දැන් ඉතින් අපේ සැලැස්ම වෙනස් කරන්න වෙනවා වොට්සන්. ඔහු තවත් බිල්ලක් ගන්න කලින් අපි ක්‍රියාත්මක විය යුතුයි."

"ඒ මොන ආකාරයටද?" මම ඇසීමි.

"ඔහුගේ ගෙදර දොර හොරෙන් ඇරගෙන ගෙට රිංගන වැඩේ, අද හවස මං කළයුතුමයි. කාට්‍රයිට් මහත්මයා, වොට්සනුත් එක්ක ඔබත් එන්න ඕනෑ අපේ උදව්වට. නමුත් නීතිවිරෝධී අවදානම් වැඩේ කරන්නේ දොස්තර වොට්සන් හා මා පමණයි."

"එතකොට මගෙන් මොකක්ද කෙරෙන්න ඕනෑ?" කාට්‍රයිට් මහතා ඇසීය.

"අපේ හිතවත් එලියට් සමග ඔහුගේ කුලීරියෙන්, අපි වෙලිංටන් වීථියට යමු. හවස පහයි හතළිස් පහ වෙනකොට ඔබ වෙලිංටන් වීථියේ අංක 90 දරන තැන බේකරිය ඉදිරිපිට රැඳී සිටිය යුතුයි. ඔබ රියෙන් බහින්නෙ නැතුව, ඒක ඇතුළටම වෙලා පාර දිහා බලාගෙන ඉන්න.

හරියට හවස හයට පාකර් එළියට බහිනවා. ඒ ඔහුගේ සුපුරුදු බීර පයින්ටුව බොන්න, රීගල් අවන්හලට යන්න. අපි හැංගිලා බලාගෙන ඉන්න ඕන, ඔහු ඒ සඳහා යනවාද කියල. ඔහු යාර පනහක් පමණ ඉදිරියට ගියාට පස්සේ, මම අශ්වකරත්තයට සංඥා කරන්නම්. එතකොට කාට්‍රයිට් මහත්මයා පාකර් දෙසවත් නොබලා හැකි ඉක්මනින් රීගල් අවන්හලට යා යුතුයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඊට පස්සෙ?"

"ඔබ බීර බෝතලයක් ඇණවුම් කරලා ඒක පානය කරමින් ඉන්න. පාකර් ඇවිත් ඔහුට සුපුරුදු මේසෙ තනිවම වාඩිවෙලා බොන්න පටන්ගනීවි. ඔබ කොහොම හරි ඔහු එක්ක මිත්‍රවෙන්න ඕන. හැකිනම් ඔහුට වැඩිපුර බීර හරි ෂැම්පේන් හරි අරගෙන දීලා කතාවට අල්ලගන්න. ඒ මගින් ඔහු ආපහු ගෙදර යන ගමන පමා කළ යුතුයි.

ඔහුගේ ගෙදරට හොරෙන් ඇතුළුවෙලා, ඔහුගේ රහස් ලියකියවිලි මොනවාහරි තියෙනවාද කියල පරීක්ෂා කරන්න, මට පැයක්වත් අවශ්‍යයි. ඔහු අනික් අය සමග කතාබහට යන, සතුටු සාමීචියට කැමැති කෙනෙක් නෙමෙයි. ඒ නිසා වැඩේ අසාර්ථක වුණොත්, අශ්වකරත්තයෙන් වහාම එන්න. කරත්තය දුටු වහාම දොර ළඟ මුරට ඉන්න වොට්සන් මට සංඥා කරාවි. එතකොට මම හැකි ඉක්මනින් ගෙදරින් පිටවෙන්නම්."

හෝම්ස් ඔහුගේ සැලැස්ම හෙළිකළේය.

"ඔබට විශ්වාසද මට හැකිවේවි කියල ඔහු සමග මිත්‍රවෙන්න?" කාට්රයිට් මහතා ඇසීය.

"ඔහු කථාවකට පටලවාගෙන, පැය භාගයක් ප්‍රමාද කරගන්න හැකිවුණොත් ඔබ හැබෑ දක්ෂයෙක්" හෝම්ස් කීය. "ඔබ අතිදක්ෂයෙක් නම්, පාකර්ට විස්කි වීදුරු දෙක තුනක් අරන්දීලා ඔහු පැය දෙකක් ප්‍රමාද කරන්න හැකිවේවි." හෝම්ස් කීවේ සිනාමුසු මුහුණෙනි.

* * *

එළියට් නම් කුලීරථ රියැදුරා ඔහුගේ අශ්වකරත්තයෙන් අපේ සහයට පැමිණියේය. පාකර් ගේ නිවසට ඇතුළු විය හැකි "හොර යතුර" මින්වෙල් ජොන්සන් ගෙනැවිත් දුන්නේ ඊට පැය භාගයකට පෙරය. වැහි වලාකුළු සහිත බවක් තිබූ නිසා අපි කල්තබා බේකර් වීථියෙන් පිටත්වී ගියෙමු.

ලන්ඩන් නගරයේ මංමාවත් වල පිහිටීම ගැන හෝම්ස් සතුවූයේ විශේෂඥ දැනුමකි. එදා වෙලිංටන් වීථියට ඇතුළුවූ පැත්තෙන් නොගොස්, අපි බ්‍රෙන්ට්ෆර්ඩ් ඇත්තේ කෙළවරෙන් එම වීථියට ඇතුළු වුණෙමු. හෝම්ස්ගේ නේවාසිකාගාරයට යාර 200 ක් තිබියදී

http://sherlockholmesinvestigations.blogspot.com

අපි කරත්තයෙන් බිමට බැස්සෙමු. කාට්රයිට් මහතා රියැදුරා සමග රථයේ රැඳී සිටියදී, අපි දෙදෙනා ඉක්මන් ගමනින් හෝම්ස්ගේ නවාතැන වෙත ගියෙමු. අපට ගිමන් හැරීමටවත් වේලාවක් නොලැබිණ.

"වෙලාව හයයි. දැන් කොයි මොහොතේ හරි පාකර් එළියට ඒවි. සූදානමින් ඉන්න වොට්සන්" හෝම්ස් කීය.

ඔහු කියූ අයුරින්ම ඒ මොහොතේ, පාකර් නිවසෙන් එළියට බැස්සේය. ඔහුගේ අතේ රෝල් කළ කුඩයක් ද විය. අහස දෙස බලා දොර යතුරු දැමූ ඔහු, ඉක්මන් ගමනින් මංසන්ධිය දෙසට ගමන් කළේය. ඔහුට යෑමට මිනිත්තු තුනක් කල් දී, හෝම්ස් පාරට පැමිණ අශ්වකරත්තයට සංඥා කළේය. ඔවුනු වේගයෙන් රීගල් අවන්හල දෙසට පිටත්වී ගියහ.

තවත් මොහොතක් හෝ පමා නොවී, අපි පාකර්ගේ ඉදිරි දොර වෙත ගියෙමු. ෆින්වෙල් ජොන්සන්ගේ මිතුරා සකස්කර දුන් යතුර තුලටම නිවැරදි විය. දොර ඇරුණු වහාම හෝම්ස් ඇතුළට පිවිසියේ, මා දොරටුව ළඟ රඳවමිනි.

"වොට්සන් හොඳ සෝදිසියෙන් ඉන්න. බැරි වෙලාවත් ඔහු ආපහු එනවෙලාවට මං එළියට ඇවිත් නැත්නම්, හයියෙන් දොරට ගහන්න. මං වහාම පිටවෙන්නම්."

හෝම්ස් ඒ නිවස තුළට ගිය පසු මගේ සිතේ ඇතිවූයේ දැඩි භීතියකි. මගේ මිත්‍රයාගේ අරමුණ කුමක් වුවත්, ඔහු යෙදෙන්නේ නීතිවිරෝධී ක්‍රියාවකයි. හදිසියට ඔහුට එළියට යා හැකි පිටිපස දොරක්වත් මේ නිවසට තිබේ දැයි අපි නොදනිමු. පාකර් ආපසු පැමිණීමට නියමිත හවස හයයි හතළිහටයි. ඔහු යම් හේතුවක් නිසා ඊට කලින් ආවොත්? මිනිත්තු හතළිහක් තිබුණත්, අවශ්‍ය දේ සොයා ගැනීමට හෝම්ස්ට ඒ කාලය ප්‍රමාණවත් වේද? පාකර්, රීගල් අවන්හලේ පමා කරගැනීමට, කාට්රයිට් මහතා සමත්වේද යන්න ගැන, මගේ හිතේ තිබුණේ සැකයකි.

සවස හයයි තිහ වනතුරුත් නිවස දෙසින් කිසිදු ශබ්දයක් නොනැගිණ. හදිසියකදී පාවිච්චි කිරීමට ගෙනා රිවෝල්වරය තවමත් මගේ සාක්කුවේය. එය අවශ්‍ය හෝම්ස්ට මිස මට නොවේ. මා බලාපොරොත්තුව සිටියේ ඔහුගේ ආරක්ෂාව සඳහා රිවෝල්වරය හෝම්ස්ට දීමටයි. නමුත් හදිසියේ එය ද අමතක විණි.

http://sherlockholmesinvestigations.blogspot.com

6.35 වෙද්දී හෝම්ස් ඉදිරි දොර විවෘත කරගෙන එළියට බැස්සේය. මම සැනසුම් සුසුමක් හෙළීමි.

"යමු යමු වොට්සන්" ඔහු කීය.

"මොකද වුණේ, වැඩේ සාර්ථකද?"

"ඒ ගැන හරියටම කියන්න අමාරුයි. යම් යම් තොරතුරු ටිකක් මට ලැබුණා. ඒක විශ්ලේෂණය කරල තමයි සාර්ථකත්වය තීරණය කරන්න පුළුවන්" ඔහු පිළිතුරු දුන්නේය.

එතැනින් ඉවත්වී අපි පාබ් ඉදිරියට ගියෙමු. හතට කාලක් තිබියදී කාට්රයිට් මහතා රැගත් අශ්වකරත්තය පැමිණියේය. අපි එයට නැගුණෙමු.

"මිනිහව වැඩිවෙලා රඳවාගන්න බැරිවුණා. අමතර මිනිත්තු දහයක්වත් හිටියද මන්දා" කාට්රයිට් මහතා තම කටයුත්තේ යෙදුණු අයුරු විස්තර කළේය. "ඔහු තමන්ගේ බීර ජෝගුව අරගෙන වාඩිවුණාට පස්සෙ, මමත් ගිහින් ඔහු ළඟ තිබුණු අසුනේ වාඩිවුණා."

"සමාවෙන්න බාධා කළාට" මං කිව්වා. "මහත්මයාගෙ මුහුණ මට දැකල පුරුදුයි. ඒ කොහේද්ද කියලයි මං කල්පනා කළේ...... කොහේද්ද.... ආ හරි මට මතක් වුණා..... මේ මහත්තය එනව නේද ක්‍රිස්ටිස් ආයතනයේ පෞරාණික බඩු වෙන්දේසි වලට?"

මුලින් පුදුමයට පත්වෙලා, ඊළඟට සැකයෙන් වගේ ඔහු මා දිහා බලාගෙන හිටියා. ඊළඟට බීර උගුරක් පානය කරලා මඳ වේලාවක් නිහඬව ඉඳලා මට පිළිතුරක් දුන්නා.

"මං ඉඳහිට ක්‍රිස්ටිලාගේ වෙන්දේසි වලට යනවා තමයි. ඔබත් පරණ දේ එකතු කරන කෙනෙක්ද?" ඔහු ඇසුවා

"ඔව් ඔව්" මං කිව්වා. "මං එකතු කරන්නේ රෝම පෞරාණික භාණ්ඩ විතරයි. ඒවායිනුත් ලෝකඩ හා තඹ පිළිම. ඔබ කැමති මොනවාටද?"

ඔහු මඳ වේලාවක් නිශ්ශබ්දව සිටියා. "එහෙම විශේෂයක් නැහැ" ඔහු කීවේ ජෝගුවේ බීර හමාර කරමින්.

"අපි තව බීර ටිකක් බොමු, මං ගණනේ" මං කිව්වා.

"එපා එපා!" ඔහු ඒක ප්‍රතික්ෂේප කළා.

"නෑ ඒකට කමක් නෑ." මං කීවා. "ඔබ වගේ පැරණි දේ එකතු කරන්නෙක් හමුවුණු එකත්, මොන තරම් සතුටක්ද. ඔබට කැමති

http://sherlockholmesinvestigations.blogspot.com

නම් බීර වෙනුවට ෂෙරි හෝ විස්කි බොමු. මොනවටද ඔබ කැමැති?"

"එහෙනම් බීර ටිකක් බොමු."

ඔහු කිව්වා. මිළඟට මං නොයෙක් දේ කිව්වත්, ඔහු නිශ්ශබ්දව අසා සිටියා මිසක් කිසිවක් කිව්වෙ නෑ. මං ඇහූ ප්‍රශ්න වලටත් යන්තම් මොනව හරි කෙඳිරිගෑව මිසක් හරි පිළිතුරක් දුන්නෙ නෑ.

"මං යන්න ඕන දූන්" හවස හයයි හතළිහ වෙද්දි පාකර් කිව්වා. "මං හැමදාම හයහමාර වෙද්දි මෙහෙන් පිටවෙනවා. අද ප්‍රමාදයි. මං යන්නම්."

"ඔහු මට අතට අතදී ආචාර කරල, අවන්හලෙන් පිටවුණේ, මගේ නම අහන්න වත් ප්‍රමාද නොවී. ඔහුට ටිකක් එන්න ඇරලා, මම අශ්ව කරත්තයකින් ඉක්මනට ආවා" රිචඩ් කාට්රයිට් මහතා කථාව අවසන් කළේය.

ඉන්පසු තමාගේ අත්දැකීම් හෝම්ස් කෙටියෙන් විස්තර කළේය. මේ වනවිට අපි බේකර් වීථියට ළඟාවී සිටියෙමු. අපි එතැනින් බැස්සෙමු. කාට්රයිට් මහතා දිගටම කුලීරියෙන් ගමන්කළේය.

"නොයෙල් පාකර් හෙවත් එරික්ගේ ගෙදරදී මට දකින්න ලැබුණු හැමදෙයක් ගැනම ඔබට විස්තර කරන්න, මං කාලය ගතකරන්නෙ නෑ වොට්සන්" හෝම්ස් කීවේ රාත්‍රී ආහාරයෙන් පසු ඔහුගේ සුපුරුදු අසුනේ හිඳගනිමිනි.

"ඒක කලාගාරයක් නැත්නම් කෞතුකාගාරයක් කිව්ව හැකි. ඒ තරමට පෞරාණික භාණ්ඩ වලින් පිරිලා. කිරිගරුඬ ලෝකයක්. රිදී, පලිඟු, ලෝකඩ, තඹ ආදී හැම දෙයකින්ම තැනූ ප්‍රතිමා එතැන තිබුණා. වැඩියෙන්ම තිබුණේ රෝම ඒවා වෙන්න ඇති. නමුත් මට ඒවා ගැන බලන්න වෙලාවක් තිබුණේ නැහැ. මං හෙව්වේ ඔහුගේ ගනුදෙනු සටහන් කළ පොත් හෝ ලිපිගොනු තියෙනවාද කියල.

අවසානයේ මං හෙව්ව දේ මට හම්බවුණා. මං ඒක ඉක්මනින් පිටපත් කරගත්තා. එකම සටහන දිනපොතක් වැනි කුඩා එකකත්, ලොකු ලෙජර් පොතක් වැනි එකකත්, සටහන්ව තිබුණා. මේ බලන්න"

හෝම්ස් මා අතට කොළයක් දුන්නේය. එහි සඳහන් වූයේ පහත සඳහන් විස්තරයයි.

http://sherlockholmesinvestigations.blogspot.com

| | | | |
|---|---|---|---|
| 1. | DRUHPUHS NHIJ<br>DYIR NITSEU | 833 | UNI |
| 2. | USEI HUTOHW LUGON<br>TS NITGNOSNUK | 231 | UNI |
| 3. | HTRIWGNOLLO YRYBRYB<br>DYIR LUWMIRC | 88 | UNI |
| 4. | RUTXYB RUTUP DRIL<br>UENUVA KRYP | 7 | IWT |
| 5. | RUMLYP NYLY<br>UNYL SGGORT<br>HCOWRIN | 22 | UNI |
| 6. | DIIWLOH REHTRY ROS<br>UNYL ARUCNYHC<br>ANYBLY | 52 | UNI |
| 7. | AULTNUB YORYM YNNY<br>URYEQS UVYRGLUB | 79 | IWT |

"දෙයියෝ සාක්කි හෝම්ස්! මේ මොකක්ද මේ? මොකක් හරි වෙනත් භාෂාවකින් ලියූ දෙයක් නේද? ඔබ කිව්වා නේද ඔහුට පෝලන්ත මිශ්‍රණයක් ඇති කියලා. එහෙනම් මේකත් යුරෝපීය භාෂාවක්ද දන්නෙ නෑ?" මම කීවෙමි.

"කොහොමටවත් නෑ වොට්සන්" මගේ මිතුරා කීය. "වෙනත් යුරෝපීය භාෂාවකින් ලියුවත්, ඕකෙ ඉංග්‍රීසියට යම්තාක් දුරට සමානකමක් තිබිය යුතුයි. නමුත් මෙතැන යොදාගෙන තිබෙන්නේ රහස් සූත්‍රයක්. අපට කරන්න තියෙන්නේ ඒකෙ යතුර සොයා ගැනීමයි. ටිකක් මහන්සි ගත්තොත් ඒක බැරිවෙන්නෙ නෑ. මේ ලිවීම ගැන මං තවත් වැදගත් දෙයක් නිරීක්ෂණය කළා."

"ඒ මොකක්ද?"

Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

"කුඩා පොතේ මේ දේවල් ලියල තිබුණෙ පැන්සලෙන්, තරමක් නොසැලකිලිමත් අකුරෙන්. නමුත් ලොකු පොතේ මේව ලියල තිබුණේ, තීන්තෙන් ඉතා පැහැදිලිව පිළිවෙළකට."

"ඒකෙන් මොකක්ද හෝම්ස් ඔබට ගතහැකිවුණු නිගමනය?"

"ඇයි මිත්‍රයා ඒකට හේතුව හිතාගන්න ඔය තරම් අමාරු ද? කුඩා පොතේ පැන්සලෙන් ලියුවේ මොකද? ඒකෙ ලියල තියෙන්නෙ තීන්ත පෑන් නොමැති තැනකදී. ඒ ඔහුට උල්පත් පෑනක් නොමැති නම්. ඒකෙ අකුරුත් කලබලේට ලියූ ඒවා. මොකක්ද ඒකට හේතුව? ඒවා පිට තැනකදී බොහොම වේගයෙන් පිටපත් කර ගනිපුවා. ඊළඟට ඔහු ගෙදර ඇවිත්, ලොකු පොතේ තීන්තෙන් එය සටහන් කරගත්තේ විවේකීව. ඒකයි අකුරු පැහැදිලි."

"ඒ කාරණය අපට වැදගත් වෙන්නෙ කොහොමද?"

"ඔහු හැමදෙයක්ම පොත්වල ක්‍රමානුකූලව සටහන් කරල තිබුණා. එදිනෙදා කෑම බීමට වියදම්, ඔහු මිලට ගත් පෞරාණික බඩු සඳහා වියදම් වුණු මුදල්, වෙනෙකක් තබා රීගල් අවන්හලට බීර සඳහා මුදල් ගෙවූ හැටි පවා ලියා තිබුණා. ඔක්කොම පැහැදිලි ඉංග්‍රීසියෙන්. නමුත් මේ දෙය ඇයි රහස් පිළිවෙළකට? පැහැදිලිවම මේක අනෙක් හැම එකකටම වඩා රහසිගත දෙයක්. බැරිවෙලා හෝ කවුරු හරි ඔහු ලියා ඇති දේ කියෙව්වොත්, ඔහු අමාරුවේ නොවැටෙන්නයි මෙහෙම ලියා තියෙන්නේ. මට හොඳටම විශ්වාසයි මේ විදියට රහස් ක්‍රමයකට ලිවීම අර තොම්සන් තරුණයාගේ වැඩක්. ඔහු ඉතා බුද්ධිමත් අක්ෂයෙක් බව, සර් ආතර් අපට කිව්වනේ. බෙන් තොම්සන් තොරතුරු ගෙනැත් දෙනවා ඇත්තේ, මේ ආකාරයට සූත්‍ර ගත කරලා. පාකර් ඒකෙ සූත්‍රය ලිහාගන්නව ඇත්තෙ ගෙදර-ඇවිත්."

කඩදාසියක් හා පැන්සලක් අතටගත් මගේ මිත්‍රයා ප්‍රහේලිකාව විසඳීමට පටන්ගත්තේය. තවදුරටත් ඔහුට බාධා නොකොට මම නින්දට ගියෙමි.

* * *

පසුදා උදෑසන මා අවදිවෙද්දී ෂර්ලොක් හෝම්ස් බැහැර යාමට සූදානම් වී තේ පානය කරමින් සිටියේය. ඔහුගේ තිබුණේ තෘප්තිමත් පෙනුමකි.

http://sherlockholmesinvestigations.blogspot.com

"අර ලියවිල්ලේ අභිරහස ඊයේ රෑම විසඳුවද" මම ඇසීමි.

"ඒක බොහොම පහසුවෙන් ලිහිය හැකි, සරල සූත්‍රයක් වොට්සන්. ඒකට මට පැය භාගයක් වත් ගතවුණේ නෑ. කුඩා ළමයි සෙල්ලමට යොදාගන්නා තාලේ එකක්" හෝම්ස් කීවේ, කෝප්පයට වත්කළ කෝපි වලට කිරි මිශ්‍ර කරමිනි.

"ඔහු ඒ ලියල තිබුණේ මොනවද දන්නවද වොට්සන්? ඒ ඔහු විසින් රහස් හෙළිකරන බවට තර්ජනය කරලා, කප්පම් මුදල් ලබාගත් පුද්ගලයින්ගේ නම්, ලිපින සහ මුදල් ප්‍රමාණ. මට අවශ්‍යම කරන දේත් එතැන තිබුණා. ඒ තමයි ඔහුගේ මීළඟ ගොදුරේ නම සහ ලිපිනය. ඒ ගැන සොයා බලන්න වහාම පිටත්වෙන්නයි මං හදන්නෙ. මට දවල් කෑමට එන්න ලැබේවිද, පාරට වෙලා ඉන්න වේවිද කියන්න බැහැ. ඒ නිසා මං හඩ්සන් මහත්මියට කිව්වා මට ගෙනියන්න හැම් සැන්ඩ්විච් එකක් සූදානම කරන්න කියලා."

"අර ලියවිල්ලෙ තිබූ දේ මට විස්තර කරන්න ගියොත් ඔබට පමාවේවිද?" මම ඇසීමි.

"ඇත්තෙන්ම ඔව් මිත්‍රයා." ඔහු කීය. "අපි කටයුතු කරන්නේ බොහොම භයානක පුද්ගලයෙකු සමඟ. ඔහු මේ සැරේ යෙදෙන්නේ, ජීවිත කීයක් අනතුරේ වැටෙන කටයුත්තකද කියලා මට තවමත් කියන්න බැහැ. වොට්සන් ඔබේ මනසට ව්‍යායාමයක් ලෙස, සූත්‍රයකින් ලියා ඇති ඒ නම් හා ලිපින ලැයිස්තුව තේරුම් කරන්න පුළුවන්ද බලන්න." කී ඔහු එවේලේම පිටත්වී ගියේය.

හෝම්ස්ගේ උදව්වක් නොමැතිව පාකර්ගේ රහස් ලියවිල්ල තනිව විසඳීමට මම තීරණය කළෙමි. මම එය මගේ වෛද්‍ය චිකිත්සාගාරය වෙත රැගෙන ගියෙමි. රෝගීන් නොමැති වෙලාවලට මම ඊට අවධානය යොමු කළෙමි.

දස අතේ කල්පනා කරමින් පැය කිහිපයක් උත්සාහ කළත්, මට එය විසඳාගැනීමට නොහැකි විය. හෝම්ස් කෙසේ කීවත්, මෙය ඉංග්‍රීසි නොවන විදේශීය භාෂාවක් පරිහරණය කළ, සංකීර්ණ රහස් ලියවිලි ක්‍රමයක් විය යුතුය. පැය තුනක් තිස්සේ මොළයට වධදී, බැරිම තැන එය විසඳීමේ උත්සාහය අත්හැර දැමුවෙමි.

සවස් වෙද්දී මා අපේ නිවහන වෙත ගොස් වැඩිවේලා යාමට පෙර, හෝම්ස් ද එහි පැමිණියේය. ඔහු බොහෝ විඩාපත්ව සිටී බැව් බැලූ බැල්මට පෙනිණ.

http://sherlockholmesinvestigations.blogspot.com

"උදය වරුවේ ඉඳන් දිගටම මහන්සි වෙන්න සිදුවුණා වොට්සන්" ඔහු කිවේ හඩ්සන් මහත්මිය ගෙන ආ තේ කෝප්පය පානය කරමිනි. "ඒ වුණත් අපි පියවරෙන් පියවර ඉදිරියට යනවා. ඒ ගැන මං හෙමින් සැරේ ඔබට කියන්නම්. ඊට කලින් මට කියන්න. පාකර්ගෙ රහස් ලියවිල්ල කියවාගන්න ඔබට හැකිවුණාද?"

"මං පැය ගණනක් තිස්සේ සෑහෙන උත්සාහයක් දැරුවා" මම කීවෙමි. "නමුත් ඒක සාර්ථක වුණේ නැහැ. මට ඒකෙ අගක් මුලක් හොයාගන්න බැරිවුණා."

"ඔව්. මට හිතුණා ඔබට ටිකක් අමාරුවේවි. කියලා" හෝම්ස් කීය. "මං ඒක විසඳූ කඩදාසිය අර මේසෙ උඩ ඇති. ඒක මගේ අතට ගෙනැත් දෙන්න. හරි.

රහසිගත ක්‍රමයකට මේ ලියලා තියෙන්නේ නම් සහ ලිපින සිහිපයක් බව මං මුලින්ම අනුමාන කළා. ඒවායේ අකුරු මාරු කරමින්, උඩ සිට පහළට අග සිට මුලට ආදී ක්‍රමවලින් මං ලියා බැලුවා. නමුත් එක්වරටම පැහැදිලි යමක් දකින්න ලැබුණෙ නැහැ. නමුත් 6 ඉලක්කමෙන් දක්වා ඇති වගන්තිය, අග සිට මුලට ලියුවාම මෙහෙම දෙයක් දකින්න ලැබුණා. මේ බලන්න.

SOR YRTHER HOLWIID INU

මේක කියෙව්වාම ඔබට අපේ ගැටලුවට සම්බන්ධ කෙනෙක් සිහිවෙන්නෙ නැද්ද?"

"මට එහෙම දෙයක් හිතාගන්න අමාරුයි."

"හොඳයි වොට්සන්. දැන් මම ඒ වගන්තිය යටින් අදාළ පුද්ගලයාගේ නම ලියන්නම් මේ බලන්න."

SOR YRTHER HOLWIID
SIR ARTHUR HILWOOD

"ඔව් ඔව්!" මට කෑගැසිණ. "බොහොම දුරට මේ සර් ආතර් හිල්වුඩ්"

"දැන් ඊට යටින් තියන වගන්තිය අග සිට මුලට ලියමු."

25 CHYNCURA LYNU
YLBYNA

මේ මොකක් කියලද ඔබට හිතෙන්නෙ?"

"25 CHANCERY LANE
ALBANY කියන එක නේද?"

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

"විශිෂ්ටයි වොට්සන්. ඔබ නිවැරදියි. මෙතැනදී හරි වචනය සාදා ගන්න අප කළ යුත්තේ Y,U,A,Y,U,/Y,Y,A යන අකුරු වෙනුවට පිළිවෙළින් AEYAE/AAY ආදේශ කිරීම පමණයි. එහෙම නේද? දැන් ඉතින් වැඩේ බොහොම පහසුයි. කුඩා ළමයෙකුට වුණත් විසඳන්න පුළුවනි. ඉංග්‍රීසි භාෂාවේ ස්වර අකුරු පහ සහ Y අකුර වෙනුවට, එම අකුරු අගසිට මුලට පිළිවෙලට වෙනස් කිරීම තමා කරල තියෙන්නේ."

| | A | E | I | O | U | Y | |
|---|---|---|---|---|---|---|---|
| වෙනුවට | Y | U | O | I | E | A | ආදේශ |

කරලා. ඒක තමයි රහස් සූත්‍රය. දැන් ඔබට පැහැදිලිද වොට්සන්?"

"ඔව්."

"හොඳයි දැන් අපි බලමු අංක 5ට දක්වා ඇති නම අග සිට මුලට ලියලා.

YLYN PYLMUR

මේකෙ Y,Y YU වෙනුවට

A,A AE යෙදුවොත් මොකක්ද අපට ලැබෙන්නේ?" හෝම්ස් ඇසීය.

" ALAN PALMER- ඇලන් පාමර් කියන නම ලැබෙනවා. ඔහු තමයි එරික් මීට කලින් ගොදුරු කරගත්තේ.

"ඔව්. බොහොම සිත් ඇදගන්නාසුලු සොයාගැනීමක්" මම කීවෙමි.

"දැන් මේක කියවල බලන්න" ඔහු මේස ලාච්චුවෙන් ගත් කඩදාසියක් මා අතට දුන්නේය. "මේ තමයි නොයෙල් පාකර් හෙවත් එරික්ගේ ගොදුරු බවට පත්වුණු අවාසනාවන්තයින්ගේ නාම ලේඛනය."

1) JOHN SHEPHERD
338 EUSTON ROAD — ONE

2) NIGEL WHITEHOUSE
132 KENSINGTON ST — ONE

3) BARBARA ILLINGWORTH
88 CROMWELL ROAD — ONE

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only.. Not For Print.

4) LORD PETER BAXTER
7 PARK AVENUE — TWO

5) ALAN PALMER
22 TRIGGS LANE — ONE
NORWICH

6) SIR ARTHUR HILWOOD
25 CHANCERY LANE — ONE
ALBANY

7) ANNA MARIA BENTLEY — TWO
97 BELGRAVE SQUARE

1) ජෝන් ෂෙපඩ්
338 යූස්ටන් පාර — එකයි

2) නයිජල් වයිට්හවුස්
132 කෙන්සිංටන් වීථිය — එකයි

3) බාබරා ඉලිංවර්ත්
88 ක්‍රොම්වෙල් පාර — එකයි

4) පීටර් බැක්ස්ටර් සාමි
7 උද්‍යාන මාවත — දෙකයි

5) ඇලන් පාමර්
22 ට්‍රිග්ස් පටුමග — එකයි
නොරිච්

6) සර් ආතර් හිල්වුඩ්
25 චාන්සරි පටුමග — එකයි
ඇල්බනි

Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

7) ඇනා මාරියා බෙන්ට්ලි
97 බෙල්ග්‍රේව් චතුරශ්‍රය දෙකයි.

"මොකක්ද හෝම්ස් මේ ඔවුන්ගේ නම් ඉදිරියෙන් එකයි නැත්නම් දෙකයි කියල සඳහන් කරල තියෙන්නේ?"

"ඒ තමයි ඔහු කොල්ල කාගත් මුදල් ප්‍රමාණ. එකයි කියන්නේ පවුම් එක්දාහයි. දෙකයි කියන්නේ දෙදාහ බව අපට හිතාගන්න පුළුවනි. මට අවශ්‍යම දේත් එතැන තිබුණා වොට්සන්. ඒ තමයි ඔහුගේ මීළඟ ගොදුරේ නම සහ ලිපිනය."

"හරියට හරි. ඔබ කිව්ව නේ ඔහු ඊයේ, බෙල්ග්‍රේව් චතුරශ්‍රයේ ගැවසුණා කියල. මේ තියෙන්නේ ඇගේ නම - ඇනා මාරියා බෙන්ට්ලි........"

"ඔව්. පාකර් ඊයේ .බෙල්ග්‍රේව් චතුරශ්‍රයට වෙලා කුරුමානම් ඇල්ලුවේ මේ කාන්තාව හමුවෙන්න. අද ඔහු ඒක සාර්ථක ලෙස ඉටුකරගත්තා."

"මොනවා? ඔබ බලාගෙන ඉඳිද්දීම?" මම පුදුමයෙන් ඇසීමි.

"ඔව්. ඒ ගනුදෙනුවේ සෑහෙන කොටසක් කෙරුණේ මගේ දෑස් ඉදිරිපිටදී කිව්ව හැකි" හෝම්ස් කීය. "නමුත් මට ඒක වළක්වන්න හැකියාවක් තිබුණේ නෑ."

"ඒ ඇයි?"

"මං ඔබට කියන්නම්. රහස් ලියවිල්ලේ අන්තිම නම, ඇනා මාරියා බෙන්ට්ලි කියල දැනගත්තාම, දින දහයකට පමණ කලින් "මෝනිං ක්‍රොනිකල්" පුවත්පතේ පළවූ පුවතක් මට සිහිවුණා. ඔබ දන්නවද වොට්සන්, බෙන්ට්ලි මුහන්ධිය කියන්නේ කවුද කියලා?"

"බයිසිකල් රජා හැටියට හැඳින්වුණු ගෝඩන් බෙන්ට්ලිගේ කවුරුවත්ද?"

"අන්න හරි. කෝටිපතියෙක්ව සිට මියගිය ගෝඩන් බෙන්ට්ලිගේ වැන්දඹු බිරිඳ - පුවත්පතේ පළවුණා බෙන්ට්ලි මැතිණියගේ වැඩිමහල් දියණිය, කෙන්ට්හි ආදිපාදවරයාගේ කනිටු පුත්‍රයා සමග ළඟදීම විවාහ වෙන බව. ඒ උත්සවය රාජකීය මට්ටමෙන් පැවැත්වෙන බවට සැකයක් නෑ. ඒ මොකද මනාලයා රජපවුලේ ළඟම ඥාතියෙක් නිසා.

පාකර් ඔතැනට කුරුමාණම් ඇල්ලුවේ ඇයි කියන එක මට එක්වරම වැටහුණා. මොකක් හරි හේතුවක් කියලා, තර්ජනය

http://sherlockholmesinvestigations.blogspot.com

කරලා, ඔහු කප්පමක් ගන්න සූදානම් වෙන බව මං අනුමාන කළා. මං තීරණය කළා බෙන්ට්ලි මැතිණිය පෞද්ගලිකවම හමුවෙලා වහාම දැනුම්දෙන්න. ඊට පස්සේ ඔහු කප්පම් මුදල අතට ගන්නකොටම පොලිසියෙන් කඩාපැනලා ඔහුව සිරභාරයට ගැනීම සැලසුම් කරන්න. උදේ 9 වෙද්දී මං ගියා බෙල්ග්‍රේව් චතුරශ්‍රයේ අංක 97 හොයාගෙන."

"ඉතින්?"

"ප්‍රධාන ගෘහ සේවකයා මුව ඇවිත් කිව්වා, අද බෙන්ට්ලි මැතිණිය හමුවෙන්න විදියක් නැහැ; ඇය හදිසි ව්‍යාපාරික සාකච්ඡාවක කියලා.

මං ඔහුට දැනුම් දුන්නා; ගිහින් කියන්න මේක ඉතාම වැදගත් හදිසි කාරණාවක්. කොහොමට වත් හෙට වෙනතුරු කල්දමන්න හැටියක් නැති බව.

ඔහු ඇයට ඒ බව දැන්නුවාම ඇය කියලා තිබුණේ මේ වෙලාවේ අත්‍යවශ්‍ය රාජකාරියක යෙදිලා ඉන්න නිසා, කොහොමටවත් මාව හමුවෙන්න බැහැ. ඇය හමුවෙන්න උවමනා නම් අද හවස දෙකට එන්න, කියල ඇය වෙලාවක් දීලා තිබුණා.

මට වෙන විකල්පයක් තිබුණේ නැහැ. ආපහු බේකර් වීදියට එන්න හිතලත්, මං හිතුවා ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගිහිං' ලෙස්ට්‍රේඩ් හමුවෙන්න. ඒ මගින් අපේ උදව්වට සිවිල් ඇඳුමෙන් සැරසුණු පොලිස්භටයන් කිහිපදෙනෙක් සූදානම් කරගන්න. මගේ ඒ වැඩ දහය වෙනකොට ඉවරවුණා. මට හිතුණා යළිත් වරක් බෙන්ට්ලි නිවසට ගිහිං බලන්න.

බෙල්ග්‍රේව් චතුරශ්‍රයේ උතුරු පැත්තේ ඉඳලා මං දකුණට ඇවිදගෙන ආවා. එක්වරම ඈතට දකින්න ලැබුණු දර්ශනයෙන් මං ගල්ගැහුණා. මට දකින්න ලැබුණු දේ ඔබට අනුමාන කරන්න පුළුවන්ද? අර මන්දිරයේ දොරටුවෙන් එළියට ආවේ කවුද? නොයෙල් පාකර් හෙවත් එරික්! සහ රාමුව සහිත උපැස් යුගළ දමාගෙන, මැදින් බෙදූ කළුපාට හිසකෙස්, කොළපාට වැහිකබාය, බොරු උඩුරැවුල - මේ හැම එකක්ම තිබුණා. ඔහු සමග සිටියා කාන්තාවක්. වයස අවුරුදු හැටක් පමණ වූ වංශවත් පෙනුම සහිත කාන්තාවක්. ඇගේ ඡායාරූපය මං කලකට පෙර දැකල තිබුණා. ඒ නැතිවුණත් මේ බෙන්ට්ලි මැතිණිය විය යුතුයි යන්න හිතාගැනීම මට අපහසු වුණේ නැහැ.

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු සමග මේ ඇය යන්නේ බැංකුවකට විය හැකියි. වහාම ඔවුන්ගේ ගමන නැවැත්විය යුතුයි. පාරේ ගමන්කළ අශ්වකරත්ත, මහ සෙනග අතරින් රිංගලා මං ඉදිරියට දිව්වා. ඔවුන් ගමන්කළේ ග්‍රොව්නර් වටරවුම දිහාවට. මං ඇය අමතා කෑගැසුවා. නමුත් පාරේ ඝෝෂාව නිසා ඇයට ඒක ඇහුණේ නැහැ. පාරේ ගමන්කළ කුලීරියක් නවත්වලා, පාකර් ඇයව ඒකට නග්ගවාගත්තා. ඔවුන් ලුහුබැඳයෑමට, තවත් කුලීරියක් නවත්වාගන්න මං දැඩි උත්සාහයක යෙදුණා. නමුත් ඒක සාර්ථක වුණේ නැහැ. මට රියක් ලැබෙන කොට තවත් මිනිත්තු පහක් පමණ ගතවෙලා. ඒ වෙනකොට ඔවුන් අශ්වකරත්ත තදබදයෙන් ඉවත්වෙලා, බ්‍රොම්ටන් පාර හරහා ත්‍රෙඩ්නීඩල් වීථියට ගිහිං අවසන් ඇති. මේ වාරයෙත් මං පාකර්ට පරාජයවුණා."

"ඔය තරම් වාහන තියෙන බෙන්ට්ලි ලඟ පෞද්ගලික වාහනයක නොගිහිං, ඇයව කුලීරියක එක්ක යන්න පාකර් තීරණය කළේ මොකද දන්නෙ නැහැ?" මම ඇසීමි.

"සට කපට හොරු, ඔවුන්ගේ ක්‍රම සහ විධි, නිතර නිතර වෙනස් කරනවා වොට්සන්. ඇයට අයත් පෞද්ගලික රියක යෑම අවදානම් කියල, ඔහුගේ හිතට සැකයක් එන්න ඇති."

"ඉතින් ඔබ බැංකුවට ගියේ නැද්ද?"

"ගියාට වැඩක් නෑ වොට්සන්" හෝම්ස් කීය. "මං ගියා නම් ඒ වෙනකොට පාකර් ඔහුගේ ගනුදෙනුව අරගෙන, එතැනින් අතුරුදන්වෙලා ඇති. මං තීරණය කළා ඇගේ නිවසට යන්න."

"ඉතින්"

"උදේ එකොළහවෙද්දි ඇය ආපහු ගෙදර ආවා."

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. ඔබ ඉතාම වැදගත් කාරණයකට උදේ ආ බව මගේ සේවකයා කිව්වා. නමුත් ඔබ හමුවෙන්න මට අවස්ථාවක් තිබුණේ නැහැ" ඇය කිව්වා.

වයස අවුරුදු හැටක් වුණත් තවමත් ඇය සුන්දර කාන්තාවක්. කෝටිපතිනියක් වුවත් ඇගේ තිබුණේ හරිම නිරහංකාර බවක්.

"වාඩිවෙන්න මහත්මයා. ඔබේ මිත්‍ර දොස්තර වොට්සන් ලියන ලිපි වලින් ඔබේ හපන්කම් ගැන මං කියවලා තියෙනවා. මොකක්ද ඔබට මගෙන් කෙරෙන්න ඕනෑ උපකාරය?"

http://sherlockholmesinvestigations.blogspot.com

තැනින් තැන පැසී තිබුණත්, ඇයට තිබුණේ රන්වන් කෙස්කළඹක්. දෑත්වල රන් ආභරණ. බෙල්ලේ අලංකාර මුතුමාලයක්. එහෙත් ඇගේ මුහුණේ මා දුටුවේ සුදුමැලි බවක්.

"බෙන්ට්ලි මහත්මිය. ඔබ දන්නා අයුරින් මම උපදේශක රහස්පරීක්ෂකයෙක්" මං කිව්වා. "මට මේ දිනවල භාරවෙලා තියෙනවා, ධනවතුන්ගෙන් කප්පම් ගන්නා, කප්පම්කාරයෙකු ගැන හොයන්න. ධනවතුන්ගේ පෞද්ගලික ජීවිතයේ යම් විෂමාචාරයක් හෝ වෙනත් පෞද්ගලික කරුණක් හෙළි කරන බවට තර්ජනය කරලා, ඔහු කප්පම් ඉල්ලනවා. මෑත කාලයේ ඔහු හය දෙනෙකුගෙන් මේ විධියට මුදල් අරගෙන තියෙනවා."

ඇය කිසිවක් නොකියා, බියෙන් භ්‍රාන්ත වී මෙන් මා දෙස බලාසිටියා.

"මං අද උදේ ආවේ ඔහුගෙන් ඔබව බේරාගන්නයි" මං කිව්වා. "නමුත් මං ප්‍රමාද වැඩියි. ඔහුගේ හත්වැනි ගොදුර වුණේ ඔබ......."

තොලකට වියැළී මෙන් මා දෙස බලාසිටි ඇය, මිනිත්තුවක් දෙකක් ඉඳලා, ගොතගගමින් යමක් කියන්න පටන්ගත්තා.

"මහත්මයා! මොනවද ඔබ ඔය කියන කතා? මට අද උදේ ඔබ හමුවෙන්න බැරිවුණා තමයි. ඒ මගේ ව්‍යාපාර කටයුත්තක් නිසා."

"ඔබ කරුණු සැඟවීමට දරන උත්සාහයෙන් වැඩක් නෑ බෙන්ට්ලි මහත්මිය. මේ අපරාධකාරයා මීට කලින් ජීවිත ගණනාවක්ම අන්ධකාරයට ඇද දමල තියෙනවා. ඔහු දිගින් දිගටම මේ විධියට අපරාධ කරන්නෙ කොහොමද? ඒ ඔහුට විරුද්ධව පැමිණිලි කරන්න, සාක්ෂි දෙන්න කිසි කෙනෙක් ඉදිරිපත් නොවෙන නිසා. ඔබ කියන්නේ නැත්නම් මං කියන්නම් කථාව. මගේ කථාවේ වැරැද්දක් තියෙනවා නම් හරි ගස්සන්න.

මේ තක්කඩියා මීට කලින් තමාව හඳුන්වා දීල තියෙන්නේ එරික් යන නමින්. නමුත් ඒක බොරු නමක්. ඔහුගේ හිසකෙස් කළුපාටයි. මැදින් බෙදලා. ඔහු කොළ පැහැති වැහි කබායක් ඇඳගෙන, ඝන රාමුව සහිත උපැස් යුගළක් පැළඳලා.

අද උදේ දහයයි මිනිත්තු දහයට, ඔබ ඔහු සමඟ කුලීරියක නැගිලා මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවට ගියා. යම්කිසි දෙයක් හෙළිනොකරන පොරොන්දුව පිට, ඔහු ඔබෙන් මුදල් ඉල්ලුවා. ඉල්ලුවේ පවුමේ නෝට්ටු වලින්. ඉල්ලූ ගණන කීයද? පවුම් දාහයිද දෙදාහයිද?"

http://sherlockholmesinvestigations.blogspot.com

දෑස් විශාල කරගෙන ඇය මා දිහා මිනිත්තු කිහිපයක් ඇසිපිය නොහෙළා බලාගෙන හිටියා. ඊළඟට ඇය බිම බලාගත්තා. දෑස්වලින් කඳුළු කැට කඩා හැළුණා.

"පවුම් දෙදාහයි." අන්තිමේදී ඇය කිව්වේ බලාපොරොත්තු කඩවුණු හඬින්. ඇගේ මුහුණේ තිබුණේ අසරණ බැගෑපත් බැල්මක්. "හෝම්ස් මහත්මයා. ඔබට මං තවත් බොරු කියන්නේ නැහැ. ඔබ මේ හැමදෙයක්ම දන්න බවයි පෙනෙන්නේ. මගේ දුවගේ විවාහ මංගල්‍යයට තව තියෙන්නේ සතියකටත් අඩු කාලයක් මහත්මයා. මං වෙන මොනවා කරන්නද?"

සේවිකාවක් අප සිටි තැනට තේ අරගෙන ආවා, කුඩා කරත්තයක. ඇය පිටවී යනතුරු ඉඳලා බෙන්ට්ලි මහත්මිය යළිත් කථාව පටන්ගත්තා.

"හෝම්ස් මහත්මයා. මං ඔබට හැමදෙයක්ම කියන්නම්. නමුත් මේක රහසක් හැටියට තබාගන්න කියලා, මං ඔබට ආයාචනය කරනවා.

ඔබ දන්නවා ඇති මං ප්‍රංශ ජාතික කාන්තාවක් බව. මේ ලෝකයේ ස්වභාවය ගැන කිසිවක් නොතේරෙන විසි අවුරුදු වයසේදී මං මගේ දෙමව්පියන්ට අකීකරු වුණා. පැරිස් නුවර සිටි චිත්‍ර ශිල්පියෙකුට රැවටිලා, මං ඔහු සමඟ විවාහ වුණේ, මගේ දෙමව්පියන්ගේ බලවත් විරෝධතා මැද. ඔහු මත්පැනට ඇබ්බැහි වුණු කෙනෙක් බව මට දැනගන්න ලැබුණේ පසුව. විවාහයෙන් අවුරුද්දක් ගතවෙද්දී ඔහු මාව අත්හැරදැම්මා. ඊළඟට වනගත දර්ශන සිතුවම් කරන්න කියලා දඩුණු ඇමරිකාවට ගියා. මං බිළිඳු පුතෙකුගේ අම්මා කෙනෙකු බවට පත්වුණත්, ඔහු අප ගැන හොයා බැලුවේවත්, මුදලක් ඉතිර කර තිබුණේවත් නැහැ. අවුරුද්දකට පමණ පසු ඔහු ගැන ආරංචියක් ආවා: ඒ ප්‍රංශ ගයනාවේදී ඔහු ස්වදේශික වනචාරීන් අතින් මැරුම් කෑවා කියලයි.

ඔය අතරේ තමා මට ගෝඩන් බෙන්ට්ලි මහත්මයා හමුවුණේ. ප්‍රංශයේ සංචාරයක් සඳහා පැමිණි ඔහු ධනවතෙක් වුණත්, දෙවියෙක් වගේ හොඳ ගතිගුණ තිබුණු කෙනෙක්. මගේ පුතා හදාවඩා ගැනීමට මගේ දෙමව්පියන්ට භාරදීලා මං එංගලන්තයට ආවා. බෙන්ට්ලි මහත්මයා සමග මෙහේදී විවාහවෙද්දී ප්‍රසිද්ධවුණේ, මං ප්‍රංශයේ වංශවත් ධනවත් පවුලක කෙනෙක් කියලයි. නමුත් ඇත්තෙන්ම මම දුප්පත් පවුලක කෙනෙක්.

http://sherlockholmesinvestigations.blogspot.com

එංගලන්තයට ආවාම මගේ රහස එතැනින්ම වැළලී ගියා කියලයි මං හිතුවේ. මං බෙන්ට්ලි මහත්මයා සමග සාර්ථක පවුල් ජීවිතයක් ගතකළා. බෙන්ට්ලි ස්පෝට්ස් සයිකල් නමින් ඔහු නිර්මාණය කළ බයිසිකලය, ලොවපුරා ජනප්‍රිය වීමෙන් ඔහු කෝටිපතියෙක් වුණා.

මගේ මුල් විවාහයේ පුතාට ජීවත්වෙන්න, මං කිසි අඩුපාඩුවක් නොකර නිතිපතා මුදල් යැව්වා. නමුත් ඔහුත් තමන්ගේ පියා මෙන් වැරැදි මග ගියා. ඔහු පැරිස් නුවර බේබද්දූ මැරවරයෙක් වී ඇති බව මට දැනගන්න ලැබුණා. වරින්වර ඔහු එංගලන්තයට ඇවිත් මට තර්ජනය කර මුදල් අරගෙන ගියා. මේ රහස එංගලන්තයේ කාට හරි දැනගන්න ලැබිල තියෙනවා.

මේ එරික් කියන නැනැත්තා මං කවදාවත් දැකපු කෙනෙක් නෙමෙයි. ඔහු මගේ ගෙදරට ආවේත් සේවකයන් රවටලා. ඇවිත් මට කිව්වා, පවුම් දෙදහසක් වහාම නොගෙව්වොත්, රහස් හෙළිකර මගේ දුවගේ විවාහය කඩා බිඳ දමන බව. මේ වෙලාවෙ අවුලක් ඇති කරගන්න තිබුණු භය නිසා මං ඒක ගෙව්වා."

"බෙන්ට්ලි මහත්මිය. මං ඔහුව අල්ලාගෙන උසාවි ගෙනිච්චොත් ඔහුට විරුද්ධව සාක්කි දෙන්න ඔබ සූදානම්ද?" මං ඇහුවා.

"ඒක මට කොහොමටවත් කරන්න බැහැ හෝම්ස් මහත්මයා. මගේ දරුවන්ට සමාජයෙන් නැගෙන අපවාද වලට මුහුණ දෙන්න වුණොත්?"

"ඔන්න ඕකයි වොට්සන් කථාව. නොයෙල් පාකර්ට විරුද්ධව සාක්ෂි දෙන්න කිසිකෙනෙක් ඉදිරිපත් වෙන එකක් නැහැ. ඔහු නව අවුරුදු විසිපහක් එක දිගටම මේ අපරාධය කළත්, ඔහු උසාවි ගෙනියන වැඩේ නම් බොහොම අමාරු වේවි."

"මොකක්ද දැන් ඔබ මේකට කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"ලිහාගන්න බැරි ගැටේ ලිහන එක, තුලෙ අනෙක් කෙළවරෙන් පටන්ගමු."

"ඒ කියන්නෙ?"

"අපි බලමු, මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවේ බෙන් තොම්සන්ගේ පැත්තෙන් අපට හෝටක් අල්ලගන්න හැකිවේවිද කියල. වොට්සන්. හෙට සිට ඔබේ චිකිත්සාගාරයේ රෝගීන්ට ප්‍රතිකාර

http://sherlockholmesinvestigations.blogspot.com

කිරීම සඳහා වෙනත් වෛද්‍යවරයෙක් යොදවන්න බැරිද? එහෙම කළොත් ඒක මට කරන ලොකු උදව්වක්."

"ඇයි?"

"මේ ඔබේ සහයෝගය මට අවශ්‍යම මොහොත. අපේ සතුරා බොහොම දූවැන්ත එකෙක්." හෝම්ස් කීය. "ඔහුව උගුලක හසුකරගන්න එක මට තනියම කරන්න අමාරුයි. මේ වෙලාවේ මේ මිනීමෝරා පැනගියොත්, අපට ඔහු කවදාවත් අල්ලගන්න බැරිවේවි. මගේ හිතේ තියෙනවා අපූරු සැලැස්මක්. ඒක ක්‍රියාත්මක කරන්න නම් දවස පුරාම ඔබට මා ළඟින් ඉන්න වෙනවා."

"මට පුළුවනි වෛද්‍ය ඇන්ස්ට්‍රුදර්ට, මගේ චිකිත්සාගාරයේ වැඩ කටයුතු කරන්න කියන්න. ඒ අතරේ මගේ බිරිඳට විදුලි පුවතක් යවන්නම්, ඇගේ නිවාඩුව තවත් දින 3ක් 4ක් දීර්ඝ කරගන්න කියලා?"

"විශිෂ්ටයි වොට්සන්" මගේ මිතුරා කීය. "මං දැනගත්තා ඔබ මගේ පිහිටට එන බව. මේ දැම ගිහින් ඒ අවශ්‍ය කටයුතු සම්පාදනය කරල එන්න. මගේ සැලැස්මේ මූලික පියවර මේකයි. මං වෙලිංටන් වීථියට වෙලා පාකර් ගැන දැඩි අවධානයකින් ඉන්නවා. ඒ අතරේ ඔබ ත්‍රෙඩ්නීඩ්ල් වීථියේ අර අවන්හල "කැප්ටන්ස් කැබින්" එක අසලට වෙලා සෝදිසියෙන් සිටිය යුතුයි."

"ඒ මොකටද?"

"මේ තරම් දවසක් මං කළ නිරීක්ෂණ අනුව මට නිගමනයකට එන්න හැකිවුණා. ඒක නිවැරදි නම් හෙට උදේ හෝ අනිද්දා උදේ පාකර් ඇවිත් බෙන් තොම්සන් හමුවෙනවාමයි. ඔවුන් හමුවෙන්නේ පුරුදු තැන. තොම්සන් කලින් ඇවිත් මේසයට වාඩිවුණොත්, ඔහුට නොතේරෙන්න ඔබ කොහොම් හරි ඔහුට කිට්ටුවම මේසයක අසුනක් ගන්න. ඔවුන් දෙදෙනාගේ කතාබහට අපි කොහොම හරි සවන් දෙන්න ඕන. පාකර් එන්නේ ඔහුගේ මිත්‍රයා හමුවෙන්න අවන්හලට නම්, මට දැනගන්න පුළුවනි. ඔහු අඳින්නේ අලුත් කබාය සහ ඉරි සහිත කලිසම. ඔහු ඒ ආකාරයට ගෙදරින් පිටවුණොත් මමත් ඒ දුම්රියෙන්ම එනවා. ඇවිත් ඔහුට කලින් ඔබේ මේසයට එන්නම්."

"මං කොහොමද තොම්සන්ව අඳුනාගන්නෙ? මං ඔහුව දැකල නැහැ." මම කීවෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙන්න ඔහුගේ ඡායාරූප කිහිපයක්" හෝම්ස් කීවේ ලාච්චුවෙන් කවරයක් එළියට ගනිමිනි. "මේව මම ලබාගත්තේ සර් ආතර් ගෙන්. අර මහන මැෂින් ප්‍රදානය කිරීමේ උත්සවයකදී සහ බැංකුවේ උත්සවයකදී ගත් ඡායාරූප. ඔබට පෙනෙනවා නේද? ඔහු උසයි කෙට්ටුයි. හිසකෙස් රන්වන් පාටයි. දිගු නැහැයක් සහිත කඩවසම් තරුණයෙක්. ඔහු බැංකුවේ රැකියාවට අඳින ඇඳුම මේකමයි. කබායේ පාට කළුපාට. අළුපාට කලිසමේ නිල් හා කළු ඉරි තියෙනවා."

පසුවදා උදෑසනින්ම හෝම්ස් පාකර් සොයා වෙලිංටන් වීථියට යද්දී, මම ත්‍රෙඩ්නීඩ්ල් වීථිය බලා පිටත්ව ගියෙමි. නැෂනල් ප්‍රොවින්ෂල් බැංකුව ඉදිරිපිට පුවත්පත් රාශියක් තබාගත් වෙළෙන්දෙක් සිටියේය. ඔහුගෙන් පුවත්පත් කිහිපයක් මිලට ගෙන, මම ඉදිරියටම ඇවිදගෙන ගියෙමි. බැංකු කටයුතු සඳහා පැමිණි ගනුදෙනුකාරයෝ වීථියේ ඔබමොබ යමින් සිටියෝය. 'කැප්ටන්ස් කැබින්' අවන්හල ඉදිරිපිට, පාරේ අනෙක් පැත්තේ වූ බංකුවක, මම වාඩිගතිමි. පුවත්පත් කියවන බවක් හඟවමින්, කාටවත් නොපෙනෙන සේ මග යනඑන අය පිළිබඳ අවධානය යොමුකිරීම අපහසු නොවීය. පැයක් පමණ ගතවී ගියත් බෙන් තොම්සන්ගේ හැඩහුරුකම ඇති කෙනෙකු මම නුදුටුවෙමි. ඔහු අද අවන්හලට නොපැමිණෙනවා වත්ද? එසේත් නැත්තම් මට මගහැරී ගියේද? මෝනිං ක්‍රොනිකල් පුවත්පත පහත දමා, මා වෙනත් පුවත්පතක් දිගහැරීමට සූදානම් වූවා පමණි. හෝම්ස් විස්තර කළ ආකාරයේ තරුණයෙක් ඉක්මන් ගමනින් අවන්හල දෙසට ඇවිදගෙන එන අයුරු මම දුටුවෙමි. වෙලාව හරියටම උදේ එකොළහය. පුවත්පතේ ආවරණය ලබා, මම සුපරික්ෂාකාරීව බලා සිටියෙමි. ඒ නම් ඡායාරූපයේ මා දුටු, හෝම්ස් විස්තර කළ තරුණයාමය. ඔහු වහාම අවන්හලට ඇතුළුවිය. මිනිත්තුවක් ගතවූ පසු මම ද එහි ඇතුළුවීමි.

ශාලාවේ එක් පසෙකට වන්නට වූ පුටු දෙකක් තබන කුඩා මේසයක, එක් අසුනක ඔහු හිඳගෙන සිටියේය. ඔහුට පිටුපසින් මම ඒ දෙසට ළංවූයෙමි. විශේෂ යමක් ඇණවුම් කිරීමට මෙන් ඔහු, අවන්හලේ බොජුන් වට්ටෝරුව කියවමින් සිටියේය. මම කෝපි පෝච්චියකට හා සැන්ඩ්විච් වලට මුදල් ගෙවා, ඔහුට යාබද මේසයට පැමිණ, ඔහුට පිටුපා වාඩිවීමි. ඉන්පසු වටපිට නොබලා

http://sherlockholmesinvestigations.blogspot.com

මහත් උනන්දුවෙන් මෙන් කොටස් වෙළඳපොලේ ගනුදෙනු සඳහන් පිටුව කියවීමට පටන්ගතිමි. එහෙත් මගේ දෙසවන් සම්පූර්ණයෙන්ම යොමුවී තිබුණේ යාබද මේසය වෙතයි.

. මිනිත්තු දහයක් ගතවෙද්දී තරුණයා කිසිවෙකුට "සුභ උදෑසනක්" ප්‍රාර්ථනා කරනු ඇසිණි. එයට ගොරෝසු හඬකින් පිළිතුරු දුන් කිසිවෙක් පුටුවක් ඇද වාඩිවිය. ඔහු සේවකයෙකු කැඳවා, කෑම හා කෝපි ඇණවුම් කළ හඬ ද මට ඇසිණි. නිසැකවම ඒ නොයෙල් පාකර් විය යුතුය. මා සිටි තැනට හෝම්ස් සඳහන් කළ විශාල කැටපත නොපෙනිණි. එහෙයින් කිසිවක් දකගැනීමට මට නොහැකි විය.

"ඔබ අද ටිකක් ප්‍රමාදයි" තරුණයා කීය. "මට ඉක්මනට යන්න ඕන. වැඩේ ඉවරයක් කරමු."

"හරි හරි. මෙන්න ගන්න."

"මෙතැන කීයද තියෙන්නෙ, හාරසීයද?" තරුණයා ඇසුවේ තරමක් නොරිස්සුම් හඬෙනි.

"වැඩක් හරිගියාම මං හැමදාමත් ඔහේට ගෙව්වෙ ඔය ගණන නේ" පාකර්ගේ රළු කටහඬ යළිත් ඇසිණි. "මුළු ගණනෙන් පහෙන් එකයි."

"මං එදත් කිව්වනේ. පහෙන් එකක් අරං මොනව කරන්නද?" තරුණයා කීය. "මගේ උදව්ව නැත්නං තමුසෙට කරන්න පුළුවන් ඉටිගෙඩියක් නෑ. මං විශ්වාසෙට හිතාගෙන හිටියා ඔහේ පන්සීයක් අද ගෙනේවි කියල."

පාකර් ඊට දුන් පිළිතුර මට නෑසිණ. ඔවුන් කෝප්ප වලට කෝපි වත්කළ නිසා තරුණයා දුන් පිළිතුර ද මට නෑසී ගියේය.

"....... අමාරුම කොටස කරන්නෙ මමයි" පාකර් කියනු ඇසිණ. "හැම අවදානමකටම මුහුණ දෙන්නත් ඕන මම. ඉතින් තමුසෙ හතරෙන් එකක් ඉල්ලන එක මොන තරම් අසාධාරණද?"

"ඔහේ සල්ලි උපයන විධිය බොහොම සාධාරණයි කියලද කියන්නෙ?" තරුණයා ඇසුවේ උපහාසාත්මක හඬෙනි. "ඔහේට විතරක් නෙමෙයි මටත් තියෙනවා අවදානමක්. ඒ වගේම තමයි, තුරුම්පු ඔක්කොම තියෙන්නෙ මගේ අතේ. ඒක අමතක කරන්න එපා. ඔහේට බැරි නම්, මට තියෙන්නේ ලොක්කට ලියුමක් දාන එක විතරයි. මොකද කියන්නේ.......?"

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

මිනිත්තු කිහිපයක නිශ්ශබ්දතාවයක් පැවතිණ.

"මොකද කල්පනා කරන්නේ. ඔටු පරක්කු වෙනවා." තරුණයා කීවේ නොඉවසිලිමත් හඬෙනි. "ඔහේට ඔය තරම් කේන්ති ගන්න තරම් දෙයක් මං කිව්වේ නෑ."

"හොඳයි කමක් නෑ. මොනව කරන්නද" පාකර්ගේ ගොරෝසු කටහඬ යළිත් ඇසිණි. "ඔහේ ඉල්ලූ දේ මං සූදානම් කරල තියන්නම්. අද රෑට මගේ ගෙදරට එන්න."

"ඇයි යාළුවා, මං මොකටද ඕහේගේ ගෙදරට එන්නෙ? හෙට උදේ ඒක මෙහාට අරගෙන එනවකෝ."

"බෑ බෑ" පාකර් පිළිතුරු දුන්නේය. "ඊයේ පෙරේදා ඉඳල මගේ පිටිපස්සෙන් මිනිහෙක් එන්න පටන් අරගෙන. බැලූ බැල්මට පොලිස්කාරයෙක් වගෙයි. නමුසෙ හිතන්නෙ මං කියන්නෙ බොරුයි කියලද? ඒ යකා මේ දැනුත් මා පස්සෙන් ආවා. මං ඔහුව මඟහැරලයි මේ ආවෙ. මට එන්න පරක්කුවුණෙත් ඒක නිසා. ඊයේ රීගල් අවන්හලේදී, මං අවිනේට නොදැකපු මිනිහෙක්, බලෙන් මා එක්ක කතාවට ආවා. අපි මාසෙකට දෙකකට මේ වැඩේ නවත්තලා දාමු" පාකර් කීවේ හතිදමමිනි.

"ඒකත් එහෙමද? හොඳයි මං එන්නම්. කීයටද මං එන්න ඕනෑ?"

"නොවැරැදීම රෑ නවය වෙනකොට එන්න. ඉල්ලන මුදලක් එතකොට දෙන්නම්."

"හරි. හරියට නවය වෙද්දි මං වෙලිංටන් වීථියේ ඔහේගේ ගෙදර දොරටුව ළඟ"

එතැනින් පිටවී යාම සඳහා ඔවුන් පුටු පිටිපසට ඇද එළියට පියවර තබන හඬ මට ඇසිණ. හෝම්ස් තවමත් නොපැමිණියේ ඇයිද යන්න දැන් මට වැටහේ. කිසිවෙකු තමා ලුහුබඳින බව තේරුම් ගෙන, දැන් පාකර් හෙවත් එරික් කැලැඹීමට පත්වී ඇත. උමං දුම්රියපොළට යාමේ අදහසින් අවන්හලෙන් පිටවී, මම එංගලන්ත මහ බැංකුව දෙසට ගමන්කළෙමි.

මා පියවර දහයක් ඉදිරියට යන්නට ඇත. වේගයෙන් පැමිණි කුලී රියක් මා අසලින් නවත්වනු දුටුවෙමි.

"දොස්තර මහත්තයා නගින්න."

හෝම්ස්ගේ කටහඬ ආවරණය කර තිබූ කුලීරිය තුළින් ඇසිණි. මම වහාම එයට නැගුණෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මං හිතන්නේ මං ඔහු පසුපස එන බව ඔහුට තේරුණේ ග්ලෝස්ටර් රෝඩ් දුම්රිය පොළේදී" හෝම්ස් කීවේ අප දෙදෙනා දහවල් ආහාරය සඳහා ඉතාලි අවන්හලක් තුළට ගොඩවැදුණු පසුය. "දකුණු කෙන්සිංටන් දුම්රියපොළේ කවාකාර වේදිකාව ළඟදී, පාකර්, සෙනග අතරේ එක්වරම මට නොපෙනී ගියා. කිහිප වාරයක්ම එහේ මෙහේ දුවලා හෙව්වත්, මට ඔහුව හොයාගන්න බැරිවුණා."

"ඔබ ඔහු පිටිපස අවන්හලට ආවෙ නැති එක ගැන, මට පුදුම හිතුණා" මම කීවෙමි.

"ඔබ ඒ ළඟින්ම වාඩිවෙලා ඔවුන්ගේ කතාබහට කන්දෙන බව මං දැනගෙන හිටියා වොට්සන්."

කෑමගන්නා අතරේ මට සවන්දීමට ලැබුණු සම්පූර්ණ විස්තරය මම මගේ මිතුරාට පැවසුවෙමි. දැඩි අවධානයකින් මා කියූ සෑමදෙයකටම සවන්දුන් ඔහු, නළල රැලිකරගෙන කල්පනා කළේය.

"වොට්සන්. ඔබ උදේ ඉඳලම හුඟක් මහන්සි වුණා. දැන් බේකර් වීදියට ගිහිං විවේකගන්න. අපේ මීළඟ පියවර මොකක්ද කියන එක මම හවසට ආවම කියන්නම්."

හෝම්ස් ආපසු පැමිණෙද්දී සවස හය පමණ වී තිබිණ. ඔහු සමගම අපේ හිතමිත්‍රයෙකු ද පැමිණියේය. ඒ ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පොලීසියේ පරීක්ෂක ලෙස්ට්‍රේඩ්ය. අපි කල්තබා රාත්‍රී ආහාරය අනුභව කළෙමු. රාත්‍රී 7 පමණ වනවිට අප වෙනුවෙන් කුලීරියක් පැමිණ ඇති බැව් හඩ්සන් මහත්මිය දැනුම්දුන්නාය. ඇඳිරි වැටෙද්දීම ඇද හැළෙන්නට පටන්ගත් වර්ෂාව, ක්‍රමයෙන් වැඩිවන ලකුණු දකින්නට ලැබිණි.

"අද රෑට ධාරානිපාත වර්ෂාවක් කඩාවැටුණොත්, අපේ සැලසුම් ඔක්කොම අවුල්වෙනවා." හෝම්ස් කීවේ කැලැඹීමට පත් ස්වභාවයෙනි. "ඒ මොකද ඒ සමගම අනාමිදුමක් එන්න පුළුවනි. අපරාධකාරයින්ට ඒක ලොකු වාසියක්. ඒ නිසා අපි කල්තියා පිටත්වෙමු."

කුලීරථයේ රියැදුරා එලියට්, රිය අපට භාරදී යන්නට ගියේය. වේලාව රාත්‍රී 7.30 වෙද්දී අපි නිවසෙන් පිටත්වූයෙමු. කුලී රථ රියැදුරෙකු ලෙස වෙස්වලාගත් ලෙස්ට්‍රේඩ් රථය පැදෙව්වේය. රාත්‍රියේ පැවැති ඝනාන්ධකාරය නිසා, වීථි හඳුනාගැනීමට පවා

http://sherlockholmesinvestigations.blogspot.com

අපහසුවිණි. වීථි ලාම්පු වලින් නිකුත්වූ ආලෝකය ද, ගලා එන මීදුම නිසා දුර්වල වූ බවක් පෙනිණි.

වෙලිංටන් වීථියේ හෝම්ස්ගේ නවාතැන පසුකොට යාර 200 ක් ඉදිරියට ගොස් රථය නැවැත්වූයෙමු. හෝම්ස් සහ මා පාගමනින් නවාතැන වෙත ආපසු එද්දී, ලෙස්ට්‍රේඩ් කුලිරියේ රැඳී සිටියේය.

"මීදුම හා අන්ධකාරය මේ දක්වාම අපට පිහිටක් වුණා. ඒත් ඉතිරි වැඩ ටික කරගන්න ඒකම බාධාවක් වේවිද කියන්න බැහැ" මගේ මිත්‍රයා කීවේ අප ඔහුගේ කාමරය වෙත ගොස් වැහිකබා ඉවත්කරද්දීය.

කාමරය ඇතුළත සෑහෙන තරම් අඳුරු වන සේ ඔහු ලන්තෑරුමේ එළිය අඩු කළේය. අනතුරුව ජනේලය අසට ළංවී පාකර්ගේ නිවස දෙස මඳවේලාවක් බලා සිටියේය.

"ඔබ හිතන්නේ බෙන් තොම්සන් අද පාකර් හමුවෙන්න එවි කියලද?" මම ඇසීමි.

"ඒකෙ සැකයක් නෑ. අපට තව මිනිත්තු හතළිහක් තියෙනවා" හෝම්ස් කීවේ ඔරලෝසුව වෙත නෙත් යොමුකරමිනි. "මේ දෙන්නා එකතුවෙලා ධනවතුන්ගෙන් කප්පම් ගත්තු ආකාරය දැන් පැහැදිලියි. ඒ මිනිසුන්ගේ ගිණුම් වල තිබෙන මුදල්, පදිංචි තැන් ආදී තොරතුරු පාකර්ට ලබාදීම වෙනුවෙන් මෙච්චර දවසක් තොම්සන්ට පහෙන් එකක් ලැබිල තියෙනවා."

"ඒ වුණාට කප්පම ගන්න කලින් දවසෙත් මුදල් වගයක් දුන්නා නේද?" මම ඇසීමි.

"ඔව්. තොරතුරු සැපයූ වහාම අත්තිකාරම් මුදලක් ගෙවන්න පාකර් පොරොන්දුවෙලා ඉන්න ඇති. තරුණයා වැඩි මුදලක් ඉල්ලුවාම පාකර්ට තරහා ගියේ එකේ පුදුමයක් නෑ. ඒ මොකද ඔහුම කිව්ව වගේ, පාකර් කරන්නේ බොහෝම අවදානම් වැඩක්. චාල්ස් ඔගස්ටස් මිල්වටන් සිද්ධිය ඔබට මතකද වොට්සන්? මට හොඳටම විශ්වාසයි, මේ මිනිහා ටික කාලෙකට හරි, මේ වැඩේ අත්හිටවන බව."

"ඒ ඇයි?"

"එකක් ඔහු අද තේරුම් ගත්තා, කවුරුන් හෝ ඔහු ලුහුබඳින බව" හෝම්ස් කීය. "ඒක මගෙන් වුණු අත්වැරැද්දක් වොට්සන්. දුම්රිය පොළේ සෙනඟ අතරේ ඔහු මගහැරේවි කියලා, මං ඔහුට ටිකක්

http://sherlockholmesinvestigations.blogspot.com

කිට්ටුවෙන් ගමන් කළා. අවස්ථා දෙකකදී මට ඔහු සමග එකම දුම්රිය මැදිරියේ ගමන් කරන්න සිදුවුණා. මෙච්චර කාලෙකට නොදැකපු, හුපුරුදු මුහුණක්, කිහිපවිටක්ම ළඟ ළඟ දකින්න ලැබුණාම, අපරාධකාරයෙකුගේ හිතේ සැකයක් ඇතිවීම ස්වාභාවිකයි. ඒ එක හේතුවක්. අනෙක, තොම්සන් වැඩි මුදලක් ඉල්ලලා තර්ජනය කළා."

"ඔහු තර්ජනය කළ බවක් මට ඇහුණෙ නෑ" මම කීවෙමි.

"ඔහු දබරැඟිල්ල ඔසවලා උස්හඬින්, සෙත්තියෙන් එහෙම නොකිව් බව ඇත්තයි" හෝම්ස් කීය. "නමුත් හිනාවෙවී කීවේ මොකක්ද? "මට තියෙන්නෙ ලොක්කට ලියුමක් දාන එක විතරයි" කීවා. එහෙම නේද වොට්සන්? ඒ වෙලාවෙ පාකර්ගේ මුහුණේ ඇතිවුණු පෙනුම මට හිතාගන්න පුළුවනි. ඔහුගේ මුහුණ සුදුමැලි වෙලා හීන් දහදිය දමන්න ඇති. තමන්ගේ ජීවිතය තියෙන්නේ තරුණයාගෙ අතේ බව පාකර්ට හොඳට තේරුම් යන්න ඇති. තව ටික දවසක් ගිහින් තරුණයා කප්පමෙන් භාගයක් ඉල්ලන්නත් ඉඩ තියෙනවා. ඒ හින්දා ඔහු ඉල්ලූ දේ දෙන්න පාකර් වහාම එකඟවත්න ඇත්තේ ඒ නිසයි. මම දැනගන්න......."

හෝම්ස්ගේ කථාව නිමවීමටත් පෙර, වේගයෙන් ආ අශ්වකරත්තයක රෝද පාරේ ගල් මත ගැටෙන හඬ අසන්නට ලැබිණ. මහවැස්සේ ඇදී ආ කුලීරිය නොයෙල් පාකර්ගේ අංක 71 දරන නිවස ඉදිරිපිට නැවැත්වූ අයුරු අපි බලාසිටියෙමු. එයින් බැස ගියේ කවුද යන්න, පාරේ තිබූ අඳුරු අන්ධකාරය නිසා අපට දැකගත හැකිවූයේ නැත. එහෙත් ස්වල්ප වේලාවකින් නිවසේ ඉදිරි දොර විවෘත විය. ඒ සමගම ආලෝක කදම්බයක් මහපාර දක්වා වැටිණ. කිසිවෙකු නිවසට ඇතුළුවූ වහාම දොර වසා යතුරු දැමිණ.

"බෙන් තොම්සන් හරියට වෙලාවට ඇවිත්" හෝම්ස් කීවේ තම ඔරලෝසුව පරීක්ෂා කරමිනි.

"ඔහු වැඩිවෙලාවක් ඉන්න බලාපොරොත්තුවක් නැතුව ඇති. කුලීරථ රියැදුරා ඔහු එනතුරු බලා ඉන්න හැඩයි" මම කීවෙමි.

මීළඟට අපි දෙදෙනා ඉක්මනින් වැහිකබා දමාගෙන ලන්තෑරුමක් ද රැගෙන තරප්පු පෙළ බැස අවුත් නිවසෙන් පිටවූයෙමු. අප පාකර්ගේ නිවස දෙසට ගමන් කරද්දී තවත් කුලීරියක් එතැනට පැමිණියේය. ඒ අප පැමිණි රථයයි. එයින් බැස

http://sherlockholmesinvestigations.blogspot.com

ආ ලෙස්ට්‍රේඩ්, තරුණයා පැමිණි කුලීරියේ රියැදුරාට මුදලක් ගෙවා යමක් කීවේය. එවිට එම රියැදුරා තම කුලීරිය පදවාගෙන යන්නට ගිය සැටිත්, ලෙස්ට්‍රේඩ් තම රථය පාකර්ගේ දොරටුව ඉදිරියට ගත් සැටිත් අපි දුටුවෙමු.

"ලෙස්ට්‍රේඩ් ඔහුට භාරදුන්නු වැඩ කොටස හරියට කළා. ඉක්මන් කරන්න වොට්සන්"

අඩක් අඳුරු කළ ලන්තෑරුමේ එළියෙන් අපි එතැනට ළඟාවූයෙමු. කලින් දී තිබූ උපදෙස් පරිදි මම කුලීරිය තුළට නැඟුණෙමි. හෝම්ස් කුළුනකට මුවාවී නොයෙල් පාකර්ගේ දොරටුව අසල රැඳී සිටියේය.

තමාගේ මුදල ද රැගෙන, දූත් කොයි මොහොතේ හෝ තොම්සන් තරුණයා ආපසු පැමිණෙනු ඇත. ඔහුට නිවසෙන් පිටවීමට පාකර් දොර විවෘත කරනු ඇත. ඒ වහාම කඩාපැන ඔහු අල්ලාගැනීමට සූදානමෙන් හෝම්ස් බලා සිටියේය. මම මගේ රිවෝල්වරයේ ආරක්ෂක අගුල ලිහිල් කොට, අවශ්‍ය වුවහොත් වෙඩිතැබීමට සූදානමෙන් සිටියෙමි.

අප සිතුවාට වඩා බොහෝ වේලාවක් ගතවිණි. මිනිත්තු හතළිස්පහක් ගතවූ පසුත් තරුණයා එළියට පැමිණෙන ලකුණක් හෝ නොවීය. අශ්වකරත්තය වෙත පැමිණි හෝම්ස්, ලෙස්ට්‍රේඩ් ඇමතීය. "ගනුදෙනුවට මේ තරම් වෙලාවක් ගතවෙන්න කිසිම හේතුවක් නෑ. මේක නරක ලකුණක්. ලෙස්ට්‍රේඩ්. මං ඔබට දුන් උපදෙස් අනුව ක්‍රියාත්මක වෙන්න" හෝම්ස් කීය.

අශ්වකරත්තයෙන් බැස ආ පොලිස් නිලධරයා, පාකර්ගේ ඉදිරි දොරට තට්ටු කළේය. අපි දෙදෙනා දොර දෙපස සූදානමෙන් සිටියෙමු. කිහිප විටක් නොනවත්වාම උස්හඬින් දොරට ගැසූ පසු, උඩුමහලේ සිටි කිසිවෙක් තරප්පු පෙළ බැස එන ශබ්දය ඇසිණි.

"කවුද?" දොර විවෘත නොකරම ඇතුළෙන් ඇසුණේ ගොරෝසු කටහඬකි.

"මං මේ කුලීරියේ රියැදුරා" ලෙස්ට්‍රේඩ් කීය. "මං එක්ක ආව තරුණ මහත්තයෙක් දූන් පැයකට කලින් මේ දොරෙන් ඇතුළුවුණා. මගේ ගාස්තුව එක පැන්සයක් ගෙව්වෙ නෑ. මට කිව්වේ මිනිත්තු පහෙන් එනවා කියලයි. කෝ ඒ මහත්තයා? එයාට එන්න කියන්න."

තත්පර කිහිපයක නිහඬතාවයකින් පසු නිවස තුළින් පිළිතුරක් ලැබිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ මහත්තයට ටිකක් සනීප නෑ. ඔහේට යන්න කියන්න කිව්වා." පාකර් පැවසුවේ දොර විවෘත කිරීමට උත්සාහ නොදරමිනි.

"මගේ ගාස්තුව ගෙවන්නෙ නැතුව එහෙම කියල බේරෙන්නද හදන්නෙ?" ලෙස්ට්‍රේඩ් ඇසුවේ කෝපයට පත් ස්වරයකිනි. "මේ මහ රෑ වැස්සෙ දුරගමනක් ආවා. ඒ මදිවාට මං මෙතැන පැයක් රස්තියාදු වුණා. මට පවුම් දෙකක් ගෙවන්න. නැත්නං මං ගිහිං වීථි මුර සංචාරයේ ඉන්න පොලිස් භටයෙක් එක්ක එනවා. මොකද කියන්නේ?"

"ඔහොම ඉන්නවා ටිකක්" නිවස තුළින් පිළිතුරු ලැබිණ. ගෙහිමියා තරප්පු පෙළේ ඉහළට ගමන්කරන ශබ්දය ඇසිණ.

මම හෝම්ස් හා ලෙස්ට්‍රේඩ් දෙස බැලීමි. ඔවුන් දෙදෙනා දොර අසලට ළං වූයේ මට රිවෝල්වරය සූදානම් කරගෙන මඳක් පිටුපසට යන ලෙසට සංඥාකරමිනි.

මිනිත්තු දෙකකට පසු දොරේ අගුළු බුරුල් කොට ඇතුළතින් යතුරු කැරකෙන හඬ ඇසිණි. දොර අඩක් විවර කළ තොයෙල් පාකර් මුදල් සහිත අත දිගු කරමින් කීවේ "මෙන්න තමුසෙගෙ පවුම් දෙක. මේකත් අරං අපායට........"

ඔහුට එම වාක්‍යය සම්පූර්ණ කිරීමට ඉඩක් නොලැබිණි. ෂර්ලොක් හෝම්ස් ඔහු වෙත කඩාපැන්නේ ගොදුරක් වෙත කඩාපනින කොටියෙකු විලසිනි. පාකර්ගේ අතේ වූ ලන්තෑරුම ඉවතට විසිවී ගිය අතර, හෝම්ස් ද සමඟ පාකර් බිම ඇදවැටිණි. වියරු වැටුණු තිරිසන් සතෙකු මෙන් ඔහු පොරකෑවේ, තම දෑත් හෝම්ස්ගේ ගෙල වෙත ළංකිරීමේ අරමුණෙනි. එහෙත් ඔහු යටත් කරගැනීමට හෝම්ස් සමත්විය. මම වහාම එතැනට පැන මගේ රිවෝල්වරය පාකර්ගේ හිසට ළං කළෙමි.

"යටත් වෙනවා පාකර්. නැත්නම් තමුසෙට වෙඩිකාල මැරෙන්නයි වෙන්නෙ" ලෙස්ට්‍රේඩ් කෑගැසීය. මා අතේ වූ ආයුධය පාකර් දුටුවේ එවිටයි. ඔහු හෝම්ස්ට යෙදූ ග්‍රහණය ලිහිල් කළේය. ලෙස්ට්‍රේඩ් විලංගු යුගළ එක් ක්ෂණයකින්, පාකර්ගේ දෑත් වටා තද කළේය.

"අපට තමුසෙ එක්ක සතුටුසාමීචි කතාකරන්න වෙලාවක් නෑ" ලෙස්ට්‍රේඩ් කීවේ බිම පෙරළී සිටි පාකර් නැගිට්ටවමිනි.

"කෝ තමුසෙගෙ අනිත් හවුල්කාරයා?"

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

සිරකරුවාගෙන් එයට පිළිතුරක් නොලැබිණි. ඔහු ඉදිරියෙන් තල්ලුකරගෙන අපි තරප්පු පෙළ දිගේ ඉහළට ගමන් කළෙමු. ඔහුගේ විසිත්ත කාමරය තුළ අප දකින්නට බලාපොරොත්තු වූ අමුත්තා නම් නොවීය. ඒ වෙනුවට එහි තිබූ පුටු, ටීපෝ හා රාක්ක එහා මෙහා පෙරළී තිබිණි.

"ඔහේගේ හිතවත් මිත්‍රයා බෙන් තොම්සන්, දූන් පැයකට කලින් මෙහේට ආව නේද?" හෝම්ස් ඇසීය. "මොකද පාකර් මහත්මයා එයාට වුණේ? මිනිහට අත්කවු ඇවිත් ජනේලයෙන් ඉගිලිලා ගියාද?"

පොර බැදීමේදී උපැස් යුගළ ගැළවී යාම නිසා, පාකර්ගේ දෙනෙත් නිරාවරණය වී තිබිණ. මගේ අතේ වූ ලන්තෑරුම මම ඔහුගේ මුහුණට ළං කළෙමි. ඔහුගේ දෑස් වලින් පිළිබිඹු වූයේ කැකෑරෙන වෛරයයි. මුහුණ භීතියෙන් සුදුමැලි වී තිබූ අතර විලංගු දමා තිබූ දෑත් වෙවුලන අයුරු මම දුටුවෙමි.

ලෙස්ට්‍රේඩ් සිරකරු භාරව සිටියදී හෝම්ස් පාකර්ගේ නිදන කාමරය දෙසට ගියේය. මම ද ඔහු පසුපස ගියෙමි.

ඇඳ යට සිටි කිසිවෙකුගේ දෙපා එළියට නෙරා තිබූ අයුරු, ඇඳේ එක් කෙළවරකින් දකින්නට ලැබිණි. හෝම්ස් එම පාවහන් තදින් ග්‍රහණය කරගෙන එක්වරම එළියට ඇද්දේය.

අපට දකින්නට ලැබුණේ මර්චන්ට්ස් ට්‍රස්ට් බැංකුවේ අයකැමි තරුණ බෙන් තොම්සන්ය. දෑස් සම්පූර්ණයෙන්ම විවෘතව තිබුණත් ඔහු යන්තමින් හෝ සෙලවුණේ නැත. ඒ ජීවමාන තොම්සන් නොව, ඔහුගේ මළසිරුර බව අපි තත්පර කිහිපයකදී වටහා ගත්තෙමු.

"එක අපරාධකාරයෙකුට තමා ඔහු කළ වැරැදිවලට දූඩි දඬුවම් ලැබිල තියෙනවා" හෝම්ස් කීය. "නොයෙල් පාකර් සියර්පින්ස්කි මහත්මයා. ඔහේ මෙපමණ දවසක් කළ අපරාධ මොන තරම් නින්දා සහගත ඒවා වුණත්, ඒවා උසාවියේදී ඔප්පුකරගැනීම අපට අමාරු වෙන්න ඉඩතිබුණා. අපේ පහසුව ගැනත් හිතන මේ වගේ අය ඉන්න එක කොයිතරම් සහනයක්ද? මිනියක් මරලා ඔබ එල්ලුම් ගහම තෝරාගැනීම ගැන මං ඔබට කෘතඥවෙනවා."

* * *

http://sherlockholmesinvestigations.blogspot.com

බෙන් තොම්සන් මරාදැමීමේ වරදට නොයෙල් පාකර් සියර්පින්ස්කි එල්ලුම්ගසට නියම විය. ඔහු විසින් කර තිබූ කප්පම් ගැනීම් උසාවියට ගෙන නොඒමට බලධාරීහු තීරණය කළහ. ඔහු සතුව තිබූ රෝම පෞරාණික භාණ්ඩ සියල්ල ක්‍රිස්ටි ආයතනයේ මෙහෙයීමෙන් වෙන්දේසි කෙරිණි. රත්පවුම් තිස්නව දහසකට ඒවා අලෙවි විය. ඒ මුදලෙන් විශාල කොටසක් පාකර් විසින් කප්පම් ලබාගත් පුද්ගලයිනට හා ඔවුන්ගේ පවුල්වලට ලබාදීමට අධිකරණයෙන් නියම විය.

"මං එදත් කිව්ව ගන් වොට්සන්" මගේ මිතුරා කීවේ බේකර් වීථියේ අපේ නිවහනට ලෙස්ට්‍රේඩ් ද පැමිණ සිටි අවස්ථාවකය. "නොයෙල් පාකර් මොන තරම් අපරාධ කළත්, බැංකුවක රැකියාව කළ නිසා, හැමදෙයක්ම පොත්පත්වල ක්‍රමානුකූලව සටහන් කළා. ඒ අවාසනාවන්ත මනුස්සයින්ට වන්දිගෙවීමේදී ඒක මොන තරම් පහසුවක් වුණාද? වැඩක් නිසි පිළිවෙළකට කරන හැටි කෙනෙකුට උගන්වලා, ඒක පුහුණුවෙන්න ඉඩ සලසන්න. ඔහු ඒක ජීවිත කාලයටම රැකගන්නවා."

**සමාප්තයි.**

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# ෂර්ලොක් හෝම්ස් ආපසු එයි !





- සුව පහසු නවාතැන
- හෝම්ස් නදි තෙර වික්‍රමය
- හදිසි අභාවය
- රැම්ස්ගේට් ප්‍රහේලිකාව
- මාරියාගේ දූතයෝ
- කාඩිනල් ටෝබටන්ගේ උමතුව

සහ

- නාඳුනන්නා


මිල 295/-

චන්දන මෙන්ඩිස්ගේ පරිවර්තනයකි.

Reading Purpose Only . Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com